පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 5

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ ප‍්‍රඥාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ ප‍්‍රඥාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප‍්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී ප‍්‍රඥානන්ද ප‍්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ඛුද්දක
# නිකාය
# 5

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**
**ඛුද්දක නිකාය 5**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 මාර්තු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇතිකරන කථා රාශියක් අන්තර්ගත කර තිබේ. කාව්‍ය රසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ චූල නිද්දෙස සහ පටිසම්භිදාවග්ගයේ දිට්ඨි කථාව අවසානය දක්වා ඇතුළත් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයුර්වේද ... ආයසීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

15 - 9 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| **චූල නිද්දේසය** | |
| 1. අජිත මානවක පුච්ඡා නිද්දේසය | 1931 |
| 2. තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර නිද්දේසය | 1946 |
| 3. පුණ්ණ මානවක සූත්‍ර නිද්දේසය | 1948 |
| 4. මෙත්තගු මානවක සූත්‍ර නිද්දේසය | 1961 |
| 5. ධොතක මානවක සූත්‍ර නිද්දේසය | 1982 |
| 6. නන්ද මානවක සූත්‍ර නිද්දේසය | 2001 |
| 7. හේමක මානවක සූත්‍ර නිද්දේසය | 2006 |
| 8. තොදෙය්‍ය මානවක සූත්‍ර නිද්දේසය | 2011 |
| 9. කප්ප මානවක සූත්‍ර නිද්දේසය | 2014 |
| 10. ජතුකණ්ණි මානවක සූත්‍ර නිද්දේසය | 2019 |
| 11. භද්‍රාවුධ මානවක සූත්‍ර නිද්දේසය | 2024 |
| 12. උදය මානවක සූත්‍ර නිද්දේසය | 2029 |
| 13. පෝසාල මානවක සූත්‍ර නිද්දේසය | 2036 |
| 14. මෝඝරාජ මානවක සූත්‍ර නිද්දේසය | 2045 |
| 15. පිංගිය මානවක සූත්‍ර නිද්දේසය | 2056 |
| 16. පාරායන මානවක සූත්‍ර නිද්දේසය | 2061 |
| 17. ඛග්ග විශාන සූත්‍ර නිද්දේසය | 2090 |
| **පටිසම්භිදාමග්ග පාළි** | 2145 |
| 1. **ඤාණ කථා** | 2145 |
| විස්සජ්ජන උද්දේස වාරය | 2151 |
| දෙවෙනි බණවර | 2167 |
| තුන්වෙනි බණවර | 2174 |
| හතරවෙනි බණවර | 2180 |
| පස්වෙනි බණවර | 2184 |
| හයවෙනි බණවර | 2189 |
| 2. **දිට්ඨි කථා** | 2321 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ඛුද්දක නිකාය

## චූල නිද්දේසය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

### අජිත මානවක පුච්ඡා නිද්දේසය.

1-1

1. "ලෝකය කුමකින් වසන ලද්දේද" යන්නෙහි (ii) ලෝකය නම් නිරය ලොකය, තිරිසන් ලෝකය, ප්‍රෙත ලෝකය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝකය, ස්කන්ධ ලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය, මේ ලෝකය, පර ලෝකය, බ්‍රහ්ම ලෝකය, දිව්‍ය ලෝකය යන මේ ලෝකයයි කියයි. (iii) මේ ලොකය කවරකින් ආවරණය කරණ ලද්දේද, වටකරණ ලද්දේද, වැසුනේද යනුයි. "ආයුෂ්මත් අජිතතෙම මෙසේ කීයේය" යන්නෙහි "මෙසේ" යනු පද සන්ධියයි. (iv) පද ගැලපීමයි. පද පිරවීමයි. අකුරු සමසේ යෙදීමයි. පද සිළුටු කිරීමයි. මෙය පද පිළිවෙලයි. "ආයුෂ්මත් අජිතතෙම" යනු ඔහුගේ වචනයයි. ගරු වචනයයි. ගෞරව සහිත උසස් නාමයයි. මේ ආයුෂ්මත් යනුයි. අජිත යනු ඒ බ්‍රාහ්මණයාගේ නාමයයි. සමානවූ පැනවීම් ව්‍යවහාර නාමයකි. නිරුක්ති පද සහිත කීමකි, යනුයි.

2. "කුමකින් ලෝකය ප්‍රකාශ නොවේද" යනු කුමකින් ලෝකය ප්‍රකාශ නොවේද, නොබබළාද, දීප්තිමත් නොවේද, විවේචනය නොකෙරේද, නොදැනේද, ප්‍රකට නොවේද යනුයි.

3. "කුමක තැවරීම කියන්නෙහිද, යනු ලෝකයාගේ තැවරීම ලැගීම කුමක්ද, බන්ධනය කිළුට කුමක්ද, කුමකින් ලොකය තැවරුනේද, මනාකොට තැවරුනේද, විශෙෂයෙන් තැවරුනේද, කිළුටු වූයේද, විශෙෂයෙන් කිළුටු වූයේද,

තැවරුනේද, මිශ්‍රවූයේද, එල්බුනේද පලිබොධවූයේදැයි කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි දෙශනා කරණු මැනවි පණවනු මැනවි. තබනු මැනවි. විවෘත කරණු මැනවි. බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි. යනු කුමක තැවරීම කියන්නෙහිද, ඒ ලෝකයට මහත් භය කුමක්ද යනු ලෝකයට මහත් භය, පීඩාව සට්ටනය, උපද්‍රවය, උවදුර කුමක්ද යනුයි එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීවේය. (මෙහි මෙසේ කීවේය යනුවෙන් දැක්වෙන ගාථා අනුවාද සියල්ලම සූත්‍ර නිර්දෙශයේ පාරායන වර්ගයේ ඒ ඒ සූත්‍රවලින් දක්වා ඇත.)

1-2

1. "ලෝකය අවිද්‍යාවෙන් වැසුනේය" යන්නෙහි අවිද්‍යා නම් දුකෙහි නොදැනීම, දුක ඇතිවීම නොදැනීම, දුක නැති තැන (දුක්ඛ නිරොධය) නොදැනීම, දුක් නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාව නොදැනීම, අතීතය ගැන නොදැනීම, අනාගතය ගැන නොදැනීම, අතීතය හා අනාගතය නොදැනීම, ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්හි නොදැනීම යන මෙබඳුවූ යමකින් නොදැනීමක්, නොදැක්ම නොවැටහීම, අවබොධයක් නැතිකම ප්‍රබෝධයක් නැති බව නුවණින් කල්පනා නොකිරීම, අඥාන බව, බාල බව, නුවණ නැතිබව, මොහය, මුලාව, අවිද්‍යාව, අවිද්‍යා සැඩවතුර, අවිද්‍යාවේ යෙදීම, අවිද්‍යානුසය, අවිද්‍යාවෙන් මැඩීම, අවිද්‍යාරම්භය, මොහය, අකුශලමූලය යන මේ අවිද්‍යාව යයි කියයි. "ලොක" යනු 1-1 1. (ii) යෙදිය යුතුයි. මේ ලෝකය මේ අවිද්‍යාවෙන් ආවරණය කරණලදී. වටකරණලදී. වසනලදී යනුයි. "අජිත" යනු භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරණසේක. 'භාග්‍යවත්' යනු මෙහි මහා නිර්දෙශයේ 7-2 1. භාග්‍යවතුන් වහන්සේ යන තැන සිට 'පැනවීමකි' යන තැනට යොදාගත යුතුයි.

2. "මසුරුකම කරණකොටගෙනද ප්‍රමාදය කරණකොට ගෙනද නොපෙණේ. යන්නෙහි මසුරුකම නම් ආවාස මච්ඡරිය, කුලමච්ඡරිය, ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය හා මෙසේවූ යම්බඳු මසුරුකමක් මසුරුවීම් බවක්, තද මසුරු

බවක් බලවත් බැඳීමක් සිතේ ගැනීමක් ඇද්ද, මෙය මසුරුකමයයි කියයි. තවද ස්කන්ධයන් පිළිබඳ මසුරුකම මසුරුකමකි ධාතූන් පිළිබඳ මසුරුකමද මසුරුකමකි ආයතනයන් පිළිබඳ මසුරුකමද මසුරුකමෙකී දැඩිව අල්ලාගැනීම යයි මසුරුකමට කියයි ප්‍රමාදය කියයුතුය කාය දුශ්චරිතයෙහි හෝ වාග් දුශ්චරිතයෙහි හෝ මනස් දුශ්චරිතයෙන් හෝ පඤ්චකාම ගුණයන්හි හෝ යෙදී කුශල ධර්මයන්ගේ හෝ වැඩීමට සිත නොයෙදීම සකස් නොකොට වැඩකිරීම, නිතර ක්‍රියා නොකිරීම, අනුත්සාහවත්ව වැඩකිරීම, පසුබටව වැඩකිරීම, බහාතැබූ කැමැත්ත ඇතිබව බහාතැබූ ධෛර්ය ඇති බව, සේවනය නොකිරීම, බහුල වහයෙන් නොයෙදීම, අනුත්සාහවත්බව, ප්‍රමාදයෙහි යෙදීමද යම් එබඳුවූ ප්‍රමාදයක් ප්‍රමාදයේ යෙදීමක් ප්‍රමාදවන බවක් ඇද්ද, මේ ප්‍රමාදයයයි කියයි.

3. "මසුරුකම කරණකොට ගෙනද ප්‍රමාදය කරණකොට ගෙනද නොපෙණේ." යනු මේ මසුරුකමින්ද මේ ප්‍රමාදයෙන්ද ලෝකයතෙම නොපෙණේ. නොබබළයි නොදැනෙයි නොපෙණෙයි යනුයි.

4. "ආශාව ආලේපයයි කියමි." යන්නෙහි ආශාව නම් තෘෂ්ණාවයි. (ii) යම් රාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද, අනුව යෙදීමක් ඇද්ද, රැහැනක් වැනි රාගයක් ඇද්ද සිතේ බලවත් ආශාවක් ඇද්ද, ඉච්ඡාව, මුච්ඡාව, අජ්ඣෝසානය, ගෙධය, පලිගෙධය, සඞ්ගය, පඞ්කය, එජාව, මායාව, ජනිකාව, සංජනනිය, සිබ්බනිය, ජාලිනීය, පත්තිකාව, සූත්‍රය, විසටාව, ආයුහනිය, දුතියා පණිධිය, භවනෙත්තිය, වනය, වනථය, පණ්ඩවය, සිනෙහය, බැඳුන ආශාව, බලාපොරොත්තුව බලාපොරොත්තු බව, රූපාශාව ශබ්දාශාව, ගන්ධාශාව, රසාශාව ස්පර්ශාශාව, ලාභාශාව, ධනාශාව, ආත්මාශාව, ජීවිතාශාව, ජප්පය, පජප්පය, අභිජප්පය, ජප්නාව, ජප්පිතබව, ලොලුප්පය ලොලුප්පාහිතය, ලොලුප්පායී බව, සුචඤ්චිතතාව, සාදුකම්‍යතාව, අධර්ම රාගය, විෂම ලොභය, පත්ථනාව, පිහිනාව සම්පත්ථනාව, කාම තෘෂ්ණාව, භවතෘෂ්නාව, විභව තෘෂ්ණාව, රූපතෘෂ්ණාව, ශබ්දතෘෂ්ණාව, ගන්ධ තෘෂ්ණාව,

රස තෘෂ්ණාව ස්පර්ශ තෘෂ්ණාව, ධර්ම තෘෂ්ණාව, ඔඝය, යොගය ගන්ථය, උපාදානය ආවරණය, නීවරණය, ඡදනය, බන්ධනය, උපක්ලේශය, අනුසයය, පරියුට්ඨානය, ලතාව, වෙවිච්ඡය, දුක්ඛමූලය, දුක්ඛ නිදානය, දුක්ඛප්පසාවය, මාරපාශය, මාරබලිසය, මාරාමිෂය, මාරනිවාපය, මාරගොචරය, මාරබන්ධනය, තෘෂ්ණා නදිය, තෘෂ්ණා ජලය, තෘෂ්ණා ගරුලය, තෘෂ්ණා සමුදය, අභි ලොභය, අකුසලමූලය, මේ ජප්පයිය කියයි. ලෝකයාගේ තැවරීම එල්බීම, බැඳීම, කිලුට මෙහි වෙයි. මේ ජප්පය නමැති තෘෂ්ණාවෙන් ලොකය තැවරුණේය. විශේෂයෙන් තැවරුණේය. කිළිටිවූයේය, විශෙෂයෙන් කිළිටිවූයේය. තැවරුණේය, මිශ්‍රවූයේය. එල්බුණේය. පලිබොධ වූයේයයිද කියමි. ප්‍රකාශ කරමි. දෙශනා කරමි, පනවමි, තබමි, විවෘත කරමි, බෙදමි, ප්‍රකට කරමි, ප්‍රකාශකරමි යනුයි "ඔහුගේ දුක මහත් භය වන්නේය" යන්නෙහි දුක්ඛයනු මහානිර්දේශයේ (15-2) 'ඉපදීමෙන් කම්පාවන' යනු 'ඉපදීමේ දුකයයි' වෙනස් කොට දෘෂ්ටි විපත් දුක යන තැනට යොදාගත යුතුයි. (1889 පිට)

**5.** යම් ධර්මයන්ගේ ප්‍රකට වශයෙන් හට ගැන්ම පෙනේද, අස්තයට යාමෙන් නිරුද්ධිය පෙනේද, කර්මය හා විපාකය මිශ්‍රද විපාකය හා කර්මය මිශ්‍රද නාමය රූපය හා මිශ්‍රද රූපය නාමය හා මිශ්‍රද ජාතිය අනුව ගියේද ජරාවෙන් පෙළුනේද ව්‍යාධියෙන් මඩනා ලද්දේද, මරණයෙන් පහර ලැබුයේද, දුකෙහි පිහිටියේද ආරක්ෂා ස්ථානයක් නොවේද, පිහිට ඇති තැනක් නොවේද, පිහිට නොවන්නකි. පිහිට නොවූයේය, මේ දුකයයි කියයි. මේ දුක ලොකයාට බියකි, මහා භයකි, තීරණයකි. උපද්‍රවයකි උවදුරකි යනුයි.

## 1-3

**1.** "හැම තැන්හි තන්හා සැඩ වතුරු ශ්‍රොතයෝ ගලාබසිත්" යන්නෙහි "ශ්‍රොතය" නම් තෘෂ්ණා ශ්‍රොතය, දෘෂ්ටි ශ්‍රොතය, ක්ලේශ ශ්‍රොතය, දුශ්චරිත ශ්‍රොතය අවිද්‍යා ශ්‍රොතය යනුයි. "සෑම තැන්හි" යනු සියලු ආයතනයන්හි යනුයි. "ගලාබසිත්" යනු ගලාබසිත්, වැගිරෙත්, පවතිත් ඇසින් රූපයෝ ගලා බසිත්,

වැගිරෙත්, පවතිත් කණින් ශබ්දයෝ ගලාබසිත්, නාසයෙන් ගන්ධයෝ ගලාබසිත්, දිවෙන් රසයෝ ගලාබසිත්, ශරීරයෙන් ස්පර්ශයෝ ගලාබසිත්, සිතින් ධර්මය ගලාබසියි වැගිරෙයි, පවතියි. ඇසින් රූපතෘෂ්ණාවෝ ගලාබසිත්, වැගිරෙත්, පවතිත්, කණින් ශබ්ද තෘෂ්ණාවෝ ගලාබසිත්, වැගිරෙත්, පවතිත්, නාසයෙන් ගන්ධ තෘෂ්ණාවෝ ගලාබසිත්, වැගිරෙත් පවතිත් දිවෙන් රස තෘෂ්ණාවෝ ගලාබසිත්, වැගිරෙත්, පවතිත්, කයින් ස්පර්ශ තෘෂ්ණාවෝ ගලාබසිත්, වැගිරෙත් පවතිත් මනසින් ධර්ම තෘෂ්ණාවෝ ගලා බසිත්, වැගිරෙත්, පවතිත්, යනුයි.

2. "මෙසේ ආයුෂ්මත් අජිතතෙම කීයේය" යන්නෙහි මෙසේ යනු ස්වර සන්ධියයි. පද පිළිවෙල යෙදීමයි මේ මෙසේ යනුයි.

3. "ශ්‍රොතය (ජලපහර) වැලැක්වීම කෙසේද? යනු ශ්‍රොතයන්ගේ වැලැක්වීම කෙසේද? නිවාරණය කෙසේද? සංවරණය කෙසේද? රැකීම කෙසේද? ගොපනය කෙසේද? යනුයි. ශ්‍රොතයන්ගේ සංවරය කියනු මැනවි. යනු ශ්‍රොතයන්ගේ ආවරණය නිවාරණය සංවරණය රැකීම ගොපනය කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි. දෙශනා කරණු මැනවි. විවෘත කරණු මැනවි. බෙදනු මැනවි. ප්‍රකට කරණු මැනවි. යනුයි. "කවරකින් ශ්‍රොතයෝ වසනු ලැබේද" යනු කවරකින් ඒ ශ්‍රොතයෝ වසනු ලැබෙද්ද ගලා නොබසිද්ද, නොවැගිරෙද්ද නොපවතිත්ද යනුයි.

1-4

1. "ලෝකයේ යම් ශ්‍රොතයෝ ප්‍රකාශ කරණ ලද්දාහුද යනු යම් මේ ශ්‍රොතයෝ මා විසින් කියන ලද්දාහුද ප්‍රකාශ කරණ ලද්දාහුද දෙශනා කරණ ලද්දාහුද පනවන ලද්දාහුද තබන ලද්දාහුද විවෘත කරණ ලද්දාහුද බෙදන ලද්දාහුද ප්‍රකට කරණ ලද්දාහුද ඒ කෙසේද තෘෂ්ණා ශ්‍රොතය; දෘෂ්ටි ශ්‍රොතය, ක්ලේශ ශ්‍රොතය, දුශ්චරිත ශ්‍රොතය, අවිද්‍යා ශ්‍රොතය යනුයි. "ලොකයෙහි (ii) යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි.

2. "සිහිය ඔවුන්ගේ නිවාරණයයි" යන්නෙහි සිහිය නම් යම් සිහියක් ඇද්ද, අනුස්මෘතියක් ඇද්ද, සිහි කිරීම් බවක් ඇද්ද, දැරීම් බවක් ඇද්ද, අමතක නොකිරීම් බවක් ඇද්ද සතින්ද්‍රියක් සතිබලයක් සතිසම්බොධ්‍යංගයක් ඒකායන මාර්ගයක් ඇද්ද, මෙ සිහිය යයි කියයි. "නිවාරණය" යනු ආවරණයයි සංවරණයයි ගොතනයයි යනුයි. සිහිය ඔවුන්ගේ නිවාරණයයි. ඒ ශ්‍රොතයන්ගේ සංවරය කියමි යනු ශ්‍රොතයන්ගේ ආවරණය නිවාරණය" සංවරණය, රැකීම, ගොපනය කියමි ප්‍රකාශ කරමි ප්‍රකට කරමි පනවමි, යනුයි. "ප්‍රඥාවෙන් එය වසනු ලැබේ." යන්නෙහි ප්‍රඥානම් යම් ප්‍රඥාවක් පජානන නම් වේද, අමොහය, ධම්මවිචය සම්‍යක් දෘෂ්ටිය නම් වේද ඒ ප්‍රඥාවෙන් මේ ශ්‍රොතයෝ වසනු ලැබේ, යනු ප්‍රඥාවෙන් මේ ශ්‍රොතයෝ වසනු ලැබෙත්, නොගලත් නොවැගිරෙත් නොපවතිත්, සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (ii) දන්නාට බලන්නාහුට ප්‍රඥාවෙන් මේ ශ්‍රොතයෝ වැසෙත් නොගලත් නොවැගිරෙත්, නොපවතිත්, (iii) සියලු සංස්කාරයෝ දුක්යයි දන්නාහට බලන්නාහට ප්‍රඥාවෙන් මේ ශ්‍රොතයෝ වැසෙත් නොගලත්, නොවැගිරෙත්, සියලු සංස්කාරයෝ අනාත්ම යයි (මෙහි (ii) යොදාගත යුතුයි.) අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ වෙත්යයි සංස්කාර හේතුවෙන් විඤ්ඤාණයෝ වෙත්යයි (මෙහි (ii) යොදාගත යුතුයි.) විඤ්ඤාණ හේතුවෙන් නාමරූපයෝ වෙත්යයි (මෙහි (ii) යොදාගත යුතුයි) නාමරූප හේතුවෙන් ආයතන සය වෙත්යයි (මෙහි (ii) යොදාගත යුතුයි.) ආයතන සයේ හේතුවෙන් ස්පර්ශය වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි) ස්පර්ශහේතුවෙන් වේදනාව වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි) වෙදනා හේතුවෙන් තෘෂ්ණාව වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි) තෘෂ්ණා හේතුවෙන් දැඩිව අල්ලා ගැනීම වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි) දැඩිව අල්ලා ගැනීම හේතුවෙන් භවය වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි.) භව හේතුවෙන් ජාතිය වේයයි (මෙහි (ii) යොදාගත යුතුයි) ජාති හේතුවෙන් ජරාමරණ වෙත්යයි නුවණින් දන්නාහට දක්නාහට මේ ශ්‍රොතයෝ වසනු ලැබෙත් නොගලත් නොවැගිරෙත් නොපවතිත් අවිද්‍යා නිරොධයෙන්

සංස්කාර නිරොධය වේයයි සංස්කාර නිරොධයෙන් විඤ්ඤාණ නිරොධය වේයයි විඤ්ඤාණ නිරොධයෙන් නාම රූප නිරෝධය වේයයි නාම රූප නිරොධයෙන් ආයතනසයේ නිරොධය වේයයි ආයතන සයේ නිරොධයෙන් ස්පර්ශ නිරොධය වේයයි ස්පර්ශ නිරොධයෙන් වේදනා නිරොධය වේයයි වෙදනා නිරොධයෙන් තණ්හා නිරොධය වේයයි තණ්හා නිරොධයෙන් උපාදාන නිරොධය වේයයි උපාදාන නිරොධයෙන් භව නිරොධය වේයයි භව නිරොධයෙන් ජාති නිරොධය වේයයි ජාති නිරොධයෙන් ජරාමරණ නිරොධය වේයයි, නුවණින් දන්නා හට මේ දක්නා හට ශ්‍රොතයෝ වැසෙත් ආවරණය වෙත්, නොගලත්, නොපවතිත්, මේ දුකයයිද මේ දුක් ඇතිවීමෙ හේතුවයයිද මේ දුක්ඛ නිරොධ නම් නිවනයයිද, මේ දුක් නිරුද්ධ කිරීමට ගමන් කරණ ප්‍රතිපදාවයයිද (iv) නුවණින් දන්නා හට දක්නාහට මේ ශ්‍රොතයෝ වැසෙත්, ආවරණය වෙත්, නොගලත් නොපවතිත්, (v) මේ ආශ්‍රව නම්වූ කල්ගත කෙලෙස්යයිද, මේ ආශ්‍රව නම්වූ කල්ගත කෙලෙස් ඇතිවීම් හේතුව යයිද මේ ආශ්‍රව නිරොධයයිද (මෙහි (iv) යොදාගත යුතුයි.)

## 1-5

1. "නුවණද සිහියද යන්නෙහි "ප්‍රඥා" නම් යම් ප්‍රඥාවක් පජානන නම්වේද, විචයනම්වේද, පවිචයනම්වේද, ධර්මවිචය නම්වේද, සල්ලක්ඛණනම්වේද, උපලක්ඛණනම්වේද, පච්චුස ලක්ඛණනම්වේද, පණ්ඩිතබව, දක්ෂබව නිපුණබවවේද, වෙභව්‍ය චින්තානම්වේද, භූරි මෙධා, පරිණායිකා විපස්සනා, පතොදො, පඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබල, පඤ්ඤාසත්ථ, පඤ්ඤාපාසාද පඤ්ඤාආලොක පඤ්ඤාඕභාස පඤ්ඤා පජ්ජොත, පඤ්ඤාරතන, අමොහය, සම්මාදිට්ඨි යනුයි සිහිය නම් යම් සිහියක් සති. අනුස්සතිනම්වේද සම්මාසතිනම්වේද, ප්‍රඥාවද, සිහියද නම්වූයේද එයයි. ආයුෂ්මත් අජිතතෙම මෙසේකීය. නිදුකානෙනි. නාමරූපයද යනු නාම නම් සතර අරූපස්කන්ධයෝයි. රූපයනම් සතර මහාභූතයෝද, සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝද යනුයි. නිදුකානෙනි,' යනු ප්‍රිය වචනයයි. ගරුවචනයයි ගෞරව සහිත සැළකියයුතු වචනයයි

මේ නිදුකානෙනි, යනුයි, 'නිදුකානෙනි, නාමරූපයද යන මවිසින් මෙය විචාරණ ලද්දේ කියනු මැනවි" යනුයි. "මවිසින් මෙය" යනු යමක් විචාරම්ද, යමක් ඉල්ලම්ද, යමක් ආරාධනා කෙරෙම්ද, යනුයි. 'විචාරණ ලද්දේ' යනු යමක් ප්‍රශ්න කරණ ලද්දේ, ඉල්ලන ලද්දේ, ආරාධනා කරණ ලද්දේ යනුයි 'කියනු මැනවි' යනු කියනු මැනවි, දෙශනා කරණු මැනවි, පනවණු මැනවි, තබනු මැනවි, විවරණය කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, ප්‍රකාශ කරණු මැනවි.

**2.** "මෙය කොතැන්හි නිරුද්ධවේදැයි මා විසින් විචාරණ ලද්දේ කියනු මැනවි." යනු කොතැන්හි මෙය නිරුද්ධවේද සංසිඳේද, අස්තයට යේද, යටපත්වේද යනුයි.

**1-6**

**1.** "යම්බඳුවූ මේ ප්‍රශ්නයක් විචාළේද, "යන්නෙහි යම්බඳු මේ යනු ප්‍රඥාවද, සිහියද නාමරූපයද විචාළේද යනු විචාළේද ආරාධනා කළේද යනුයි. "අජිතය, එය තට කියමි" යන්නෙහි "ආජිත" යනු තථාගතයන් වහන්සේ ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරති. "එය" යනු ප්‍රඥාවද, සිහියද, නාමරූපයද යනුයි. "කියමි" යනු කියමි. ප්‍රකාශකරමි දෙශනාකරමි පනවමි තබමි. විවරණය කරමි බෙදමි, ප්‍රකට කරමි. යනුයි යම්තැනෙක්හි නාමයද රූපයද ඉතිරි නොකොට සංසිඳේදයන්නෙහි, නාමය යනු සතර අරූපස්කන්ධයෝයි. "රූප" යනු සතර මහා භූතයෝද, සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝද යනුයි. ඉතිරිනොකොට යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය අඩු නොකොට වට කොට ගන්නා වචනයකි. මේ ඉතිරි නොකොට යනුයි.

**2.** "විනාශවෙයි" යනු නිරුද්ධවෙයි. අස්තයටයයි සංසිඳෙයි. යනුයි. "යම් තැනෙක්හි නාමයද රූපයද ඉතිරි නොකොට විනාශවෙයි" යනු විඤ්ඤාණයාගේ නිරොධයෙන් මෙහි මෙය සංසිඳෙයි. යම් සෝවාන් මාර්ග ඥානයකින් අභිසංස්කාර විඤ්ඤාණයාගේ නිරොධයෙන් භවසතක් හැර කෙළවර නොමැති සංසාරයෙහි උපදින්නේ නම් ඒ නාමයද රූපයද

මෙහිම නිරුද්ධ වෙත්. සංසිඳෙත් අස්තයට යෙත්, විනාශවෙත්, සකෘදාගාමි මාර්ග ඥානයෙන් අභිසංස්කාර විඤ්ඤාණයාගේ නිරොධයෙන් භව දෙකක් හැර භව පසෙක්හි උපදින්නාහු නම් ඒ නාමයද රූපයද මෙහිම නිරුද්ධවෙත්. සංසිඳෙත් අස්තයට යත්. විනාශවෙත්, අනාගාමී මාර්ගඥානයෙන් අභිසංස්කාර විඤ්ඤාණයාගේ නිරොධයෙන් එක් භවයක් හැර රූප ධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි හෝ යම් කෙනෙක් උපදින්නාහු නම් ඒ නාමයද රූපයද මෙහිම නිරුද්ධවෙත්. සංසිඳෙත්. අස්තයට යත්, විනාශවෙත්, අර්හත් මාර්ග ඥානයෙන් අභිසංස්කාර විඤ්ඤාණයාගේ නිරොධයෙන් යමෙක් තුමූ උපදින්නාහුනම් ඒ නාම රූපයෝ නිරුද්ධවෙත්, සංසිඳෙත්, ආයතනයටත්, විනාශ වෙත්, අනුපාදිෂෙශ නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන්නාවූ රහතන් වහන්සේගේ අන්තිම විඤ්ඤාණයාගේ නිරොධයෙන් ප්‍රඥාවද, සිහියද නාමරූපද මෙහිම නිරුද්ධවෙත්, සංසිඳෙත් අස්තයට යත්, යනුයි.

1-7

1. "යම් කෙනෙක් විශෙෂයෙන් ක්ෂය කළ ධර්ම ඇත්තෝ වෙද්ද "යන්නෙහි" විශෙෂයෙන් ක්ෂය කළ ධර්ම ඇත්තෝ යනු අර්හත්වූ ක්ෂීණා ශ්‍රවයන් වහන්සේලා වෙති. කුමන කරුණකින් ක්ෂය කළ ධර්ම ඇත්තෝ යනු රහතන් වහන්සේලාට කියත්ද? උන්වහන්සේලා ක්ෂය කළ ධර්ම ඇත්තෝ වෙති. දැනගත් ධර්ම ඇත්තෝවෙති. සමකොට බැලූ ධර්ම ඇත්තෝ වෙත්, තීරණය කළ ධර්ම ඇත්තෝවෙත්. ප්‍රකට ධර්ම ඇත්තෝ වෙත්. වඩනලද ධර්ම ඇත්තෝ වෙත්. සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (ii) විශෙෂයෙන් ක්ෂය කළ ධර්ම ඇත්තෝ වෙත්. දැනගත් ධර්ම ඇත්තෝ වෙත් සමකොට බැලූ ධර්ම ඇත්තෝ වෙත් තීරණය කළ ධර්ම ඇත්තෝ වෙත්. ප්‍රකට කළ ධර්ම ඇත්තෝ වෙත්. වඩනලද ධර්ම ඇත්තෝ වෙත්. (iii) සියලු සංස්කාරයෝ දුක්යයි (මෙහි (ii) යෙදිය යුතුයි) සියලු ධර්මයෝ අනාත්මයයි (මෙහි (ii) යෙදිය යුතුයි.) අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්යයි (මෙහි (ii) යෙදිය යුතුයි) යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල

නිරොධය (විනාශය) පිණිස පවත්නේයයි (මෙහි (ii) යෙදිය යුතුයි.) නැවතද උන්වහන්සේලාගේ ස්කන්ධයෝ ක්ෂය කරණ ලදහ. ධාතූහු ක්ෂය කරණ ලදහ. ආයතනයෝ ක්ෂය කරණ ලදහ. ගතීහු ක්ෂය කරණ ලදහ. උත්පත්තීහු ක්ෂය කරණ ලදහ. භවයෝ ක්ෂය කරණ ලදහ. සංසාර නම් වට්ටයෝ ක්ෂය කරණ ලදහ. නැවතද උන්වහන්සේලා ස්කන්ධ කෙළවර සිටියාහුවෙති. ධාතු කෙළවර සිටියාහුවෙති. ආයතන කෙළවර සිටියාහු වෙති. ගතිකෙළවර සිටියාහු වෙති. උත්පත්ති කෙළවර සිටියාහු වෙති. ප්‍රතිසංධි කෙළවර සිටියාහු වෙති. භවකෙළවර සිටියාහුවෙති. සංසාර කෙළවර සිටියාහු වෙති. වට්ට කෙළවර සිටියාහුවෙති. අන්තිම භවයෙහි සිටියාහුවෙති. අන්තිම ශරීරයෙහි සිටියාහු වෙති. අන්තිම දෙහධරවූ අර්හත් සේක.

2. "උන්වහන්සේලාගේ සසර ගමන අවසානය. මේ අන්තිම ශරීරයයි. ජාතිමරණ සංසාරයක් නැත. උන්වහන්සේලාට නැවත ඉපදීමක් නැත." යනුයි. ඒ කාරණයෙන් රහතන් වහන්සේලාට ක්ෂය කළ ධර්ම ඇත්තෝ යයි කියත්. යම්කෙනෙක් ක්ෂය කළ ධර්ම ඇත්තෝ මෙහි බොහෝ "හික්මෙන්නෝ" යන්නෙහි කවර කරුණකින් ශෛක්ෂ නම් වේද, හික්මේහුයි කුමක හික්මේද, අධිශීලයද හික්මෙත්, අධිචිත්තයද හික්මෙත් අධිප්‍රඥාවද හික්මෙත්. මහණෙනි, අධිශීල ශික්ෂාව කවරීද? මෙහි මහණ සිල් ඇත්තේවේද ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ වාසය කරයි. ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප වරදෙහි භය දක්නා සුලු වූයේ හික්මේද? කුඩා ශීලස්කන්ධය, මහා ශීලස්කන්ධය, ප්‍රතිෂ්ඨාව, දුසිරිත්වලට ආවරණය, සංයමය, සංවරය කුසල දහම් සමාපත්තීන්ගේ උසස් බව, යන මෙය අධිශීල ශික්ෂා නමි. මහණෙනි, අධිචිත්ත ශික්ෂාව කවරීද? මෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්ව (මහා නිද්දේශයෙහි (2-4) (iii) සිට යෙදිය යුතුයි.)

3. "මහණෙනි, අධිප්‍රඥා ශික්ෂාව කවරීද? මෙහි මහණ තෙම ප්‍රඥාවෙන් යුක්තවේද ආර්යවූ උසස්වූ වැඩීම ඇති කරවන ප්‍රඥාවෙන් යුක්තවූයේ මනාකොට දුක් කෙළවර කිරීමට පැමිණියේවේද හෙතෙම මෙය දුකයයි තත්වූ පරිදි දනියි. මේ

දුක් ඇතිවීමේ හේතුවයයි මේ දුක්ඛ නිරොධයයි. මේ දුක්ඛ නිරොධය පිණිස ගමන් කරණ ප්‍රතිපදාව යයි තත්වූ පරිදි දැනගනීද, මේ ආශ්‍රවයයි මේ ආශ්‍රව ඇතිවීමයයි මේ ආශ්‍රව නිරොධයයි. මේ ආශ්‍රව නිරොධ ගාමිණී ප්‍රතිපදාවයයි තත්වූ පරිදි දැනගනියි. මේ අධිප්‍රඥා ශික්ෂාවයි මේ ශික්ෂා තුන සිහිකරමින් හික්මෙත්. දැනගන්නාහු හික්මෙත්, බලන්නාහු හික්මෙත්, සිත පිහිටුවන්නාහු හික්මෙත්, ඒ නිසා මුදන්නාහු හික්මෙත්, වීර්යය දැඩිකොට ගන්නාහු හික්මෙත්, සිහිය යොදවන්නාහු හික්මෙත්, සිත තැන්පත් කරන්නාහු හික්මෙත්, නුවණින් දැනගන්නාහු හික්මෙත්, දැනගත යුත්ත දැනගන්නාහු හික්මෙත්, මනාකොට දැනගත යුත්ත මනාකොට දැනගන්නාහු හික්මෙත් දුරු කටයුතු දෙය දුරු කරන්නාහු හික්මෙත්, වැඩිය යුත්ත වඩන්නාහු හික්මෙත්, ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහු හික්මෙත්, සමාදන්ව සිටිත්, ඒ කාරණයෙන් සෙඛයෝ (හික්මෙන්නෝ) යයි කියති.

4. "බොහෝ" යනු "මහත්වූ" යනුයි. මේ ශෛක්ෂයෝ සෝවාන් මාර්ගස්ථයෝද ඵලස්ථයෝද සකෘදාගාමී මාර්ගස්ථයෝද ඵලස්ථයෝද අනාගාමී මාර්ගස්ථයෝද ඵලස්ථයෝද රහත් මාර්ගයට පැමිණියෝද යන මොවුහු වෙති.

5. "මෙහි" යනු මේ දෘෂ්ටියෙහි, මේ කැමැත්තෙහි මේ රුචියෙහි, මේ ගැන්මෙහි, මේ ධර්මයෙහි, මේ විනයෙහි, මේ ධර්ම විනයයෙහි මේ පාවචනයෙහි මේ බ්‍රහ්ම චරියාවෙහි, මේ ශාස්තෘ ශාසනයෙහි, මේ ආත්ම භාවයෙහි, මේ මනුෂ්‍ය ලොකයෙහිම යනුයි.

6. "මවිසින් විචාරණ ලද්දේ, ප්‍රඥාවත් ඔබවහන්සේ" යනු මෙලෙස විචාරණ ලද්දේ නිදුකානෙනි, කියනු මැනව යනු ඔබ වහන්සේද ප්‍රඥා ඇත්තෙක, පණ්ඩිත කෙනෙක, නුවණැත්තෙක, ඔවුන්ගේ කියනලද ධර්මයන්ගේද, සෙඛයන්ගේද මෙබඳු පැවැත්මය මෙබඳු හැසිරීමය, මෙබඳු ගොචරය මෙබඳු විහරණයයි මෙබඳු ප්‍රතිපදාවයයි විචාරණ ලද්දේ ඉල්වනලද්දේ, ආරාධනා කරණ ලද්දේ පහදවන ලද්දේ යනුයි.

7. "කියනු මැනව" යනු කියනු මැනවි. දෙශනා කරණු මැනවි, පනවනු මැනවි. තබනු මැනවි, විවෘත කරණු මැනවි. බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, ප්‍රකාශ කරණු මැනවි යනුයි. "නිදුකානෙනි, යනු ප්‍රිය වචනයයි ගරු වචනයයි ගරු කටයුතු සැලකිය යුතු වචනයයි. මේ නිදුකානෙනි යනුයි. මා විසින් මෙබඳු ප්‍රඥාවන් ඔබවහන්සේගෙන් විචාරණලද්දේ 'නිදුකානෙනි, කියනු මැනව, යනු ඒ බ්‍රාහ්මණතෙම කීයේය.

1-8

1. "කාමයන්හි ගිජු නොවන්නේය" යන්නෙහි කාමයෝ නම් ප්‍රධාන වශයෙන් කාමයෝ දෙකොටසකි. වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද යනුයි (මහා නිර්දෙශයේ 1-1 (ii) සිට 3 ඡෙදය අවසානයට යොදාගත යුතුයි.) මොවුහු ක්ලේශ කාමයෝයයි කියත්. ගිජුකමයයි තෘෂ්ණාවට කියයි යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි.

2. "කාමයන්හි ගිජු නොවන්නේය" යනු ක්ලේශ කාමයෙන් වස්තු කාමයන්හි ගිජු නොවන්නේය. ගිජු නොවූවෙක් වන්නේය, ආරාධනය කරණ ලද්දෙක් මුදන ලද්දෙක් නොවලක්වන්නෙක්, මුදනලද වැළකීම් ඇත්තෙක් ප්‍රහීන කරණලද වැළකීම් ඇත්තෙක්, සංසිඳුන වැළකීම් ඇත්තෙක් වන්නේය. පහකළ රාග ඇත්තෙක් වන්නේය. වෙන්ව ගිය රාග ඇත්තෙක් වන්නේය. මුදනලද රාග ඇත්තෙක් වන්නේය. සංසිඳුන රාග ඇත්තෙක් වන්නේය. තෘෂ්ණාව දුරු කළේ, නිවුනේ සිහිල් වූයේ සැපත විඳින්නේ වෙයි. "බ්‍රහ්මයා බඳු කයින් වසන්නේය. සිතින්ද කැළඹීම් ඇති නොකරන්නේය" යනු සිතෙහි වන්නාවූ සිත, මන, මනස, හදය, පණ්ඩරය, මනායතනය, මනින්ද්‍රිය, විඤ්ඤාණය විඤ්ඤාණස්කන්ධය යන මනො විඤ්ඤාණ ධාතුකවූ දුශ්චරිතයෙන් සිත කැළඹුනේවේ, ලෙල දෙන්නේවේ, ගැටුනේ වේ, නොසංසිඳුනේවේ. වාග් දුශ්චරිතයෙන් මනස් දුශ්චරිතයෙන් රාගයෙන් ද්වෙෂයෙන් මොහයෙන්, ක්‍රොධයෙන්, බද්ධ වෛරයෙන් ගුණමකු කමින් ගුණවතුන් හා සමසේ

සිතීමෙන් ඊර්ෂ්‍යාවෙන් මසුරු කමින්, රැවටිල්ලෙන්, කෛරාටික කමින් තද ගතියෙන්, එකට එක කිරීමෙන්, මානයෙන් අතිමානයෙන්, මදයෙන් ප්‍රමාදයෙන් සියලු ක්ලේශයන්ගෙන්, සියලු දුශ්චරිතයන්ගෙන් සියලු දාහයන්ගෙන්, සියලු තැවිලිවලින්, සියලු අකුශල රැස්කිරීම්වලින් කැළඹුනේ වේද, ලෙලදෙන්නේවේ, ගැටුනේ වේ, නොසන්සිඳුනේ වේ, සිතින් නොකැළඹුනෙක් වන්නේය. නොසැලුනේ නොගැටුනේ භ්‍රාන්ත නොවූයේ කළඹන්නාවූ කෙලෙස් දුරු කරන්නේය. සංසිඳවන්නේය. සිත කළඹන්නාවූ කෙලෙස් වලින් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූයේ විශෙෂයෙන් වෙන්වූයේ සීමා නොකළ සිතින් වසන්නේය, යනුයි.

2. "සියලු ධර්මයන්හි දක්ෂවූයේ," යනු සියලු සංස්කාරයෝ අනිත්‍යයයි සියලු ධර්මයන්හි දක්ෂවූයේ, සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයන්හි දක්ෂවූයේ, සියලු ධර්මයෝ අනාත්මයයි සියලු ධර්මයන්හි දක්ෂවූයේ අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ වෙත්යයි සියලු ධර්මයන්හි දක්ෂවූයේ යම්කිසි හේතු ප්‍රත්‍ය ධර්මයක් ඇද්ද ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේයයි සියලු ධර්මයන්හි දක්ෂවූයේ, මෙසේද සියලු ධර්මයන්හි දක්ෂවූයේ නැවතද අනිත්‍ය වශයෙන් සියලු ධර්මයන්හි දක්ෂවූයේ දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩ වශයෙන්, විනාශවීම් වශයෙන්, පීඩා වශයෙන්, උපද්‍රව වශයෙන්, භය වශයෙන්, කරදර වශයෙන්, සෙලවීම් වශයෙන්, අස්ථිර වශයෙන්, කලක් නොපැවතීම් වශයෙන්, ආරක්ෂා ස්ථානයක් නොවීම් වශයෙන් පිහිටක් නැති වශයෙන්, හිස් වශයෙන්, තුච්ඡ වශයෙන්, ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්, ආදීනව වශයෙන්, නික්මීම් වශයෙන්, විපරිනාම ධර්ම වශයෙන්, අසාර වශයෙන් දුක්ඛ මූල වශයෙන්, වධක වශයෙන්, විභව වශයෙන් ආශ්‍රව වශයෙන්, මාරාමිෂ වශයෙන්, ජාති ධර්ම වශයෙන් ජරා ධර්ම වශයෙන්, ව්‍යාධි ධර්ම වශයෙන්, මරණ ධර්ම වශයෙන් ශොකය වැළපීම, දුක් දොම්නස්, උපායාස ධර්ම වශයෙන්, ඇතිවීම් වශයෙන්, අස්තයට යාම් වශයෙන්, රශ විඳීම් වශයෙන් ආදීනව

වශයෙන් නික්මීම් වශයෙන් සියලු ධර්මයන්හි දක්ෂවූයේ, මෙසේද සියලු ධර්මයන්හි දක්ෂ වූයේ යනුයි. නැවතද සියලු ධර්මයෝයයි ආයතන දොළසට කියත්. ඇසද, රූපයෝද, කණද ශබ්දයෝද, නාසයද ගන්ධයෝද, දිවද රශයෝද, කයද ස්පර්ශයෝද, මනසද ධර්මයෝද, යන යම් හෙයකින් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි ඡන්ද රාගය ප්‍රහීණවූයේ වේද, මුලින් ඉදුරුවේ වේද, අග සිඳි තල් ගසක් මෙන් කරණලද්දේ වේද, සම්පූර්ණයෙන් අභාවයට පත් කරණලද්දේ වේද, නැවත නූපදනා බවට පමුණුවන ලද්දේ වේද, මෙපමණකින්ද කුශල ධර්මයන්හි දක්ෂවූයේ යනුයි.

4. "මහණතෙම සිහි ඇතිව ඇවිදින්නේය" යනු කරුණු සතරකින් සිහි ඇත්තේ යනුයි. (ii) කයෙහි කය අනුව බැලීමේ සිහිය පිහිටුවන්නේ සිහි ඇත්තේ නම්. වේදනාවන්හි වේදනාව අනුව බැලීමේ සිහිය පිහිටුවන්නේ සිහි ඇත්තේ නම්. සිතෙහි සිත අනුව බලන සිහිය පිහිටුවන්නේ සිහි ඇත්තේ නම් ධර්මයන්හි ධර්මය අනුව බලන සිහිය පිහිටුවන්නේ සිහි ඇත්තේ නම්. අනිකුදු සතර කාරණයකින් සිහි ඇත්තේ නම්. නොසිහිය දුරුකරණ බැවින් සිහි ඇත්තේ නම්. සිහිය ඇති කරණ ධර්ම කරණ ලද බැවින් සිහි ඇත්තේ නම්. සිහිය නැති කරණ ධර්ම දුරුකරණ බැවින් සිහි ඇත්තේ නම්. සිහියට නිමිතිවන ධර්මයන්හි මුලා නොවීම් අර්ථයෙන් සිහි ඇත්තේ නම්. අනිකුදු සතර කාරණයකින් සිහි ඇත්තේ නම්. සිහියෙන් යුක්තවූ බැවින් සිහි ඇත්තේ නම්. සිහියෙන් වසඟවූ බැවින් සිහි ඇත්තේ නම්. සිහියෙන් ප්‍රගුණ බැවින් සිහි ඇත්තේ නම්. සිහියෙන් නොබැසීම් වශයෙන් සිහි ඇත්තේ නම්. අනිකුදු කරුණු සතරකින් සිහි ඇත්තේ නම්. සිහියෙන් යුක්ත බැවින් සිහි ඇත්තේ නම්. ශාන්තවූ බැවින් සිහි ඇත්තේ නම්. හික්මුන බැවින් සිහි ඇත්තේ නම්. ශාන්ත ධර්මයෙන් යුක්ත බැවින් සිහි ඇත්තේ නම්. බුද්ධානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. ධර්මානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. සංඝානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. ශීලානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. ත්‍යාගානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. දෙවතානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්.

ආනාපාන ස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. මරණානුස්මෘතියෙන් සිහි ඇත්තේ නම්. කායගතාසතියෙන් සිහි ඇත්තේ නම්. සම්‍යක් ස්මෘතිය, ස්මෘති සම්බොධ්‍යංගය, ඒකායන මාර්ගය, යන මෙයින් යුක්තවූයේ සිහි ඇත්තේ නම්. මෙය සිහිය යයි කියනු ලැබේ. (iii) මේ සිහියෙන් යුක්තවූයේවේද පැමිණියේ විශේෂයෙන් පැමිණියේවේද, උප ශාන්ත බැවින් යුක්තවූයේවේද, එය සිහිය යයි කියනු ලැබේ. භික්ෂුව නම් ධර්ම සතක් මිදුන බැවින් භික්ෂු නම් (මහා නිද්දෙසයේ 3-4 (1) "භික්ෂු" යනු යන තැන සිට යොදාගත යුතුයි.)

**5.** "සිහි ඇතිව භික්ෂුව ඉරියව් පවත්වන්නේය" යනු (ii) සිහි ඇතිව යන්නේය. සිහි ඇතිව සිටින්නේය, සිහි ඇතිව හිඳින්නේය, සිහි ඇතිව නිදන්නේය. සිහි ඇතිව ඉදිරියට යන්නේය. සිහි ඇතිව ආපසු එන්නේය. සිහි ඇතිව බලන්නේය. සිහි ඇතිව වටපිට බලන්නේය. සිහි ඇතිව (අතපයාදිය) හකුලන්නේය. දිගු කරන්නේය. සිහි ඇතිව දෙපට සිවුරු පාත්‍ර සිවුරු දරන්නේය. සිහි ඇතිව හැසිරෙන්නේය. ඉරියව් පවත්වන්නේය. පවතින්නේය. පාලනය කරන්නේනුයි. (iii) සිහි ඇත්තේ නම් එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**6.** ගාථා අවසානය සමගම ඔවුහු ඒ බ්‍රාහ්මණයා සමගම එකම කැමති ඇත්තෝ එක යෙදීම් ඇත්තෝ එක අදහස් ඇත්තෝ එක්බඳු ඇඳුම් ඇත්තෝ ඒ නොයෙක් දහස් ගණන් සත්වයින්ට කෙලෙස් ධූලි නැති කෙලෙස් කුණු නැති දහම් ඇස පහළවිය. යම්කිසි ඇතිවීම් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේය කියායි. ඒ බ්‍රාහ්මණයාට දැඩිව අල්ලා නොගෙන කෙලෙස් වලින් සිත මිදුනේය. අර්හත්වයා ලැබීම (ii) සමගම දළ මඬුලුද වැහැරි සිවුරුද ත්‍රිදණ්ඩාසනද කෙන්ඩිද කෙස් රැවුල්ද අතුරුදන් වූයේ මුඩු කළ හිස් ඇත්තේ කසාවත් දරා දෙපට සිවුරු පාත්‍ර සිවුරු දරා ඇඳිලි බැඳ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස මම ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමියි කීය. (iii) භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමින් සිටියේ වෙයි.

# තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර නිර්දෙශය.

## 2-1

1. "මේ ලොකයෙහි කවරෙක් සතුටුවූයේද" යනු තුෂ්ට වූයේ සන්තුෂ්ටවූයේ ප්‍රීතිවූයේ සම්පූර්ණ අදහස් ඇත්තේ යනුයි." කවරෙක් ලොකයෙහි සන්තොෂ වූයේද? මෙසේ ආයුෂ්මත් තිස්ස මෙත්තෙය්‍යතෙම කීයේය." යන්නෙහි 'මෙසේ' යනු (ii) ස්වර සන්ධියයි පද ගැලපීමයි. පදයන් පිරවීමයි අකුරු සමකිරීමයි. පද සිලිටු කිරීමයි. පද පිළිවෙල දැක්වීමයි මේ ඉති යනුයි.

2. "ආයුෂ්මත්" යනු ප්‍රිය වචනයයි. ගරු වචනයයි. ගෞරව සැළකිලි යුතු වචනයකි. මේ ආයුෂ්මත් යනුයි. 'තිස්ස' යනු තිස්ස බ්‍රාහ්මණයාගේ නාමයයි පැනවීමයි. ව්‍යවහාරයයි නිරුක්ති පදයයි. ආමන්ත්‍රණයයි. මෙත්තෙය්‍ය යනු ඒ බ්‍රාහ්මණයාගේ ගොත්‍රයයි. පැනවීම් ව්‍යවහාරයයි.

3. "කවරෙකුට කම්පාවක් නැත්තේද?" තෘෂ්ණා, කම්පාව, දෘෂ්ටි කම්පාව, මාන කම්පාව, ක්ලෙශ කම්පාව, කර්ම කම්පාව යන මේ කම්පාවෝ කවරෙකුට නැත්තේද, විද්‍යමාන නොවෙත්ද නොලැබෙත්ද ප්‍රහීණද මුලින් සිඳුනේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍ය කළේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි. "කවරෙක් අන්තදෙක දැන" යනු කවරෙක් අන්තදෙක දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි. යමෙක් උභයාන්තය දැන මධ්‍යයෙහි නොගෑවේද යනු මධ්‍යයෙහි දැන නොගෑවේද නොගෑවුනේ නොතැවරුනේ සාරා දැමූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වාසය කරයි. යනුයි.

4. "මහා පුරුෂයායයි කවරෙකුට කියයිද" යනු අග්‍ර පුරුෂයා ශ්‍රෙෂ්ඨ පුරුෂයා විශෙෂයෙන් ශ්‍රෙෂ්ඨ පුරුෂයා ප්‍රමුඛ පුරුෂයා උත්තම පුරුෂයා ප්‍රවර පුරුෂයායයි එය කියමි. එය දක්වන්නෙමි. එය ව්‍යවහාර කරන්නෙමි.

5. "ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. 'ස්වාමීනි, මහා පුරුෂයාය මහා පුරුෂයා

යයි කියයි, 'ස්වාමීනි කොපමණකින් මහා පුරුෂයායයි කියයිද?" යනුයි. ශාරිපුත්‍රය, මම මිදුන සිත් ඇති බැවින් මහා පුරුෂයයි කියමි. නොමිදුන සිත් ඇති බැවින් මම මහා පුරුෂයයි නොකියමි. ශාරිපුත්‍රය, කෙසේ මිදුන සිත් ඇත්තේවේද? ශාරිපුත්‍රය, මෙහි මහණ අධ්‍යාත්ම කයෙහි කය අනුව බලමින් වාසය කෙරේද කෙලෙස් තවන වීර්ය ඇත්තේ මනාදැනීම් ඇත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි දැඩිලෝභය හා දොම්නස හික්මවන්නේද, කය අනුව බලමින් (ii) වාසය කරන්නාවූ ඔහුගේ සිත ආශ්‍රවයන් දැඩිව නොගෙන වෙන්වෙයි. මිදෙයි. (iii) වේදනාවන්හි වේදනාවන් අනුව බලමින් (මෙහි (ii) යෙදිය යුතුයි) සිතෙහි සිත අනුව බලමින් ධර්මයෙහි ධර්මය අනුව බලමින් මෙහි (ii) යොදනු ශාරිපුත්‍රය, මෙසේ වනාහි මහණතෙම මිදුනු සිත් ඇත්තේ වෙයි. ශාරිපුත්‍රය, මිදුන සිත් ඇති බැවින් මම මහා පුරුෂයයි කියමි. නොමිදුන සිත් ඇති බැවින් මහා පුරුෂ යයි නොකියමි යනුයි.

**6.** "හෙතෙම මෙහි තෘෂ්ණාව ඉක්මවූයේය. යන්නෙහි බැසීමයයි තෘෂ්ණාවට කියයි. රාගය, බලවත් ඇල්ම, දැඩි ලොභය, ලොභය, අකුශල මූලය යනුයි. යමෙකුට මේ බැසීම නම් තෘෂ්ණාව ප්‍රහීණද මුලින් උදුරා දැමීමේද, ශාන්තද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යකළේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම බැසීම නම්වූ තෘෂ්ණාව ඉක්මවූයේය. ඈත් කළේ විශේෂයෙන් ඈත්කළේ වෙන්කළේනුයි හෙතෙම මෙහි තෘෂ්ණාව ඉක්මවූයේය යනුයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**7.** ගාථාව අවසානයේ ඒ බ්‍රාහ්මණයා සමග යම්කෙනෙක් වූවාහු නම් ඔවුන් සමග එක අදහස් ඇත්තෝ එක බෙදීම් ඇත්තෝ එක අදහස් ඇත්තෝ එක ඇඳුම් ඇත්තෝ වූහ. නොයෙක් දහස් ගණන් දෙනාට කෙලෙස් රජස් නැති කෙලෙස් කිළුටු නැති දහම් ඇස පහළවිය. ඒ බ්‍රාහ්මණයාට ආශ්‍රවයන් දැඩිව නොගෙන කෙලෙස් වලින් සිත මිදුනේය. රහත් බව ලැබීම සමගම (1-8) 6 (ii) ඡේදය යෙදිය යුතුයි.

# පුණ්ණ මානවක සූත්‍ර නිර්දෙශය

## 3-1

1. "තෘෂ්ණාව නැතිවීමෙහි මුල දක්නේ" යන්නෙහි 'එජාව' නම් තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශලමූලයක් ඇද්ද ඒ 'ඒජා' නම් තෘෂ්ණාව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ප්‍රහීණය, මුලින් සින්දේය. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේය. සම්පූර්ණ අභාවයට පමුණුවන ලද්දේය. නැවත නූපදනා බවට පමුණුවන ලද්දේය. එහෙයින් බුදුරජාණන් වහන්සේ තෘෂ්ණා නැති සේක. තෘෂ්ණාව දුරුවූ බැවින් අනෙජ නම් භාග්‍යවතුන් වහන්සේ (ii) ලාභයෙහිද කම්පා නොවෙයි. අලාභයෙහිද කම්පා නොවෙයි. කීර්තියෙහිද කම්පා නොවෙයි. අපකීර්තියෙහිද කම්පා නොවෙයි. ප්‍රශංසාවෙහිද කම්පා නොවෙයි. නින්දාවෙහිද කම්පා නොවෙයි. සැපයෙහිද කම්පා නොවෙයි. දුකෙහිද කම්පා නොවෙයි. නොසෙලවෙයි යනුයි. (iii) භාග්‍යවතුන් වහන්සේ මුල දක්නා සුළු සේක. හේතුව දක්නා සුළුසේක. නිදානය දක්නා සුළුසේක. ඇතිවීම දක්නා සුළු සේක. ආහාරය දක්නා සුළුසේක. අරමුණ දක්නා සුළු සේක. ප්‍රත්‍යය දක්නා සුළුසේක. ඇතිවීම දක්නා සුළුසේක.

2. 'අකුශලමූලයෝ' යනු ලෝභය අකුශල මූලයකි. ද්වෙෂය අකුශල මූලයකි මොහය අකුශල මූලයකි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මහණෙනි, කර්මයන්ගේ ඇතිවීම පිණිස නිදාන තුනෙකි. එනම් ලොභය කර්මයන්ගේ ඇතිවීමට නිදානයකි. ද්වෙෂය කර්මයන්ගේ ඇතිවීමට නිදානයකි. මොහය කර්මයන්ගේ ඇතිවීමට නිදානයකි. මහණෙනි ලෝභයෙන් හටගත් කර්මයකින් හෝ ද්වෙෂයෙන් හටගත් කර්මයකින් හෝ මොහයෙන් හටගත් කර්මයකින් හෝ දෙවියෝ නොපෙනෙත්. අන්‍යවූද සුගතීහු නොලැබෙත්. මහණෙනි, එසේ නමුදු ලොභයෙන් උපන් කර්මයෙන් ද්වෙෂයෙන් උපන් කර්මයෙන් මෝහයෙන් උපන් කර්මයෙන් නරකය පෙණෙයි. තිරිසන් යෝනිය පෙණෙයි. ප්‍රෙතවිෂය පෙණෙයි. යම් ඒ අනික්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුර්ගතීහුද පෙණෙත්. නරකයෙහිද තිරිසන් යොනියෙහිද, ප්‍රෙත විෂයෙහිද ආත්මභාවයක් ලැබීමද වෙයි. මේ අකුශල මුල් තුණයයි භාග්‍යවතුන් වහන්සේ දනියි. දකියි.

3. මෙසේද භාග්‍යවතුන් වහන්සේ මුල දක්නාසේක. ඇතිවීමද දක්නාසේක. කුසල් මුල් තුනෙහි අලොභය කුශල මූලයකි. අද්වෙෂය කුශලමූලයකි. අමෝහය කුශල මූලයකි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී. මහණෙනි මේ කරුණු තුණ කුශල මූලයෝ නම් වෙති. මහණෙනි, අලොභයෙන් හටගත් කර්මයෙන් අද්වෙෂයෙන් හටගත් කර්මයෙන් අමෝහයෙන් හටගත් කර්මයෙන් දෙවියෝ පෙණෙත්. මිනිස්සු පෙණෙත්. යම්බඳු අන්‍යවූද සුගතීහුද දෙව් මිනිසුන් අතර ආත්මභාව ලැබීමද පෙණෙත්. මේ තුණ කුශල මූලයෝ යයි භාග්‍යවතුන් වහන්සේ දනියි. දකියි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ මුල දක්නාසුළුසේක. ඇතිවීම දක්නාසුළු සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනාකරණලදී. මහණෙනි, යම්කිසි කුශල ධර්මයෝ ඇද්ද කුශලභාගිකයෝ ඇත්ද කුශලපාක්ෂිකයෝ ඇද්ද ඒ සියල්ලෝම අප්‍රමාදය මුල්කොට ඇත්තෝය. අප්‍රමාදය එක් තැන්කොට ඇත්තේය. ඒ ධර්මයන්ට අප්‍රමාදය ශ්‍රෙෂ්ඨයයි භාග්‍යවතුන් වහන්සේ දනියි. දකියි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ මුල දක්නාසුළුසේක. ඇතිවීම දක්නාසේක.

4. නැවතද භාග්‍යවතුන් වහන්සේ සංස්කාරයන්ගේ මුල අවිද්‍යාව යයිද විඤ්ඤාණයාගේ මුල සංස්කාරයයිද නාම රූපයාගේ මුල විඤ්ඤාණයයිද, සලායතනයාගේ මුල නාම රූපයයිද, ස්පර්ශයාගේ මුල සළායතනයයිද වේදනාවට ස්පර්ශය මුල්යයිද, තෘෂ්ණාවට වේදනාව මුල්යයිද උපාදානයට තෘෂ්ණාව මුල්යයිද, උපාදානයට භවය මුල්යයිද, ජාතිය (ඉපදීමට) භවය මුල්යයිද, ජරා මරණයට ජාතිය මුල්යයිද භාග්‍යවතුන් වහන්සේ දන්නාසේක. දක්නාසේක. මෙසේද භාග්‍යවතුන් වහන්සේ මුල දක්නා සුළුසේක. ඇතිවීම දක්නාසුළුසේක. නැවතද භාග්‍යවතුන් වහන්සේ ඇස් රෝගයන්ට ඇස මුල්යයි දනියි. දකියි. කන්

රෝගයන්ට කණ මුල්යයි නාසිකා රෝගයන්ට නාසය මුල්යයිද දිවේ රෝගයන්ට දිව මුල්යයිද, කාය රෝගයන්ට ශරීරය මුල් යයිද, චෛතසික දුක්ඛයන්ට මනස මුල් යයිද, මෙසේද භාග්‍යවතුන් වහන්සේ දනියි. දකියි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ මුල දක්නාසුළුසේක. හේතුව දක්නාසුළුසේක. නිදානය දක්නාසුළුසේක. ඇතිවීම දක්නාසුළුසේක වීම දක්නා සුළුසේක. සමුට්ඨානය (හටගැන්ම) දක්නාසුළුසේක. ආහාරය දක්නාසුළුසේක. අරමුණ දන්නාසුළුසේක. ප්‍රත්‍යය දක්නාසුලු සේක. හටගැන්ම දක්නාසුළුසේක යනුයි.

5. "ආයුෂ්මත් පුණ්ණකතෙම මෙසේ කීයේය" යන්නෙහි මෙසේ කීයේය යන්නෙහි ("ඉච්චායස්මා"යි) ස්වර සන්ධියයි. (1-1) 1 (iv) ඡේදය යෙදිය යුතුයි.) "ආයුෂ්මත් පුණ්ණක තෙම ප්‍රශ්න කිරීම ප්‍රයෝජනකොට පැමිණියේය" යනු ප්‍රශ්න කිරීමේ කැමැත්තෙන් පැමිණියේය. ප්‍රශ්න විචාරීමේ කැමැත්තෙන් පැමිණියේය. මෙසේද ප්‍රශ්න ඇසීම ප්‍රයෝජන කොට පැමිණියේය. නැවතද අසන්නන්ගේ, ප්‍රශ්න විචාරන්නන්ගේ පැමිණීම, ඉදිරියට ඒම, එළඹීම, සේවනය ඇත්තේනුයි, මෙසේද ප්‍රශ්නකිරීම ප්‍රයෝජනකොට පැමිණියේය යනුයි. නැවතද ඔබට ප්‍රශ්න පැමිණීමක් ඇත. මා විසින් විචාරණලද්ද විසඳීමටද ඒ බර ඉසිලීමටද ඔබ පොහොසත්ය.

6. "මිනිස්සුද ඍෂිවරයෝද කුමක ඇළුනෝද" යන්නෙහි කුමක ඇළුනෝද, කුමකට එළඹුනෝද යන්නෙහි "ඍෂිහු" නම් ඍෂී නම් වූ යම්කිසි ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූවෝය. ආජීවකයෝ නම් නිඝණ්ඨයෝයි. ජටාධර තාපසයෝයි. මනුජ යන්නෙන් මිනිස්සු කියත්. "ක්ෂත්‍රියයෝ බ්‍රාහ්මණයෝ දේවතාවන්ට" යන්නෙහි ක්ෂත්‍රියයෝ නම් යම්කිසි ක්ෂත්‍රිය ජාතිකයෝයි. බ්‍රාහ්මණයෝ නම් යම්කිසි අනුන් පහත්කොට සිතන බමුණෝය. දේවතාවන්ට යන්නෙහි ආජීවක ශ්‍රාවකයන්ට ආජීවකයෝ දෙවතාවෝයි. නිඝණ්ඨ ශ්‍රාවකයන්ට නිඝණ්ඨයෝ දෙවතාවෝයි. ජටිල ශ්‍රාවකයින්ට ජටිලයෝ දෙවතාවෝයි පරිව්‍රාජක ශ්‍රාවකයන්ට පරිව්‍රාජකයෝ දෙවතාවෝයි. විරුද්ධනොවූ ශ්‍රාවකයන්ට විරුද්ධ

නොවූවෝ දෙවතාවෝයි හස්තිව්‍රතය ඇතියන්ට ඇත්තු දෙවතාවෝයි. අශ්ව ව්‍රතය ඇත්තන්ට අශ්වයෝ දෙවතාවෝයි. ගව ව්‍රතය ඇතියන්ට ගවයෝ දෙවතාවෝයි. ශුනක ව්‍රතය ඇතියන්ට ශුනකයෝ දෙවතාවෝයි කාක ව්‍රතය ඇතියන්ට කාකයෝ දෙවතාවෝයි. වාසු දෙව ව්‍රතය ඇතියන්ට වාසු දෙවයා දෙවතා වෙයි බල දෙව ව්‍රතය ඇතියන්ට බල දෙවියා දෙවතාවා වෙයි. "පූර්ණභද්‍ර ව්‍රත ඇතියන්ට පූර්ණභද්‍රයා දෙවියා වෙයි. මණි භද්‍ර ව්‍රත ඇතියන්ට මණි භද්‍රයා දෙවතාවා වෙයි. අග්නි ව්‍රත ඇතියන්ට ගින්න දෙවතාවා වෙයි. නාග ව්‍රත ඇතියන්ට නාගයා දෙවතාවා වෙයි. සුපර්ණව්‍රත ඇතියන්ට සුපර්ණයා දෙවතාවා වෙයි. යක්ෂ ව්‍රත ඇතියන්ට යක්ෂයා දෙවතාවා වෙයි. අසුර ව්‍රත ඇතියන්ට අසුරයා දෙවතාවා වෙයි. ගාන්ධර්ව ව්‍රත ඇතියන්ට ගාන්ධර්වයා දෙවතාවා වෙයි. මහාරාජ ව්‍රත ඇතියන්ට මහ රජවරු දෙවතාවෝ වෙත්. චන්ද්‍ර ව්‍රතය ඇතියන්ට චන්ද්‍රයා දෙවතාවා වෙයි. සූර්ය ව්‍රතය ඇතියන්ට සූර්යයා දෙවතාවා වෙයි. ඉන්ද්‍ර ව්‍රතය ඇතියන්ට ඉන්ද්‍රයා දෙවතාවා වෙයි. බ්‍රහ්ම ව්‍රතය ඇතියන්ට බ්‍රහ්මයා දෙවතාවා වෙයි. දෙව ව්‍රතය ඇතියන්ට දෙවියා දෙවතාවා වෙයි. දිශා ව්‍රත ඇතියන්ට දිශාව දෙවතාවා වෙයි. යමෙක් යමෙකුන්ගේ දක්ෂිණාව පිළිගනීද ඔවුහු දෙවතාවෝ වෙත් යනුයි.

7. "මේ ලොකයෙහි බොහෝ යාග කළාහුය" යන්නෙහි "යාග" යයි දිය යුතු දෙයට කියයි. සිවුරු, පිණ්ඩපාත, සෙනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර, ආහාර පාන, වස්ත්‍ර යානා, මාලා, මල් සුවඳ, විලවුන්, සයනයන් ආවාස, පහන් යනුයි යාග කළාහුය යනු (ii) සිවුරු පිණ්ඩපාත, සෙනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර, ආහාර පාන, වස්ත්‍ර යානා මල් සුවඳ විලවුන් සයනයන්, ආවාස පහන් යන (iii) යාගයන් යමෙක් සොයත්ද ඔවුහු යාග කරත් යම් කෙනෙක් සිවුරු (මෙහි (ii) යෙදිය යුතුයි) යාග ද්‍රව්‍ය රැස් කෙරෙද්ද ඔවුහු යාග කරත්. යමෙක් සිවුරු පිණ්ඩපාත (මෙහි (ii) යොදාගත යුතුයි) යාග ද්‍රව්‍යයන් දෙත්ද යාග කරත්ද පරිත්‍යා කරත්ද ඔවුහුද යාග කරත්.

8. "බොහෝ" යනු මේ යාගයෝ හෝ බොහෝ වෙත්, මේ යාග කරන්නෝ හෝ බොහෝ වෙත්, මේ යාග හා යාග කරන්නෝ බොහෝ වෙත්. ක්ෂත්‍රියයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශුද්‍රයෝ හෝ ගෘහස්ථයෝ හෝ ප්‍රව්‍රජිතයෝ හෝ දෙවියෝ හෝ මිනිස්සු හෝ යන මේ යාග හා යාග කරන්නෝ හෝයි. මේ බොහෝ දන්දීමට සුදුස්සෝ හෝ මේ දන්දීමට සුදුසු බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝද දිළින්දෝද මාර්ගිකයෝද ගුණ කියා ඉල්වන්නෝද යාචකයෝද යන මෙසේ දන්දීමට සුදුස්සෝ හෝ යනුයි

9. "බොහෝ මේ ලොකයෙහි" යනු මනුෂ්‍ය ලොකයෙහියි යනුයි.

10. "මේ කාරණය විචාරමි. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කරණු මැනවි" යන්නෙහි විචාරීම නම් විචාරීම් තුනකි (ii) නොදැකි දෙය, ප්‍රකාශ කර ගැනීමේ විචාරීම, දැකීදෙය ගලපා බැලීමේ ප්‍රශ්න කිරීම, විමතිය නැතිකර ගැනීමේ ප්‍රශ්න කිරීම, යනුයි. නොදුටු දෙය ප්‍රකාශ කර ගැනීමේ විචාරීම කවරේද? ප්‍රකෘතියෙන් ලක්ෂණය නොදැනීම වේද, නොදුටු සමකොට නොබැලූ තීරණය නොකළ නොවැඩූ, ඤාණයාගේ දැකීම පිණිස සමකොට බැලීම පිණිස, තීරණය කිරීම පිණිස, ප්‍රකට කිරීම පිණිස, වැඩීම පිණිස, ප්‍රශ්න අසාද, මෙය නොදුටු දේ ප්‍රකාශ කර ගැනීමේ විචාරීමවේ.

11. "දැකී දෙය සමාන කර බැලීමේ පෘච්ඡාව කවරේද?" ප්‍රකෘතියෙන් ලක්ෂණයක් වේද ඤාණයක් වේද, දුටු සම කොට බැලූ තීරණය කළ පණ්ඩිතයන් සමග සමකර බැලීම පිණිස ප්‍රශ්න විචාරාද, මෙය දුටු දෙය සංසන්දනය කර බැලීමේ පෘච්ඡා නමි,

12. "සැකය දුරු කිරීමේ පෘච්ඡාව කවරේද?" ප්‍රකෘතියෙන් සැකයට පත්වූයේ වේද, විමතියට පත්වූයේ අදහස් දෙකක් දරන්නේ වේද, මෙසේ වේද, මෙසේ නොවේද, කෙසේ වේද, යන හෙතෙම විමතිය බිඳ දැමීම පිණිස ප්‍රශ්න විචාරයි. මේ විමතිය සිඳීමේ පෘච්ඡා නමි. මේ ප්‍රශ්න විචාරීම් තුනයි. අනිකුදු

ප්‍රශ්න තුනක් ඇත. මිනිසුන්ගේ ප්‍රශ්න නොමිනිසුන්ගේ ප්‍රශ්න නිර්මාණය කළාවූ (බුදු රූ) ආදීන්ගේ ප්‍රශ්න යනුයි.

13. "මිනිසුන්ගේ ප්‍රශ්න කවරේද?" මිනිස්සු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ විචාරත්. භික්ෂූහු විචාරති. භික්ෂුණීහු විචාරති. උපාසකවරු විචාරති. උපාසිකාවරු විචාරති, රජවරු විචාරති. රාජවංශිකයෝ විචාරති. ගන්ධර්වයෝ විචාරති, බමුණෝ විචාරති, වෛශ්‍යයෝ විචාරති, ශුද්‍රයෝ විචාරති ගෘහස්ථයෝ විචාරති. පැවිද්දෝ විචාරති, මේ මිනිසුන්ගේ ප්‍රශ්නයෝයි. "නොමිනිස් ප්‍රශ්නයෝ කවරහුද?" අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් වෙත එළඹ ප්‍රශ්න විචාරති, නාගයෝ විචාරති, සුපර්ණයෝ (ගුරුළෝ) විචාරති. යක්ෂයෝ විචාරති. අසුරයෝ විචාරති. ගන්ධර්වයෝ විචාරති. දිව්‍යමහා රජවරු විචාරති, ශක්‍රයෝ විචාරති, බ්‍රහ්මයෝ විචාරති. දෙවතාවෝ විචාරති මේ නොමිනිස් ප්‍රශ්නයෝයි.

14. "නිර්මාණය කළවුන්ගේ ප්‍රශ්නයෝ කවරහුද?" භාග්‍යවතුන් වහන්සේ මනොමයවූ සියලු අංග සම්පූර්ණ මනා ඉන්ද්‍රිය ඇති රූපයක් මවයි. ඒ නිර්මිත රූපය භාග්‍යවත් බුදුන් වෙත පැමිණ ප්‍රශ්න විචාරයි. භාග්‍යවතුන් වහන්සේ විසඳන සේක. මේ නිර්මාණය කළ වුන්ගේ පෘච්ඡාවෝයි මේ ප්‍රශ්න කිරීම් තුන වෙති.

14. නැවතද ප්‍රශ්න තුනක් වෙති. තමාට වැඩ පිණිස අසන ප්‍රශ්න, අනුන්ට වැඩ පිණිස අසන ප්‍රශ්න, තමන් අනුන් යන දෙපක්ෂයට වැඩ පිණිස අසන ප්‍රශ්න යනුයි. අනිකුදු විචාරීම් තුනක් වෙති, මෙලොව පිළිබඳ විචාරීම් පරලොව පිළිබඳ විචාරීම් මෙලොව පරලොව දෙකම පිළිබඳ විචාරීම් වෙති. නැවතද විචාරීම තුනෙකි. නිවැරදි අර්ථ ඇති පෘච්ඡාව කෙලෙස් නැති අර්ථ ඇති පෘච්ඡාව පිරිසිදු අර්ථ ඇති පෘච්ඡාව යනුයි. නැවතද විචාරීම් තුනක් වෙති. අතීත පෘච්ඡා අනාගත පෘච්ඡා වර්තමාන පෘච්ඡා යනුයි. අනිකුදු ප්‍රශ්න කිරීමෙ තුනක් වෙති. ආධ්‍යාත්මික පෘච්ඡා බාහිර පෘච්ඡා අධ්‍යාත්මික බාහිර පෘච්ඡා යනුයි.

**15.** නැවත ප්‍රශ්න කිරීම් තුනෙකි. කුශල පෘච්ඡා අකුශල පෘච්ඡා අව්‍යාකාත පෘච්ඡා යනුයි. නැවතද ප්‍රශ්න කිරීම් තුනෙකි. ස්කන්ධ පෘච්ඡා ධාතු පෘච්ඡා ආයතන පෘච්ඡා යනුයි. අනිකුදු ප්‍රශ්න කිරීම් තුනෙකි. සතිපට්ඨාන පෘච්ඡා සම්මප්පධාන පෘච්ඡා ඉද්ධිපාද පුච්ඡා යනුයි. අනිකුදු ප්‍රශ්න කිරීම් තුනෙකි. ඉන්ද්‍රිය පෘච්ඡා බල පෘච්ඡා බොජ්ක්ධංග පුච්ඡා යනුයි.

**16.** අනිකුදු ප්‍රශ්න කිරීම් තුනෙකි. මග්ගපුච්ඡා ඵල පුච්ඡා නිබ්බාණ පුච්ඡා යනුයි. ප්‍රශ්න කරමි යනු ආරාධනා කරමි. ඉල්ලමි, එය කියනු මැනවි. යනුයි 'භගවත්' යනු ගෞරව වචනයකි. (මහා නිද්දෙසයේ (7-2) 1 යෙදිය යුතුයි. 1661 පිට) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමකි මේ භගවා යනුයි.

**17.** "මෙය කියනු මැනවි" යනු කියනු මැනවි, දෙශනා කරණු මැනවි, ප්‍රකාශ කරණු මැනවි. පනවනු මැනවි. තබනු මැනවි විවෘත කරණු මැනවි. බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, යනුයි. එබැවින් බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 3-2

**1.** "බලාපොරොත්තුවෙත්" යනු (ii) රූප ලැබීම බලාපොරොත්තුවෙත්. ශබ්දය ලැබීම බලාපොරොත්තුවෙත් ගන්ධ රශ ස්පර්ශයන් බලාපොරොත්තු වෙත්. පුත්‍රයන් අඹුවන් කීර්තිය ධනය ඓශ්චර්යය ලැබීම බලාපොරොත්තු වෙත්. ක්ෂත්‍රිය මහා සාර කුලයෙහි ඉපදීම බලාපොරොත්තු වෙත්. බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි ඉපදීම බලාපොරොත්තු වෙත්. ගෘහපති මහාසාර කුලයෙහි ඉපදීම බලාපොරොත්තු වෙත්. චාතුර්මහාරාජික තාවතිංස යාම තුෂිත නිර්මානරතී පරනිර්මිත වසවර්ති යන දෙවියන් කෙරෙහි ඉපදීම බලාපොරොත්තු වෙත්. බ්‍රහ්ම කායික දෙවියන් කෙරෙහි ආත්මභාවය ලැබීම බලාපොරොත්තු වෙත්. ප්‍රාර්ථනා කරත්. ආශා කරත්.

**2.** "ස්තුති කරත්" යනු යාගයට හෝ ස්තුති කරත්. ඵලයට හෝ ස්තුති කරත්. දක්ෂිණාවෙහි හෝ ස්තුති කරත්. කෙසේ යාගයට ස්තුති කෙරෙත්ද? පිරිසිදු කොට දෙනලද්දට මනාප

කොට දෙනලද්දට ප්‍රණීත කොට දෙන ලද්දට කාලයෙහි දෙන ලද්දට කැපකොට දෙන ලද්දට දක්ෂිණාර්හයන් සොයා බලා දෙනලද්දට නිවැරදි කොට දෙනලද්දට නිතර දෙන ලද්දට පැහැදුනේය යනු සිහි කරත්. කියත්, වර්ණනා කරත්, ප්‍රශංසා කරත්, මෙසේ යාගයට ස්තුති කරත්. කෙසේ ඵලයට ස්තුති කරත්ද? මේ හේතුවෙන් රූපය ලැබීම වන්නේය. "බලාපොරොත්තුවෙත්" යන්නට "ලැබීම වන්නේය" යනු යොදා (3-2) 1 (ii) යොදාගත යුතුයි.) බ්‍රහ්ම කායික දෙවියන් කෙරෙහි ආත්ම ප්‍රතිලාභය වන්නේයයි ස්තුති කරත්, ගුණ කියත්, වර්ණනා කරත්, ප්‍රශංසා කරත්, මෙසේ ඵලයට ස්තුති කරත්, කෙසේ දක්ෂිණාවට ස්තුති කරත්ද? දක්ෂිණාර්හයෝ ජාති සම්පන්නයෝ වෙති. ඉගෙණගත්තාවූ මන්ත්‍රධරවූ වේදත්‍රයේ පරතෙරට ගියාවූ නිඝණ්ඩු කෙටුභ සහිතවූ අක්ෂර සහිත විද්‍යා ප්‍රභෙදයන්ගේද ඉතිහාසය පස්වෙනි කොට ඇති පද කාව්‍ය කරණයන්ගේද ලොකායත මහා පුරුෂ ලක්ෂණයෙහිද කෙළවරට පැමිණියාවූද රාගය දුරු කළාවූ හෝ රාගය දුරු කිරීමට පිළිපදින්නාවූ හෝ ද්වෙෂය දුරු කළාවූ හෝ ද්වෙෂය දුරු කිරීමට පිළිපදින්නාවූ හෝ මොහය පහවූ හෝ මෝහය දුරු කිරීමට පිළිපදින්නාවූ හෝ ශ්‍රද්ධා සම්පන්නවූ හෝ ශීල සම්පන්නවූ හෝ සමාධි සම්පන්නවූ හෝ ප්‍රඥා සම්පන්නවූ හෝ විමුක්ති සම්පන්නවූ හෝ විමුක්ති ඥාන දර්ශන සම්පන්නවූ හෝ යයි ස්තුති කරත්, ගුණ කියත්, වර්ණනා කරත්. ප්‍රශංසා කරත්, මෙසේ දක්ෂිණාර්හයන් කෙරෙහි ස්තුති කරත්, කථාකරත්. රූපය ලැබීම ගැන කථා කරත්. ශබ්ද ප්‍රතිලාභය ගැන කථා කරත්. ගන්ධ ප්‍රතිලාභය ගැන කථා කරත්. රස ප්‍රතිලාභය ගැන කථා කරත්, 'බලාපොරොත්තුවෙත්' යන්නට 'ගැන කථා කරත්' යනු යොදා (3-2) 1 (ii) යෙදිය යුතුයි.) බ්‍රහ්ම කායික දෙවියන් කෙරෙහි ආත්ම ප්‍රතිලාභය ගැන කථා කරත්. විශෙෂයෙන් කථා කරත්, යනුයි. "භාග්‍යවතුන් වහන්සේ, පුණ්ණකය, යාග කෙරෙත්" යන්නෙහි පරිත්‍යාග කරත්, දෙත්, සිවුරු පිණ්ඩපාත ගිලන්පස බෙහෙත් පිරිකර, ආහාර, පාන, වස්ත්‍ර, යාන මාලා, සුවඳ විලවුන්, සයන, ආවාස, පහන් බලාපොරොත්තුවෙත්, යනුයි.

3. "ලාභය (ලැබීම) නිසා කාමයෝ බලාපොරොත්තු වෙත්." යනු රූපය ලැබීම නිසා කාමයෝ බලාපොරොත්තු වෙත්. ශබ්දය ලැබීම නිසා කාමයෝ බලාපොරොත්තුවෙත්. (3-1) 1 (ii) යෙදිය යුතුයි.) බ්‍රහ්ම කායික දෙවියන් කෙරෙහි ආත්ම ප්‍රතිලාභය පිණිස කාමයෝ බලාපොරොත්තුවෙත්.

4. "යාග කරන්නාවූ භව රාගයෙහි ඇළුනාවූ ඔවුහු ජාති ජරාවන් එතර නොකළාහුය." යන්නෙහි ඔවුහු යනු යාග කරන්නෝ කියත්. යාගයෙහි යෙදුනෝ යනු යාග යෙදීම්වල යුක්තවූවෝ නියුක්තවූවෝ යෙදුනෝ එය චරිත කොට ඇත්තෝ එය බහුලකොට ඇත්තෝ එය ගරුකොට ඇත්තෝ, එයට නැමුනෝ, එහි ඇළුනෝ එය අධිපති කොට ඇත්තෝ, යනුයි.

5. "භව රාගයෙහි ඇළුනෝ," යන්නෙහි භව රාගය නම් භවයන්හි යම් භවාශාවක් භව කැමැත්තක්, භව බන්ධනයක්, භව තෘෂ්ණාවක්, භව ස්නෙහයක්, භව පරිඩාහයක් ඇද්ද භව මූර්ඡාවක් ඇද්ද, භවයන්හි ගැලීමක් ඇද්ද, භව රාගයෙන් භවයන්හි ඇලීමක් ඇද්ද, ගිජුවීමක් මූර්ඡා වීමක් ලැගීමක්, එරීමක් ඇද්ද එයයි.

6. "යාගයෙහි යෙදුනාවූ භවයෙහි ඇළුනාවූ ඔවුහු ජාති ජරාවන් තරණය නොකරත්යයි කියමි" යනු ඒ යාගයෙහි යෙදුනාවූ භව රාගයෙහි ඇළුනාවූ ඔවුහු ජාති ජරා මරණයෙන් තරණය නොකරත්, නොඉක්මවත්, ජාති මරණයෙන් නොනික්මුනෝ වෙත්. නොවූවෝ නොසන්සිඳුනෝ ජාති ජරා මරණයන් ඇතුළත පෙරළෙත්. සංසාර මාර්ගය ඇතුළත පෙරළෙත්. (ii) ජාතියෙන් (ඉපදීමෙන්) යුක්තවූවෝ ජරාවෙන් විසුරුණෝ, ව්‍යාධියෙන් මැඩුනෝ මරණයෙන් වැටුනෝ ආරක්ෂාවක් නැත්තෝ පිහිටක් නැත්තෝව වෙසෙත්යයි කියමි. දෙශනා කරමි. පනවමි. තබමි. විවෘත කරමි, බෙදමි, ප්‍රකට කරමි, ප්‍රකාශ කරමි, යනුයි.

3-3

1. "ඒකාන්තයෙන් ඒ යාගයෙහි යෙදෙන්නෝ තරණය නොකරත්" යනු ඒ යාග යොදන්නෝ භව රාගයෙහි ඇළුනෝ

ජාති ජරා මරණය එතර නොකරත්. නොඉක්මවත්. ජාති ජරා මරණය නොඉක්මවූවාහු, නොසන්සිඳුනාහු වෙන් නොකළාහු, ජාති ජරා මරණය ඇතුළත පෙරළෙත් සංසාර මාර්ගය ඇතුළත පෙරළෙත්. (3-2) 6 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**2.** "නිදුකාණෙනි, යාගයන්ගෙන් ජාතියද ජරාවද යන්නෙහි" යාගයන්ගෙන් යනු, බොහෝ යාගයන්ගෙන් වෙන්ව යනුයි. (ii) 'නිදුකාණෙනි' යනු ප්‍රිය වචනයයි ගරු වචනයයි, ගෞරව සැළකිලි වචනයයි. මේ මාරිස (නිදුකාණනි) යනුයි. (iii) ඉක්බිති දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි හැසිරෙන්නේ ජාතියද ජරාවද තරණය කළේය. නිදුකාණෙනි, යනු ඉක්බිති මේ තෙම දෙවියන් සහිත ලොකයෙහි මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි ජාති ජරා මරණය තරණය කළේය, එතර කළේය මාරිස, යනු (මෙහි (ii) යෙදිය යුතුයි.)

**3.** "එය භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරමි. දෙශනා කරණු මැනවි," යන්නෙහි 'එය විචාරමි' යනු එය විචාරමි, එය ඉල්ලමි, එය දෙශනා කරණු මැනවි. එය විචාරමි. මට දෙශනා කරණු මැනවි. 'භගවත්' යනු ගෞරව වචනයයි කියනු මැනවි. 'දෙශනා කරණු මැනවි' පනවනු මැනවි තබනු මැනවි යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීයේය.

## 3-4

**1.** "ලොකයෙහි තමාට අයත්වූද අනුන්ට අයත්වූද ආත්මභාවයන් දැන" යන්නෙහි 'දැන' යනු ඥානයට කියයි යම් ප්‍රඥාවක් පජානන නම් වේද (මහානිද්දෙසයේ (2-8) 10 ඡේදයේ 'යම් ප්‍රඥාවක්' යන තැන සිට 14 ඡේදය අවසානය දක්වා යොදාගත යුතුයි.) සම්‍යක් දෘෂ්ටිය යනුයි. 'තමන්ට අයත්වූද අනුන්ට අයත්වූද, යන්නෙහි 'ඔර' (තමාට අයත්) යයි ස්වකීය ආත්මභාවයට කියයි. "පාරයයි" අන්‍ය ආත්මභාවයට කියයි එසේම 'ඔර' යයි ස්වකීය රූප වෙදනා සඤ්ඤා සංඛාර, විඤ්ඤාණයන්ට කියයි 'පාර' යයි අනුන්ට අයත් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤානයන්ට කියයි. 'ඔර' යයි අධ්‍යාත්මික ආයතන සයට කියයි. 'පාර' යයි බාහිර ආයතන සයට කියයි.

ඔර යයි මනුෂ්‍ය ලොකයට කියයි. පාරයයි දිව්‍ය ලොකයට කියයි. 'ඔර' යයි කාම ධාතුවට කියයි. 'පාර' යයි රූප ධාතුවට හා අරූප ධාතුවට කියයි 'තමාට අයත්වූද අනුන්ට අයත්වූද ආත්මභාවයන් දැන යන්නෙහි තමාට අයත්වූද අනුන්ට අයත්වූද ආත්මභාවයන් අනිත්‍ය වශයෙන් සංස්කාර දුක් වශයෙන් රොග වශයෙන් ගඩවශයෙන් (මහා නිද්දෙසයේ (11-11) 5 (iv) 'රූප ප්‍රකට වෙයි' යන තැනට යොදාගත යුතුයි.) නික්මීම් වශයෙන් දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

2. "යමෙකුට ලොකයෙහි කිසිතැනක කම්පාවක් නැද්ද" යන්නෙහි යමෙකුට යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. 'කම්පාවක්' යනු තෘෂ්ණා කම්පාව, දෘෂ්ටි කම්පාව, මාන, කම්පාවක් ක්ලෙශ කම්පාව කර්ම කම්පාව යන මේ කම්පාවීම් නැත. නොලැබෙත්, නූපදිත්, ප්‍රහීනය මුලින් සිඳුනේය සන්සිඳුනේය. ඉපදීමට අයොග්‍යය. ඥානය නැමති ගින්නෙන් දැවුනේය යනුයි. 'කිසි තැනක' යනු කිසියම් තැනක අධ්‍යාත්මයෙහි හෝ බාහිර හෝ අධ්‍යාත්ම බාහිර හෝ යනුයි. 'ලොකයෙහි' යනු අපාය ලොකයෙහි (1-1) 1 (i) ඡේදය යොදාගත යුතුයි) 'ශාන්තවූ දුශ්චරිතාදී දුම්නැති රාගාදී දුක් නැති ආශාරහිත හෙතෙම ජාති ජරාව තරණය කළේය කියමි. යන්නෙහි 'ශාන්ත' නම් රාගය සන්සිඳුන බැවින් ශාන්ත නමි. ද්වෙෂය මොහය, ක්‍රොධය, ගුණමකුකම බද්ධ වෛරය (මහා නිද්දෙසයේ (3-4) 2 රාගය යන තැන සිට යෙදිය යුතුයි.) සියලු අකුශල් රැස්කිරීම්වල ශාන්ත බව ඇති බැවින් සංසිඳුනේ නිවුනේය. දුරුකළ බැවින් නිවුන බැවින් ශාන්තය, උපශාන්තය එබැවින් සන්සිඳුනේය, එබැවින් ශාන්ත නමි.

3. "කෙලෙස් දුම් නැති" යනු කායදුශ්චරිතය දවන ලදී. වියලවන ලදී. සන්සිඳුවන ලදී. වාග් දුශ්චරිතය මනස් දුශ්චරිතය දවන ලදී. වියලවන ලදී, රාගය, මොහය ද්වෙෂය, දවන ලදී. වියලවන ලදී. විශේෂයෙන් වියලවනලදී ක්‍රොධය, බද්ධ වෛරය ගුණමකුකම, ගුණවතුන් තමා හා සම කිරීම, ඊර්ෂ්‍යාව, මසුරුකම,

රැවටිල්ල, කෛරාටිකකම, තදගතිය, එකට එක කිරීම, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, සියලු කෙලෙස් සියලු දුශ්චරිත සියලු පීඩා සියලු දැවිලි, සියලු තැවිලි, සියලු අකුශල රැස්කිරීම් දවන ලදී. වියලන ලදී. සංසිඳුවන ලදී. නැවතද ක්‍රොධය දුමයයි කියයි.

4. "බ්‍රාහ්මණය, තට ක්‍රොධය කෑම සපයන ගෙය වේ. ක්‍රොධය දුමයි. මුසාවාදය පහත් බවයි. දිව පූජාවයි. හෘදය උපදනා තැන වේ. මනාව දෙන්නාවූ පුරුෂයාට අර්ථයෝ බැබලීම වෙත්. නැවතද දශාකාරකින් ක්‍රොධය උපදියි. (ii) මට අනර්ථයක් කළේයයි ක්‍රොධය උපදියි. මට අනර්ථ කෙරේයයි ක්‍රොධය උපදියි. මට අනර්ථයක් කරන්නේයයි ක්‍රොධය උපදියි. මාගේ ප්‍රිය මනාපයාට (මිත්‍රයාට) අනර්ථයක් කෙළේයයි ක්‍රොධය උපදියි. කෙරේයයි කරන්නේයයි ක්‍රොධය උපදියි. මාගේ සතුරාට වැඩක් කෙළේයයි කෙරේයයි කරන්නේයයි ක්‍රොධය උපදියි. අස්ථානයෙහිද ක්‍රොධය උපදියි මෙබඳුවූ යම් සිතේ ක්‍රොධයක් ප්‍රතිවිරොධයක් කෝපයක් ප්‍රතිකෝපයක් ද්වෙෂයක් කිපීමක් ව්‍යාපාදයක් විරොධයක් ප්‍රති විරොධයක් චණ්ඩගතියක් කඳුළු හෙලීමක් සිතෙහි නොසතුටු බවක් ඇද්ද, මේ ක්‍රොධයයි කියයි. නැවතද ක්‍රොධයාගේ උසස් බව හා පහත් බව දතයුතුයි. කිසි කලෙක ක්‍රොධය සිත අවුල් කිරීම පමණකට වෙයි. ඒතාක් මුහුණ නොහැකුලුනේ වෙයි. කිසි කලෙක ක්‍රොධය මුහුණ හැකිලීම් පමණකට වෙයි. ඒතාක් හනු හැකිලීම නොවෙයි.

5. සමහර කලෙක ක්‍රොධය හනු හැකිලීම් පමණකට වෙයි. ඒතාක් නපුරු වචන නිකුත් නොවෙයි. සමහර කලෙක ක්‍රොධය නපුරු වචන නිකුත් කිරීම් පමණකට වෙයි. ඒතාක් ඒ මේ අත නොබැලීම වෙයි. කිසි කලෙක ක්‍රොධය ඒ මේ අත බැලීම් පමණකට වෙයි. ඒතාක් දණ්ඩක් ආයුධයක් අතගෑම නොවෙයි, කිසි කලෙක ක්‍රොධය දණ්ඩක් ආයුධයක් අතගෑම් පමණකට වෙයි. ඒතාක් දණ්ඩක් හෝ ආයුධයක් ඉස්සීම නොවෙයි. කිසි කලෙක ක්‍රොධය දණ්ඩක් ආයුධයක් ඉස්සීම පමණකට වෙයි. ඒතාක් දණ්ඩක් හෝ ආයුධයක් විසි කිරීම නොවෙයි. කිසි

කලෙක ක්‍රොධය දණ්ඩක් හෝ ආයුධයක් විසි කිරීම් පමණකට වෙයි, ඒතාක් මත්තෙහි හෙලීම නොවෙයි. කිසි කලෙක ක්‍රොධය දණ්ඩක් ආයුධයක් මත්තෙහි හෙලීම් පමණකට වෙයි. ඒතාක් සිඳීම් බිඳීම් නොවෙයි. කිසි කලෙක ක්‍රොධය සිඳීම් බිඳීම් පමණකට වෙයි. ඒතාක් පැලීම් ආදිය නොවෙයි. කිසි කලෙක ක්‍රොධය දඬු ආදියෙන් ගසා පැලීම් ආදියකට වෙයි. ඒතාක් අඟපසඟ කැඩීම් ආදියක් නොවෙයි. කිසි කලෙක ක්‍රොධය අඟපසඟ කැඩීම් ආදියකට පමණක් වෙයි. ඒතාක් දිවි තොරකිරීම (මැරීම) නොවෙයි. කිසි කලෙක ක්‍රොධය දිවි තොර කිරීම් පමණකට වෙයි. ඒතාක් සියල්ලම පරිත්‍යාග කිරීම නොවෙයි. යම් පරිද්දෙකින් ක්‍රොධය අන්‍ය පුද්ගලයා නසා තමාද නසාද මෙපමණකින් ක්‍රොධය දැඩි වූයේ ඉතා මහත් බවට පැමිණියේ වෙයි. යමෙකුට ඒ ක්‍රොධය ප්‍රහීනද මුලින් සිඳුනේද ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම දුම් නොගසන්නේ වෙයි. ක්‍රොධය ප්‍රහීනවූ බැවින් ක්‍රොධයට සතුරා දැනගත් බැවින් දුම් නොගසන්නේ වෙයි. ක්‍රොධ හෙතුව බිඳ දැමූ බැවින් දුක් නැත්තේ ආශා නැත්තේ ක්‍රොධය ඉක්මවූයේ ද්වෙෂය ඉක්මවූයේ මොහය ඉක්මවූ (දවනලදී යනු ඉක්මවූයේ යනු යොදා (3-4) 3 ක්‍රොධය යන තැන සිට යොදාගත යුතුයි.) සියලු අකුසල රැස්කිරීම් ඉක්මවූයේ මුලින් සිඳ දැම්මේ සංසිඳවූයේ ඉපදීමට අයොග්‍යවූයේ ඥානය නමැති ගින්නෙන් දැවුනේනුයි හෙතෙම නිරාසායයි කියයි. "ආශා රහිතවූයේ" යන්නෙහි ආශායයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුසල මූලයක් ඇද්ද යමකුට මේ ආශා නම් තෘෂ්ණාව ප්‍රහීනද මුලින් සිඳුනේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම පීඩා රහිත යයිද ආශා රහිතයයිද කියයි.

**6.** "ඉපදීම්" යනු ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායයන්හි යම් ඉපදීමක් ඇද්ද, ඇතිවීමක් ඇද්ද බැස ගැනීමක් ඇද්ද, ස්කන්ධන්ගේ පහළවීමක් ඇද්ද ආයතනයන්ගේ ඇතිවීමක් ඇද්ද, එයයි.

7. "ජරාව" නම් ඒ ඒ සත්වනිකායයෙහි ඒ ඒ සත්වයන්ගේ ජරාවක් ඇද්ද, දිරීම් බවක් ඇද්ද, දත් වැටීමක් හිසකේ සුදුවීමක් ඇඟ රැලිවැටීමක් ඇද්ද ආයුෂයාගේ ගෙවීමක් ඉන්ද්‍රියයන්ගේ මේරීමක් ඇද්ද එය ජරාව නමි.

8. "ශාන්තවූ දුම් නැත්තාවූ පීඩා නැති ආශා රහිත හෙතෙම ජාති ජරා මරණයන් එතර කළේය. ඉක්ම වූයේයයි කියමි, ප්‍රකාශ කරමි, දෙශනා කරමි, පනවමි. තබමි, විවෘත කරමි, ගාථාවන්ගේ අවසානයෙහිම (1-8) 6 යොදාගත යුතුයි.) ඇඳිලිබැඳ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමින් ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමියි කීයේය.

## මෙත්තගූ මානවක සූත්‍ර නිර්දෙශය

### 4-1

1. "මෙය විචාරමි, භාග්‍යවතුන් වහන්සේ දේශනා කරණු මැනවි. යන්නෙහි ප්‍රශ්න කිරීම් තුනකි (3-1) 10, 11, 12, 13, 14, 15 ඡෙද යෙදිය යුතුයි.

"භාග්‍යවත්" යනු ගෞරව වචනයකි. (මහා නිද්දේශයේ (7-2) 1 භාග්‍යවතුන් වහන්සේ යනු යන තැන සිට යොදාගත යුතුයි. 1731 පිට) ඔබ වහන්සේ වඩනලද ආත්මභාවය ඇත්තෙක්වේද, දන්නෙකැයි දනිමි. වේදගූයයි ඔබවහන්සේ දනිමි. වඩනලද ආත්මභාවය ඇත්තේයයි දනිමි. අවබොධ කරමි. වඩනලද ආත්මභාවය ඇත්තෙක, වේද දන්නෙකැයි යන්නෙහි වේද යයි සතර මාර්ගයන්හි ඥානයට කියයි ප්‍රඥාව, පංචෙන්ද්‍රිය, ප්‍රඥාබලය, මහානිද්දේශයේ (4-5) 3 (ii) යෙදිය යුතුයි.) ධම්මවිචය සම්බොජ්ක්ධංගය, වීමංසාව, විපස්සනාව සම්‍යක් දෘෂ්ටිය යනුයි. භාග්‍යවතුන් වහන්සේ ඒ වෙදයන්ගෙන් ජාති ජරා මරණයාගේ කෙළවරට වැඩියසේක. අවසානයට වැඩියසේක, අන්තයට වැඩියසේක, ආරක්ෂාවට වැඩිය සේක, පැමිණි සේක, නිර්භය බවට වැඩියසේක, පැමිණිසේක, මිදීමට වැඩියසේක, අමෘතයට වැඩියසේක, පැමිණිසේක, නිවනට වැඩියසේක, පැමිණිසේක, වේදයන්ගේ අන්තයට ගියේනුයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වේදගූ නම්වේ. වේදයන්ගෙන් හෝ අන්තයට ගියේනුයි වෙදගූ නම්වේ.

**2.** කෙසේ භාග්‍යවතුන් වහන්සේ වඩනලද ආත්මභාව ඇතිසේක්ද, භාග්‍යවතුන් වහන්සේ වඩනලද කය ඇතිසේක. වඩනලද ශීලය ඇතිසේක. වඩනලද ජරා මරණය ඇතිසේක. වඩනලද සිත ඇතිසේක. වඩනලද ප්‍රඥාව ඇතිසේක. වඩන ලද සිහිය පිහිටුවීම ඇතිසේක. වඩනලද සම්‍යක් ප්‍රධානය ඇතිසේක. වඩනලද ඍද්ධිපාද ඇතිසේක. වඩනලද ඉන්ද්‍රිය ඇතිසේක. වඩනලද බල ඇතිසේක. වඩනලද බොජ්ක්ධංග ඇතිසේක. වඩනලද මාර්ගය ඇතිසේක. ප්‍රහීන කෙලෙස් ඇතිසේක. ලබනලද ස්ථිරගති ඇතිසේක. ප්‍රත්‍යක්ෂ කළ නිරොධය ඇතිසේක. උන්වහන්සේ දුක මනාකොට දැන ගන්නා ලදී. තෘෂ්ණාව ප්‍රහීනකරණ ලදී. මාර්ගය වඩනලදී. නිරොධය ප්‍රත්‍යක්ෂ කරණ ලදී. දැනගතයුත්ත දැනන්නාලදී. විශෙෂයෙන් දැනගත යුත්ත විශෙෂයෙන් දැනගන්නාලදී. ප්‍රහීන කළයුතු දෙය ප්‍රහීණකරණ ලදී. වැඩියයුත්ත වඩන ලදී. ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂකරණ ලදී. විශාලය ගැඹුරුය. ප්‍රමාණයක් නොමැත දුකසේ දතයුතුය. බොහෝවූ රත්නසාරයක් බඳුය, උපෙක්ෂා සිතින් යුක්තය. ඇසින් රූපය දැක සතුටු ඇත්තේ නොවේ. සතුටු නැත්තේ නොවේ. මැදහත්ව සිහි ඇතිව යහපත් නුවණින් සිටිනසේක. කණින් ශබ්දය අසා නාසයෙන් සුවඳ දැන දිවෙන් රසය විඳ කයින් ස්පර්ශයකොට සිතින් ධර්මය දැන සතුට ඇත්තේ නොවෙයි. සතුට නැත්තේ නොවෙයි මැදහත්ව සිහි ඇතිව සිටිනසේක. ඇසින් රූපය දැක මන වඩන්නාවූ රූපයෙහි නොඇලෙයි. පිළිකුල් නොකරයි. රාගය නූපදවයි. උන්වහන්සේගේ කය සිටි පරිදිමවේ. සිත සිටිපරිදිමවේ. ඇසින් රූපය දැක අමනාපයක් හැකුළුනු මුහුණක් ඇත්තේ නොවෙයි. කැළඹුන සිත් ඇත්තේ නොවෙයි. අධ්‍යාත්මය මනාව පිහිටියේය. කණින් ශබ්දය අසා නාසයෙන් සුවඳ දැන දිවෙන් රසය විඳ කයින් ස්පර්ශයකොට සිතින් ධර්මය දැන ප්‍රිය උපදවා නොඇලෙයි. පිළිකුල් නොකරයි. රාගය නූපදවයි. උන්වහන්සේගේ ශරීරය සිටිපරිදිම වෙයි.

අධ්‍යාත්මය මනාව පිහිටියේ වෙයි. සිතින්ද වනාහි ධර්මය දැන අමනාපයක් මුහුණ හැකිලීමක් නොවෙයි. කැළඹුන සිත් ඇත්තේ නොවෙයි. අධ්‍යාත්මය මනාව පිහිටියේය. ඇසින් රූපය දැක (ii) ඇලීම් කටයුත්තෙහි නොඇලෙයි. දූෂ්‍යවිය යුත්තෙහි දූෂ්‍ය නොවෙයි. කෝප වියයුත්තෙහි කෝප නොවෙයි. කිළුටුවිය යුත්තෙහි කිළුටු නොවෙයි. (iii) කණින් ශබ්දය අසා (මෙහි (ii) යෙදිය යුතුයි.) සිතින් ධර්මය දැන (මෙහි (ii) යෙදිය යුතුයි) දුටු දෙයෙහි දුටු මාත්‍ර ඇත්තේ ඇසූ දෙයෙහි ඇසූ මාත්‍ර ඇත්තේ ස්පර්ශ කළ දෙයෙහි ස්පර්ශ කළ මාත්‍ර ඇත්තේ දැනගත් දෙයෙහි දුටු දෙයෙහි නොඇලෙයි. ඇසූ දෙයෙහි නො ඇලෙයි. ඉන්ද්‍රිය තුනකින් ගත් දෙයෙහි නොඇලෙයි. දැනගත් දෙයෙහි නොඇලෙයි. කෙලෙස් වශයෙන් නොගන්නේ අත්හැරියේ. නොබැඳුනේ වෙන්වූයේ සීමා නොකළ සිතින් වාසය කරයි. ඇසූ දෙයෙහි ස්පර්ශ කළ දෙයෙහි දැනගත් දෙයෙහි කෙලෙස් වශයෙන් නොගන්නේ (මෙහි (ii) යෙදිය යුතුයි.) සීමා නොකළ සිතින් වසයි. භාග්‍යවතුන් වහන්සේ ඇසින් රූපය දකියි. භාග්‍යවතුන් වහන්සේට රූපය ගැන ඡන්දරාගයක් නැත. සිත මනා කොට මිදුනේය. භාග්‍යවතුන් වහන්සේට කණ ඇත. කණින් භාග්‍යවතුන් වහන්සේ ශබ්ද අසා ඡන්දරාග වශයෙන් නොගනියි. මිදුන සිත ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේට නාසය ඇත. භාග්‍යවතුන් වහන්සේ නාසයෙන් සුවඳ දැන ගනියි. එහි ඡන්දරාගයක් භාග්‍යවතුන් වහන්සේට නැත. මනාව සිත මිදුනේය. භාග්‍යවතුන් වහන්සේට දිව ඇත, දිවින් රසය විඳියි. එහි ඡන්ද රාගය නැත. මනාව සිත මිදුනේය. භාග්‍යවතුන් වහන්සේට කය විද්‍යමානය භාග්‍යවතුන් වහන්සේ කයින් ස්පර්ශය විඳියි. උන්වහන්සේට ස්පර්ශය පිළිබඳ ඡන්ද රාගය නැත. භාග්‍යවතුන් වහන්සේ මනාව මිදුනසේක. භාග්‍යවතුන් වහන්සේට මනස විද්‍යමානය භාග්‍යවතුන් වහන්සේ මනසින් ධර්මය දනියි. ඒ පිළිබඳ ඡන්දරාගය නැත, ඇස රූපයෙහි ඇළුනේය, රූපය දන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ඇස දැමුනේය. ගුප්තය, රැකුනේය, සංවරය, ඒ ඇසේ සංවරය පිණිස ධර්මය දේශනා කරයි. කණ ශබ්දයෙහි ඇළුනේය, නාසය

ගන්ධයෙහි ඇළුනේය. දිව රසයෙහි ඇළුනේය, ඒ රසයෝ භාග්‍යවතුන් වහන්සේට දැමුනාහ, රැකුනාහ. සංවරණයහ. ඒ දිවේ සංවරණය පිණිස ධර්මය දෙශනා කරයි. කය ස්පර්ශයෙහි ඇළුනේය. මනස ධර්මයෙහි ඇළුනේය. භාග්‍යවතුන් වහන්සේට ඒ මනස දැමුනේ ආරක්ෂාවූයේ රැකුනේ සංවරණය වුයේ ඒ මනසේ සංවරය පිණිස ධර්මය දෙශනා කරයි.

3. "දැමුනාහු සභාවට පමුණුවයි. දැමුනහු පිටට රජු නගියි යමෙක් අනුන්ගේ නපුරු වචන ඉවසාද, මිනිසුන් අතර දැමුනාහු ශ්‍රෙෂ්ඨයි."

"අස්වතරයා දැමුනේ උතුම්. ආජානීය අශ්වයෝද දැමුනාහු උතුම්වෙති. කුඤ්ජරනම් මහ ඇතාද දැමුනේ උතුම්වේ. එයට වඩා තමා දමනය කරගැනීම උතුම්වේ. මේ යානයන්ගෙන් අමෘතය නම් නිවන දෙසට යා නොහැකිවේ. යම්හෙයකින් තමා හික්මුන තැනැත්තේ හික්මුනහු වෙයි. හික්මුන භූමියට පැමිණි මිදුනසිත් ඇත්තෝ නැවත භවයකට නොපැමිණෙත්.

4. "යමෙකු විසින් ආධ්‍යාත්මිකවූද බාහිරවූද සියලු ලොකයෙහි ඉන්ද්‍රියයන් පුරුදුකළේද හෙතෙම මේ ලොවද පරලොවද හැර (පිරිනිවන් කාලය) බලාපොරොත්තුවෙයි." දැමුනේ යනු මෙසේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ වඩන ලද ආත්ම භාව ඇත්තේයයි වෙදය දන්නේයයි දනිම්. "කෙසේ දුක් ඇතිවන්නේද" යන්නෙහි කෙසේද? යනු සංසය පුච්ඡා විමති පුච්ඡා, මෙළ්හක පුච්ඡා, අනෙකංස පුච්ඡා මෙසේද මෙසේ නොවේද? කුමක්වේද? කෙසේවේද? යනුයි දුක් කොතැනින් යනු ජාති දුක ජරා දුක ව්‍යාධි දුක (1-4) 3 දුකයන තැන සිට යොදාගත යුතුයි.) යම් ධර්මන්ගේ මුලපටන් ඇතිවීම පෙනේ. අස්තයට යාම වශයෙන් නිරොධය පෙනේ. කර්මය හා එක්වූ විපාකය විපාකය හා එක්වූ කර්මය නාමය හා එක්වූ රූපය රූපය හා එක්වූ නාමය ජාතියෙන් අනුව ගිය ජරාවෙන් ගැවසීගත් ව්‍යාධියෙන් මඩනාලද මරණයෙන් වැටුන, දුකෙහි පිහිටියේය. ආරක්ෂාවක් නැත්තේය. පිහිටක් නැත්තේය. මේ දුක්ඛයෝයයි කියත්, මේ දුක් කොහින් ඇතිවූයේද? කොහින් හටගත්තේද?

කොහින් පහළවූයේද? කුමක් නිදානකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේදැයි මේ දුක්වල මුල විචාරයි. හේතුව විචරයි. නිදානය විචාරයි. සම්භවය විචාරයි. ප්‍රභවය විචාරයි. ඇතිවීම විචාරයි. ආහාරය විචාරයි. ආරම්මණය විචාරයි. ප්‍රත්‍යය විචාරයි. සමුදය විචාරයි ඉල්ලයි, යනුයි.

5. "ලොකයෙහි යම්කිසි අනෙක රූපයෝ" යන්නෙහි "යම්කිසි" යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය වටකොට ගන්නා ඉතිරි නොකොට ගන්නා වචන යයි. 'ලොකයෙහි' යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි, දිව්‍යලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි. 'නොයෙක් ආකාරවූ' යනු නොයෙක් ආකාරවූ නානාප්‍රකාරවූ ලොකයෙහි දුක් යනුයි. එසේ හෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

4-2

1. "ඉදින් දුක්ඛයාගේ ප්‍රභවය විචාළේද," යන්නෙහි දුක්ඛයාගේ යනු ජාති දුක්ඛයාගේ ව්‍යාධි දුක්ඛයාගේ මරණ දුක්ඛයාගේ ශොක වැළපීම්, කායිකදුක්, දොම්නස්, දැඩි ආයාස යන දුක්ඛයන්ගේ ප්‍රභවය විචාළේය, යනුයි.

2. "භාග්‍යවතුන් වහන්සේ මෙත්තගු යනු බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි. භගවත් යනු ගෞරව වචනයයි. (මහා නිද්දේසයේ (7-2) 1 භාග්‍යවතුන් වහන්සේ යනු යන තැන සිට යොදාගත යුතුයි.) මේ භගවත් යනුයි. භාග්‍යවතුන් වහන්සේ මෙත්තගු යනු යම්සේ දැනගත යුතුද, එය ඔබට ප්‍රකාශකරමි. "එය" යනු දුක්ඛයාගේ මුල කියමි. හෙතුව කියමි, නිදානය කියමි, සම්භවය කියමි, ප්‍රභවය කියමි, ආහාරය කියමි, ආරම්මණය කියමි, ප්‍රත්‍යය කියමි, ඇතිවීම කියමි, දෙශනා කරන්නෙමි, පනවන්නෙමි, තබන්නෙමි, විවෘත කරන්නෙමි, ප්‍රකාශ කරන්නෙමි. "යම්සේ දැනගතයුතුද යනු දැනගතයුතුද අවබොධකටයුතුද, මෙය මෙසේවූයේ නොවේ. මෙය

ආරංචියෙන් දැනගත්තේ නොවේ. කොටස් වශයෙන් ගන්නේ නොවේ. නොයෙක් තර්කහෙතුවෙන් නොවේ. ආකාර සලසා විතර්කයෙන් ගත්තේ නොවේ. දෘෂ්ටිය විනිවිද බැලීමෙන් නොවේ. තනියම තෙමේම අවබොධ කරගත් තමාට ප්‍රත්‍යක්ෂ ධර්මයයි.

3. "උපධි හේතුවෙන් දුක් හටගනිත්," යන්නෙහි උපධීහු දශයක්වෙත්. තෘෂ්ණා උපධි, කෙලෙස් උපධි, කර්ම උපධි, දුශ්චරිත උපධි, ආහාර උපධි, සතර උපාදින්නක ධාතු උපධි, ආධ්‍යාත්මික ආයතන සයේ උපධිය, සයවැදෑරුම් විඤ්ඤාණයන්ගෙන් ඇතිවූ කායොපධිය, සියලු දුක දුක්ඛාර්ථයෙන් උපධිය, මේ දශ උපධියයි කියත් 'දුක්' යනු ජාතිදුක, ජරාදුක, ව්‍යාධිදුක, මරණදුක, ශොක පරිදෙව (වැළපීම) කායික දුක, දොම්නස, දැඩි ආයාස දුක, දෘෂ්ටි ව්‍යසන දුක යනුයි යම් ධර්මයන්ගේ මුලපටන් ඇතිවීම පෙණේද, අස්තයට යාම් වශයෙන් නිරොධය පෙණේද, කර්මය හා මිශ්‍රවූ විපාකයක්වේද, මේ දුක්යයි කියත්. මේ දුක් උපධි (කෙලෙස්) නිදානකොට ඇත්තෝවෙති. උපධි (කෙලෙස්) හෙතුකොට ඇත්තෝවෙති. උපධි ප්‍රත්‍යයකොට ඇත්තෝවෙති. උපධි කාරණකොට ඇත්තෝවෙත්. ඇතිවෙත්, හටගනිත්, පහළ වෙත්. දුක් උපධි නිදානකොට පහළවෙත්.

4. "ලොකයෙහි යම්කිසි නොයෙක් රූපයෝ" යන්නෙහි යම්කිසි යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරි නොකොට වටකොටගන්නා වචනයකි. 'මේ යම්කිසි' යනුයි. ලොකයෙහි යනු අපාය ලොකයෙහි, මනුෂ්‍ය ලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි, ධාතුලොකයෙහි යනුයි. "නොයෙක් රූපයෝ" යනු නානාවිධවූ නොයෙක් ප්‍රකාරවූ යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

## 4-3

1. "තිස්සය, යමෙක් නොදැනීමෙන් උපධිහු රැස් කෙරේද" යන්නෙහි "යම්බඳු" යනු යම්බඳු යම් ප්‍රකාරයකින් යුක්ත යම් අයුරකට පැමිණි යම් සද්ධර්මයකින් යුක්තවූ ක්ෂත්‍රියයෙක් හෝ

බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යනුයි. "නොදැනීමෙන්" යනු මෝඩවූ තැනැත්තේ නොදන්නා තැනැත්තේ උපධි රැස් කරයි යනු තෘෂ්ණා උපධි රැස්කරයි. දෘෂ්ටි උපධි රැස්කරයි. ක්ලේශ උපධි රැස්කරයි. කර්ම උපධි රැස්කරයි. දුශ්චරිත උපධි රැස්කරයි. ආහාර උපධි රැස්කරයි. ප්‍රතිඝ උපධි රැස්කරයි. සතර උපාදින්න ධාතු උපධි රැස්කරයි. සැවැදෑරුම් ආධ්‍යාත්මික ආයතන උපධි රැස්කරයි. සවැදෑරුම් විඥ්ඥාණකකාය උපධි රැස්කරයි. උපදවයි. "අඥාන තැනැත්තේ නැවත නැවත දුකට පැමිණෙයි' යනු නැවත නැවත ජාතිදුකට ජරාදුකට ව්‍යාධිදුකට මරණදුකට ශොක වැළපීම් කායිකදුක්, දොම්නස්, දැඩි ආයාස දුකට පැමිණෙයි. ඇති කරයි, උපදවයි, පරාමර්සනය කරයි. අනාථවෙයි අඥාන තැනැත්තේ උපධි රැස්කරයි යනුයි. "අඥාන තැනැත්තේ" යනු මෝඩ තැනැත්තේ අවිද්‍යාවෙන් යුක්ත තැනැත්තේ යනුයි.

**2.** "එහෙයින් දැනගත් තැනැත්තා විසින් උපධි නොකොට යුතුය." යන්නෙහි එහෙයින් යනු ඒ කාරණයෙන් ඒ හෙතුවෙන්, ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මේ ආදීනවය සලකා යනුයි. දැනගන්නා තැනැත්තේ සියලු සංස්කාරයන් අනිත්‍යයයි දැනගන්නා තැනැත්තේ අවබොධකරණ තැනැත්තේ සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි දැනගන්නා තැනැත්තේ අවබොධ කරණ තැනැත්තේ යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද එය නිරුද්ධිය පිණිස පවත්නේයයි දැනගන්නා තැනැත්තේ අවබොධ කරණ තැනැත්තේ යනුයි.

**3.** "උපධි රැස් නොකරන්නේය" යනු තෘෂ්ණා උපධි නොකරන්නේය. දෘෂ්ටි උපධි නොකරන්නේය. කෙලෙස් උපධි නොකරන්නේය. දුශ්චරිත උපධි නොකරන්නේය. ආහාර උපධි නොකරන්නේය පටිඝ උපධි නොකරන්නේය. සතර උපා දින්නක ධාතු උපධි නොකරන්නේය. සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතන උපධි නොකරන්නේය සවැදෑරුම් විඥ්ඥාණක කාය උපධි නොකරන්නේය. ඇති නොකරන්නේය යනුයි.

4. "දුක්ඛයාගේ යනු ජාතිදුක්ඛයාගේ ජරාදුක්ඛයාගේ ව්‍යාධිදුක්ඛයාගේ, මරණ දුක්ඛයාගේ, ශොක, වැළපීම්, දුක් දොම්නස් දැඩි ආයාස දුක්ඛයාගේ යනුයි.

5. "ඇතිවීම දක්නේ" යනු දුක්ඛයාගේ මුල දක්නේ, හෙතුව දක්නේ ප්‍රභවය දක්නේ සම්භවය දක්නේ, ඇතිවීම අනුව දක්නේ, ආහාරය අනුව දක්නේ ආරම්මණය අනුව දක්නේ ප්‍රත්‍යය අනුව දක්නේ, සමුදය අනුව දක්නේ යනුයි. අනුපස්සනාව (අනුව දැකීම) යනු යම් ප්‍රඥාවක් ඇද්ද (මහා නිද්දෙසයේ (2-8) 10 ඡේදයේ යම් ප්‍රඥාවක් යන තැන සිට 14 ඡේදය අවසානය දක්වා යොදාගත යුතුයි.) අමොහ, ධම්ම විචය, සම්මාදිට්ඨිය යන මේ අනුපස්සනාවෙන් ප්‍රඥාවෙන් යුක්ත වූයේවේද, හෙතෙම අනුව දක්නේයයිද දුක දන්නේයයිද ජාතියගේ ප්‍රභවය දක්නේයයි ද කියයි. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළහ.

## 4-4

1. "යමක් අපි විචාළෙමුද එය අපට ප්‍රකාශ කළහ" යන්නෙහි යම් ඒ දෙයක් විචාළෙමුද ඉල්ලීමුද යනුයි. "අපට ප්‍රකාශ කළහ" යන්නෙහි කියන ලදී, දෙශනා කරණ ලදී, පණවන ලදී, තබන ලදී, විවෘත කරණ ලදී, ප්‍රකාශ කරණ ලදී යනුයි. "අනික් දෙයක් විචාරමි. එයද කියනු මැනවි." යනු අනික් දෙයක් විචාරමි. එයද දැන් දෙශනා කරණු මැනවි, දැන් කියනු මැනවි, පහදවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, ප්‍රකාශ කරණු මැනවි.

2. "කෙසේ නම් පණ්ඩිතයෝ ජාති ජරා ශෝක පරිදෙව ඔඝය ඉක්මවත්ද" යන්නෙහි කෙසේනම් යනු සංසය නම්වූ ප්‍රශ්න, විමති නම්වූ ප්‍රශ්න, ද්වෙල්හක නම්වූ ප්‍රශ්න, මෙසේ වූයේද, මෙසේ නුවූයේද කවරක්වූයේද, කෙසේවූයේද යනුයි. "නුවණැත්තෝ" යනු පණ්ඩිතයෝ, ප්‍රඥාවන්තයෝ, බුද්ධිමත්හු, ඥානය ඇත්තෝ යනුයි. 'ඔඝය' යනු කාමොඝය, භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය යනුයි. (ii) "ජාති" යනු සත්වයන්ගේ ඇතිවීමක් පහළවීමක් ඇද්ද එයයි 'ජරා' යනු සත්වයන්ගේ යම්

ජරාවක් දිරීම බවක් ඇද්ද එයයි. 'ශොක' යනු ඥාති ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ භොග ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ රොග ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ සීල ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ දෘෂ්ටි ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ වෙනින් අනික් ස්පර්ශයන්ගෙන් හෝ යුක්ත වූවහුගේ ශොකයක් ඇද්ද ශොක කිරීමක් ඇද්ද ඇතුළත ශොකයක් ඇද්ද, ඇතුළත දාහයක් ඇද්ද, සිතේ විශෙෂයෙන් දැවීමක් ඇද්ද, දොම්නසක් ඇද්ද ශොක නමැති හුලක් ඇද්ද, එයයි. පරිදෙවය නම් ඥාති ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ භොග ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ රොග ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ ශීල ව්‍යසනයෙන් හෝ ස්පර්ශ කරණ ලද්දහුගේ වෙනින් අනික් ව්‍යසනයන්ගෙන් යුක්තවූවහුගේ හැඬීමක් ඇද්ද වැළපීමක් ඇද්ද, විලාපයක් ඇද්ද එයයි.

3. "නුවණැත්තෝ කෙසේ ඔඝය ඉක්මවත්ද ජාති ජරා ශොක පරිදෙවයන් (වැලපීම්) ඉක්මවත්ද එය මුනිතෙමේ මනාකොට ප්‍රකාශ කරණු මැනවි, යන්නෙහි "එය" යනු යමක් විචාරම්ද, යමක් ඉල්ලම්ද යමක් පහදවම්ද යනුයි. "මුනි" යනු මොනයයි ඥානයට කියයි. යම් ප්‍රඥාවක් ඇද්ද (මහා නිද්දෙසයේ (2-8) 10 ඡෙදයේ යම් ප්‍රඥාවක් යන තැන සිට 14 ඡෙදය දක්වා යොදාගත යුතුයි.) ධම්ම විචය නම්වේද, සම්‍යක් දෘෂ්ටිය නම් වේද භාග්‍යවතුන් වහන්සේ ඒ ඥානයෙන් යුක්තවූයේ මුනි නම්වූයේ මොන නම් ඥානයෙන් යුක්තවූයේ වෙයි. "මොනෙය්‍ය" නම් කාය මොනෙය්‍ය, වචී මොනෙය්‍ය, මනො මොනෙය්‍ය යනුයි. කාය මොනෙය්‍යය කවරේද? (2-8) (ii) (12) (13) ඡෙද යොදාගත යුතුයි) මනාකොට ප්‍රකාශ කරණු මැනවි යනු එය මනාකොට කියනු මැනවි දෙශනා කරණු මැනවි, පණවනු මැනවි. තබනු මැනවි. විවෘත කරණු මැනවි. බෙදනු මැනවි. ප්‍රකට කරණු මැනවි. එය මට මුනින් වහන්සේ මනාකොට දෙශනා කරණු මැනවි. මේ ධර්මයයි මෙසේ ඔබවහන්සේ විසින් අවබොධ කරගත් ධර්මය යන්නෙහි එසේ

ඔබ වහන්සේ විසින් දන්නා ලද ධර්මය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

1. "තට ධර්මය දෙශනා කරන්නෙමි" යන්නෙහි මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ල පරිපූර්ණවූ බ්‍රහ්මචරියාව සතර සතිපට්ඨානයන් සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියයන් පංච බලයන් සප්තබොධ්‍යංගයන් ආර්ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණය නිර්වාණ ගාමිනි ප්‍රතිපදාව, ප්‍රකාශ කරන්නෙමි. දෙශනා කරන්නෙමි. පනවන්නෙමි බෙදන්නෙමි. ප්‍රකට කරන්නෙමි යනුයි.

2. "භාග්‍යවතුන් වහන්සේ 'මෙත්තගූ මානවකය තොපට ධර්මය දෙශනා කරන්නෙමි' යනුයි මෙසේවූයේයයි ආරංචියෙන් නොකියන ධර්මයෙහි" යනු දුටු ධර්මයෙහි දැනගත් ධර්මයෙහි සමකොට බැලූ ධර්මයෙහි තීරණය කළ ධර්මයෙහි ප්‍රකට කළ ධර්මයෙහි (ii) සියලු සංස්කරයෝ අනිත්‍යයයි සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි. යම්කිසි ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දුටු ධර්මයෙහි දැනගත් ධර්මයෙහි යනුයි. මෙසේද දුටු ධර්මයෙහි "මෙසේ වූයේයයි ආරංචියෙන් දැනගත්තක් නොව යනු මෙසේ වූයේයයි අසා හෝ ආරංචි මාත්‍රයෙන් හෝ කොටස් වශයෙන් ගෙන හෝ තර්ක වශයෙන් හෝ ආකාර වශයෙන් විතර්ක කොට හෝ දෘෂ්ටිය විනිවිද බැලීමෙන් හෝ නොව තෙමේම අවබොධකොට ගත් තමාට ප්‍රත්‍යක්ෂවූ ධර්මය තට දෙශනා කරන්නෙමි.

3. "යම් හෙයකින් උතුම් යයි යමක් දැනගන්නා ලදද යනු යමක් දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට, සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැනීම ඇතිකොට තීරණය කොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි දැනීම ඇතිකොට තීරණයකොට ප්‍රකටකොට යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දැනීම ඇතිකොට සම කොට

බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි 'සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ යනුයි,

**4.** කයෙහි කය අනුව බලන සිහි ඇත්තේනුයි සිහි ඇත්තේ නමි. (1-8) 4 (ii) යෙදිය යුතුයි) හෙතෙම සිහි ඇත්තේ නමි. හැසිරෙත් යනු ඉරියව් පවත්වන්නේ, පාලනය කරන්නේ යැපෙන්නේ යනුයි.

**5.** "යමක් දැන සිහි ඇත්තේ හැසිරෙන්නේ ලොකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කරන්නේය යන්නෙහි විසත්තිකා නම් තෘෂ්ණාවයි යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද (මහා නිද්දෙසයේ (1-3) 4 යෙදිය යුතුයි.) විශෙෂයෙන් ඇතුළුවේනුයි විසත්තිකා නමි. විසුරුනේනුයි විසත්තිකා නමි. පැතුරුනේනුයි විසත්තිකා නමි. විෂමවූයේනුයි විසත්තිකා නමි. විසහරනේනුයි විසත්තිකා නමි. විෂමුල් බැවින් විසත්තිකා නමි. විෂ ඵල බැවින් විසත්තිකා නමි. විෂ පරිභොග බැවින් විසත්තිකා නමි. විෂයන්ට ආවාසනුයි විසත්තිකා නමි. රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි කුලයෙහි ගණයෙහි ආවාසයෙහි ලාභයෙහි ප්‍රශංසාවෙහි සැපයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි සෙනාසනයෙහි ගිලන්පස බෙහෙත් පිරිකරෙහි කාම ධාතුවෙහි හෝ රූපධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි හෝ කාම භවයෙහි සංඥා භවයෙහි අසඤ්ඤ භවයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤා භවයෙහි එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි පඤ්චවොකාර භවයෙහි අතීතයෙහි අනාගතයෙහි පවත්නා කාලයෙහි දැකී දෙයෙහි ඇසූ දෙයෙහි ස්පර්ශ කළ දෙයෙහි දැනගතයුතු ධර්මයන්හි ඇලුනේනුයි විසිරුනේනුයි විසත්තිකා නමි.

**6.** "ලොකයෙහි" යනු අපාය ලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතුලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි. "ලොකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කරන්නේය යන්නෙහි ලොක යනු ඒ විසත්තිකා ලොකය හෝ ඒ විසත්තිකාව හෝ සිහි ඇතිව තරණය කරන්නේය. ඉක්ම වන්නේය, යනුයි.

## 4-6

1. "එයට මම සතුටු වෙමි" යන්නෙහි එයට යනු ඔබගේ වචනයට ගැලපූ දෙශනයට සතුටුවෙමි. අනුමෝදන් වෙමි. කැමති වෙමි. යනුයි. 'මහර්ෂි' යනු කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ මහර්ෂි නම් වේද? මහත්වූ ශීල සමූහයක් සෙවීය, ගවෙෂණය කළේය, පර්යේෂණය කළේය. එබැවින් මහර්ෂී නමි. මහත්වූ සමාධි ස්කන්ධයක් මහත්වූ විමුක්ති ස්කන්ධයක්, මහත්වූ විමුක්ති ඥාන දර්ශන ස්කන්ධයක් සෙවීය, ගවේෂණය කළේය, පර්යේෂණය කළේය, එබැවින් මහර්ෂී නමි. මහත්වූ අන්ධකාර සමූහය බිඳ දැමීම සෙවීය. ගවේෂණය කළේය. පර්යේෂණය කළේය. එබැවින් මහර්ෂී නමි. මහත්වූ විපර්යාසයාගේ (වෙනස්වීමේ) බිඳීම සෙවූයේය. පර්යේෂණය කළේය. එබැවින් මහර්ෂී නමි. මහත්වූ තෘෂ්ණා උල උදුරා දැමීම සෙවූයේය, ගවෙෂණය කළේය, පර්යේෂණ කළේය, එබැවින් මහර්ෂී නමි. මහත්වූ දෘෂ්ටි රැස්වීම ලිහා දැමීම සෙවූයේය. ගවෙෂණ කළේය. පර්යේෂණය කළේය, එබැවින් මහර්ෂී නමි. මහත්වූ මාන ධජය පහත දැමීම සෙවූයේය. ගවෙෂණය කළේය, පර්යේෂණය කළේය. එබැවින් මහර්ෂී නමි. මහත්වූ ඔඝයාගේ එතරවීම සෙවීය. ගවෙෂණය කළේය. පර්යේෂණය කළේය. එබැවින් මහර්ෂි නමි. මහත්වූ භාරයාගේ බහා තැබීම මහත්වූ සංසාර වෘත්තයාගේ සිඳීම, මහත්වූ තැවීමේ නිවීම මහත්වූ දැවිල්ල සංසිඳීම මහත්වූ ධර්ම÷ධ්වජයාගේ එසවීම මහත්වූ සතිපට්ඨානයෙහි මහත්වූ සම්‍යක් ප්‍රධානයෙහි මහත්වූ ඍද්ධි පාදයෙහි මහත්වූ ඉන්ද්‍රියයන් මහත්වූ බලයන් මහත්වූ බොධ්‍යංගයන් මහත්වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය මහත්වූ පරමාර්ථය මහත්වූ නිර්වාණය සෙවීය, පර්යේෂණය කළේය. සෙවීය. එබැවින් මහර්ෂි නමි. බුදුරජතෙම කොහිද? භාග්‍යවතුන් වහන්සේ කොහිද? දෙවාති දෙවයන් වහන්සේ කොහිද? නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කොහිද කියා මහෙශාක්‍යවූ සත්වයන් විසින් සොයන ලද්දේය. ගවේෂණය කරණ ලද්දේය, පර්යේෂණය කරණ ලද්දේය, එබැවින් මහර්ෂී නමි. මහර්ෂි ධර්මය උතුම්යයි කියත්. යම් ඒ සියලු සංස්කාරයන් සංසිඳවූ

සියලු උපධීන් බහාතැබූ තෘෂ්ණාව දුරුකළ විරාගවූ නිරොධවූ නිර්වාණය උත්තමය අග්‍රය, ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛයයි උතුම් ධර්මයයි මහෙසී නම්.

2. "දැන සිහි ඇතිව හැසිරෙත් යනු" දැන සමකොට බලා තීරණයකොට ප්‍රකට කොට සියලු සංස්කාරයන් අනිත්‍යයයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි දැන සම කොට බලා ප්‍රත්‍යක්ෂකොට යම්කිසි හේතු ප්‍රත්‍ය ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණයකොට සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේනම්. කයෙහි කය අනුව බලන සිහිය වඩන්නේනුයි සිහි ඇත්තේ නම්. සිතෙහි සිත අනුව බලන සිහිය වඩන්නේනුයි. වේදනාවන්හි වේදනාවන් අනුව බලන සිහිය වඩන්නේනුයි. ධර්මයෙහි ධර්මය අනුව බලන සිහිය වඩන්නේනුයි සිහි ඇත්තේනම්. (1-8) 4 (ii) යෙදිය යුතුයි.) හෙතෙම සිහි ඇත්තේයයි කියයි. හැසිරෙත් යනු හැසිරෙන්නේ වාසය කරන්නේ ඉරියව් පවත්වන්නේ යැපෙන්නේ යනුයි. යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ ලෝකයෙහි විසත්තිකානම් තෘෂ්ණාව තීරණය කරන්නේය යන්නෙහි විසත්තිකා යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි.

3. "විසත්තිකා යනු කවර අර්ථයකින් විසත්තිකා නම් වේද, (මහා නිද්දෙසයේ (10-12) 3 යෙදිය යුතුයි.) ලෝකයෙහි යනු අපාය ලෝකයෙහි (1-1) 1 (i) යෙදිය යුතුයි) ලෝකයෙහි විසත්තිකාව තරණය කරන්නේය යනු ලෝකයෙහි විසත්තිකාව තරණය කරන්නේය. ඉක්මවන්නේය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 4-7

1. "යම් කිසිවක් දැනගනිම්ද අවබොධ කෙරෙම්ද යනුයි. "මෙත්තගු" යනු භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරති. "භාග්‍යවත්" යනු ගෞරව වචනයයි. (මහා

නිද්දෙසයේ (7-2) 4 යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කරණලද ප්‍රඥප්තියයි. මේ භගවත් යනුයි. භාග්‍යවතුන් වහන්සේ ‘මෙත්තගූ’ මානවකයෙනි, උඩද, යටද සරසද මැදද යන්නෙහි උඩයයි අනාගතයට කියයි. යට යයි අතීතයට කියයි. සරස හා මැද යයි වර්තමානයට කියයි. උඩයනු දිව්‍ය ලෝකයයි යට යනු නරකයයි. සරස හා මැදයයි මනුෂ්‍ය ලෝකයයි උඩ යනු කුශල ධර්මයෝයි. යට යනු අකුශල ධර්මයෝයි. සරස හා මැද යනු අව්‍යාකෘත ධර්මයෝයි. උඩ යනු අරූප ධාතුයි යට යනු කාම ධාතුයි. සරස හා මැද යනු රූප ධාතුයි. උඩ යනු සැප වේදනාවයි. යට යනු දුක්ඛ වේදනාවයි. සරස හා මැද යනු අදුක්ඛමසුඛ වේදනාවයි. උඩ යනු පාතාලයෙන් උඩයි. යටයනු හිසකේ වලින් යට යනුයි. මේ යනු කියනලද පනවන ලද තබනලද යනුයි. ‘නන්දි’ යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. ‘නිවෙසන’ යනු නිවෙසන දෙකකි. තෘෂ්ණා නිවෙසනයද දෘෂ්ටි නිවෙසනයද යනුයි. (මහා නිද්දෙසයේ (2-6) 1 (ii) (iii) ඡේද ‘මමත්වය වෙනුවට’ නිවෙසනයයි වෙනස්කර යොදා ගත යුතුයි.)

2. “විඥ්ඥාණය දුරුකරව” යනු පුණ්‍යාභි සංස්කාර සහගත විඥ්ඥාණය, අපුණ්‍යාභි සංස්කාර සහගත විඥ්ඥාණය, ආනෙඤ්ජාභි සංස්කාර සහගත විඥ්ඥාණය, යන මේවාහි නන්දියද, නිවෙසනයද අභිසංස්කාර සහගත විඥ්ඥාණයද දුරුකරව, සංසිඳව සම්පූර්ණ අභාවයට පමුණුවව යනුයි. “භවයෙහි විඥ්ඥාණය නොසිටින්නේය” යන්නෙහි භවයෝ නම් භව දෙකකි. කර්ම භවයද ප්‍රතිසන්ධි භවයද යනුයි. පුනර්භවය හෝ වෙයි.

3. කර්මභවය කුමක්ද, පුණ්‍යාභි සංස්කාරය? අපුණ්‍යාභි සංස්කාරය, ආනෙඤ්ජාභි සංස්කාරය, මේ කර්ම භවයයි. ප්‍රතිසන්ධිකවූ පුනර්භවය කවරේද? ප්‍රතිසන්ධිකවූ රූප වේදනා සඤ්ඤා, සංඛාර විඥ්ඥාණ යන මොවුහුයි. මේ ප්‍රතිසන්ධිකවූ පුනර්භවයෙහි නොසිටින්නේය. විඥ්ඥාණය හැර භවයෙහි නොසිටින්නේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

4-8

1. "මෙසේ වසන්නාවූ සිහි ඇති අප්‍රමාදවූ තැනැත්තේ" යන්නෙහි 'මෙසේ වාසයකරන්නාවූ' යනු නන්දියද නිවෙසනයද අභිසංස්කාර විඤ්ඤාණයද කර්ම භවයද ප්‍රතිසන්ධිකවූ පුනර්භවයද දුරුකරන්නේ සංසිඳුවන්නේ සම්පූර්ණයෙන් අභාවයට පමුණුවන්නේද වෙති. 'සිහි ඇති යනු' කරුණු සතරකින් සිහි ඇත්තේ නම්. කයෙහි කය අනුව බලන සිහිය පිහිටුවීම වඩන්නේ (1-8) 4 (ii) ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම සිහි ඇත්තේයයි කියයි. 'අප්‍රමාදවූයේ' යනු සකස්ව කරන්නේ, නිතර ක්‍රියා කරන්නේ නොනවත්වා ක්‍රියාකරන්නේ කම්මැලි නොවී ක්‍රියාකරන්නේ බහා නොතැබූ කැමැත්ත ඇත්තේ බහා නොතැබූ ධුර ඇත්තේ කුසලයන්හි අප්‍රමාදවූයේ කෙසේ මම නොපුරණලද හෝ ශීල සමූහය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් උත්සාහවත් කෙරෙම්දැයි යමෙක් එහි කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද නොපසුබස්නා බවද සිහියද මනා නුවණැතිබවද යෙදීමද කුශල ධර්මයන්හි අප්‍රමාදයද කෙරේද? කෙසේ මම නොපුරණලද හෝ ශීල සමූහය සමාධි සමූහය ප්‍රඥා සමූහය, විමුක්ති ස්කන්ධය විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය පුරන්නෙම්ද? පුරණලද හෝ විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය ඒ ඒ තන්හි නුවණින් උත්සාහවත් කෙරෙම්දැයි යමෙක් එහි කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද, නොපසුබස්නා බවද, සිහියද මනා නුවණැතිබවද සිහියද බලවත් උත්සාහයද පටන්ගත් වීර්ය ඇති බවද අධිෂ්ඨානයද යෙදීමද කුශල ධර්මයන්හි අප්‍රමාදයද කෙසේ මම නොදන්නාලද දුක හෝ දැනගන්නෙම්ද, ප්‍රහීන නොකරණ ලද කෙලෙස් හෝ දුරුකරන්නෙම්ද, නොවඩන ලද මාර්ගය හෝ වඩන්නෙම්ද ප්‍රත්‍යක්ෂ නොකරණලද නිරොධය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නෙම්දැයි එහි කැමැත්තද, උත්සාහයද, යෙදීමද, නොපසුබැසීමද, සිහියද පටන්ගන්නා ලද වීර්ය ඇතිබවද, සිහියද නුවණද ප්‍රධන් වීර්යයද, අධිෂ්ඨානයද කුශලධර්මයන්හි යෙදීමදැයි මෙසේ වාසය කරන්නේ යනුයි.

3. "භික්ඛු" යනු පෘථග්ජන කල්‍යාණක හෝ භික්ෂුවයි ශෛක්ෂ්‍ය (හික්මෙන) හෝ භික්ෂුවයි. හැසිරෙත් යනු

හැසිරෙන්නේ වාසයකරන්නේ ඉරියව් පවත්වන්නේ පාලනය කරන්නේ යැපෙන්නේ යනුයි.

3. "මමත්වය" නම් මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි.) තෘෂ්ණා මමත්වය දුරුකොට දෘෂ්ටි මමත්වය බැහැර කොට මමත්වයන් හැර සංසිඳවා අත්හැර සම්පූර්ණයෙන් අභාවයට පමුණුවා යනුයි. නුවණැති භික්ෂුතෙම මමත්ව කටයුතු දේ දුරුකොට, ජාති ජරා ශොක වැළපීම් මෙහිම දුරුකරන්නේය දුක යන්නෙහි 'ජාති' යනු ඒ ඒ සත්වයන්ගේ (4-4) 2 (ii) යෙදිය යුතුයි.) මමත්වය නම් (මහා නිද්දෙසයෙහි (2-6) 1 (ii) (iii) ඡෙදය යෙදිය යුතුයි.) මෙහි යනු මේ දෘෂ්ටියෙහි (මහා නිද්දෙසයෙහි (2-6) 1 (ii) (iii) ඡෙදය යෙදිය යුතුයි. මේ මනුෂ්‍ය ලෝකයෙහි නුවණැත්තේ යනු දන්නා තැනැත්තේ ප්‍රඥාවත් තැනැත්තේ යනුයි. දුක යනු ජාති දුක (4-3) 4 ඡෙදයේ "දුක්ඛ" යන තැන සිට යෙදිය යුතුයි.) ජාති ජරා ශෝක පරිදේව දුක් මෙහිදීම නුවණැත්තේ දුරුකරන්නේය යනු 'විද්‍යාවෙන් යුක්ත තැනැත්තේ නුවණැත්තේ, ප්‍රඥාවත් තැනැත්තේ මෙහිදීම ඉපදීමද, ජරාවද, ශෝක වැළපීම් දුක්ද දුරුකරන්නේය, සංසිඳවන්නේය. සම්පූර්ණ අභාවයට පමුණුවන්නේය. ජාති ජරා ශොක වැළපීම් යනු නුවණැත්තේ මෙහිදීම දුරුකරන්නේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

## 4-9

1. "භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනයට සතුටුවෙමි" යන්නෙහි මෙයට යනු ඔබගේ වචනයට දෙශනාවට, ගැලපීමට සතුටුවෙමි, කැමතිවෙමි, ඉවසමි, තබමි, ප්‍රියකරමි, යනුයි. 'මහර්ෂි' යනු (4-6) 1 ඡෙදය යෙදිය යුතුයි.

2. "මනාකොට දෙශනා කරණලද" යනු මනාකොට කියනලද, මනාකොට තබනලද මනාකොට පනවන ලද මනාකොට විවෘතකරණලද යනුයි. 'උපධි යයි' කෙලෙස්ද ස්කන්ධයෝද, අභිසංස්කාරයෝ කියත්. උපධි ප්‍රහානය, උපධි සංසිඳීම, අමෘතවූ නිර්වාණයයි මනාකොට කියන ලදී.

ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දුක දුරුකළසේක. යන්නෙහි ඒකාන්තයෙන් යනු ඒකාන්ත වචනයයි, නියම වචනයයි. සැක නැති වචනයයි. අදහස් දෙකක් නැති වචනයයි නිරොධ වචනයයි. අපණ්ණක වචනයයි. ස්ථිර වචනයයි. මේ ඒකාන්තයෙන් යනුයි.

"භාග්‍යවත්" යනු ගෞරව වචනයයි. (මහා නිද්දෙසයේ (7-2) 1 භාග්‍යවතුන් වහන්සේ යනු යන තැන සිට යෙදිය යුතුයි.) දුක දුරුකළේය. යන්නෙහි (ii) ජාති දුක ජරා දුක ව්‍යාධි දුක ශොකය, වැළපීම කායික දුක, දොම්නස දැඩි ආයාස දුක දුරුකළේය. සංසිඳවිය. නූපදනා බවට පැමිණ විය. (iii) ඒ එසේම ඔබ විසින් දන්නා ලද්දේය. සමකොට බලන ලද්දේය. තීරණය කරන ලද්දේය. මේ ධර්මය යයි එසේ ඔබ විසින් දන්නා ලද්දේය. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 4-10

1. "ඔවුහුද ඒකාන්තයෙන් දුක දුරු කරන්නේය" යනු ඒ ඒ ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, වෛශ්‍යයෝද, ශුද්‍රයෝද, ගෘහස්ථයෝද, ප්‍රව්‍රජිතයෝද, දෙවතාවෝද, මනුෂ්‍යයෝද දුරු කළාහුය. "දුක නම්" ජාති දුක (4-9) 2 (ii) යෙදිය යුතුය.) දුරු කළාහුය, සංසිඳවූවාහුය, සම්පූර්ණයෙන් අභාවයට පැමිණෙව්වාහුය, යනුයි. "මුනි" යනු "මොන" යයි ඥානයට කියයි. (මහා නිද්දේසයේ 2-8) 10 මුනි යනු යන තැන සිට යෙදිය යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්, මනාසේ අවවාද කරන්නේය. සකස්ව අවවාද කරන්නේය. නිතර අවවාද කරන්නේය. නැවත නැවත අවවාද කරන්නේය. අනුශාසනා කරන්නේය යනුයි. "නාග" යනු එය භාග්‍යවතුන් වහන්සේට ආමන්ත්‍රණය කරයි. "වඳිමි" යනු කයින් වඳිමි, වචනයෙන් හෝ වඳිමි, සිතින් හෝ වඳිමි, අන්වර්ථ ප්‍රතිපත්තියෙන් හෝ වඳිමි, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් හෝ වඳිමි. සත්කාර කරමි, ගරුකාර කරමි, බහුමාන කරමි, පුදමි "එකතුව රැස්ව, හමුව උන්වහන්සේට නමස්කාර කරයි. යනුයි. "නාග" යනු භාග්‍යවතුන් වහන්සේ නාගසේන, වරද නොකරණ

බැවින් නාග නම්, නොයේනුයි නාග නම්. නොපැමිණේනුයි නාග නම්. කෙසේ භාග්‍යවතුන් වහන්සේ වරද නොකරණ බැවින් නාග නම්වේද "වරද" යයි ලාමකවූ කෙලෙස් ඇති කරන්නාවූ නැවත භවයක් දෙන්නාවූ දුක්ඛ විපාකවූ නැවත ජාති ජරා මරණ දෙන්නාවූ ලාමක අකුශල ධර්මයෝ කියත්. (මහා නිද්දේසයේ (9-11) 2 ඡේදය යෙදිය යුතුයි.) නාගයන් වහන්සේට රැස්ව ඒ ඒ කරුණෙන් නමස්කාර කරමි. මට භාග්‍යවතුන් වහන්සේ නිතර අවවාද කරන්නේ නම් යෙහෙකි. නැවත නැවත අවවාද කරන්නේ නම් යෙහෙක. අනුශාසනා කරන්නේ නම් යෙහෙක. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

### 4-11

1. "වෙදගු නම් බ්‍රාහ්මණතෙම යමක් දන්නේද" යන්නෙහි "බ්‍රාහ්මණ" යනු ධර්ම සතක් බැහැර කරණලද බැවින් බ්‍රාහ්මණ නම්. මහානිද්දෙසයේ (4-3) (1) බ්‍රාහ්මණ යනු යන තැනට සිට යොදාගත යුතුයි.) "වේදය දත්" යන්නෙහි වෙදයෝ යයි. සතරමාර්ග ඥානයට කියයි. (මහානිද්දෙසයේ (4-5) 3 (ii) යෙදිය යුතුයි.) 'මනාකොටදැන' යනු දැනගන්නේය. විශේෂයෙන් දැනගන්නේය. අවබොධ කරන්නේය යනුයි. කිඤ්චන (කෙලෙස්) නැති යනු රාග කිඤ්චනය, ද්වෙෂ කිඤ්චනය, මොහ කිඤ්චනය, මාන කිඤ්චනය, දෘෂ්ටි කිඤ්චනය, ක්ලේශ කිඤ්චනය, දුශ්චරිත කිඤ්චනය යන යම් ඒ ප්‍රහීනද මුලින් සිඳුනේද, සංසිඳුනේද, ඉපදීමට අයොග්‍ය වුයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අකිඤ්චනයයි කියයි.

2. "කාමයෝ නම්" ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මහා නිද්දේසයේ 1 (i) (ii) 2 දෙ යෙදිය යුතුයි.) මේ ක්ලේශකාමයෝ යයි කියත්. භවයෝ නම් භව දෙකකි. කර්ම භවයද ප්‍රතිසන්ධිවූ පුනර්භවයද යනුයි. 'අකිඤ්ඤනවූ (කෙලෙස් නැති) පුද්ගලයා කාමභවයෙහි නොපැමිණියේය. නොලැගුනේය, නියතය, වෙන්වූයේය සීමා

නොකළ සිතින් වාසය කෙරෙත්. හෙතෙම ඒකාන්තයෙන් යනු ඒකාන්තයෙන් හෙතෙම මේ ඔඝය තරණය කළේය, යන්නෙහි,

"ඒකාන්තයෙන්" යනු ඒකාන්ත වචනයයි. ඔඝය යනු කාමොඝය, භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, යනුයි. තරණය කළේය. යනු ඉක්මවූයේය, යනුයි. මේ ඔඝය තරණය කළේ යනු කාමොඝය තරණය කළේය. භවොඝය තරණය කළේය, දිට්ඨොඝය තරණය කළේය. හෙතෙම විසූ වාස ඇත්තේ, පුරුදු කළ ගමන් ඇත්තේ, ගිය කෙළවර ඇත්තේ, ගිය දිශාව ඇත්තේ, පාලනය කරණලද බ්‍රහ්මචරියා ඇත්තේ, වඩනලද මාර්ග ඇත්තේ, ප්‍රහීන කළ කෙළෙස් ඇත්තේ, ප්‍රත්‍යක්ෂ කළ නිරොධය ඇත්තේ, දුක්ඛයාගේ කෙළවර දක්නාලදී. සමුදය ප්‍රහීනය, මාර්ගය වඩන ලදී. නිරොධය ප්‍රත්‍යක්ෂ කරණලදී. දැනගත යුත්ත දැන ගන්නාලදී. විශෙෂයෙන් දැනගත යුත්ත විශෙෂයෙන් දැන ගන්නා ලදී. පහකළ යුතුදෙය පහකරණ ලදී. වැඩිය යුතු දෙය වඩන ලදී. හෙතෙම උගුලන ලද දොර පළු ඇත්තේය. තරණය කරණලද දිය අගල ඇත්තේය. උදුරා දැමූ කනුව ඇත්තේය. බැහැර කරණලද අගුල ඇත්තේය. පීඩා රහිතය. ශාන්තවූ ධර්ම ඇත්තේය. බහා තැබූ කෙලෙස් බර ඇත්තේය. කාමයන්ගෙන් වෙන්වූ (මහා නිද්දෙසයේ (1541) පිටේ 20 ඡෙදය යෙදිය යුතුයි.)

3. "පරතෙරට එතරවූයේම" යන්නෙහි පර තෙරයයි අමෘතවූ නිර්වාණයට කියයි. යම් ඒ නිවනක් සියලු සංස්කාරයන් ශමනය කළේ සියලු උපධීන් සංසිඳවූයේ, තෘෂ්ණා ක්ෂය වූයේ විරාග යයි නිරොධ යයි නම්වූයේද, ඒ නිවනයි. හෙතෙම පරතෙරට ගියේ පරතෙරට පැමිණියේ අන්තයට ගියේ අන්තයට පැමිණියේ කෙළවරට පැමිණියේ, අවසානයට ගියේ, අවසානයට පැමිණියේ, ආරක්ෂාවට ගියේ ආරක්ෂාවට පැමිණියේ සරණ බවට ගියේ සරණ බවට පැමිණියේ, අභය බවට ගියේ අභය බවට පැමිණියේ, ඉක්මීමට ගියේ, ඉක්මීමට පැමිණියේ අමෘතයට ගියේ, අමෘතයට පැමිණියේ, නිර්වාණයට ගියේ නිර්වාණයට

පැමිණියේ, හෙතෙම විසූ වාස ඇත්තේ (මහා නිද්දෙසයේ (3-7) 6 (ii) යෙදිය යුතුයි.) නැවත ඉපදීමක් නැත. "හුල් නැත්තේ" යනු රාග හුල (මහා නිද්දෙසයේ 15-5 (1) හුල් යන තැන සිට යොදාගත යුතුයි.) සියලු අකුසල රැස් කිරීම නමැති හුල් යන යමෙකුට මේ හුල් ප්‍රහීනද මුලින් සිඳුනේද, ශාන්තද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම (අබිල) හුල් නැත්තේයයි කියයි.

**5.** "සැක නැත්තේ" යනු දුකෙහි සැක කිරීම, දුක ඇති වීමෙහි සැක කිරීම, දුක්ඛ නිරොධයෙහි සැක කිරීම, දුක්ඛ නිරොධගාමිනි ප්‍රතිපදාවෙහි සැක කිරීම, පූර්වාන්තයෙහි සැක කිරීම, අපරාන්තයෙහි සැක කිරීම, පූර්වාපරාන්තයෙහිසැක කිරීම, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි සැක කිරීම යන යම් මෙබඳු සැකයක් ඇද්ද, සැක කිරීමක් ඇද්ද, සැක කිරීම් බවක් ඇද්ද, විමතියක් ඇද්ද, විචිකිච්ඡාවක් ඇද්ද, අදහස් දෙකක් ඇද්ද, බෙදී ගිය මාර්ග දෙකක් ඇද්ද, යමෙකුගේ මේ සැකයෝ ප්‍රහීණද මුලින් සිඳුනේද, ශාන්තද, සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම සැක නැත්තේ යයි කියයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 4-12

**1.** "විද්‍යාවෙන් යුක්ත තැනැත්තේ" යනු ඥානවත් තැනැත්තේ යනුයි. වේදය දත් තැනැත්තේ යනු වේදයෝ යයි සතර මාර්ග ඥානයට කියයි. (මහා නිද්දෙසයේ (4-5) 3 (ii) යෙදිය යුතුයි.)

**2.** "නරයා" යනු මානවයා පුරුෂයා, පුද්ගලයා, ජීවය යනුයි. මෙහි යනු මේ දෘෂ්ටියෙහි මේ මනුෂ්‍ය ලොකයෙහි, යනුයි.

**3.** "භවාභවයෙහි" යනු භවාභවයෙහි, කර්ම භවයෙහි, පුනර්භවයෙහි කාම භවයෙහි පුනර්භවයෙහි, රූප භවයෙහි කර්ම භවයෙහි, රූප භවයෙහි, පුනර්භවයෙහි, අරූප භවයෙහි කර්ම භවයෙහි, අරූප භවයෙහි පුනර්භවයෙහි, නැවත නැවත ගතියෙහි නැවත නැවත උත්පත්තියෙහි, නැවත නැවත ප්‍රතිසන්ධියෙහි, නැවත නැවත ආත්ම භවයෙහි, යනුයි. සංගයෝ

නම් සප්ත සංගයෝයි. (ii) රාග සංගය ද්වෙෂ සංගය මොහ සංගය, මාන සංගය, දෘෂ්ටි සංගය, ක්ලේශ සංගය දුශ්චරිත සංගය යනුයි. දුරුකොට යනු සංගයන් බැහැරකොට යනුයි නැවතද බැහැරකොට යනු ඇලීමෙහි, ලැගීමෙහි වෙන්කොට දුරුකොට යනුයි. හෙතෙම දුරුකළ තෘෂ්ණා ඇත්තේ, පීඩා රහිතවූයේ ආශා රහිතවූයේ හෙතෙම ජාති ජරාවන් තරණය කළේයයි කියමි.

4. "තෘෂ්ණාව නම්" රූප තෘෂ්ණාව ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම තෘෂ්ණාව යනුයි. යමෙකුගේ මේ තෘෂ්ණාව ප්‍රහීණද, මුලින් සිඳුනේද ශාන්තද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම පහවූ තෘෂ්ණා ඇත්තේ, වෙන්ව ගිය තෘෂ්ණා ඇත්තේ වමාරණ ලද තෘෂ්ණාව ඇත්තේ, මිදුන තෘෂ්ණාව ඇත්තේ ප්‍රහීණ තෘෂ්ණාව ඇත්තේ පහවූ රාග ඇත්තේ වෙන් කළ රාග ඇත්තේ සන්සිඳුන රාග ඇත්තේ, තෘෂ්ණාවෙන් නික්මුනේ, නිවුනේ, සිහිල්වූයේ, සැපය විඳින්නේ බ්‍රහ්මයා බඳු ආත්ම භාවයෙන් වාසය කරයි. හෙතෙම රාගය විනාශ කළේ, ද්වෙෂය විනාශ කළේ, මොහය විනාශ කළේ, ක්‍රොධය විනාශකළේ බද්ධ වෛරය විනාශකළේ (මහා නිද්දෙසයේ (9-3) 3 "ශාන්තිය" යනු 'විනාශකළේ' කියා වෙනස්කොට යොදාගත යුතුයි. 1662 පිට) සියලු අකුසල රැස් කිරීම් විනාශකළේ, මුලින් සින්දේ, ශාන්තවූයේ සංසිඳුනේ, ඉපදීමට අයොග්‍යවූයේද හෙතෙම තෘෂ්ණාව විනාශකළේ හෙවත් අනීඝයයි කියත්, ආශා රහිත යනු යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එය නැති බවයි යමෙකුට මේ තෘෂ්ණාව ප්‍රහීනද, මුලින් සිඳුනේද, ශාන්තද. සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම ආශා රහිතයයි කියයි.

4. "ජාති" ඉපදීම නම් ඒ ඒ සත්වයන්ගේ යම් දිරීමක් දිරීම් බවක් ඇද්ද එයයි. ජරාව නම් ඒ ඒ සත්වයන්ගේ යම්බඳු ඇතිවීමක්, පහළවීමක්, ඇද්ද එයයි. ඉන්ද්‍රියයන්ගේ යම් මේරීම් බවක් ඇද්ද මේ ජරායයි කියයි, යම් ඒ කෙනෙක් තෘෂ්ණාව දුරුකළේ දුක් නැත්තේ, ආශා නැත්තේද හෙතෙම

ඒකාන්තයෙන් ජාති ජරා මරණයන් තරණය කළේය. එතර වූයේය. ඉක්මවූයේයයි කියමි, ප්‍රකාශ කරමි, දෙශනා කරමි, පනවමි. තබමි විවෘත කරමි, බෙදමි, ප්‍රකට කරමි, හෙතෙම පහවූ තෘෂ්ණා ඇත්තේ දුක් නැත්තේ ආශා නැත්තේ ජාති ජරාවන් තරණය කළේයයි කියමි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ. ගාථා කෙළවරවීම සමගම (1-8) 6 යෙදිය යුතුයි.)

## ධොතක මානවක සූත්‍ර නිර්දෙශය

### 5-1

1. "භාග්‍යවතුන් වහන්සේ විචාරමි. මෙය දෙශනා කරණු මැනවි, යන්නෙහි "විචාරීම්" යනු විචාරීම් තුනෙකි. (මහා නිද්දෙසයේ (14-1) 2-3-4-5-6 ඡෙද යෙදිය යුතුයි.) මෙය දෙශනා කරණු මැනවි යනු කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි යනුයි. මෙසේ ආයුෂ්මත් ධොතකතෙම කීයේය යන්නෙහි (ඉච්චාති) මෙසේ යනු ස්වර සන්ධියයි. ආයුෂ්මත් යනු ප්‍රිය වචනයයි ගරු වචනයයි ගරු කටයුතු උසස් වචනයයි. ආයුෂ්මත් "ධොතක" යනු ඒ බ්‍රාහ්මණයාගේ නාමයයි පැනවීමයි, නාම කර්මයයි, අභිලාපයයි.

2. "මහර්ෂීන් වහන්ස, ඔබවහන්සේගේ වචනයන් බලාපොරොත්තුවෙමි" යනු ඔබවහන්සේගේ වචනය දෙශනාව බලාපොරොත්තුවෙමි. කැමතිවෙමි, යනුයි. "මහර්ෂී" යනු භාග්‍යවතුන් වහන්සේ (14-1) 10 යෙදිය යුතුයි.)

3. "ඔබ වහන්සේගේ වචනය අසා නිවනෙහි හික්මෙන්නේ යනු ඔබගේ වචනය දෙශනාව අනුසන්ධිය අසා ශ්‍රවණයකොට ඉගෙණ සලකාබලා තමන්ගේ නිවනෙහි හික්මෙන්නේය. යනු හික්මීම් තුනකි. අධිශීල ශික්ෂා අධිචිත්ත ශික්ෂා, අධිපඤ්ඤා ශික්ෂා යනුයි. (1-7) 2 'අධිශීල ශික්ෂාව කවරීද' යන තැන සිට යොදාගත යුතුයි.) මේ අධිපඤ්ඤා ශික්ෂාවයි. තමන්ගේ නිර්වාණය යනු තමන්ගේ රාගය නිවීමට ද්වෙෂය නිවීමට මොහය නිවීමට ක්‍රොධය නිවීමට බද්ධ වෛරය නිවීමට

(මහානිද්දෙසයේ 14-5 (2) 'ශාන්තවූවහුට' යනු 'නිවීමටයයි' වෙනස් කොට රාගය යන තැනසිට යොදාගත යුතුයි 1787) සියලු අකුශල රැස්කිරීම් වල සංසිඳීම පිණිස දුරුකිරීම පිණිස අධිශීලයෙහිද හික්මෙන්නේය. අධිචිත්තයෙහිද හික්මෙන්නේය. අධිප්‍රඥාවෙහිද හික්මෙන්නේය, මේ ශික්ෂා තුන ආවර්ජනා කරන්නේ හික්මෙන්නේය, බලන්නේ හික්මෙන්නේය, ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ හික්මෙන්නේය, සිත තබන්නේ හික්මෙන්නේය, ශ්‍රද්ධාව මුදන්නේ හික්මෙන්නේය, වීර්ය දැඩිව ගන්නේ හික්මෙන්නේය, සිහිය පිහිටුවන්නේ හික්මෙන්නේය, සිත පිහිටුවන්නේ හික්මෙන්නේය, ප්‍රඥාවෙන් දැන ගන්නේ හික්මෙන්නේය, දැනගත යුත්ත දැන ගන්නේ හික්මෙන්නේය. විශෙෂයෙන් දැනගත යුත්ත විශෙෂයෙන් දැන ගන්නේ හික්මෙන්නේය, දුරුකළයුතු දෙය දුරු කරන්නේ හික්මෙන්නේය, ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය, වැඩිය යුත්ත වඩන්නේ හික්මෙන්නේය යනුයි.

## 5-2

1. "උත්සාහ කරවයි වදාළහ" යනු උත්සාහවත්ව කරව, වීර්ය කරව, කැමැත්ත ඇති කරව, උපදව යනුයි. "ධොතක" යනු භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි, "භාග්‍යවත්" යනු මේ ගෞරව වචනයයි ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි යනුයි.

2. "මෙහිම ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ" යන්නෙහි මෙහි යනු මේ දෘෂ්ටියෙහි මේ කැමැත්තෙහි මේ රුචියෙහි මේ ගැන්මෙහි, මේ ධර්මයෙහි, මේ විනයෙහි, මේ ධර්ම විනයෙහි, මේ පාං වචනයෙහි, මේ බ්‍රහ්මචරියාවෙහි, මේ ශාස්තෘ ශාසනයෙහි, මේ ආත්ම භාවයෙහි, මේ මනුෂ්‍ය ලොකයෙහි, "ප්‍රඥා ඇත්තේ යනු පණ්ඩිතවූයේ බුද්ධි ඇත්තේ, ඥාන ඇත්තේ යනුයි" සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ නම්. කයෙහි කය අනුව බලන සිහිය වඩන්නේ (1-8) 4 (ii) යොදාගත යුතුයි.) හෙතෙම සිහි ඇත්තේයයි කියයි.

3. "මෙයින් අසා හික්මෙන්නේය" යනු මෙයින් මාගේ වචනය දෙශනාව, ගැලපීම, අසා ඉගෙණ සලකාබලා, යනුයි. හික්මෙන්නේය යන්නෙහි හික්මීම් තුනෙකි. අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා අධිප්‍රඥා ශික්ෂා යනුයි. (1-7-2) අධිශීලයද යන තැන සිට හා 3 ඡෙදය යෙදිය යුතුයි.) මේ අධිප්‍රඥා ශික්ෂාවයි.

4. "තමන්ගේ නිර්වාණය යනු" තමන්ගේ රාගය නිවීම පිණිස (මහා නිද්දෙසයේ 14-5 (2) 'ශාන්තවූවහුට' යනු 'නිවීමට' යයි වෙනස් කොට රාගය යන තැනසිට යොදාගත යුතුයි. 1787)

5-3

1. "මම මනුෂ්‍ය ලොකයෙහි දෙවියන්" දකිමි යන්නෙහි දෙවියෝ නම් දෙවියෝ තුන් කොටසකි, එනම් සම්මුති දෙව උප්පත්ති දෙව, විශුද්ධි දෙව යනුයි. සම්මුති දෙවියෝ කවරහුද? රජවරු, රාජකුමාරවරු, දෙවි වරු යනුයි. මොව්හු සම්මුති දෙවියෝයයි කියත්.

2. "උත්පත්ති දෙවියෝ කවරහුද? චාතුර්මහාරාජික දෙවියෝ, තාවතිංස දෙවියෝ යාම දෙවියෝ තුසිත දෙවියෝ නිර්මාණ රතී දෙවියෝ, පරනිර්මිත වසවර්ති දෙවියෝ එයට ඉහළවූ බ්‍රහ්ම කායික දෙවියෝද යනුයි. මොව්හු උත්පත්ති දෙවියෝ නම් වෙත්.

3. "විශුද්ධි දෙවියෝ කවරහුද? තථාගත ශ්‍රාවකයෝ අර්හත්වූ ක්ෂීණා ශ්‍රවයෝ, පසේ බුදුවරු මොහු විශුද්ධි දෙවියෝයයි කියත්, භාග්‍යවතුන් වහන්සේ සම්මුති දේවද නොවන සේක. උප්පත්ති දේවද නොවනසේක. විශුද්ධි දේවද නොවන සේක. දෙවියන්ට දෙවිසේක. සිංහයන්ට සිංහසේක. නාගයන්ට නාගසේක, සමූහ ඇත්තන්ට සමූහ ඇතිසේක. මුනීන්ට මුනිසේක. රජුන්ට රාජ සේක.

4. "මම මනුෂ්‍ය ලොකයෙහි දෙවියන් දකිමි" යනු දෙවියන්ට උසස්වූවන් දකිමි, දෙවියන්ට දෙවියන් දකිමි. යනුයි. මම දිව්‍ය

මනුෂ්‍ය ලොකයෙහි අකිඤ්චන කෙලෙස් නැත්තාවූ බ්‍රාහ්මණයෙක්ව ඉරියව් පවත්වන්නෙමි යන්නෙහි අකිඤ්චනවූ හෙවත් කෙලෙස් නැති යනු රාගකිඤ්චනය, ද්වෙෂ කිඤ්චනය, මොහ කිඤ්චනය, මාන කිඤ්චනය, දෘෂ්ටි කිඤ්චනය, ක්ලේශ කිඤ්චනය, දුශ්චරිත කිඤ්චනය යන මේ කෙලෙස් භාග්‍යවත් බුදුන්ගේ ප්‍රහීනයහ. මුලින් ඉදිරූහ. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලදහ. අභාවයට පමුණුවන ලදහ. නැවත නූපදනා බවට පමුණුවන ලදහ. එහෙයින් බුද්ධ නම් වේ.

**5.** "බ්‍රාහ්මණ" යනු භාග්‍යවතුන් වහන්සේ ධර්ම සතක් බැහැර කරණ ලද බැවින් බ්‍රාහ්මණ නම්. සත්කාය දෘෂ්ටිය බැහැර කරණ ලද්දේ වෙයි. විචිකිච්ඡාව බැහැර කරණ ලද්දේ වෙයි. ශීලව්‍රත පරාමාශය බැහැරකරණ ලද්දේ වෙයි. රාගය, ද්වෙෂය, මොහය, මානය, බැහැර කරණ ලද්දාහු වෙත්. කෙලෙස් ඇති කරන්නාවූ නැවත භවයක් ඇති කරන්නාවූ රාග සහිත දුක් විපාක දෙන්නාවූ නැවත ජාති ජරාමරණ දෙන්නාවූ ලාමක අකුශල ධර්මයන් දුරු කොට සිටියාවූ භාග්‍යවතුන් වහන්සේ නිර්මල සේක. තැන්පත් සේක. ප්‍රඥාවෙන් යුක්ත සේක. සංසාරය ඉක්මවා සිටි සේක යනුයි.

**6.** "ඉරියව් පවත්වන්නාවූ" යනු හැසිරෙන්නාවූ වාසය කරන්නාවූ, පාලනය කරන්නාවූ, යැපෙන්නාවූ, යනුයි. ඉරියව් පවත්නා කෙලෙස් නැත බ්‍රාහ්මණයාට ඒ ඒ කාරණයෙන් නමස්කාර කරමි යනුයි.

**7.** "සමතැස්යයි" යනු සර්වඥතාඥානයට කියයි. භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥානයෙන් උපෙතවූයේ සමුපෙතවූයේ පැමිණියේ උපන්නේ යුක්තවූයේ වෙයි. උන් වහන්සේට නොපෙණෙන දෙයක් මෙහි නැත. නොදන්නා අර්ථයක් නොදතයුත්තක් නැත. දක්ෂිණාර්හවූ තථාගතයන් වහන්සේ එබැවින් සමන්ත චක්ඛු නම්.

**8.** "ඒ ඒ කාරණයෙන් සමතැස් ඇති බුදුන් වහන්සේ වඳිමි ශාක්‍යයන් වහන්ස, මාගේ සැකය දුරුකරණු මැනවි" යන්නෙහි "ශාක්‍ය" යනු භාග්‍යවතුන් වහන්සේයි. ශාක්‍ය කුලයෙන්

පැවිදිවූයේනුයි ශාක්‍ය නම්, යලිදු හෝ ආඪ්‍යවූ මහත්වූ ධනය ඇත්තේනුයි. ‘ශාක්‍ය’ නම්. උන්වහන්සේට මේ ධනයෝ වෙත්. ඒ කවරහුද? ශ්‍රද්ධා ධනය, ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය ප්‍රඥා ධනය, සතිපට්ඨාන ධනය, සම්‍යක් ප්‍රධාන ධනය, ඍද්ධිපාද ධනය, ඉන්ද්‍රිය ධනය, බල ධනය, බොජ්ක්ධංග ධනය, මාර්ග ධනය, ඵල ධනය, නිර්වාණ ධනය, මෙසේ නොයෙක් ධන රුවනින් ආඪ්‍යවූයේ මහත් ධන ඇත්තේනුයි ධනවත්වූයේනුයි ශාක්‍ය නම්. නැවතද ශූර බැවින් ධීර බැවින් බිය නොවන බැවින් තැති නොගන්නා බැවින්, ප්‍රහීන භය භෙරව ඇති බැවින් පහවූ ලොමහර්ෂ ඇති බැවින් ශාක්‍ය නම්. “සැකයයයි” විචිකිච්ඡාවට කියයි. දුකෙහි සැකය, දුක් ඇතිවීමට හේතුවේ සැකය, දුක්ඛ නිරොධයේ සැකය, දුක්ඛනිරොධ ගාමිනී ප්‍රතිපදාවේ සැකය පූර්වාන්තයෙහි සැකය, අපරාන්තයෙහි සැකය, පූර්වාපරාන්තයෙහි සැකය, ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්හි සැකය යන මෙබඳු සැකයක් සැක කිරීමක් සැක කිරීම් බවක් විචිකිච්ඡාවක් අදහස් දෙකක්, දෙමංසන්ධියක්, සිතෙහි නිශ්චය නොමැති ගතියක්, තැතිගැන්මක් ඇද්ද, එයයි “ශාක්‍යයන් වහන්ස එය දුරු කරණු මැනව,” යනු මා මුදවනු මැනව, මෝඩ බැවින් දුරු කරණු මැනව, සැකය නමැති, හුලෙන් මා දුරු කරණු මැනව යනුයි.

**9.** “මම මිදවීමට උත්සාහ නොකරන්නෙමි” යන්නෙහි මම සැක ඇති තැනැත්තේ මිදවීමට නොහැක්කෙමි. සැක ඇති තැනැත්තේ උඩට එසවීමට නොහැක්කෙමි. උත්සාහ නොකරන්නෙමි. වෑයම් නොකරන්නෙමි. වීර්‍ය නොකරන්නෙම් අශ්‍රද්ධාවත් පුද්ගලයා කෙරෙහි කුසීතකම නොසිඳී තැනැත්තා කෙරෙහි, හීනවීර්‍ය ඇත්තා කෙරෙහි නොපිළිපදින්නා කෙරෙහි ධර්ම දෙශනාවෙන් මෙසේද මම මිදවීමට උත්සාහ නොකරන්නෙමි. නැවතද මුදවන අන් කිසිවෙක් නැත. ඉදින් ඔවුහු මිදෙන්නාහු නම් ස්වකීය උත්සාහයෙන් ස්වකීය වීර්යයෙන් ස්වකීය පරාක්‍රමයෙන් ස්වකීය පුරුෂ ධෛර්යයෙන් ස්වකීය පුරුෂ බලයෙන් ස්වකීය පුරුෂ පරාක්‍රමයෙන් තමාගේ සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අවිරුද්ධ ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව ධර්මානුධර්ම ප්‍රතිපදාව, පිළිපදින්නාහු මුදන්නෙමි. "මම මෙසේ මිදවීමට උත්සාහ නොකරන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී.

10. "චුන්දය, හෙතෙම ඒකාන්තයෙන් තමා එරුනේ එරුන අන්කෙනෙකු ගොඩනගනීය යන මේ කාරණය විද්‍යමාන නොවේ. චුන්දය, හෙතෙම ඒකාන්තයෙන් තමා නොදැමුනේ විනීත නොවූයේ නොපිරිනිවුනේ අන්‍යයා දමනය කරන්නේද, හික්මවන්නේද, පිරිනිවනට පමුණුවන්නේද, යන මේ කාරණය විද්‍යමාන නොවෙයි. මෙසේද මම මිදවීමට උත්සාහ නොකරන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී.

11. "තමා විසින් කරණලද පාපය තමා කිළිටිකරයි. තමා විසින් නොකරණලද පාපය තමා පිරිසිදුකරයි. ශුද්ධිය හා අශුද්ධිය වෙන වෙනම ඔවුනොවුන් පිරිසිදු නොකරයි." මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලදී.

12. "බ්‍රාහ්මණය එපරිද්දෙන්ම නිර්වාණය සිටියි. නිර්වාණගාමී මාර්ගය සිටියි. නැවතද වනාහි මාගේ ශ්‍රාවකයෝ මෙසේ අවවාද කරණු ලබන්නාහු මෙසේ අනුශාසනා කරණු ලබන්නාහු ඇතැම් කෙනෙක් ඒකාන්තයෙන් දක්වනලද නිර්වාණය ලබාගනිත්, ඇතැම් කෙනෙක් ලබා නොගනිත්, මෙහිලා මම කුමක් කරම්ද? බ්‍රාහ්මණය තථාගතතෙම මාර්ගය දැන මාර්ගය අවබොධකොට දෙශනාකරයි. තමා විසින් පිළිපදිනු ලබන්නෝ මිදෙන්නාහුවෙත්.

13. "ධොතකය, ලොකයෙහි කිසියම් සැකයෙන් යුත් පුද්ගලයෙක්තෙම" යන්නෙහි සැක ඇති, අදහස් දෙකක් ඇති, විචිකිච්ඡා සහිත යනුයි. "කිසියම්" යනු කිසියම් ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශුද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යනුයි. ලොකයෙහි යනු අපාය ලොකයෙහි (1-1) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

13. "ශ්‍රේෂ්ඨවූ ධර්මයද දැනගණු ලබන්නේ" යන්නෙහි ශ්‍රේෂ්ඨ ධර්මයයයි අමෘතවූ නිර්වාණයට කියයි. (ii) යම් ඒ දෙයක් සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමවේද, සියලු උපධීන්ගේ සංසිඳීමවේද, තෘෂ්ණා ක්ෂයනම්වේද, විරාගනම් වේද, නිරොධනම්වෙයි, ඒ නිර්වාණයයි. ශ්‍රේෂ්ඨය යනු අග්‍රය ශ්‍රේෂ්ඨය ප්‍රමුඛය, උතුම්ය, දැනගණු ලබන්නේ, අවබොධ කරණු ලබන්නේ යනු ශ්‍රේෂ්ඨ ධර්මයද දැනගණු ලබන්නේ මේ ඕඝය තරණය කරන්නේය. මෙසේ ඔබ කාමොඝය භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, තරණය කරන්නෙහිය, එතර වන්නෙහිය. ඉක්මවන්නෙහිය යනුයි.

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 5-4

1. "ශ්‍රේෂ්ඨයාණනි, කරුණා කරමින් අනුශාසනා කළ මැනවි." යනු ශ්‍රේෂ්ඨයන් වහන්ස, අනුශාසනා කරණු මැනවි. ශ්‍රේෂ්ඨයන් වහන්ස, අනුග්‍රහ කරණු මැනවි. ශ්‍රේෂ්ඨයන්වහන්ස, අනුකම්පා කළ මැනවි. කරුණා කරමින් යනු දයාවෙන් යුක්තවෙමින්, අනුග්‍රහ උපදවමින්, අනුකම්පා උපදවමින් යනුයි.

2. "යම්හෙයකින් මම විවේක ධර්මය දැනගනිම්ද" යන්නෙහි විවේක ධර්මය යනු අමෘතවූ නිර්වාණයට කියයි. යම් ඒ (5-3) 13 (ii) යෙදිය යුතුයි.) "යමක් මම දැනගනිම්ද, යන්නෙහි යමක් මම දැනගන්නෙම්ද, අවබොධ කරන්නෙම්ද, ලබන්නෙම්ද දකින්නෙම්ද ප්‍රත්‍යක්ෂ කරන්නෙම්ද යනුයි.

3. "යම්සේ මම අහස මෙන් වෙනසකට නොපැමිණෙන්නේ" යනු ආකාශය වෙනස් නොවේද, නොගනීද මෙසේ ආකාශය මෙන් වෙනසකට නොපැමිණෙන්නේ යනු යම්සේ ආකාශය යම්කිසි වර්ණයකට එනම්, ලාකඩ (රතු) පාටට හෝ කහපාටට හෝ නිල්පාටට හෝ මදටිය පාටට හෝ මෙසේ පාටකට නොපැමිණෙන්නේ යනුයි. යම්සේ ආකාශය නොකිපේද, ව්‍යාපාදයට නොපැමිණේද, නොගැවේද, මෙසේද අහස මෙන් වෙනසකට නොපැමිණෙන්නේද යනුයි.

4\. "මෙහිම සිටියේ යනු" මෙහිම නියුක්තවූයේ මේ ආසනයෙහිම සිටියේ මේ පිරිසෙහිම සිටියේ යනුයි මෙසේද මෙසේ සිටියේ යනුයි. නැවතද මෙහි සිටියේ යනු මෙහිම ශාන්තවූයේ උපශාන්තවූයේ. නිවුනේ, සංසිඳුනේ මෙසේද මෙහිම සිටියේ යනුයි.

5\. "ආශ්‍රිතනොවූ" යනු ආශ්‍රය දෙකකි. තෘෂ්ණා ආශ්‍රය හා දෘෂ්ටි ආශ්‍රය යනුයි. ('මමත්වය' යනු 'ආශ්‍රයයයි' වෙනස් කොට මහා නිද්දේසයේ (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි. 1561 පිට) තෘෂ්ණා ආශ්‍රය දුරකොට දෘෂ්ටි ආශ්‍රය බැහැරකොට ඇස ආශ්‍රය නොවූයේ, කණ ආශ්‍රය නොවූයේ, නාසය ආශ්‍රය නොවූයේ, දිව ආශ්‍රය නොවූයේ, කය ආශ්‍රය නොවූයේ, මනස ආශ්‍රය නොවූයේ, රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි, කුලයා කෙරෙහි ගණයා කෙරෙහි, ආවාසයෙහි, ලාභයෙහි, කීර්තියෙහි, ප්‍රශංසායෙහි, සැපයෙහි චීවරයෙහි, පිණ්ඩපාතයෙහි, සෙනාසනයෙහි ගිලන්පස බෙහෙත් පිරිකරෙහි, කාමධාතුවෙහි, රූපධාතුවෙහි, කාමභවයෙහි, රූප භවයෙහි, අරූපභවයෙහි, සංඥා භවයෙහි, අසංඥා භවයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤාභවයෙහි, එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි, පඤ්චවොකාර භවයෙහි, අතීතයෙහි අනාගතයෙහි, පවත්නා කාලයෙහි ඇසූ දුටු ස්පර්ශ කළ දැනගත් ධර්මයෙහි, ආශ්‍රයනොවූයේ නොඇළුනේ, නොපැමිණියේ, ආරාධිත නොවූයේ, නොඇළුනේ, නික්මුනේ, වෙන්වූයේ සීමානොකළ සිතින් වාසය කරන්නෙමි. ඉරියව් පවත්වන්නෙමි. පවතින්නෙමි. පාලනය කරන්නෙමි. යැපෙන්නෙමි, යනුයි. එසේ හෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 5-5

1\. "ඔබගේ ශාන්තිය ප්‍රකාශ කරන්නෙමි" යනු රාගයාගේ ශාන්තිය ද්වෙෂයාගේ ශාන්තිය, මොහයාගේ ශාන්තිය, ක්‍රොධයාගේ ශාන්තිය, බද්ධවෛරයාගේ, ගුණමකුකමේ, උතුමන් හා තමාද සමානයයි සිතීමේ, ඊර්ෂ්‍යාවේ, මසුරුකමේ, රැවටිල්ලේ කෛරාටිකකමේ, තදගතියේ එකට එක කිරීමේ, මානයාගේ

අතිමානයාගේ, මදයාගේ, ප්‍රමාදයාගේ කෙලෙසුන්ගේ, සියලු දුසිරිත්වල, සියලු පීඩාවල සියලු දැවිලිවල, සියලු තැවිලිවල, සියලු අකුසල රැස්කිරීම්වල ශාන්තිය, උපශාන්තිය, නිවීම, සංසිඳීම, ප්‍රකාශ කරන්නෙමි, කියන්නෙමි, දෙශනා කරන්නෙමි, පනවන්නෙමි, තබන්නෙමි, විවෘත කරන්නෙමි, බෙදන්නෙමි, ප්‍රකට කරන්නෙමි, යනුයි.

**2.** "දුටු ධර්මයෙහි මෙසේ වූයේයයි සිය ආරංචියෙන් නොඇසූධර්මයෙහි" යනු දුටු ධර්මයෙහි දැනගත් ධර්මයෙහි, සමකොට බැලූ ධර්මයෙහි, තීරණය කළ ධර්මයෙහි, ප්‍රකට ධර්මයෙහි, යනුයි. නැවතද දුක දුටුකල්හි දුක කියන්නෙමි. සමුදය දුටුකල්හි සමුදය (දුක්හේතුව) කියන්නෙමි. මාර්ගය දුටුකල්හි මාර්ගය කියන්නෙමි. නිරොධය දුටුකල්හි නිරොධය කියන්නෙමි. මෙසේද දුටු ධර්මයෙහි යනුයි. නැවතද තමා විසින් දැක්කයුතු කල්නොයවා විපාකදෙන, එව බලවයි කියයුතු, සමීපයට පමුණුවන, නුවණැත්තන් විසින් වෙන වෙන දතයුතු, මෙසේද දුටු ධර්මයෙහි යනුයි.

**3.** "ආරංචියෙන් නොඇසූ" යනු මෙසේ වූයේයයි නොඇසූ පරම්පරාවෙන් පැමිණියේයයි නොසැලකූ, කොටස් වශයෙන් නොගත්, තර්ක හේතුවෙන් නොගත් න්‍යාය හේතුවෙන් නොගත් ආකාරය විතර්කකොට නොගත්, දෘෂ්ටිය විනවිද බැලීමෙන් නොගත් තෙමේම දැක දැනගත් තමාට ප්‍රත්‍යක්ෂවූ ධර්මය යනුයි. "කියන්නෙමි" යනු දුටු ධර්මයෙහි මෙසේයයි ආරංචියෙන් නොඇසූ ධර්මයෙහි යමක් දැන සමකොට ලබා, තීරණයකොට ප්‍රකට කොට සියලු සංස්කාරයෝ අනිත්‍යයහයි දැන, ප්‍රකටකොට, තීරණයකොට සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයහයි යම්කිසි හෙතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දැන තීරණයකොට සමකොට බලා ප්‍රකටකොට යනුයි. සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ යනුයි. කයෙහි කය අනුව බලන සිහිය වඩන්නේනුයි සිහි ඇත්තේනම්. (1-8) 4 (ii) යෙදියයුතුයි.) හැසිරෙත් යනු හැසිරෙන්නේ වාසය කරන්නේ, ඉරියව් පවත්වන්නේ පවතින්නේ පාලනය කරන්නේ යනුයි.

4. "එයට ඔබ සතුටුවෙමි." යනු ඔබවහන්සේගේ වචනයට දෙශනාවට පද ගැලපීමට සතුටුවෙමි. අනුමෝදන් වෙමි. කැමතිවෙමි. යනුයි.

5. "මහර්ෂීන් වහන්සේ උතුම් ශාන්තිය" යන්නෙහි 'මහර්ෂි' යනු භාග්‍යවතුන් වහන්සේයි. මහත්වූ ශීල සමූහය (මහා නිද්දේශයේ (14-1) 10 ඡේදය යෙදිය යුතුයි.) උතුම්යයි අමෘතවූ නිර්වාණයට කියයි. යම් ඒ සියලු සංස්කාරයන් සමථයට පත්වූයේ සියලු උපධීන් බහා තැබූයේ තෘෂ්ණා ක්ෂය වූයේ, විරාග නම් වූයේ නිරොධ නම් වූයේ ඒ නිර්වාණ යයි. 'උතුම්' යනු උත්තම ප්‍රවර යනුයි.

6. "යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ" යන යමක් දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි. සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකට කොට යනුයි.

7. "සිහි ඇත්තේ" යනු කරුණු සතරකින් සිහි ඇත්තේ නමි. (1-8) 4 (ii) යෙදිය යුතුයි. හැසිරෙන්නේ යනු හැසිරෙන්නේ වාසය කරන්නේ ඉරියව් පවත්වන්නේ යැපෙන්නේ යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ ලොකයෙහි විසත්තිකාව තරණය කරන්නේය. යනුයි. විසත්තිකා යයි තෘෂ්ණාවට කියයි.

8. "විසත්තිකා" යනු කවර අර්ථයකින් විසත්තිකා නම් වේද, (මහා නිද්දේශයේ (10-16) 3 විශේෂයෙන් ඇලේනුයි යන තැන් සිට යෙදිය යුතුයි.) "ලෝකයෙහි" යනු අපාය ලෝකයෙහි (1-1) (ii) යෙදිය යුතුයි.) "ලෝකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කරන්නේය" යනු ලෝකයෙහි හෝ ඒ විසත්තිකාව තරණය කරන්නේය. විසත්තිකා ලොකය හෝ සිහි ඇතිව විසත්තිකාව තරණය කරන්නේය. යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීයේය.

## 5-6

1. "භාග්‍යවතුන් වහන්සේ ධෝතකය යමක් දැනගනිම්ද, අවබොධ කෙරෙම්ද, "උඩයට සරස හා මැද" යන්නෙහි උඩ යයි අනාගතයට කියයි යට යයි අතීතයට කියයි. සරස හා මැදයයි වර්තමානයට කියයි. නැවතද උඩ යනු කුශල ධර්මයෝයි. යට යනු අකුශල ධර්මයෝයි. සරස හා මැද අව්‍යාකෘත ධර්මයෝයි. උඩ යනු සුඛ වෙදනාවයි. යට යනු දුක්ඛ වේදනාවයි. සරස හා මැද යනු අදුක්ඛමසුඛ වේදනාවයි. මෙය ලොකයෙහි සංගයයි දැන යනු මෙය එල්බීමයයි. මෙය බන්ධනයයි මෙය පලිබොධය යයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

2. "භවාභවයෙහි තෘෂ්ණාව නොකරන්නෙහි" යන්නෙහි රූප තෘෂ්ණාව, ශබ්ද තෘෂ්ණාව, ගන්ධ තෘෂ්ණාව, රස තෘෂ්ණාව ස්පර්ශ තෘෂ්ණාව ධර්ම තෘෂ්ණාව යනුයි. "භවාභවයෙහි" යනු කර්ම භවයෙහි කාම භවයෙහි පුනර්භවයෙහි, රූප භවයෙහි, පුනර්භවයෙහි අරූප භවයෙහි, කර්මභවයෙහි, අරූපභවයෙහි, පුනර්භවයෙහි නැවත නැවත භවයෙහි ගතියෙහි, නැවත නැවත උත්පත්තියෙහි නැවත නැවත ප්‍රතිසන්ධියෙහි නැවත නැවත ආත්මභාවය ලැබීමෙහි තෘෂ්ණාව නොකරන්නෙහි නූපදවන්නෙහි, ඇති නොකරන්නෙහි, දුරුකරව, සංසිඳුව, සම්පූර්ණයෙන් අභාවයට පමුණුවව යනුයි.

## 6-1

1. "ශාක්‍යයන් වහන්ස, මම තනිවූයේ මහත්වූ ඔඝය යන්නෙහි තනිවූයේ යනු මට දෙවෙනි පුද්ගලයෙක් හෝ නැත. මට දෙවෙනි ධර්මයක් හෝ නැත. ධර්මයෙහි හෝ මට දෙවැන්නෙක් නැත. යම් පුද්ගලයෙකු නිසා හෝ ධර්මය නිසා හෝ මහත්වූ කාමෞඝය භවෞඝය දිට්ඨෞඝය අවිජ්ජෞඝය, තරණය කරන්නෙමි, එතර වන්නෙමි, ඉක්ම වන්නෙමි, යනුයි. "ශාක්‍යය" යනු භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය නම් වන සේක. ශාක්‍ය කුලයෙන් පැවිදි වූයේනුයි ශාක්‍යනම් වනසේක. නැවතද මේ නොයෙක් ධර්ම රත්නයන්ගෙන් ආඪ්‍යවූයේ මහත් ධන

ඇත්තේනුයි ශාක්‍ය නම් වනසේක. නැවතද සූරය, ධීරය, වික්‍රමයෙන් යුක්තය, බිය නොවන සුළුය, තැති නොගන්නා සුළුය, පහවූ ලොමු ඩැහැගැනීම් ඇත්තේයයි ශාක්‍ය නම්.

2. "උපසීව තෙම මෙසේ කීය. ශාක්‍යයන් වහන්ස මම මහත්වූ ඕඝය ආශ්‍රය නොවූයේ තරණය කරන්නට නොහැක්කෙමි." යන්නෙහි ආශ්‍රය නොවූයේ යනු පුද්ගලයා හෝ ආශ්‍රය නොවූයේ ධර්මය හෝ ආශ්‍රය නොවූයේ උත්සාහ නොකරමි. බලවත් නොවූයේ මහත්වූ කාමොඝය භවොඝය දිට්ඨොඝය, අවිජ්ජොඝය, තරණය කරන්නට එතර වෙන්නට ඉක්ම වන්නට යනුයි. ආශ්‍රය නොවූයේ තරණය කරන්නට නොහැක්කෙමි.

3. "සම්තැස් ඇති උත්තමයන් වහන්ස, අරමුණ දෙශනා කරණු මැනවි' යනු අරමුණ නිශ්‍රය. උපනිශ්‍රය කියනු මැනවි. දෙශනා කරණු මැනවි. පනවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි. බෙදනු මැනවි ප්‍රකාශ කරණු මැනවි, "සමතැස් යනු සමතැස්යයි සර්වඥතා ඥානයට කියයි. භාග්‍යවතුන් වහන්සේ ඒ සර්වඥතාඥානයෙන් යුක්ත සේක. (මහා නිද්දෙසයේ (14-7) 4 බුදු ඇසින් යන තැන සිට යොදාගත යුතුයි.) යමෙක් ආශ්‍රය වූයේ යනු යම් පුද්ගලයෙකු හෝ ආශ්‍රයවූයේ ධර්මය හෝ ආශ්‍රයවූයේ මහත්වූ කාමොඝය භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, තරණය, කරන්නේය, එතර වන්නේය. පිහිනන්නේය, ඉක්ම වන්නේය, යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

### 6-2

1. "ආකිඤ්චඤ්ඤාය බලන්නේ සිහිඇත්තේ" යනු ඒ බ්‍රාහ්මණතෙම ප්‍රකෘතියෙන්ම ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිලාභියෙකි. ඇත්තේම නිශ්‍රය නොදනියි. මේ නිශ්‍රයයයි ඒ භාග්‍යවතුන් වහන්සේ නිශ්‍රයද කියයි. මත්තෙහිද නෛයාර්ණික මාර්ගයවූ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය සිහි ඇතිව සමවැද සිහිඇතිව නැගිට එහි හටගත් චිත්ත චෛතසික ධර්මයන්හි අනිත්‍ය වශයෙන් බලන්නේ දුක්

වශයෙන්, රෝගවශයෙන්, ගඩ වශයෙන්, හුල් වශයෙන්, ආබාධ වශයෙන්, විනාශවීම් වශයෙන් සෙලවීම් වශයෙන් බිඳීම් වශයෙන්, අස්ථිර වශයෙන්, ආරක්ෂා නොවීම් වශයෙන්, පිහිට නොවීම් වශයෙන්, හිස් වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන්, ආදීනව වශයෙන් විපරිණාම ධර්මවශයෙන් අසාර වශයෙන් පීඩාවට මුල්වශයෙන්, භවවශයෙන් විභව වශයෙන්, ආශ්‍රව වශයෙන්, නම් වශයෙන්, මාරාමිෂ වශයෙන් ජාතිධර්ම වශයෙන්, ජරා ධර්මවශයෙන් ව්‍යාධි ධර්ම වශයෙන්, මරණ ධර්ම වශයෙන්, ශොක පරිදෙව, දුක්ඛ දොමනස්ස උපායාස වශයෙන්, සමුදය ධර්ම වශයෙන් අස්තංගම වශයෙන්, ආශ්වාද වශයෙන්, ආදීනව වශයෙන් නිස්සරණ වශයෙන් බලන්නේ පරීක්ෂා කර බලන්නේ යනුයි. "සිහි ඇත්තේ' යනු යම් සිහියක් ඇත්ද සිහිය පිහිටුවීමක් ඇද්ද, සිහිය අනුව යෙදීමක් ඇද්ද, සම්‍යක් ස්මෘතියක් ඇද්ද මේ සිහිය යයි කියනු ලැබේ. මේ සිහියෙන් යුක්තවූයේ වෙයි. (1-8) 4 කරුණු සතරකින් යන තැන සිට යෙදිය යුතුයි.) හෙතෙම සිහි ඇත්තේයයි කියයි.

2. "කිසිවක් නැත" යනු ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියයි. කුමන කරුනකින් කිසිවක් නැත යනු ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට කියාද, විඤ්ඤානඤ්චායතන සමාපත්තිය සිහි ඇතිව සමවැද සිහිඇතිව නැගිට ඒ විඤ්ඤාණයට ගරුකරයි, වඩයි, අතුරුදහන්කරයි. කිසිවක් නැතැයි දකියි. ඒ කාරණයෙන් කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය නිසා ඇසුරුකොට එල්බී, කාමොඝය භවොඝය දිට්ඨොඝය, ආවිජ්ජොඝය තරණය කරව, එතෙරකරවා පිහිනව, ඉක්මෙව, යනුයි.

3. "කාමයන් දුරුකොට සැකයෙන් වෙන්වූයේ," යන්නෙහි "කාම" නම් ප්‍රකට වශයෙන් කාමදෙකකි. වස්තු කාමද ක්ලේශ කාමදවෙති (මහා නිද්දේසයේ (1) 1 (ii) 2-3 ඡෙද යෙදිය යුතුය.) කාමයන් දුරුකොට යනු වස්තු කාමයන් දැන ක්ලේශ කාමයන් දුරුකොට බැහැර කොට, සංසිඳවා, නූපදනා බවට පමුණුවා යනුයි. "සැකය" යනු විචිකිච්ඡාවට කියයි. දුකෙහි

සැකය දුක්ඛ සමුදයේ සැකය දුක්ඛ නිරොධයේ සැකය දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාවේ සැකය ප්‍රතීත්‍ය සමුත්පාදයේ සැකය, තැතිගැන්ම සිතේ කලබලය, සැකය යන මෙයින් දුරුවූයේ, වෙන්වූයේ, නික්මුනේ සීමානොකළ සිතින් වාසයකරයි. මෙසේද සැකයෙන් වෙන්වූයේ යනුයි. නැවතද දෙතිස් තිරිසන් කථාවෙන් වෙන් වූයේ, ඈත්වූයේ, නික්මුනේ, සීමානොකළ සිතින් වාසය කරයි. මෙසේද සැකයෙන් වෙන්වූයේ යනුයි.

4. "තෘෂ්ණා" යනු රූප තෘෂ්ණා ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ තෘෂ්ණා යනුයි. "රත්ති" යනු රාත්‍රියයි 'අහො' යනු දවාලයි රෑද දවල්ද තෘෂ්ණාව දුරුකිරීම, රාගය දුරුකිරීම, ද්වෙෂය දුරුකිරීම, මොහය දුරුකිරීම, ගතිය දුරුකිරීම, උත්පත්තිය දුරුකිරීම, ප්‍රතිසන්ධිය දුරුකිරීම, භවය සංසාරය දුරුකිරීම, බලව මනාකොට බලව දුරුකරව, පරීක්ෂා කරව යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 6-3

1. "යමෙක් සියලු කාමයන්හි වීතරාග ඇත්තේ" යන්නෙහි "සියලු" යන සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරි නොකොට සම්පූර්ණයෙන් ගන්නා වචනයයි මේ 'සියල්ල' යනුයි. 'සියලු කාමයන්හි' යනු ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. වස්තුකාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මහා නිද්දේශයේ (1-1) 1 (ii) 2-3 ඡේද යෙදිය යුතුයි.)

2. "යමෙක් සියලු කාමයන්හි වීතරාග ඇත්තේ" යනු පහවූ රාග ඇත්තේ, වෙන්වූ රාග ඇත්තේ, මිදූ රාග ඇත්තේ, වමනය කළ රාග ඇත්තේ, බහා තැබූ රාග ඇත්තේ, විෂ්කම්භනවූයේ යනුයි.

3. "සියලු කාමයන්හි යමෙක් වීතරාග ඇත්තේ ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකළේ එය හැර සිතන්නේ" යනු යට සමාපත්ති සය හැර බැහැරකොට පරිත්‍යාගකොට, ඉක්මවා, ආකිඤ්චඤ්ඤායතනයෙහි ඇළුනේ, එළඹියේ යනුයි. විමොක්ඛ සඤ්ඤායයි සත්වැදෑරුම් සංඥා සමාපත්තීහු කියත්. යම් පමණ

සංඥා සමාපත්තීන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඇද්ද (ii) විමොක්ෂවූයේද, අග්‍රවූයේද, ශ්‍රෙෂ්ඨ වූයේද මිදුනේද, උතුම්වූද ප්‍රවරවූ අධිමුක්ති විමොක්ෂයෙන් මිදුනේ, එහි ඇළුනේ, එය චරිතකොට ඇත්තේ, එය බහුලකොට ඇත්තේ, එය ගරුකොට ඇත්තේ, එයට නැමුනේ, එයට බරවූයේ එය ඇලීම්කොට ඇත්තේ යනුයි.

4. "හෙතෙම ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි චුත නොවෙමින් සිටිනේද, 'සිටිනේද' යනු සංසය පුච්ඡා, විමති පුච්ඡා, මෙල්හක පුච්ඡා, අනෙකංස පුච්ඡා යනුයි. මෙසේ වේද, මෙසේ නොවේද කුමක්වේද, කෙසේ වේද 'එහි සිටිනේද යනු, ආකිඤ්චඤ්ඤායතනයෙහි චුත නොවෙමින් යනුයි. නැවතද පසුනොබසිමින් සිටියේද යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

### 6-4

1. "සියලු කාමයන්හි යමෙක් වීතරාග ඇත්තේද" යන්නෙහි 'සියලු' යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරිනොකොට ගන්නා වචනයයි. මේ සියලු යනුයි 'කාමයන්හි' යනු ප්‍රකට වශයෙන් කාම දෙකක් වස්තු කාමද ක්ලේශ කාමද යනුයි. (මහානිද්දේශයේ (1) 1 (ii) 2-3 ඡේද යෙදිය යුතුයි. 1523-1524 පිටු)

2. "සියලු කාමයන්හි යමෙක් වීතරාග ඇත්තේ" යනු දුරුකළ රාග ඇත්තේ සංසිඳුවනලද රාග ඇත්තේ මැඩපවත්වන ලද රාග ඇත්තේ යනුයි. භාග්‍යවතුන් වහන්සේ උපසීවය, ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකළේ එය හැර සිතත් යනු යට සමාපත්ති සය හැරබැහැරකොට, පරිත්‍යාගකොට, ඉක්මවා වෙන් කොට ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති නිශ්‍රිත වූයේ, ඇළුනේ, පැමිණියේ, ගැළුනේ, යනුයි. සංඥාවිමොක්ෂයයි සත්වැදෑරුම් සංඥා සමාපත්තීහු කියත්. යම් පමණ සංඥාවන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියක්වේද, විමොක්ෂ වූයේද අග්‍රවූයේද, ශ්‍රෙෂ්ඨවූයේද, ප්‍රමුඛවූයේද උත්තමවූයේද, (6-2) 3 (ii) යෙදිය යුතුයි.)

3. "හෙතෙම එහි චුත නොවෙමින් සිටින්නේය" යනු කල්ප සැටදහසක් සිටින්නේය. "එහි" යනු ආකිඤ්චඤ්ඤායතනයෙහි "චුත නොවෙමින් යනු" (ii) කම්පා නොවෙමින් වෙනස් නොවෙමින්, අතුරුදහන් නොවෙමින්, නොපිරිහෙමින්, නැවතද නොඇලෙමින් දුෂ්‍ය නොවෙමින්, මුලා නොවෙමින්, සිටින්නේය යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 6-5

1. "හෙතෙම ඉදින් චුතනොවී සිටින්නේ නම්" යනු ඉදින් හෙතෙම එහි කල්ප සැට දහසක් සිටින්නේ නම් යනුයි. එහි යනු ආකිඤ්චඤ්ඤායතන යෙහියි. 'චුත නොවූයේ' යනු 6-4-3 (ii) යොදාගත යුතුයි) "සර්වඥයන් වහන්ස, බොහෝ වර්ෂයක්" යනු බොහෝ වර්ෂ සිය ගණනක් බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂගණනක්, බොහෝ කල්ප දහස් ගණනක්, බොහෝ කල්ප සියගණනක් බොහෝ කල්ප දහස් ගණනක්, බොහෝ කල්ප ලක්ෂ ගණනක්, යනුයි.

2. "සමතැස් ඇති සර්වඥයන් වහන්ස" යන්නෙහි සමතැස්යයි සර්වඥතාඥානයට කියයි. (මහානිද්දෙසයේ (14-7) 4 බුදු ඇසින් යන තැනසිට යොදාගත යුතුයි.) හෙතෙම එහි ප්‍රීති භාවයට පැමිණියේ නිත්‍යවූයේ ධ්‍රැව වූයේ ශාස්වතවූයේ, වෙනස් නොවූයේ එහිම සිටින්නේනම් යනුයි. නැවතද ඔහුගේ විඤ්ඤාණය චුතවන්නේ නම් සිඳෙන්නේ නම් චුත වන්නේ නම් යනුයි. නැවත ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් උපදවන්නේනම් කාමධාතුයෙහි හෝ රූප ධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි හෝ ආකිඤ්චඤ්ඤායතනය උපන්නහුගේ පරිනිර්වාණයද ප්‍රතිසන්ධියද විචාරයි. එබඳුවූවහුට යනු එබඳුව සිටියහුට එබඳු ප්‍රකාර ඇත්තහුට යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීය.

## 6-6

1. යම්සේ වාත වේගයෙන් විසුරුවනලද ගිනිසිල" යන්නෙහි "ගිනි සිලයයි" ගිනි දැල්ලට කියයි. "වාතයෝ නම් පෙරදිග වාතය, අපරදිගවාතය, උතුරුදිග වාතය, දකුණු දිග

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වාතය, රජස් ඇති වාතය රජස් නැති වාතය ශීතලවාතය උෂ්ණවාතය ස්වල්පවාතය කාලවාතය, වෙරම්භවාතය, පක්ෂවාතය, ස්වර්ණවාතය, තාලපර්ණවාතය, විධූපනවාතය, යනුයි. "වාතවෙගයෙන් විසුරුවන ලද' යනු විසිකරණ ලද තැන් තැන්හි දමන ලද යනුයි. භාග්‍යවතුන් වහන්සේ උපසීවය යනුයි. "අස්තයට යයි" යනු නිරුද්ධ වෙයි. සන්සිඳෙයි, යනුයි. "සංඛ්‍යාවට නොපැමිණෙයි. උදෙසීමට නොපැමිණෙයි. ගණනට නොපැමිණෙයි ප්‍රඥප්තියට නොපැමිණෙයි. පෙරදිගට ගියේයයි අපරදිගට ගියේයයි උතුරුදිගට ගියේයයි දකුණු දිගට ගියේයයි උඩට ගියේයයි යටට ගියේයයි සරසට ගියේයයි නොයෙක් දිශාවට ගියේයයි' එබඳු හේතුවක් නැත, ප්‍රත්‍යයක් නැත, කරුණක් නැත යනුයි. "මෙසේ මුනීන් වහන්සේ නාම කයින් මිදුනේ යන්නෙහි" "මෙසේ" යනු උපමාව පිළියෙල වීමයි.

"මුනි' යනු මොනයයි ඥානයට කියයි. (මහා නිද්දෙශයේ (2-8) 10 ඡෙද යොදාගත යුතුයි.) 'නාම කයින් මිදුනේ' යනු ඒ මුනීන් වහන්සේ ප්‍රකෘතියෙන් මුලදීම රූප කායයෙන් මිදුනේ ඒ අංගයෙන් ඉක්මවීමෙන් විෂ්කම්භන ප්‍රහානයෙන් ප්‍රහීනවූයේ වෙයි. ඒ මුනිවරු භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ සතර ආර්ය මාර්ග අවබොධ කළාහු වෙති. සතර ආර්ය මාර්ගය අවබොධ කළ බැවින් නාම කයද රූප කයද දැන ගන්නාහු වෙත්, නාම කයද රූප කයද දැනගත් බැවින් නාම කයින්ද රූප කයින්ද මිදුනේ වෙයි. අත්‍යන්ත අනුපාදා විමොක්ෂයෙන් මිදුනේ වෙයි. අර්ථයට ගියේයයි සංඛ්‍යාවට නොයයි යනු අනුපාදි ශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවුනේයයි, ගණනට නොයයි. උදෙසීමට නොපැමිණෙයි. ප්‍රඥප්තියට නොයයි. ක්ෂත්‍රිය යයි හෝ බ්‍රාහ්මණයයි හෝ වෛශ්‍යයයි හෝ ශුද්‍රයයි හෝ ගෘහස්ථයයි හෝ ප්‍රව්‍රජිතයයි හෝ දෙවියයි හෝ මිනිස්යයි හෝ රූපීයයි හෝ අරූපීයයි හෝ සඤ්ඤීයයි හෝ අසඤ්ඤීයයි හෝ නෙවසඤ්ඤී නාසඤ්ඤීයයි හෝ එබඳු හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. කාරණයක් නැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 6-7

1. "හෙතෙම අස්තයට ගියේ නැවත වාසයක් නැද්ද" යනු අස්තංගතවූ හෙතෙම නැද්ද විනාශවූයේද නැවත වාසයක් නැත්ද යනුයි. "නැතහොත් නිත්‍යද, වෙනස් නොවන්නේද යනු සැමදා එහිම සිටින්නේද යනුයි.

2. "නැතහොත් සදාකාලිකව ආරොග්‍යයෙන් යුක්තව සිටින්නේද එය මුනීන් වහන්සේ මනාකොට ප්‍රකාශ කරණු මැනව" යන්නෙහි එය යනු යමක් විචාරම්ද, යමක් ඉල්ලම්ද? යනුයි. "මුනි" යනු මොනයයි ඥානයට කියයි. (මහා නිද්දෙශයේ 2-8) (10) ඡෙද යොදාගත යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනිනම්. "මනාකොට ප්‍රකාශ කළ මැනවි" යනු යහපත්ව කියනු මැනව, දෙශනා කරණු මැනව. පනවනු මැනව, තබනු මැනව, විවෘත කරණු මැනව, යනුයි.

3. "එසේ ඔබවහන්සේ විසින් දන්නා ලද ධර්මය" යනු ඔබවහන්සේ විසින් දන්නා ලද, සමකොට බලන ලද තීරණය කරණ ලද, ප්‍රකට කරණ ලද මේ ධර්මය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 6-8

1. "අස්තයට ගියහුට රූප ප්‍රමාණයක් නැත" යන්නෙහි අස්තයට ගියහුට යනු අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියහුට රූප ප්‍රමාණයක් නැත. වේදනා ප්‍රමාණයක් නැත. සංඥා ප්‍රමාණයක් නැත, සංස්කාර ප්‍රමාණයක් නැත, විඥ්ඥාණයක් නැත, විද්‍යමාන නොවෙත්, නොලැබෙත්, ප්‍රහීනය, මුලින් සිඳුනේය, ඉපදීමට අයොග්‍යය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය. උපසීවයයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

2. "යමෙකු විසින් ඔහු මෙසේ මෙසේයයි කියන්නේ නම්" යනු යම් රාගයකින්, යම් ද්වෙෂයකින්, යම් මොහයකින්

කියන්නාහු නම්, යම් මානයකින්, යම් දෘෂ්ටියකින්, යම් උද්ධච්චයකින්, යම් විචිකිච්ඡාවකින් කියන්නාහු නම්, යම් අනුසය යන්ගෙන් කියන්නාහුනම්, රාගයෙන් රත්වූයේයයි කියා හෝ ද්වෙෂයෙන් දූෂ්‍ය වූයේයයි කියා හෝ මෝහයෙන් මුලාවූයේයයි කියා හෝ එකට බැඳුනේයයි කියා හෝ ථාම බවට ගියේය කියා හෝ කියයුත්තක් නැත. රැස්කිරීම් ප්‍රහීනය, රැස්කිරීම් ප්‍රහීණ බැවින් යම් ගතියක් නොකියන්නාහුය. තිරිසනෙක කියා හෝ තිරිසනෙක කියා හෝ ප්‍රෙත විෂයෙහි වූවෙක කියා හෝ මිනිසෙක කියා හෝ දෙවියෙක කියා හෝ රූපියෙක කියා හෝ අරූපියෙක කියා හෝ සඤ්ඤීයෙක කියා හෝ අසඤ්ඤීයෙක කියා හෝ නෙවසඤ්ඤියෙක කියා හෝ අසඤ්ඤියෙක කියා හෝ නෙවසඤ්ඤි නාසඤ්ඤියෙක කියා හෝ කීමට එබඳු හේතුවක් නැත, ප්‍රත්‍යයක් නැත, කාරණයක් නැත යනුයි.

3. "නසන ලද ස්කන්ධාදී ධර්මයන්හි" යනු සියලු ස්කන්ධයන්හි, සියලු ආයතනයන්හි, සියලු ධාතූන්හී, සියලු ගතීන්හි සියලු උත්පත්තීන්හි, සියලු ප්‍රතිසන්ධින්හි, සියලු භවයන්හි, සියලු සංසාරයන්හි, සියලු වට්ටයන්හි, ඉදිරීම ඇතිකල්හි සන්සිඳීම ඇතිකල්හි, ඉපදීමට අයොග්‍ය බව ඇතිකල්හි, ඥානය නමැති ගින්නෙන් දැවුන කල්හි යනු සියල්ල නැති කළ කල්හි, සියලු වාද මාර්ගද නැතිකරණ ලද්දේය,

4. "සියලු වාද මාර්ග නැති කරණ ලද්දේය" යන්නෙහි වාදපථයෝ නම් ක්ලේශයෝද ස්කන්ධයෝද අභිසංස්කාරයෝද වෙති. ඒ වාදයෝද වාද මාර්ගයෝද අධිවචනයෝද අධිවචන මාර්ගයෝද නිරුක්තිද, නිරුක්ති මාර්ගයෝද ප්‍රඥප්තිද ප්‍රඥප්ති මාර්ගයෝද ඉවත් කරණ ලදී. උපුටා දමන ලදී. ප්‍රහීණ කරණ ලදී. ඉපදීමට අයොග්‍ය කරණ ලදී. ඥානය නමැති ගින්නෙන් දවන ලදී යනුයි.

ගාථා අවසානය සමගම ඒ බ්‍රාහ්මණයා (1-8 (6) යෙදිය යුතුයි)

# නන්ද මානවක සූත්‍ර නිර්දෙශය

## 7-1

1. "ලොකයෙහි මුනීහු ඇත්තාහයි කියත්" යනු ඇත්තාහ, විද්‍යමානවෙත්, ලැබෙත් යනුයි. 'මුනීහු' යනු මුනි නම්වූ ආජීවකයෝ, නිඝණ්ඨයෝ, ජටිලයෝ, තාපසයෝ, දෙවියෝ යන මොව්හු ලොකයෙහි මුනීහුයයි දැනගනිත්. ඔවුහු ලොකයෙහි මුනීහු වෙත්යයි ජනයෝ කියත්. ආයුෂ්මත් නන්දතෙම මෙසේ කීය. 'ඔබවහන්සේ විසින් මෙය කියනු මැනවි' යන්නෙහි ජනයෝ නම් ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද, ශුද්‍රයෝද, ගෘහස්ථයෝද ප්‍රව්‍රජිතයෝද, දෙවියෝද, මිනිස්සුද ඔවුහු ලෝකයෙහි මුනීහු යයි කියත්, ප්‍රකාශ කරත්, ව්‍යවහාර කරත්. 'කෙසේ නම්' එය ප්‍රකාශ කරද්ද, යන්නෙහි 'කෙසේනම්' යනු සංසය පුච්ඡා, විමති පුච්ඡා, මෙල්හක පුච්ඡා, අනෙකංස පුච්ඡා, මෙසේ වූයේද, මෙසේ නුවූයේද, කුමක් වූයේද, කෙසේවූයේදැයි යනුයි.

2. "කවර ඥානයක් උපන් බැවින් ඔවුහු මුනීහුයයි කියද්ද?" යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥ්ඥානයෙන් හෝ යුක්තවූවහුට, පැමිණියහුට මුනියයි කියත්, ප්‍රකාශ කරත්ද යනුයි.

3. "නැතහොත් දුෂ්කර ජීවිකාවෙන් යුක්ත බැවින්ද" යනු කවර නම් දුෂ්කරවූ රූක්ෂවූ දිවිපැවැත්මකින් යුක්ත වූවහුට මුනියයි කියද්ද, ව්‍යවහාර කරද්ද යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 7-2

1. "දෘෂ්ටියෙන් හෝ ශ්‍රැතියෙන් හෝ ඥානයෙන් හෝ නොවේ" යන්නෙහි දෘෂ්ටියෙන් යනු දෘෂ්ටි ශුද්ධියෙන් නොවේ, ශ්‍රැතියෙන් නොවේ, යනු ශ්‍රැත ශුද්ධියෙන් නොවේ, ඥානයෙන් යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් නොවේ පඤ්චාභිඥා ඥානයෙන් හෝ නොවේ. මිථ්‍යා ඥානයෙන් නොවේ යනුයි. 'දක්ෂයෝ' යනු යම් ඒ ස්කන්ධ දක්ෂයෝ ධාතු දක්ෂයෝ

ආයතන දක්ෂයෝ ප්‍රතීත්‍යසමුත්පාද දක්ෂයෝ, සතිපට්ඨාන දක්ෂයෝ. සම්‍යක් ප්‍රධාන දක්ෂයෝ, ඍද්ධිපාද දක්ෂයෝ ඉන්ද්‍රිය දක්ෂයෝ, බල දක්ෂයෝ, බොධ්‍යංග දක්ෂයෝ මාර්ග දක්ෂයෝ, ඵල දක්ෂයෝ, නිර්වාණ දක්ෂයෝ යන ඒ දක්ෂයෝ දෘෂ්ටි ශුද්ධියෙන් හෝ ශ්‍රැත ශුද්ධියෙන් හෝ අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ මිථ්‍යා ඥානයෙන් හෝ දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ යුක්තවූවහුට පැමිණියහුට මුනියයි නොකියත්, ප්‍රකාශ නොකරත් යනුයි.

2. "යම් කෙනෙක් තුමූ මාරසේනාව දුරුකළාහුද කෙලෙස් දුරුකළාහුද ඔවුහු මුනීහුයයි කියමි" 'සේනා' යයි මාර සේනාවට කියයි. කාය දුශ්චරිතය මාරසේනාවකි. (මහා නිද්දෙසයේ (13-20 (1) යෙදිය යුතුයි) කෙලෙස් යනු රාගය, ද්වෙෂය, මොහය, ක්‍රොධය, බද්ධවෛරය (මහා නිද්දෙශයේ (2-4) 2 මක්ඛය යන තැන සිට යෙදිය යුතුයි) සියලු අකුසල රැස්කිරීම්ද වෙති. යමෙකුට මේ දුක් ඇතිකරවණ කෙලෙස් ප්‍රහීනද මුලින් සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද එබැවින් කෙලෙස් රහිතයයි කියත්

3. "ආශා රහිත" යනු ආශායයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුසල මූලයක් ඇද්ද එයයි යමෙකුන්ගේ මේ ආශාව ප්‍රහීනද, මුලින් සිඳුනේද, සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද ඔවුහු ආශා රහිතවූවෝ යයි කියති.

4. "හැසිරෙත්" යනු වාසය කරත්. ඉරියව් පවත්වත් පවතිත්, පාලනය කරත්. යැපෙත් යනුයි. ඔවුහු ලොකයෙහි මුනීහුයයි කියමි, ප්‍රකාශ කරමි, දෙශනා කරමි, පණවමි, විවෘත කරමි, බෙදමි, ප්‍රකට කරමි යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

7-3

1. "යම්කිසි මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙද්ද" යන්නෙහි යම්කිසි යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරිනොකොට ගන්නා වචනයකි. මේ යම්කිසි යනුයි. (ii)

'ශ්‍රමණයෝ' යනු යම්කිසි මේ ශාසනයෙන් පිටත් පැවිදි බවට පත්වූවෝ හෝ පරිබ්‍රාජක බවට පැමිණියෝ හෝ යනුයි. 'බමුණෝ' යනු යම්කිසි භොවාදී නම්වූ බ්‍රාහ්මණයෝයි. දැකි දෙයෙහිද ඇසූ දෙයෙහිද ශුද්ධිය කියත් යනු දැකි දෙයින්ද ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්, ඇසූ දෙයින්ද ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ප්‍රකාශ කරත්. දැකි දෙයින් හා ඇසූදෙයින්ද ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්. ශීලව්‍රතයෙන්ද ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ප්‍රකාශ කරත්.

2. "නොයෙක් ආකාරයෙන් ශුද්ධිය කියත්" යනු නානා විධ ව්‍රත චරණයෙන් හා මංගලයයි සම්මත මිථ්‍යා මතවලින්ද ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය කියත්, ප්‍රකාශ කරත්, යනුයි.

3. "හුදෙක් (කිසිසේත්) මෙහි යම්සේ හැසිරෙද්ද යන්නෙහි හුදෙක් යන අර්ථයවූ කිඤ්චාපි යනු ස්වර ගැලපීමයි. ස්වර පරිපූරණයයි අකුරු සම කිරීමයි. පද සිළුටු කිරීමයි. මේ කිඤ්චාපි යනුයි. "ඔවුහු" යනු දෘෂ්ටිගතිකයෝයි, එහි යනු ස්වකීය දෘෂ්ටියෙහි, ස්වකීය කැමැත්තෙහි, ස්වකීය රුචියෙහි, ස්වකීය ලබ්ධියෙහි යනුයි.

4. "සංවරණය වූවාහු" යනු ගොපනය වූවාහු හැසිරෙන්නාහු, වාසය කරන්නාහු, ඉරියව් පවත්වන්නාහු, යනුයි. හුදෙක් ඔවුහු එහි හැසුරුනාහු ජාතිය හා ජරාව තරණය නොකළාහුයයි කියමි. යනු ජාති ජරා මරණයන් එතර නොකළාහ, නොඉක්මවූහ. ජාති ජරා මරණයන් නොඉක්මවූ බැවින් ජාති ජරා මරණයෙහි ඇතුළත පෙරළෙත්, සංසාර වට්ටයෙහි පෙරළෙත්. (ii) ජාතිය අනුව ගියෝ ජරාවෙන් විසුරුවන ලද්දෝ, ව්‍යාධියෙන් මඩනා ලද්දෝ මරණයෙන් පහර ලැබුවෝ ආරක්ෂාවක් නැත්තෝ අසරණවූවෝ යයි කියමි, පනවමි, තබමි, විවෘත කරමි, ජාති ජරාව තරණය නොකළාහුයයි කියමි යනුයි, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

## 7-4

1. "යම්කිසි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද" යන්නෙහි යම්කිසි යනු (7-3) 1 යෙදිය යුතුයි.) මෙසේ නන්දතෙම කීයේය, යනුයි. මුනි යනු "මොන" යයි ඥානයට කියයි. 'ඕඝසතරණය නොකළවුන් කීයෙහිය' යනු කාමොඝය, භවොඝය, දිට්ඨොගය, අවිජ්ජොඝය, තරණය නොකළවුන්, නොඉක්මවූවන්, කීයෙහිය. ඔව්හු ජාති ජරා මරණයෙහි පෙරළෙත්. සංසාර වට්ටයෙහි පෙරළෙත්, ජාතිය අනුව ගියාහු (7-3 (ii) යෙදිය යුතුයි.) පිහිටක් නැත්තාහුයයි කීයෙහිය.

2. "එසේ නම් නිදුකානන් වහන්ස දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි කවරෙක් ජාති ජරාවන් තරණය කළේද" යනු මේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි කවරෙක් ජාති ජරා මරණයන් තරණය කළේද? ඉක්මවූයේද යනුයි. 'නිදුකාණෙනි' යනු ප්‍රිය වචනයයි, ගරු වචනයයි, සැලකිය යුතු වචනයයි, මේ නිදුකානෙනි, යනුයි. 'මෙය භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරමි, දෙශනා කරණු මැනවි, යනු එය විචාරමි, එය ආරාධනා කරමි' එය ඉල්ලමි යනුයි.

3. "භගවත්" යනු ගෞරව වචනයයි. (මහා නිද්දෙසයේ 7-2 (1) යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි. ඒ මේ භගවත් යනුයි 'මෙය කියනු මැනව' යනු දෙශනා කරණු මැනවි, කියනු මැනවි, පනවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි. බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 7-5

1. "(භාග්‍යවතුන් වහන්සේ) නන්දයෙනි මම සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ජාති ජරා වැළඳ ගත්තාහුයයි නොකියමි" යනු නන්දය සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ජාති ජරාවෙන් ගැවසී ගත්තාහු වැසුනාහු වැළඳ ගත්තාහුයයි මම නොකියමි. ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ප්‍රතිසන්ධියද ජාති ජරා මරණයන්ද ප්‍රහීනකළාහු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මුලින් සින්දාහු අග සිඳිනලද තල් ගසක් මෙන්කළාහු සම්පූර්ණ අභාවයට පැමිණවූවාහු නැවත ඉපදීමට අයොග්‍ය කළාහු ඇත්තාහයි කියමි. දෙශනා කරමි, පනවමි, තබමි, විවෘත කරමි, බෙදමි, ප්‍රකට කරමි, යනුයි.

2. "නන්දය, මම සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ජාති ජරාවෙන් වෙළුනාහුයයි නොකියමි" යනු යම් කෙනෙක් මේ ලොකයෙහි දැකි, ඇසූ, ස්පර්ශ කළ දේ හෝ ශීල ව්‍රතයන් හෝ සියල්ල දුරුකොට යන්නෙහි "සියල්ල" යනු යම් ඒ සියලු දෘෂ්ටි ශුද්ධීන් දුරුකොට, බැහැරකොට සම්පූර්ණ අභාවයට පමුණුවා යම් ඒ සියලු ශ්‍රැත ශුද්ධීන් යම් ඒ සියලු මූත ශුද්ධීන්, යම් ඒ සියලු ස්පර්ශ ශුද්ධීන් දුරුකොට යම් ඒ දැකි, ඇසූ ඉන්ද්‍රිය තුණකින් ස්පර්ශ කළ ශුද්ධීන් දුරුකොට යම් ඒ සියලු ශීල ශුද්ධීන් දුරුකොට, ව්‍රත ශුද්ධීන් දුරුකොට, ශීල ව්‍රත ශුද්ධීන් දුරුකොට, බැහැරකොට සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි. නොයෙක් ආකාර දෘෂ්ටි යනු නොයෙක් ආකාර මංගලයයි සම්මත මිථ්‍යා මතවලින් ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය දුරුකොට යනුයි.

3. "තෘෂ්ණාව මනාකොට දැන ආශ්‍රව රහිතවූ ඒ මනුෂ්‍යයෝ කාමාදී සැඩ වතුරෙන් එතරවූහයි කියමි," යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා, ධර්ම තෘෂ්ණා යනුයි. "තෘෂ්ණාව දැන" යනු තෘෂ්ණාව ඥාත, තීරණ, පහාන යන දැනීම් තුනින් දැනයනුයි. "ආශ්‍රව රහිතවූවෝ" යන්නෙහි ආශ්‍රව සතරෙකි. කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යනුයි. යමෙකුන්ගේ මේ ආශ්‍රවයෝ ප්‍රහීනද මුලින් උදුරන ලද්දේද, අග සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේද, නැවත නූපදනා බවට පමුණුවන ලද්දේද ඔවුහු ආශ්‍රව රහිතයෝයයි කියත්.

4. "යම් කෙනෙක්" යනු අර්හත් ක්ෂීණාශ්‍රවයෝයි. "තෘෂ්ණාව දැන අනාශ්‍රවවූවෝ ඇත්ද ඔවුහු කාමාදී සැඩ වතුරෙන් එතරවූයේ යයි කියමි" යනු යමෙක් තෘෂ්ණාව දැන ආශ්‍රව රහිතවූවෝද මමද ඔවුහු කාමොඝය, භවොඝය,

දිට්ඨොඝය, අවිජ්ජොඝය එතර කළාහුයයි සියලු සංසාර පථය එතර කළාහුයයි කියමි. යනුයි.

## හෙමක මානවක නිර්දෙශය

### 8-1

1. "යම් ඒ මොව්හු ප්‍රකාශ කළාහුද" යනු බවාරි බ්‍රාහ්මණයා සහ ඔහුගේ ආචාර්යවරු ස්වකීය දෘෂ්ටිය, ස්වකීය කැමැත්ත, ස්වකීය ලබ්ධිය, ස්වකීය අධ්‍යාශය, ස්වකීය අභිප්‍රාය ප්‍රකාශ කළහ, කීහ, දෙශනා කළහ, පැනවූහ, තැබූහ, ප්‍රකට කළහ, යනුයි.

2. "ආයුෂ්මත් හෙමකතෙම මෙසේ කීය. ගෞතම ශාසනයෙන් පෙර" යනු ගෞතම ශාසනයට පළමුව යනුයි. "ගෞතම ශාසනයෙන්" යනු බුද්ධ ශාසනයෙන්, ජින ශාසනයෙන්, තථාගත ශාසනයෙන් දෙව ශාසනයෙන් අරහන්ත ශාසනයෙන් යනුයි. 'මෙසේය' මෙසේ වන්නේය, "මෙසේ වනාහි වූයේය" යනු සියල්ල මෙසේය. මෙසේ වන්නේය. මෙසේ වීයයි ආරංචියෙන් හෝ පරම්පරාවෙන් හෝ කොටස් කොට ගැනීමෙන් හෝ තර්ක හේතුවෙන් හෝ න්‍යාය හේතුවෙන් හෝ ආකාර වශයෙන් විතර්ක කොට හෝ දෘෂ්ටිය විනිවිද බැලීමෙන් හෝ දැනගත් තමා මනාව දැන නොගත් ධර්මයක් ප්‍රකාශ කළහ. සියල්ල මෙසේවූයේ යයි ආරංචියෙන් දැනගත් යනුයි." සියල්ල තර්කය ඇතිකරවන්නාවූ" යනු සියල්ල තර්කය ඇති කරවන්නාවූ සියල්ල විතර්කය ඇති කරවන්නාවූ සියල්ල සිතිවිලි ඇති කරවන්නාවූ ව්‍යාපාද විතර්කය ඇති වරන්නාවූ විහිංසා විතර්කය ඇති කරවන්නාවූ, ඥාති විතර්කය, ජනපද විතර්කය, අමරා විතර්කය, පරානුද්දයතා පටිසංයුත්ත විතර්කය, ලාභ සක්කාර සිලොක පටිසංයුත්ත විතර්කය, අවිඤ්ඤත්ති පටිසංයුත්ත විතර්කය, ඇති කරවන්නාවූ යනුයි. මම එහි සතුටු නොවීමි යනු මම එහි නොඇලීමි. නොවිඳියෙමි, නොපැමිණියෙමි, යනුයි එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8-2

1. "ඔබ වහන්සේද ධර්මය දෙශනා කරණු මැනවි" යන්නෙහි "ඔබ වහන්සේ" යනු භාග්‍යවතුන් වහන්සේට කියයි 'ධර්මය කියනු මැනවි' යන්නෙහි ධර්මය නම් මුල යහපත්, මැද යහපත්, අග යහපත්, අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත, සියල්ල සම්පූර්ණ, පිරිසිදු බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරණ, සතර සතිපට්ඨානයන් සතරසම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියන්, පංචබලයන්, සප්ත බොධ්‍යංගයන්, ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිර්වාණය නිර්වාණ ගාමිණී ප්‍රතිපදාව මට ප්‍රකාශ කරණු මැනව, දෙශනා කරණු මැනව කියනු මැනව, පනවනු මැනවි, තබනු මැනවි යනුයි.

2. "මුනීන් වහන්සේ තෘෂ්ණාව දුරු කිරීමට" යන්නෙහි, 'තෘෂ්ණා' නම් රූප තෘෂ්ණාව ධර්ම තෘෂ්ණාව යනුයි දුරුකිරීම' යනු තෘෂ්ණාව නැතිකිරීම, තෘෂ්ණාව ව්‍යපසමනය, තෘෂ්ණාව සන්සිඳීම, අමෘතවූ නිර්වාණය යනුයි. "මුනි" යනු මොනයයි ඥානයට කියයි. (මහා නිද්දෙසයේ (3-1) (3) යොදාගත යුතුයි. තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නමි.

3. "යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ" යනු යමක් දැන තීරණයකොට, ප්‍රකටකොට, සියලු සංස්කාරයන් අනිත්‍යයයි දැන සමකොට බලා තීරණයකොට, ප්‍රකටකොට සියලු සංස්කාරයෝ දුක්යයි සියලු සංස්කරයෝ අනිත්‍යයයි සියලු ධර්මයෝ අනාත්මයයි යම්කිසි හෙතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි ප්‍රකටකොට සමකොට බලා තීරණය කොට යනුයි "සිහි ඇත්තේ" යනු කරණු සතරකින් සිහි ඇත්තේ නමි. (1-8) 4 (ii) යොදාගත යුතුයි.) "හැසිරෙන්නේ" යනු හැසිරෙන්නේ ඉරියව් පවත් වන්නේ පාලනය කරන්නේ. ප්‍රකාශ කරන්නේ, යැපෙන්නේ, යනුයි. "විසත්තිකා" යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. විසත්තිකා යනු කවර අර්ථයකින් විසත්තිකා නම් වේද? (මහා නිද්දෙසයේ (10-12) 3 යොදාගත යුතුයි.) විසුරුවානුයි විසත්තිකා

නමි. ලොකයෙහි යනු අපාය ලොකයෙහි, දිව්‍යලොකයෙහි, ස්කන්ධලොකයෙහි, ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි.

4. "ලොකයෙහි විසත්තිකා" යනු ලොකයෙහි විසත්තිකාව හෝ විසත්තිකා ලොකය හෝ තරණය කරන්නෙමි. ඉක්ම වන්නෙමි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේකීය.

8-3

1. "හෙමකය, මේ ලොකයෙහි දැකි, ඇසූ, ස්පර්ශ කළ, දැනගත් ධර්මයන්හි" යනුයි. 'දකින ලද යනු ඇසින් දක්නා ලද ප්‍රිය රූපයන් අසනලද යනු කණින් අසන ලද 'මුත' යනු නාසනේ ආඝ්‍රාණය කරණ ලද, දිවින් රශවිඳින ලද, කයින් ස්පර්ශ කරණ ලද යනු සිතින් දැනගත් යනුයි. "හෙමකය මේ ලොකයෙහි දැකී ඇසූ, ස්පර්ශ කළ දැනගත් ධර්මයන්හි" යනු කවරක් ලොකයෙහි ප්‍රිය රූපවේද යහපත් රූපවේද, ඇස ලොකයෙහි ප්‍රිය රූප වේ යහපත් රූපවේ, කණලොකයෙහි ප්‍රිය රූපවේ යහපත් රූපවේ. දිව ලොකයෙහි ප්‍රිය රූපයවේ. යහපත් රූප වේ. සිත ලොකයෙහි ප්‍රිය රූප වේ, යහපත් රූප වේ. රූපයෝ ලොකයෙහි ප්‍රිය රූපයවේ. යහපත් රූපවේ. ශබ්දයෝ ලොකයෙහි ප්‍රිය රූපවේ. යහපත් රූපවේ. ගන්ධයෝ ලොකයෙහි ප්‍රිය රූපවේ. යහපත් රූපවේ. ස්පර්ශයෝ ලොකයෙහි ප්‍රිය රූපවේ. යහපත් රූපවේ. ධර්මයෝ ලොකයෙහි ප්‍රිය රූප වේ. යහපත් රූපවේ. චක්ඛු විඤ්ඤාණය ලොකයෙහි ප්‍රිය රූප වේ. යහපත් රූපය වේ. ඇසේ ස්පර්ශයෙන් හටගත් වේදනාව කණ, නාසය, දිව, මනස යන මේවායින් හටගත් වේදනාව ලොකයෙහි ප්‍රිය රූපය වේ. යහපත් රූපය වේ, රූප සංඥාව ලොකයෙහි ප්‍රිය රූපයවේ. යහපත් රූපය වේ. ශබ්ද සංඥාව ලොකයෙහි ප්‍රිය රූපයවේ. යහපත් රූපයවේ. ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම සංඥාවන් ලොකයෙහි ප්‍රිය රූපයවේ, යහපත් රූපයවේ. රූප සඤ්චෙතනාව ලොකයෙහි ප්‍රිය රූපය වේ, යහපත් රූපයවේ. ශබ්ද ගන්ධ, රශ, ස්පර්ශ, ධර්ම සඤ්චෙතනාවන් ලොකයෙහි ප්‍රිය රූපවේ, යහපත් රූපයවේ, රූප තෘෂ්ණාව ලොකයෙහි

ශබ්ද තෘෂ්ණාව ලොකයෙහි ප්‍රිය රූපය වේ. යහපත් රූපයවේ ගන්ධ රශ, ස්පර්ශ, ධර්ම තෘෂ්ණාවන් ලොකයෙහි (ii) ප්‍රිය රූපයවේ. යහපත් රූපයවේ. රූප විතර්කය ලොකයෙහි (මෙහි (ii) ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ විතර්කයන් ලොකයෙහි (මෙහි (ii) රූප විචාරය ලොකයෙහි (මෙහි (ii) ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, විචාරයන් ලොකයෙහි (මෙහි (ii)

2. "හේමකය ප්‍රිය රූපයන්හි ඡන්දරාග විනොදනය" යන්නෙහි ඡන්දරාගය නම් කාමයන්හි යම් කාමච්ඡන්දයක් ඇද්ද, කාමරාගයක් ඇද්ද, කාමනන්දියක් ඇද්ද, කාම තෘෂ්ණාවක් ඇද්ද, කාම ස්නේහයක් ඇද්ද, කාම පරිඩාහයක් ඇද්ද, කාම මූර්ඡාවක් ඇද්ද, කාමයෙහි ගැලීමක් ඇද්ද, කාමොඝය, කාමයොගය, කාමූපාදානය, කාමච්ඡන්ද නීවරණය යනුයි. 'ඡන්ද විනොදය' යනු ඡන්ද රාග ප්‍රහානය, ඡන්දරාග සංසිඳීම, අමෘතවූ නිර්වාණය යනුයි. අච්‍යුත නම් නිර්වාණ පදය යනුයි. තාන පදය ලෙන පදය, සරණ පදය අගය පදය යනුයි. නිත්‍යවූ ධ්‍රැවවූ ශාස්වතවූ වෙනස් නොවන ධර්මය යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

1. "ඒ සිහි ඇත්තෝ මෙය දැන" යන්නෙහි "මෙය" යන අමෘතවූ නිර්වාණයයි යම් ඒ තැනක් සියලු සංස්කාරයන් සමනය කළ සියලු උපධීන් දුරුකළ, විරාග නම් වූ නිරොධ නම් වූ නිර්වාණයයි දැන, සමකොට බලා තීරණය කොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැන සම කොට බලා තීරණයකොට, ප්‍රකටකොට සියලු සංස්කාරයෝ දුක්යයි, සියලු ධර්මයෝ අනාත්මයයි දැන සමකොට බලා තීරණය කොට යම්කිසි හේතු ප්‍රත්‍ය ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණය කොට, ප්‍රකටකොට යනුයි.

2. "යම් කෙනෙක් තුමූ" යනු අර්හත් ක්ෂීණාශ්‍රවයෝයි. "සිහි ඇත්තේ" යනු කරුණු සතරකින් සිහි ඇත්තේ නම් (1-8) 4 (ii) යෙදිය යුතුයි. ඔව්හු සිහි ඇත්තෝයයි කියත්. "නුවණැත්තෝ මේ කාරණය දැන දැකි ධර්මයෙහි නිවුනාහු" යන්නෙහි 'දැකිධර්මයෙහි' දැකිධර්මය, නම් සමකොට බැලු

ධර්මය, තීරණය කළ ප්‍රකට කළ ධර්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැකි ධර්මය, සියලු සංස්කාරයෝ දුක්යයි දැකි ධර්මය, සියලු ධර්මයෝ අනාත්මයයි දැකි ධර්මය, යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේ යයි දැකි ධර්මය, අවබොධ කළ ධර්මය, සමකොට බැලූ ධර්මය, තීරණයකළ ධර්මය යනුයි. විශේෂයෙන් නිවුනාවූ යනු රාගය නිවුන බැවින්, නිවුනේ නම්, ද්වෙෂය (මහානිද්දේසයේ (3-4) 2 යෙදිය යුතුයි. 1578 පිට) සියලු අකුශල ධර්මයන් සන්සිඳුන බැවින්, නිවූ බැවින්, සන්සිඳූ බැවින් නිවුනේ නම්.

3. "ඔව්හු හැමකල්හි නිවුනාහු වෙති." යනු රාගය බැහැරකළ බැවින් ද්වෙෂය (බැහැරකළ බැවින් යනු යොදා මහා නිද්දේසයේ (3-4) 2 යෙදිය යුතුයි) 'ඔවුහු' යනු අර්හත් ක්ෂිණාශ්‍රවයන් වහන්සේලායි හැමකල්හි යනු සියලු කාලයෙහි නිත්‍ය කාලයෙහි නිතර ඊතලයෙන් ඊතලය සේ රැල හා රැලසේ පෙරබත, පසුබත, පූර්වයාමය, මධ්‍යම යාමය, පශ්චිමයාමය, කාලයෙහි, හේමන්තයෙහි, ග්‍රීෂ්මයෙහි, පූර්ව වයස්කොටසෙහි මධ්‍යම වයස් කොටසෙහි, පශ්චිම වයස් කොටසෙයි යනුයි.

4. "ලෝකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කළාහු" යන්නෙහි විසත්තිකා නම් තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ඇද්ද, අකුශල මූලයක් ඇද්ද එයයි. කවර අර්ථයකින් විසත්තිකා නම් වේද, (මහා නිද්දෙසයේ (10-12) 3 ඡෙදයේ විශෙෂයෙන් ඇලේනුයි යන තැන සිට යෙදිය යුතුයි. 1713 පිට) 'ලොකයෙහි' යනු අපාය ලොකයෙහි (1-1) 1 (i) යෙදිය යුතුයි.) ආයතන ලෝකයෙහි යනුයි.

5. "ලෝකයෙහි විසන්තිකා නම් තෘෂ්ණාව තරණය කළාහු" යනු ලෝකයෙහි ඒ විසත්තිකා නම් තෘෂ්ණාව හෝ විසත්තිකා තෘෂ්ණා ලොකය හෝ තරණය කළාහු එතර වූවාහු ඉක්මෙව්වාහු යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

**(ගාථා අවසානයත් සමගම (1-8) 6 යෙදිය යුතුයි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# තොදෙය්‍යමානවක සූත්‍ර නිර්දේශය.

## 9-1

1. "යමෙකු කෙරෙහි කාමයෝ නොවසද්ද" යන යමෙකු කෙරෙහි කාමයෝ නොසිටිද්ද විශෙෂයෙන් නොවෙසෙත්ද, මෙසේ තොදෙය්‍යතෙම කීයේය. තෘෂ්ණාව යමෙකුට නැද්ද, විද්‍යමාන නොවෙත්ද, යනු තෘෂ්ණාව යමෙකුට විද්‍යමාන නොවෙද්ද, නූපදීද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම සැකයෙන් එතරවූයේද යන සැකය එතරකළේද ඉක්මවූයේද යනුයි. "ඔහුගේ මිදීම කෙසේද" යනු ඔහුගේ මිදීම කෙබඳුවේද, කවර ප්‍රකාරයක්වේද යනුයි. ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

2. "යමෙකු කෙරෙහි කාමයෝ නොවසත්ද" යනු යම් කිසි පුද්ගලයකු කෙරෙහි අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කෙරෙහි යනුයි. කාමයෝ යනු ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. වස්තුකාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මහා නිද්දේසයේ (1) 1 (ii) 2, 3 ඡෙද යෙදිය යුතුයි.)

3. "යමෙකු කෙරෙහි කාමයෝ නොවෙසෙද්ද" යනු යමෙකු කෙරෙහි කාමයෝ නොවෙසෙත්ද, නොපිහිටද්ද යනුයි. භාග්‍යවතුන් වහන්සේ තොදෙය්‍යය යනුයි. තෘෂ්ණාව යමෙකුට නැත්ද යන්නෙහි තෘෂ්ණාව නම් රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා ධර්ම තෘෂ්ණා යනුයි.

4. "යමෙකුට" යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. තෘෂ්ණාව යමෙකුට නැද්ද යනු තෘෂ්ණාව යමෙකුට නැද්ද නොලැබේද, ප්‍රහීනද, සංසිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි. හෙතෙම සැකය තරණය කළේය යන්නෙහි සැකය නම් විචිකිච්ඡාවට කියයි. දුකෙහි සැකය, දුක් ඇතිවීමෙ සැකය, දුක්ඛ නිරොධයේ සැකය, දුක්ඛ නිරොධගාමිණී ප්‍රතිපදාවේ සැකය, ප්‍රතීත්‍ය සමුත්පාදයේ සැකයද යනුයි. 'යමෙක්' යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ යනුයි.

5. "හෙතෙම සැකයෙන් එතරවූයේ" යනු හෙතෙම සැකයෙන් එතරවූයේ, උත්තීර්ණ වූයේ ඉක්මවූයේ යනුයි 'ඔහුට අන්‍ය මිදීමක් නැත' යනු ඔහුට අනික් වෙන මිදීමක් නැත. යම් මිදීමකින් මිදුනේ නම් (එකල්හි) හෙතෙම මිදුනේය ඔහුට අනික් මිදීමක් නැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

6. "හෙතෙම රූපයෙහි බලාපොරොත්තුව ඇතිකර ගනියි" යනු තෘෂ්ණා ඇති ශබ්දයෙහි ගන්ධයෙහි රශයෙහි ස්පර්ශයෙහි කුලයෙහි, ගණයෙහි, ආවාසයෙහි, ලාභයෙහි, යශසෙහි, ප්‍රශංසාවෙහි, සැපතෙහි, චීවරයෙහි පිණ්ඩපාතයෙහි, සෙනාසනයෙහි, ගිලන්පස බෙහෙත් පිරිකරෙහි, කාම ධාතුවෙහි රූප ධාතුවෙහි අරූපධාතුවෙහි කාම භවයෙහි රූප භවයෙහි අරූප භවයෙහි සංඥා භවයෙහි අසංඥා භවයෙහි නෙවසඤ්ඤා නාසංඥා භවයෙහි එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි පංචවොකාර භවයෙහි අතීතයෙහි අනාගතයෙහි පවත්නා කාලයෙහි දැකි, ඇසූ දැනගත් ධර්මයෙහි බලාපොරොත්තුවෙයි. ආශා කරයි. ප්‍රාර්ථනා කරයි. පහකළ ආශා ඇති නුවණැති හෙතෙම යන්නෙහි නුවණැති යනු පණ්ඩිතවූයේ, ප්‍රඥාවත්වූයේ, බුද්ධිමත්වූයේ ඥාන ඇත්තේ යනුයි.

7. "ඥානයෙන් සිතයිද" යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ තෘෂ්ණා කල්පය හෝ කරයිද, ඇති කරයිද උපදවයිද යනුයි.

8. "ශාක්‍යවූ මුනීන්වහන්ස, මම යම්සේ දැනගනිම්ද" යන්නෙහි ශාක්‍ය නම් භාග්‍යවතුන් වහන්සේයි ශාක්‍ය කුලයෙන් පැවිදිවූයේනුයි ශාක්‍ය නමි. (5-3) 8 ඡේදය යෙදිය යුතුයි.) එය යනු යමක් විචාරම්ද යමක් ඉල්ලම්ද, එය කියනු මැනව, දෙශනා කරණු මැනව, විවෘත කරණු මැනව, බෙදනු මැනව, ප්‍රකාශ කරණු මැනව යනුයි. 'සමන්ත චක්ඛු ඇති සර්වඥයන් වහන්ස," යන්නෙහි 'සමන්ත චක්ඛු' යනු සර්වඥතා ඥානයට කියයි. (මහා නිද්දෙසයේ (14-7) 4 බුදු ඇසින් යන තැන සිට යෙදිය යුතුයි.) එහෙයින් ඒ බ්‍රාහ්මණ තෙම කීය.

**9-3**

**1.** "ආශා නැත්තාවූ හෙතෙම බලාපොරොත්තු නොවෙයි" යනු හෙතෙම රූපයෙහි බලාපොරොත්තුව ඇතිකර නොගනියි, ශබ්දයෙහි, ගන්ධයෙහි, රශයෙහි, ස්පර්ශයෙහි බලාපොරොත්තුව ඇතිකර නොගනියි. දැකි ඇසූ දැනගත් ධර්මයෙහි බලාපොරොත්තු නොවෙයි. කැමති නොවෙයි ප්‍රාර්ථනා නොකරයි, ආශා නොකරයි.

**2.** "ප්‍රඥාවත් තෙම ප්‍රඥාවෙන් සිතයි" යනු පණ්ඩිතවූ, ප්‍රඥාවත් බුද්ධිමත් යනුයි. හෙතෙම ඥානයෙන් තෘෂ්ණාව නොගනියි යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ තෘෂ්ණා කල්පය නොගනියි, දෘෂ්ටිකල්පය නොගනියි, තොදෙය්‍යය, 'මෙසේද මුනිතෙම දැනගනුව' යන්නෙහි මුනිවරයා යනු මොනයයි ඥානයට කියයි (මහා නිද්දේසයේ (3-1) 3 යෙදිය යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්.

**3.** "තොදෙය්‍යය, මෙසේද මුනිවරයා දැනගනුව" යනු දැනගනුව, විශෙෂයෙන් දැනගනුව, අවබොධ කරව යනුයි. "රාගාදී කිඤ්චන නැති කාම භවයෙහි නොඇළුන" යන්නෙහි කිඤ්චන යනු රාග කිඤ්චනය, ද්වෙෂ කිංචනය, මොහ කිංචනය මාන, දෘෂ්ටි, ක්ලේශ, දුශ්චරිත, කිඤ්චනයන් යන මේවා වෙති. යමෙකුගේ මේ කිඤ්චනයෝ ප්‍රහීනද, මුලින් සිඳුනේද, ශාන්තද, සංසිඳුනේද, ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අකිඤ්චනයයි කියයි.

**4.** "කාමයෝ" නම් ප්‍රකට වශයෙන් කාම දෙකකි. වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මහා නිද්දෙසයේ 1 (ii), 2, 3 ඡෙද යෙදිය යුතුයි.)

**5.** "භවයෝ" යනු භව දෙකකි. කර්ම භවයද ප්‍රතිසන්ධික නම්වූ පුනර්භවයද යනුයි. මේ ප්‍රතිසන්ධිකවූ පුනර්භවයයි.

**6.** "අකිඤ්චනවූ පුද්ගලයා කාම භවයෙහි නොලැගෙයි" යනු නොරඳයි, නික්මුනේය, මිදුනේය, සීමා නොකළ සිතින්

වාසය කරයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ. (ගාථාවසානය සමගම (1-8) 6 යෙදිය යුතුයි.)

## කප්පමානවක සූත්‍ර නිර්දෙශය

### 10-1

1. "සංසාරයෙහි සිටිත් යන්නෙහි" 'පර' යනු සංසාරයට කියයි. ආගමනය, ගමනය, කාලය, ගතිය, භවාභවය, ච්‍යුතිය, උත්පත්තිය, පහළවීම, නිරොධය ජාතිය, ජරාව මරණයද, සංසාරයාගේ පූර්ව කෙළවරද නොපෙණෙයි. අන්තිම කෙළවරද නොපෙණෙයි. සංසාර මධ්‍යයෙහි සත්වයෝ සිටියාහු පිහිටියාහු ඇළුනාහු ගැළුනාහු යනුයි.

2. "කෙසේ සංසාරයාගේ පූර්ව කෙළවර නොපෙණේද?" (i) මෙපමණ ජාති දහසක් සසර පැවතුනේය. ඔබ්බට නැතැයි කීමට කරුණක් නැත. මෙසේද සංසාරයාගේ පූර්ව කෙළවර නොපෙණෙයි. මෙපමණ ජාති කෝටි සියයක් (ii) සසර පැවතුනේය. ඉන් ඔබ්බට නොපවත්නේයයි කීමට කරුණක් නැත. මෙසේද සංසාරයාගේ පූර්ව කෙළවරක් නොපෙණේ. (iii) මෙපමණ ජාති කෝටි දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ ජාති කෝටි ලක්ෂයක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ ගණනක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ සියක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ සියක් දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ කෝටියක් (මෙහි (ii) යෙදිය යුතුයි. මෙපමණ වර්ෂ කෝටි සියයක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ කෝටි දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ වර්ෂ කෝටි ලක්ෂයක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ කල්ප ගණනක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ කල්ප සියයක් (මෙහි (ii) යෙදිය යුතුයි. මෙපමණ කල්ප දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි. මෙපමණ කල්ප සියක් දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ කල්ප කෝටියක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ කල්ප කෝටි සියයක් (මෙහි (ii)

යෙදිය යුතුයි.) මෙපමණ කල්ප කෝටි දහසක් (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙපමණ කල්ප කෝටි දස දහසක් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. "මහණෙනි, සංසාරයෙහි අග මුලක් නැත. පූර්ව කෙළවරක් නොපෙණේ. තෘෂ්ණා සංයෝජනයෙන් බැඳුන අවිද්‍යාවෙන් වැසුන සත්වයන්ගේ දිවීම සැරිසැරීම වෙයි. මහණෙනි, මෙසේ දීර්ඝ කාලයක් දුක විඳින ලදී. දරුණු දේ විඳිනලදී. ව්‍යසනයන් විඳිනලදී, සොහොන් වඩන ලදී මහණෙනි යම්තාක් මේ සංසාරයෙහි කළකිරීමට සුදුසුය. වෙන්වීමට සුදුසුය. මිදීමට සුදුසුය." මෙසේද සංසාරයෙහි පූර්ව කෙළවරක් නොපෙණේ කෙසේ සංසාරයෙහි අන්තිම කෙළවරක් නොපෙනේද යනු මෙපමණ ජාතීහු සංසාරයෙහි පවත්නේයයි (iv) ඉන් එහා නොපවත්නේයයි මෙබඳු කරුණක් නැත. මෙපමණ ජාති සියයක් මෙපමණ ජාති දහසක්, මෙපමණ ජාති සියක් දහසක් (මෙහි (iv) යෙදිය යුතුයි.) මෙසේද සංසාරයාගේ අන්තිම කෙළවරක් නොපෙණේ. සංසාර මධ්‍යයෙහි සත්වයෝ සිටියාහු වෙත්, ඇළුනාහු වෙත්, පැමිණියාහු වෙත් යනුයි.

3. මහත් බිය ඇති ඕඝය (දිය පහර) හටගත් කල්හි යනු කාමෞඝය, භවෞඝය, දිට්ඨෞඝය හටගත් කල්හි, උපන් කල්හි, පහළවූ කල්හි, යනුයි මහත් භය ඇති යනු ජාති භය ජරා භය, ව්‍යාධි භය යනුයි.

4. "ජරා මරණයෙන් පීඩිතවූවන්ගේ" යනු ජරා මරණයෙන් පීඩිතවූවන්ගෙ යුක්තවූවන්ගේ, ජාතිය අනුව ගියවුන්ගේ, ජරාවෙන් විසුරුවන ලද්දවුන්ගේ, ව්‍යාධියෙන් මඩන ලද්දවුන්ගේ, ආරක්ෂා නැත්තවුන්ගේ, පිහිට නැත්තවුන්ගේ යනුයි. තිදුකාණන් වහන්ස, ජරා මරණයෙන් පීඩිතවූවන්ගේ ආරක්ෂාව පිහිට ගතිය කියනු මැනවි, දෙශනා කරණු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකාශ කරණු මැනවි යනුයි. 'තිදුකානෙනි,' යනු ප්‍රිය වචනයයි ගරු වචනයයි, සැළකියයුතු වචනයයි, "ඔබවහන්සේ පිහිට කියනු මැනවි," යනු පිහිට, සරණය, ගතිය, පරායනය කියනු මැනවි, දෙශනා කරණු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකාශ කරණු මැනවි, යනුයි.

5. "ඔබවහන්සේ මට යම් පිහිටක් කියනසේක් නම් එය එසේමය. අනික් පරිද්දකින් නොවන්නේය." යම්සේ දුක්ඛයන් මෙහිම නිරුද්ධ වන්නේය, සන්සිඳෙන්නේය, එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය. 'අස්තයට යන්නේය. නැවත ප්‍රතිසන්ධිය ලැබීමේ දුක නූපදවන්නේය. කාම ධාතුවෙහි හෝ කාම භවයෙහි හෝ රූප භවයෙහි හෝ අරූප භවයෙහි හෝ, සඤ්ඤා භවයෙහි හෝ අසඤ්ඤා භවයෙහි හෝ නෙවසඤ්ඤා නාසඤ්ඤා භවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාර භවයෙහි හෝ පඤ්චවොකාර භවයෙහි හෝ නැවත ගතිය හෝ උත්පත්තිය හෝ ප්‍රතිසන්ධිය හෝ භවයෙහි හෝ සංසාරයෙහි හෝ වට්ටයෙහි හෝ නූපදින්නේය. ඇති නොවන්නේය, මෙහිම නිරුද්ධ වන්නේය සන්සිඳෙන්නේය' යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 10-2

1. භාග්‍යවතුන් වහන්සේ කප්පය, සසර මැද සිටිනවුන්ට මහත්වූ ඔඝය ඇතිවූ කල්හි ජරා මරණාදීන් යුක්ත වූවන්ගේ පිහිට කියමි. "පෙර" යෙහි මැද සිටියවුන්ට යන්නෙහි "පර" නම් සංසාරයයි ආගමනය, ගමනාගමනය, කාලය, ගතිය. භවාභවය, චුතිය, උත්පත්තිය, බිඳීම ජාති ජරාමරණයද සංසාරයාගේ පූර්ව කෙළවරද නොපෙණෙයි. පසු කෙළවරද නොපෙණෙයි. මැද සසරෙහි සත්වයෝ සිටියාහු, පිහිටියාහු ඇළුනාහු පැමිණියාහු යනුයි. කෙසේ සංසාරයේ පූර්ව කෙළවර නොපෙණේද (10-1 (2) (i-ii-iii) ඡේද යෙදිය යුතුයි.) මෙසේ සංසාරයාගේ පූර්ව කෙළවර නොපෙණේ. කෙසේ සංසාරයාගේ පසු කෙළවර නොපෙණේද? (10-1 (2) (iv) යෙදිය යුතුයි.) මෙසේ සංසාරයාගේ පසු කෙළවර නොපෙණේ. මෙසේ සංසාරයාගේ පූර්ව කෙළවරද පසු කෙළවරද නොපෙණේ මැද සංසාරයෙහි සිටියාහු, පිහිටියාහු, ඇළුනාහු, පැමිණියාහු ගැළුනාහු යනුයි. 'මහත් බිය ඇති ඔඝය පැමිණි කල්හි යනු,' කාමොඝය, භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, ඇතිවූ කල්හි හටගත් කල්හි පහළවූ කල්හි යනුයි. මහත් භය යනු ජාති භය ජරා භය, ව්‍යාධි

භය, මරණ භය යනුයි. "ජරා මරණයෙන් පීඩිතවූවන්ට" යනු ජරාවෙන් යුක්තවූවන්ට ජාතිය (ඉපදීම) අනුව ගියවුන්ට ජරාවෙන් විසුරුවන ලද්දවුන්ට ව්‍යාධියෙන් මැඩුනවුන්ට පිහිටක් නැතියවුන්ට යනුයි. "නිදුකානෙනී, ආරක්ෂාව ගතිය ප්‍රකාශ කරණු මැනවි දෙශනා කරණු මැනවි පනවනු මැනවි තබනු මැනවි විවෘත කරණු මැනවි බෙදනු මැනවි යනුයි. ඔබවහන්සේ මට පිහිට ප්‍රකාශ කරණු මැනවි. එය අන් පරිද්දෙකින් නොවන්නේය" යනු යම්සේ මේ දුක මෙහිම නිරුද්ධ වන්නේ නම් සංසිඳීම වන්නේ නම්, අස්තයට යන්නේ නම් නැවත ප්‍රතිසන්ධි දුක නූපදවන්නේ නම් කාම ධාතුවෙහි හෝ කාම භවයෙහි හෝ රූප භවයෙහි හෝ අරූප භවයෙහි හෝ සඤ්ඤා භවයෙහි හෝ අසඤ්ඤා භවයෙහි හෝ නෙවසඤ්ඤා නාසඤ්ඤා භවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාර භවයෙහි හෝ පංචවොකාර භවයෙහි හෝ නැවත ගතිය හෝ උත්පත්තිය හෝ ප්‍රතිසන්ධිය හෝ භවාභවයෙහි හෝ සංසාරයෙහි හෝ වට්ටයෙහි හෝ නූපදින්නේ නම් ඇති නොවන්නේ නම් මෙහිම නිරුද්ධවන්නේ නම් සන්සිඳෙන්නේ නම් යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීය.

## 10-3

1. "පරය හෙවත් සංසාර මධ්‍යයෙහි සිටියහුට" යන්නෙහි "පර" නම් සංසාරයයි. ආගමනය, ගමනාගමනය, කාලය ගතිය භවාභවය ව්‍යුතිය, උත්පත්තියද ජාති මරණ සංසාරයාගේ පූර්ව කෙළවර නොපෙණෙයි. (10-1) 1 (i-ii-iii-iv) ඡෙද යෙදිය යුතුයි.) ජාති ජරා මරණයෙන් පීඩිතවූවන්ට පිහිටක් කියමි. කප්පකය යනු ආලොකයක් ආරක්ෂාවක් පිහිටක් ගතියක් කියමි. දෙශනා කරමි පනවමි තබමි විවෘත කරමි. බෙදමි ප්‍රකට කරමි යනුයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 10-4

1. "රාගාදී කිඤ්චනයන් නැති දැඩිව අල්ලාගැනීම් නැති" යන්නෙහි කිඤ්චන නම් (4-11) 1 කිඤ්චන යන තැන සිට යෙදිය යුතුයි.) දැඩිව ගැනීම යනු තෘෂ්ණාවට කියයි (ii) යම්

රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද දැඩිව ගැණීමක් ඇද්ද එයයි. දැඩිව ගැනීමේ ප්‍රහානය, දැඩිව ගැනීම් සංසිඳීම, අමෘතවූ නිර්වාණයයි යනුයි (iii) මෙය පිහිටකි. අනිකක් නැත" යනු මෙය පිහිටකි. ආරක්ෂාවකි ගතියකි. අනිකක් නැත යනු වෙනින් අනික් පිහිටක් නැත. අග්‍රවූ, ශ්‍රෙෂ්ඨවූ, ප්‍රමුඛවූ, පිහිට මෙයයි. යනුයි "එය නිර්වාණයයි කියමි" යන්නෙහි 'වානයයි' තෘෂ්ණාවට කියයි. යම්රාගයක් ඇද්ද (10-4) 1 (ii) යෙදිය යුතුයි.) තෘෂ්ණා ප්‍රහානය, තෘෂ්ණා ව්‍යපසමය, තෘෂ්ණා සංසිඳීම නම්වූ අමෘතවූ නිර්වාණයයි ඉති 'මෙසේ' යනු ස්වර සන්ධියයි. ස්වර සංසර්ගයයි. ස්වර සම්පූර්ණ කිරීමයි. අකුරුසම කිරීමයි. පදසිළුටු කිරීමයි. "කියමි" යනු දෙශනාකරමි, පනවමි, තබමි, විවෘතකරමි, බෙදමි, ප්‍රකටකරමි, ප්‍රකාශකරමි, යනුයි. "යම් ඒ සිහිඇත්තෝ මේ කාරණය දැන" යන්නෙහි "මෙය" යනු අමෘතවූ නිර්වාණයයි. යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමක් ඇද්ද සියලු උපධීන්ගේ දුරුකිරීමක් ඇද්ද, තෘෂ්ණාක්ෂය නම්වූ, විරාග නම්වූ, නිරොධ නම්වූ, නිර්වාණයයි. "දැන" යනු දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (1-8) 3 යෙදිය යුතුයි.) යම් කිසි හේතු ප්‍රත්‍ය ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි දැන, සමකොට බලා, තීරණයකොට, යනුයි. "යම්කෙනෙක්" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයෝයි. "සිහිඇති" යනු කරුණු සතරකින් සිහි ඇති යනුයි. කයෙහි කය අනුව බලන සිහිය වඩන බැවින් ((1-8) 4 (ii) යෙදිය යුතුයි.) එහෙයින් සිහි ඇත්තෝයයි කියත්. "දැකිධර්මයෙහි නිවුනාහු" යන්නෙහි දැකි ධර්මයනම් දැකි ධර්මය, සමකොට බැලූ ධර්මය තීරණය කළ ධර්මය, යනුයි. නිවුනාහු යනු ලොභය නිවූ බැවින් නිවුනාහු, ද්වෙෂය නිවූ බැවින් (මහානිද්දේසයේ (3-4) 2 යෙදිය යුතුයි. 1578 පිට) "ඔව්හු මාරයාගේ වසඟයට නොපැමිණෙත්" යනු යම් ඒ මාර, කණ්හ අධිපති, අන්තගු, පමත්ත බන්ධු යන නම් ඇති ඒ මාරයාගේ වසඟයට නොයෙත්, මාරයා ඔවුහු වසඟයට නොගනිත්, ඔව්හු මාරයාද මාරපක්ෂයද, මාරපාශයද මාරබිලියද, මාරවිෂයද, මාර නිවාසයද, මාරගොචරයද මාරබන්ධනයද මැඩ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පවත්වා යටපත්කොට හැසිරෙත්, වාසයකරත්, ඉරියව් පවත්වත්, පාලනය කරත්. ඔව්හු මාරයාගේ ශිෂ්‍යයෝ නොවෙත්" යනු ඔව්හු මාරයා ලඟ හැසිරෙන්නෝ නොවෙත්. ඔව්හු භාග්‍යවත් බුදුන්ගේ ශිෂ්‍යයෝ වෙත්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළහ. (ගාථා අවසානය සමගම (1-8) (6) යෙදිය යුතුයි.)

## ජතුකණ්ණි මානවක සූත්‍ර නිර්දෙශය

### 11-1

1. "වීරයන් වහන්ස, ඔබවහන්සේ කාමයන් නොකැමැත්තේයයි අසායනු දැන ඉගෙණ, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන්ද අර්හත් සේක සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය ලොකවිදූය නිරුත්තර පුරුෂයන් හික්මවන රියැදුරුය දෙව්මිනිසුන්ට ශාස්තෘය බුද්ධය භාග්‍යවත්යයි යනු අසා" යනුයි. වීරයන් වහන්ස, මම යන්නෙහි "වීර" යනු භාග්‍යවතුන් වහන්සේ වීරනම්වන සේක. වීර්ය ඇත්තේනුයි "වීර" නමි. ශක්ති ඇත්තේනුයි වීර නමි. අර්ථයට සුදුසුනුයි වීර නමි සූර බැවින් වීර නමි. වික්‍රම ඇත්තේනුයි බිය නැත්තේනුයි. තැති නොගන්නේනුයි, පලානොයේනුයි. ප්‍රහීණ කළ බිය හා බියට හේතුදේ ඇති බැවින් මෙහි සියලු පාපයන්ගෙන් වෙන්වූයේ නිරය දුක ඉක්මවා සිටියේනුයි' වීර නමි. ප්‍රධන්වීර්ය කළේනුයි වීර නමි. "කාමය නොකැමැත්තේ' යන්නෙහි කාමයෝ නම් ප්‍රකට වශයෙන් කාමදෙකකි. වස්තුකාමයෝද ක්ලෙශ කාමයෝද යනුයි. (මහානිද්දේසයේ (1) 1 (ii) 2, 3 ඡේද යෙදිය යුතුයි.) භාග්‍යවත් බුදුරජානන් වහන්සේ වස්තුකාමය දැනගන්නාලද ක්ලේශකාමය ප්‍රහීන කරණලදී. වස්තුකාමය දැනගත් බැවින් ක්ලේශකාමය දුරුකළ බැවින් භාග්‍යවතුන් වහන්සේ කාමයන් කැමති නොවෙයි, කාමයන් නොතබයි කාමයන් ආශානොකරයි, යමෙක් කාමයන් කැමතිවෙද්ද, කාමයන් ප්‍රාර්ථනා කරද්ද, ඔව්හු කාම කාමීහුවෙත්, රාගසංඥා ඇත්තාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ කාමයන් කැමති නොවනසේක. කාමයන් ආශා නොකරණසේක.

එහෙයින් බුදුරජාණන් වහන්සේ කාමයන් නොකැමැත්තේ, දුරුකළ කාම ඇත්තේ, වැමෑරූ කාම ඇත්තේ, මිදූ කාම ඇත්තේ, ප්‍රහීන කළ කාම ඇත්තේ, සංසිඳවූ කාම ඇත්තේ, පහකළ රාග ඇත්තේ, කෙලෙස් දුරුකළේ, නිවුනේ සිහිල්වූයේ සැපත විඳින්නේ බ්‍රාහ්මයා බඳු ආත්ම භාවයෙන් වාසය කරයි. "ආයුෂ්මත් ජතුකණ්ණිතෙම මෙසේ කීය" යන්නෙහි "ඉච්චාති" යනු ස්වර සන්ධියයි (2-1) 1 ස්වරසන්ධියයි යන තැන සිට යෙදිය යුතුයි.) "ආයුෂ්මත්" යනු ප්‍රිය වචනයයි (2-1) 2 යෙදිය යුතුයි. ගරුවචනයයි ආයුෂ්මත් "ජතුකණ්ණය" යනු ඒ බ්‍රාහ්මණයාගේ ගොත්‍රය යයි නාමයයි පැනවීමයි "ඔඝය ඉක්මවූ ඔබවහන්සේ විචාරන්ට යන්නෙහි," ඔඝය ඉක්මවූ යනු ඔඝය එතර කළාවූ යනුයි. විචාරන්නට යනු ප්‍රශ්න කරන්නට, ඉල්ලන්නට, ආරාධනා කරන්නට පහදවන්නට යනුයි.

2. "කාමය දුරුකළහුවෙත" යනු දුරුකළ කාමය ඇත්තහුවෙත, මිදූකාමය ඇත්තහුවෙත, සංසිඳූකාමය ඇත්තහුවෙත, ප්‍රහීනවූ කාමය ඇත්තහුවෙත, පහකළ රාගය ඇත්තහු වෙත. මිදූ රාගය ඇත්තහු වෙත, සංසිඳූ රාගය ඇත්තහු වෙත පැමිණියේවෙමු. එළඹියේවෙමු, සම්ප්‍රාප්ත වූයේවෙමු, යනුයි. "ශාන්තිය" යනු එක් ආකාරයකින් ශාන්තිය නම් එයම ශාන්ති පදයවූ නිර්වාණයයි යම් ඒ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමක් වේද, සියලු උපධීන් දුරු කිරීමක්වේද? තෘෂ්ණාක්ෂය නම්වූ විරාගනම්වූ නිරොධනම්වූ නිර්වාණයයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලදී. 'මේ නිර්වාණපදය ශාන්තය, මේ නිර්වාණපදය ප්‍රණීතය, එනම් යම් ඒ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමක් වේද, සියලු උපධින් දුරුකිරීමක් වේද, තෘෂ්ණාක්ෂයවූ විරාග නම්වූ නිරොධනම්වූ නිර්වාණයයි නැවතද අනික් ආකාරයකින් යම් ඒ ධර්මයෝ ශාන්තාධිගමය පිණිස ශාන්තිය ස්පර්ශ කිරීම පිණිස, ශාන්තිය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. ඒ කෙසේද? සතර සතිපට්ඨානයෝ සතර සම්‍යක් ප්‍රධානයෝ සතර ඍද්ධිපාදයෝ, පඤ්චෙන්ද්‍රියයෝ පංචබලයෝ, සප්ත බොධ්‍යංගයෝ, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මොව්හු ශාන්ති පදයෝ නම්වෙත්. ශාන්තිපදය ආරක්ෂාපදය, අභයපදය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අච්චුතපදය, අමෘතපදය නිර්වාණපදය, කියනු මැනවි, දෙශනා කරණු මැනවි, පනවනු මැනවි. තබනු මැනවි, විවෘත කරණු මැනවි. බෙදනු මැනවි "සියල්ල දක්නා ඇස් ඇත්ත" යන්නෙහි "සියල්ල දකින" යනු සර්වඥතාඥානයයි. භාග්‍යවත් බුදුරජානන් වහන්සේගේ ඇස් ඇතිබවද ජිනභාවයද පෙරපසු නොව එකවිටම උපන්නේය. එහෙයින් බුදුරජතෙම සියල්ල දක්නා ඇස් ඇතිසේක.

3. "මා නොදන්නා දෙයවූ මෙය දෙශනා කරණු මැනවි" යන්නෙහි නොදන්නා දෙය යනු අමෘතවූ නිර්වාණයයි. නිරොධ නම්වූ නිර්වාණයයි. "භගවත්" යනු ගෞරව වචනයයි. (මහා නිද්දේසයේ (7-2) 1 යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි. මේ භගවත් යනුයි. "කාමයෝ" යනු ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. එනම් වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මහා නිද්දේසයේ (1) 1 (ii) 2-3 යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ වස්තුකාමය දැන ක්ලේශකාමය දුරු කොට මැඩ පවත්වා, වාසය කරණසේක. හැසිරෙණසේක. ඉරියව් පවත්වනසේක. පාලනය කරණසේක. සූර්යයා තේජසින් පෘථිවිය මෙන් යනු යම්සේ බලවත් තේජසින් යුක්ත සූර්යයා පෘථිවිය තේජසින් මැඩ තබා සියලු ආකාශ ගත අන්ධකාරය මැඩ දුරුකොට ආකාශයෙහි ආකාශ මාර්ගයෙහි ගමන් කෙරේද, මෙපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ ඥානය ඇතිසේක් ඥානතේජසින් යුක්තවූසේක් සියලු සංස්කාරයන් ඇතිවීමේ හේතුව ක්ලේශාන්ධකාරය අවිද්‍යාන්ධකාරය දුරුකොට ඥානාලොකය දක්වා වස්තුකාමය දැන ක්ලේශකාමයන් දුරුකොට, මැඩපවත්වා යටපත්කොට හැසිරෙණසේක. ඉරියව් පවත්වනසේක. යනුයි.

4. "මහත් ප්‍රඥා ඇති ඔබවහන්සේ ස්වල්ප නුවණ ඇති මට යනු මම ස්වල්ප නුවණැත්තෙක්මි. ලාමක ප්‍රඥා ඇත්තෙක්මි. ඔබවහන්සේ මහා ප්‍රඥා ඇත්තෙකි. පුථු ප්‍රඥා ඇත්තෙකි, හාස ප්‍රඥා ඇත්තෙකි, ජවන ප්‍රඥා ඇත්තෙකි, තීක්ෂණ ප්‍රඥා ඇත්තෙකි, නිබ්බෙධික ප්‍රඥා ඇත්තෙකි. භූරියයි පෘථිවියට කියයි.

ඒ පෘථිවිය සමානවූ මහත්වූ පළල්වූ ප්‍රඥාවෙන් යුක්තවූයේනුයි මහත් ප්‍රඥා ඇතිනම් "ධර්මය" යනු මුල යහපත්වූ මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, සියල්ල සම්පූර්ණවූ, පිරිසිදු බ්‍රහ්මචර්යාව සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධානය පඤ්චෙන්ද්‍රිය, පංචබලය සප්ත බොධ්‍යංගය, ආර්ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණය නිර්වාණගාමී ප්‍රතිපදාව දෙශනා කරණු මැනවි. පනවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, යනුයි. "යමක් මම දැනගන්නෙම් නම්" යනු යමක් මම දැනගන්නෙම් නම් අවබොධ කරන්නෙම් නම්, පැමිණෙන්නෙම් නම්, ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් යනුයි. "මෙහි ජාති ජරාව දුරුකිරීම" යනු මෙහි ජාති ජරාමරණයන්ගේ ප්‍රහාණය සන්සිඳීම, ව්‍යපසමනය, අමෘතවූ නිර්වාණය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණ තෙම මෙසේ කීය.

### 11-2

1. "කාමයන්හි ගිජුකම දුරුකොට" යන්නෙහි කාමයෝ නම් ප්‍රකට වශයෙන් දෙකක් වෙති, වස්තුකාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. මහා නිද්දේශයේ (1) 1 (ii) 2-3 ඡෙද යෙදිය යුතුයි.) "ගිජුකම" යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇල්මක් ඇද්ද, අභිධ්‍යාවක් ඇද්ද ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. කාමයෙහි ගිජුකම දුරුකරව, නූපදනා බවට පමුණුව, භාග්‍යවතුන් වහන්සේ 'ජතුකණ්ණිය' යනු බ්‍රාහ්මණයාට ගොත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි 'භගවත්' යන ගෞරව වචනයයි. (මහා නිද්දේශයේ (7-8) 1 යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි. යම් ඒ භගවත් යනුයි.

2. "නෛෂ්ක්‍රම්‍යය ක්ෂෙම වශයෙන් දැක" යන්නෙහි 'නෛෂ්ක්‍රම්‍යය' යනු සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව, නිවැරදි ප්‍රතිපදාව, ධර්මානු ධර්ම ප්‍රතිපදාව යනුයි, ශීලයන් සම්පූර්ණ කිරීම, ඉන්ද්‍රියයන්හි වසනලද දොර ඇති බව භොජනයන්හි ප්‍රමාණය දැනීම නිදි දුරුකිරීම, සිහිය හා මනා නුවණැති බව, සතර සතිපට්ඨානයන්, සතර ඍද්ධිපාදයන්, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්තබොධ්‍යංග, ආර්ය අෂ්ටාංගික

මාර්ගය නිර්වාණය නිර්වාණ ගාමිණී ප්‍රතිපදාව, ක්ෂෙම වශයෙන් ආරක්ෂාව වශයෙන්, සරණ වශයෙන්, අමෘත වශයෙන් නිර්වාණ වශයෙන්, දැක බලා, සමකොට තීරණය කොට, ප්‍රකටකොට යනුයි ආත්ම රහිතයයි විශෙෂයෙන් දැන යනු තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් ගන්නාලද පරාමර්ශ කරණලද බැසගත්, ගැලුන, ඇළුන, ආත්ම රහිතයයි යනු ආත්ම රහිතයයි මිදියයුත්තක් දුරුකටයුත්තක් සංසිඳවිය යුත්තක් දුරුකටයුත්තක් යනුයි. 'කිඤ්චන' යනු රාග කිඤ්චනය, ද්වෙෂ කිඤ්චනය, මොහ කිඤ්චනය, මාන කිඤ්චනය, දෘෂ්ටි කිඤ්චනය, ක්ලේශ කිඤ්චනය, දුශ්චරිත කිඤ්චනය යන මේ කිඤ්චනයෝ ඔබට විද්‍යමාන නොවේවා. දුරුකරව, සංසිඳව යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

11-3

1. "පූර්වයෙහි යමක් ඇද්ද එය වියලව" යනු අතීත සංස්කාරයන් නිසා යම් ක්ලේශයෝ උපදින්නාහු නම්, ඒ ක්ලේශයන් වියලව, ඇතිනොකරව, දුරුකරව සම්පූර්ණ අභාවයට පමුණුව 'පසු' යනු අනාගත සංස්කාරයන් නිසාරාහ කිඤ්චනය ද්වෙෂ කිඤ්චනය, මොහ කිඤ්චනය, දෘෂ්ටි කිඤ්චනය, ක්ලේශ කිඤ්චනය, දුශ්චරිත කිඤ්චනය යන නූපදවන්නෙහිය මේ කිඤ්චනයන් ඔබ නොකරන්නෙහිය, දුරුකරන්නෙහිය, සම්පූර්ණ අභාවයට පමුණුවන්නෙහි යනුයි. 'මධ්‍යය' යනු පවත්නා කාලයෙහි රූප, වේදනා සඤ්ඤාසංඛාර විඤ්ඤාණයන් තෘෂ්ණා වශයෙන්, දෘෂ්ටි වශයෙන් නොගන්නෙහිය, පරාමර්ශ නොකරන්නෙහිය, සතුටු නොවන්නෙහිය බලාපොරොත්තු නොවන්නෙහිය, අභිනන්දනය, අභිවදනය ගැනීම පරාමර්ශය ඇතුළුවීම දුරුකරන්නෙහිය, සම්පූර්ණ අභාවයට පමුණුවන්නෙහිය යනුයි. ශාන්තවූයේ හැසිරෙන්නෙහිය යනු රාගය ශාන්තවූ බැවින් උප ශාන්තවූ බැවින් ශාන්තව හැසිරෙන්නේය ද්වෙෂය (මහා නිද්දේශයේ (3-4) 2 යෙදිය යුතුයි.) සියලු අකුශල රැස්කිරීම් ශාන්තවූ බැවින් උපශාන්තවූ බැවින් නිවුන බැවින් පහවූ බැවින්

සන්සිඳුන බැවින් ශාන්තවූයේ උපශාන්තවූයේ සන්සිඳුනේ වාසය කරන්නෙහිය, ඉරියව් පවත්වන්නෙහිය, පාලනය කරන්නෙහිය, යැපෙන්නෙහිය, ශාන්තව හැසිරෙන්නෙහිය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

11-4

1. "බ්‍රාහ්මණය සර්වප්‍රකාරයෙන් නාමරූපයන්හි පහවූ ගිජුකම ඇත්තහුට යන්නෙහි" 'සර්වප්‍රකාරයෙන්' යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරි නොකොට ඇතුලත් නොකොට ගන්නා වචනයකි. මේ සර්වප්‍රකාරයෙන් යනුයි. නාම යනු අරූප ස්කන්ධයෝයි. 'රූප' යනු සතර මහා භූතයෝද උපාදාය රූපද යනුයි. ගෙධ යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් නැද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. "ආශ්‍රවයන් විද්‍යමාන නොවෙත් යන්නෙහි" ආශ්‍රවයෝ නම් ආශ්‍රව සතරෙකි. කාමාශ්‍රව, භවාශ්‍රව, දෘෂ්ටාශ්‍රව, අවිද්‍යාශ්‍රව යනුයි. 'උන්වහන්සේට' යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි විද්‍යමාන නොවෙත් යනු මේ ආශ්‍රවයෝ ඔහුට නැද්ද විද්‍යමාන නො වෙද්ද, නූපදිද්ද, ප්‍රහීනද මුලින් සිඳුනේද, ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

**(ගාථාවගේ අවසානය සමගම (1-8) 6 යෙදිය යුතුයි.)**

## භද්‍රාවුධ මානවක සූත්‍ර නිද්දෙශය

12-1

1. "ඔක නම් වාසස්ථානය දුරු කරන්නේය, තෘෂ්ණාව සිඳින්නේය, ආශා රහිත වන්නේය," යන්නෙහි වාසස්ථානය දුරු කරන්නේ යනු රූපධාතුවෙහි යම් ඡන්දයක් ඇද්ද, යම් රාගයක් ඇද්ද, යම් නන්දියක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, යම් උපාදානයෝ වෙද්ද, ඉටාගන්නා ලද සිතෙහි කෙලෙස් ඇතුල්වීම් ඇද්ද, ඒවා භාග්‍යවත් බුදුරජානන් වහන්සේට ප්‍රහීනය මුලින් සිඳුනේය, අගසිඳින ලද තල්ගසක් මෙන් විය, සම්පූර්ණයෙන් අභාවයට ගියේය, නැවත නූපදනේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "තෘෂ්ණාවද සිඳින්නේය" යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා ශබ්ද තෘෂ්ණා ගන්ධ තෘෂ්ණාව, රස තෘෂ්ණාව ස්පර්ශතෘෂ්ණාව ධර්මතෘෂ්ණා යනුයි. බුදුරජානන් වහන්සේගේ ඒ තෘෂ්ණාව ප්‍රහීනය මුලින් සිඳුනේය ශාන්තය' ඉපදීමට අයොග්‍ය කළේය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය. එහෙයින් බුදුරජතෙම තණ්හච්ජිත හෙවත් තෘෂ්ණාව සින්දේ නමි. 'එජා' නම් තෘෂ්ණාවයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද, එයයි. බුදුරජාණන් වහන්සේගේ එජා නම් තෘෂ්ණාව ප්‍රහීණය. මුලින් සිඳුනේය. සම්පූර්ණ අභාවයට ගියේය. නැවත නූපදනා බවට පැමිණියේය. එජාව ප්‍රහීනවූ අනෙජ නම් භාග්‍යවතුන් වහන්සේ ලාභයෙහිද කම්පා නොවෙයි, අලාභයෙහිද කම්පා නොවෙයි, කීර්තියෙහිද කම්පා නොවෙයි, අපකීර්තියෙහිද කම්පා නොවෙයි. ප්‍රශංසාවෙහිද කම්පා නොවෙයි, නින්දාවෙහිද කම්පා නොවෙයි, සැපයෙහිද කම්පා නොවෙයි, දුකෙහිද කම්පා නොවෙයි. නොසෙලවෙයි, යනුයි.

3. "නන්දි" යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද ලොභයක් ඇද්ද අකුශල මූලයක් ඇද්ද එයයි. ඒ නන්දි නම් තෘෂ්ණාව බුදුරජාණන් වහන්සේගේ ප්‍රහීනය මුලින් උදුරණ ලද්දේය. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේය. සම්පූර්ණ අභාවයට නැවත නූපදනා බවට පමුණුවන ලදී එබැවින් බුදුජතෙම නන්දිජහ නම් වන සේක. "මිදුනේය. ඔඝය එතර කළේය" යනු භාග්‍යවතුන් වහන්සේ කාමොඝය එතර කළේය. භවොඝය එතර කළේය. අවිජ්ජොඝය එතර කළේය, සංසාර පථය එතර කළේය. හෙතෙම වැස නිමවූ වස් ඇත්තේ. පුරුදු කළ ගමන් ඇත්තේ (මහා නිද්දෙසයේ (3-7) 6 (ii) යොදාගත යුතුයි.) ජාති මරණ සංසාරයක් නැත ඔහුට නැවත උත්පත්තියක් නැත, නන්දිය දුරු කළේය, ඔඝය එතර කළේය, යනු භාග්‍යවතුන් වහන්සේගේ රාගයෙන්සිත මිදුනේය, මනාකොට මිදුනේය ද්වෙෂයෙන් සිත මිදුනේය. (මහා නිද්දෙසයේ (3-4) 2 යොදාගත යුතුයි.) සියලු අකුශල රැස්කිරීම්වලින් සිත මිදුනේය, මනාකොට මිදුනේය,

නුවණැතියන් වහන්සේගෙන් කල්පය දුරු කිරීම ඉල්ලමි යන්නෙහි කල්පයෝ දෙකකි. තෘෂ්ණා කල්පයද දෘෂ්ටි කල්පයද යනුයි. මමත්වය යනු කල්පය යනුවෙන් වෙනස් කොට (මහා නිද්දෙසයේ (2-6) 1 (ii) (iii) යොදාගත යුතුයි.) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ තෘෂ්ණා කල්පය ප්‍රහීණවූ බැවින් දෘෂ්ටි කල්පය සංසිඳුවන ලද බැවින් බුදුරජතෙම කල්පය දුරුකළ සේක. 'ඉල්ලමි' යනු ඉල්ලමි, බලාපොරොත්තු වෙමි, ආශා කරමි යනුයි. සුමෙධයයි ප්‍රඥාවට කියයි. යම් ප්‍රඥාවක් ඇද්ද, (මහා නිද්දෙසයේ (3-1) 3 යොදාගත යුතුයි.) අමොහය, ධම්මවිචය සම්මාදිට්ඨිය යනු මේ ප්‍රඥාවෙන් භාග්‍යවතුන් වහන්සේ යුක්ත සේක. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සුමේධ නම් වන සේක, "නාග" යනු භාග්‍යවතුන් වහන්සේයි. වරද නොකරණ බැවින් නාග නමි. (මහා නිද්දෙසයේ (9-11) 2 යොදාගත යුතුයි.) "නාගයන් වහන්සේගේ වචනය අසා මෙයින් ඒ ඒ තැන්වලට යත්" යනු ඔබ වහන්සේගේ වචනය දෙශනාව අනුසන්ධිය අසා ඉගෙණ සලකාබලා මෙයින් බැහැරයත් යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 12-2

1. "ජනපදයන්ගෙන් පැමිණියාවූ නානා ජනයෝ" යන්නෙහි නානා ජනයෝ යනු ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද ගෘහස්ථයෝද ප්‍රව්‍රජිතයෝද දෙවියෝද මිනිස්සුද යනුයි. ජනපදයන්ගෙන් පැමිණි යනු අඟු, මගධ, කාලිංග, කාසී, කොසල, වජ්ජි මල්ල, චෙති, වංග යන රටවල්ද, කුරු පංචාල, මච්ඡ, සූරසේන, අවන්ති, යොන්, කම්බොජ, යන දෙශද යනුයි. "රැස්වූ යනු පැමිණියාවූ ආවාවූ යනුයි. ඔබ වහන්සේගේ වීර වාක්‍යයන් බලාපොරොත්තු වන්නාවූ යන්නෙහි "වීර" නම් භාග්‍යවතුන් වහන්සේ වීර නම් වනසේක. වීර්ය ඇත්තේ යනු වීර බැවින් පොහොසත්නුයි වීර නමි. අප්‍රමාදවූයේනුයි වීර නමි. පහවූ ලොමුඩැහැ ගැනුම් ඇත්තේනුයි වීර නමි. මේ ලොව සියලු පාපයන්ගෙන් වෙන්වූයේනුයි වීර නමි. නිරය දුක ඉක්මවා සිටියේනුයි වීර නමි, යනුයි. ඔබවහන්සේගේ දෙශනාව

ගැලපීම, බලාපොරොත්තු වන්නාහු ප්‍රාර්ථනා කරන්නාහු ඔබ වහන්සේ ඔවුන්ට මනාකොට දෙශනා කරණු මැනවි. ප්‍රකාශ කරණු මැනවි, යනුයි. එසේ ඔබවහන්සේ විසින් දක්නා ලද නිර්ණය කරණලද ප්‍රකට කරණ ලද මේ ධර්මය යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

## 12-3

1. "තදින් අල්ලාගන්නාවූ සියලු තෘෂ්ණාව හික්මව" යන්නෙහි තදින් අල්ලාගන්නාවූ තෘෂ්ණා නම් රූප තෘෂ්ණාව ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ තෘෂ්ණාව යනුයි. අල්ලා ගැනීමේ තෘෂ්ණායයි යන්නෙහි කවර කරුණකින් මෙසේ කියනු ලැබේද? ඒ තෘෂ්ණාවෙන් රූපය තදින් අල්ලා ගනිත්, ඇතුලුවෙත්, වෙදනාව සඤ්ඤාව සංස්කාරයෝ විඤ්ඤාණය, ගතිය, උත්පත්තිය, ප්‍රතිසන්ධි භවය, සංසාර වට්ටය අල්ලා ගනිත්, ඒ කාරණයෙන් ආදාන තෘෂ්ණාව යයි කියත්. සියලු ආදාන අල්ලා ගන්නා තෘෂ්ණාව දුරුකරව යනු සියලු ආදාන අල්ලාගන්නා තෘෂ්ණාව දුරු කරන්නේය, බැහැර කරන්නේය, සම්පූර්ණ අභාවයට පමුණුවන්නේය යනුයි. උඩයට සරස මැද යන්නෙහි උඩ යනු මනුෂ්‍ය ලොකයයි (4-7) 3 උඩයනතැන සිට යොදාගත යුතුයි.) ලොකයෙහි යනු අපාය ලොකයෙහි (1-1) 1 (ii) යොදාගත යුතුයි.) "ලොකයෙහි යමක් දැඩිව අල්ලා ගනීද ඒ සමග මාරතෙමේ සත්වයා ලුහුබඳී" යන්නෙහි ඒ සමග මාරතෙමේ යනු කමාභී සංස්කාර වශයෙන් ප්‍රතිසන්ධි ලත් ස්කන්ධ මාරතෙම ධාතු මාරතෙම ආයතන මාරතෙම, ගති මාරතෙම උත්පත්ති මාරතෙම, ප්‍රතිසන්ධි මාරතෙම භව මාරතෙම සංසාර මාරතෙම වට්ට මාරතෙම අනුවයයි යනුයි. සත්වයා යනු ජනයා, නරයා, මානවයා, පුරුෂයා, පුද්ගලයා, මනුජයා යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

## 12-4

1. "එහෙයින් දන්නාවූ පුද්ගලතෙම දැඩිව අල්ලා නොගන්නේය" යන්නෙහි "එහෙයින්" යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන්, ඒ නිදානයෙන් යනුයි. එහෙයින්

දන්නාවූ යනු අවබොධ කරන්නාවූ දැනගන්නාවූ සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැනගන්නාවූ, අවබොධකරගන්නාවූ, සියලු සංස්කාරයෝ දුක්යයි දැනගන්නාවූ අවබොධ කරන්නාවූ (1-8) 3 යෙදිය යුතුයි.) යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි දැනගන්නාවූ අවබොධ කරන්නාවූ (පුද්ගලතෙම) දැඩිව නොගන්නේය යනු රූපය දැඩිව නොගන්නේය. පරාමර්ශ නොකරන්නේය, ඇතුළු නොවන්නේය. වෙදනාව, සංඥාව, සංස්කාරයන්, විඤ්ඤාණය, ගතිය, උත්පත්තිය, ප්‍රතිසන්ධිය, භවය, සංසාරය, වට්ටය දැඩිව නොගන්නේය. පරාමර්ශ නොකරන්නේය. ඇතුළු නොවන්නේය. "සිහි ඇති භික්ෂු තෙම සියලු ලොකයෙහි කිසිවක් යන්නෙහි" 'භික්ෂු' යනු පෘථග්ජන කල්‍යාණක වූ හෝ භික්ෂුවයි, ශෛක්ෂ හෝ භික්ෂුවයි. සිහි ඇත්තේ යන කරුණු සතරකින් සිහි ඇත්තේ නම්. කයෙහි කය අනුව බලන සතිපට්ඨානය වඩන්නේ සිහි ඇත්තේනම්. (1-8) 4 (ii) යෙදිය යුතුයි.) හෙතෙම සිහි ඇත්තේයයි කියයි 'කිසිවක්' යනු කිසියම් රූප ගතවූ හෝ වෙදනාගතවූ හෝ සඤ්ඤාගතවූ හෝ සංස්කාර ගතවූ හෝ විඤ්ඤාණ ගතවූ හෝ යනුයි. 'සියලු ලෝකයෙහි' යනු සියලු අපාය ලොකයෙහි සියලු මනුෂ්‍ය ලෝකයෙහි දිව්‍ය ලොකයෙහි සියලු ස්කන්ධ ලොකයෙහි සියලු ධාතු ලෝකයයෙහි සියලු ආයතන ලෝකයෙහි යනුයි. "රූපාදිය දැඩිව ගන්නා සත්වයෝ" යනු යම් කෙනෙක් රූපය දැඩිව ගනිද්ද, අල්ලාගනිද්ද, පරාමර්ශ කෙරෙද්ද, ඇතුළු වෙද්ද, වෙදනාව සංඥාව සංස්කාරයන්, විඤ්ඤාණය, ගතිය, උත්පත්තිය, ප්‍රතිසන්ධිය, භවය, සංසාර වට්ටය, දැඩිව ගනිද්ද අල්ලාගනිද්ද, පරාමර්ශ කෙරෙද්ද, ඇතුළුවෙද්ද යනුයි. 'මෙසේ' යනු ස්වර ගැලපීමයි. (2-1) 1 යෙදිය යුතුයි.) ස්වරයන්ගේ පිළිවෙල දැක්වීමයි මේ "මෙසේ" යනුයි 'බලනු ලබන්නේ යනු දකිනු ලබන්නේ අවලෝකනය කරණු ලබන්නේ යනුයි. ප්‍රජාව යනු සත්වයින්ට මේ වෙනින් නමකි. ක්ලේශයෝද ස්කන්ධයෝද අභිසංස්කාරයෝද මාර ධෙය්‍යයයි කියත්. ප්‍රජාව හෙවත් සත්වයා මච්චු ධෙය්‍යයෙහි මාරධෙය්‍යයෙහි මරණ ධෙය්‍යයෙහි ඇළුනාහු විශෙෂයෙන්

ඇළුනාහු එල්බුනාහු යනුයි. යම්සේ බිත්තියෙහි ගැසූ උලෙහි හෝ නාගදන්තයෙහි හෝ බඩුපොදිය එල්බුනාහුද මෙසේම ප්‍රජාව හෙවත් සත්වයා මච්චු ධෙය්‍යයෙහි, මාරධෙය්‍යයෙහි, මරණ ධෙය්‍යයෙහි ඇලුනාහු එල්බුනාහු යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ. ගාථාවගේ අවසානය සමගම (1-8) යෙදිය යුතුයි.) මම ශාස්තෲන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමියි යනුයි.

## උදය මානවක සූත්‍ර නිර්දේශය

### 13-1

1. "ධ්‍යානකරණ සුළුකෙලෙස් රජස් දුරුකොට සිටියාවූ" යන්නෙහි ධ්‍යාන කරණසුළු යනු භාග්‍යවතුන් වහන්සේ ධ්‍යාන කරණසේක. ප්‍රථමධ්‍යානයෙන් ධ්‍යාන කරණසේක. ද්විතීයධ්‍යානයෙන් ධ්‍යාන කරණසේක. තෘතීය ධ්‍යානයෙන් ධ්‍යානකරණසේක. චතුර්ථ ධ්‍යානයෙන් ධ්‍යාන කරණසේක. විතර්ක සහිත විචාර සහිත ධ්‍යානයෙන් ධ්‍යානකරණසේක. විතර්ක රහිත විචාර සහිත ධ්‍යානයෙන් ධ්‍යානකරණසේක. විතර්ක රහිත විචාර රහිත ධ්‍යානයෙන් ධ්‍යානකරණසේක. ප්‍රීතිය සහිත ධ්‍යානයෙන් ධ්‍යානකරණසේක. ප්‍රීතිය රහිතවූ ධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. සුඛසහගතවූ ධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. උපෙක්ෂා සහගත ධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. ශූන්‍යතාධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. අනිමිත්ත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරණසේක. අප්පණිහිත ධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. ලෞකිකවූ ධ්‍යානයෙන්ද ධ්‍යානකරණසේක. ලොකොත්තර ධ්‍යානයෙන්ද ධ්‍යාන කරණසේක. ධ්‍යානයෙහි ඇළුනෝ ඒකාන්තයෙන් යෙදුනෝ ඒ අර්ථය ගරුකොට ඇත්තෙහුයි ධ්‍යායි නම්. 'රජසින් වෙන්වූයේ" යනු රාගය රජසකි. ද්වෙෂය රජසකි. මොහය රජසකි. ක්‍රොධය රජසකි. බද්ධ වෛරය රජසකි. සියලු අකුශල රැස්කිරීම් රජසෙකි. ඒ රජස් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ප්‍රහීනය සිඳිනලද මුල් ඇත්තාහ. අග සිඳින තල්ගසක් මෙන් කරණලදී. සම්පූර්ණ

අභාවයට පමුණුවනලදී. නැවත නූපදනා බවට පමුණුවනලදී. එහෙයින් බුදුරජතෙම රජස් නැතිසේක. පහවූ රජස් ඇතිසේක. රජසින් වෙන්වූ සේක. "රාගය රජසකි. එය රේණුයයි නොකියනු ලැබේ. 'රජස යනු රාගයට මේ අනික් නමකි. (ii) පසැස් ඇති බුදුරජාණන් වහන්සේ මේ රජස දුරුකොට සිටිසේක. එහෙයින් ජිනයන් වහන්සේ පහවූ කෙලෙස් රජස් ඇත්තේයයි කියනු ලැබේ. (iii) ද්වෙෂය රජසකි. (මෙහි (ii) යෙදිය යුතුයි.) මොහය රජසකි. (මෙහි (ii) යෙදිය යුතුයි.) සිටියාවූ යනු භාග්‍යවතුන් වහන්සේ පාෂාණක චෛත්‍යස්ථානයෙහි වැඩසිටිසේක. "දුක්ඛයාගේ පරතෙරට ගියාවූ නගරයෙහි පසෙක වැඩසිටියාවූ මුනිවරයා ත්‍රිවිද්‍යාප්‍රාප්තවූ මරුවාට බියවූ ශ්‍රාවකයෝ ඇසුරුකරන්නේ මෙසේද භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි සේක. නැවතද භාග්‍යවතුන් වහන්සේ සියලු කුසලයන් සංසිඳවූ බැවින් සිටිසේක. වැසනිමවූ වාස ඇතිසේක. පුරුදු කළ ගමන් ඇතිසේක. (මහානිද්දේසයේ (3-7) 6 (ii) යෙදිය යුතුයි.) උන්වහන්සේට නැවත උත්පත්තියක් නැත. මෙසේද භාග්‍යවතුන් වහන්සේ සිටිසේක යනුයි.

2. "කරණලද කටයුතු ඇති ආශ්‍රව රහිතවූ" යනු භාග්‍යවත් බුදුරදුන්ගේ කටයුතු හා කළයුතු දේ ප්‍රහීනය මුලින් සිඳින ලද්දේය. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලදී. සම්පූර්ණයෙන් අභාවයට පමුණුවනලදී. නැවත නූපදනා බවට පමුණුවන ලදී. එහෙයින් බුදුරජතෙම කරණ ලද කටයුතු ඇතිසේක.

3. "යමෙකුට විසත්තිකා නම් තෘෂ්ණාව නැද්ද කෘත්‍යාකෘත්‍යයන් ප්‍රහීනවූ සිඳිනලද කාමාදී සැඩවතුරු ඇති භික්ෂුවට තැවීමක් නොවේ" යනුයි. කරණලද කටයුතු ඇති ආශ්‍රව රහිතවූ යන්නෙහි ආශ්‍රවයෝ යනු ආශ්‍රව සතරකි. එනම් කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යනුයි. ඒ භාග්‍යවත් බුදුරදුන්ගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීනයහ. මුලින් සිඳින ලද්දේය. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලදී. සම්පූර්ණයෙන් අභාවයට ගියේය. නැවත නූපදනා බවට පැමිණියේය. එබැවින් බුදුරදතෙම ආශ්‍රව රහිතසේක.

4. "සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය" යනු භාග්‍යවතුන් වහන්සේ සියලු ධර්මයන් විශෙෂ ඥානයෙන් දැන පරතෙරට ගියසේක. මනාකොට දැන පරතෙරට ගියසේක. ප්‍රහානය කොට පරතෙරට ගියසේක. භාවනාවෙන් පරතෙරට ගිය සේක. ප්‍රත්‍යක්ෂ කිරීමෙන් පරතෙරට ගියසේක. සමාපත්තියෙන් පරතෙරට ගියසේක. සියලු ධර්මයන් විශෙෂ ඥානයෙන් දැන පරතෙරට ගියසේක. සියලු දුක් මනාකොට දැන පරතෙරට ගියසේක. සියලු කෙලෙස් ප්‍රහානය කිරීමෙන් පරතෙරට ගියසේක. සතර මාර්ගය භාවනාවෙන් පරතෙරට ගියසේක. ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිරොධය පරතෙරට ගියසේක. සියලු සමාපත්තීන් සම වැදීමෙන් පරතෙරට ගිය සේක. උන්වහන්සේ වශී ප්‍රාප්තසේක. පාරමී ප්‍රාප්තසේක. ආර්ය ශීලයෙහි වශී ප්‍රාප්තසේක. පාරමී ප්‍රාප්තසේක. ආර්ය සමාධියෙහි වශී ප්‍රාප්තසේක. පාරමී ප්‍රාප්තසේක. ආර්ය ප්‍රඥාවෙහි වශී ප්‍රාප්තසේක. පාරමී ප්‍රාප්තසේක. ආර්ය විමුක්තියෙහි උන්වහන්සේ පාරප්‍රාප්ත සේක. පාරමී ප්‍රාප්ත සේක. අන්තයට ගියසේක. අන්තයට පැමිණිසේක. කෙළවරට ගියසේක. කෙළවරට පැමිණිසේක. පර්යන්තයට ගියසේක. පර්යන්තයට පැමිණිසේක. අවසානයට ගියසේක. අවසානයට පැමිණිසේක, ආරක්ෂාවට ගියසේක. ආරක්ෂාවට පැමිණිසේක. පිහිටට ගියසේක. පිහිටට පැමිණිසේක. අභය බවට ගියසේක, අභය බවට පැමිණිසේක, අච්‍යුත බවට ගිය සේක, අච්‍යුත බවට පැමිණිසේක, අමෘතයට ගියසේක, අමෘතයට පැමිණිසේක, නිර්වාණයට ගියසේක. නිර්වාණයට පැමිණි සේක. උන්වහන්සේ වැස නිමවූ විසීම් ඇතිසේක. (මහා නිද්දෙශයේ (3-7) (6) (ii) යෙදිය යුතුයි.) උන්වහන්සේට නැවත ඉපදීමක් නැත.

5. "ප්‍රශ්නයක් ඇසීම පිණිස පැමිණියේවෙමි" යනු ප්‍රශ්න කිරීම පිණිස පැමිණියේවෙමි. විචාරීම පිණිස පැමිණියේ වෙමි. නැවතද ප්‍රශ්න අසන්නන්ගේ ප්‍රශ්න විචාරන්නන්ගේ පැමිණීම, එළඹීම, පයුරුපාසනය, ඇත්තේය. මෙසේද ප්‍රශ්න ඇසීම පිණිස පැමිණියේවෙමි යනුයි. නැවතද ඔබවහන්සේට ප්‍රශ්න පැමිණීම ඇත. ඔබවහන්සේද පරතෙරට පැමිණිසේක. මා විසින් විචාරීමට

සුදුසුය. කියන්නට විසඳන්නට ඔබවහන්සේට භාරය. මෙසේද ප්‍රශ්න ඇසීම පිණිස පැමිණියේ වෙමි යනුයි. අඤ්ඤා විමොක්ෂය කියනු මැනවි යනු අඤ්ඤා විමොක්ෂය දෙශනා කරණු මැනවි, පනවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි. ප්‍රකාශ කරණු මැනවි, යනුයි. "අවිද්‍යාවගේ බිඳීම" යනු අවිද්‍යාවගේ බිඳ දැමීමයි, ව්‍යපසමනයයි, සංසිඳීමයි අමෘතවූ නිර්වාණය යනු අවිද්‍යාවගේ බිඳීමයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

## 13-2

1. "කාමච්ඡන්දයන්ගේ ප්‍රහානය" යන්නෙහි ඡන්දය නම් කාමයන්හි යම් ඡන්දයක් ඇද්ද, කාම රාගයක් ඇද්ද, කාම බන්ධනයක් ඇද්ද, කාම තෘෂ්ණාවක් ඇද්ද, කාම ස්නේහයක් ඇද්ද, කාම පිපාසාවක් ඇද්ද, කාම පරිඩාහයක් ඇද්ද, කාම මූර්ඡාවක් ඇද්ද, කාමයට බැස ගැන්මක්, කාමොඝයක්, කාම යොගයක් කාමූපාදානයක් කාමච්ඡන්ද නීවරණයක් ඇද්ද යනුයි. "කාමච්ඡන්දයන්ගේ ප්‍රහානය" යනු ව්‍යපසමනය සංසිඳීම, අමෘතවූ නිර්වාණය යනුයි.

2. භාග්‍යවතුන් වහන්සේ උදයය කාමච්ඡන්දයන්ගේ ප්‍රහානයද දොම්නසද යන දෙක යනු චෛතසික නොසතුට චෛතසික දුක, චෛතසිකය හා ස්පර්ශවූ නොසතුට, යනුයි, "දොම්නසද" යනු දෙකේ යනු කාමච්ඡන්දයාගේද දොම්නසගේද යන දෙකේ දුරු කිරීම, සංසිඳීම, අමෘත නිර්වාණය යනුයි.

3. "ථීනයාගේ දුරු කිරීම" යන්නෙහි ථීන නම් චිත්තයාගේ යම් නොසුදුසු බවක් මැලිබවක්, වැඩට නොයෙදෙන බවක් වේද, එබඳු ථීනයාගේ දුරු කිරීම, ප්‍රහානය සන්සිඳීම, අමෘතවූ නිර්වාණයයි කුකුසෙහි නිවාරණය යනු අත පිළිබඳ කුකුසද කුකුසකි. පය පිළිබඳ කුකුසද කුකුසකි. අත් පා පිළිබඳ කුකුසද කුකුසකි. අකැපදෙයෙහි කැපය යන හැඟීම, කැපදෙයෙහි අකැපය යන හැඟීම වරදෙහි නිවරදය යන හැඟීම, නිවරදෙහි වරද යන හැඟීම මෙබඳු කුකුස්, කුකුස් බව, සිතෙහි විපිලිසර

ගතිය, සිතේ අස්ථිරත්වය කුකුස නම් නැවතද කරුණු දෙකකින් කුකුස උපදියි. (මහා නිද්දෙසයේ (10-3) 4 යොදගත යුතුයි.) එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

13-3

1. "උපෙක්ෂා ස්මෘති දෙකින් පිරිසිදුවූ" යන්නෙහි උපෙක්ෂා නම් යම් චතුර්ථ ධ්‍යානයෙහි උපෙක්ෂාවක් ඇද්ද, එකඟ බවක් ඇද්ද, චිත්ත සමථයක් ඇද්ද, මධ්‍යස්ථකමක් ඇද්දඃ එයයි චිත්තයාගේ සතිය යනු යම් සතරවන ධ්‍යානයෙහි උපෙක්ෂා නිසා ස්මෘතියක් වේද, අනුස්මෘතියක් වේද' සම්‍යක් ස්මෘතියක් වේද, යනුයි.

2. "උපෙක්ෂාව හා ස්මෘතියෙන් පිරිසිදුවූ" යනු උපෙක්ෂාවද ස්මෘතියද, පිරිසිදුවූවාහු වෙත්. විශුද්ධවූවාහු සංශුද්ධවූවාහු පිරිසිදුවූවාහු බබලන්නාහු අංගන රහිතවූවාහු පහවගිය කෙලෙස් ඇත්තාහු මෘදුවූවාහු කර්මයට යොග්‍යව සිටියාහු යනුයි.

3. "ධර්ම තර්කය පෙරටුව යන" යන්නෙහි ධර්ම තර්කය යනු සම්‍යක් සංකල්පයට කියයි. එය ආදියෙන් වෙයි. පෙරටුව වෙයි. පූර්වාංගමවූයේ වෙයි. මෙසේද ධර්ම තර්කය පෙරටුවූයේ වෙයි. නැවතද ධර්ම තර්කයයි සම්‍යක් දෘෂ්ටියට කියයි. යමෙක් ආදියෙහි වූයේද පෙරටුවවූයේද පූර්වංගම වූයේද මෙසේද ධර්ම තර්කය පෙරටුවූයේ වෙයි. නැවතද සතර මාර්ගයන්ගේ පූර්වභාග විදර්ශනාවට කියයි. එය ආදියෙහි වෙයි. පෙරටුව වෙයි පූර්වාංගම වෙයි. මෙසේද ධර්ම තර්කය පෙරටුවූයේ වෙයි.

4. "අඤ්ඤාවිමොක්ෂය කියමි" යන්නෙහි අඤ්ඤා විමොක්ෂය නම් අරහත්ත විමොක්ෂයයි අර්හත් විමොක්ෂය කියමි. දෙශනා කරමි. පනවමි, තබමි, විවෘත කරමි. බෙදමි, ප්‍රකට කරමි, ප්‍රකාශ කරමි යනුයි. අවිද්‍යාවගේ බිඳීම යන්නෙහි අවිද්‍යාව නම් දුකෙහි නොදැනීමයි. අවිද්‍යාව යනු මොහයයි අකුසල මූලයයි. බිඳ දැමීම යනු ප්‍රහානය සන්සිඳීම, දුමෘතවූ නිර්වාණයයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

13-4

1. "ලොකයෙහි සංයෝජනය නම් කුමක්ද?" ලොකයේ සංයෝජනය එල්බීම, බන්ධනය, කිලුට කුමක් වේද එයින් ලොකය යුක්තවූයේ යෙදුනේවේද? යනුයි. එහි විචාරණය කෙසේද? යනු විචාරණය, පටිවිචාරණය යනුයි. කවරකින් ලෝකය හැසිරේද? යමකගේ ප්‍රහානයෙන් කිම නිවනයයි කියනු ලැබේද? යනු යමක ප්‍රහානයෙන් සන්සිඳීමෙන් නිර්වාණයයයි කියයිද, ප්‍රකාශ කරයිද, ව්‍යවහාර කරයිද යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීය.

2. "නන්දිය ලෝකයෙහි සංයෝජනයයි" යන්නෙහි නන්දිය යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද මෙය නන්දියයි කියනු ලැබේ. මේ නන්දිය ලෝකයාගේ සංයෝජනයකි. එල්බීමකි. බන්ධනයකි. උපක්ලේශයකි. මේ නන්දියෙන් ලෝකය යුක්තය, ප්‍රයුක්තය, ආයුක්තය, සමායුක්තය, එල්බුනේය යනුයි.

3. "විතර්කය විචාරණයයි" යන්නෙහි විතර්කය නම් නව විතර්කයෝයි කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය, ඥාන විතර්කය, ජනපද විතර්කය, අමරා විතර්කය, පරානුද්දයතා ප්‍රතිසංයුක්ත විතර්කය ලාභ සත්කාර කීර්ති යුක්ත විතර්කය, අනවඤ්ඤත්ති ප්‍රතිසංයුක්ත විතර්කය යන මේ නව විතර්කයෝ වෙති. මේ නව විතර්කයෝ ලොකයාගේ වාරණ විචාරණ පටිවිචාරණයෝ වෙති. මේ නව විතර්කයෙන් ලෝකය හැසිරෙයි විශෙෂයෙන් හැසිරෙයි යනුයි.

4. "තෘෂ්ණාව දුරුකිරීමෙන් නිර්වාණය යයි කියනු ලැබේ." යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණාව, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ තෘෂ්ණාව යන තෘෂ්ණාව දුරුකිරීමෙන් නිර්වාණයයි කියනු ලැබේ. යනු තෘෂ්ණාව දුරුකිරීමෙන් ව්‍යපසමනයෙන් සන්සිඳීමෙන් නිර්වාණයයයි කියයි. ව්‍යවහාර කරයි. ප්‍රකාශ කරයි යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශකළහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 13-5

1. "කෙසේ සිහි ඇතිව හැසිරෙන්නනහුට" යනු කෙසේ සිහි ඇතිව මනා නුවණැතිව හැසිරෙන්නහුට වාසය කරන්නහුට ඉරියව් පවත්වන්නහුට, පවතින්නහුට පාලනය වන්නහුට, යැපෙන්නහුට යනුයි. විඤ්ඤාණය නිරුද්ධවේද යනු ව්‍යපසමනයවේද, සංසිඳේද යනුයි.

2. "භාග්‍යවතුන් වහන්සේ වෙත මනාකොට පැමිණ" යනු භාග්‍යවත් බුදුන්ගෙන් මනාකොට විචාරන්නට ඉල්වන්නට ආරාධනා කරන්නට ආවෝ වෙමු. පැමිණියෙමු. සම්ප්‍රාප්තවීමු. යනුයි. "ඔබවහන්සේගේ වචනය මනාකොට අසමු" යනු ඔබවහන්සේගේ වචනය දෙශනාව, අනුසන්ධිය අසමු, ඉගෙණ ගනිමු, දරමු යනුයි, එහෙයින් ඒ බ්‍රාහ්මණ තෙම මෙසේ කීහ.

## 13-6

1. "ඇතුළතද පිටතද වේදනාව ගැන සතුටු නොවන්නාවූ" යනු අධ්‍යාත්ම වෙදනාවන්හි වේදනාව අනුව බලමින් වාසය කරන්නේ වේදනාව ගැන සතුටු නොවෙයි. නොකියයි. සතුටුවීම, කීම ගැනීම, පරාමර්ශය, ඇතුළුවීම දුරු කරයි. බැහැර කරයි. සම්පූර්ණයෙන් අභාවයට පමුණුවයි. පිටත වේදනාවන්හි වේදනාව අනුව බලමින් වාසයකරන්නේ වේදනාව ගැන සතුටු නොවෙයි. (ii) නොකියයි. සතුටුවීම, කීම ගැනීම පරාමර්ශය ඇතුළුවීම දුරුකරයි, බැහැරකරයි, සම්පූර්ණ අභාවයට පමුණුවයි. ඇතුළද පිටද වේදනාවන්හි වේදනාව අනුව බලමින් වාසය කරන්නේ වේදනාව ගැන සතුටු නොවෙයි. නොකියයි. සතුටුවීම් කීම ගැනීම පරාමර්ශය ඇතුළුවීම දුරුකරයි. සම්පූර්ණ අභාවයට පමුණුවයි. (iii) අධ්‍යාත්මයෙහි ඇතිවීම ධර්මය අනුව බලන්නේ වෙදනාවන්හි වෙදනාව අනුව බලමින් වාසය කරන්නේ වෙදනාව ගැන සතුටු නොවෙයි. (මෙහි (ii) යොදාගත යුතුයි.) අධ්‍යාත්මයෙහි විනාශ ධර්මය අනුව බලමින් වාසය කරන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) අධ්‍යාත්මයෙහි ඇතිවීම හා නැතිවීම ධර්මය අනුව බලන්නේ (මෙහි (ii)

යොදාගත යුතුයි.) පිටත ඇතිවීම ධර්මය අනුව බලන්නේ (ii) යොදාගත යුතුයි.) පිටත විනාශ ධර්මය අනුව බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) පිටත ඇතිවීම හා විනාශ ධර්මය අනුව බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) ඇතුළද පිටද විනාශ ධර්මය අනුව බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) ඇතුළද පිටද ඇතිවීම් ධර්මය අනුව බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) මේ දොළොස් ආකාරයෙන් වේදනාවන්හි වේදනාව අනුව දකිමින් වාසය කරන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) නැවතද වේදනාව අනුව අනිත්‍ය වශයෙන් බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි) දුක් වශයෙන් රෝග වශයෙන් ගඩවශයෙන් හුල් වශයෙන්, පීඩා වශයෙන්, ආබාධ වශයෙන්, නික්මීම් වශයෙන්, බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) මේ දෙසතලිස් ආකාරයෙන් වෙදනාවන්හි වෙදනාව අනුව බලන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.)

**2.** "මෙසේ සිහි ඇතිව හැසිරෙන්නාවූ" යනු මෙසේ සිහි ඇතිව මනා නුවණැතිව හැසිරෙන්නාවූ කියන්නාවූ ඉරියව් පවත්වන්නාවූ, පාලනය කරන්නාවූ, යනුයි. විඤ්ඤාණය නිරුද්ධවේ යනු පුණ්‍යාභි සංස්කාර සහගත විඤ්ඤාණය, අපුණ්‍යාභි සංස්කාර සහගත විඥාණය අනෙඤ්ජාභි සංස්කාර සහගත විඤ්ඤාණය නිරුද්ධවේ. සංසිඳේ අස්තයට යේ. යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

**(ගාථාවගේ අවසානය සමග (1-8) 6 යොදාගත යුතුයි.)**

## පොසාල මානවක සූත්‍ර නිර්දේශය

### 14-1

**1.** "යමෙක් අතීතය ප්‍රකාශ කෙරේද?" යන්නෙහි "යමෙක්" යනු තමාම දැනගත් ආචාර්යවරයෙකු නැති, යම් ඒ භාග්‍යවතුන් වහන්සේ පෙර නොඇසූ ධර්මයන්හි තෙමේම සත්‍යයන් අවබොධකළ සේක්ද? එහිද සර්වඥ භාවයට පැමිණියේ ඵලයන්හි වසඟ බවට පැමිණියේද යනුයි. අතීතය ප්‍රකාශ කෙරෙයි යනු භාග්‍යවතුන් වහන්සේ තමාගේද අනුන්ගේද

අතීතයද ප්‍රකාශ කරයි. අනාගතයද ප්‍රකාශ කරයි. පවත්නා කාලයද ප්‍රකාශ කරයි.

2. කෙසේ භාග්‍යවතුන් වහන්සේ අතීතය ප්‍රකාශ කෙරේද? භාග්‍යවතුන් වහන්සේ තමාගේ අතීතය (ii) එක් ජාතියක් ප්‍රකාශ කරයි. ජාති දෙකක් ප්‍රකාශ කරයි. ජාති තුනක්, ජාති හතරක්, ජාති පහක්, (5 සිට 10 දක්වා) සම්පූර්ණ කර ගත යුතුයි.) ජාති දසයක් ජාති විස්සක් ජාති තිහක් ජාති හතළිහක් ජාති පණහක් (මෙහි 50 සිට 100 දක්වා සම්පූර්ණකරගත යුතුයි.) ජාති සියයක් ජාති දාහක් ජාති ලක්ෂයක්, නොයෙක් සංවර්ත කල්පයන්, නොයෙක් විතර්ක කල්පයන්, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්, අසවල් තැන විසීමි. මෙසේ නම් ඇත්තෙක් වීමි. මෙසේ ගොත්‍ර ඇත්තෙක් වීමි. මෙසේ වර්ණ ඇත්තේ මෙසේ ආහාර ඇත්තේ මෙසේ සුවදුක් විඳින්නේ මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තේ හෙතෙම එයින් චුතව අසවල් තැන උපන්නේ වෙයි. මෙසේ නම් ඇත්තේ මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ මෙසේ සුවදුක් විඳින්නේ මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තේ වෙයි. හෙතෙම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙයි. (iii) මෙසේ ආකාර සහිත දැක්වීම සහිත නොයෙක් ආකාර පූර්වෙනිවාසය ප්‍රකාශ කරයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමාගේ අතීතය ප්‍රකාශ කරයි.

3. කෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ අතීතය ප්‍රකාශ කෙරේද? භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ අතීතය (මෙහි 2 (ii) යොදාගත යුතුයි.) මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ අතීතය ප්‍රකාශ කරයි. භාග්‍යවතුන් වහන්සේ ජාතක පන්සියයක් දෙශනා කරන්නේ තමාගේද අනුන්ගේද අතීතය ප්‍රකාශ කරයි.

4. "මහා පදානීය" සූත්‍රාන්තය දෙශනා කරන්නේ (ii) තමන්ගේද අනුන්ගේද අතීතය ප්‍රකාශ කරයි. (iii) "මහාසුදස්සන" සූත්‍රය ප්‍රකාශ කරන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) 'මහාගොවින්ද' සූත්‍රාන්තය දෙශනා කරන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි.) මාඝ දෙවිය සූත්‍රාන්තය දෙශනා

කරන්නේ (මෙහි (ii) යොදාගත යුතුයි) මෙය භාග්‍යවතුන් වහන්සේ දෙශනා කරණ ලදී.

**5.** "චුන්දය අතීත කාලය අරභයා තථාගතයන් වහන්සේගේ යම් විඥ්ඥාණයක් වේද, උන්වහන්සේ යම් පමණ බලාපොරොත්තු වේද එපමණ සිහි කරයි. චුන්දය, අනාගතයද අරබයා වර්තමානයද අරබයා තථාගතයන් වහන්සේට බොධිඥානය උපදියි. මේ අන්තිම ජාතියයි. දැන් නැවත උත්පත්තියක් නැත. යනුයි. ඉන්ද්‍රිය පරොපරියත්ත ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. සත්වයන්ගේ ආසයානුසය ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. යමක පාටිහාර ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. සබ්බඤ්ඤුත ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. අනාවරණ ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. සියලු තන්හි අපගම ප්‍රතිහත අනාවරණ ඥානය තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමාගේද අනුන්ගේද අතීතය ප්‍රකාශ කරයි. අනාගතය මනාව ප්‍රකාශ කරයි. පවත්නා කාලය ප්‍රකාශ කරයි. කියයි, දෙශනා කරයි, පනවයි. තබයි, විවෘත කරයි, බෙදයි, ප්‍රකට කරයි, ප්‍රකාශ කරයි යනුයි.

**6.** "එජා නැත්තේ සිඳුන සැකය ඇත්තේ" යන්නෙහි එජා නම් තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුශලමූලයක් ඇද්ද, මේ එජා නම් තෘෂ්ණාව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ප්‍රහීනය මුලින් සින්දේය. අගසිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේය. සම්පූර්ණ අභාවයට පමුණුවන ලදී. නැවත නූපදනා බවට පමුණුවන ලදී. එබැවින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අනෙජ නම් වන සේක. තෘෂ්ණාවෙන් නොහොත් කම්පාවෙන් ප්‍රහීන බැවින් අනෙජ නම් වනසේක.

**7.** භාග්‍යවතුන් වහන්සේ ලාභයෙහිද කම්පා නොවෙයි. (3-1) 1 'ලාභයෙහිද' යන තැන සිට යොදාගත යුතුයි.) දුකෙහිද කම්පා නොවෙයි. නොසෙලවෙයි. සිඳින ලද සැකය ඇති

යන්නෙහි සැකය යනු විචිකිච්ඡාවට කියයි. දුකෙහි සැක කරයි ( (4-11) 5 යොදාගත යුතුයි.) ඒ සැකය භාග්‍යවත් බුදුන්ගේ සිඳුනේය. විශෙෂයෙන් සිඳුනේය. සන්සිඳුනේය. ඉපදීමට අයොග්‍ය වූයේය. ඥානය නැමැති ගින්නෙන් දැවුනේය. එහෙයින් බුදුරජ තෙම සිඳින ලද සැක ඇත්තේවේ. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය යන්නෙහි විශිෂ්ට ඥානයෙන් පරතෙරට ගිය සේක. මනා දැනීමෙන් පරතෙරට ගිය සේක. ප්‍රහානයෙන් පරතෙරට ගිය සේක. ප්‍රත්‍යක්ෂ කිරීමෙන් පරතෙරට ගිය සේක. සමාපත්තියෙන් පරතෙරට ගිය සේක, යනුයි. ප්‍රශ්න කිරීම පිණිස පැමිණියෙ වෙමි. යනු ප්‍රශ්න කැමැත්තෙන් පැමිණියේ වෙමි. (3-1) 5 ‘ප්‍රශ්න කිරීමේ’ යන තැන සිට යොදාගත යුතුයි) එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීයේය.

## 14-2

1. “ප්‍රකටවූ රූප සංඥා ඇත්තහුට” යන්නෙහි රූප සංඥාව කවරීද? රූපාවචර සමාපත්තියට සමවැදුනහුට හෝ උපන්නහුට හෝ මෙලොව සුඛ විහරණ ඇත්තහුට හෝ සංඥාවක් හැඳිනීමක් හැඳිනීම් බවක් ඇද්ද, මේ රූප සංඥාවයි ප්‍රකට රූප සංඥා ඇත්තහුට යනු සතර අරූප සමාපත්තීන් ලද්දාහුට රූප සංඥාවෝ ප්‍රකට වූවාහු වෙත්. වඩන ලද්දාහු වෙත්, ඉක්මවූවාහු වෙත් යනුයි. සියලු කායයන් ප්‍රහීනවූවහුට යනු සියලු ප්‍රතිසන්ධිකවූ රූප කය ප්‍රහීනවූ අවිෂ්කම්භන ප්‍රහානයෙන් ප්‍රහීනවූ ඔහුගේ රූප කය යනුයි.

2. “කිසිවක් නැතැයි බලන්නාවූ” යනු ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියයි, කවර කරුණකින් කිසිවක් නැතැයි කියද්ද? ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සිහි ඇතිව සමවැද සිහි ඇතිව නැගිට ඒ විඤ්ඤාණයම දුරු කරයි. අතුරුදහන් කරයි, කිසිවක් නැතැයි බලයි. ඒ කාරණයෙන් කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට කියයි.

3. “ශාක්‍යයන් වහන්සේගෙන් ඥානය විචාරමි. යන්නෙහි ‘ශාක්‍යයන් වහන්සේගෙන්’ යනු භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය

නම් වන සේක. ශාක්‍ය කුලයෙන් පැවිදි වූයේනුයි ශාක්‍ය නම්. ප්‍රහීන කළ බිය හා බියට හේතු දේ ඇත්තේ පහවූ ලොමු ඩැහැගැනීම් ඇත්තේනුයි ශාක්‍ය නම්. ශාක්‍යයන් වහන්සේගෙන් ඥානය විචාරමි. යනු උන්වහන්සේගෙන් ඥානය විචාරමි. ප්‍රශ්න විචාරමි. කෙබඳුද කවරාකාරද? කවර ප්‍රකාරද? යනුයි.

4. "එබඳුවූ නෛයායය හෙවත් දතයුතුදේ කෙසේද? යනු එය පැමිණ විය යුතුය. හික්මිය යුතුය, පැනවිය යුතුය. බැලිය යුතුය, පැහැදිය යුතුය, එයින් මත්තෙහි ඥානය කෙසේ ඉපදිය යුතුද? යනුයි. 'එබඳුවූ' යනු එවැනිවූ එබඳු සටහන් ඇති එවැනි ප්‍රකාර ඇති යම් ඒ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියයි යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

14-3

1. "සියලු විඤ්ඤාණස්ථිතීන් යනු භාග්‍යවතුන් වහන්සේ අභිසංස්කාර වශයෙන් සතර විඤ්ඤාණස්ථිතීන් දනියි. කෙසේ භාග්‍යවතුන් වහන්සේ අභිසංස්කාර වශයෙන් සතර විඤ්ඤාණස්ථිතීන් දනීද? මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරණලදී" මහණෙනි, ඉදින් රූපූපාය (ii) විඤ්ඤාණය සිටිනු ලබන්නේ සිටියි. රූපාරම්මනය රූපප්‍රතිෂ්ඨාව වැඩීම් බවට විපුලත්වයට පැමිණෙයි. (iii) මහණෙනි, ඉදින් වෙදනූපාය හෝ (මෙහි (ii) යෙදිය යුතුයි.) මහණෙනි, ඉදින් සංඛාරූපාය හෝ විඤ්ඤාණය සිටිනු ලබන්නේ සිටියි. සංඛාරාරම්මනය සංඛාර ප්‍රතිෂ්ඨාව වෘද්ධියට මහත් බවට විපුලත්වයට පැමිණෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අභිසංස්කාර වශයෙන් සතර විඤ්ඤාණස්ථිතීන් දනියි.

2. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රතිසන්ධි වශයෙන් සතර විඤ්ඤාණස්ථිතීන් දනීද? මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මහණෙනි, නානත්තකාය නානත්ත සඤ්ඤීනම් සත්වයෝ ඇත්තාහ. යම්කිසි මනුෂ්‍යයෝද ඇතැම් දෙවියෝද ඇතැම් විනිපාතිකයෝදවෙති. මේ ප්‍රථම විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, නානත්තකාය එකත්තසඤ්ඤීවූ සත්වයෝ ඇත්තාහ. යම්කිසි පළමුව පහළවූ බ්‍රහ්මකායික

දෙවියෝවෙයිද, මේ දෙවෙනි විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, එකත්තකායනම්වූද නානත්ත සඤ්ඤීනම්වූද සත්වයෝ ඇත්තාහ. යම්කිසි ආභස්සර දෙවියෝ වෙති. මේ තුන්වන විඤ්ඤාණස්ථිතියයි මහණෙනි, ඒකත්තකායනම්වූද ඒකත්ත සඤ්ඤීනම්වූද සත්වයෝ ඇත්තාහ. යම්කිසි සුභකිණ්ණක දෙවියෝවෙති. මේ සතරවන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූපසංඥාව ඉක්මවා ප්‍රතිඝසංඥාව අස්තයට පමුණුවා නානත්තසංඥාවන් සිහිනොකොට ආකාශය අන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණියාහුද, මේ පස්වන විඤ්ඤාණස්ථිතියයි සර්වප්‍රකාරයෙන් ආකාශනඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාහුද, මේ සවන විඤ්ඤාණස්ථිතියයි සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාහුද මේ සත්වන විඤ්ඤාණස්ථිතියයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රතිසන්ධි වශයෙන් සප්තවිඤ්ඤාණස්ථිතීන් දනියි.

3. "තථාගතතෙම දැනගන්නේ" යනු දැනගන්නේ අවබොධකරන්නේ යනුයි. මෙය භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශකළහ. චුන්දය. භාග්‍යවතුන් වහන්සේ විසින් අතීතවූද නොවූද නොවැසුනාවූද අනාත්මසඤ්ඤාවූද යමක්වේද එය තථාගතතෙම ප්‍රකාශ නොකරයි. චුන්දය, අතීතවූද (ii) සිදුවූද වැසුනාවූද අනාත්මසඤ්ඤා ඇත්තේද එයද තථාගතතෙම ප්‍රකාශ නොකරයි. (iii) චුන්දය, අතීතවූද සිදුවූද (iv) වැසුනාවූද අර්ථයෙන් යුක්තයමක් ඇද්ද, ඒ ප්‍රශ්න විසඳීම පිණිස එයට තථාගතතෙම කාලය දන්නේවෙයි.

4. "චුන්දය අනාගතවූද (මෙහි 3 (ii) යෙදියයුතුයි.) චුන්දය අනාගතවූද සිදුනුවූද (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

5. "චුන්දය, පවත්නා කාලයෙහිවූද නොවූ නොවැසුන අනර්ථය ගෙනදෙන යමක් ඇද්ද, එය තථාගතතෙම ප්‍රකාශ නොකරයි. චුන්දය, පවත්නා කාලයෙහිවූද සිදුවූ වැසුන අනර්ථය ගෙනදෙන යමක්වේද? එයද තථාගතතෙම ප්‍රකාශ නොකරයි.

චුන්දය, පවත්නා කාලයෙහිවූද සිදුවූ වැසුන අර්ථයෙන් යුක්ත යමක්වේද ඒ ප්‍රශ්න විසඳීම පිණිස තථාගත තෙම කාලය දන්නේවෙයි. චුන්දය, මෙසේ වනාහී අතීත අනාගත පවත්නා යන කාලයන්ට අයත් ධර්මයන්හි තථාගත තෙම කාලවාදීවූයේ භූතවාදීවූයේ, අර්ථවාදීවූයේ ධර්මවාදී වූයේ විනයවාදී වූයේ වෙයි. එහෙයින් තථාගතයයි කියයි. 'චුන්දය යම් හෙයකින් දෙවියන් සහිත ලොකයාගේ මරුන් සහිත බඹුන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාවගේ දැකී ඇසූ, ස්පර්ශ කළ, දැනගත්, පැමිණි, සොයනලද සියල්ල සිතින් අවබොධ කරණලදී. එහෙයින් තථාගතයයි කියයි.

**6.** "චුන්දය යම් රාත්‍රියක තථාගතතෙම නිරුත්තරවූ සම්‍යක් සම්බොධියට පැමිණේද, යම් රාත්‍රියක නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවේද මේ අතර යමක් කියාද දෙශනා කෙරේද, ඒ සියල්ල එසේමවෙයි. අන්පරිද්දෙකින් නොවෙයි. එහෙයින් තථාගතයයි කියයි. "චුන්දය, තථාගත තෙම යම්සේ කියන්නේද, එසේ කරන්නේවෙයි. යම්සේ කරන්නේද එසේ කියන්නේවෙයි. මෙසේ යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදීසේක. එහෙයින් තථාගතයයි කියයි.

**7.** "චුන්දය, දෙවියන් සහිත ලොකයෙහි මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි තථාගත තෙම මැඩ පැවතුනසේක. අන්‍යයාට මැඩිය නොහැකිසේක. අන්‍යයා වශයෙහි පවත්වනසේක. එහෙයින් තථාගතයයි කියයි.

**8.** "සිටින්නේ මෙය දනියි" යනු භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු නපුරු ගති ඇති නපුරුසේ වැටෙන සැපයෙන් පහවූ නරකයෙහි උපදින්නේයයි කම්මාභිසංඛාර වශයෙන් මෙලොවම කරුණු දනියි. භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු තිරිසන් යෝනියෙහි උපදින්නේ යයි කම්මාභි සංඛාර වශයෙන් මෙලොවම කරුණු දනියි. මේ පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු ප්‍රේත විෂයෙහි උපදින්නේයයි කම්මාභි සංඛාර වශයෙන් මෙලොවම කරුණු

දනියි. මේ පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු මිනිසුන් අතරෙහි උපදින්නේයයි කම්මාභි සංඛාර වශයෙන් මෙලොවම දනියි. මෙසේ පිළිපන් පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිනම්වූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේයයි කම්මාභි සංඛාර වශයෙන් දනියි.

**9.** "භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී. (ii) 'ශාරීපුත්‍රය, එක්තරා පුද්ගලයකු ගැන මේ පුද්ගල තෙම මෙසේ පිළිපන්නේ මෙසේ පවතියි. මේ මාර්ගයට බැසි තැනැත්තේ යම්සේ (iii) කායයාගේ බිඳීමෙන් මරණින් මතු නපුරුගති ඇති නපුරුසේ වැටෙන සැපයෙන් තොර නරකයෙහි උපදින්නේ යයි මෙසේ සිතින් සිත පිරිසිඳ ඇතිවීම දනිමි ශාරිපුත්‍රය. මම එක්තරා පුද්ගලයකු ගැන මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. මේ පුද්ගලතෙම එසේ පිළිපන්නේ එසේ ඉරියව් පවත්වයි. ඒ මාර්ගයට බැස ගත්තේ කායයාගේ බිඳීමෙන් මරණින් මතු (vi) තිරිසන් යොනියෙහි උපදින්නේයයි භාග්‍යවතුන් වහන්සේ දනියි. (මෙහි (ii) (iii) යෙදිය යුතුයි.) ප්‍රේත විෂයෙහි උපදින්නේ යයි දනියි. (මෙහි (i) (iv) යෙදිය යුතුයි.) මිනිසුන් අතරෙහි උපදින්නේයයි දනියි. (මෙහි (ii) යෙදිය යුතුයි.) කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදින්නේයයි දනියි. (මෙහි (ii) ඡෙදය යෙදිය යුතුයි.) ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මෙලොවම තෙමේ මනා කොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි, යන මේ කාරණය දනියි. අවිමුක්තිය යනු ආකිඤ්චඤ්ඤායතනයයි අවිමුක්ත යනු එය අධිපතිකොට ඇත්තේ අවිමුක්තියයි, නැවතද භාග්‍යවතුන් වහන්සේ දනියි. මේ පුද්ගලතෙම රූපයෙන්. (මිදුනේය) ශබ්දයෙන් මිදුනේය, ගන්ධයෙන් මිදුනේය. රසයෙන් මිදුනේය, ස්පර්ශයෙන් මිදුනේය, කථාවෙන් මිදුනේය, ගණයාගෙන් මිදුනේය, ආවාසයෙන් මිදුනේය, ලාභයෙන් මිදුනේය. කීර්තියෙන් මිදුනේය, ප්‍රශංසාවෙන් මිදුනේය, සැපතින් මිදුනේය, සිවුරෙන් මිදුනේය, පිණ්ඩපාතයෙන් මිදුනේය, සේනාසනයෙන් මිදුනේය, ගිලන්පස බෙහෙත් පිරිකරින්

මිදුනේය, සූත්‍රාන්තයෙන් මිදුනේය, විනයෙන් මිදුනේය, අභිධර්මයෙන් මිදුනේය, ආරඤ්ඤිකාංගයෙන් මිදුනේය. පිණ්ඩපාතිකාංගයෙන් මිදුනේය, පාංශුකූලිකාංගයෙන් මිදුනේය, තෙචීවරිකාංගයෙන් සපදානචාරිකාංගයෙන්, ඛලුපච්ඡාභක්තිකාංගයෙන්, නෙසජ්ජිකාංගයෙන්, යථාසන්තතිකාංගයෙන්, ප්‍රථම ධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයෙන්, තෘතියධ්‍යානයෙන්, චතුර්ථ ධ්‍යානයෙන්, ආකාශානඤ්චායතන සමාපත්තියෙන්, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන්, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන්, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් මිදුනේ යනුයි. විමුක්තිය එය පරායනයකොට ඇත්තේය යනු ආකිඤ්චඤ්ඤායතනමයවූ එය පරායනකොට ඇත්තේය (iv) කර්මය පරායනකොට ඇත්තේය, විපාක පරායන කොට ඇත්තේය. කර්ම ගරුකොට ඇත්තේය. ප්‍රතිසන්ධි ගරුකොට ඇත්තේය. නැවතද භාග්‍යවතුන් වහන්සේ දනියි. මේ පුද්ගලතෙම රූපය පරායනකොට ඇත්තේය. (මෙහි (iv) යෙදියයුතුයි.) නෙවසඤ්ඤානාසඤ්ඤා සමාපත්ති පරායනවූයේය යනුයි.)

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 14-4

1. "ආකිඤ්චඤ්ඤායතනය උපදවන කර්මය දැන" යනු ආකිඤ්චඤ්ඤායතනයට හෙතුවූ කර්මාභිසංස්කාරයට කියයි. එය ආකිංචඤ්ඤායතන හෙතුව යයි දැන එල්බීම යයි දැන බන්ධනයයි දැන පලිබොධයයි දැන, සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි.

2. "නන්දි සංයෝජනයයි මෙසේ දැන" යනු නන්දි සංයෝජනයයි අරූප රාගයට කියයි. රූප රාගයෙන් ඒ කර්මයෙහි එල්බුනේය. අරූප රාගය නන්දි සංයෝජනයයි දැන එල්බීම යයි දැන බන්ධනයයි දැන පලිබොධය යයි දැන සම කොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි. "ඉති" (මෙසේ) යනු පද සන්ධියයි, පද ගැලපීමයි. පද පිරවීමයි අකුරු සම්පූර්ණ

කිරීමයි. වචන සිළුටු කිරීමයි. පද පිළිවෙළ දැක්වීමයි. "මේ කාරණය මෙසේ දැන" යනු මෙසේ මෙය දැන, සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි.

3. "ඉක්බිත්තෙන් එහි විශෙෂයෙන් බලයි" යන්නෙහි එහි යනු ආකිංචඤ්ඤායතනයට සමවැද එයින් නැගිට එහි උපන් චිත්ත චෛතසික ධර්මයන් අනිත්‍ය වශයෙන් බලයි, දුක් වශයෙන් බලයි, රෝග වශයෙන් බලයි (1-8) 3 රෝග වශයෙන් යන තැන සිට යෙදිය යුතුයි.) නිශ්ශරණ වශයෙන් බලයි. දකියි, පරීක්ෂා කරයි.

4. "මේ ඥානය සත්‍යය යනු මේ ඥානය සත්‍යය, වූ පරිදිය අවිපරීතය, යනුයි. බ්‍රාහ්මණ යනු ධර්ම සතක් බැහැර කළ බැවින් බ්‍රාහ්මණ නම්. (මහා නිද්දෙශයේ (4-3) 1 යෙදිය යුතුයි.) කෙලෙස් ඇසුරු නොකළ අටලෝ දහමින් කම්පා නොවන බැවින් තාදී නම්වූ හෙතෙම බ්‍රහ්ම නම්. වැස නිමවූ යනු කල්‍යාණ පෘථග්ජනයාගේ පටන් සප්ත ශෛක්ෂයෝ නොපැමිණි දෙයෙහි පැමිණීම පිණිස නොලැබූ දෙය ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ දෙය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වාසය කෙරෙත්. රහතන් වහන්සේ වැස නිමවූ වස් ඇත්තේය, කළ කටයුතු ඇත්තේය. බහා තැබූ බර ඇත්තේය, පැමිණි යහපත ඇත්තේය, ක්ෂය කළ භව සංයෝජනයන් ඇත්තේය, විමුක්තිය මනාසේ දත්සේක. හෙතෙම විසූ වාස ඇත්තේය, පුරුදු කළ ගමන් ඇත්තේ (මහා නිද්දෙසයේ (3-7) 6 (ii) යෙදිය යුතුයි.) ජාති මරණ සංසාරයක් පුනර්භවයක් නැත, යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ. ගාථාවගේ කෙළවර සමගම (1-8) 6 යෙදිය යුතුයි.)

## මොඝරාජ මානවක නිර්දෙශය

### 15-1

1. "දෙවරක් මම ප්‍රශ්න කළෙමි" යනු ඒ බ්‍රාහ්මණ තෙම දෙවරක් භාග්‍යවත් බුදුන්ගෙන් ප්‍රශ්න විචාළේය. ප්‍රශ්න විචාළ ඔහුට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ නොකළසේක. මේ

අන්තයෙහි ඒ බ්‍රාහ්මණයාගේ ඉන්ද්‍රිය පරිපාකය වන්නේය, එබැවිනි. ශාක්‍ය යනු භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය සේක. (3-3) 8 ශාක්‍ය යන තැන සිට යෙදිය යුතුයි.) දෙවරක් මම ප්‍රශ්න කළෙමි, යනු ශාක්‍යයන් වහන්සේගෙන් දෙවරක් මම ප්‍රශ්න කළෙමි, ඉල්ලීමි, යනුයි. මට පසැස් ඇති උන්වහන්සේ ප්‍රකාශ නොකළසේක, දෙශනා නොකළ සේක, නොපැනවූසේක, නොතැබූසේක.

2. "ඇස් ඇති" යනු භාග්‍යවතුන් වහන්සේ ඇස් පසකින් යුක්ත බැවින් ඇස් ඇතිසේක. මසැසින්ද ඇස් ඇති සේක. දිවැසින්ද ඇස් ඇතිසේක, පැනැසින්ද ඇස් ඇතිසේක. බුදු ඇසින්ද ඇස් ඇතිසේක, සමතැසින්ද ඇස් ඇතිසේක.

3. භාග්‍යවතුන් වහන්සේගේ මසැසින් වර්ණ පසක් විද්‍යමාන වෙත්. නීලවර්ණය පීත (කහ) වර්ණය ලොහිත (රතු) වර්ණය, කෘෂ්ණ (කලු) වර්ණය, සුදු වර්ණය යනුයි. භාග්‍යවතුන් වහන්සේගේ ඇස් ලොම් යම්තැනක පිහිටියේද එය නිල් වෙයි. පැහැදීම ඇති කරන්නේ වෙයි. දැකුම් කළු වෙයි. උම්මා නම් මල් සමාන වෙයි, එයට එහා කහපාට වෙයි, රන්වන් වෙයි පැහැදීම ඇතිකරන්නේ වෙයි. දැකුම් කළුවෙයි. කිණිහිරි මල් සමාන වෙයි. දෙපස ඇස් කූටයෝ භාග්‍යවතුන් වහන්සේගේ රතුපාට වෙත්. පැහැදීම් ඇතිකරන්නාහු වෙත්. ඉන්දගොපක සමාන වර්ණවෙත්. මැද කළුපාට වෙයි. රූක්ෂ නොවෙයි, පැහැදීම ඇති කරන්නේ වෙයි, රෑද දාවල්ද පර්වතයක වර්ණයට සමාන වර්ණ ඇතිවෙයි. යම් කලෙක චතුරංග සමන්නාගත අන්ධකාරය වේද, සූර්යයාද අස්තයට ගියේවේද, කළුවර පක්ෂයෙහි පොහොයද (මාසේ පෝය) වේද, ඝන වන ලැහැබ වේද, මහා අකාල මේඝයක් (වැස්සක්) පැමිණියේ වේද, මෙබඳු කරුණු සතරකින් යුත් අන්ධකාරය හාත්පස යොදුනක පෙණේද, මේ අතර මහා ගෙයක් හෝ ජනේලයක් හෝ පර්වතයක් හෝ ගසක් හෝ ආවරණ වශයෙන් දැකීමට නොලැබෙයි. එකම තල ඇටයක් නිමිතිකොට ඒ තල ඇටය විසුරුවන්නේද, එය සොයා ගන්නේද භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකෘති ඇසෙහි

එවැනි පිරිසිදු බවක් ඇතිසේක. එබැවින් මසැසින්ද ඇස් ඇතිසේක.

4. "භාග්‍යවතුන් වහන්සේ කෙසේ දිවැසින් ඇස් ඇති සේක්ද? භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් කර්මවූ පරිදි පැමිණෙන සතුන් දකියි. භාග්‍යවතුන් වහන්සේ කැමතිවන සේක්නම් එකම ලොකයක් දක්නේය, ලොක ධාතු දෙකක් දක්නේය. ලොක ධාතු තුනක් දක්නේය. ලොක ධාතු පසක්, දශයක්, විස්සක්, දක්නේය. ලොක ධාතු තිසක් දක්නේය, ලොක ධාතු සතළිසක් දක්නේය. පණසක් දක්නේය, දහසක් දක්නේය, දෙදහසක් මධ්‍යමවූ ලොක ධාතු දක්නේය, දහසක් මහා සහශ්‍රී ලොක ධාතු දක්නේය. ඉදින් යම් තරමක් බලාපොරොත්තු වන්නේ නම් එපමණම දක්නේය. මෙසේද භාග්‍යවතුන් වහන්සේගේ දිව ඇස පිරිසිදුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දිව ඇසින්ද ඇස් ඇතිසේක.

"කෙසේ භාග්‍යවතුන් වහන්සේ පැනැසින්ද ඇස් ඇතිසේක්ද? භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රඥා ඇතිසේක. ජවන ප්‍රඥා ඇතිසේක. හාස ප්‍රඥා ඇතිසේක. තික්ඛ ප්‍රඥා ඇතිසේක. නිබ්බේධික ප්‍රඥා ඇතිසේක. ප්‍රඥා ප්‍රභෙදයන්හි දක්ෂය, බෙදුන ඥානය ඇතිසේක. ලැබූ ප්‍රතිසම්භිදා ඇතිසේක. සතර විශාරද භාවයෙන් යුක්තසේක. දශබලධාරීසේක. පුරිසාසභසේක. පුරිසසීහ සේක. පුරිසනාභසේක. පුරිසා ජඤ්ඤසේක. පුරිස ප්‍රධානත්වය ඉසලීමට සමර්ථසේක. අනන්තවූ ඥාන ඇතිසේක. අනන්තවූ තේජස් ඇතිසේක. අනන්තවූ කීර්ති ඇතිසේක. ආඪ්‍යවූයේ, මහද්ධන ඇත්තේ ධනවත්සේක. පමුණුවන බැවින් නෙතෘසේක අනුනෙතෘසේක. පණවනසේක. බලනසේක. පහදවනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දන්නාදෙය දන්නාසේක, දක්නාදෙය දක්නාසේක, ඇතිසේක, ධර්මය බඳුවූසේක, බ්‍රහ්මයා බඳුවූසේක, ප්‍රකාශකරණසේක, ඤානය ඇතිසේක, අර්ථය තෝරාදෙනසේක. අමෘතය දෙනසේක, ධර්ම ස්වාමිසේක, තථාගතසේක.

6. "තුන්වෙනි වාරයෙහි මාගේ ඇසීම විය" යනු තුන්වෙනි වර දක්වා බුදුරජතෙම සහ ධාර්මික ප්‍රශ්න විචාරණ ලද්දේ

ප්‍රකාශකරයි යනුයි. දිව්‍යර්ෂි යනු භාග්‍යවතුන් වහන්සේද ඍෂිවරයාද දිව්‍යර්ෂි නම්. යම්සේ පැවිදිවූ රජුට රාජර්ෂියයි කියයිද පැවිදි බ්‍රාහ්මණයාට බ්‍රාහ්මණ ඍෂියයි කියාද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේද ඍෂිවරයාද දිව්‍යර්ෂි නම්.

7. "නැවතද භාග්‍යවතුන් වහන්සේ පැවිදි කෙනෙක්නුයි ඍෂි නම්. මහත්වූ ශීල රාශියක් සෙවූයේනුයි ඍෂිනම්. මහත්වූ සමාධි රාශියක්, මහත්වූ ප්‍රඥා රාශියක්, මහත්වූ විමුක්ති රාශියක්, විමුක්ති ඥාන දර්ශන රාශියක් සෙවූයේය. මහත්වූ අන්ධකාරය බිඳ දැමීම සෙවූයේය. මෙසේ භෙදභින්න මහත්වූ විපර්යාශය සෙවූයේනුයි ඍෂිනම්. මහත්වූ තෘෂ්ණා හුලේ ඉදිරීම සෙවූයේනුයි ඍෂිනම්. මහත්වූ දෘෂ්ටි බැම්ම ලිහාදැමීම, මහත්වූ මාන ධජයාගේ පහත්කිරීම මහත්වූ රැස්කිරීම සංසිඳීම, මහත්වූ ඔඝයෙන් එතරකිරීම, මහත්වූ සංසාර වට්ටය සිඳීම, මහත්වූ දැවිල්ල නිවීම, මහත්වූ තැවීම සංසිඳීම මහත්වූ ධර්ම ධජයාගේ එසවීම. සෙවූයේනුයි මහර්ෂිනම්. මහත්වූ සතිපට්ඨානයන් මහත්වූ සම්‍යක් ප්‍රධානයන්, මහත්වූ ඉන්ද්‍රියයන් මහත්වූ බලයන්, මහත්වූ බොධ්‍යංගයන්, මහත්වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, මහත්වූ පරමාර්ථය, අමෘතවූ නිර්වාණය සෙවූයේනුයි මහර්ෂිනම් බුදුරජාණන් වහන්සේ කොහිද භාග්‍යවතුන් වහන්සේ කොහිද දෙව දෙවයන් වහන්සේ කොහිද, නරාසභයන් වහන්සේ කොහිදැයි මහෙශාක්‍යයන් විසින් සොයන ලද්දේනුයි, මහර්ෂි නම් යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීය.

## 15-2

1. "මේ ලොවද පරලොවද" යන්නෙහි මේලොව නම් මනුෂ්‍ය ලොකයයි. පරලොකය නම් මනුෂ්‍ය ලෝකය හැර සියලු පරලොවයි. දෙවියන් සහිත බ්‍රහ්මලොකය යනු දෙවියන් සහිත ලොකය, මරුන් සහිත බඹුන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව යනුයි. "ඔබවහන්සේගේ දෘෂ්ටිය නොදනියි" යනු ඔබවහන්සේගේ දෘෂ්ටිය, රුචිය, කැමැත්ත අදහස, ලෝකය නොදනියි. මේතෙමේ මෙවැනි දෘෂ්ටි ඇත්තෙක, මෙවැනි කැමති ඇත්තෙක, මෙවැනි රුචි ඇත්තෙක, මෙවැනි ලබ්ධි

ඇත්තෙක, එවැනි අදහස් ඇත්තෙකැයි නොදනියි, නො දකියි, නොවිඳියි, නොලබයි යනුයි.

2. "යශස් ඇති ගෞතමයන් වහන්සේගේ" යනු යශසට පැමිණියේනුයි භාග්‍යවතුන් වහන්සේ යශස් ඇත්තේනම් නැවතද භාග්‍යවතුන් වහන්සේ සත්කාර කරණ ලද්දේනුයි ගරුකාර කරණ ලද්දෙනුයි, බහුමාන කරණ ලද්දේනුයි, පුදන ලද්දේනුයි. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේනුයි, යශස් ඇත්තේ නම්. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

15-3

1. "මෙසේ ඉදිරියට දක්නාසුළුවූයේ" යනු ඉදිරිය දක්නා ශ්‍රෙෂ්ඨත්වය දක්නා, ප්‍රමුඛත්වය දක්නා, උතුම්බව දක්නා යනුයි. ප්‍රශ්න ඇසීමට පැමිණියේ වෙමි යනු (3-1) 5 යෙදිය යුතුයි.) "කෙසේ ලෝකය බලන්නහුට" යනු කෙසේ ලෝකය බලන්නහුට, ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට සමකොට බලන්නහුට තීරණය කරන්නහුට, ප්‍රකට කරන්නහුට මෘත්‍යු රාජයා නොදකීද" යනු මෘත්‍යු රාජයා නොපැමිණේද, නොලැබේද යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම මෙසේ කීය.

15-4

1. ලොකය ශූන්‍ය වශයෙන් බලව, 'යන්නෙහි ලොකය නම් නිරය ලෝකය. තිරිසන් ලෝකය, ප්‍රෙතවිෂය ලොකය, මනුෂ්‍යලොකය, දිව්‍යලෝකය, ස්කන්ධලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය මේ ලෝකය, පරලෝකය, බ්‍රහ්ම ලෝකය දෙවියන් සහිත ලෝකය යනුයි.

2. එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්වූහ. 'ස්වාමීනි, ලෝකය ලොකය යයි කියයි, කොපමණකින් ලෝකය යයි කියනු ලැබේද?" යනුයි. මහණ, විනාශවේනුයි, ලෝකය යයි කියයි. විනාශවෙයි යනු අදහස විනාශ වෙයි. රූපය විනාශවෙයි, චක්ඛුවිඤ්ඤාණය විනාශවෙයි, ඇසේ පහස විනාශ වෙයි, ඇසේ පහස හේතුවෙන් යමක් උපදීද, එයද විනාශවෙයි. ස්පර්ශය විනාශවෙයි. මනස විනාශ වෙයි. ධර්මය විනාශවෙයි.

මනොවිඤ්ඤාණය විනාශවෙයි. මනසේ ස්පර්ශය විනාශවෙයි. මනසේ ස්පර්ශ හේතුවෙන් යමක් උපදීද එයද විනාශවෙයි. විඳියයුතු සැපය හෝ ඇද්ද එයද විනාශ වෙයි. මහණ එහෙයින් ලෝකය යයි කියයි" යනුයි.

3. "ශූන්‍ය වශයෙන් ලොකය බලයි" යනු දෙයාකාරයකින් ලොකය බලයි. වශයෙහි නොපැවතීම සැලකීම් වශයෙන් හෝ ධාතු සංස්කාර බැලීම් වශයෙන් හෝ යනුයි. කෙසේ වශයෙහි නොපැතීම ලක්ෂණ කොට ලොකය ශූන්‍ය වශයෙන් බලන්නේද, "මහණෙනි, රූපය ලැබෙයි. වේදනාවගේ වශයෙහි නොලැබෙයි, සංඥාවගේ වශයෙහි නොලැබෙයි. සංස්කාරයන්ගේ වශයෙහි නොලැබෙයි. විඤ්ඤාණයේ වශයෙහි නොලැබෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළසේක.

4. "මහණෙනි, රූපය අනාත්මයකි. මහණෙනි, මේ රූපය ආත්මයක් වන්නේ නම් මේ රූපය ආබාධය පිණිස නොපවත්නේය. මෙසේ රූපයට වේවායි නොවේවායි නොලැබෙයි. මහණෙනි, මේ රූපය අනාත්මයකි. එහෙයින් රූපය ආබාධය පිණිස පවතියි. මෙසේ රූපයට වේවායි නොවේවායි නොලැබෙයි. වේදනාව අනාත්මයකි. එහෙයින් වේදනාව ආබාධය පිණිස පවතියි. යම් හෙයකින් මහණෙනි, වේදනාව අනාත්මයක් වේද, එහෙයින් වේදනාව ආබාධය පිණිස පවතියි. සංඥාව අනාත්මයකි. මහණෙනි, මේ සංඥාව අනාත්මයක් වන්නේ නම් මේ සංඥාව ආබාධය පිණිස නොපවත්නේය. යම් හෙයකින් මේ සංඥාව අනාත්මයක් වේද එහෙයින් සංඥාව ආබාධය පිණිස පවතියි. සංස්කාරය අනාත්මයකි. මේ සංස්කාරය ආත්මයක් වන්නේ නම්, මේ සංස්කාරය ආබාධය පිණිස නොපවත්නේය. යම් හෙයකින් මේ සංස්කාරය අනාත්මයක් වන්නේද, එහෙයින් සංස්කාරය ආබාධය පිණිස පවතියි. (iii) (සංස්කාරය විඤ්ඤාණය කොට (මෙහි (ii) යෙදිය යුතුයි.) මෙසේ වශයෙහි නොපැවතීම ලක්ෂන වශයෙන් ලොකය ශූන්‍ය වශයෙන් දකියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** කෙසේ හිස් සංස්කාර යයි බැලීම් වශයෙන් ලොකය ශූන්‍යයයි බලාද? රූපයෙහි සාරයක් නොලැබෙයි. වේදනාවෙහි සාරයක් නොලැබෙයි, සංඥාවෙහි සාරයක් නොලැබෙයි, විඤ්ඤාණයෙහි සාරයක් නොලැබෙයි. නිත්‍ය සාර වශයෙන් හෝ ශුබ සාර වශයෙන් හෝ ආත්ම සාර වශයෙන් හෝ නිත්‍ය වශයෙන් හෝ ධ්‍රැව වශයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ වෙනස් නොවන ධර්ම වශයෙන් හෝ රූපය අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්ව ගියේය වේදනාව අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්ව ගියේය. සංඥාව අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්ව ගියේය. සංස්කාරය අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්ව ගියේය. විඤ්ඤාණය අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්ව ගියේය. යම්සේ උන හෝ බට වල හරයක් නැත්තේද නිශ්ශාරද සාරයෙන් වෙන් වූයේද, යම්සේ එරඬු ගස, යම්සේ දිඹුල් ගස, යම්සේ එරබඳු ගස, යම්සේ පෙනපිඩ, යම්සේ දිය බුබුල, යම්සේ මිරිඟුව, යම්සේ කෙසෙල් කඳ යම්සේ මායාව, අසාරය නිශ්ශාරය, සාරයෙන් ඉවත්ව ගියේය. මෙපරිද්දෙන්ම රූපය අසාරය, නිශ්ශාරය, සාරයෙන් තොරය, මෙසේ හිස් සංස්කාරයක් යයි බැලීම් වශයෙන් ලොකය හිස් වශයෙන් බලයි. මෙසේ දෙයාකාරයෙන් ලොකය හිස් වශයෙන් බලයි.

**6.** "නැවතද සයාකාරයකින් ලොකය ශූන්‍ය වශයෙන් බලයි. ආත්ම වශයෙන් හෝ ආත්මය කෙරෙහි නිත්‍ය වශයෙන් හෝ ස්ථිරත්ව වශයෙන් හෝ ශාස්වත ධර්ම වශයෙන් හෝ වෙනස් නොවන ධර්ම වශයෙන් හෝ ඇස ශූන්‍යය, රූපය ශූන්‍යය, ශබ්දය ශූන්‍යය, ගන්ධය ශූන්‍යය, රසය ශූන්‍යය, ස්පර්ශය ශූන්‍යය, ධර්මය ශූන්‍යය, කණ ශූන්‍යය, නාශය ශූන්‍යය දිව ශූන්‍යය, කායය ශූන්‍යය, මනස ශූන්‍යය යනුයි. චක්ඛු විඤ්ඤාණය, ශොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය කාය විඤ්ඤාණය, මනො විඤ්ඤාණය ශූන්‍යය, චක්ඛු සම්ඵස්සය, සොත සම්ඵස්සය, ඝාන සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය කාය සම්ඵස්සය, මනො සම්ඵස්සය ශූන්‍යය, ඇසේ පහසින්වූ වේදනාව, කණේ පහසින්වූ, දිවේ පහසින්වූ කයේ පහසින්වූ මනසෙහි පහසින්වූ වේදනාව ශූන්‍යය, රූප සංඥාව,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ, ධර්ම සංඥාව ශූන්‍යය, රූප සඤ්චෙතනාව, ශබ්ද සඤ්ඤෙතනාව, ගන්ධ සඤ්චෙතනාව, රස සඤ්චෙතනාව, ස්පර්ශ සඤ්චෙතනාව, ධර්ම සඤ්චෙතනාව ශූන්‍යය යනුයි. රූප තෘෂ්ණාව ශූන්‍යය. රූප විතර්කය ශූන්‍යය, රූප විචාරය ශූන්‍යය, ශබ්ද තෘෂ්ණාව ශබ්ද විතර්කය, ශබ්ද විචාරය, ගන්ධ තෘෂ්ණාව, ගන්ධ විතර්කය, ගන්ධ විචාරය, රස තෘෂ්ණාව රස විතර්කය, රස විචාරය, ස්පර්ශ තෘෂ්ණාව ස්පර්ශ විතර්කය, ස්පර්ශ විචාරය, ධර්ම තෘෂ්ණාව, ධර්ම විතර්කය, ධර්ම විචාරය ශූන්‍යය, යනුයි. මෙසේ ආකාර සයකින් ලොකය ශූන්‍ය වශයෙන් බලයි.

7. "නැවත දශාකාරයකින් ලොකය ශූන්‍ය වශයෙන් බලයි, රූපය ස්වල්ප වශයෙන්, හිස් වශයෙන්, ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්, අසාර වශයෙන්, වධක වශයෙන් විභව වශයෙන්, පීඩා මූලක වශයෙන්, ආශ්‍රව සහිත වශයෙන්, සංඛත වශයෙන් යන මෙසේ දශාකාරයෙන් ලොකය ශූන්‍ය වශයෙන් බලයි. නැවත දොළොස් ආකාරයකින් ශූන්‍ය වශයෙන් ලොකය බලයි, රූපය සත්වයෙක් නොවේ ජීවය නොවේ, නරයෙක් නොවේ, මානවයෙක් නොවේ, ස්ත්‍රියක් නොවේ, පුරුෂයෙක් නොවේ, ආත්මය නොවේ, ආත්මයෙහි නොවේ මම නොවේ, මට නොවේ, කිසිවෙක් නොවේ, කිසිවෙකුගේ නොවේ, වේදනාව සංඥාව, සංස්කාරය, විඤ්ඤාණය, සත්වයෙක් නොවේ, ජීවය නොවේ, නරයෙක් නොවේ, මානවකයෙක් නොවේ. ස්ත්‍රියක් නොවේ. පුරුෂයෙක් නොවේ, ආත්මය නොවේ, ආත්මයෙහි නොවේ, යමක් මම නොවේ, මට නොවේ, කිසිවෙක් නොවේ, කිසිවෙකුගේ නොවේ, මෙසේ දොළොස් ආකාරයෙන් ලොකය ශූන්‍ය වශයෙන් බලයි."

8. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. "මහණෙනි, මේ ශරීරය මාගේ නොවේ, තොපගේ නොවේ, වෙන කෙනෙකුගේ නොවේ, චෙතනාවෙන් යුක්ත වේදනාවෙන් යුක්ත මෙය පුරාණවූ කර්මයක් යයි දතයුතුයි. මහණෙනි, එහි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙම ප්‍රතීත්‍ය සමුත්පාදයම මනාකොට

නුවණින් සිහි කරයි. මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය වෙයි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වෙයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. (1-4) (2) 'අවිද්‍යා හේතුවෙන්' යන තැන සිට යෙදිය යුතුයි. මෙසේද ලෝකය ශූන්‍ය වශයෙන් බලත්.

**9.** මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. (ii) මහණෙනි, යමක් තොපගේ නොවේනම් එය දුරු කරව්. ඒ දුරු කිරීම දීර්ඝ කාලයක් හිත සුව පිණිස, වන්නේය. කිසිවක් ඔබගේ නොවේනම් එය දුරු කරව්. ඒ දුරු කිරීම දිගු කලක් හිත සුව පිණිස පවත්නේය. මහණෙනි, වෙදනාව (iii) තොපගේ නොවේ. එය දුරු කරව් ඒ දුරු කිරීම දීර්ඝ කාලයක් හිත සුව පිණිස පවත්නේය. (iv) මහණෙනි, සඤ්ඤාව (මෙහි (iii) යොදාගත යුතුයි.) මහණෙනි, සංස්කාරය (මෙහි (iii) යොදාගත යුතුයි.) මහණෙනි, විඤ්ඤාණය (මෙහි (iii) යොදාගත යුතුයි.)

**10.** "මහණෙනි, මේ ජේතවනයෙහි තෘණ, දර, කොළ වේද, එය ජනතෙම ගෙන යන්නේ නම් හෝ කඩන්නේ නම් හෝ සුදුස්සක් හෝ කරන්නේ නම් ඒ තෘණාදිය මෙසේ අප ජනතෙම පැහැර ගනියි, ඩැහැගනියි. යම් දෙයක් හෝ කෙරේ යයි සිතත්ද" "ස්වාමීනි එසේ නොවේ" "එයට හේතු කවරේද?" තමා හෝ තමා කෙරෙහි හෝ යන අදහසක් ඒවාට නැති බැවිනි. එපරිද්දෙන්ම (මෙහි 8 (ii) (iii) යොදාගත යුතුයි.)

**11.** "ධර්මයෝ ඇතිවීම වශයෙන් පිරිසිදුය සංස්කාර සමූහය පිරිසිදුය, ශාමිනිය, ඇති තතු දක්නහුට බියක් නොවේ. තෘණ දර සමාන ලොකය යම් කලෙක නුවණින් දකීද, තට එය අනාර්ථයක් පිණිස නොවේ." අන් තැනක ප්‍රතිසන්ධිය පිණිස නොවේ. මෙසේද ලොකය ශූන්‍ය වශයෙන් බලයි.

**12.** ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ලොකය ශූන්‍යය ලොකය ශූන්‍යයයි කියනු ලැබේ. කොපමණකින් ලොකය ශූන්‍යයයි කියනු ලැබේද?" "ආනන්දය, යමක් තමා විසින් හෝ තමා කෙරෙහි හෝ ශූන්‍යද එහෙයින් ලොකය ශූන්‍යයයි කියනු ලැබේ.

ආනන්දය, තමා විසින් හෝ තමා කෙරෙහි හෝ කුමක් ශූන්‍ය වේද? ආනන්දය තමා විසින් හෝ තමා කෙරෙහි හෝ ඇස වනාහි ශූන්‍යය, රූපය ශූන්‍යය, චක්ඛු විඤ්ඤාණය, ශූන්‍යය, තමා විසින් හෝ තමා කෙරෙහි චක්ඛු සම්ඵස්සයෙන් හටගත් සැපක් හෝ දුකක් හෝ සැපදුක් දෙකම හෝ ශූන්‍යය, කණ ශූන්‍යය, ශබ්දය ශූන්‍යය, නාශය ශූන්‍යය, ගන්ධය ශූන්‍යය දිව ශූන්‍යය, රස ශූන්‍යය, කය, ශූන්‍යය, ස්පර්ශය ශූන්‍යය මනස ශූන්‍යය, ධර්මය ශූන්‍යය, මනොවිඤ්ඤාණය ශූන්‍යය, මනො සම්ඵස්සය ශූන්‍යය, මනස හා ස්පර්ශයෙන් තමා විසින් හෝ තමා කෙරෙහි හෝ වේදයිතවූ සැපවූ දුක්වූ සැපදුක් දෙකම නැති යමක් උපදීද, එයද ශූන්‍යය. ආනන්දය යම්හෙයකින් තමා විසින් හෝ තමා කෙරෙහි හෝ යමක් ශූන්‍යද, එහෙයින් ලොකය ශූන්‍යයයි කියනු ලැබේ. මෙසේද ලොකය, ශූන්‍ය වශයෙන් බලයි.

13. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. "මහණෙනි, මෙපරිද්දෙන්ම මහණතෙම රූපය සොයන්නේ යම් පමණ රූපයාගේ ගතියක් වේද, වෙදනාව සොයන්නේ යම් පමණ වෙදනාවගේ ගතියක් වේද, සඤ්ඤාව සොයන්නේ යම් පමණ සඤ්ඤාවගේ ගතියක් වේද, සංස්කාරය සොයන්නේ සංස්කාරයාගේ යම් පමණ ගතියක් වේද, විඤ්ඤාණය සොයන්නේ යම් පමණ විඤ්ඤාණයේ ගතියක් වේද, එයද ඔහුට මමය' කියා හෝ 'මගේය කියා හෝ මා කෙරෙහිය කියා හෝ මෙසේද ඔහුට නොවෙයි. මෙසේද ලොකය ශූන්‍ය වශයෙන් බලව යනු ශූන්‍ය වශයෙන් බලව, දකුව, සමකොට බලව, තීරණය කරව ප්‍රකට කරව යනුයි."

14. "මොඝ රාජය" හැමකල්හි සිහි ඇත්තේ" යනු බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි. හැමකල්හි යනු (මහා නිද්දෙසයේ 3-5 (3) මධ්‍යාහ්න සමයෙහි යන තැන සිට යොදාගත යුතුයි.) පශ්චිම වයස් කොටසෙහි යනුයි. සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ යනුයි. කයෙහි කය අනුව බලන සතිපට්ඨානය වඩන්නේ සිහි ඇත්තේ

වෙයි. හෙතෙම සිහි ඇත්තේ නම්. ආත්ම දෘෂ්ටිය උදුරා දමා යන්නෙහි ආත්ම දෘෂ්ටිය යනු විසි වැදෑරුම් ආත්ම දෘෂ්ටියයි. මේ ශාසනයෙහි ආර්ය ධර්මය නොදන්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය ආත්මය වශයෙන් බලයි. තමා රූපවත්ය කියා හෝ රූපය ආත්මය කෙරෙහි පිහිටියේය කියා හෝ ආත්මය හෝ රූපයෙහි පිහිටියේය. වේදනාව, සඤ්ඤාව, සංස්කාරයන් විඤ්ඤානය ආත්ම වශයෙන් බලයි තමා විඤ්ඤාණවත්ය කියා හෝ විඤ්ඤාණය ආත්මය කෙරෙහි පිහිටියේය කියා හෝ ආත්මය විඤ්ඤාණයයෙහි පිහිටියේය කියා හෝ යම් මෙබඳු දෘෂ්ටියක් ඇද්ද දෘෂ්ටි ගැනීමක් ඇද්ද, දෘෂ්ටි ඝනවනයක් ඇද්ද, දෘෂ්ටි කාන්තාරයක් ඇද්ද, දෘෂ්ටි නපුරු කටුවක් ඇද්ද, දෘෂ්ටි කම්පාවක් ඇද්ද, දෘෂ්ටි සංයෝජනයක් ඇද්ද, ගැනීමක් පිහිටු වීමක්, බැසගැන්මක්, පරාමර්ශයක් නපුරු මාර්ගයක් වැරදි මාර්ගයක්, බොරු බවක්, තීර්ථායතනයක්, විපර්යාශගැන්මක් මිථ්‍යාගැන්මක් ඇද්ද, මේ මිථ්‍යාදෘෂ්ටියයි, "උදුරා" යනු ආත්ම දෘෂ්ටිය උදුරා උත්පාටනය කොට, බැහැරකොට, දුරුකොට, මෙසේ මරුවා තරණය කරන්නෙහිය, ජරාවද තරණය කරන්නෙහිය, මරණයද තරණය කරන්නෙහිය. ඉක්මවන්නෙහිය යනුයි.

**15.** "මෙසේ ලෝකය බලයි" යනු මෙසේ ලෝකය බලන්නාවූ සමකරන්නාවූ, තීරණය කරන්නාවූ ප්‍රකට කරන්නාවූ යනුයි. මෘත්‍යු රාජයා යනු මාරයායි මෘත්‍යු රාජයා නොදකියි යනු මෘත්‍යු රාජයායි නොලබයි. නොවිඳියි යනුයි.

**16.** භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී. 'මහණෙනි, වනයෙහි වසන මුවෙක් වනයෙහි හැසිරෙන්නේ සැක නැතිව යයි, සැක නැතිව සිටියි, සැක නැතිව හිඳියි, සැක නැතිව නිදයි. මහණෙනි, එයට හේතු කවරේද, වැද්දා ඉදිරියට නොඑන බැවිනි මහණෙනි, එමෙන්ම මහණ තෙම

කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති ප්‍රථම ධ්‍යානයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය මාරයා නැතිකොට නොදැක්මට ගියේයයි කියයි.

"නැවතද මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූප සංඥාව ඉක්මවා පටිඝසඤ්ඤාව අස්තයට පමුණුවා නානත්තසංඥාව සිහිනොකොට අකාසය අනන්තයයි ආකාශානඤ්ඤායතනයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය මාරයා නැතිකොට නොදැක්මට ගියේ වෙයි. නැවතද මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට සමවැද වාසය කරයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැද වාසය කරයි. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවැද වාසයකරයි. සංඥාවයවයන් දැක ආශ්‍රවයෝ ක්ෂයවූවාහු වෙත්. මහණෙනි, මෙයද මාරයා නැතිකොට නොදැක්මට ගියේයයි කියයි. හෙතෙම ලොකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කළේයයි කියයි. හෙතෙම නිසැකව යයි නිසැකව සිටියි නිසැකව හිඳගනියි, නිසැකව නිදයි. එයට හේතු කවරේද, පාපිමන්තු නම් මාරයා ඉදිරියට නොපැමිණියේද, නොදකීද එහෙයිනි' එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

(ගාථාවෙන් කෙළවර සමගම (1-8) 6 යෙදිය යුතුයි.)

## පිංගිය මානවක සූත්‍ර නිර්දේශය.

### 16-1

1. "ජරාවට පැමිණියේ දුර්වර්ණවූයේ ශක්ති නැත්තේ වීමි" යනු ජරාවට පැමිණියේ වයසට පැමිණියේ, මහළුවූයේ, කල්ගතවූයේ අන්තිම වයසට පැමිණියේ උත්පත්තියෙන් එක්සිය විසි වයසට පැමිණියේ ස්වල්ප බල ඇත්තේ ස්වල්ප ශක්ති

ඇත්තේ යනුයි. 'දුර්වර්ණවූයේ' යනු පෙර තිබූ යහපත් වර්ණය පහව ගියේය පැහැපත් බව අතුරුදන්විය, ආදීනවය පහළවූයේය යනුයි. ඇස් අපිරිසිදුය. ඇසීම අපහසු වෙයි. 'අතරෙහි' යනු මම අතරෙහි නොනසිම්වා යනුයි. සිහි මුලාවට නොපැමිණෙම්වා යනු දැනගතයුතු දේ නොදැන, අවිද්‍යාවට පැමිණියේ, මුලාවට පැමිණියේ, අතරෙහි නොමියෙම්වා යනුයි. අතරෙහි යනු ඔබගේ ධර්මය, දෘෂ්ටිය, ප්‍රතිපදාව, මාර්ගය නොදැන අවබොධ නොකොට ස්පර්ශ නොකොට ප්‍රත්‍යක්ෂ නොකොට, මම අතරෙහි කළුරිය නොකෙරම්වා යනුයි. 'මම යම් ධර්මයක් දැනගනිම්ද' යන්නෙහි 'ධර්මය' යනු මුල පිරිසිදු මැද පිරිසිදු අග පිරිසිදු අර්ථ සහිත යහපත් පද සහිත සම්පූර්ණයෙන් පරිපූර්ණවූ, පරිශුද්ධවූ බ්‍රහ්මචරියාව, එනම් සතර සතිපට්ඨානයන්, සතර සම්‍යක් ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය, පංචබල, සප්ත බොධ්‍යංගයන්, ආර්ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණයද, නිර්වාණගාමිනී ප්‍රතිපදාවද කියනු මැනව, දෙශනාකරණු මැනව, පනවනු මැනව, තබනු මැනව, විවෘත කරණු මැනව, දෙසනු මැනව, පනවනු මැනව, තබනු මැනව, විවෘත කරණු මැනව, බෙදනු මැනව, ප්‍රකාශකරණු මැනව යනුයි, 'යමක් මම දැනගනිම්ද' යනු යමක් මම දැනගන්නෙම් නම් අවබොධ කරන්නෙම් නම් බලන්නෙම් නම් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් යනුයි.

2. "මේ ලොකයෙහිම ජාති ජරාව දුරුකරන්නාවූ" යනු මෙහිම ජාති ජරා මරණයාගේ ප්‍රහාණය, ව්‍යපසමනය, සන්සිඳීම, අමෘතවූ නිර්වාණය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණ තෙම ප්‍රකාශ කළහ.

## 16-2

1. "වෙහෙසෙන්නාවූ රූපයන් දැක" යන්නෙහි රූපය නම් සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපදින උපාදාය රූපයෝද යනුයි. රූප ප්‍රවෘත්තියෙන්, රූප හේතුවෙන්, රූප කාරණයෙන්, වෙහෙසෙත්, ගැටෙත්, රූපය ඇති කල්හි නොයෙක් කම්කටොළු කරවනු ලබත්. කසවලින්ද තලවත් (මහා

නිද්දේශයේ (7-7) 2 'කසවලින්' යන තැන සිට යොදාගත යුතුයි.) මෙසේ සත්වයෝ රූප හේතුවෙන්, රූප ප්‍රත්‍යයෙන්, රූපකාරණයෙන්, වෙහෙසෙත්, ගැටෙත් මෙසේ වෙහෙසෙනු ලබන කල්හි, ගැටෙනු ලබන කල්හි දැක බලා, සමකොට, තීරණයකොට යනුයි.

**2.** "වෙනස්වෙත්" යනු පෙළෙනුලබත් ගැටෙනුලබත්, ව්‍යාධි ඇත්තාහු දෙම්නස් ඇත්තාහු වෙත්. ඇසේ රෝගයෙන් (ii) වෙනස්වෙත්, ගැටෙනුලබත්, ව්‍යාධි ඇත්තාහු දොම්නස් වූවාහු (සෑම රෝගයක් අවසානයෙහිම (මෙහි (ii) යොදාගත යුතුයි.) කන් රෝගයෙන් (මහා නිද්දේසයේ (1-4) 4 (ii) 'රෝගය' යනු 'රෝගයෙන්' කියා වෙනස්කොට යොදාගත යුතුයි.) ඇටමැස්සෝය, මදුරුවෝය, වාතය අව්වය, දීර්ඝ ජාතීහුද යන මොවුන්ගේ ස්පර්ශයෙන් වෙනස් වෙත්, කිපෙත්, පෙළෙත්, ගැටෙත්, ව්‍යාධි ඇත්තාහු රූපයන්හි දොම්නස් වූවාහුවෙත් නැවතද ඇස වෙන්වන කල්හි අතුරුදහන්වන කල්හි වෙනස්වෙත් (මෙහි (ii) යෙදිය යුතුයි.) දොම්නස්වූවාහුවෙත්, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, රූපයෙහි ශබ්දයෙහි, ගන්ධයෙහි, රසයෙහි, ස්පර්ශයෙහි, කුලයා කෙරෙහි, ගණයා කෙරෙහි. ආවාසයෙහි, ලාභයෙහි ප්‍රශංසාවෙහි, සුඛයෙහි, සිවුරෙහි, පිණ්ඩපාතයෙහි සේනාසනයෙහි, ගිලන්පස බෙහෙත් පිරිකරෙහි පිරිහෙනකල්හි, නැතිවන කල්හි, වෙන්වන කල්හි, විනාශ වන කල්හි, කිපෙත් පෙළෙත්, ගැටෙත්, ව්‍යාධි ඇත්තාහු දොම්නස්වූවාහු වෙත්. මෙසේද රූපයන්හි විනාශයවෙත්. ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද ගෘහස්ථයෝද ප්‍රව්‍රජිතයෝද, දෙවියෝද මිනිස්සුද දැනගනියි. ප්‍රමාදවූවාහු යනු ප්‍රමාදය කිය යුතුයි. (මහානිද්දේසයේ (15-8) 2 යෙදිය යුතුයි. 1846 පිට) මේ ප්‍රමාදයෙන් යුක්තවූවෝ ප්‍රමාදවූවාහුවෙත් යනුයි. එහෙයින් යනු එහෙයින්, ඒ කාරණයෙන්, ඒ හෙතුවෙන්, ඒ ප්‍රත්‍යයෙන්, ඒ නිදානයෙන් මෙසේ ආදීනවය, බලනු ලබන්නේ යනුයි. සභිය, එහෙයින් ඔබ ප්‍රමාද නොවූයේ යනු සකස්ව කරන්නේ නිතර ක්‍රියාවෙහි

යෙදෙන්නේ, නිමවන ලද ක්‍රියා ඇත්තේ කම්මැලිනොවූ ක්‍රියා ඇත්තේ කුශල ධර්මයන්හි අප්‍රමාදවූයේ යනුයි.

3. "නැවත නූපදනා පිණිස රූපය දුරුකරව" යන්නෙහි රූපය නම් සතර මහා භූතයෝද සතර මහා භූතයන්ගේ උපදාය රූපයෝද යනුයි. රූපය දුරුකරව යනු රූපයදුරුකරව, රූපය බැහැරකරව, රූපය සංසිඳුව, රූපය සම්පූර්ණ අභාවයට පමුණුවව, නැවත නූපදීම පිණිස යනු තාගේ රූපය යම්සේ මෙහිම නිරුද්ධ වන්නේනම් නැවත ප්‍රතිසන්ධික භවයක් නූපදනේය. කාමධාතුවෙහි හෝ රූප ධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි හෝ කාම භවයෙහි හෝ රූපභවයෙහි හෝ අරූපභවයෙහි හෝ සඤ්ඤාභවයෙහි හෝ අසඤ්ඤා භවයෙහි හෝ නෙවසඤ්ඤානාසඤ්ඤා භවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාර භවයෙහි හෝ පඤ්ච වොකාර භවයෙහි හෝ නැවත ගතිය හෝ උත්පත්තිය හෝ ප්‍රතිසන්ධිය හෝ භවයෙහි හෝ සසර හෝ වට්ටයෙහි හෝ ඇති නොවන්නේය නූපදනේය. මෙහිම නිරුද්ධ වන්නේය. සංසිඳෙන්නේය. අස්තයට යන්නේය. යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

4. "සතර දිශාවෙහිද සතර විදිසාවෙහිද උඩද යටද යන දශදිශාවෙහි ඔබවහන්සේ නොදැකී නොඇසූ ස්පර්ශ නොකළ නොදත් කිසිවක් නැත. ආත්මාර්ථයක් හෝ පරාර්ථයක් හෝ නැත. විද්‍යමාන නොවෙත්. මම යම්සේ දැනගන්නෙම් නම් ඒ ධර්මය දෙශනා කරණු මැනවි" යන්නෙහි ධර්මය නම් මුල පිරිසිදු මැද පිරිසිදු අවසානය පිරිසිදු අර්ථසහිත, පද සහිත සියල්ල පරිපූර්ණවූ නිර්වාණයද නිර්වාණ ගාමනී ප්‍රතිපදාවද කියනු මැනව. දෙශනා කරණු මැනව, පණවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, ප්‍රකාශ කරණු මැනවි, යනුයි. "යම්හෙයකින් මම දැනගන්නෙම් නම්" යනු යමක් මම දැනගන්නෙම් නම්, පැමිණෙන්නෙම් නම්, අවබොධ කරන්නෙම් නම්, දකින්නෙම් නම්, ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් එය දෙශනා කරණු මැනව යනුයි.

5. "මෙහිම ජාති ජරාවන් දුරුකිරීමට හේතුවූ" යනු මෙහිම ජාති ජරා මරණ ප්‍රහාණය, සංසිඳීම්, බහාතැබීම, අමෘතවූ නිර්වාණය යනුයි. එහෙයින් ඒ බ්‍රාහ්මණතෙම කීය.

16-3

1. "භාග්‍යවතුන් වහන්සේ පිංගිය, තෘෂ්ණාවට විශෙෂයෙන් පැමිණියාවූ" යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම තෘෂ්ණා යනුයි විශෙෂයෙන් පැමිණි යනු තෘෂ්ණාව අනුව ගියාවූ, පැමිණියාවූ හිඳිනාවූ, මැඩපැවතියාවූ, යටකොටගත් සිත් ඇත්තාවූ යනුයි.

2. "මිනිසා" යනු සත්වයාට අනික් නමකි. "දකිනු ලබන්නේ" යනු බලනුලබන්නේ පරීක්ෂාකරණු ලබන්නේ යනුයි.

3. "ප්‍රජාව යුක්තවන්නීය" යනු ඔව්හු ජරාවෙන් යුක්තවූවාහුවෙත්, ව්‍යාධියෙන් යුක්තවූවාහුවෙත්, මරණයෙන් යුක්තවූවාහුවෙත්, ශොක වැළපීම් දුක් දොම්නස් හා දැඩි ආයාසයෙන් යුක්තවූවාහුවෙත්. නිරයදුකින් යුක්තවූවාහු වෙත්, ඒ ඥාති ප්‍රජාව, ඒ උපද්‍රත ප්‍රජාව, ඒ පීඩාවටපත් ප්‍රජාව යනුයි. ජරාවෙන් පීඩිතවූ ඔව්හු යනු ජරාවෙන් ගැවසීගත්, යුක්තවූ, ව්‍යාධියෙන් මඩනාලද පිහිටක් නැති අසරණවූ යනුයි.

4. "එහෙයින්" යනු ඒ කාරණයෙන්, ඒ හෙතුවෙන්, ඒ ප්‍රත්‍යයෙන්, ඒ නිදානයෙන් මෙසේ ආදීනවයන් දකිනු ලබන්නේ එහෙයින් යනුයි.

5. "අප්‍රමාදවූයේ" යනු නිතර ක්‍රියා කරන්නේ (4-8) 1 'අප්‍රමාදවූයේ' යන තැන සිට යෙදිය යුතුයි.) කුශල ධර්මයන්හි අප්‍රමාදවූයේ යනුයි "පිංගිය එහෙයින් ඔබ අප්‍රමාද වූයේ නැවත නූපදීම පිණිස තෘෂ්ණාව දුරුකරව" යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම තෘෂ්ණ යනුයි තෘෂ්ණාව දුරුකරවයනු තෘෂ්ණාව අත්හරුව, තෘෂ්ණාව සන්සිඳව, තෘෂ්ණාව සම්පූර්ණයෙන් අභාවයට පමුණුව යනුයි.

6. "නැවත නූපදීම පිණිස" යනු යම්සේ ඔබ නැවත ප්‍රතිසන්ධි ගන්නා භවයක් ඇති නොකරන්නේද, කාම ධාතුවෙහි හෝ

රූපධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි හෝ කාම භවයෙහි හෝ රූපභවයෙහි හෝ සඤ්ඤා භවයෙහි හෝ අසඤ්ඤා භවයෙහි හෝ නෙවසඤ්ඤානාසඤ්ඤා භවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාර භවයෙහි හෝ නැවත ගතියෙහි හෝ උත්පත්තියෙහි හෝ ප්‍රතිසන්ධියෙහි හෝ භවයෙහි හෝ සංසාරයෙහි හෝ ඇති නොවන්නේය. නූපදවන්නේය. මෙහිම නිරුද්ධවන්නේය, සංසිඳවන්නේය අස්තයට යන්නේය, යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

7. "ගාථාවගේ කෙළවර සමගම ඒ බ්‍රාහ්මණයා සමග එකම අදහස් ඇත්තාහු එකම ප්‍රයෝග ඇත්තාහු එකම ඇඳුම් ඇත්තාහු ඒ ප්‍රාණීන් දහසට කෙලෙස් රජස්නැති, කෙලෙස් මලනැති, යම්කිසි හේතු ප්‍රත්‍යයකින් ඇතිවන ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවතියි යන දහම් ඇස පහළවිය. ඒ බ්‍රාහ්මණයාටද කෙලෙස් රජස් නැති, කෙලෙස් මලනැති, හේතු ප්‍රත්‍යයකින් ඇතිවන ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවතියි යන දහම් ඇස පහළවිය. (1-8) 6 අගකොටස යෙදිය යුතුයි.)

## පාරායන මානවක සූත්‍ර නිර්දේශය

### 17-1

1. "භාග්‍යවතුන් වහන්සේ මගධ රට පාෂානක චෛත්‍යයෙහි වැඩවසන සේක් පරිචාරිකවූ බ්‍රාහ්මණයින් දහසය දෙනෙකු විසින් ආරාධනා කරණ ලද්දේ ඇසූ ඇසූ ප්‍රශ්නයන් විසඳා වදාළ සේක. මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මේ "පාරායන"යි වදාළසේක. 'භගවත් යනු ගෞරව වචනයයි. (මහානිද්දෙසයේ (7-8) 1 යොදාගත යුතුයි.) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි.

2. "මෙය භාග්‍යවතුන් වහන්සේ මගධ රට වාසය කරණ සේක් පාෂානක චෛත්‍යයෙහිදී වදාළසේක." යනු 'මගධ' නම් ජනපදයෙහි වාසය කරණ සේක් යනුයි. 'වාසයකරන සේක්' යනු හැසිරෙන්නේ ඉරියව් පවත්වන්නේ පවතින්නේ පාලනය

කරන්නේ යනුයි. ‘පාෂානක චෛතිය’ යනු යම්කිසි බුද්ධාසනයකට කියයි. පිරිවරවූ බමුණන් දහසය දෙනා යනු පිංගිය බ්‍රාහ්මණයා බාවාරිය බ්‍රාහ්ණයාගේ ශිෂ්‍යයෙකි. ළඟ හැසිරෙන්නෙකි. පරිචාරිකයෙක් වූයේය.

**2.** “එබැවින් ඒ දහසය දෙනා යනු මෙසේද පිරිවරවූ බමුණන් දහසය දෙනාට යනුයි. නැවතද බමුණෝ දහසය දෙනා භාග්‍යවත් බුදුරදුන්ගේ ශිෂ්‍යයෝ වන්නාහ. පරිචාරිකයෝ වන්නාහ. මෙසේද පරිචාරිකා සොළොස් බමුණන් විසින් ආරාධනා කරණ ලද්දේ විචාරණ විචාරණ ලද ප්‍රශ්නයන් විසඳා වදාළ සේක. එහෙයින් මෙය කියයි. එනම්, භාග්‍යවතුන් වහන්සේ මගධ රට වාසය කරණ සේක් පාෂානක චෛත්‍යයෙහිදී පරිචාරික සොළොස් බමුණන් විසින් විචාරණ විචාරණ ලද ප්‍රශ්නයන් විසඳා වදාළ සේක යනුයි.

**4.** “එක එකම ප්‍රශ්නයාගේ අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මය, පිළිපදනේය.” යන්නෙහි මේ ධර්මයෝ ජරා මරණයේ පරතෙරට යනු සුළුය. මේ ධර්ම ක්‍රමයට පාරායන යයි අනික් නමකි. “එක එක ප්‍රශ්නයකගේ” යනු එක එක අජිත ප්‍රශ්නයකගේ එක එක තිස්ස මෙත්තෙය්‍ය ප්‍රශ්නයකගේ එක එක පුණ්ණක ප්‍රශ්නයකගේ එක එක මෙත්තෙගු ප්‍රශ්නයකගේ එක එක ධොතක ප්‍රශ්නයකගේ එක එක උපසීව ප්‍රශ්නයකගේ එක එක නන්දක ප්‍රශ්නයකගේ එක එක හෙමක ප්‍රශ්නයකගේ එක එක තොදෙය්‍ය ප්‍රශ්නයකගේ එක එක කප්ප ප්‍රශ්නයකගේ එක එක ජතුකණ්ණ ප්‍රශ්නයකගේ එක එක භද්‍රාවුධ ප්‍රශ්නයකගේ එක එක උදය ප්‍රශ්නයකගේ එක එක පොසාල ප්‍රශ්නයකගේ එක එක මොඝ රාජ ප්‍රශ්නයකගේ එක එක පිංගිය ප්‍රශ්නයකගේ අර්ථය දැන ධර්මය දැන ඒ ප්‍රශ්නය ධර්මය විසඳීම යනුයි. ‘අර්ථය දැන’ යනු අර්ථය දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි. ‘ධර්මය දැන’ යනු දැන තීරණයකොට ප්‍රකටකොට යනුයි. ‘ධර්මානුධර්මයෙහි පිළිපදනේ’ යනු සම්‍යක් ප්‍රතිපදාව’ අනුලොම ප්‍රතිපදාව, යහපත් ප්‍රතිපදාව යනුයි. පිළිපදනේ යනු ධර්මානුධර්මයෙහි පිළිපදනේය යනුයි.

**5.** "ජරාමරණයාගේ පරතෙර" යනු අමෘතවූ නිර්වාණ යයි. යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමක් ඇද්ද, සියලු උපධීන්ගේ බහා තැබීමක් ඇද්ද, තෘෂ්ණාක්ෂය නම්වූ නිරොධනම්වූ විරාගනම්වූ නිර්වාණයයි ජරාමරණයාගේ පරතෙරට යන්නේය" යනු ජරාමරණයාගේ පරතෙරට පැමිණෙන්නේය, පරතෙර දකින්නේය, පරතෙර ප්‍රත්‍යක්ෂ කරන්නේය, යනුයි.

**6.** "මේ ධර්මයෝ පරතෙර පමුණුවන ධර්මයෝ වෙත්" යනු මේ ධර්මයෝ පරතෙරට පමුණුවත් පරතෙරට විශෙෂයෙන් පමුණුවත්, ජරාමරණයන් තරණය කිරීම පිණිස පමුණුවත්නුයි මේ ධර්මයෝ පරතෙරට පමුණුවත් යනුයි. එහෙයින් ධර්ම ක්‍රමයට යන්නෙහි එහෙයින් යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ හෙතුවෙන් ඒ ප්‍රත්‍යයෙන්, ඒ නිදානයෙන්, මේ ධර්මක්‍රමයට යනු මේ පාරායනයට යනුයි 'පාර' යනු අමෘතවූ නිර්වාණයට කියයි. මේ මාර්ගයයයි කියයි. "නමකි" යනු ප්‍රඥප්තිය යනුයි, ව්‍යවහාරය යනුයි නාමයයි නිරුක්තියයි කථාව්‍යවහාරයයි මේ එක එක ප්‍රශ්නයකගේද අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයෙහි පිළිපදනේ නම් ජරාමරණයාගේ පරතෙරට පමුණුවත් එහෙයින් පාරායන යයි කියයි.

## 17-2

**1.** "මොවුහු බුදුන් වෙත පැමිණියහ" යන්නෙහි 'මොවුහු' යනු මේ සොළොස් පාරායණික බ්‍රාහ්මණයෝ යනුයි. 'බුදුන්' යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. තමන්ම චතුරාර්ය සත්‍යය අවබොධ කළ සේක' ආචාර්යවරයෙක් නැත්තේය. පෙර අවබොධ නොකළ ධර්මයන් තෙමේ සත්‍යය අවබොධ කළ සේක. එහිද සර්වඥ බවට පැමිණිසේක, ඵලයන්හිද වසඟ බවට පැමිණි සේක, බුද්ධ යනු කවර අර්ථයකින් බුද්ධ නම් වේද? සත්‍යයන් අවබොධ කෙළේනුයි. බුද්ධ නම්, ප්‍රජාව කෙරෙහි අවබොධ කරවන ලද්දේනුයි බුද්ධ නම්. සියල්ල දත් බැවින් බුද්ධ නම්. සියල්ල දක්නා බැවින් බුද්ධ නම් කෙලෙස් නැති කළ බැවින් බුද්ධනම්. කිළුටු හෙවත් බාධා දුරුකළ බැවින්

බුද්ධ නම් ඒකාන්ත වීතරාග බැවින් බුද්ධ නමි. ඒකාන්ත වීතදොෂ බැවින් බුද්ධ නමි. ඒකාන්ත වීතමොහ බැවින් බුද්ධ නමි. ඒකාන්ත නික්කිලෙස (කෙලෙස් නැති බැවින්) බුද්ධ නමි. ඒකායන මාර්ගයට ගියේනුයි බුද්ධ නමි. තනිව නිරුත්තරවූ සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි බුද්ධ නමි. බුද්ධි ප්‍රතිලාභයෙන් අබුද්ධිය බෙදන ලදනුයි බුද්ධ නමි. බුද්ධ යන මේ නාමය මව විසින් නොකරණ ලදී. පියා විසින් නොකරණ ලදී. සහෝදරයා විසින් සහෝදරිය විසින්, මිත්‍රාමාත්‍යයන් විසින්, නෑ සහලේ නෑයන් විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් නොකරණ ලදී. දෙවතාවන් විසින් නොකරණ ලදී. විමොක්ෂය කෙළවරකොට ඇති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට සර්වඥතා ඥානය ලැබීම සමගම ඇතිවන ප්‍රත්‍යක්ෂ වශයෙන් ඇති කළ පැනවීමකි. මේ බුද්ධ යනුයි. "මොව්හු බුදුන් වෙත පැමිණියහ, පයිරුපාසනය කළහ, පිරිවැරූහ, චරණ ධර්මයෙන් යුක්ත ඍෂීන්" යන්නෙහි චරණ නම් ශීලය හා ආචාරය ඇතිවීමයි ශීලසංවරයද චරණයයි, ඉන්ද්‍රිය සංවරයද චරණයයි, භොජනයෙහි පමණ දැනීමද චරණයයි. නිදි වර්ජිත කිරීමෙහි යෙදීමද චරණයයි. ධර්ම සතක් චරණයෝයයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරණ ලදහ. චරණයෙන් යුක්ත යනු ශ්‍රෙෂ්ඨ චරණයයි. ඉතා උතුම් චරණයයි ප්‍රමුඛ චරණයයි. ඉතා උතුම් චරණයයි යනුයි. 'ඍෂි' යනු භාග්‍යවතුන් වහන්සේ ඍෂි සේක. මහත්වූ ශීල සමූහයක් සෙවීනුයි ඍෂි සේක. (4-6) 1 යොදාගත යුතුයි.)

2. "විචාරන්නාහු" යනු ප්‍රශ්න කරන්නාහු ඉල්ලන්නාහු යනුයි. 'නිපුනවූ ප්‍රශ්නයක්' යනු ගැඹුරුවූ දැකීමට දුෂ්කරවූ, දුකසේ අවබොධ කටයුතුවූ ශාන්තවූ, ප්‍රණීතවූ අතක්කාවචරවූ නිපුනවූ, පණ්ඩිත වෙදනීයවූ යනුයි. 'බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙතට' යන්නෙහි 'බුද්ධ' නම් යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. (17-3) 1 (i) බුදුන් යන තැන සිට යොදාගත යුතුයි.)

3. "ශ්‍රෙෂ්ඨ' යනු අග්‍ර, ශ්‍රෙෂ්ඨ ප්‍රමුඛ උතුම්, ඉතා උතුම් බුදුරදුන් වෙත පැමිණියහ. පයිරුපාසනය කළහ. විචාළහ, ප්‍රශ්න කළහ යනුයි.

17-3

1. "ඔවුන්ට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළසේක' යන්නෙහි "ඔවුන්ට" යනු සොළොස් පාරායනීය බ්‍රාහ්මණයන්ට යනුයි. 'බුද්ධ' යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. (17-2) 1 බුදුන් යන තැන සිට යෙදිය යුතුයි.) ඔවුන්ට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළසේක. කීසේක, දෙශනා කළසේක, පැනවූසේක, තැබූසේක, විවෘත කළසේක, බෙදූසේක, යනුයි. ප්‍රශ්න විචාරණ ලද්දේ යනු ඉල්ලන ලද්දේ ආරාධනා කරණ ලද්දේ යනුයි.

2. "කීම පරිදි" යනු යම්සේ කිය යුතුද, එසේ කීසේක. යම්සේ දෙසිය යුතුද එසේ දෙසූ සේක, යම්සේ පැනවිය යුතු නම් එසේ පැනවූසේක, යම්සේ තැබිය යුතු නම් එසේ තැබූ සේක, යම්සේ බෙදිය යුතු නම් එසේ බෙදූසේක. යම්සේ ප්‍රකට කළ යුතු නම් එසේ ප්‍රකට කළ සේක. යම්සේ ප්‍රකාශ කළ යුතු නම් එසේ ප්‍රකාශ කළ සේක. 'ප්‍රශ්නයන්ගේ විස්තර ප්‍රකාශ කිරීමෙන්' යනු ප්‍රශ්නයන්ගේ ව්‍යාකරණයෙන් යනු කීමෙන්, දෙශනා කිරීමෙන්, දැක්වීමෙන්, විවෘත කිරීමෙන්, බෙදීමෙන් ප්‍රකාශනයෙන් යනුයි.

3. "සතුටු කළසේක" යනු පැහැදවූසේක යනුයි. 'බ්‍රාහ්මණයින්' යනු සොළොස් පාරායනීය බ්‍රාහ්මණයින් යනුයි.

4. "මොන" යයි ඥානයට කියයි. (මහා නිද්දේසයේ (3-1) 3 යෙදිය යුතුයි. 1572 පිට)

5. "පංච චක්ෂූන් වහන්සේ විසින් ඔවුහු සතුටු කරවන ලදහ" යන්නෙහි ඔවුහු යනු සොළොස් පාරායන බ්‍රාහ්මණයෝ සතුටු කරවන ලදහ, ප්‍රශංසා කරවන ලදහ, ආරාධනය කරවන ලදහ. සතුටු කරවන ලදහ, යනුයි.

6. "භාග්‍යවතුන් වහන්සේ ඇස් පසක් ඇති බැවින් ඇස් ඇත්තේනම් (මහානිද්දෙසයේ (14-7) 1 'පසැස්වලින්' යන තැන සිට යෙදිය යුතුයි.) මෙසේ භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥානය ඇති බැවින්ද ඇස් ඇත්තේ නම් 'බුද්ධ' යනු

යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. (17-2) 1 'බුදුන්' යන තැන සිට යෙදිය යුතුයි.) ආදිච්ච බන්ධු යන්නෙහි ආදිච්ච යනු සූර්යයාට කියයි. සූර්යයාද ගෝත්‍රයෙන් ගෞතමය, භාග්‍යවතුන් වහන්සේද ගොත්‍රයෙන් ගෞතමය, භාග්‍යවතුන් වහන්සේ සූර්යයාගේ ගොත්‍ර බන්ධුවරයෙකි. ගොත්‍ර ඥාතිවරයෙකි. එහෙයින් බුදුරජතෙම ආදිච්ච බන්ධු නම් වේ. 'බ්‍රහ්මචරියාවෙහි හැසුරුනහ' යන්නෙහි බ්‍රහ්මචරියාව නම් අසද්ධර්මචරියාවෙන් හෝ වෙන්වීමයි එය නොකිරීමයි යනුයි. නැවතද සමානාර්ථයෙන් බ්‍රහ්මචරියාව යයි ආර්ය අෂ්ටාංගික මාර්ගයට කියයි.

7. ඒ කෙසේද සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. 'බ්‍රහ්මචරියාවෙහි හැසුරුණහ' යනු බ්‍රහ්මචරියාවෙහි හැසුරුනහ, සමාදන්ව සිටියහ යනුයි.

8. "උතුම් ප්‍රඥා ඇත්තවුන් වහන්සේ සමීපයෙහි" යනු අග්‍ර ප්‍රඥා ඇති ශ්‍රෙෂ්ඨප්‍රඥා ඇති, ප්‍රමුඛ ප්‍රඥා ඇත්තවුන් සමීපයෙහි යනුයි. "සමීපයෙහි" යනු ආසන්නයෙහි, නුදුරෙහි, යනුයි. මෙය ඒ සඳහා කියන ලදී.

## 17-4

1. "එක එකම ප්‍රශ්නයකගේද" යනු එක එකද අජිත ප්‍රශ්නයකගේ තිස්ස මෙත්තෙය්‍ය, පුණ්ණ මානවක, මෙත්තගු ධොතක, උපසීව, නන්ද, හෙමක, තොදෙය්‍ය, කප්ප මානවක, ජතුකණ්ණි, භද්‍රාවුධ, උදය, පොසාල, මොඝරාජ යන මොවුන්ගේ එක එක ද ප්‍රශ්නයකගේ යම්සේ බුදුන් විසින් දෙශනා කරණලද' යන්නෙහි,

2. "බුද්ධ" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. "යම්සේ බුදුන් විසින් දෙශනා කරණ ලද," යනු යම්සේ බුදුන් විසින් දෙශනා කරණලද පනවන ලද තබන ලද, විවෘත කරණ ලද, බෙදන ලද ප්‍රකට කරණ ලද, ප්‍රකාශ කරණ ලද යනුයි.

3. "එසේ යමෙක් පිළිපදනේ නම්," යනු සම්‍යක් ප්‍රතිපදාව, අනුලොම ප්‍රතිපදාව, නොවෙනස් ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව,

ධර්මානුධර්ම ප්‍රතිපදාව, පිළිපදනේය, "යමෙක් එසේ පිළිපදනේ නම් මෙතෙරින් එතරට යන්නේය." යන්නෙහි පාර (එතර) යයි අමෘතවූ නිර්වාණයට කියයි. මෙතර යයි ක්ලේශයෝද, ස්කන්ධයෝද, අභිසංස්කාරයෝද කියයි.

4. "පරතෙරට යන්නේය" යනු පරතෙරට පැමිණෙන්නේය, පරතෙර දක්නේය, පරතෙර ප්‍රත්‍යක්ෂ කරන්නේය, පරතෙරට පමුණු වන්නේය, පරතෙර ප්‍රත්‍යක්ෂ කරන්නේය මෙතරින් එතරට යන්නේය යනුයි. එහෙයින් මෙය කියයි.

17-5

1. "මෙතරින් එතරට යන්නේය" යනු ක්ලේශයෝද ස්කන්ධයෝද, අභිසංස්කාරයෝද මෙතර නමි. එතෙරයයි අමෘතවූ නිර්වාණයට කියයි. තෘෂ්ණා ක්ෂය නම්වූ විරාග නම්වූ නිරොධ නම් වූ නිර්වාණයයි.

2. "උතුම් මාර්ගය" යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයට කියයි. (මෙහි 17-3) 7 ඡෙදය යෙදිය යුතුයි.) "උතුම්" යනු, අග්‍රවූ, ශ්‍රෙෂ්ඨවූ ප්‍රමුඛවූ යනුයි. වඩන්නේ යනු වඩන්නේ ආසෙවනය කරන්නේ, යනුයි. 'එය පරතෙරට යන මාර්ගය" යන්නෙහි 'මාර්ගය' යනු මාර්ගය, පන්ථය, පථය, අද්ධය අඤ්ජසය, වටුමය, අයනය, නැව, එතරවන ඒදණ්ඩ පසුර යනුයි පරතෙරට පැමිණීම පිණිස, පරතෙරට සම්ප්‍රාප්තය පිණිස, ජරා මරණයාගේ තරණය පිණිස, මාර්ගයයි යනුයි.

3. "එහෙයින් පාරායනයයි" යන්නෙහි 'එහෙයින්' යනු ඒ ප්‍රත්‍යයෙන් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ නිදානයෙන් යනුයි. පරතෙර යනු අමෘතවූ නිර්වාණයට කියයි 'අයන' යනු මාර්ගයට කියයි. 'ඉති' (මෙය) යනු ස්වරයන්ගේ ගැලපීමයි. පදයන්ගේ පිළිවෙල දැක්වීමයි යනුයි.

4. "පාරායනය අනුව ගායනා කළෙමි." යනු ගායනයට අනුව ගායනා කළෙමි. කීමට අනුව කීවෙමි යනුයි. "මෙසේ ආයුෂ්මත් පිංගිය" යන්නෙහි (ඉති ආයස්මා) යනු පද ගැලපීමයි. පදයන්ගේ පිළිවෙල දැක්වීමයි මේ ඉති යනුයි. "ආයුෂ්මත්"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යනු ප්‍රිය වචනයයි, ගරු වචනයයි ගරු කටයුතු සැලකියයුතු වචනයයි, මේ ආයුෂ්මත් යනුයි. ‘ආයුෂ්මත් පිංගිය’ යනු ඒ තෙරුන් වහන්සේගේ නාමයයි. පැනවීමයි, ව්‍යවහාරයයි, යනුයි. ‘ආයුෂ්මත් පිංගිය තෙම මෙසේ කීයේය.’ යනුයි. යම්සේ දැක්කේද එසේ කීයේය” යනු (ii) දෙශනා කළේය, පැනවූයේය, තැබීය, විවෘත කළේය, බෙදීය, ප්‍රකට කළේය, ප්‍රකාශ කළේය. සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (iii) යම්සේ දැක්කේද එසේ කීයේය. සියලු සංස්කාරයෝ දුක්යයි (මෙහි (ii) යෙදිය යුතුයි.) සියලු ධර්මයෝ අනාත්මයයි (මෙහි (ii) යෙදිය යුතුයි. යම්කිසි ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි යම්සේ දැක්කේද එසේ කීයේය. (මෙහි (ii) යෙදිය යුතුයි.)

**5.** “නිර්මලවූ බොහෝ නුවණැති” යන්නෙහි ‘නිර්මලවූ’ යනු රාගයමලය, ද්වෙෂය මලය මොහ මලය, ක්‍රොධය බද්ධ වෛරය (3-4) 3 ‘මානය’ යන තැන සිට යොදාගත යුතුයි.) සියලු අකුශල සංස්කාර මලයෝ භාග්‍යවත් බුදුරදුන්ගේ ප්‍රහීනය. මුලින් උපුටන ලද්දේය. අගසිඳි තල්ගසක් මෙන් කරණ ලදී. සම්පූර්ණ අභාවයට පමුණුවන ලදී. බුදුරදතෙම විමලය, නිර්මලය, මලයන්ගෙන් පහවූයේය. සියලු මලයන්ගෙන් වෙන්වූයේය.

**6.** “භූරි” යයි පෘථිවියට කියයි. ඒ පෘථිවියට සමාන ප්‍රඥාවෙන් නිර්මල වූයේ පළල් වූයේ යුක්තවූයේ යනුයි. “මෙධා” යනු ප්‍රඥාවට කියයි. යම් ප්‍රඥාවක් ඇද්ද (මහානිද්දෙසයේ (3-1) 3 යෙදිය යුතුයි.) අමොහයක් ධම්මවිචයක් සම්මාදිට්ඨියක් ඇද්ද එයයි. භාග්‍යවතුන් වහන්සේ මේ මෙධා නම් ප්‍රඥාවෙන් යුක්ත සේක.

**7.** “කාමයෙන් වෙන්වූයේ නිවනට පැමිණියේ” යන්නෙහි කාමයෝ නම් ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. වස්තුකාමද ක්ලේශකාමද යනුයි. (මහානිද්දේසයේ (1) 1 (ii) 2-3 ඡෙද යෙදිය යුතුයි) මොව්හු වස්තු කාමයෝයයි කියත්, මොව්හු ක්ලේශ කාමයෝයයි කියත්, භාග්‍යවත් බුදුන් වහන්සේ විසින් වස්තු

කාමයෝ සම්පූර්ණයෙන් දැනගන්න ලදහ. ක්ලේශ කාමයෝ ප්‍රහීන කරණලදහ. වස්තුකාමයෝ දැනගන්නාලද බැවින් භාග්‍යවතුන් වහන්සේ කාමයන් ප්‍රාර්ථනා නොකරයි. කාමයන් බලාපොරොත්තු නොවෙයි. එහෙයින් බුදුරදතෙම කාමරහිතසේක. කාමයන්ගෙන් නික්මුනුසේක. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කාමයන් ප්‍රාර්ථනා නොකරයි. ආශා නොකරයි. මිදූකාම ඇතිසේක. ප්‍රහීන කාම ඇතිසේක. සංසිදූකාම ඇතිසේක. පහවූරාග ඇතිසේක. ඉවත් කළ රාග ඇතිසේක. වමාරාදැමූ රාග ඇතිසේක. තෘෂ්ණා රහිත වූයේ නිවුනේ සිහිල්වූයේ සැපත විඳින්නේ බ්‍රහ්මයා බඳු ආත්මභාවයෙන් වාසය කරයි.

**8.** "කාම රහිතවූයේ වන රහිතවූයේ" යන්නෙහි රාගය වනයකි. ද්වෙෂය, මොහය, ක්‍රොධය බද්ධවෛරය, වනයෝ වෙති. සියලු අකුශල රැස්කිරීම වනයෝවෙති. භාග්‍යවත් බුදුන්වහන්සේගේ ඒ වනයෝ ප්‍රහීනයහ. මුලින් සිඳුනේය. අගසිඳි තල්ගසක්මෙන් කරණලදී. සම්පූර්ණ අභාවයට පමුණුවනලදී. නැවත නූපදනා බවට පමුණුවනලදී. එහෙයින් බුදුරදතෙම අවන නම් වනසේක. වනයෙන් ඉවත්වූ සේක. වනයෙන් මිදුනසේක.

**9.** "නාග" යනු භාග්‍යවතුන් වහන්සේයි. වරද නොකරණ බැවින් නාගසේක. (4-10) 1 නාගයන තැන සිට යෙදිය යුතුයි.)

**10.** "ඒනාගයන් වහන්සේ කවර හේතුවකින් බොරු කියන්නේද?" යන්නෙහි 'කවර හේතුවකින්' යනු කවර කාරණයකින්, කවර නිදානයකින්, කවර ප්‍රත්‍යයකින් යනුයි. 'බොරුකියන්නේද,' යනු මුසාකියන්නේද, ප්‍රකාශ කරන්නේද, ව්‍යවහාර කරන්නේද, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සභාවට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයින් මැදට ගියේ හෝ ගම්මැදට ගියේ හෝ රාජකුල මධ්‍යයට ගියේ හෝ විනීත නොවූයේ ශාක්ෂි විභාග කරණ ලද්දේ 'එම්බා පුරුෂය, මෙහි එව. යමක් දන්නේ නම් කියවයි' කී කල්හි හෙතෙම දන්නාදෙය හෝ නොදන්නෙමියි නොදන්නාදෙය හෝ දන්නෙමියි.

නොදැකිදෙය මම දැක්කෙමියි හෝ දැකිදෙය මම නොදැක්කෙමියි තමා හේතුවෙන් හෝ අනුන් හෙතුවෙන් හෝ ආමිසාදී කිසියම් හේතුවකින් හෝ දැන දැන බොරු කියයිද මෙය මුසාවාදය යයි කියයි.

11. "නැවතද කරුණු තුනකින් මුසාවාදය වෙයි. මුසා කියන්නෙමියි පෙරම ඔහුට අදහසක් වෙයි. මුසාකියන කල්හි මුසා කියමියි ඔහුට අදහසක් වෙයි. මුසා කී කල්හි ඔහුට මුසා කීවෙමියි. අදහසක් වෙයි. මේ තුන් ආකාරයෙන් මුසාවාදය වෙයි. නැවතද සතරාකාරයකින් මුසාවාදය වෙයි. නැවතද කරුණු පසකින්, කරුණු සයකින් කරුණු සතකින් මුසාවාදය වෙයි. නැවතද අටාකාරයකින් මුසාවාදය වෙයි. කවර හේතුවකින් මුසාවකියන්නේද, ව්‍යවහාර කරන්නේද, යනුයි. එහෙයින් පිංගියතෙම මෙසේ කීය.

## 17-6

1. "ප්‍රහීන කෙලෙස්මල හා මොහය ඇති බුදුරජාණන් වහන්සේගේ" යන්නෙහි මලය නම් රාගමලය, ද්වෙෂමලය, මොහමලය, මානමලය දෘෂ්ටිමලය, ක්ලේශමලය, සියලු දුශ්චරිතමලය, සියලු භවගාමී කර්මමලය, යනුයි මොහය නම් යම්දුකෙහි නොදැනීමක් ඇද්ද, දුක්හෙතුවෙහි, දුක්ඛ නිරොධයෙහි දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාවෙහි, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි නොදැනීමක් ඇද්ද, අවිද්‍යාව, ලංගිය (අගුල) මොහය, අකුසල මූලය යනුයි. මේ මොහයයයි කියයි. මොහ මලයද භාග්‍යවත් බුදුරදුන්ගේ ප්‍රහීනය, මුලින් උදුරන ලද්දේය. මුලින් සිඳි තල් ගසක් මෙන් කරණ ලද්දේය. සම්පූර්ණයෙන් අභාවයට පමුණුවන ලද්දේය. නැවත නූපදනා බවට පමුණුවන ලදී. එහෙයින් බුදුරදතෙම කෙලෙස් මලයන් හා මොහය ප්‍රහීන කළසේක.

2. "මානය හා මක්ඛය ප්‍රහීන කළ" යන්නෙහි මානය යනු සිතෙහි යම් නැගීම් බවක් වේද එක් ආකාරයෙන් මානයයි. තමා උසස් කොට තැබීම හා අනුන් පහත්කොට තැබීම යන දෙයාකාරයෙන් මානයයි. ශ්‍රෙෂ්ඨවූයේ වෙමි. සමාන වූයේ වෙමි.

හීනවූයේ වෙමියි යන තුන් ආකාරයකින් මානයයි. ලාභයෙන් මානය උපදවයි. කීර්තියෙන් මානය උපදවයි. ප්‍රශංසාවෙන් මානය උපදවයි. සැපයෙන් මානය උපදවයි. යන සතරාකාරයෙන් මානය උපදවයි.

3. "රූපයන් ලැබුවේවෙමියි සිහිකරන්නේ මානය උපදවයි. ශබ්දයන් ලැබුවේවෙමියි සිහිකරන්නේ, මානය උපදවයි. ගන්ධයන්, රසයන් ස්පර්ශයන්, ලැබුවේ වෙමියි සිහිකරන්නේ මානය උපදවයි යන පස් ආකාරයෙන් මානය උපදවයි.

4. "ඇස ලැබීමෙන් මානය උපදවයි. කණ ලැබීමෙන්, නාශය ලැබීමෙන්, දිව ලැබීමෙන් ශරීරය ලැබීමෙන්, මනස ලැබීමෙන් යන සයාකාරයෙන් මානය උපදවයි. මානය, අති මානය, මානාතිමානය, බහුමානය, අතිමානය, අස්මිමානය, මිච්ඡාමානය, යන සත් ආකාරයෙන් මානය උපදවයි.

5. "ලාභයෙන් මානය උපදවයි. අලාභයෙන් අවමානය උපදවයි. කීර්තියෙන් මානය උපදවයි. අපකීර්තියෙන් අවමානය උපදවයි. ප්‍රශංසාවෙන් මානය උපදවයි. නින්දාවෙන් අවමානය උපදවයි. සැපතින් මානය උපදවයි. දුකින් අවමානය උපදවයි. යන අටආකාරයෙන් මානය උපදවයි.

6. "ශ්‍රෙෂ්ඨයාට ශ්‍රෙෂ්ඨවූයේ වෙමියි මානය, උපදියි. ශ්‍රෙෂ්ඨයාට සමානවූයේ වෙමියි මානය උපදියි. ශ්‍රෙෂ්ඨයාට හීනවූයේ වෙමියි මානය උපදියි. සමානයාට ශ්‍රෙෂ්ඨවූයේ වෙමියි මානය උපදියි. සමානයාට සමානවූයේ වෙමියි මානය උපදියි. සමානයාට හීනවූයේ වෙමියි මානය උපදයි. හීනයාට ශ්‍රෙෂ්ඨවූයේ වෙමියි මානය උපදියි. හීනයාට සමානවූයේ වෙමියි මානය උපදියි. හීනයාට හීනවූයේ වෙමියි මානය උපදියි, යන නව ආකාරයෙන් මානය උපදියි.

7. "මෙහි ඇතැම් කෙනෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රත්වයෙන් හෝ හැඩහුරුකමින් හෝ, ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යාස්ථානයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ යන දශාකාරයෙන් මානය උපදවයි.

8. "වෙනින් අනික් කරුණුවලින් හෝ යම් මෙබඳුවූ මානයක් සිතීමක් සිතීම් බවක් උසස්යයි සිතීමක් ධජයක්සේ මනාකොට ගැනීමක්, කොඩියක් සේ සිත උසස්කර ගැනීමක් ඇද්ද, මේ මානයයි.

9. "මක්ඛය" නම් යම් මකුගතියක් ඇද්ද, මකුවීම් බවක් ඇද්ද, මේ මක්ඛයයි. භාග්‍යවතුන් වහන්සේගේ මානයද මක්ඛයද ප්‍රහීනය, මුලින් සිඳුනේය, නැවත නූපදනා බවට පැමිණවූයේය, එහෙයින් බුදුරජතෙම මානයද මකු ගුණයද ප්‍රහීන කළසේක, යනුයි.

10. "එහෙයින් මම ගුණවර්ණනාවෙන් යුත් වචනය කියන්නෙමි" යන්නෙහි 'එහෙයින්' යනු පදසන්ධියයි පද ගැලපීමයි, පදපිරවීමයි අකුරු සමකිරීමයි. මේ එහෙයින් යනුයි. "ගුණවර්ණනාවෙන් යුක්තවූ" යනු වර්ණනාවෙන් සමන්නාගතවූ වචනය ප්‍රකාශ කරන්නෙමි, දෙශනා කරන්නෙමි, පනවන්නෙමි, තබන්නෙමි, විවෘත කරන්නෙමි, බෙදන්නෙමි, යනුයි. එහෙයින් පිංගිය ස්ථවිර තෙම ප්‍රකාශ කළේය.

17-7

1. "අන්ධකාරය දුරුකරන්නාවූ," යනු රාග අන්ධකාරය ද්වෙෂ අන්ධකාරය, මොහ අන්ධකාරය, මාන අන්ධකාරය දෘෂ්ටි අන්ධකාරය, ක්ලෙශ අන්ධකාරය, දුශ්චරිත අන්ධකාරය, අඥාන කරණය, ප්‍රඥානිරුද්ධිය, විනාශපක්ෂය, දුරුකළේය. සම්පූර්ණ අභාවයට පැමිණවූයේය.

2. "බුද්ධ" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි. (17-2) 1 'බුදුන්' යන තැන සිට යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි. සමන්තචක්ඛුයයි සර්වඥතාඥානයට කියයි. (මහානිද්දේසයේ (14-7) 4 'බුදු ඇසින්' යන තැන සිට යෙදිය යුතුයි.) එහෙයින් තථාගතතෙම සමන්ත චක්ඛු නම්වේ.

3. "ලොකයාගේ කෙළවරට ගියේ සියලු භවයන් ඉක්ම වූයේ" යන්නෙහි එක් ලොකය නම් එක් භවලොකයයි. ලොක දෙකකි භවලොකයද සම්භව ලොකයද යනුයි. සම්පත්ති ලොකයද විපත්ති සම්භව ලොකයද යනුයි. ලොකතුනකි.

වේදනාතුනයි. ලොක සතරකි. සතර ආහාරයයි. ලොක පසකි උපාදාන පසයි. ලොකසයකි. සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝයි. ලොකසතකි සප්ත විඤ්ඤාණස්ථිතීහුයි. ලොක අටකි. අෂ්ටලොක ධර්මයෝයි ලොක නවයකි. නවසත්තාවාසයෝයි ලොක දශයකි. දශ ආයතනයෝයි. ලොක දොළසකි. ආයතන දොළසයි. ලොක දහඅටකි අෂ්ටාරසධාතුහුවෙති.

4. "ලොකයෙහි කෙළවරට ගියේ" යනු භාග්‍යවතන් වහන්සේ ලොකයාගේ කෙළවරට ගියසේක. අන්තයට ගියසේක. නිර්වාණයට ගියසේක. උන්වහන්සේ වැස නිමවූ වස් ඇත්තේ, පුරුදු කළ ගමන් ඇත්තේ (මහානිද්දේසයේ (3-7) 6 (ii) යෙදිය යුතුයි) ජාති මරණ සංසාරයක් නැත. ඔහුට පුනර්භවයක් නැත. භවය ඉක්මවූයේය යන්නෙහි භවය නම් භවදෙකකි. කර්මභවයද ප්‍රතිසන්ධි භවයවූ පුනර්භවයද යනුයි.

5. "කර්මභවය කවරේද? පුණ්‍යාභි සංස්කාරය ආනෙඤ්ජාභි සංස්කාරය යනුයි. ප්‍රතිසන්ධිකවූ පුනර්භවය කවරේද? ප්‍රතිසන්ධිකවූ රූපයෝ වේදනාව, සංඥාව සංස්කාරයෝ විඤ්ඤාණය, මේ ප්‍රතිසන්ධිකවූ පුනර්භවයයි, 'ඉක්මවූයේ' යනු වෙන්වූයේ යනුයි.

6. "ආශ්‍රව සහිත වූයේ" යන්නෙහි ආශ්‍රව සතරකි. කාමාසවය, භවා සවය, දිට්ඨා සවය, අවිජ්ජා සවය, යනුයි. භාග්‍යවත් බුදුරදුන්ගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීනයහ. මුලින් උදුරණ ලද්දේය. අග සිඳි තල්ගසක් මෙන් කරණ ලදී නැවත නූපදනා බවට පමුණුවන ලදී. එහෙයින් බුදුරද තෙම කෙලෙස් රහිත සේක.

7. "සියලු දුක් ප්‍රහීනවූයේය" යන්නෙහි දුක් නම් ප්‍රතිසන්ධිකවූ ජාති දුක, ජරාදුක, ව්‍යාධිදුක, මරණදුක ශොකය, වැළපීම් දුකය, උපායාස දුකය, (4-2) 3 යොදාගත යුතුයි.) දෘෂ්ටි ව්‍යසන දුක ප්‍රහීනය, මුලින් සිඳුනේය, සන්සිඳුනේය, ඉපදීමට අයොග්‍යය, ඥානය නැමැති ගින්නෙන් දැවුනේය, එහෙයින් බුදුරදතෙම සියලු දුක් ප්‍රහීන කළ බැවින් අනාශ්‍රව සේක. සියලු දුක් ප්‍රහීන කළ සේක.

8. "බ්‍රාහ්මණයා ආශ්‍රය කළ පච්චය යන නමින් යුක්ත වූයේ" යනු සිරි යන නමින් යුක්තවූයේ විපස්සී භාග්‍යවතුන් වහන්සේ සිඛී භාග්‍යවතුන් වහන්සේ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ කකුසඳ භාග්‍යවතුන් වහන්සේ කොනාගම භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යන ඒ බුදුවරු සිරියන නමින් යුක්තයහ. 'සිරියයි' ආමන්ත්‍රණය ඇති සේක. ශාක්‍යමුනිවූ භාග්‍යවතුන් වහන්සේද ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ සිරි නාමය ඇති සේක. සිරි යන ආමන්ත්‍රණය ඇති සේක, යනුයි. "ආශ්‍රය කරණ ලදී" යනු මා විසින් ඒ බුදු රජතෙම ආශ්‍රය කරණ ලදී. පයිරුපාසනය කරණ ලදී. ප්‍රශ්න අසන ලදී. විචාරණ ලදී යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරතෙම මෙසේ කීහ.

17-8

1. "යම්සේ ද්විජයා (පක්ෂියා) ආහාර නැති වනය හැර බොහෝ ගෙඩි ඇති වනයෙහි වසන්නේද" යන්නෙහි 'ද්විජ' යනු පක්ෂියායි කවර කරුණකින් ද්විජයයි පක්ෂියාට කියයිද දෙවරක් උපදින බැවින් ද්විජ නමි. මවුකුසින්ද අණ්ඩ කොෂයෙන්ද යනුයි. ඒ කාරණයෙන් ද්විජයයි කියයි. 'ආහාර නැති වනය' යනු ස්වල්ප ගෙඩි ඇති ස්වල්ප දිය ඇති වනය හැර දුරුකොට ඉක්මවා වෙනින් බොහෝ ගෙඩි ඇති බොහෝ කෑම ඇති මහත් වනයට පැමිණෙන්නේද, ඒ වන ලැහැබෙහි වාසය කරන්නේද යනුයි.

2. "මෙසේ ස්වල්ප දිය හැර මහා ජලයට යන හංසයා මෙන් පැමිණියේ" යනුයි 'මෙසේ' යනු උපමාව පිළියෙල කිරීමයි. 'සවල්ප දිය දුරු කොට' යනු බාවාරි බ්‍රාහ්මණයා සහ ඔහුගේ අනික් ආචාර්යවරුද භාග්‍යවත් බුදුරදුන් ගැන සිතන කල්හි ස්වල්ප දිය මෙන් වෙති. ලාමක දිය මෙන් වෙති. පිංගිය බ්‍රාහ්මණතෙම ඒ ස්වල්ප දිය ලාමක දිය දුරුකොට ඉක්මවා මහත් දිය ඇති තැනක් බඳු අසමවූ අසම සමවූ අප්පටිභාගවූ, අප්පටිපුග්ගලවූ, දෙවාතිදෙවවූ, නරාසභවූ පුරුෂ සිංහවූ පුරුෂ නාගවූ, පුරිසාජඤ්ඤ වූ දශබලධාරී වූ බුදුන් වෙත පැමිණියේය.

3. යම්සේ හංසතෙම මහත්වූ මානස නම් විල අනොතත්ත නම් විල, මහා සමුද්‍රය ආදී මහත් ජලරාශිය ඇති තැනට පැමිණෙන්නේය. එමෙන්ම පිංගිය බ්‍රාහ්මණතෙම නොසෙලවෙන ගති ඇති අප්‍රමාන තේජස් ඇති නිරන්තර ඥාන ඇති, විවෘතවූ ඇස් ඇති, ලැබූ ප්‍රතිසම්භිදා ඇති. සතර විසාරද බව ඇති, ශ්‍රද්ධා විමුක්තවූ, මහත්වූ, ගම්භීරවූ, අප්‍රමෙයවූ, බොහෝ රුවන් ඇති, සාගරය සමවූ, අසමානවූ, මහත්වූ ගුණ ඇති ජලංගුපෙක්ෂාවෙන් යුක්තවූ භාග්‍යවත් බුදුරදුන්වෙත පැමිණියේය. පර්වතයන්ට මේරුව මෙන්ද, පක්ෂීන්ට ගුරුලාමෙන්ද, මෘගයන්ට සිංහයා මෙන්ද, ආත්ම දෘෂ්ටි ඇත්තන්ට උපධිය මෙන්ද වූ ශාස්තෲන් වහන්සේ වෙතට ජිනයන් වහන්සේ වෙතට පැමිණියේය යනුයි. මෙසේ මම ස්වල්ප දිය හැර මහත්වූ දියට පැමිණි හංසයා මෙන් පැමිණියේ වෙමි, එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ කීහ.

**17-9**

1. "මට යමෙක් පූර්වයෙහි කියන ලද්දාහුද" යන්නෙහි යමෙක් යනු බාවාරි බ්‍රහ්මණයාද අනික් යම් ඒ ආචාර්යවරුද ඔවුහු ස්වකීය දෘෂ්ටිය, ස්වකීය කැමැත්ත ස්වකීය රුචිය, ස්වකීය ලබ්ධිය, ස්වකීය අධ්‍යාශය, ස්වකීය අභිප්‍රාය, ප්‍රකාශ කළහ. කීහ දෙසූහ, පැනවූහ, තැබූහ, බෙදූහ, විවෘත කළහ, ප්‍රකට කළහ යනුයි.

2. "ගෞතම ශාසනයෙන් පෙර" යනු ගෞතම ශාසනයෙන් පළමුව, යනුයි. ගෞතම ශාසනයෙන් යනු බුද්ධ ශාසනයෙන් ජිනශාසනයෙන්, තථාගත ශාසනයෙන් දෙව දෙව ශාසනයෙන් අරහන්ත ශාසනයෙන් යනුයි.

3. "මෙසේද මෙසේද වන්නේයයි සියල්ල තර්ක ඇති කරවන්නේය" යනු මෙය මෙසේවූයේයයි දැනගත් ආරංචියෙන් දැනගත් පරම්පරා වශයෙන් එන කොටස් වශයෙන් ගත් තර්ක හේතුවෙන් න්‍යාය හේතුවෙන් ආකාරය හේතුවෙන් පරිවිතර්කයෙන් දෘෂ්ටිය විනිවිද බැලීමෙන් වේ. තෙමේ මනාකොට දැනගෙන නොවේ. තමාට ප්‍රත්‍යක්ෂ ධර්මය නොකීහ.

4. "ඒ සියල්ල තර්කය ඇති කරවන්නේය" යනු ඒ සියල්ල තර්කය ඇති කරවන්නේය. විතර්කය ඇති කරවන්නේය. සංකල්ප ඇති කරවන්නේය. කාම විතර්කය ඇති කරවන්නේය. ව්‍යාපාද විතර්කය ඇති කරවන්නේය. විහිංසා විතර්කය ඇති කරවන්නේය. ඥාති විතර්කය ජනපද විතර්කය, පරානුද්දයතා ප්‍රතිසංයුක්ත විතර්කය, වඩන්නේය. ලාභ සත්කාර ස්තුතියෙන් යුක්ත විතර්කය වඩන්නේය, ලාභ සත්කාර ස්තුතියෙන් යුක්ත විතර්කය වඩන්නේය. නින්දාවෙන් වෙන්වූ විතර්කය වඩන්නේය, යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

17-10

1. "තනිවූයේ අන්ධකාරය දුරුකොට සිටියේ" යන්නෙහි තනිවූයේ යනු භාග්‍යවතුන් වහන්සේ පැවිදිවූ බැවින් තනිවූ සේක. දෙවැන්නෙක් නැත. තෘෂ්ණාව දුරු කළ බැවින් තනිවූ සේක. ඒකාන්ත වීතරාග බැවින් තනිවූ සේක. ඒකාන්ත වීතදොෂ බැවින් තනිවූ සේක. ඒකාන්ත වීතමොහ බැවින් තනිවූ සේක. ඒකාන්ත කෙලෙස් රහිත බැවින් තනිවූ සේක. ඒකායන මාර්ගයට ගියේනුයි තනිවූ සේක. එකම නිරුත්තර සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි තනිවූ සේක.

2. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ පැවිදිවීමෙන් තනිවූ සේක්ද?" භාග්‍යවතුන් වහන්සේ තරුණවූයේම කලු කෙස් ඇත්තේම සොඳුරු යෞවනයෙන් යුක්තවූයේ ප්‍රථම වයසෙහි කඳුලු මුසු මුහුණු ඇති හඬන විලාප කියන මවුපියන්ගේ හා නෑයින්ගේද නොකැමැත්තෙන් සියලු ගෘහවාස පලිබොධය සිඳ අඹුදරු පලිබොධය සිඳ ඥාති පලිබොධය සිඳ මිත්‍රාමාත්‍ය පලිබොධයන් සිඳ හිසකේ රැවුල් කපා හැර කසාවත් පොරවා ගිහිගෙයින් අනාගාරිය නම්වූ ශාසනයෙහි පැවිදිව කෙලෙස් නැති බවට පැමිණ තනිව හැසිරෙයි වාසය කරයි ඉරියව් පවත්වයි පවතියි, පාලනය කරයි, යැපෙයි, මෙසේ භාග්‍යවතුන් වහන්සේ පැවිදිවීමෙන් තනිවූ සේක.

3. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ අද්විතීයාර්ථයෙන් තනිවූ සේක්ද?" තනිවූ උන්වහන්සේ මෙසේ පැවිදිවූයේ අරණ්‍යයෙහිවූ

අල්පවූ ශබ්ද ඇති, අල්පවූ ඝොෂා ඇති ජනයාගෙන් වෙන්වූ මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය විවේකයට සුදුසුවූ සේනාසනයන් සේවනය කරයි. උන්වහන්සේ තනිව ගමන් කරයි. තනිව සිටියි, තනිව සයනය කරයි. තනිව ගමට පිඬු පිණිස හැසිරෙයි. තනිව ඉදිරියට යයි. තනිව ආපසු එයි. තනිව රහසිගතව වැඩ හිඳියි. තනිව සක්මන ඉටාගනියි, තනිව හැසිරෙයි වාසය කරයි. ඉරියව් පවත්වයි. පවතියි පාලනය කරයි. යැපෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අද්විතීයාර්ථයෙන් තනිවූසේක.

**4.** "කෙසේ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව දුරු කිරීම් අර්ථයෙන් තනිවූ සේක්ද?" උන්වහන්සේ මෙසේ තනිවූයේ දෙවැන්නෙක් නැතිවූයේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ දුරුකළ ආත්මභාව ඇතිව වසන්නේ නෙරංජරානදීතීරයෙහි බෝරුක මුල මහත්වූ වීර්ය කරන්නේ සේනා සහිත නමුචි නම්වූ පමත්ත බන්ධු නම්වූ මාරයා පලවා හැර තෘෂ්ණා ජාලය ඇසුරු කළ විසත්තිකා නම් තෘෂ්ණාව දුරුකළ සේක, බැහැර කළ සේක, සම්පූර්ණ අභාවයට පැමිණවූ සේක.

**5.** "තෘෂ්ණාව දෙවැනිකොට ඇති පුරුෂයා මේ දීර්ඝ සංසාරයේ සැරිසරමින් මේ ආත්මභාවයෙන් අනික් ආත්මභාවයට පැමිණෙමින් සංසාරය නොඉක්මවයි."

"තෘෂ්ණාව මෙසේ දුක් ඇතිකරන්නකැයි පහකළ තෘෂ්ණා ඇත්තේ දැඩිකොට ගැනීම් නැත්තේ සිහි ඇති භික්ෂුව හැසිරෙන්නේය" මෙසේ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව දුරුකිරීම් අර්ථයෙන් තනිවූසේක.

**6.** "කෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්ත වීතරාග බැවින් තනිවූසේක්ද?" රාගය ප්‍රහීනකළ බැවින් ඒකාන්ත වීතරාගනුයි තනිවූසේක. ද්වෙෂය දුරුකළ බැවින් ඒකාන්ත වීතදොෂනුයි තනිවූසේක. මොහය ප්‍රහීන කළ බැවින් ඒකාන්ත වීතමොහනුයි තනිවූසේක. ක්ලේශයන් ප්‍රහීනකළ බැවින් ඒකාන්තයෙන් කෙලෙස් නැත්තේනුයි තනිවූසේක.

7. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගයට ගියේනුයි, තනිවූසේක්ද?" (ii) ඒකායන මාර්ගයයි සතර සතිපට්ඨානයන්ට කියති. සතරසම්‍යක් ප්‍රධානයන්ට, පඤ්චෙන්ද්‍රියයන්ට, පඤ්චබලයන්ට, සප්තබොධ්‍යංගයන්ට, ආර්ය අෂ්ටාංගික මාර්ගයට කියති. 'ජාතික්ෂය දක්නාවූ හිතානුකම්පා ඇති බුදුරජාණන් වහන්සේලා ඒකායන මාර්ගය දනිති. පෙර එක් මාර්ගයකින්ම සසර තරණය කළහ. දැන් තරණය කරති, මතු තරණය කරන්නාහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගයට ගියේනුයි තනිවූසේක.

8. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ නිරුත්තර සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි තනිවූසේක්ද?" බොධියයි සතර මාර්ගයන්හි ඥානයට කියයි. ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥාබලය, ධම්මවිචය සම්බොජ්ක්ධංගය, විමංසාව, විදර්ශනාව සම්‍යක් දෘෂ්ටිය යනුයි. භාග්‍යවතුන් වහන්සේ ඒ බොධිඥානයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයයි අවබොධ කළසේක. සියලු සංස්කාරයෝ දුක්යයි අවබොධ කළසේක. සියලු ධර්මයෝ අනාත්මයයි අවබොධ කළසේක. යම්කිසි හේතු ප්‍රත්‍යයකින් ඇතිවන ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි අවබොධ කළසේක. නැවතද අවබොධ කටයුතු පැමිණියයුතු දැකිය යුතු ප්‍රත්‍යක්ෂ කටයුතු ඒ සියල්ල ඒ බොධි ඥානයෙන් අවබොධ කළසේක, පැමිණිසේක, දැකිසේක, ප්‍රත්‍යක්ෂකළසේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තනිවම නිරුත්තරවූ සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි තනි වූසේක.

9. "අන්ධකාරය දුරුකළසේක" යනු භාග්‍යවතුන් වහන්සේ රාගාන්ධකාරය, ද්වෙෂාන්ධකාරය, මොහාන්ධකාරය, දෘෂ්ටි අන්ධකාරය, ක්ලේශාන්ධකාරය, දුශ්චරිත අන්ධකාරය, ඇස් නැති කිරීම, නොදැනීම ඇති කිරීම, ප්‍රඥාව නිරුද්ධ කිරීම, නිර්වාණයට හේතුනොවන, දෙය නැති කළ සේක. දුරුකළසේක සංසිඳවූසේක. දෙශනාකළසේක. 'සිටියේ' යනු භාග්‍යවතුන් වහන්සේ පාෂානක චෛත්‍යස්ථානයෙහි වැඩසිටි සේක යනුයි.

10. "උන්වහන්සේ රශ්මිමත්, ආලොක ඇත්තෙක් වූ සේක." යනු රශ්මි ඇති, ප්‍රඥා ඇති, පණ්ඩිතවූ, ප්‍රඥා ඇති බුද්ධිමත්, ඥාන ඇති, නුවණ ඇති යනුයි. 'ආලොක ඇත්තෙක්' යනු ආලෝකය ඇතිකරන්නෙක් එලිය ඇතිකරන්නෙක් පහන ඇතිකරන්නෙක් යනුයි.

11. "මහත් ප්‍රඥා ඇති" යනු උසස් ප්‍රඥා ඇතිසේක. පඤ්ඤාධජසේක, පඤ්ඤාකේතසේක, ප්‍රඥාව අධිපතිකොට ඇතිසේක. සෙවීම බහුලකොට ඇතිසේක, යට බැලීම බහුල කොට ඇතිසේක. මනාකොට මිදීම බහුලකොට ඇතිසේක. ප්‍රකට විහරණය ඇතිසේක. එය චරිතකොට ඇතිසේක. එය බහුලකොට ඇතිසේක. එය ගරුකොට, එයට නැඹුරුව එයට බරව, එහි ඇළුනසේක. එය අධිපතිකොට ඇතිසේක. 'භූරියයි' පෘථිවියට කියයි පෘථිවිය සමාන ප්‍රඥාවෙන් යුක්ත සේක යනුයි.

12. "මේධා" යයි ප්‍රඥාවට කියයි. යම් ප්‍රඥාවක් (මහා නිද්දේශයේ 3-1 (3) යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රඥාවෙන් යුක්තවූයේ එළඹියේ උපන්නේ ඇතිවූයේ වෙයි. එහෙයින් බුදුරදතෙම මහා ප්‍රඥා ඇතිසේක, එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

## 17-11

1. "යමෙක් මට ධර්මය දෙශනා කළසේක්ද?" යනු යම් ඒ භාග්‍යවත් ස්වයම්භූඥානයෙන් අවබොධ කළ ආචාර්යවරයෙක් නැති භාග්‍යවතුන් වහන්සේ පෙර අවබොධ නොකළ ධර්මයන්හි තෙමේ සත්‍යයන් මනාව අවබොධ කළ සේක. එහිද සර්වඥතාඥානයට පැමිණිසේක. ඵලයන්හිද වසඟභාවයට පැමිණියේ ධර්මය දේශනා කළසේක යනුයි. ධර්මය යනු මුල යහපත්, මැද යහපත්, අග යහපත් අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත සියල්ල පිරිසිදු බ්‍රහ්මචර්යාව එනම් සතර සතිපට්ඨානයන් (17-10) 7 (ii) යෙදිය යුතුයි.) ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිර්වාණය නිර්වාණ ගාමිනී ප්‍රතිපදාව කීසේක. දෙශනා කළසේක. පැනවූසේක, තැබූසේක, විවෘත කළසේක, බෙදූසේක, ප්‍රකටකළ සේක, යනුයි.

2. "ශාන්දෘෂ්ටිකවූ අකාලිකවූ" යනු මෙලොවම විපාක දෙන කල් නොයවා පලදෙන, එව බලවයි කීමට සුදුසු නුවණැත්තන් විසින් ලඟට පමුණුවන, මෙසේද ශාන්දෘෂ්ටික වූ නැවතද යමෙක් මෙලොවම ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩාද, ඒ මාර්ගයට අනතුරුව ඵලයට පැමිණෙන්නේය, විඳියි. එය ලබයි. මෙසේද ශාන්දෘෂ්ටිකවූ අකාලිකවූ යම්සේ මිනිස්සු කාලිකවූ ධනයදී අතරෙහි නොලබාද කාලය බලාපොරොත්තුවේද, මේ ධර්මය එසේ නොවේ. යමෙක් මෙලොව ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩාද ඒ මාර්ගයට අනතුරුව ඵලය ලබයි. එය විඳියි. පරලොව නොවේ. මෙසේ අකාලිකවූ යනුයි 'තෘෂ්ණා ක්ෂය' යන්නෙහි තෘෂ්ණාව නම් රූපතෘෂ්ණා, ශබ්ද ගන්ධ, රස, ස්පර්ශ ධර්ම තෘෂ්ණා යනුයි. 'තෘෂ්ණාක්ෂය යනු රාග ක්ෂය, ද්වෙෂ ක්ෂය, මොහක්ෂය, ගතික්ෂය, උත්පත්ති ක්ෂය, භවක්ෂය, සංසාරක්ෂය, වට්ටක්ෂය යනුයි.

3. "ඊති රහිතවූ" යන්නෙහි ස්කන්ධද, කෙලෙස්ද අභිසංස්කාරද ඊති (උපද්‍රව) යයි කියත්, ඊතී ප්‍රහානය ඊති සන්සිඳීම, ඊති බැහැර කිරීම, අමෘතවූ නිර්වාණය යනුයි. "යමකට කිසියම් තැනක උපමාවක් නැත." යන්නෙහි 'යමෙකුට' යනු නිර්වාණය යනුයි. උපමාවක් නැත යනු සමාන කිරීමට යමක් නැත යනුයි 'කිසියම් තැනක' යනු කොහිවත් කවර තැනකවත් අධ්‍යාත්මයෙහි හෝ බාහිරවූ හෝ අධ්‍යාත්ම බාහිරදෙකෙහි හෝ නිවනට උපමාවක් නැත, යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

## 17-12

1. "පිංගිය, කිමෙක්ද? උන්වහන්සේගෙන් වෙන්ව වසන්නෙහිද?" යනු කිමෙක්ද බුදුන්ගෙන් වෙන්වන්නෙහිද? ඉවත් වන්නෙහිද? යනුයි පිංගිය, "මොහොතක්වත්" යනු මොහොතක්වත් ක්ෂණයක්වත් යනුයි. 'පිංගිය' ගෞතමවූ උසස්ඥාන ඇත්තාගෙන් යනු 'ප්‍රඥාධජය ඇත්තාගෙන්' ප්‍රඥා කේතුව ඇත්තාගෙන්, ප්‍රඥාව අධිපතිකොට ඇත්තාගෙන්, සෙවීම් බහුලකොට ඇත්තාගෙන්, යටබැලීම් ඇත්තාගෙන්, ප්‍රකට

විහරණ ඇත්තාගෙන්, එය චරිතකොට ඇත්තාගෙන්, එය බහුලකොට ඇත්තාගෙන්, එය ගරුකොට ඇත්තාගෙන්, එයට නැමුන තැනැත්තාගෙන්, එයට මදක් බරවූ තැනැත්තාගෙන්, යනුයි.

2. "භූරියයි" පෘථිවියට කියයි. 'මෙධායයි' ප්‍රඥාවට කියයි. යම් දැනීමක් ඇද්ද, (මහානිද්දේසයේ (3-1) 3 යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රඥාවෙන් යුක්තවූයේ, එළඹියේ, පැමිණියේ, යුක්තවූයේවේද එහෙයින් බුදුරදතෙම යහපත් ප්‍රඥා ඇතිසේක. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

## 17-13

1. "මම උන්වහන්සේගෙන් වෙන්ව නොවසමි" යනු මම බුදුන්ගෙන් වෙන්ව නොවසමි. ඉවත්ව නොයමි යනුයි.

2. "බ්‍රාහ්මණය මොහොතක්වත්' යනු මොහොතකුදු ක්ෂණයකුදු යනුයි. 'ගෞතමවූ උසස්ඥාන ඇත්තාගෙන්' යනු ප්‍රඥාව ධජය කොට ඇත්තාගෙන්, ප්‍රඥාව කොඩියක් කොට ඇත්තාගෙන්, ප්‍රඥාව අධිපතිකොට ඇත්තාගෙන් යනුයි. 'යමෙක් මට ධර්මය දෙශනා කළේද' යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේ (මහානිද්දේසයේ (7-2) 1 යෙදිය යුතුයි.)

## 17-14

1. "සිතින්ද ඇසින්ද දකිමි" යනු යම්සේ ඇස් ඇති පුරුෂයෙක් එලිය ඇතිකල්හි රූපයන් දකින්නේද බලන්නේද, පරීක්ෂා කරන්නේද, එපරිද්දෙන්ම මම භාග්‍යවත්වූ බුදුරදුන් සිතින් දකින්නෙමි, බලන්නෙමි, පරීක්ෂා කරන්නෙමි.

2. "බ්‍රාහ්මණය, උන්වහන්සේ සිතින් හෝ ඇසින් හෝ රෑ දාවල් අප්‍රමාදවූයේ" යනු රෑද දාවල්ද බුද්ධානු ස්මෘතිය වඩන්නේ යනුයි.

3. "වඳිමින්" යනු කයින් හෝ වඳින්නේ, වචනයෙන් හෝ වඳින්නේ, සිතින් හෝ වඳින්නේ, අන්වර්ථ ප්‍රතිපත්තියෙන් හෝ වඳින්නේ, ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් හෝ වඳින්නේ, සත්කාර

කරන්නේ, ගරුකාරකරන්නේ, බහුමාන කරන්නේ, පුදන්නේ රෑ දාවල් වෙන්ව නොවසමි.

4. "එයින්ම වෙන්නොවීම සිතමි." යනු ඒ බුද්ධානුස්මෘතියෙන් වඩන්නේ වෙන්නුවූයේයයි දනිමි, යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

17-15

1. "ශ්‍රද්ධාද, ප්‍රීතියද, මනසද ස්මෘතියද" යන්නෙහි ශ්‍රද්ධා නම් භාග්‍යවතුන් වහන්සේ නිසා ඇතිවූ සද්දහන ඔකප්පනාදී ශ්‍රද්ධාවයි. එනම් ශ්‍රද්ධාව ශ්‍රද්ධෙන්ද්‍රිය, ශ්‍රද්ධාබලය යනුයි. 'ප්‍රීතිය' යනු භාග්‍යවතුන් වහන්සේ නිසා යම් ප්‍රීතියක්, ප්‍රමුදිත භාවයක්, සතුටක්, සිතේ ඔදවැඩීමක් ඇද්ද එයයි. 'මනස' යනු භාග්‍යවතුන් වහන්සේ අරබයා යම් සිතක් එනම් මන, මානස, හදය පණ්ඩර, මනායතනය, මනින්ද්‍රිය, විඤ්ඤානය, විඤ්ඤානස්කන්ධය, යන යමක් ඇතිවේද එයයි. ස්මෘතිය නම් භාග්‍යවතුන් වහන්සේ අරබයා යම් සිහියක්, අනුස්මෘතියක් ඇද්ද එයයි.

2. "මාගේ ශ්‍රද්ධාවද ප්‍රීතියද, මනසද, සිහියද, ගෞතම ශාසනයෙන් ඉවත් නොවෙත්" යනු ගෞතම ශාසනයෙන්, බුද්ධශාසනයෙන් ජිනශාසනයෙන්, තථාගත ශාසනයෙන්, දෙව දෙවශාසනයෙන්, අරහන්තශාසනයෙන් ඉවත්නොවෙත්, යනුයි.

3. "මහත් ප්‍රඥාඇත්තේ යම් යම් දිශාවකට" යනු පෙර දිගට හෝ බටහිරදිගට හෝ දකුණුදිගට හෝ උතුරුදිගට හෝ යේද, ගමන් කෙරේද. ඉදිරියටයේද යනුයි.

4. "මහත් ප්‍රඥා ඇති" යනු මහා ප්‍රඥා ඇති තීක්ෂණ ප්‍රඥා ඇති, පුථුප්‍රඥා ඇති, හාස ප්‍රඥා ඇති ජවන ප්‍රඥා ඇති නිබ්බෙධික ප්‍රඥා ඇති යනුයි.

5. "භූරි" යයි පෘථිවියට කියයි. ඒ පෘථිවියට සමානවූ මහත්වූ පළල්වූ ප්‍රඥාවෙන් යුක්තවූයේය යනුයි.

6. "මහත් ප්‍රඥා ඇත්තේ යම් යම් දිශාවකටයේද හෙතෙම ඒ ඒ දිශාවට නැමුනේවෙයි" යනු හෙතෙම බුදුරද තෙම යම් තැනෙක්හිද ඒ දෙසට නැමුනේ වෙයි. එයට නැමුනේ, එයට

බරවූයේ එහි ඇළුණේ එය අධිපතිකොට ඇත්තේ යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

17-16

1. "දුර්වලවූ ශරීර ඇති වයස්ගතවූ මාගේ" යනු දිරුනාවූ, වෘද්ධවූ අස්තයට ගියාවූ, අන්තිම වයසට පැමිණියේ යනුයි. "දුර්වල ශරීර ඇත්තහුගේ යනු' ස්වල්ප ශක්තිය ඇත්තහුගේ යනුයි.

2. "එහෙයින්ම ශරීරය එහි නොයයි" යනු බුදුන් යම් තැනකද, එහි නොයයි, ගමන් නොකරයි, ඉදිරියට නොයයි, යනුයි. කල්පනා කරමින් යම් යනු විතර්ක ගමනින්, ඥාන ගමනින්, ප්‍රඥාගමනින් බුද්ධි ගමනින්, ඉදිරියට යම් යනුයි.

3. "බ්‍රාහ්මණය, මාගේ සිත එහි යෙදුනේය" යන්නෙහි 'සිත' යනු යම් සිතක් ඇද්ද (මහානිද්දේසයේ (16-13) 4 මන යන තැන සිට යෙදිය යුතුයි.) එහි යෙදුනේය' යනු යම් තැනක බුදුරජාණන් වහන්සේද සිත එහි යෙදුනේය යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

17-17

1. "මඩෙහි නිදන්නේ" යනු කාම මඩෙහි කාම ක්ලේශයෙහි, කාම පරිලාහයෙහි, නිදන්නේ වැදහෝනේ යනුයි.

2. "සැලෙන්නේ" යනු තෘෂ්ණා සැලීමෙන් සැලෙන්නේ දෘෂ්ටි සැලීමෙන් සැලෙන්නේ ක්ලේශ සැලීමෙන්, සැලෙන්නේ, සංයොග සැලීමෙන් සැලෙන්නේ, විපාක සැලීමෙන් සැලෙන්නේ, දුශ්චරිත සැලීමෙන් සැලෙන්නේ, රාගයෙන් රත්ව සැලෙන්නේ, ද්වෙෂයෙන් දූෂිතව සැලෙන්නේ, මොහයෙන් මුලාව සැලෙන්නේ, මානයෙන් බැඳී සැලෙන්නේ උද්ධච්චයෙන් විසුරුනෙක්ව සැලෙන්නේ, විචිකිච්ඡාවෙන් සැලෙන්නේ සැපයෙන් සැලෙන්නේ දුකින් සැලෙන්නේ ඉපදීමෙන් සැලෙන්නේ ජරාවෙන් සැලෙන්නේ, ව්‍යාධියෙන් සැලෙන්නේ ශොක වැළපීම් දුක් දොම්නස් උපායාසවලින් සැලෙන්නේ, නරක දුකින් සැලෙන්නේ, තිරිසන් යොනිදුකින් සැලෙන්නේ,

ප්‍රෙතවිෂයික දුකින් සැලෙන්නේ. මිනිස් දුකින් සැලෙන්නේ. ගැබට බැස ගැනීම මුල්කොට ඇති දුකින් ගර්භයෙහි සිටීම මුල්කොට ඇති දුකින් ගර්භයෙන් නැගිටීම මුල්කොට ඇති දුකින් උපන්නහුට උපධි බන්ධනාදියෙන් ඇතිවන දුකින් ආත්මොපක්‍රම දුකින් 'පරොප ක්‍රම දුකින්' විපරිනාම දුක යනාදී දුකින් සැලෙන්නේ දිශාවෙන් දිශාවට ගියෙමි යනු ශාස්තෲ කෙනෙකුගෙන් ශාස්තෲ කෙනෙකු ලඟට, ධර්මයකින් ධර්මයකට, දෘෂ්ටියකින් දෘෂ්ටියකට ප්‍රතිපදාවකින් ප්‍රතිපදාවකට මාර්ගයකින් මාර්ගයකට ගියෙමි.'

3. "ඉක්බිති බුදුරදුන් දුටුවෙමි." යන්නෙහි ඉක්බිති යනු පදගැලපීමයි පදපිරවීමයි 'අකුරු සමකිරීමයි' පද සිළුටු කිරීමයි යනුයි. 'දුටුවෙමි' යනු දැකීම් යනුයි.

4. "බුද්ධ" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි (17-2) 1 බුදුන් යන තැන සිට යෙදිය යුතුයි.)

5. "ඔඝය තරණය කළ" යනු භාග්‍යවතුන් වහන්සේ කමොඝය තරණය කළසේක. භවොඝය තරණය කළසේක. අවිජ්ජොඝය තරණය කළසේක. සියලු සංසාරපථය තරණය කළසේක. ඉක්මවූසේක. වෙන්කළසේක, උන්වහන්සේ වැස නිමවූසේක. (මහානිද්දේසයේ (3-7) 6 (ii)) උන්වහන්සේට ජාතිමරණ සංසාරය නැත, පුනර්භවයක් නැත. 'ආශ්‍රව රහිතවූ' යනු කාමාශ්‍රවය, භවාශ්‍රවය දෘෂ්ටාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය යනුයි. ඒ ආශ්‍රවයෝ භාග්‍යවත් බුදුරදුන්ගේ ප්‍රහීනයහ, මුලින් උපුටන ලද්දේය, අගසිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේය. සම්පූර්ණ අභාවයට පමුණුවන ලදී. නැවත නූපදනා බවට පමුණුවන ලදී. එහෙයින් භාග්‍යවත් තෙම අනාශ්‍රව නම් වූසේක. යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

17-18

1. "යම්සේ වක්කලී තෙරුන් වහන්සේවීද" යනු (ii) ශ්‍රද්ධා ඇති ශ්‍රද්ධාගරුකවූ ශ්‍රද්ධාපූර්වාංගමවූ ශ්‍රද්ධාමුක්තවූ, ශ්‍රද්ධා අධිපතිකොට ඇති රහත් බවට පැමිණිසේක්ද, (iii) යම්සේ

භද්‍රාවුධ ස්ථවිරතෙම (මෙහි (ii) යෙදිය යුතුයි.) යම්සේ ආලවිගොතම ස්ථවිරතෙම (මෙහි (ii) යෙදිය යුතුයි.) එපරිද්දෙන්ම ඔබද ශ්‍රද්ධාව මුදව, සියලු සංස්කාරයෝ අනිත්‍යයයි. විශ්වාසයෙන් ශ්‍රද්ධාව මුදව, සියලු සංස්කාරයෝ දුක්යයි විශ්වාසයෙන් ශ්‍රද්ධාව මුදව, සියලු ධර්මයෝ අනාත්මයයි විශ්වාසයෙන් ශ්‍රද්ධාව මුදව, යම්කිසි හේතුප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි විශ්වාසයෙන් ශ්‍රද්ධාව මුදව, එපරිද්දෙන් ඔබද ශ්‍රද්ධාව මුදව, පිංගිය ඔබද මාරයාට අයත් ප්‍රදෙශයෙන් එතරට යව, මාරයාට අයත් දේ හෙවත් ප්‍රදෙශය යනු ක්ලේශයෝද ස්කන්ධයෝද අභිසංස්කාරයෝද කියත්, 'එතරයයි' අමෘතවූ නිර්වාණයට කියයි.

2. යම් ඒ නිර්වාණයක් සියලු සංස්කාරයන් සමථයට පත් කළේ සියලු උපධීන් සංසිඳවූයේ තෘෂ්ණා ක්ෂය නම්වේද, විරාග නම්වේද, නිරොධ නම්වේද, ඒ නිර්වාණයයි 'ඒ මාරයාට අයත් ප්‍රදේශයෙන් එතරට යව' යනු පිංගිය මාරයාට අයත් ප්‍රදේශයෙන් එතරට යව, එතර දකුව, එතර ප්‍රත්‍යක්ෂකරව යනුයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළහ.

## 17-19

1. "මෙහිලා වැඩියක් පහදිමි" යනු වැඩියක් පහදිමි. (ii) වැඩි වැඩියත් විශ්වාසකරමි. වැඩි වැඩියත් ඇලෙමි. සියලු සංස්කාරයෝ අනිත්‍යයයි වැඩි වැඩියත් ඇලෙමි. වැඩි වැඩියත් අදහමි, වැඩි වැඩියත් විශ්වාස කරමි. වැඩි වැඩියත් ඇලෙමි. මෙහි (ii) යෙදිය යුතුයි) සියලු ධර්මයෝ අනාත්මයයි වැඩි වැඩියත් පහදිමි මෙහි (ii) යෙදිය යුතුයි.) යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේ යයි වැඩි වැඩියත් පහදිමි, වැඩි වැඩියත් අදහමි, වැඩි වැඩියත් විශ්වාස කරමි.

2. "මුනීන් වහන්සේගේ වචනය අසා" යනු මුනි යන්නෙහි මොනයයි ඥානයට කියයි (මහා නිද්දේසයේ (8) 8 (10) යෙදිය යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වේ. මුනීන්ගේ වචනය අසා' යනු ඔබගේ වචනය දෙශනාව, අනුසන්ධිය, අසා ඉගෙණ, සලකා බලා, යනුයි.

3. "වැස්ම දුරුකළ බුදුරදතෙම" යන්නෙහි වැස්ම නම් වැසුම පසකි. තෘෂ්ණා, දෘෂ්ටි, ක්ලේශ, දුශ්චරිත. අවිද්‍යා, යනුයි. භාග්‍යවත් බුදුන්ගේ ඒ වැසුම් පහව ගියහ. විනාශවූහ. නැසුනාහ ප්‍රහානයවූහ, මුලින් සිඳුනාහ, ශාන්තවූහ. ඉපදීමට අයොග්‍යවූහ. ඥානය නමැති ගින්නෙන් දැවුනාහ. එහෙයින් බුදුරදතෙම පහවූ වැසුම් ඇතිසේක.

4. "බුද්ධ" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේයි (17-8) (i) 'බුදුන්' යන තැන සිට යෙදිය යුතුයි) ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි. ඒ මේ භාග්‍යවතුන් වහන්සේයි.

5. "හුල් නැත්තේ වැටහීම් ඇත්තේ" යන්නෙහි 'හුල් නැත්තේ' යනු රාගහුල, ද්වෙෂහුල, මෝහ ක්‍රොධහුල උපනාහ හුල, සියලු අකුශල රැස්කරීම් හුල යන මේ හුල් භාග්‍යවත් බුදුරදුන්වහන්සේගේ ප්‍රහීනයහ, මුලින් උදුරනලදහ, අගසිඳි තල් ගසක් මෙන් කරණ ලදහ, අභාවයට පමුණුවන ලදහ, නැවත නූපදනා බවට පමුණුවන ලදහ. එහෙයින් බුදුරදතෙම අබ්ල නම් සේක. වැටහීම් ඇත්තේ යනු වැටහීම් තුනෙකි. පර්යාප්තිය, ප්‍රශ්න ඇසීම් හා අධිගමය, යනුයි.

6. "පර්යාප්ති වැටහීම, කවරේද?" මෙහි ඇතැම් පුද්ගලයෙකුට ප්‍රකෘතියෙන් සූත්‍රය, ගෙය්‍යය, වෙය්යාකරණය ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූතධම්මය, වෙදල්ලය, යන මේ ධර්මයෝ වැටහෙයි. ඔහුට පර්යාප්තිය ආශ්‍රයකොට වැටහීම ඇතිවෙයි. මේ පර්යාප්ති වැටහීමයි.

7. "ප්‍රශ්න ඇසීම් වැටහීම් කවරේද?" මෙහි ඇතැම් පුද්ගලයෙක් අර්ථයෙහිද, න්‍යායයෙහිද, ලක්ෂණයෙහිද, කාරණයෙහිද, ධාතුස්ථානයෙහිද, ප්‍රශ්න ඇසීම් ඇත්තේ වෙයි. ඔහුට ප්‍රශ්න ඇසීම නිසා වැටහීම ඇත්තේ වෙයි. මේ ප්‍රශ්න ඇසීම් වැටහීමයි.

8. "අධිගම ප්‍රතිභානය කවරේද?" මෙහි ඇතැම් පුද්ගලයෙකුට සතර සතිපට්ඨාන වැටහුනේ වෙයි. සතර සම්‍යක්

ප්‍රධාන වැටහුනේ වෙයි. සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්තබොධ්‍යංග, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය, වැටහුනේ වෙයි. සතර ආර්‍යමාර්ගද සතරශ්‍රාමාන්‍ය ඵලද, සතර ප්‍රතිසම්භිදාද, ෂට් අභිඥාද, අවබොධවූවාහු වෙත්. ඔහු විසින් අර්ථය දන්නාලදී. ධර්මය දන්නාලදී. නිරුක්තිය දන්නාලදී. අර්ථය දත් කල්හි අර්ථය වැටහෙයි ධර්මය දත් කල්හි ධර්මය වැටහෙයි. නිරුක්තිය දැනගත් කල්හි නිරුක්තිය වැටහෙයි. මේ තුන් ඥානයෙහි ප්‍රතිභාන පටිසම්භිදානම් භාග්‍යවතුන් වහන්සේගේ මේ ඥානය ප්‍රතිභාන පටිසම්භිදාවෙන් යුක්තවූයේ වෙයි. එහෙයින් බුදුරදතෙම වැටහීමෙන් හෙවත් ප්‍රතිභානයෙන් යුක්තසේක. යමෙකුට පර්යාප්තියක් නැද්ද, පරිපුච්ඡාවක් නැද්ද, අධිගමයක් නැද්ද? ඔහුට කුමක් වැටහෙන්නේද? යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

## 17-20

1. "උසස් දෙවියන් කරන්නාවූ ධර්මය දැන" යන්නෙහි දෙව් යනු සම්මුතිදෙව උත්පත්තිදේව, විශුද්ධිදේව, යනුවෙන් දෙවියෝ තුන් කොටසකි. (5-3) (i) යෙදිය යුතුයි. භාග්‍යවතුන් වහන්සේ සම්මුති දෙවියන්ට වඩා උසස් දෙවියයි දැන, උත්පත්ති දෙවියන්ටත් උසස් දෙවියන් යයි දැන, විශුද්ධි දෙවියන්ටත් වඩා උසස් දෙවියයි දැන, සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

2. "තමාද අන්‍යයාද" යනු තමාද අන්‍යයාද උසස් දෙවියන් කරණ ධර්ම දැනගත්සේක. දැකිසේක. අවබොධ කළසේක. තමා දෙවියන්ට වඩා උසස් කරණ ධර්ම කවරේද? (ii) සම්‍යක් ප්‍රතිපදාව, අනුලෝම ප්‍රතිපදාව, නොවෙනස් ප්‍රතිපදාව, ධර්මානුධර්ම ප්‍රතිපදාව, ශීලයන් සම්පූර්ණ කිරීම, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇති බව, භොජනයෙහි පමණ දැනීම, නිදිවර්ජිත කිරීම, සිහිනුවණ යෙදීම, සතර සතිපට්ඨානයන් සම්‍යක් ප්‍රධාන, පඤ්චෙන්ද්‍රිය, පංචබල සප්තබොධ්‍යංග ආර්‍ය අෂ්ටාංගික මාර්ගය යනු මේ තමහට උසස් දෙවියන් ඇති කරණ ධර්මයයි කියත්.

3. අනුන්ගේ දෙවියන්ට වඩා උසස් බව ඇතිකරණ ධර්ම කවරේද? සම්‍යක් ප්‍රතිපදාව (17-19) 2 (ii) යෙදිය යුතුයි.) ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේවා අනුන්ගේ දෙවියන්ට වඩා උසස් බව ඇතිකරණ ධර්මයයි කියත්. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන්ගේද, අනුන්ගේ ද අධික දෙවියන් ඇතිකරණ ධර්මයන් දැනගත්සේක, බැලූසේක, අවබොධ කළසේක. ශාස්තෘන්වහන්සේ ප්‍රශ්නයක් අවසන් කරණසේක. භාග්‍යවතුන් වහන්සේ පාරායන ප්‍රශ්නයන්ගේ අවසානය කරණ සේක. වෙන්කොට දැක්වීම කරණසේක. පිරිමැදීම කරණ සේක යනු භාග්‍යවතුන් වහන්සේ ගැල් නායකසේක.

4. යම්සේ ගැල් නායකයා ගැල් කාන්තාරයෙන් තරණය කරවයිද, චොර කාන්තාරයෙන් තරණය කරවයිද, නපුරු සතුන් ඇති කාන්තාරයෙන් තරණය කරවයිද, දුර්භික්ෂ කාන්තාරයෙන් තරණය කරවයිද, ජලය නැති කාන්තාරයෙන් තරණය කරවයිද, නිර්භය භූමියට පමුණුවයිද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ ගැල් නායකසේක. සත්වයන් කාන්තාරයෙන් තරණය කරවයි. ජාති කාන්තාරයෙන්, ජරා, ව්‍යාධි, මරණ, ශෝක පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාස කාන්තාරයන්ගෙන් තරණය කරයි. රාග කාන්තාරයෙන් තරණය කරයි ද්වෙෂ, මොහ, දෘෂ්ටි, ක්ලේශ, දුශ්චරිත, කාන්තාරයෙන් තරණය කරයි. රාග නමැති මහවනයෙන්, ද්වෙෂ නමැති මහවනයෙන්, මෝහ නමැති මහවනයෙන් දෘෂ්ටි නමැති මහවනයෙන් තරණය කරවයි. දුශ්චරිත නමැති මහ වනයෙන් තරණය කරවයි. නිර්භය භූමියවූ අමෘතවූ නිර්වාණයට පමුණුවයි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ සාර්ථවාහසේක.

5. නැවතද භාග්‍යවතුන් වහන්සේ නායකසේක, පමුණුවනසේක, පනවනසේක, බලනසේක, මෙසේද භාග්‍යවතුන් වහන්සේ සාර්ථවාහ වනසේක.

6. "නැවතද භාග්‍යවතුන් වහන්සේ නූපන් මාර්ගය උපදවනසේක. නොහටගත් මාර්ගය හටගන්වනසේක, නොකියනලද මාර්ගය කියනසේක, මාර්ගය දන්නාසේක,

මාර්ගයෙහි දක්ෂසේක. දැන් ශ්‍රාවකයෝ මාර්ගය අනුව ගියාහු වෙසෙත්.

7. "සැකය නැතිකොට දැනගනිත්" යනු සැක නැති බවට පැමිණෙත්. රාගාදී හුල් සහිතව පැමිණ හුල් නැත්තාහු වෙත් අදහස් දෙකක් ඇතිව පැමිණ එය නැතිවූවාහු වෙත්. සැක ඇතිව පැමිණ සැක නැත්තාහු වෙත්. රාග සහිතව පැමිණ දුරුකළ රාග ඇත්තාහුවෙත්. ද්වෙෂ සහිතව පැමිණ ද්වෙෂ නැත්තාහු වෙත්. මොහ සහිතව පැමිණ මොහය නැත්තාහු වෙත්. කෙලෙස් සහිතව පැමිණ කෙලෙස් රහිත වූවාහු වෙත්. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ කීහ.

## 17-21

1. "ස්ථිරවූ වෙනස් නොවෙන්නාවූ නිර්වාණය" යන්නෙහි 'වෙනස් නොවන්නාවූ' යනු නිර්වාණයට කියයි. යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමක් ඇද්ද තෘෂ්ණාව දුරු කළ විරාග නම්වූ නිරොධ නම්වූ නිර්වාණයයි. එය රාගයෙන් වෙනස් නොවෙත්. ද්වෙෂයෙන් වෙනස් නොවෙත්. මොහයෙන් ක්‍රොධයෙන් බද්ධ වෛරයෙන් මකු ගුණයෙන් උතුමන් හා සම ගුණ ඇතැයි සිතීමෙන්, ඊර්ෂ්‍යාවෙන් මසුරුකමින් රැවටිල්ලෙන් කෛරාටික කමින් තදගතියෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන්ගෙන් සියලු දුශ්චරිතයන්ගෙන් සියලු තැවීම් වලින් සියලු දැවීම් වලින් සියලු අකුසල රැස් කිරීම් වලින් නිර්වාණය වෙනස් නොවෙයි, නිත්‍යය ස්ථිරය යනුයි.

2. "යමකට උපමාවක් නැද්ද?" යන්නෙහි 'යමකට' යනු නිර්වාණයට යනුයි. 'උපමාවක් නැත' යනු සමාන කිරීමක් නැත යනුයි කොහිවත් යනු කොතැනකවත් අධ්‍යාත්මයෙහි හෝ බාහිරව හෝ යනුයි.

3. "ඒකාන්තයෙන් යන්නෙම් නිවනෙහි සැකයක් නැත" යන්නෙහි 'ඒකාන්තයෙන්' යනු නියමිත වචනයයි. නිසැක වචනයයි අදහස් දෙකක් නැති වචනයයි. නියම වචනයයි. නිදොස් වචනයයි. අවිරුද්ධ වචනයයි. 'ඒකාන්තයෙන්

යන්නෙමි’ යනු පැමිණෙන්නෙමි. ප්‍රත්‍යක්ෂ කරන්නෙමි. යනුයි. ‘මෙහි සැකයක් නැත’ යන්නෙහි ‘මෙහි’ යනු නිර්වාණයෙහිය. සැකයක් යනු විමතියක් විචිකිච්ඡාවක් අදහස් දෙකක් නැත. විද්‍යමාන නොවේ, නොලැබෙයි. ප්‍රහීනය, මුලින් සිඳුනේය. ශාන්තය, සන්සිඳුනේය, ඉපදීමට අයොග්‍යය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය.

4. “මුදන ලද සිත මෙසේ දරව්” යනු නිර්වාණයට නැමුන නිර්වාණයට බරවූ, නිර්වාණයෙහි ඇළුන, මිදුන සිතැත්තෙකු කොට මා දරව යනුයි. එහෙයින් පිංගිය ස්ථවිරයන් වහන්සේ කීහ.

## ඛග්ග විශාන සූත්‍ර නිර්දෙශය.

18-1

1. “තෘෂ්ණාව ප්‍රහීණවූද නොවූද සියලු භූතයන් කෙරෙහි දඬුවම් බහා තබා” යන්නෙහි සියලු යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරි නොකොට වටකොට ගන්නා වචනයකි. මේ සියලු යනුයි. ‘භූතයෝ’ යනු තසයෝද ථාවරයෝද යනුයි. තසයෝ නම් යම් කෙනෙකුන්ගේ ත්‍රස්තවන්නාවූ තෘෂ්ණාව ප්‍රහීන නොවූයේද යම් කෙනෙකුන්ගේ භය භෙවරයෝ අප්‍රහීනද, ඔව්හු තසයෝ නම් වෙත්.

2. “ථාවරයෝයයි කවර කරුණකින් කියද්ද?” ඔව්හු ත්‍රස්ත නොවෙද්ද බිය නොවෙද්ද, සංත්‍රාසයට නොපැමිණෙද්ද, ඒ කාරණයෙන් ථාවරයයි කියත්. “දණ්ඩ” යනු දඬුවම් තුනකි. කාය දණ්ඩය, වචී දණ්ඩය, මනො දණ්ඩය යනුයි. ත්‍රිවිධවූ කාය දුශ්චරිතය කාය දණ්ඩ නමි, සතර වැදෑරුම් වාග් දුශ්චරිතය වාග් දණ්ඩ නමි. ත්‍රිවිධවූ මනොදුශ්චරිතය මනොදණ්ඩ නමි.

3. “සියලු භූතයන් කෙරෙහි දණ්ඩනයන් බහා තබා” යනු සියලු භූතයන් කෙරෙහි දණ්ඩනයන් යටපත්කොට සන්සිඳුවා යනුයි.

4. “ඔවුන්ගෙන් එක් අයෙකුටවත් හිංසා නොකොට යනු එකම සත්වයෙකුටවත් අතින් හෝ (ii) කැට කැබලිති ආදියෙන්

හෝ දණ්ඩකින් හෝ ආයුධයකින් හෝ රැහනකින් හෝ හිංසා නොකරන්නාහු, (iii) සියලු සත්වයන්ටද අතින් හෝ (මෙහි (ii) යොදාගත යුතුයි.) යනුයි.

5. "පුත්‍රයෙකු කැමති නොවන්නේය. යහළුවෙකු කොයින්ද?" යන්නෙහි නැත, යනු ප්‍රතික්ෂෙපයයි. 'පුත්‍ර' යනු (ii) පුත්‍රයෝ සතර දෙනෙකි. ක්ෂෙත්‍රයෙන් උපන් පුත්‍රයාය, තමාගෙන් හටගත් පුත්‍රයාය, හදාගත් පුත්‍රයාය, අතවැසි පුත්‍රයාය යනුයි. යමකුගෙන් සමග පැමිණීමක් පහසු ගමනක් යහපත් යාමක් හෝ ඊමක් පහසු තැනක් පහසු හිඳගැන්මක් පහසු නිදීමක් පහසු ආමන්ත්‍රණයක් බලාපොරොත්තුවේද, ඔව්හු සහායයෝ නම්. "පුත්‍රයෙකු කැමති නොවන්නේය" යනු පුතෙකු කැමති නොවන්නේය, බලාපොරොත්තු නොවන්නේය.

6. "යහළුවෙකු කොයින්ද?" යනු සන්දෘෂ්ටයෙකු හෝ සම්භක්තයෙකු හෝ සහායයකු හෝ කැමති වන්නේද, බලාපොරොත්තු වන්නේද යනුයි.

7. "කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය" යනු ඒ පසේ බුදුන් වහන්සේ තනිසේක. උන්වහන්සේ පැවිදි වීමෙන් තනිවූ සේක. දෙවැන්නෙකු නැති බැවින් තනිවූ සේක. තෘෂ්ණාව දුරුකළ බැවින් තනිවූ සේක. ඒකාන්ත වීතරාග බැවින් තනිවූ සේක. ඒකාන්තවීත දොෂ බැවින් තනිවූ සේක. ඒකාන්ත වීතමොහ බැවින් තනිවූ සේක. ඒකාන්තයෙන් කෙලෙස් නැත්තේනුයි තනිවූ සේක. කෙසේ ඒ පසේ බුදුන් වහන්සේ ඒකායන මාර්ගයට ගියේනුයි තනිවූ සේක්ද? ඒකායන මාර්ගය යයි (ii) සතර සතිපට්ඨානයන්ට කියයි. සතර සම්‍යක් ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට, පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්චබලයන්ට, සප්ත බොධ්‍යංගයන්ට ආර්ය අෂ්ටාංගික මාර්ගයට කියයි.

8. ඒ සියල්ල ඒ ප්‍රත්‍යෙක බොධිඥානයෙන් අවබොධ කළ සේක, පැමිණි සේක, ප්‍රත්‍යක්ෂ කළ සේක. මෙසේ ඒ පසේ බුදුන් වහන්සේ නිරුත්තර ප්‍රත්‍යෙක සම්බොධියට පැමිණි බැවින් තනිවූ සේක.

**9.** "හැසිරෙන්නේය" යනු හැසිරීම් අටෙකි. ඉරියා පථචරියාව, ආයතන චරියාව. සතිචරියාව, සමාධි චරියාව ඥාන චරියාව, මග්ග චරියාව, පටිපත්ති චරියාව ලොකත්ථ චරියාව යනුයි. ඉරියා පථචරියා සතර ඉරියව්වලයි. ආයතන ඉරියාව සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයනයෙහියි. සති චරියාව සතර සතිපට්ඨානයන්හියි. සමාධි චරියාව සතර ධ්‍යානයන්හියි. ඥාන චරියාව සතර සත්‍යයන්හියි මග්ග චරියාව සතර මාර්ගයන්හියි ප්‍රතිපත්ති චරියාව සතර ශ්‍රාමාන්‍ය ඵලයන්හියි. ලොකාර්ථ චරියාව තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහියි පසේ බුදුන් වහන්සේ කෙරෙහියි තථාගත ශ්‍රාවකයන් වහන්සේ කෙරෙහියි ඉරියා පථචරියාව ප්‍රණිධි සම්පන්නයන්ට වෙයි. ආයතන චරියාව ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තන්ට වෙයි. සති චරියාව අප්‍රමාද විහාරීන්ට වෙයි. සමාධි චරියාව අධිචිත්තයෙහි යෙදුනවුන්ට වෙයි. ඥාන චරියාව බුද්ධි සම්පන්නයන්ට වෙයි. මාර්ග චර්යාව සම්‍යක් ප්‍රතිපන්නයන්ට වෙයි. ප්‍රතිපත්ති චර්යාව ලැබූ ඵලය ඇත්තවුන්ට වෙයි. ලොකාර්ථ චරියාව තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලාටද පසේ බුදුන් වහන්සේලාටද ශ්‍රාවකයන් වහන්සේලාටද වෙයි. මේ අටවැදෑරුම් චරියාවෝ වෙත්.

**10.** නැවතද චරියා අටක් වෙති. මුදන්නේ ශ්‍රද්ධාවෙන් හැසිරෙයි. වැටහෙන්නේ සිහියෙන් හැසිරෙයි. කලබල නොවූයේ සමාධියෙන් හැසිරෙයි. දැනගන්නේ ප්‍රඥාවෙන් හැසිරෙයි. විශෙෂයෙන් දැනගන්නේ විඥානයෙන් හැසිරෙයි. මෙසේ පිළිපන් කුශල ධර්මයෝ රැස්කෙරෙත්නුයි ආයතන චරියාවෙන් හැසිරෙයි. මෙසේ පිළිපන්නේ විශෙෂයටද පැමිණේනුයි. විශෙෂ චරියාවෙහි හැසිරෙයි. අවික්ෂෙප චරියාවෙහි හැසිරෙයි. මේ අට වැදෑරුම් චරියාවෝ වෙත්. අනිකුදු චරියා අටක් වෙත්. දස්සන චරියා, ඥාන චරියා, සම්‍යක් දෘෂ්ටියෙන් සිත අරමුණට නැංවීමේ චරියාව, සම්‍යක් සංකල්පයෙහි පිළිගැන්මේ චරියාව, සම්‍යක් වචනයෙහි හටගැන්මේ චරියාව, සම්‍යක් කර්මාන්තයේ පිරිසිදු වීමේ චරියාව, සම්‍යක් ආජීවයාගේ මනාකොටගැන්මේ චරියාව, සම්‍යක් ව්‍යායාමයේ උපස්ථාන චරියාව, සම්‍යක්සතියේ

සම්‍යක් සමාධියේ කලබල නොවීමේ චරියාව, මේ අෂ්ට චරියාව කඟවේනාගේ අඟමෙන්වේ. කඟවේනාට එකම අඟකි. දෙකක් නැත. එමෙන්ම ඒ පසේ බුදුන් වහන්සේ එබඳු පැවතීම් ඇතිසේක.

11. යම්සේ වැඩි ලුණු ඇති දෙය ලුණු ස්වභාවය ඇත්තේයයි කියාද, ඉතා තිත්ත දෙය තික්ත ස්වභාවය ඇත්තේයයි කියාද ඉතා මධුරදෙයට මධුර ස්වභාව ඇත්තේයයි කියාද, ඉතා උෂ්ණයෙන් යුක්ත දෙයට ගිනි ඇත්තේයයි කියාද ඉතා සිහිල් දෙයට හිම ඇත්තේයයි කියාද, මහා දියකඳට සමුද්‍රය ඇත්තේයි කියාද, මහාභිඥා බල ප්‍රාප්තවූ ශ්‍රාවකයාට ශාස්තෲන් වහන්සේ ඇත්තේය, කියාද, එපරිද්දෙන්ම ඒ පසේ බුදුන් වහන්සේ එබඳු කල්ප ඇත්තේය එබඳු ස්වභාව ඇත්තේය. මිදුන බන්ධන ඇත්තේය, මනාකොට ලොකයෙහි හැසිරෙයි, වාසය කරයි. ඉරියව් පවත්වයි, පාලනය කරයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-2

1. "සංසර්ගය ඇත්තහුට ස්නෙහයෝ ඇතිවෙත්" යන්නෙහි සංසර්ග දෙකක් වෙති. දර්ශන සංසර්ගයද ශ්‍රවණ සංසර්ගයද යනුයි. දර්ශන සංසර්ගය කවරේද? (ii) මෙහි ඇතැම් පුද්ගලයෙක් දැකුම් කළුවූ සතුට උපදවන්නාවූ උතුම්වූ පැහැසපුවෙන් යුක්තවූ ස්ත්‍රියක් හෝ කුමාරියක් හෝ දකීද, දැක ඒ ඒ ලකුණු නිමිති වශයෙන් ගනීද? (iii) කෙස් හෝ ශොභනය, මුඛය හෝ ශෝභනය, ඇස් හෝ ශොභනය, කන් හෝ ශොභනය, නාශය හෝ ශොභනය. තොල් හෝ ශොභනය, දත් හෝ ශොභනය, බෙල්ල හෝ ශොභනය, තනය හෝ ශොභනය, පපුව හෝ ශොභනය බඩ හෝ ශොභනය, කටිය හෝ ශොභනය, කලවය හෝ ශොභනය, කෙන්ඩා හෝ ශොභනය, අත් හෝ ශොභනය පා හෝ ශොභනය, ඇඟිලි ශොභනය, නියපොතු ශොභන යයි දැක බලා සතුටු වෙයි. බලාපොරොත්තුවෙයි. බැඳෙයි රාග බන්ධනයට පැමිණෙයි. (iv) මේ දර්ශන සංසර්ගයයි.

2. ශ්‍රවණ සංසර්ගය කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් ස්ත්‍රියක් හෝ කුමාරියක් හෝ ගැන අසා (මෙහි (18-2) 1 (ii) (iii) යොදාගත යුතුයි.) අසා සතුටුවෙයි. මේ ශ්‍රවණ සංසර්ගයයි.

3. "ස්නෙහය" යනු ස්නෙහ දෙකකි. තෘෂ්ණා ස්නෙහයද දෘෂ්ටි ස්නෙහයද යනුයි. තෘෂ්ණා ස්නෙහය කවරේද? යම් පමණ තෘෂ්ණාවෙන් සීමා කරණ ලද වට කරණ ලද මමත්වය වශයෙන් ගන්නාලද, මෙය මාගේය, මෙපමණ මාගේය, මෙපමණකින් මාගේය, රූපයෝ මාගේය, ශබ්දයෝ මාගේය, ගන්ධයෝ මාගේය, රසයෝ ස්පර්ශයෝ අතුරන ඇතිරිලි පාබිසි, දාසි දාසයෝ, එළු බැටළුවෝ, ඌරු කුකුල්ලු ඇත්, ගව, අශ්ව, වෙළෙම්බු, කෙත්, වතු, රන්, අමුරන්, ගම්, නියම්ගම් රාජධානිහුද රටවල්ද ජනපදද, කොටුගුල්ද, භාණ්ඩාගාරද, මේ සියලු මහා පෘථිවියද තෘෂ්ණා වශයෙන් සිතයි. යම්පමණ එක්සිය අටක් ප්‍රමාණවූ තෘෂ්ණාව වෙයි. මේ තෘෂ්ණා ස්නෙහයයි.

4. දෘෂ්ටි ස්නෙහය කවරේද? විසිවැදෑරුම් ආත්ම දෘෂ්ටිය, දශවැදෑරුම් මිථ්‍යා දෘෂ්ටිය, දශවැදෑරුම් අන්ත ග්‍රාහික දෘෂ්ටිය, යන මෙබඳු දෘෂ්ටි ගැනීම, දෘෂ්ටි කාන්තාරය, දෘෂ්ටි නපුරු කටුව, දෘෂ්ටි කම්පාව, දෘෂ්ටි සංයෝජනය, ගැනීම, බැසගැන්ම, පරාමර්ශය, වැරදි මාර්ගය මිථ්‍යාපථය, විපරීත ගැන්ම, යන යම්බඳු දෙසැට දෘෂ්ටීහු ඇද්ද එයයි.

5. "සංසර්ගය ඇත්තහුට ස්නෙහයෝ ඇතිවෙත්" යනු දර්ශන සංසර්ග හේතුවෙන්ද ශ්‍රවණ සංසර්ග හේතුවෙන්ද තෘෂ්ණා ස්නෙහයද දෘෂ්ටි ස්නෙහයද වෙත්, හටගනිත් උපදිත්, පහළවෙත්.

6. "ස්නෙහය අනුව මේ දුක වැඩෙයි." යන්නෙහි ස්නෙහය නම් ස්නෙහ දෙකකි. එනම්, තෘෂ්ණා ස්නෙහයද දෘෂ්ටි ස්නෙහයද යනුයි. (18-2) 3 යොදාගත යුතුයි.) "මේ දුක වැඩෙයි" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. සතුන්ද මරයි. හොරකම්ද කරයි. ගෙවල් බිඳීම්ද කරයි බලාත්කාරයෙන් ධනය පැහැර ගනියි. උපද්‍රවද කරයි. අන්

අඹුවන් කරාද යයි බොරුද කියයි ඒ ඔහු අල්ලා රජුට දක්වයි. (මහා නිද්දෙසයේ (15-1) 1 ඔහු අල්ලා යන තැන සිට යොදාගත යුතුයි.)

7. මේ දුක් දොම්නස් ඔහුට කොයින්ද? සැක හෙතුවෙන් නන්දි නම්වූ තෘෂ්ණා හේතුවෙන්, රාග හේතුවෙන් නන්දි රාග හේතුවෙන් නිරය දුක්ද, තිරිසන් යොනි දුක්ද, ප්‍රෙත විෂයික දුක්ද මානුෂික දුක්ද, කොයින් උපන්නාහුද, කොයින් හටගත්තාහුද, කොයින් ඇතිවූවා හුද, කොයින් පහළවූවාහුද, ස්නෙහ හේතුවෙන් තෘෂ්ණා හේතුවෙන්, රාග හේතුවෙන්, නන්දි රාග හේතුවෙන් වෙති ඇතිවෙත්, පහළ වෙත් යනුයි. ස්නෙහයෙන් ඇතිවන ආදීනවය බලන්නේ යන්නෙහි ස්නෙහ දෙකකි. තෘෂ්ණා ස්නෙහයද දෘෂ්ටි ස්නෙහයද යනුයි. (මෙහි (18-2) 3 යොදා ගත යුතුයි.) ස්නෙහයෙන් ඇතිවන ආදීනවය බලන්නේ යනු තෘෂ්ණා ස්නෙහයද දෘෂ්ටි ස්නෙහයද දකිනු ලබන්නේ බලනු ලබන්නේ පරීක්ෂා කරණු ලබන්නේ යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ කීහ.

## 18-3

1. "මිත්‍රයන් කෙරෙහිද යහළුවන් කෙරෙහිද අනුකම්පා කරන්නේ පිළිබඳ සිත් ඇත්තේ" යන්නෙහි 'මිත්‍රයෝ' යන්නෙහි මිත්‍රයෝ දෙකොටසෙකි. ගිහි මිත්‍රයෝද පැවිදි මිත්‍රයෝද යනුයි. ගිහි මිත්‍රයෝ කවරහුද? මෙහි ඇතැම් පුද්ගලයෙක් දීමට දුෂ්කර දෙයක් දේද, බැහැර කිරීමට දුෂ්කර දෙයක් බැහැර කෙරේද, කිරීමට දුෂ්කර දෙයක් කෙරේද, ඉවසීමට දුෂ්කර දෙයක් ඉවසාද, තමාගේ රහස් මිත්‍රයාට කියාද, මිත්‍රයාගේ රහස් සඟවාද, විපත්තියකදී මිත්‍රයා අත් නොහරීද, ජීවිතය පවා මිත්‍රයා පිණිස පරිත්‍යාග කෙරේද, මිත්‍රයා පහත් කොට නොසිතාද මේ ගිහි මිත්‍රයා නම් වේ.

2. "පැවිදි මිත්‍රයා කවරේද?" මෙහි මහණතෙම ප්‍රියවූයේද, ගරුබව වඩන්නේද යහපත් වචන කියන්නේද, ගැඹුරු අර්ථවත් දේ කථා කරන්නේද, වැරදි මාර්ගයෙහි නොයොදාද, අධිශීලයෙහි සමාදන් කරවාද, සතර සතිපට්ඨාන භාවනාවන්

යෙදීමෙහි යොදවාද, සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන්, පඤ්චෙන්ද්‍රියයන්, පංචබලයන්, සප්ත බොධ්‍යංගයන්, හා ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේද භාවනාවේ යෙදීමේ යොදවාද, මේ පැවිදි මිත්‍රයා නම් වේ.

3. සුහද හෙවත් යහළුවා නම් යම් කෙනෙකුන් සමග යාම, ඊම, සිටීම, හිඳගැනීම, නිදීම, කථාකිරීම යහපත් වේද හෙතෙමේයි. මිත්‍රයා කෙරෙහිද සුහද හෙවත් යහලුවා කෙරෙහිද, දැකී, ඇසුරු කළ යහළුවන් කෙරෙහිද අනුකම්පා කරණු ලබන්නේ බලනු ලබන්නේ, අනුග්‍රහ කරණු ලබන්නේ ආත්මාර්ථයද, පරාර්ථයද, උභයාර්ථයද දුරු කරයි. මෙලොව අර්ථය දුරු කරයි, පරලොව අර්ථය දුරු කරයි, පරමාර්ථය දුරු කරයි, ඉවත් කරයි, අතුරුදන් කරයි.

4. "බැඳුන සිත් ඇත්තේ" යනු කරුණු දෙකකින් බැඳුන සිත් ඇත්තේ යනුයි. තමා හෝ පහත් තැන තබන්නේ අනුන් හෝ උසස් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වෙයි, තමා හෝ උසස් තැන තබන්නේ අනුන් හෝ පහත් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වෙයි. කෙසේ තමා පහත්කොට තබන්නේ අන්‍යයා උසස් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වේද 'තෙපි මට බොහෝ උපකාරීහුය, මම තෙපි නිසා සිවුරුද, පිණ්ඩපාතයද සෙනාසනද, ගිලන්පස බෙහෙත් පිරිකරද ලබමි. අනිකෙකුට දෙන්ට හෝ සිතන කල්හි තෙපි නිසා තෙපි ආශ්‍රය කරමින් මෙහි මාගේ පුරාණ මවුපියන්ගේ නාම ගෝත්‍රය අතුරුදන්වූ කල්හි මේ අසවලාගේ කුළුපගයෙක. මේ අසවල් තැනැත්තියගේ කුළුපගයෙකැයි ඔබවහන්සේලා විසින් එහි ගෙනයනු ලැබීමි.' මෙසේ තමා නීච ස්ථානයෙහි තබන්නේ අන්‍යයා උසස් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වෙයි.

5. "කෙසේ තමා උසස් තැන තබන්නේ අන්‍යයා පහත් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වේද?" 'මම යුෂ්මතුන්ට බොහෝ උපකාරීවෙමි. තෙපි මා නිසා බුදුන් සරණ කොට ගියහ. ධර්මය සරණකොට ගියහ, සංඝයා සරණකොට ගියහ, සතුන් මැරීමෙන්, හොරකම් කිරීමෙන්, කාමයෙහි වරදවා

හැසිරීමෙන්, බොරු කීමෙන් රහමෙර පානයෙන් වෙන්වූහ. මම තොපට පෙළ කියවමි. ප්‍රශ්න විසඳා දෙමි, පොහොය කියමි. නව කර්ම සිහිකරවමි. එසේ නමුත් තෙපි මා ඉක්මවා අන්‍යයන්ට ගරු කරන්නහුද, සත්කාර කරන්නහුද බහුමාන කරන්නහුද? යනුවෙනි මෙසේ තමා උසස් තැන තබන්නේ අන්‍යයා පහත් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වෙයි. මෙසේ අර්ථය දුරු කරයි.

**6.** "එක්ව බැඳීමෙහි මේ භය දකින්නේ" යන්නෙහි භය යනු ජාති භය, ජරා භය, ව්‍යාධි භය, මරණ භය, රාජ භය, චෞර භය, උදක භය, දණ්ඩ භය, දුර්ගති භය, දියරැල භය, කිඹුල් භය, දියසුළි භය, නපුරු වනසතුන්ගේ භය, අපකීර්ති භය, භයානකවූ තැති ගැන්ම, රෝමහර්ෂය, සිතේ සංවේගය, යනුයි 'එක්ව බැඳීම' යනු බැඳීම් දෙකකි. තෘෂ්ණා බැඳීමද දෘෂ්ටි බැඳීමද යනුයි.) (18-2) 3 'ස්නේහය' යනු 'බැඳීම්' යයි වෙනස්කොට යෙදිය යුතුයි.) මේ තෘෂ්ණා බැඳීමයි. මේ දෘෂ්ටි බැඳීමයි. මේ භය එක්ව බැඳීමෙහි බලන්නේ, දකින්නේ පරීක්ෂා කර බලන්නේ, කඟවේනෙකුගේ අඟ මෙන් තනිවහැසිරෙන්නේය, යනුයි එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශකළහ.

## 18-4

**1.** "උණ පඳුර විශාලවූයේ පළල්වූයේ යන්නෙහි," වංස යනු උණ පඳුරට කියයි. උණ පඳුරෙහි යම්සේද පෞරාණික වංශයෙහි සත්වයෝ ඇළුනාහ, ලැගුනාහ, එපරිද්දෙන්ම විසත්තිකා යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද යෙදීමක් ඇද්ද නන්දියක් ඇද්ද, නන්දි රාගයක් ඇද්ද තෘෂ්ණාවගේ යම් ඇලීමක් ආශාවක් ප්‍රශ්න කිරීමක් ඇද්ද, මේ විසත්තිකා නමි. රූපයෙහි, ශබ්දයෙහි, ගන්ධයෙහි, රසයෙහි, ස්පර්ශයෙහි, කුලයෙහි, ගණයෙහි, ආවාසයෙහි, ප්‍රශංසාවෙහි, සැපයෙහි, චීවරයෙහි, පිණ්ඩපාතයෙහි, සෙනාසනයෙහි, ගිලන්පස, බෙහෙත් පිරිකරෙහි, කාම ධාතුවෙහි, රූප ධාතුවෙහි, අරූප ධාතුවෙහි, කාම භවයෙහි, රූප භවයෙහි, අරූප භවයෙහි, සඤ්ඤා භවයෙහි, අසඤ්ඤා භවයෙහි, නෙවසඤ්ඤා

නාසඤ්ඤා භවයෙහි, එකවොකාර භවයෙහි, චතුවොකාර භවයෙහි, පඤ්ච වොකාර භවයෙහි, අතීතයෙහි, අනාගතයෙහි, පවත්නා කාලයෙහි, දැකි ඇසූ, ස්පර්ශ කළ, දැනගත් ධර්මයන්හි මහත්සේ ඇලේනුයි විසත්තිකා නම්.

2. "පුත්‍රයන් කෙරෙහිද අඹුවන් කෙරෙහිද යම් බලාපොරොත්තුවක් ඇද්ද," යන්නෙහි පුත්‍රයෝ යනු පුත්‍රයෝ, සතර දෙනෙකි. (18-5) 3 යෙදිය යුතුයි.) අඹුවෝ යයි භාර්යාවන්ට කියත්. අපෙක්ෂාව යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි.

3. "හුණ කිළිල (ගොබය) මෙන් නොගැටෙන්නේ" යන්නෙහි වංශයයි හුණ පඳුරට කියයි. යම්සේ හුණ පඳුර තරුණ කාලයෙහි ගොබ කාලයෙහි නොඇළුනේ නොලැගුනේ නොසෙල්වෙන්නේ නික්මේද, එමෙන්ම ඇලීම් දෙකකි. තෘෂ්ණා ඇලීමද දෘෂ්ටි ඇලීමද යනුයි. (18-2) 3 යෙදිය යුතුයි.) මේ තෘෂ්ණා ඇලීමයි මේ දෘෂ්ටි ඇලීමයි. ඒ පසේ බුදුන්වහන්සේට තෘෂ්ණා ඇලීම ප්‍රහීනය, දෘෂ්ටි ඇලීම සන්සිඳුනේය. තෘෂ්ණා ඇලීම ප්‍රහීනවූ බැවින් දෘෂ්ටි ඇලීම සන්සිඳුන බැවින් ඒ පසේ බුදුන්වහන්සේ රූපයෙහි නොඇලෙයි. ශබ්දයෙහි නොඇලෙයි. ගන්ධයෙහි නොඇලෙයි. රසයෙහි නොඇලෙයි, ස්පර්ශයෙහි නොඇලෙයි, කුලයෙහි, ගණයා කෙරෙහි, ආවාසයෙහි, ලාභයෙහි කීර්තියෙහි, ප්‍රශංසාවෙහි සැපයෙහි, චීවරයෙහි, පිණ්ඩපාතයෙහි සෙනාසනයෙහි, ගිලන්පස බෙහෙත් පිරිකරෙහි නොඇලෙයි නොගනියි, මුසපත් නොවෙයි නික්මුනේ, වෙන්වූයේ සීමා නොකළ සිතින් වසයි, එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-5

1. "අරණ්‍යයෙහි මුවා නොබැඳුනේ කැමතිසේ ගොදුරු පිණිස යයි" මුවා නම් මුවෝ දෙකොටසකි. ඒනී මුවාද පසද මුවාද යනුයි. වනයෙහි වූ මුවා වනයෙහි වාතාවරණයෙහි හැසිරෙන්නේ නිදහස්ව යයි. නිදහස්ව සිටියි, නිදහස්ව ලගියි,

නිදහස්ව නිදයි. එයට හේතු කවරේද, මහණෙනි, වැද්දාට ඉදිරිපත් නොවන බැවිනි. මහණෙනි, එමෙන්ම මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට සමවැද වාසය කරයි.

**2.** "මහණෙනි, මෙය (ii) මාර පදය (මාරයාට අයත් ප්‍රදෙශය) ඉක්ම වූයේයයිද පාපීවූ මාරයාට පෙණීමෙන් වෙන්වූයේ යයිද කියයි (iii) මහණෙනි, නැවතද මහණතෙම විතර්ක විචාරයන් සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති, සිතේ එකඟත්වය ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**2.** "මහණෙනි, නැවත මහණතෙම ප්‍රීතියෙන් නොඇලීමෙන් සිහි ඇත්තේ මනා නුවණැත්තේ උපෙක්ෂා සහිතව වාසය කරයි. සැපයේ පහස කයින් විඳියි. යම් ඒ දෙයක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහාරීයයි ආර්යයෝ කියද්ද ඒ තෘතීය ධ්‍යානයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය (මෙහි 2 යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, නැවතද මහණතෙම සැපයාගේ ප්‍රහානයෙන්ද දුඃඛයාගේ ප්‍රහානයෙන්ද පූර්වයෙහිම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරු කිරීමෙන් දුක් නැති සුව නැති උපෙක්ෂාව හා සිහියෙන්ද පිරිසිදුවූ සතරවන ධ්‍යානයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය (18-5) 2 යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන් රූප සංඥාව ඉක්මවා, ප්‍රතිඝ සංඥාව අස්තයට පමුණුවා, නානත්ත සංඥාව මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතනයට සමවැද වාසය කරයි. මහණෙනි, මෙය ( (18-5) 2 යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට සමවැද වාසය කරයි.

සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට සමවැද වාසය කරයි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවැද වාසය කරයි. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. සංඥාව දැක ආශ්‍රවයෝ ගෙවීගියාහු වෙති. මහණෙනි, මෙය ( (18-5) 2 යෙදිය යුතුයි.) ලෝකයෙහි විසත්තිකා නමැති තෘෂ්ණාවෙන් එතර වූයේය.

7. "යම් ඒ තැනැත්තෙක් නිදහස්ව යේද, සිටීද, හිඳීද, නිදාද, එයට හේතු කවරේද, පාපීවූ මාරයා ඉදිරියේ නොපෙණෙන බැවිනි.

8. "නුවණැති ජනතෙම සේරී ධර්මය බලන්නේ" යන්නෙහි නුවණැති යනු පණ්ඩිතවූ ප්‍රඥා ඇති, බුද්ධිමත්, ඥාන ඇති යනුයි. 'ජනතෙම' යනු සත්වයා මානවකයා පුද්ගලයා ජීවයා යනුයි. (ii) 'සේරී' යනු සේරී ධර්ම දෙකකි. ධම්ම සේරී පුද්ගල සේරී යනුයි, ධම්ම සේරි (නිදහස් ධර්මය) කවරේද? සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය, පංච බල, සප්තබොධ්‍යංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේ ධර්ම සේරී නම්වේ. පුද්ගල සේරී (නිදහස් පුද්ගලයා) කවරේද? යමෙක් මේ සේරී ධර්මයන්ගෙන් යුක්තවේද හෙතෙම සේරී පුද්ගලයායයි කියයි. "නුවණැති පුද්ගලතෙම සේරී ධර්මය බලන්නේ" යනු දකින්නේ, පරීක්ෂා කරන්නේ කඟවේනා මෙන් තනිව හැසිරෙන්නේය එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-6

1. "යහළුවන් මැද විසීමේද, සිටීමේද, හිඳීමේද, ඇවිදීමේද ඇමතීම (අඬ ගැසීම) වෙයි." යන්නෙහි 'යහළුවෝ, නම් යම් කෙනෙකුන් සමග පැමිණීම පහසුවේද, යාම පහසුවේද, යාම, ඊම, පහසුවේද, හිඳගැනීම, නිදීම, කථා කිරීම, සාකච්ඡා කිරීම පහසුවේද, ඔවුහු යහළුවෝ වෙති. විසීමේද සිටීමේද ගමනෙහිද යන මේ ආදියෙහි තමහට වැඩ පිණිස පවත්නා කථා කිරීම්,

අනුන්ට වැඩ පිණිස පවත්නා කථා කිරීම් දෙපසටම වැඩ පිණිස කථා කිරීම් මෙලොව වැඩපිණිස කථාකිරීම්, පරලොව වැඩ පිණිස කථාකිරීම්, යනුයි.

2. "නිදහස්ව හැසිරීම (සේරී ධර්මය) ලෝභය ඇතියන්ගේ ධර්මයක් නොවේ යයි බලන්නේ" යනු මෙය මෝඩවූ අසත්පුරුෂවූ, තීර්ථකයන්ගේ තීර්ථක ශ්‍රාවකයන්ගේ ධර්මයක් නොවේ. පණ්ඩිතවූ සත්පුරුෂවූ කාශාය වස්ත්‍රධාරී බුදු පසේබුදු බුද්ධ ශ්‍රාවකයන්ගේ ධර්මයකි. "සේරී" යනු සේරී ධර්ම දෙකොටසකි. (18-5) 8 (ii) යෙදිය යුතුයි.) සේරී ධර්මය බලන්නේ යනු සේරී ධර්මය දකින්නේ බලන්නේ, පරීක්ෂාකරන්නේ යනුයි.

18-7

1. "යහළුවන් මැද ක්‍රීඩාවෙහි ඇල්මද වෙයි" යන්නෙහි ක්‍රීඩා යනු ක්‍රීඩා දෙකකි, කායික ක්‍රීඩාවද වාචසික ක්‍රීඩාවද යනුයි. කායික ක්‍රීඩාව කවරේද, ඇතුන්ගෙන් ක්‍රීඩා කරත් අසුන්ගෙන් ක්‍රීඩා කරත්, දුනුවලින් ක්‍රීඩා කරත්, කඩුවලින් ක්‍රීඩා කරත්, (කට්ටි අටක් ඇති) දාන් ලෑලි ආදියෙන් ක්‍රීඩා කරත්, අහසෙහිද ක්‍රීඩා කරත්, ශරීරයෙහි එක් පෙදෙසකින්ද ක්‍රීඩා කරත්, ගල්කැට ආදියෙන්ද ක්‍රීඩා කරත්, කළවලින්ද සෙල්ලම් කරත්, ඉරටු ගත් අතින්ද ක්‍රීඩා කරත්, (මහා නිද්දෙසයේ (14-12) 6 යෙදිය යුතුයි.) මේ වාචසික ක්‍රීඩා නම් වෙති. 'රතිය' යනු ඇලීමට වචනයකි. රති යනු යහළුවන්ට කියයි යම් කෙනෙකුන් සමග (18-6) 1 'යහළුවෝ' නම් යන තැන සිට යෙදිය යුතුයි.) මේ යහළුවෝ නම් වෙත්.

2. "පුත්‍රයන් කෙරෙහිද ප්‍රේමය මහත්වෙයි" යන තන්හි පුත්‍රයෝ යනු පුත්‍රයෝ සතර දෙනෙකි. තමාගෙන් උපන් පුත්‍රයාය, කෙතින් උපන් පුත්‍රයාය, හදාගත් පුත්‍රයාය, අතවැස්සාය, යන මොව්හු වෙති. 'ඒ පුත්‍රයන් කෙරෙහි මහත්වූ ප්‍රේමය වෙයි' යනු ප්‍රෙමය බොහෝවෙයි යනුයි.

3. "ප්‍රිය විප්‍රයොගය පිළිකුල් කරන්නේ" යන්නෙහි ප්‍රියයෝ දෙකොටසකි. සත්වයෝ හෝ සංස්කාරයෝ යනුයි. ප්‍රියවූ සත්වයෝ කවරහුද, මෙහි ඇතැම් පුද්ගලයෙකුට වැඩ කැමති,

හිත කැමති, පහසු කැමති, කාමාදී බැම්වලින් නිදහස කැමති, මව හෝ පියා හෝ සහෝදරයා හෝ සහෝදරිය හෝ පුත්‍රයෙක් හෝ දුවක් හෝ මිත්‍රාමාත්‍යයෝ හෝ ලේ සහලේ නෑයෝ හෝ වෙද්ද, මේ ප්‍රියවූ සත්වයෝ වෙති.

4. "ප්‍රියවූ සංස්කාරයෝ කවරහුද, මන වඩන රූපයෝය, ශබ්දයෝය, සුවඳය, රසයෝය ස්පර්ශයෝය යන මේ ප්‍රිය සංස්කාරයෝ වෙති. ප්‍රිය විප්‍රයෝගය පිළිකුල් කරන්නේ යනු ප්‍රියයන්ගෙන් වෙන්වීම පිළිකුල් කරන්නේ කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ.

18-8

1. "සතර දිශාවෙහි සත්වයන් සමග ක්‍රොධ නොවූයේ වෙයි." යනු ඒ පසේ බුදුන්වහන්සේ මෛත්‍රී සහගත සිතින් (ii) එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද, තුන්වන දිශාවද, සතරවන දිශාව හා උඩ යටද සරසද යන සියලු තන්හි සියලු ලෝකය විපුලවූ මහද්ගතවූ අප්‍රමාණවූ මෛත්‍රී සහගත සිතින් අප්‍රමාණවූ වෛර නැති සිතින් පතුරුවා වාසය කරයි. කරුණා සහගත සිතින් (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) මුදිතා සහගත සිතින් (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) උපෙක්ෂා සහගත සිතින් වාසය කරයි.

2. "සතර දිශාවෙහි සත්වයන් සමග ක්‍රොධ නොවූයේ වෙයි" යනු මෛත්‍රිය වඩනලද බැවින් පෙරදිග සත්වයෝ වෙද්ද, ඔවුහු අප්‍රිය නොවූවාහු වෙති. දකුණු දිග යම් සත්වයෝ වෙද්ද ඔවුහු පිළිකුල් නොවූවාහු වෙති. බටහිර දිග යම් සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහුවෙති. උතුරු දිග යම් සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති, නැගෙනහිර දිග අනු දිශාවෙහි සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති. දකුණු දිග අනු දිශාවෙහි සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති. බටහිර දිග අනුදිශාවෙහි සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති. උතුරු දිග අනුදිශාවෙහි යම් සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති. යට දිශාවෙහි සත්වයෝ වෙද්ද

ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති, උඩ දිශාවෙහි සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති. යම් ඒ ඒ දිශාවල සත්වයෝ වෙද්ද ඔව්හු අප්‍රිය නොවූවාහු වෙති.

3. "ඉතරීතර සන්තෝෂයෙන් සතුටුවන්නේ" යනු ඒ පසේ බුදුන් වහන්සේ ලැබුන යම් සිවුරකින්, ඉතරීතර සන්තොෂයෙහි ගුණ කියන්නේ, සිවුරු, හේතුවෙන් නොසරුප් සෙවීමට නොසුදුසු නොවීමට නොපැමිණෙයි. සිවුරු නොලැබුනේ නොසොයයි. ලැබ සිවුරෙහි ගිජු නොවූයේ ආදීනව දක්නේ සසරින් නික්මීමෙහි නුවණැත්තේ පරිභොග කරයි, ඒ සිවුරු පිළිබඳ ඉතරීතර සන්තොෂයෙන් උසස් බව නොසිතයි. අනුන්ට අවමන් නොකරයි. යමෙක් වනාහි එහි දක්ෂවූයේ අලස නොවූයේ, මනා නුවණැත්තේ සිහි ඇත්තේ වෙයි, මෙය ඒ පසේ බුදුන් වහන්සේ පෞරාණිකවූ අග්‍රයයි දතයුතු ආර්ය වංශයෙහි පිහිටියේයයි කියයි. යම් පරිදි ලැබුන පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වෙයි. යම් පරිදි ලැබුන සේනාසනයෙන් සතුටුවූයේ වෙයි, යම්පරිදි ලැබුන ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටුවූයේ වෙයි, සතුටෙහි ගුණ කියන්නේ වෙයි. ඒ ගිලන්පස බෙහෙත් පිරිකර හේතුවෙන් නොසරුප් සෙවීමට නොසුදුසු සෙවීමට නොපැමිණෙයි. ගිලන්පස බෙහෙත් පිරිකර නොලැබ කම්පා නොවෙයි, ලැබුනේද එහි නොලැගුනේ මුසපත් නොවූයේ ආදීනවය දක්නේ සසරින් නික්මීමේ නුවණ ඇතිව පරිභොග කරයි. ඒ යම්පරිදි ලැබුන ගිලන්පස බෙහෙත් පිරිකර සතුටින් තමා උසස්යයි නොසිතයි, අනුන්ට නින්දා නොකරයි, යමෙක් වනාහි එහි දක්ෂවූයේ අලස නොවූයේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ වෙයි. මෙය ඒ පසේ බුදුන් වහන්සේ පෞරාණිකවූ අග්‍රයයි දතයුතු ආර්ය වංශයෙහි පිහිටියේයයි කියයි.

4. "උවදුරු දුරු කරන්නේ තැති නොගන්නේ" යන්නෙහි උවදුරු නම් උවදුරු දෙකොටසකි. ප්‍රකට උවදුරුද අප්‍රකට උවදුරුද යනුයි. ප්‍රකට උවදුරු කවරහුද, සිංහ, ව්‍යාඝ්‍ර දිවි, වලස්, ගව, මහිෂ, ඇත්, අස්, ගෝනුසු, පත්තෑ ආදීහුද කළ කර්ම ඇති හෝ නැති සොරුද (මහා නිද්දෙසයේ (1-4) 4 (ii) උවදුරු යන

තැන සිට යොදාගත යුතුයි.) මොව්හු අප්‍රකට උවදුරු නම් වෙති.

**5.** "කවර අර්ථයකින් උවදුරු නම්වේද?" මැඩ පවත්වන අර්ථයෙන් උවදුරු නම්. පිරිහීමට පත්වේනුයි උවදුරු නම්. එහි ඇතිවේනුයි උවදුරු නම්, කෙසේ මැඩ පවත්වානුයි උවදුරු නම්වේද, ඒ උවදුරු ඒ පුද්ගලයා මැඩපවත්වත්, යටකරත්, කරදරයට පමුණුවත්, මෙසේ මැඩපවත්වානුයි උවදුරු නම්. කෙසේ පිරිහීමට පත්වේනුයි උවදුරු නම්වේද, ඒ උවදුරු කුශල ධර්මයන්ගේ අනතුර පිණිස පිරිහීම පිණිස පවතිත් කවර කුශල ධර්මයන්ගේද සම්‍යක් ප්‍රතිපදාව, අනුලෝම ප්‍රතිපදාව, නිවැරදි ප්‍රතිපදාව, නොවෙනස් ප්‍රතිපදාව, ධර්මානුධර්ම ප්‍රතිපදාව, සීලයන් සම්පූර්ණ කිරීම, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇති බව, භෝජනයෙහි පමණ දැනීම, නිදි දුරු කිරීම යන මොවුන්ගේද, සිහි නුවණෙහිද, සතර සතිපට්ඨානයන්ගේ භාවනාවේ යෙදීමේද සතර සම්‍යක් ප්‍රධානයන්ගේද සතර ඍද්ධිපාදයන්ගේද පඤ්චෙන්ද්‍රියයන්ගේද පංච බලයන්ගේද සප්ත බොධ්‍යංගයන්ගේද ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේ වැඩීමේද යන මේ කුශල ධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත්.

**6.** "කෙසේ එහි වෙසේනුයි උවදුරු නම්වේද?" එහි ඒ ලාමකවූ අකුශල ධර්මයෝ උපදිත්, යම්සේ මේ අකුශල ධර්මයන්ට ආත්ම භාවය ආශ්‍රයවූයේද එය මෙසේයි. ගොඩෙහි ගොඩ ආශ්‍රය කරණ ප්‍රාණීහු සයනය කරත්, දියෙහි දිය ආශ්‍රය කොට ඇති ප්‍රාණීහු සයනය කරත්, දියෙහි දිය ආශ්‍රය කොට ඇති ප්‍රාණීහු සයනය කරති. වනයෙහි වනය ආශ්‍රය කොට ඇති ප්‍රාණීහු සයනය කරති, දුකෙහි දුක ආශ්‍රයකොට ඇති ප්‍රාණීහු සයනය කරති, එපරිද්දෙන්ම එහි ඒ ලාමකවූ අකුශල ධර්මයෝ ආත්ම භාවය ආශ්‍රය කොට උපදිත්. මෙසේද එය ආශ්‍රය කොට ඇත්තේනුයි උවදුරු නම් වෙති. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. අතවැස්සන් (මහා නිද්දෙසයේ (1-4) 4 (ii) 'උවදුරු' යන තැන සිට යොදා ගත යුතුයි.) මෙසේද

එහි ආශ්‍රය ඇතිවේනුයි උවදුරු නම්. ඒ උවදුරු බැහැර කළ බැවින් යට කළ බැවින් උවදුරු මැඩ පැවැත්වූයේය යනුයි.

7. "තැති නොගත්තේ" යනු ඒ පසේ බුදුන්වහන්සේ බිය නොවූයේ තැති නොගත්තේ වෙයි, ප්‍රහීන කළ බිය හා බියට හේතු ඇත්තේ, පහවූ ලොමු ඩැහැගැණීම් ඇත්තේ වාසය කරණසේක. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළසේක.

## 18-9

1. "ඇතැම් පැවිද්දෝද අමාරුවෙන් සංග්‍රහ කටයුතුය" යනු මෙහි ඇතැම් පැවිද්දෝ නිස දෙන කල්හිද පෙළ කියවන කල්හිද ප්‍රශ්නයන්ට පිළිතුරු දෙන කල්හිද සිවුරු දෙන කල්හිද පාත්‍රයන් දෙන කල්හිද ලෝහ තලි දෙන කල්හිද, පැන් කෙණ්ඩිය දෙන කල්හිද, පෙරහන දෙන කල්හිද, පසුම්බිය දෙන කල්හිද, සෙරෙප්පු දෙන කල්හිද, පටි දෙන කල්හිද ඒ ගැන කන් යොමු නොකරයි සිත නොයොදයි. වැරදි පැවතුම් ඇත්තේ මුහුණ වෙනතකට හරවයි.

3. "එසේම එබඳු ගිහියෝද වෙසෙති." යනු මෙහි ඇතැම් ගෘහස්ථයෝද ස්ත්‍රියක් දෙන කල්හි, දැසි දස්සන් දෙන කල්හි, රථයන් දෙන කල්හි. කෙත්වතු හිරණ්‍ය ස්වර්ණ දෙන කල්හි, ගම් නියම්ගම් නගර ජනපද දෙන කල්හි, එය නොඅසයි, යනුයි. බාහිර දේ ගැන අල්පෝත්සාහ ඇත්තේ යනු තමා හැර සියල්ලම මේ අර්ථයෙහි බාහිර දේ වෙති. ඒ දෙයෙහි අපෙක්ෂා රහිතවූයේ කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-10

1. "ගිහිලක්ෂණ බහා තබා" යන්නෙහි ගිහිලක්ෂණ නම් කෙස් රැවුල් මල් ගඳ විලවුන්, නොයෙක් ආභරණ පළඳනාද පොරෝනා හිස් වෙළුම්, ඇඟඋලන දේ, මදින දේ, කණ්ණාඩි අඳුන්, මුහුණේගාන වත්සුනු ආදිය, හිසකේ සිළුව, කඩුව, සේසත

විසිතුරු සෙරෙප්පු, නළල්පට, වල්විදුනා යනාදිය බහාතබා යනුයි ගිහි ලක්ෂණ බහාතබා යනු ගිහිලක්ෂණ බහා තබා අත්හැරදමා, ඉවත්කොට යනුයි.

2. "පරසතු රුකේ කොළ වැටුනාක් මෙන්" යනු යම්සේ (දෙවියන්ගේ) පරසතු රුකේ පත්‍රයෝ වැටුනාහු වෙද්ද එසේම ඒ පසේබුදුන් වහන්සේගේ ගිහි ලක්ෂණ බිඳුනාහ. වැටුනාහ යනුයි.

3. "ධෛර්යවත් තැනැත්තේ" යනු වීර්ය ඇත්තේනුයි. ධීර නම්. අප්‍රමාද වූයේනුයි ධීර නම්, සූරවූයේනුයි. බිය නැත්තේනුයි තැති නොගන්නේනුයි පහකළ බිය හා බියට හේතු දේ ඇත්තේනුයි ධීර නම්. පහකළ ලොමුඩැහැගැනීම් ඇත්තේනුයි ධීර නම්. මෙහි සියලු පාපයෙන් වෙන්ව නරකය ඉක්මවා සිටියේනුයි ධීර නම්.

4. "ගිහි බන්ධනයෝ" යනු පුත්‍රයෝද, භාර්යාවද, දාසයෝද. දාසීහුද, එළු බැටළුවෝද. ඌරු කුකුල්ළුද. ඇත් ගව අශ්ව වෙළෙම්බුද, කෙත්වතු හිරණ්‍ය ස්වර්ණ ගම් නියම් ගම් රාජධානිද රටවල්ද, ජනපදද, කොටුගුල්ද, භාණ්ඩාගාරද යන මේවා වෙති. 'මෙබඳු යම්කිසි ඇලීම ඇතිකරවන ගිහි ලක්ෂණ ධෛර්යවත් තැනැත්තේ සිඳ දමා' යනු ඒ පසේබුදුන් වහන්සේ ගිහිලක්ෂණ සිඳදමා බිඳදමා බැහැරකොට සංසිඳුවා නූපදනා බවට පමුණුවා ධෛර්යවත් තැනැත්තේ කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය. එහෙයින්, ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශකළහ.

18-11

1. "ප්‍රඥාවෙන් යුත් යහළුවකු ඉදින් ලබන්නේ නම්" යනු ඉදින් පණ්ඩිතවූ ප්‍රඥාවත්වූ, බුද්ධිමත්වූ ඥානය ඇති විභාවීවූ යහළුවකු ලබන්නේ නම් යනුයි.

2. "යහපත් විහරණ ඇති ඔහු සමග හැසිරෙන්නේය." යනු කරුණාවෙන්ද මුදිතාවෙන්ද උතුම්වූයේ යනුයි. "යහපත් හැසිරීම් ඇති" යනු (ii) ප්‍රථමධ්‍යානයෙන්ද යහපත් විහරණ ඇත්තේ ද්විතීය ධ්‍යානයෙන්ද, තෘතීය ධ්‍යානයෙන්ද චතුර්ථධ්‍යානයෙන්ද, යහපත් විහරණ ඇත්තේ, මෛත්‍රී

චෙතොවිමුක්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ, කරුණා මුදිතා උපෙක්ෂා චෙතො විමුක්තියෙන්ද, යහපත් විහරණ ඇත්තේ, ආකාශානඤ්චායතන සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ, නිරොධ සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ, ඵල සමාපත්තියෙන්ද යහපත් විහරණ ඇත්තේ යනුයි.

3. "ධීර" යනු පණ්ඩිතවූ, ප්‍රඥා ඇති, බුද්ධි ඇති ඥානය ඇති, තැනැත්තේ යනුයි" 'සියලු උවදුරු මැඩපවත්වා' යනු සියලු උවදුරු මැඩපවත්වා යටකොට, බැහැරකොට යනුයි.

4. "සිහි ඇති සතුටු සිත් ඇති තැනැත්තේ ඔහු සමග හැසිරෙන්නේය." යනු ඒ පසේබුදුන් වහන්සේ සිහි ඇත්තේ වෙයි. උතුම් සිහිය හා ප්‍රඥාවෙන් යුක්තවූයේ කොට බොහෝ කල් ඇති කියා බොහෝ කල් ඇතිදේ සිහිකිරීමෙන් අනුස්මරණය කිරීමෙන් යුක්තවූයේ වෙයි. යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-12

1. "ප්‍රඥාවත් යහළුවකු ඉදින් නොලබන්නේ නම්" යනු ප්‍රඥාවත්, බුද්ධිමත්, ඥානය ඇති, විභාවීවූ අයකු නොලබන්නේ නම් යනුයි. 'එකට හැසිරෙන්නේ' යනු සමග හැසිරෙන්නේ යනුයි. ධෛර්යවත්වූ "යහපත් විහරණ ඇති" යනු ප්‍රථමධ්‍යානයෙන්ද යහපත් විහරණ ඇති (19-11) 2 (ii) යෙදිය යුතුයි) යනුයි. 'ධෛර්යවත්' යනු උත්සාහවත් පණ්ඩිතවූ ප්‍රඥාවත් බුද්ධි ඇති ඥානය ඇති විභාවීවූ යනුයි.

2. "රට හා විජිතය හැරදැමූ රජු මෙන්" යනු යම්සේ ඔටුනු පලන්, දිනූ යුද ඇති ක්ෂත්‍රිය රජතෙම දුරුකළ සතුරන් ඇත්තේ, සම්පූර්ණ කළ අදහස් ඇත්තේ, පිරූ භාණ්ඩාගාර ඇත්තේ බොහෝ හිරණ්‍ය ස්වර්ණ ඇති නගරය බැහැරකොට කෙස් රැවුල් කපාහැර කසාවත් හැඳ පොරවා ගිහිගෙයින් නික්ම

අනගාරිය නම් ශාසනයෙහි පැවිදිව කෙලෙස් නැති බවට පැමිණ තනිව හැසිරෙයි. ඉරියව් පවත්වයි. පවතියි. පාලනය කරයි යැපෙයි. මෙසේ පසේ බුදුන්වහන්සේද සියලු ගෘහවාස පලිබොධය සිඳ අඹු දරු පලිබොධය සිඳ ඥාති පලිබොධය සිඳ මිත්‍රාමාත්‍ය පලිබොධය සිඳ, කෙස් රැවුල් කපා හැර, කසාවත් හැඳ පොරවා ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිව කෙලෙස් නැති බවට පැමිණ තනිව හැසිරෙයි. තනිව වාසය කරයි. ඉරියව් පවත්වයි. පාලනය කරයි, යැපෙයි යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-13

1. "සහාය සම්පත්තියට ඒකාන්තයෙන් ප්‍රශංසා කරමි." යන්නෙහි 'ඒකාන්තයෙන්' යනු ඒකාන්ත වචනයයි, සැක නැති වචනයයි. දෙකක් නොසිතන වචනයයි. නියෝග වචනයයි. මේ ඒකාන්තයෙන් යනුයි. 'සහාය සම්පදාව' යනු යම් ඒ සහායයෙක් රහතුන්ට අයත් සිල් සමූහයෙන් යුක්තවේද, රහතුන්ට අයත් සමාධි සමූහයෙන් යුක්තවේද, රහතුන්ට අයත් ප්‍රඥා සමූහයෙන් යුක්ත වේද, රහතුන්ට අයත් විමුක්ති සමූහයෙන්, රහතුන්ට අයත් විමුක්ති ඥානදර්ශන සමූහයෙන් යුක්තවෙද්ද, ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන්, විමුක්තිඥාන දර්ශනයෙන්, උසස්වූ හෝ සමානවූ හෝ යහළුවෝ සේවනය කටයුත්තාහ. භජනය කටයුත්තාහ. පයිරු පාසනය කටයුත්තාහ.

2. "මොවුන් නොලද කල්හි නිවැරදි භොජනය ඇත්තේ" යනු වැරදි සහිත ජීවත්වීම ඇති පුද්ගලයෙක් ඇත. නිවැරදි ජීවත්වීම ඇති පුද්ගලයෙක් ඇත. වැරදි සහිත ජීවිකාව ඇති පුද්ගලයා කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් කුහක කමින් නැලවිලි කථාවෙන්, නිමිති ශාස්ත්‍ර කීමෙන්, ගිහීන්ගේ පණිවුඩ ගෙනයාමෙන්, ලාභයෙන් ලාභය බලාපොරොත්තු වෙමින්, දර දීමෙන් උණදඬු දීමෙන්, මල් දීමෙන් ගෙඩි දීමෙන්, නෑමට ජලය දීමෙන්, ඇඟේ උලන සුණු ආදිය දීමෙන්, මැටි දීමෙන්, දැහැටිදඬු දීමෙන්, මුහුණ සෝදන ජලය දීමෙන්, චාටුකථා

කීමෙන්, සැබෑ බොරු මිශ්‍ර කොට කීමෙන්, යන්නට හැර නුගුණ කීමෙන්, වාස්තුවිද්‍යාවෙන්, තිරශ්චීන විද්‍යාවෙන් නක්ෂත්‍ර විද්‍යාවෙන් දූත ගමනින්, පණිවුඩ ගෙනයාමෙන්, වෙදකමින්, යනාදී අධර්ම දෙයින් යම් යම් දේ ලැබ ජීවිකාව කරයි. මේ වැරදි සහිත ජීවිකාව ඇති පුද්ගලයා යයි කියනු ලැබේ.

3. "නිවැරදි පුද්ගලයා කවරේද? (පළමු වැරදි කරුණු අතහැර) දැහැමින් ජීවත්වීමයි. "මෙය නොලැබ නිවැරදි ජීවිකාව ඇත්තේ" යනු මේ වැරදි ජීවිකාව නොකොට නොලැබ කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 19-14

1. "බබළන රන් වළලු දැක" යනු දැක, බලා, තීරණය කොට, ප්‍රකටකොට යනුයි. 'ස්වර්ණ' යනු රත්රන්වලට කියයි. බබළන යනු පිරිසුදු නියම වර්ණවත් යනුයි.

2. "කර්මාර පුත්‍රයා විසින් මනාකොට නිමවනලද" යනු කර්මාර පුත්‍රයා යයි රන්කරුවාට කියයි. රන්කරුවා විසින් මනාකොට සාදනලද, නිමවනලද, කරණලද යනුයි. 'දෑතෙහි ගැටෙන' යන්නෙහි 'භුජ' යයි අතට කියයි. එක අතෙහි වළලු දෙක ගැටෙත්. මෙපරිද්දෙන්ම සත්වයෝ තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් නරකයෙහි ගැටෙත්. තිරිසන් යෝනියෙහි ගැටෙත් ප්‍රෙත විෂයෙහි ගැටෙත්, මිනිස්ලොව ගැටෙත්, දෙව්ලොව ගැටෙත්, ගතියෙන් ගතිය, උත්පත්තියෙන් උත්පත්තිය, ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධිය, භවයෙන් භවය, සංසාරයෙන් සංසාරය, වට්ටයෙන් වට්ටය, ගැටෙන්නාහු හැසිරෙත්, වාසය කරත්, ඉරියව් පවත්වත්, යැපෙත් යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-15

1. "මෙසේ දෙවැන්නෙකු හා මාගේ එක්වීම" යනු තෘෂ්ණාව දෙවෙනි කොට ඇත්තේ හෝ වෙයි. පුද්ගලයකු දෙවෙනි කොට ඇත්තේ හෝ වෙයි. කෙසේ තෘෂ්ණාව දෙවෙනි කොට ඇත්තේ

වේද? මෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම තෘෂ්ණා යනුයි" යමෙකුගේ තෘෂ්ණාව ප්‍රහීන නොවූයේද, හෙතෙම තෘෂ්ණාව දෙවැන්නා කොට ඇත්තේ යයි කියයි.

2. "තෘෂ්ණාව දෙවැන්නෙකු කොට ඇති පුද්ගලයා සසර දීර්ඝ කාලයක් හැසිරෙන්නේ මේ ආත්ම භාවයෙන් අන් ආත්ම භාවයකට යමින් සසර නොයික්මවයි" යනුයි. මෙසේ තෘෂ්ණාව දෙවැන්නකුකොට ඇත්තේ වෙයි. කෙසේ පුද්ගලයා දෙවැන්නකුකොට ඇත්තේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් තමා හේතුවෙන් නොව කාරණා හේතුවෙන් නොව උඩගුවූයේ නොසන්සුන් සිතැත්තේ එකෙකුට හෝ දෙවැන්නෙක් වේද, තුන්වැන්නෙක් සතර වැන්නෙක් හෝ වේද, එහි නිෂ්ඵල දේ කථා කරයි. ඒ කෙසේද? රාජකථා (මෙහි 18-8 3 (ii) යොදාගත යුතුයි.) යනුයි. මෙසේ පුද්ගලයා දෙවැන්නකුකොට ඇත්තේ වෙයි.

3. "හිස්වචන කථාකිරීම ඇත්තේ වෙයි" යන්නෙහි හිස් වචන නම් දෙතිස් තිරිසන් කථාවෝයි. හේ කෙසේද රාජ කථා (මහානිද්දෙසයේ (14-8) 3 (ii) යොදාගත යුතුයි.) ඇලීම ඇති කල්හි යන්නෙහි ඇලීම් දෙකකි. තෘෂ්ණාවෙහි ඇලීමද දෘෂ්ටියෙහි ඇලීමද යනුයි. (මෙහි (18-2) 3 යොදා ගත යුතුයි.) මේ තෘෂ්ණාවෙහි ඇලීමයි. මේ දෘෂ්ටියෙහි ඇලීමයි.

3. "මේ බිය මත්තෙහි බලන්නේ" යන්නෙහි භය යනු ජාතිභය, ජරාභය, ව්‍යාධිභය, මරණභය, රාජභය, චොරභය, ගිනිභය, ජලභය, අත්තානුවාදභය, පරානුවාදභය, දණ්ඩ භය, දුර්ගතිභය, රැල බිය, කිඹුල් බිය, සුළි බිය, වන සතුන්ගේ බිය, දිවි පැවැත්මේ බිය, නින්දා බිය, දුර්ගති බිය, තැති ගැන්ම, ලොම් කෙළින් සිටීම සිතෙහි හදිසි බිය, මේ බිය මත්තෙහි දකින්නේ යනු මේ භය මත්තෙහි බලන්නේ දකින්නේ පරීක්ෂාකරන්නේ කඟවේනා අඟමෙන් තනිව හැසිරෙන්නේය. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-16

1. "කාමයෝ විචිත්‍රය, මධුරය, සිත් අලවන්නේයයි" යන්නෙහි 'කාමයෝ' නම් ප්‍රකට වශයෙන් කාම දෙකොටසෙකි. වස්තුකාමද ක්ලේශ කාමද යනුයි. (මහානිද්දෙසයේ (1) 1 (ii) 2-3 ඡෙද යොදාගත යුතුයි.) "විචිත්‍රය" යනු (ii) නානා වර්ණ රූපයෝ, නානාවර්ණ ගන්ධයෝ නානාවර්ණ ශබ්දයෝ නානාවර්ණ රසයෝ නානා වර්ණ ස්පර්ශයෝ, ඉෂ්ටවූ මධුරවූ යනුයි.

2. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. "මහණෙනි, කාමගුණයෝ පසක් වෙති. කවර පසක්ද ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ කාමය දෙන්නාවූ ඇතුළුම් කටයුතුවූ ඇසින් දකින්නාවූ රූපයෝද, කණින් අසන්නාවූ ශබ්දයෝද නාසයෙන් ආඝ්‍රානය කරන්නාවූ සුවඳද දිවින් දැන ගන්නාවූ රසයෝද, කයින් දැනගන්නාවූ ස්පර්ශයෝද යනු, මහණෙනි, මේ පස් වැදෑරුම් කාමගුණයෝ වෙති. මේ පංචකාම ගුණයන් නිසා සැපය සොම්නස උපදියි. මෙය කාම සුවයයි කියයි. මෙය සැපතට පීඩා කරණ සැපයයි. නූගතුන්ගේ සැපයයි. විපත් ඇති කරවන සැපයයි. මෙය නොසෙවිය යුතුයි, නොවැඩිය යුතුයි, බහුල වශයෙන් නොකටයුතුයි. මේ සැපතට බියවිය යුතුයයි කියමි.

3. "සිත් අලවන" යන්නෙහි සිත නම් යම් සිතක් මන නම් වේද? මානස නම් වේද, සතුටු කරවත්, "විරූප රූපයෙන් සිත ඇදගනිත්" යනු 'සිත සතුටු කරවත්.' යනු නොයෙක් වර්ණ ඇති රූපයන්ගෙන් එනම් (මෙහි 18-16) 1 (ii) යොදාගත යුතුයි.) නොයෙක් වර්ණ ඇති ස්පර්ශයන්ගෙන් සිත ඇදගනිත්, සතුටු කරවත් යනුයි. කාම ගුණයන්හි ආදීනව දැක යනු

4. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරණ ලදී. "මහණෙනි, මෙහි ඇතැම් කුල පුත්‍රයෙක් යම් ශිල්පයකින් ජීවත් වේද, එනම්, ගොවිතැනින් හෝ ගවයන් රැකීමෙන් හෝ රජයේ නිලදැරීමෙන් හෝ වෙනින් ශිල්ප හැදෑරීමෙන් හෝ ශීතලට මුහුණපාමින්, උෂ්ණයට මුහුණපාමින් ඇටමැස්සෝය

මදුරුවෝය. වාතය, අව්වය, දීර්ඝ ජාතීන්ගේ ස්පර්ශය යන මේවායේ ස්පර්ශය ලබන්නේ බඩගින්නෙන් හා පිපාසයෙන් පෙළෙන්නේ වෙයි.

5. "මහණෙනි, මෙය කාමයන්ගේ මෙලොව ආදීනවයයි (ii) කාමහේතුවෙන්, කාමය නිමිත්තෙන් දුක් ගොඩක් ඇති වෙයි. මහණෙනි, එසේ වෙහෙසෙන්නාවූ ගැටෙන්නාවූ, වෑයම් කරන්නාවූ ඒ කුලපුත්‍රයාගේ ඒ භොගයෝ වැඩීමට නොපැමිණෙත්, හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි. ලෙහි අතගසා හඬයි. සිහි මුලාවට පැමිණෙයි. 'මාගේ උත්සාහය හිස්ය, මාගේ ව්‍යායාමය නිෂ්ඵලවූයේ යයි සිතයි. මහණෙනි, මෙයද කාමයන්ගේ මෙලොව ආදීනව යයි, කාම හේතුවෙන් කාම නිදානයෙන් ඇතිවන දුක් ගොඩයි.

6. "මහණෙනි, මෙසේ උත්සාහ කරණ ගැටෙන වෑයම් කරණ ඒ කුල පුත්‍රයාගේ භොගයෝ දියුණුවට පැමිණෙත්. එකල්හි හෙතෙම ඒ භොගයන්ගේ ආරක්ෂාව සැලසීමට දුකක් දොම්නසක් විඳියි. කෙසේ මාගේ භොගයෝ රජවරු පැහැර නොගන්නාහුද සොරු පැහැර නොගන්නාහුද, ගින්නෙන් විනාශ නොවන්නාහුද, ජලයෙන් ගසාගෙන නොයන්නාහුද, ප්‍රිය නොවූවෝ පැහැර ගෙන නොයන්නාහු දැයි, ඔහු ආරක්ෂාව ඇති කරයි. එසේ ආරක්‍ෂාව ඇති කල්හි ඒ භොගයෝ රජවරු හෝ ගනිත් සොරු හෝ පැහැර ගනිත්, ගින්නෙන් හෝ විනාශවෙත් ජලයෙන් හෝ ගසාගෙන යත්, අප්‍රිය හෝ (දායාද වශයෙන්) ගනිත්. හෙතෙම ශොක කරයි. මහණෙනි, මෙයද කාමයන්ගේ මෙලොව ආදීනවයයි. දුක්ගොඩයි කාමහේතුවෙන් (මෙහි 5 (ii) යොදාගත යුතුයි.)

7. "මහණෙනි, නැවතද කාමහේතුවෙන් කාම නිමිත්තෙන් රජවරුද රජුන් හා විවාද කරත්, ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් හා විවාද කරත්, බ්‍රහ්මණයෝද බ්‍රාහ්මණයන් හා විවාද කරත්, ගෘහපතීහු ගෘහපතීන් හා විවාද කරත් මවද පුතා සමග විවාද කරයි. පුතාද මව සමග විවාද කරයි. පියාද පුතා සමග විවාද කරයි. පුතාද පියා සමග විවාද කරයි. සහෝදරයාද සහෝදරිය

සමග විවාද කරයි. සහෝදරියද සහෝදරයා සමග විවාද කරයි. යහළුවාද යහළුවා සමග විවාද කරයි. ඔව්හු එහි කලහ, විග්‍රහ, විවාදයට පැමිණියාහු ඔවුනොවුන් අතින්ද. ගල්කැටාදියෙන්ද දඬු මුගුරුවලින්ද, ගසාගනිත්. ආයුධ වලින්ද ගසාගනිත්. ඔව්හු එහිදී මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද කාමයන්ගේ මෙලොව විපාකයයි. කාම හේතුවෙන් කාම නිදානයෙන් කාම නිමිත්තෙන් ඇතිවන දුක් ගොඩයි.

8. "මහණෙනි, නැවතද කාමහේතුවෙන්, කාමනිදානයෙන් කාම නිමිත්තෙන් කඩු, සම්ගෙන, දුනු හියවුරු ගෙන දෙපසට බෙදී යුදයට පැමිණෙත්. ඊතලවලින් විදින කල්හි කඩු ආදිය බබළන කල්හි, ඊතලවලින් විදිත්. ආයුධ වලින් විදිත්. කඩුවෙන්ද හිස සිඳිත්. ඔවුහු එහි මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත් මහණෙනි, (ii) මෙයද කාමයන්ගේ මෙලොව ආදීනවයයි කාමහේතුවෙන්, කාම නිදානයෙන් කාමනිමිත්තෙන් ඇති වන දුක් ගොඩයි.

9. "මහණෙනි, නැවතද කාමහේතුවෙන් කාමනිදානයෙන් කාම නිමිත්තෙන් කඩු සම් ගෙන, දුනු හියවුරු ගෙන අටලු හා දිය අගල්වලින් පනිත්. ඊවලින් විදින කල්හි ආයුධ විසි කරණ කල්හි කඩු බබළන කල්හි ඊතලවලින් විදිත්, ආයුධ විසි කරත්. කාරම් ආදියද ඉසිත්. ගින්නෙන්ද මඩිත් කඩුවෙන්ද හිස සිඳිත්. ඔව්හු එහි මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද (මෙහි (18-16) 8 (ii) යොදාගත යුතුයි.)

10. "මහණෙනි, නැවතද කාමහේතුවෙන් කාම නිදානයෙන් කාම නිමිත්තෙන් ගෘහ සන්ධි බිඳිත්. මංකොල්ලකෑම කරත්. ගෙවල් කීපයක් හැර ගෙයක් බිඳ ධනය පැහැර ගනිත්. උවදුරුද කරත්. පරදාර කර්මයද කරත්. ඒ ඔහු රජවරු අල්ලා නොයෙක් කම්කටොළු කරවත්, කසවලින්ද තලවත්, වේවැල්වලින්ද තලවත්, අඩක් පැලූ දණ්ඩෙන්ද තලවත්, අතද කපවත් (මහා නිද්දේසයේ (7-7) (2) 'පය කපයි' යන තැන සිට යොදාගත

යුතුයි.) කඩුවෙන් හිස සිඳවත්, ඔව්හු එහිදී මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද කාමයන්ගේ මෙලොව ආදීනවයයි.

10. "නැවතද මහණෙනි, කාමයන්ගේ හේතුවෙන් කයින් දුසිරිතෙහි හැසිරෙත්. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙත්, සිතින් දුසිරිතෙහි හැසිරෙත්, ඔව්හු කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර සිතින් දුසිරිතෙහි හැසිර, කායයාගේ බිඳීමෙන් මරණින්මතු අපාය නම්වූ නපුරු ගති ඇති නපුරුසේ වැටෙන නරකයෙහි උපදිත් මහණෙනි මෙයද කාමයන්හි පරලොව ආදීනවයයි කාමහේතුවෙන් කාමනිදානයෙන් කාමනිමිත්තෙන් ඇතිවන දුක් ගොඩයි.

12. "කාමගුණයන්හි දැක" යනු කාමගුණයන්හි ආදීනව දැක යනු දැක, සමකොටබලා තීරණයකොට, ප්‍රකට කොට යනුයි කාමගුණයන්හි ආදීනව දැක කඟවේනා අඟ මෙන් තනිව හැසිරෙන්නේය යනුයි. එහෙයින් ඒ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-17

1. "විපතද, කඩුවද, උපද්‍රවද, රෝගයද, හුලද යන මේ භය" යනු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණලදී. "මහණෙනි, භය යන මෙය කාමයන්ට අනික් නමකි. 'දුක' යන මෙය කාමයන්ට අනික් නමකි. මහණෙනි, 'රෝගය' යන මෙය කාමයන්ට අනික් නමකි. 'ගඩුව' යන මෙය කාමයන්ට අනික් නමකි. මහණෙනි, හුල යන මෙය කාමයන්ට අනික් නමකි. සංකය යනු කාමයන්ට මේ අනික් නමකි. මහණෙනි, භය යනු කාමයන්ට මේ අනික් නමකි.

2. "කුමක් හෙයින් භයයයි කාමයන්ට අනික් නමක් වේද? කාමරාගයෙන් රත්වූයේ, ඡන්ද රාගයෙන් බැඳුනේ මෙලොව භයින්ද නොමිදෙයි. පරලොව භයින් නොමිදෙයි. එහෙයින් 'භය යනු කාමයන්ට මේ අනික් නමකි. මහණෙනි, කවර හේතුවකින් රෝගයයිද ගණ්ඩයයිද සල්ලයයිද සංගයයිද සංකයයිද ශබ්භයයිද කාමයන්ට මේ අනික් නම් වෙත්ද?

3. "මහණෙනි, කාමරාගයෙහි ඇළුන ඡන්දරාගයෙහි බැඳුන මේ සත්වතෙම මේ ලොකයෙහි ගර්භයෙන්ද නොමිදෙයි පරලොව ගර්භයෙන්ද නොමිදෙයි. එහෙයින් ගර්භය (මවුකුස) යනු කාමයන්ට මේ අනික් නමකි.

4. "භයය, දුකය, රෝග, සංගය, යන කාමයක් වේද පෘථග්ජන සත්වතෙම යම් තැනෙක වේද, මේ කාමභය කියත්" සැපය යන ස්වරූපයෙන් බැස ගත්තේ නැවත මවු කුසකට පැමිණෙයි. මහණෙනි, යම් හෙයකින් මහණතෙම කෙලෙස් තවන වීර්ය ඇත්තේ මේ පලිය දුක ඉක්මවා සිට අන්‍යවූ ජාතිජරාවෙන් යුක්ත සැලෙන්නාවූ සත්වයා බලයි යනුයි. "මේ භය කාමගුණයෙහි දැක යනු මේ භය කාමගුණයෙහි දැකබලා සමකොට තීරණය කොට, ප්‍රකටකොට යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-18

1. "සීතයද උෂ්ණයද බඩගින්නද පිපාසයද, යන කරුණු දෙකකින් ශීතලවෙයි. අභ්‍යන්තර ධාතු කැළඹීම වශයෙන් ශීතලවෙයි. බාහිර ඍතු වශයෙන් ශීතලවෙයි. 'උෂ්ණ' යනු කරුණු දෙකකින් උෂ්ණයවෙයි අභ්‍යන්තර ධාතු කැළඹීම් වශයෙන් හෝ උෂ්ණයවෙයි. බාහිර ඍතු වශයෙන් හෝ වෙයි. 'ක්ෂුධා', යයි බඩගින්නට කියයි. පිපාසයයි ජලය බීමේ කැමැත්තට කියයි.

2. "වාතයෝ" නම් පෙරදිගවාතය, බටහිරදිගවාතය, උතුරුදිගවාතය දකුණුදිගවාතය, ධූලිසහිතවාතය, ධූලිරහිත වාතය, ශීතවාතය, උෂ්ණවාතය, ස්වල්පවාතය, මහාවාතය, ඉතා මහත්වාතය, කාලවාතය, වෙරම්බවාතය, සුවර්ණ වාතය තල්කොළවාතය, (විජිනිපතේ) පවන් ගැසීමෙන් ඇතිවන වාතය, යනුයි.

3. "අව්ව" යනු සූර්යතාපයට කියයි. 'ඩැහැලේබොන මැස්සෝ' යනු පිංගලයයි කියන ඇටමැස්සන්ට කියයි 'දීර්ඝ ජාතියයි' සර්පයන්ට කියයි. මේ සියල්ල මැඩ පවත්වා යනු යටපත්කොට, මැඩ, කඟවේනෙකුගේ අඟමෙන් තනිව

හැසිරෙන්නේය යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-19

1. "හස්තිනාගතෙම රංචුව අත්හැර" යන්නෙහි 'නාග' යනු හස්තිනාගයාට කියයි. පසේ බුදුන් වහන්සේද නාග නම්වෙයි. කවර කරුණකින් පසේ බුදුන් වහන්සේ නාග නම් වනසේක්ද? වැරදි නොකරණ බැවින් නාගනම් වේ. 'නොයානුයි' නාගනම් 'පැමිණේනුයි' නාගනම්. කෙසේ ඒ පසේ බුදුන්වහන්සේ වැරදි නොකරණ බැවින් නාගනම්වේද? වැරදියයි කෙලෙස් ඇති කරවන, නැවත භවයක් ඇති කරවන සසරදුක් විපාකදෙන, නැවත ජරාමරණය දෙන ලාමකවූ අකුශල ධර්මයන්ට කියයි. කිසිවරදක් ලොකයෙහි නොකෙරේද, සියලු බන්ධනයන් ලිහා දමා එහි නොඇලේද, අටලෝදහමින් කම්පා නොවන එබඳුවූ උන්වහන්සේට නාගයයි කියයි. මෙසේ ඒ පසේ බුදුන්වහන්සේ වරද නොකරණ බැවින් නාගනම්වේ.

2. "කෙසේ ඒ පසේ බුදුන්වහන්සේ නොයේනුයි නාග නම්වනසේක්ද? ඒ පසේ බුදුන්වහන්සේ ඡන්දයෙන් අගතියට නොයයි 'ද්වෙෂයෙන් අගතියට' නොයයි මොහයෙන් අගතියට නොයයි. රාගවශයෙන් නොයයි ද්වෙෂ වශයෙන් නොයයි, මොහ වශයෙන් නොයයි, මානවශයෙන් නොයයි, දෘෂ්ටි වශයෙන් නොයයි. උද්ධච්ච වශයෙන් නොයයි. විචිකිච්ඡා වශයෙන් නොයයි, අනුසය වශයෙන් නොයයි. වර්ගවූ කර්මයන්ගෙන් නොයයි. ගමන් නොකරයි. මෙසේ ඒ පසේ බුදුන්වහන්සේ නොයේනුයි නාග නම්.

3. "කෙසේ ඒ පසේ බුදුන්වහන්සේ නොපැමිණේනුයි නාගනම්වනසේක්ද? සෝවාන් මාර්ගයෙන් යම්කෙලෙස් ප්‍රහීනද ඒ කෙලෙස් නැවත ආපසු නොපැමිණෙයි. සකෘදාගාමි මාර්ගයෙන් යම්කෙලෙස් ප්‍රහීනද ඒ කෙලෙස් නැවත ආපසු නොපැමිණෙයි. අනාගාමි මාර්ගයෙන් අර්හත් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීනවූවාහුද, ඒ කෙලෙස් නැවත ආපසු

නොපැමිණෙයි මෙසේ ඒ පසේ බුදුන්වහන්සේ නොපැමිණේනුයි නාග නමි.

4. "අත්හැර" යනු රංචුව අත්හැර යනුයි. යම්සේ ඒ පසේ බුදුන්වහන්සේ රංචුව අත්හැර තනිව වනයමැද හැසිරෙයි ඉරියව් පවත්වයි, පවතියි පාලනය කරයි. යැපෙයි. පසේ බුදුන්වහන්සේද ගණයා අත්හැර තනිව වනයෙහිවූ ඇතවනයෙහි සුදුසුවූ ස්වල්ප ශබ්දය ඇති ස්වල්ප ඝොෂය ඇති මිනිසුන්ගෙන් තොර මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය සෙනසුන් සේවනය කරයි. උන්වහන්සේ තනිවයයි තනිව සිටියි. තනිව හිඳගනියි, තනිව නිදයි, තනිව ගමට පිඬු පිණිස හැසිරෙයි, තනිව ආපසු පැමිණෙයි, තනිව රහසිගතව වැඩහිඳියි, තනිව සක්මන අධිෂ්ඨානකරයි, තනිව හැසිරෙයි, තනිව සයනය කරයි, ඉරියව් පවත්වයි, පාලනයකරයි.

5. "හටගත් කඳ ඇත්තේ මහත් පියුම් විල ඇත්තේ" යනු යම්සේ ඒ හස්තිනාගතෙම සත්රියන් හෝ අටරියන් හෝ හටගත් කඳ ඇත්තේවෙයි. පසේ බුදුන්වහන්සේද අසෙඛවූ ශීලරාශියෙන් (සිල්කඳින්) අසෙඛවූ සමාධි රාශියෙන්, අසෙඛවූ ප්‍රඥා රාශියෙන්, අසෙඛවූ විමුක්ති රාශියෙන් අසෙඛවූ විමුක්ති ඥාන දර්ශන රාශියෙන්, යන හටගත් කඳ ඇත්තේවෙයි. යම්සේ ඒ ඇත්රජතෙමේද මහත් පියුම් විල ඇත්තේවේද, එමෙන්ම පසේ බුදුන්වහන්සේද සප්ත බොධ්‍යංග නමැති පියුම් විලෙන් යුක්තවූයේ වෙයි. සතිසම් බොජ්ක්ධංග පියුම් විලෙන්, ධම්මවිචය සම්බොජ්ක්ධංග පියුම් විලෙන්, පීතිසම්බොජ්ක්ධංග පියුම් විලෙන්, පස්සද්ධි සම්බොජ්ක්ධංග පියුම් විලෙන්, සමාධිසම්බොජ්ක්ධංග පියුම්විලෙන් උපෙඛා සම්බොජ්ක්ධංග පියුම්විලෙන් යුක්තවෙයි. යම්සේ ඒ හස්තිනාගයා කැමතිතාක්කල් වනයෙහි වාසය කරයි. පසේ බුදුන්වහන්සේද කැමතිතාක්කල් වනයේ වාසය කරයි. පළමු වන ධ්‍යානයෙන්ද කැමතිතාක් කල් වාසයකරයි. දෙවන ධ්‍යානයෙන්ද කැමතිතාක්කල් වාසය කරයි. තුන්වන සතරවන ධ්‍යානයන්ගෙන්ද කැමතිතාක්කල් වනයෙහි වාසයකරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෛත්‍රීචෙතො විමුක්තියෙන්ද කැමතිතාක්කල් වනයෙහි වාසයකරයි කරුණා චෙතො විමුක්තියෙන්ද, මුදිතා චෙතො විමුක්තියෙන්ද උපෙක්ඛා චෙතො විමුක්තියෙන්ද කැමති තාක්කල් වනයෙහි වාසය කරයි. ආකාශානඤ්චායතන සමාපත්තියෙන්ද විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන්ද, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන්ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන්ද, නිරොධ සමාපත්තියෙන්ද ඵලසමාපත්තියෙන්ද කැමතිතාක්කල් වනයෙහි වාසයකරයි, යනුයි. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

### 18-20

**1.** "සමූහයා සමග ඇලීමෙහි සාමායික චිත්ත විමුක්තිය සිදුනොවන්නකි." යනු භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. 'ආනන්දය, යම්පමණ කල් මහණතෙම සමූහයා සමග එක් වූයේ සමූහය සමග ඇළුනේ සමූහයා සමග ඇලීමෙහි යෙදුනේ ගණයා සමග ඇලීමෙහි යුක්තවූයේවේද, යම් ඒ නෙක්ඛම්ම සුඛය, පවිවේක සුඛය, උපසම සුඛය සම්බොධි සුඛය, ඔහුට පහසුවෙන් ලැබිය හැකි වන්නේයයි, නිදුක්ව ලැබිය හැකි වන්නේයයි කරදර නැතිව ලැබිය හැකි වන්නේයයි යන මේ කාරණය විද්‍යමාන නොවේ. 'ආනන්දය යම් ඒ භික්ෂුවක් තනිවූයේ ගණයාගෙන් වෙන්වූයේ වාසය කෙරේද, මේ භික්ෂුව සාමායික චිත්ත විමුක්තියට පැමිණ වාසය කරන්නේයයි කැමතිවිය යුතුයි. අසමායික භාවයට යොග්‍ය නොවේය යන කාරණය විද්‍යමාන වේ.

**2.** "ආදිත්‍යබන්ධූන් වහන්සේගේ වචනය අසා" යන්නෙහි ආදිත්‍යයයි සූර්යයාට කියයි. සූර්යයාද ගොත්‍රයෙන් ගෞතමය, පසේ බුදුන්වහන්සේද ගොත්‍රයෙන් ගෞතමය, ඒ පසේ බුදුන්වහන්සේ සූර්යයාගේ ගොත්‍ර ඇත්තේවෙයි. නෑයාවෙයි. 'ආදිත්‍ය බන්ධූන් වහන්සේගේ වචනය අසා' යනු ආදිත්‍ය බන්ධූන් වහන්සේගේ වචනය දෙශනාව, අනුසන්ධිය, අසා, ඉගෙණ, දරායනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-21

1. "දෘෂ්ටි නමැති කටු ඉක්මවූයේය" යන්නෙහි දෘෂ්ටි කටුයයි විසිවැදෑරුම් ආත්ම දෘෂ්ටියට කියයි. මේ ලොකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ, ආර්ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ නූගත් පෘථග්ජනතෙම රූපය ආත්මය වශයෙන් බලයි. ආත්මය රූපවත්යයි කියා හෝ සිතයි. ආත්මය කෙරෙහි රූපය ඇත්තේය කියා සිතයි. රූපය කෙරෙහි ආත්මය ඇත්තේයයි සිතයි. වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය, ආත්ම වශයෙන් බලයි. ආත්මය විඥානවත්ය කියා හෝ ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇත්තේ කියා හෝ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇත්තේය කියා හෝ යම් මෙබඳු දෘෂ්ටි ගැන්මක්, දෘෂ්ටි වනයක්, දෘෂ්ටි කාන්තාරයක්, දෘෂ්ටි කපුරු කටුවක්, දෘෂ්ටි කම්පාවක්, දෘෂ්ටි සංයෝජනයක්, ගැන්මක්, ප්‍රතිෂ්ඨාවක් ඇතුළුවීමක්, වැරදි මාර්ගයක්, බොරුවක්, තීර්ථායතනයක්, වරදවාගැන්මක්, විපර්යාස ග්‍රහණයක්, මිථ්‍යා ග්‍රහණයක්, යන මේ යම්තාක් දෙසැට දෘෂ්ටියක්වේද, මේ දෘෂ්ටි නපුරු කටුවයි, 'ඉක්මවූයේය' යනු දෘෂ්ටිකවූ ඉක්මවූයේය. වෙන් කළේය, යනුයි.

2. "මාර්ගයට පැමිණ නියමයට පැමිණියේය" යනු නියමය යයි සතර ආර්ය මාර්ගයෝ කියත්. සතර ආර්ය මාර්ගයට පැමිණියේ නියාමයට පැමිණියේ. ස්පර්ශකළේ, ප්‍රත්‍යක්ෂකළේ යනුයි. 'මාර්ගය' යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයට කියයි. හේ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනුයි. මාර්ගය ලැබුයේ, පැමිණියේ යනුයි.

3. "අනුන්ගෙන් නොදැන උපන් ඥානය ඇත්තේවෙමි. ඒ පසේ බුදුන්වහන්සේට ඥානය උපන්නේය, පහළවූයේය, ඇතිවූයේය, යනුයි. "සිහිඇතිව දැනගන්නේ" යනු ඒ පසේ බුදුන් වහන්සේ පරනෙය්‍ය නොවනසේක. පරප්‍රත්‍ය නොවන සේක. සිහිමුලා නොවූයේ අනුන් අයත්දේ දැනගනියි. සියලු

සංස්කාරයෝ අනිත්‍යයයි ඥානය උපන්නේය. ඇතිවූයේය, පක්ෂ වූයේය. සියලු සංස්කාරයෝ දුක්යයි, සියලු ධර්මයෝ අනාත්මයයි යම්කිසි හේතුවකින් උපන් යම් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි අනුන්ගෙන් නොදැන සිහිමුලා නොව දැනගනියි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-22

1. "නිල්ලොපවූයේ, කුහක නැත්තේ පිපාස නැත්තේ" යන්නෙහි නිල්ලොපයයි තෘෂ්ණාව නැතිවීමට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලෝභයක් ඇද්ද, අකුසල මූලයක් ඇද්ද ඒ ලොලුප්ප නම් තෘෂ්ණාව ඒ පසේ බුදුන් වහන්සේගේ ප්‍රහීනය, මුලින් උපුටා දැම්මේය අග සිඳි තල් ගසක් මෙන් කරණ ලද්දේය සම්පූර්ණ අභාවයට පමුණුවනලදී නැවත නූපදනා බවට පමුණුවනලදී. එහෙයින් පසේ බුදුන් වහන්සේ තෘෂ්ණා නැතිසේක. කුහක නැතිසේක. (මහා නිද්දේශයේ (10-5) 2 (ii) යෙදිය යුතුයි.)

2. ඒ පසේබුදුන් වහන්සේගේ මේ තුන් කුහනවස්තූහු ප්‍රහීනයහ. මුලින් සිඳුනාහ. සන්සිඳුනාහ. ඉපදීමට අයොග්‍ය වූහ. ඥානය නමැති ගින්නෙන් දැවුනාහ. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ කුහක නැතිසේක. පිපාස නැතිසේක යනුයි පිපාසය යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලෝභයක් අකුශල මූලයක් ඇද්ද, එයයි. ඒ පිපාසය නම් වූ තෘෂ්ණාව ඒ පසේ බුදුන් වහන්සේ ගේ ප්‍රහීනය මුලින් සිඳුනේය. අගසිඳි තල්ගසක්මෙන් කරණ ලදී. සම්පූර්ණ අභාවයට පමුණුවනලදී. නැවත නූපදනා බවට පමුණුවනලදී. එහෙයින් පසේබුදුන් වහන්සේ කුහක නැත්තේ පිපාසය නැත්තේ යයි කියයි.

3. "මක්ඛ" යනු මකු ගතියක් මකුවීම්බවක් ඇද්ද එයයි 'කසට' යනු රාගය කසටකි. ද්වෙෂය කසටකි. මොහය කසටකි ක්‍රොධය බද්ධ වෛරය මකු ගුණය ගුණවතුන් හා සමතත්වය සිතීම, සියලු අකුශල රැස්කිරීම් කසටකි. හෙතෙම දුකෙහි

නොදැනීම ඇත්තේ වෙයි දුක ඇතිවීමේ හේතුව නොදැනීම ඇත්තේ වෙයි. දුක්ඛ නිරොධයෙහි හේතුව නොදැනීම ඇත්තේවෙයි. දුක්ඛ නිරොධයට ගමන් කිරීමේ ප්‍රතිපදාවෙහි නොදැනීම ඇත්තේ වෙයි. පූර්වාන්තයෙහි නොදැනීම ඇත්තේ වෙයි. අපරාන්තයෙහි නොදැනීම ඇත්තේ වෙයි. පූර්වාපරාන්තයෙහි නොදැනීම ඇත්තේ වෙයි. ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්හි නොදැනීම ඇත්තේ වෙයි. මෙබඳු නොදැනීම, නොදැක්ම, අවබොධ නොකිරීම, වැරදිසේ ගැනීම, ඇතිසේ නොදැක්ම, ප්‍රත්‍යක්ෂ නොකිරීම, මෝඩබව, දුර්වලබව යහපත් සිහියෙන් තොරබව, අවිද්‍යා නමැති සැඩවතුර, අවිද්‍යානුසය, මැඩගෙන අවිද්‍යාව මතුවීම, අවිද්‍යාමූලය, මොහය, අකුශලමූලය යනුයි. ඒ පසේ බුදුන් වහන්සේගේ මකු ගුණයද කසටද මෝහයද වමාරා දමනලදී. නැතිකරණලදී ප්‍රහීනය, මුලින් සිඳුනේය, ශාන්තය, සන්සිඳුනේය. ඉපදීමට අයොග්‍යය ඥානය නමැති ගින්නෙන් දැවුනේය යනුයි.

4. "ආශා" යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. 'සියලු ලෝකයෙහි' යනු සියලු අපාය ලෝකයෙහි, සියලු මනුෂ්‍ය ලෝකයෙහි, සියලු දිව්‍යලෝකයෙහි, සියලු ධාතුලෝකයෙහි, සියලු ආයතන ලෝකයෙහි, ආශාරහිතවූයේ යනුයි. "සියලු ලොකයෙහිවී" යනු සියලු ලෝකයෙහි ආශාරහිතව, තෘෂ්ණා රහිතව, පිපාස රහිතව කඟවේනාගේ අඟමෙන් තනිව හැසිරෙන්නේය යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-23

1. "පාප මිත්‍රයන් දුරුකරන්නේ" යන්නෙහි පාප සහාය යනු යම් සහායයෙක් (මිත්‍රයෙක්) දශ වැදෑරුම් මිත්‍ථ්‍යා දෘෂ්ටියෙන් යුක්තවූයේද, (ii) දුන් දෙයෙහි විපාක නැත. යාග වශයෙන් දුන් දෙයෙහි විපාක නැත. පිදූ දෙයෙහි විපාක නැත. යහපත්ව කළ යහපත්ව නොකළ කර්මයන්ගේ ඵල විපාකයක්

නැත. මෙලොව නැත. පරලොව නැත. මවු නැත. පියා නැත, ඕපපාතික සත්වයෝ නැත. ලොකයෙහි මනාව පිළිපන් යහපත් ගමන් ඇති, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැත. යමෙක් මේ ලොවද, පරලොවද තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේද, (iii) මේ පාපසහාය නම්.

2. "යමෙක් පාප සහායයා දුරුකරන්නේය" යනු පාප සහායයා ඇතිකරන්නේය. වර්ජනය කරන්නේය යනුයි. 'අනර්ථය දක්නා විෂම දෙයෙහි ඇළුන යනු' යම් ඒ සහායයෙක් දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූයේ (මෙහි (ii) යෙදිය යුතුයි.) ප්‍රකාශ කෙරේද මේ අනර්ථය දක්නේ යනුයි.

3. "විෂම දෙයෙහි ඇළුන" යනු විෂමවූ කායකර්මයෙහි ඇළුන, විෂමවූ වාග් කර්මයෙහි ඇළුන, විෂමවූ මනඃ කර්මයෙහි ඇළුන විෂමවූ ප්‍රාණඝාතයෙහි ඇළුන, විෂමවූ අදත්තාදානයෙහි ඇළුන, විෂමවූ කාම මිථ්‍යාචාරයෙහි ඇළුන, විෂමවූ බොරු කීමෙහි ඇළුන විෂමවූ කේළාම් කීමෙහි ඇළුන විෂමවූ පරුෂ වචනයෙහි ඇළුන විෂමවූ හිස් වචන කීමෙහි ඇළුන, විෂමවූ දැඩි ලෝභයෙහි ඇළුන, විෂමවූ අනුන් විනාශ කරමියි අදහසෙහි ඇළුන, විෂමවූ මිත්ථ්‍යාදෘෂ්ටියෙහි ඇළුන, විෂමවූ සංස්කාරයන්හි ඇළුන, විෂමවූ පඤ්චකාම ගුණයන්හි ඇළුන, විෂමවූ පංචනීවරණ ධර්මයන්හි ඇළුන, ගැළුනාවූ, පැමිණියාවූ යනුයි.

4. "තෙමේ ප්‍රමාදයෙහි යුක්තවූවහු සේවනය නොකරන්නේය. යන්නෙහි 'යුක්තවූයේ' යනු යමෙක් කාමයන් සොයාද විශෙෂයෙන් සොයාද (ii) එය චරිතකොට ඇත්තේ එය බහුලකොට ඇත්තේ එය ගරුකොට ඇත්තේ, එයට නැමුනේ එයට බරවූයේ එහි ඇළුනේ එය අධිපතිකොට ඇත්තේ, හෙතෙමේද කාමයෙහි ඇළුනේ එහි අධිපතිකොට ඇත්තේ, හෙතෙමේද කාමයෙහි ඇළුනේ යනුයි. (iii) යමෙක් තෘෂ්ණා වශයෙන් රූපය සොයයිද ශබ්ද, ගන්ධ, රශ, ස්පර්ශ සොයයි. (මෙහි (ii) යෙදිය යුතුයි.) යමෙක් තෘෂ්ණා වශයෙන් ශබ්දය සොයයිද, ගන්ධ, රස ස්පර්ශ ලබාද (මෙහි (ii) යෙදිය යුතුයි.)

හෙතෙමේද තෘෂ්ණා වශයෙන් රූපය පරිභොග කරයි, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය පරිභොග කරයි. (මෙහි (ii) යෙදිය යුතුයි.) ප්‍රමාදවූයේය යනුයි ප්‍රමාදය කියයුතුයි.

5. "කාය දුශ්චරිතයෙහි හෝ වාග් දුශ්චරිතයෙහි හෝ මනස් දුශ්චරිතයෙහි හෝ පංචකාම ගුණයෙහි හෝ සිත යෙදවීමක් ඇද්ද, කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස, නොසකස්ව වැඩකිරීම, නිතර ක්‍රියා නොකිරීම, නිමවා ක්‍රියා නොකිරීම, පසුබට බව, බහාතැබූ කැමැත්ත ඇති බව බහා තැබූ කාර්ය ඇති බව, සේවනය නොකිරීම, නොවැඩීම, බහුල වශයෙන් නොකිරීම, අධිෂ්ඨාන නොකිරීම, නොයෙදීම ප්‍රමාදය යනුයි. යම් මෙබඳුවූ ප්‍රමාදයක් ප්‍රමාද බවක් ඇද්ද මෙය ප්‍රමාදයයයි කියයි. "තමා සේවනය නොකරන්නේය" යනු තමා සේවනය නොකරන්නේය, නොහැසිරෙන්නේය. ප්‍රමාදය පිණිස නොපවත්නේය. යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 19-24

1. "බහුශ්‍රැතවූ ධර්මධරවූ (මිත්‍රයා) භජනය කරයි" යනු මිත්‍රයා බහුශ්‍රැතවූයේ වේද, රැස්කළ ඇසූ පිරූ තැන් ඇත්තේ වේද, යම් ඒ ධර්මයෝ මුල පිරිසිදුවූ මැද පිරිසිදුවූ අග පිරිසිදුවූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ල සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන්නේද, එබඳුවූ වචනයෙන් පුරුදු කළ සිතින් මෙනෙහි කරණලද දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද ධර්මයෝ බොහෝකොට දරාගත්තාහු වෙත්. යනුයි. 'ධර්මධර' යනු සූත්‍රය, ගෙය්‍යය වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධම්මය, වෙදල්ලය, යන ධර්මයන් දරයි. බහුශ්‍රැතවූ ධර්මධරවූ මිත්‍රයා භජනය කරන්නේය සේවනය කරන්නේය යනුයි.

2. "මහත් ප්‍රතිභානය ඇති මිත්‍රයා" යනු මිත්‍රයා ශීලයෙන් මහත්වූයේ වේද, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන් විමුක්ති ඥාන දර්ශනයෙන්, මහත්වූයේද ඔහුයි. ප්‍රතිභානය (වැටහීම)

ඇති යනු පර්යාප්තියෙහි ප්‍රතිභානය ඇත්තේද, පරිපුච්ඡාවෙහි ප්‍රතිභානය ඇත්තේද, අධිගමයෙහි ප්‍රතිභානය ඇත්තේද යනුයි.

3. "පර්යාප්තියෙහි වැටහීම කවරේද? මෙහි ඇතැම් පුද්ගලයකුට සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යා කරණය, ගාථාව උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධම්මය, වෙදල්ලය, යන මේ ධර්මයන් හදාරණ ලද්දේ වේද, ඒ පර්ය්‍යාප්තිය නිසා වැටහේද, මේ පර්ය්‍යාප්ති වැටහීමයි.

4. පරිපුච්ඡා වැටහීම කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් අර්ථයෙහිද, න්‍යායයෙහිද ලක්ෂණයෙහිද, කාරණයෙහිද ස්ථානයෙහිද ඔහුගේ ප්‍රශ්න ඇසීම වෙයි. ඔහුගේ ප්‍රශ්න ඇසීම නිසා වැටහෙයි (මේ ප්‍රශ්න ඇසීමේ) පරිපුච්ඡා වැටහීමයි.

5. අධිගම වැටහීම කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙකුට සතර සතිපට්ඨානයෝ වැටහීම (ලැබීම) ඇතිවෙත් සතර සම්‍යක් ප්‍රධානයෝ සතර ඍද්ධිපාදයෝ පඤ්චෙන්ද්‍රියෝ පංචබලයෝ, සප්තබොධ්‍යංගයෝ, ආර්ය අෂ්ටාංගික මාර්ගය සතර ආර්ය මාර්ග, සතර ශ්‍රාමාණ්‍ය පල සතර ප්‍රතිසම්භිදා ෂට් අභිඥා යන මෙයින් යුක්තවූයේ ඔහුට අර්ථය වැටහුනේ වෙයි. ධර්මය වැටහුනේවේ. නිරුක්තිය වැටහුනේ වෙයි අර්ථය දැනගත් කල්හි අර්ථ වැටහුනේ වෙයි. ධර්මය දැනගත් කල්හි ධර්මය වැටහුනේ වෙයි. නිරුක්තිය දැනගත් කල්හි නිරුක්තිය වැටහුනේ වෙයි. මේ තුන් ඥාන ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ඇත්තේ වෙයි. ඒ පසේ බුදුන් වහන්සේ මේ ප්‍රතිභානයෙන් හා ප්‍රතිසම්භිදාවෙන් යුක්තවූයේ පැමිණියේ උපන්නේ යුක්තවූයේ වෙයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රතිභානයෙන් යුක්ත සේක.

5. "යමෙකුට පර්ය්‍යාප්තිය නැද්ද ප්‍රශ්න විචාරීම නැද්ද අධිගමය නැද්ද, ඕහට කුමක් වැටහෙන්නේද, අර්ථයන් දැන සැකය දුරුකොට" යනු ආත්මාර්ථය දැන පරාර්ථය දැන උභයාර්ථය දැන මෙලොව අර්ථය දැන පරලොව අර්ථය දැන පරමාර්ථය දැන මනාකොට දැන සමකොට බලා තීරණයකොට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රකටකොට යනුයි. සැකය දුරු කරන්නේය. යනු බැහැර කරන්නේය ඉවත් කරන්නේය. සම්පූර්ණ අභාවයට පමුණුවන්නේ යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-25

1. "ක්‍රීඩාවද රතියද ලොකයෙහි කාමගුණයද" යන තැන්හි 'ක්‍රීඩාව නම්' ක්‍රීඩා දෙකකි. කායික ක්‍රීඩාවද වාචසික ක්‍රීඩාවද යනුයි. (මහා නිද්දේසයේ (14-12) 6 ඡේදයේ වාචසික ක්‍රීඩාවයි යන තැනට යොදාගත යුතුයි.)) 'රතිය' යනු නොකළකිරීමට මේ අනික් නමකි, 'කාම සුඛය' යනු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. 'මහණෙනි, මේ කාමගුණ පසෙකි. ඒ පස කවරේද? ඇසින් දැනගන්නා (ii) ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය රූපවූ කාමය ගෙනදෙන්නාවූ ඇළුම් කටයුතුවූ (iii) රූපයෝද, කණින් දැනගන්නා (මෙහි (ii) යොදාගත යුතුයි.) ශබ්දයෝද, නාශයෙන් දැනගන්නා මෙහි (ii) යොදා ගත යුතුයි.) ගන්ධයෝද, දිවෙන් දැන ගන්නා (මෙහි (ii) යොදාගත යුතුයි) රසයෝද කයින් දැනගන්නා (මෙහි (ii) යොදාගත යුතුයි) ස්පර්ශයෝද යන මොව්හු මහණෙනි, පංචකාම ගුණයෝ නම් වෙති. මහණෙනි යම්හෙයකින් මේ පඤ්චකාම ගුණයන් නිසා සැපයක් සොම්නසක් උපදීද මේ කාම සුඛයයි කියයි. ලොකය යනු මනුෂ්‍ය ලොකයෙහි යනුයි.

2. "අලංකාර නොකොට බලාපොරොත්තු නැතිව" යනු ලොකයෙහි ක්‍රීඩාවද, කාමරතියද, කාම සැපයද අලංකාර නොකොට බලාපොරොත්තු රහිතව දුරුකොට බැහැරකොට, සංසිඳවා, සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි.

3. "සැරසීම්වලින් වෙන්වූයේ සත්‍යවාදීවූයේ" යන තැන්හි සැරසීම් නම් සැරසීම් දෙකකි. (මහා නිද්දේශයේ 'අලංකාර නම්' යන තැන සිට යොදාගත යුතුයි.) මේ පැවිද්දන්ගේ සැරසීම් වෙති. "සත්‍යවාදී" යනු ඒ පසේ බුදුන් වහන්සේ සත්‍යය කියන්නේ ඇදහීම් ඇති කථා ඇත්තේ විශ්වාස කළ හැකි කථා ඇත්තේ වෙයි. සැරසීම් වලින් ඇත්වූයේ වෙන්වූයේ නික්මුනේ

සීමා නොකළ සිතින් වාසය කරයි යනුයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-26

1. "පුත්‍රයාද, භාර්යාවද, පියාද, මවද" යන තැන්හි පුත්‍රයෝ නම් පුත්‍රයෝ සතර දෙනෙකි. තමාගෙන් උපන් පුත්‍රයාය. ක්ෂෙත්‍රයෙන්, උපන් පුත්‍රයාය, හදාගත් පුත්‍රයාය. අතවැස්සාය යනුයි. 'දාර' යනු භාර්යාවට කියයි, 'පියා' යනු යම් ඒ ඇතිකළ පියතෙමේයි, 'මව' යනු ඉපදවූ මව යනුයි.

2. "ධනයන්ද ධාන්‍යද වධ බන්ධනයන්ද" යනු හිරණ්‍ය ස්වර්ණ, මුතු මැණික්, වෛඩූර්ය පබළු, රන්රිදී, ලෝහිතංක, මැසිරි ගල්, යනුයි, 'ධාන්‍ය' යනු 'පුබ්බන්න' 'අපරන්නයෝ' වෙති. පුබ්බන්න නම් හැල් ආදී ධාන්‍යයෝයි. අපරන්න නම් පලා ආදියයි. 'නෑයෝ' නම් නෑයෝ සතර කොටසකි. ඥාති බන්ධු, ගෝත්‍ර බන්ධු, මිත්‍ර බන්ධු, ශිල්ප බන්ධු යනුයි.

3. "කාමයෝ දුරුකොට යන්නෙහි" කාමයෝ නම් ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසක් වෙති, එනම් වස්තු කාමයෝද, ක්ලේශ කාමයෝද, යනුයි. (මහා නිද්දෙසයේ (1-1) (ii) 2-3 ඡෙද යෙදිය යුතුයි. 1523-1524 පිටු) කාමයන් දුරුකොට යනු වස්තු කාමයන් විශේෂයෙන් දැන ක්ලේශ කාමයන් දුරුකොට, බැහැර කොට. සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි. සෝවාන් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීන වූවාහුද, ඒ කෙලෙස් නැවත නොපැමිණෙත්, ආපසු නොඑත්. සකෘදාගාමි මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීනවූවාහුද, අනාගාමි මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීනවූවාහුද අර්හත් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීන වූවාහුද ඒ කෙලෙස් නැවත නොපැමිණෙත්. ආපසු නොඑත් යනුයි. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-27

1. "මෙය ඇලීමකි, ස්වල්ප සැපයක් ඇත්තේය." යන්නෙහි 'ඇලීම' යනු හෝ බිලිය යනු හෝ ආමිසය යනු හෝ මෙය පඤ්චකාම ගුණයෝ නම් වෙති. මහණෙනි, මේ පඤ්චකාම

ගුණයන් නිසා සැපත උපදියි, සොම්නස උපදියි, මෙය කාම සුඛයයි කියයි. මේ සැපය ස්වල්පය, මේ සැපය ටිකය, මේ සැපය ලාමකය, මේ සැපය පහත්ය, මේ සැපය දුක්ය, යනුයි "මෙය ඇලීමකි මෙහි සැපය ස්වල්පය" මෙහි බොහෝ දුක් ඇත්තාහ යනු භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පශ්වාද (මහා නිද්දෙසයේ (1-3) 2 (ii) යෙදිය යුතුයි 1527-1528 පිටු)

2. "මෙය ගල හෝ ගිලීම යයි නුවණැත්තේ දැන" යනු "ගිලීම" හෝ බිලිය හෝ ආමිසය හෝ එල්බීම හෝ බන්ධනය හෝ මෙය පඤ්චකාම ගුණයන්ට විශෙෂ නම් වෙති 'ඉති' (මෙයි) යනු පද සන්ධියයි, පද ගැලපීමයි පද පිරවීමයි, අකුරු සම කිරීමයි පහසුසේ කීමට සැලැස්වීමයි යනුයි 'නුවණැත්තේ' යනු පණ්ඩිතවූ, ප්‍රඥාවත්, බුද්ධිමත්, ඥානය ඇති විභාවීවූ, මෙධාවී යනුයි. මෙය 'ගිලීම' යයි දැන යනු නුවණැත්තේ ගිලීමයයි දැන, බිලිය යයි දැන, ආමිෂයයි දැන එල්බීමයයි දැන, බන්ධනයයි දැන පළිබොධය යයි දැන, සම කොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-28

1. "සංයෝජනයන් (බැඳීම්) දුරුකොට" යනු සංයෝජනයෝ දශයක් වෙති. කාම රාග සංයෝජනය, ප්‍රතිඝ සංයෝජනය, මාන සංයෝජනය, දෘෂ්ටි සංයෝජනය විචිකිච්ඡා සංයෝජනය, ශීලව්‍රත පරාමාශ සංයෝජනය, භවරාග සංයෝජනය, ඊර්ෂ්‍යා සංයෝජනය, මාත්සර්ය සංයෝජනය, අවිද්‍යා සංයෝජනය යනුයි. 'සංයෝජනයන් දුරුකොට' යනු දශ සංයෝජනයන් දුරුකොට, බැහැර කොට, සංසිඳීමකොට, සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි.

2. "මත්ස්‍යයා සලිලයෙහි දැල බිඳගෙන ගියාක් මෙන්" යන්නෙහි 'දැලයයි' නූල් දැලට කියයි. 'සලිල' යයි ජලයට කියයි. 'අම්බුතරී' යයි මත්ස්‍යයාට කියයි. දැල බිඳ, දෙබේකොට වාසය කරයි. ඉරියව් පවත්වයි, පවතියි, පාලනය කරයි, යැපෙයි. එපරිද්දෙන්ම තෘෂ්ණා දැලද, දෘෂ්ටි දැලද යන දැල් දෙක සිඳ

යන්නෙහි (මමත්වය යනු "දැලයයි" වෙනස් කොට (මහා නිද්දෙසයේ (2-6) 1 (ii) (iii) යෙදිය යුතුයි.) ඒ පසේ බුදුන් වහන්සේගේ තෘෂ්ණා ජාලය ප්‍රහීනය, දෘෂ්ටි ජාලය සංසිඳුනේය, තෘෂ්ණා ජාලය ප්‍රහීන කළ බැවින් දෘෂ්ටි ජාලය සංසිඳවූ බැවින්, ඒ පසේ බුදුන්වහන්සේ රූපයෙහි නොඇලෙයි ශබ්දයෙහි නොඇලෙයි, ගන්ධයෙහි නොඇලෙයි, දැකී, ඇසූ මුත (නාසය, දිව, සිරුර යන මෙයින්) දැනගත් ධර්මයන්හි නොඇලෙයි, නොගැටෙයි, නික්මුනේ, ඉවත් කළේ, වෙන්වූයේ සීමා නොකළ සිතින් වාසය කරයි.

3. "ගින්නෙන් දැවුන තැනට ගිනි ආපසු නොඑන්නාක් මෙන්" යනු යම්සේ ගින්න තණ, දර ආදිය දවන්නේ නොනැවතී යයිද, එසේම ඒ පසේ බුදුන් වහන්සේගේ සෝවාන් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීනද, ඒ කෙලෙස් නැවත ආපසු නොපැමිණෙයි සකෘදාගාමි මාර්ගයෙන්, අනාගාමි මාර්ගයෙන් අර්හත් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීනද, ඒ කෙලෙස් නැවත නොපැමිණෙයි. ආපසු නොඑයි එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශකළහ.

## 18-30

1. "යට බලාගත් ඇස් ඇත්තේ පාද ලොලත්වය නැත්තේ යනු විහිදවූ ඇස් ඇත්තේ වේද, (මහා නිද්දෙසයේ (14-8) 1 යෙදිය යුතුයි.) කෙසේ පාද ලොලත්වය ඇත්තේ වේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් පාද ලොලත්වයෙන් යුක්තවූයේ වේද, (මහා නිද්දෙසයේ (14-11) 2 යෙදිය යුතුයි.) ගුප්ත වූ ඉන්ද්‍රිය ඇත්තේ ආරක්ෂා කළ මනස ඇත්තේ යනු ඒ පසේ බුදුන් වහන්සේ ගුප්තවූ ඉන්ද්‍රිය ඇත්තේ වෙයි ඇසින් රූපය දැක නිමිති ගන්නේ නොවෙයි. හැඩහුරුකම් ගන්නේ නොවෙයි, යම් කරුණකින් මේ චක්ඛුන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට දැඩි ලෝභය දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ ඔහු අනුව යන්නාහුද එය සංවරය පිණිස පිළිපදියි චක්ඛුන්ද්‍රිය රකියි. චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දය අසා නාසයෙන් සුවඳ ආඝ්‍රානය කොට දිවින් රසය විඳ කයින් ස්පර්ශය

ස්පර්ශ කොට, සිතින් ධර්මය දැන නිමිති ගන්නේ නොවෙයි. හැඩහුරුකම ගන්නේ නොවෙයි යම් කරුණකින් මේ මනින්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට අභිධ්‍යාව (දැඩි ලෝභය) දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ ඔහු අනුව යන්නාහුද එය සංවරය පිණිස පිළිපදියි. මනෙන්ද්‍රිය රකියි, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ආරක්ෂා කළ මනස ඇත්තේ යනු ආරක්ෂා කළ ගෝපනය කළ මනස ඇත්තේ යනුයි. කෙලෙස් වශයෙන් ගත්තේ දාහයට පැමිණෙනු ලබන්නේ යනු මෙය ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලදී. අනවස්සුත පරියාය නම්වූ කෙලෙස් වශයෙන් නොගන්නා ධර්ම ක්‍රමය ප්‍රකාශ කරන්නෙමි. අනවස්සුත පරියාය නම්වූ එය අසව්, මනාකොට කියන්නෙමි” “එසේය ඇවැත්නියි” ඒ භික්ෂූහු ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

2. “ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. ඇවැත්නි කෙසේ අවස්සුත වේද (කාමාශාවෙහි ගිජුවේද) ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුව ඇසින් රූපය දැක (ii) ප්‍රිය රූපයෙහි ඇලේද, අප්‍රිය රූපයෙහි සිත දූෂ්‍යවේද මනාකොට මෙනෙහි නොකළ සිතින් වාසය කෙරේද, මඳ සිතිවිලි ඇත්තේවේද, චෙතො විමුක්තියද ප්‍රඥා විමුක්තියද තත්වූ පරිදි නොදනීද, යම් තැනෙක උපන් යම් ඒ ලාමක අකුශල ධර්මයෝ ඉතිරි නොකොට නිරුද්ධවේද, (iii) කණින් ශබ්ද අසා, ප්‍රිය ශබ්දයෙහි (මෙහි (ii) යෙදිය යුතුයි.) නාසයෙන් සුවඳ දැන ප්‍රිය සුවඳෙහි (මෙහි (ii) යෙදිය යුතුයි.) දිවෙන් රසය දැන ප්‍රිය රසයෙහිද (මෙහි (ii) යෙදිය යුතුයි.) කයින් ස්පර්ශය කොට ප්‍රිය ස්පර්ශයෙහි (මෙහි (ii) යෙදිය යුතුයි.) මනසින් ධර්මය දැන ප්‍රිය රූපවූ ධර්මයන්හි (මෙහි (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, ඒ භික්ෂුව ඇසින් දක්නා රූපයන්හි (iv) කාමාශාවෙන් ගිජුවූයේ වෙයි. (v) කණින් අසන ශබ්දයන්හි (මෙහි (iv) යෙදිය යුතුයි.) දිවෙන් විඳගන්නා රසයන්හි (මෙහි (iv) යෙදිය යුතුයි) කයින් විඳගන්නා ස්පර්ශයන්හි (මෙහි (iv) යෙදිය යුතුයි.) මනසින් දැනගන්නා ධර්මයන්හි කාමාසාවෙන් ගිජුවූයේ වෙයි. මෙසේ

වාසය කරන්නාවූ ඒ භික්ෂුව වෙත ඇසින්ද (vi) මාරයා පැමිණෙයි. මාරයා ඉඩ ලබන්නේද වෙයි. මාරයා ආරම්මනය ලබන්නේ වෙයි. (vii) ඒ භික්ෂුව වෙත කණින්ද (මෙහි (vi) යෙදිය යුතුයි.) ඒ භික්ෂුව වෙත නාසයෙන්ද (මෙහි (vi) යෙදිය යුතුයි.) ඒ භික්ෂුව වෙත දිවෙන්ද (මෙහි (vi) යෙදිය යුතුයි.) ඒ භික්ෂුව වෙත කයින්ද (මෙහි (vi) යෙදිය යුතුයි.) ඒ භික්ෂුව වෙත මනසින්ද (මෙහි (vi) යෙදිය යුතුයි.)

3. "ඇවැත්නි, යම්සේ බටවලින් කළ ගෙයක් හෝ උණ වලින් කළ ගෙයක් හෝ කොටස්වූයේ ඉතා පැරණිවූයේ ඇත්තේවේද, පෙරදිගින්ද පුරුෂයෙක් පත්තුවූ ගිනි හුලක්, ගෙන එහි පැමිණෙන්නේද, ගින්න එහි ඉඩක් ලබන්නේය. ගින්න අරමුණක් ලබන්නේය, බටහිර දිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද යට දිශාවෙන්ද, උඩ දිශාවෙන්ද පුරුෂයෙක්තෙම පත්තුවූ ගිනි හුලක් ගෙන එහි පැමිණෙන්නේද, ඒ ගින්න ඉඩක් ලබන්නේමය, ගින්න අරමුණක් ලබයි, මහණෙනි, එපරිද්දෙන්ම මෙසේ වාසය කරන්නාවූ භික්ෂුව වෙත (මෙහි 2 (vi) යෙදිය යුතුයි.)

4. "ඇවැත්නි, රූපයෝ (ii) මෙසේ වාසය කරන්නාවූ භික්ෂුව මැඩගනියි (iii) භික්ෂුව රූපයන් නොමඩියි. ශබ්දයෝ (ii) යොදන්න) භික්ෂුව ශබ්දයන් නොමඩියි ගන්ධයෝ (ii) යොදන්න) භික්ෂුව ගන්ධයන් නොමඩියි. රසයෝ (ii) යොදන්න) භික්ෂුව රසයන් නොමඩියි. ස්පර්ශයෝ (ii) යොදන්න) භික්ෂුව ස්පර්ශයන් නොමඩියි.

5. "මහණෙනි, රූපයෝ (ii) ඒ භික්ෂුව මැඩියේයයි මෙය කියයි (iii) ශබ්දයෝ (මෙහි (ii) යොදන්න) ගන්ධයෝ (මෙහි (ii) යොදන්න) රශයෝ (මෙහි (ii) යොදන්න) ස්පර්ශයෝ (මෙහි (ii) යොදන්න) කෙලෙස් ඇතිකරණ, නැවත භවයක් දෙන, දුක්විපාක ඇති නැවත ජරාමරණදෙන ලාමක අකුශල ධර්මයෝ නොමැඩියාහුවෙති. මහණෙනි, මෙසේ වනාහි අවස්සුත වූයේ වෙයි.

6. "ඇවැත්නි, කෙසේ අනවස්සුතවූයේවේද? ඇවැත්නි, මෙහි භික්ෂුව ඇසින් රූපය දැක ප්‍රිය රූපයයි නොඇලේද,

අප්‍රිය රූපයෙහි නොසතුටු නොවේද (ii) එළඹ සිටි කය පිළිබඳ සිහියෙන් වාසය කෙරේද, අප්‍රමාණවූ සිතින් චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද තත්වූ පරිද්දෙන් දැනගනියි. යම් තැනක ඔහුගේ ලාමක අකුශල ධර්මයෝ ඉතිරි නොකොට නිරුද්ධවෙත්. ඇවැත්නි මේ භික්ෂුව අනවස්සුතයයි කියයි. (iii) ඇසින් හැඳිනගන්නා රූපයන්හි අනවස්සුතවූයේ වෙයි. (iv) මාරයා අවකාශය නොලබයි. මාරයා ආරම්මනය නොලබන්නේ වෙයි. (v) මෙසේ වසන්නාවූ භික්ෂුව රූපයන් මැඩපවත්වයි. රූපයෝ භික්ෂුව නොමඩිත්, මහණෙනි, මේ භික්ෂුව රූපය මැඩියේයයි කියයි. කණින් ශබ්දය, නාසයෙන් ගන්ධය, දිවෙන් රසය, කයින් ස්පර්ශය, සිතින් ධර්මය (යනුද යොදාගත යුතුයි) ලාමකවූ කෙලෙස් ඇති කරන්නාවූ, නැවත භවයක් දෙන්නාවූ, නැවත ජරාමරණ දෙන්නාවූ, දුක්විපාක දෙන්නාවූ කිසිම ක්ලේශයකින් නොමැඩියේවෙයි මහණෙනි, මෙසේ වනාහි අනවස්සුතවූයේ වෙයි. නොදැවෙන්නේ යනු රාගයෙන් උපන් දාහයෙන් නොදැවෙන්නේ, ද්වෙෂයෙන් උපන් දාහයෙන් නොදැවෙන්නේ, මොහයෙන් උපන් දාහයෙන් නොදැවෙන්නේ එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-31

1. "ගිහි ලකුණු බැහැරකොට" යනු ගිහිලකුණු අත්හැර, ගිහිලකුණු බැහැරකොට, නික්ම සන්සිඳුවා, යනුයි.

2. "වැසුන කොළ ඇති පරසතු රුක මෙන්" යනු ඒ කොවිලාර නම් පරසතු රුක වැසුන සෙවන ඇත්තේ ඝනගත් කොළ ඇත්තේවේද, එමෙන්ම ඒ පසේ බුදුන් වහන්සේ සම්පූර්ණ පාත්‍රසිවුරු දැරුවේ යනුයි. කාෂාය වස්ත්‍ර ඇත්තේ ගිහිගෙන් නික්ම යනු ඒ පසේ බුදුන් වහන්සේ සියලු ගෘහවාස පලිබොධය සිඳ ඥාති පලිබොධය සිඳ, මිත්‍රයන්ගේ හා යහළුවන්ගේ පලිබොධය සිඳ රැස්කිරීමේ පලිබොධය සිඳ හිසකේ රැවුල් බැහැරකොට කසාවත් හැඳ ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිව කිසි ක්ලේශයක් හෝ කිසිවක් නැති බවට පැමිණ තනිව හැසිරෙයි. වාසය කෙරෙයි, ඉරියව් පවත්වයි,

පවතියි, පාලනය කරයි, යැපෙයි, එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-32

1. "රසයන්හි ගිජුකම නොකරන්නේ ලොල් නොවූයේ" යන්නෙහි 'රසය' නම් (මහානිද්දෙසයේ (10-7) 4 යෙදිය යුතුයි.)

2. "යම්දේ කෙරෙහි ඇළුනාවූ, ගැළුනාවූ, මූර්ඡාවූ, බැස ගත්තාවූ, ඒ රසතෘෂ්ණාව ඒ පසේ බුදුන් වහන්සේගේ ප්‍රහීනය, මුලිනුපුටන ලද්දේය. අගසිඳි තල්ගසක්මෙන් කරණලදී. සම්පූර්ණ අභාවයට පමුණුවන ලදී. නැවත නූපදනා බවට පමුණුවනලදී. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ සිහිනුවණින් විමසා ආහාරය වළඳයි. සෙල්ලම් පිණිස නොවේ, තරුණ මදාදීමද වැඩීමට නොවේ. සැරසීම පිණිස නොවේ, අලංකාර පිණිස නොවේ, යම්තාක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස, යැපීම පිණිස බඹසරට පිහිට පිණිස, 'මෙසේ පුරාණ වෙදනාව දුරුකරමි, අළුත් වෙදනාව නූපදවන්නෙමි මෙය මාගේ ජීවිත යාත්‍රාව පිණිස වන්නේය. නිරවද්‍යවූ ඵාසු විහරණය වන්නේයයි' කියාදවේ. මෙසේ රසතෘෂ්ණාවෙන් ඈත්වූසේක. වෙන්වූසේක, නික්මුනේ, මිදුනේ සීමා නොකළ සිතින් වාසය කරයි.

3. "ලොල්නොවූයේ" යනු 'ලොලුප්ප' යයි තෘෂ්ණාවට කියයි යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. ඒ ලොලුප්පනම් තෘෂ්ණාව පසේ බුදුන් වහන්සේගේ ප්‍රහීනය, මුලිනුපුටන ලද්දේය. අගසිඳි තල්ගසක්මෙන් කරණලදී. සම්පූර්ණ අභාවයට පමුණුවනලදී, නැවත නූපදනාබවට පමුණුවන ලදී. එහෙයින් පසේ බුදුන්වහන්සේ තෘෂ්ණාව දුරුකළ සේක. 'අන්‍යයන් පොෂණය නොකරන්නේ සපදාන චාරීවූයේ' යනු ඒ පසේ බුදුන්වහන්සේ තමන්ම පොෂණය කරයි. හැසිරෙයි. අන්‍යයා පොෂණය නොකරන්නේය ක්ෂීණාශ්‍රවවූයේය. වමාරණ ලද ද්වෙෂය ඇත්තේය. ඔහුට මම බ්‍රාහ්මණයායයි කියමි.

4. "සපදානචාරීවූයේ" යනු ඒ පසේ බුදුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රසිවුරුගෙන ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස හැසිරෙයි. රැකුනාවූ කයින් රැකුනාවූ වචනයෙන් රැකුනාවූ සිතින් මෙනෙහි කළ සිහියෙන්, සංවරණය කරණ ලද ඉන්ද්‍රියයන්ගෙන් යටබලාගත් ඇස් ඇතිව යහපත් ඉරියව්වලින් යුක්තව පිළිවෙලින් කුලයක් පාසා පිඬු පිණිස හැසිරෙයි. එබැවින් සපදානචාරීනම්.

5. "කුලයක් පාසා නොබැඳුන සිත් ඇත්තේ" යනු කරුණු දෙකකින් බැඳුන සිත් ඇත්තේවෙයි. තමා හෝ පහත්තැන තබන්නේ අනුන් හෝ උසස් තැන තබන්නේ බැඳුනසිත් ඇත්තේ වෙයි තමා හෝ උසස් තැන තබන්නේ අනුන් හෝ පහත් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේ වෙයි. කෙසේ තමා පහත් තැන තබන්නේ අන්‍යයා උසස් තැන තබන්නේ බැඳුන සිත් ඇත්තේවේද (මහානිද්දෙසයේ (14-15) 4 'නැවත කරුණු දෙකකින්' යන තැන සිට යොදා ගත යුතුයි.) මෙසේ තමා උසස් තැන තබා අන්‍යයා පහත් තැන තබා බැඳුන සිත් ඇත්තේ වෙයි.

6. "කුලයක් (ගෙදරක්) පාසා නොබැඳුන සිත් ඇත්තේවෙයි" යනු ඒ පසේ බුදුන් වහන්සේ කුලපලි බොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි ගණ පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි. ආවාස පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි. චීවර පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි. පිණ්ඩපාත පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි. සෙනාසන පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේවෙයි. ගිලන්පස බෙහෙත් පිරිකර පලිබොධයෙන් නොබැඳුන සිත් ඇත්තේ වෙයි, යනුයි. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ ප්‍රකාශ කළසේක.

18-33

1. "සිතින් පඤ්චනීවරණයන් හැර" යනු ඒ පසේබුදුන් වහන්සේ කාමච්ඡන්ද නීවරණය (ii) දුරුකොට බැහැර කොට සංසිඳුවා සම්පූර්ණ අභාවයට පමුණුවා (iii) ව්‍යාපාද නීවරණය

(මෙහි (ii) යෙදිය යුතුයි) ථිනමිද්ධ නීවරණය (මෙහි (ii) යෙදිය යුතුයි) උද්ධච්ච කුක්කුච්ච නීවරණය (මෙහි (ii) යෙදිය යුතුයි.) විචිකිච්චා නීවරණය (මෙහි (ii) යෙදිය යුතුයි.) කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

2. "චිත්තොපක්ලේශයන් දුරුකොට" යනු රාගය, සිතට උපක්ලේශයකි. ද්වෙෂය සිතට උපක්ලේශයකි. මොහය සිතට උපක්ලේශයකි ක්‍රොධය සිතට උපක්ලේශයකි. බද්ධ වෛරය සිතට උපක්ලේශයකි. (උපක්ලේශය යනු යොදා (3-4) 3 'ගුණමකුකම' යන තැන සිට යෙදිය යුතුයි.) සියලු අකුශල රැස්කිරීම් සිතට උපක්ලේශයකි. සියලු චිත්තොපක්ලේශයන් දුරුකොට බැහැරකොට සංසිඳුවා, සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි.

3. "නොඇළුනේ ස්නේහ දොෂය සිඳ" යන්නෙහි 'නොඇළුනේ' යනු නිශ්‍රය (ඇලීම්) දෙකකි, තෘෂ්ණානිශ්‍රයද, දෘෂ්ටි නිශ්‍රයද යනුයි. (මමත්වය යනු 'නිශ්‍රයයයි' වෙනස්කොට (මහා නිද්දේශයේ (2-6) 1 (ii) (iii) යෙදිය යුතුයි.) 'ස්නේහ දොෂය' යනු ස්නේහ දෙකකි. තෘෂ්ණා ස්නේහයද දෘෂ්ටිස්නේහයද යනුයි... (මමත්වය යනු 'ස්නෙහයයි' වෙනස් කොට (මහානිද්දේශයේ (2-6) 1 (ii) (iii) යෙදිය යුතුයි)

4. "ද්වෙෂ" යනු යම් චිත්තයාගේ ක්‍රොධයක් ඇද්ද, වෛරයක් ඇද්ද, ප්‍රතිවිරොධයක් ඇද්ද, කෝපයක් ප්‍රකෝපයක් සම් ප්‍රකෝපයක්, ද්වෙෂයක්, ප්‍රදොෂයක්, සම් ප්‍රදොෂයක්, චිත්තයාගේ නොසන්සුන් බවක්, කෝපයක්, කිපීම් බවක් ද්වෙෂයක් ද්වෙෂවීම් බවක්, ව්‍යාපාදයක්, ව්‍යාපාදවීම් බවක් චිත්තයාගේ ක්‍රොධයක්, බද්ධවෛරයක්, කෝපයක්, විරොධයක්, ප්‍රතිවිරොධයක් චණ්ඩ බවක් කඳුළු නැගීමක්, සිතේ නොසතුටුබවක් ඇද්ද, එයයි ඒ පසේ බුදුන් වහන්සේ තෘෂ්ණා ස්නේහයද දෘෂ්ටි ස්නේහයද ද්වෙෂයද සිඳ විශේෂයෙන් සිඳ සන්සිඳුවා සම්පූර්ණ අභාවයට පමුණුවා ඇසෙහි නොඇළුනේ,

කණෙහි නොඇළුනේ නාසයෙහි, දිවෙහි කයෙහි නොඇළුනේ දැකි, ඇසූ මුතයෙන් ගත් දැනගතයුතු ධර්මයන්හි, නොඇළුනේ නොපැමිණියේ නොගැළුනේ, නික්මුනේ වෙන්වූයේ සීමානොකළ සිතින් වාසයකරයි යනුයි. එහෙයින් ඒ පසේබුදුන්වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-34

1. "මුලින්ම සොම්නස් දොම්නස් දෙකද සැප දුක් දෙකද බහාතබා" යනු ඒ පසේබුදුන් වහන්සේ සැපයාගේද ප්‍රහාණයෙන් දුක්ඛයාගේද ප්‍රහාණයෙන් මුලින්ම සොම්නස් දොම්නස් දෙක අස්තයට පමුණුවා දුක් නොවූ සුව නොවූ උපෙක්ෂාව හා සිහියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට සමවැද වාසය කරයි.

2. "පිරිසිදුවූ උපෙක්ෂාවද සමථයද ලැබ" යනු යම් සතරවන ධ්‍යානයෙහි උපෙක්ෂාවක් ඇද්ද, චිත්තයාගේ එකග්‍රකමක් ඇද්ද, එක් අරමුණක පිහිටි බවක් ඇද්ද, සිතේ නොවිසුරණ බවක් ඇද්ද, සමාධින්ද්‍රිය, සමාධි බලය, සම්‍යක් සමාධියක් ඇද්ද යනුයි. සතරවන ධ්‍යානයෙහි උපෙක්ෂාව හා එකග්‍රකම පිරිසිදුවූවාහු බබලන්නාහු කෙලෙස් නැතිවූවාහු මෘදුවූවාහු කර්මයට යොග්‍යව සිටියාහු තෘෂ්ණා රහිතවූවාහු පිරිසිදු වූවාහු වෙති. පිරිසිදුවූ උපෙක්ෂාවද සමථයද ලැබ යනු චතුර්ථධ්‍යානයෙහි උපෙක්ෂාවද සමථයද ලැබ යනුයි එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-35

1. "පරමාර්ථයට පැමිණීම පිණිස පටන්ගත් වීර්ය ඇත්තේ" යනු පරමාර්ථය යයි අමෘතවූ නිර්වාණයට කියයි. යම් ඒ යමක් සියලු සංස්කාරයන් සංසිඳවූයේ සියලු උපධීන් බැහැර කළේ, තෘෂ්ණාව ක්ෂයකළේ විරාගනම්වූ නිරොධ නම්වූ නිර්වාණය යනුයි. පරමාර්ථයට පැමිණීම පිණිස එය ලැබීම පිණිස අධිගමය පිණිස, ස්පර්ශ කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, අකුශල ධර්මයන්ගේ ප්‍රහානය පිණිස, කුශල ධර්මයන් ගැනීම පිණිස,

උත්සාහයෙන්, දැඩි පරාක්‍රමයෙන් කුශල ධර්මයන්හි බහා නොතැබූ ධෛර්ය ඇතිව පටන්ගත් වීර්ය ඇතිව වාසය කරයි.

**2.** "ඒ පසේබුදුවරයා නූපන් ලාමකවූ අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස (ii) කැමැත්ත ඇතිකරයි. වෑයම් කරයි වීර්ය පටන්ගනියි. සිත දැඩිකොට තවයි (iii) උපන් ලාමකවූ අකුශල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස (මෙහි (ii) යෙදිය යුතුයි) නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස (මෙහි (ii) යෙදිය යුතුයි.) කුශලධර්මයන්ගේ පැවැත්ම පිණිස, වෙනස් නොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත් බව පිණිස භාවනාව සම්පූර්ණ කිරීමෙන් (මෙහි (ii) යෙදිය යුතුයි) මෙසේද නොපසුබට සිත් ඇත්තේ කුසීත නොවූ පැවැත්ම ඇත්තේ වෙයි.

**3.** "නැවතද ඒකාන්තයෙන් සමද නහරද ඇටද ඉතිරි වේවා, මස් ලේ (වියලේවා) යම් ඒ පුරුෂ ශක්තියෙන්, පුරුෂ බලයෙන් පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුත්ත එසේ නොපැමිණ වීර්යයේ තැබීම නොවන්නේයයි (ii) සිත දැඩි කොට ගනියි. තබයි, මෙසේද නොපසුබස්නා සිත් ඇත්තේ කම්මැලි නොවූ පැවතුම් ඇත්තේ යනුයි.

**4.** "යම්තාක් මාගේ දැඩිව නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත මිදෙන්නේද, ඒතාක් මේ ආසනයෙන් නොනැගිටින්නෙමියි (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ඒතාක් මම මේ සක්මනින් නොබසින්නෙමි. යම්තාක් දැඩිව නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත නොමිදේද ඒතාක් විහාරයෙන් නොනික්මෙන්නෙමි (මහානිද්දේශයේ (3-3) 3 'සක්මනෙන්' යන තැන සිට යෙදිය යුතුයි. 1576 පිට)

**5.** "මේ පෙරවරු කාලයෙහි (ii) ආර්ය ධර්මය ලබන්නෙමි. මනාකොට ගෙනෙන්නෙමි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කරන්නෙමියි මේ මධ්‍යාහ්න කාලයෙහි (මෙහි (ii) සවස් කාලයෙහි (මෙහි (ii) (iii) පෙරබත් කාලයෙහි (මෙහි (ii) පසුබත් කාලයෙහි (මෙහි (ii) පූර්ව යාමයෙහි (මෙහි (ii) මධ්‍යම යාමයෙහි (මෙහි (ii) වර්ෂා කාලයෙහි (මෙහි (ii) ග්‍රීෂ්ම කාලයෙහි (මෙහි (ii) පූර්ව වයස් කොටසෙහි (මෙහි (ii) මධ්‍යම

වයස් කොටසෙහි (මෙහි (ii) අන්තිම වයස් කොටසෙහි (මෙහි (ii) දැඩි උත්සාහ ඇත්තේ වීර්‍ය බලයෙන් යුක්තවූයේ යනු ඒ පසේ බුදුන් වහන්සේ දැඩිව ගැනීම් ඇතිසේක.

6. "කුශල ධර්මයන්හි ස්ථිර ගැනීම් ඇතිසේක. කාය සුචරිතයෙහි, වචී සුචරිතයෙහි, දාන සංවිභාගයෙහි සීල සමාදානයෙහි උපොසථ වාසයෙහි, මවුන් පිදීමෙහි, පියන් පිදීමෙහි, ශ්‍රමණයන් පිදීමෙහි, බ්‍රාහ්මණ (කෙලෙස් රහිතයන්) පිදීමෙහි, යන එක්තරා අධි කුශල ධර්මයන්හි යුක්තවූයේ යනුයි.

7. "වීර්‍ය බලයෙන් යුක්තවූයේ" යනු ඒ පසේ බුදුන් වහන්සේ ධෛර්‍ය බලයෙන්ද, වීර්‍ය පරාක්‍රමයෙන්ද ප්‍රඥාවෙන්ද යුක්තවූයේ, පැමිණියේ, උපන්නේ වෙයි යනුයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-36

1. "විවේකයෙන් යුක්තව ධ්‍යානයෙහි යෙදෙන්නේ" යනු ඒ පසේබුදුන් වහන්සේ විවේකයෙන් යුක්තවූයේ වෙයි. විවේකයෙහි ඇළුනේ වෙයි. අධ්‍යාත්මයෙහි චිත්ත සමථයෙහි යෙදුනේ, දුරුනොකළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්තවූයේ ශුන්‍යාගාරයෙහි ධ්‍යානය කරන්නේ, ධ්‍යානයෙහි ඇළුනේ එක් නිශ්චයක යෙදුනේ පදාර්ථය ගරුකළේ විවේකවූ ධ්‍යානය ආශ්‍රය කළේ වෙයි.

2. "ඒ පසේ බුදුන් වහන්සේ කරුණු දෙකකින් ධ්‍යානයෙහි යෙදෙයි. නූපන් හෝ ප්‍රථම ධ්‍යානයාගේ දැඩිව ගැනීමෙහි යුක්තවූයේ නූපන් හෝ ද්විතීය ධ්‍යානයාගේ දැඩිව ගැනීමෙහි, තෘතීය ධ්‍යානයාගේ චතුර්ථධ්‍යානයාගේ දැඩිව ගැනීමෙහි යුක්තවූයේනුයි. මෙසේද ධ්‍යානයෙහි යෙදෙයි. නැවතද උපන් ප්‍රථම ධ්‍යානය ආසෙවනය කරයි, වඩයි, බහුල කරයි, උපන් හෝ ද්විතීයධ්‍යානය, උපන් හෝ තෘතීයධ්‍යානය උපන් හෝ චතුර්ථ ධ්‍යානය ආසේවනය කරයි, වඩයි, බහුල කරයි, මෙසේ ධ්‍යානයෙහි යෙදෙයි.

3. "ධර්මයන්හි නිතර යෙදෙන්නේ ධර්මයෙහි හැසිරෙන්නේ" යන්නෙහි ධර්මයෝ යනු සතර සතිපට්ඨානයෝ

සතර සම්‍යක් ප්‍රධාන පඤ්චෙන්ද්‍රිය පංචබල සප්තබොධ්‍යංග ආර්ය අෂ්ටාංගික මාර්ගය යනුයි. අනුධර්මයෝ කවරහුද සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව, අවිරුද්ධ ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව, ධර්මානු ධර්ම ප්‍රතිපදාව, ශීලයන් සම්පූර්ණ කිරීම් බව ඉන්ද්‍රියයන්හි වැසුන දොර ඇති බව, භොජනයන්හි ප්‍රමාණය දන්නා බව නිදිවර්ජිත කිරීමෙහි යෙදීම, සිහිනුවණ යෙදීම, යනු මේ අනු ධර්මයෝ යයි කියත්. 'නිත්‍යයෙන්' යනු නිත්‍යයෙන් සතතයෙන් නිරන්තරයෙන් ඊතලයෙන්, ඊතලයසේ දිය රැල්ලෙන් දිය රැල්ලසේ අතරක් නැතිසේ පවත්නා, පෙර බත් කාලයෙහි පසුබත් කාලයෙහි, පූර්ව යාමයෙහි, පශ්චිමයාමයෙහි, ආලෝක කාලයෙහි හෝ සඳ රැසෙහි හේමන්තයෙහි, ග්‍රීෂ්මයෙහි පෙර වයස්කොටසෙහි, මධ්‍යම වයස් කොටසෙහි, පශ්චිම වයස් කොටසෙහි හැසිරෙයි, ඉරියව් පවත්වයි, පාලනය කරයි, යැපෙයි.

4. "භවයන්හි ආදීනවය කල්පනා කොට" යනු සියලු සංස්කාරයෝ අනිත්‍යයයි භවයන්හි ආදීනවය කල්පනා කොට, සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්ම යයි භවයන්හි ආදීනවය කල්පනාකොට යම් කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධි පිණිස පවත්නේයයි භවයන්හි ආදීනවය කල්පනා කරන්නේ යනුයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-37

1. "අප්‍රමාදවූයේ තෘෂ්ණාක්ෂය ප්‍රාර්ථනා කරන්නේ" යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම තෘෂ්ණා යනුයි. 'තෘෂ්ණාක්ෂය' යනු රාගක්ෂය, ද්වෙෂක්ෂය, මොහක්ෂය, ගතික්ෂය, උත්පත්තික්ෂය, ප්‍රතිසන්ධික්ෂය, භවක්ෂය, සංසාරක්ෂය වට්ටක්ෂය, කැමතිවන්නේ බලාපොරොත්තුවන්නේ, ආශාකරන්නේ, යනුයි.

2. ඒ පසේබුදුන් වහන්සේ සකස්ව කටයුතු කරණ සේක. නිතර කටයුතු කරණ සේක. කුශල ධර්මයන්හි අප්‍රමාදවූ සේක. කෙලතොළු නොවූයේ ඇසූ පිරූ තැන් ඇත්තේ සිහි ඇත්තේ යන තන්හි කෙළතොළු නොවූයේ යනු ඒ පසේ බුදුන්වහන්සේ

පණ්ඩිතවූයේ නුවණැත්තේ, බුද්ධි ඇත්තේ ඥාන ඇත්තේ විභාවීවූයේ, මෙධාවීවූයේ යනුයි.

3. "ඇසූ පිරූ තැන් ඇත්තේ" යනු ඒ පසේබුදුන් වහන්සේ ශ්‍රැතවත් වූයේ ශ්‍රැතධරවූයේ, රැස්කළ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි. යම් ඒ ධර්මයෝ මුල පිරිසිදුද, මැද පිරිසිදුද, අග පිරිසිදුද, අර්ථසහිත, ව්‍යඤ්ජන සහිත, සියල්ල සම්පූර්ණවූ පිරිසිදුවූ, බ්‍රහ්මචරියාව ප්‍රකාශ කෙරෙද්ද, එබඳු ධර්මයෝ බොහෝකොට අසන ලද්දේ වෙයි, දරණ ලද්දේ වචනයෙන් පුරුදු කරණ ලද්දේ සිතින් විමසා බලන ලද්දේ දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද්දේ වෙයි.

4. "සිහි ඇත්තේ" යනු ඒ පසේ බුදුන් වහන්සේ සිහි ඇත්තේ වෙයි. උතුම්වූ සිහියෙන් හා නුවණින් යුක්තවූ බැවින් කොට බොහෝ කල්වූ දේද කියා බොහෝ කල්වූ දේද, සිහිකරයි.

5. "සංඛාත ධර්ම හෙවත් ඥානයෙන් නියමය දන්නේ ප්‍රධන්වීර්ය ඇත්තේ" යන්නෙහි සංඛාත ධර්මයෝයයි ඥානයට කියත්. යම් ප්‍රඥාවක් ඇද්ද දැනීමක් (මහා නිද්දේසයේ (3-1) 3 යොදාගත යුතුයි.) අමොහය ධම්මවිචය, සම්‍යක් දෘෂ්ටිය නම් වේද එයයි. ඒ පසේබුදුන් වහන්සේ සංඛාත ධර්මයෙන් යුක්තවූයේ (ii) ඥානධර්මයෙන් යුක්තවූයේ තුලින ධර්මයෙන් යුක්තවූයේ විභූත ධර්මයෙන් යුක්තවූයේ සියලු සංස්කාරයෝ අනිත්‍යයයි සංඛාත ධර්මයෙන් යුක්තවූයේ (මෙහි (ii) යොදාගත යුතුයි) යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරුද්ධිය පිණිස පවත්නේයයි සංඛාත ධර්ම ඇත්තේ (මෙහි (ii) යොදාගත යුතුයි.)

6. "නැවතද, ඒ පසේබුදුන් වහන්සේගේ ස්කන්ධයෝ කෙටි වූහ. ධාතු කෙටිවූහ. ආයතනයෝ කෙටිවූහ. ගතීහු කෙටිවූහ. උත්පත්තීහු කෙටි වූහ. ප්‍රතිසන්ධීහු කෙටිවූහ. භවයෝ කෙටිවූහ. සංසාරයෝ කෙටිවූහ. වට්ටයෝ කෙටිවූහ.

7. "නැවතද ඒ පසේබුදුන් වහන්සේ ස්කන්ධයන්ගේ කෙළවර සිටි සේක. ධාතු කෙළවර සිටි සේක, ආයතන කෙළවර සිටි සේක, ගති කෙළවර සිටි සේක, උත්පත්ති කෙළවර සිටි

සේක, ප්‍රතිසන්ධි කෙළවර සිටි සේක, භව කෙළවර සිටි සේක, සංසාර කෙළවර සිටිසේක, වට්ටය කෙළවර සිටිසේක, සංස්කාර කෙළවර සිටි සේක, අන්තිම භවයෙහි සිටිසේක. පසේ බුදුන් වහන්සේට ජාති මරණ සංසාරයක් නැත, පුනර්භවයක් නැත, ඒ කාරණයෙන් පසේබුදුන්වහන්සේ සංඛාත ධර්මයෙන් (ඥානයෙන්) යුක්තසේක.

8. "නිශ්චය ඇත්තේ" යනු නියමයයි සතර ආර්ය මාර්ගයට කියයි. සතර ආර්ය මාර්ගයෙන් යුක්තවූයේනුයි නියත නම්. නියාමයට පැමිණියේ සම්ප්‍රාප්තවූයේ අධිගත වූයේ දැක්කේ ප්‍රත්‍යක්ෂ කළේ යනුයි.

9. "පධානයෙන් යුක්තවූයේ" යනු පධානයයි වීර්යයට කියයි. යම් චිත්තයාගේ වීර්යාරම්භයක් ඇද්ද නික්මීමක් පරාක්‍රමයක් උද්‍යෝගයක් උත්සාහයක් උත්සාහ බවක් ඇද්ද ශක්තියක් ලිහිල් නොවූ උත්සාහයක් ඇද්ද බහා නොතැබූ කැමැත්තක් ඇද්ද බහා නොතැබූ වීර්යයක් ඇද්ද, ධෛර්ය දැඩිව ගැණීමක් ඇද්ද, වීර්ය විරියින්ද්‍රිය විරිය බලය, සම්මාවායාමය, යන මෙයද යනුයි. ඒ පසේ බුදුන් වහන්සේ මේ වීර්යයෙන් යුක්තවූයේ පැමිණියේ වෙයි එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ වීර්යයෙන් යුක්ත සේක. එහෙයින් ඒ පසේ බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

18-38

1. "ශබ්දයන්හි සන්ත්‍රාස නොවූ සිංහයා මෙන්" යනු යම්සේ මෘගරාජවූ සිංහයා ශබ්දයන්හි සන්ත්‍රාස නොවූයේ උත්‍රාස නොවූයේ, බිය නොවූයේ, පලා නොයන්නේවේද,

2. "දැලෙහි නොබැඳෙන වාතය මෙන්" යන්නෙහි වාතය නම් පෙරදිග, වාතය බටහිර දිග වාතය, උතුරුදිග වාතය, දකුණු දිග වාතය, ධූලි සහිත වාතය, ධූලි රහිත වාතය, ශීතල වාතය, උෂ්ණ වාතය, ස්වල්ප වාතය, මහත් වාතය, පක්ෂ වාතය තල්පතින් ඇතිකරවන වාතය, විජිනිපතේ වාතය යනුයි. "දැල" යනු නූල් දැලට කියයි. යම්සේ වාතය දැලෙහි නොබැඳේද නොගැටේද, නොදනීද, එමෙන් තෘෂ්ණා ජාලයද දෘෂ්ටි ජාලයද

යන මේ දැල් දෙක (මමත්වය යනු දැල යයි වෙනස්කොට (මහානිද්දේශයේ (2-6) 1 (ii) (iii) යොදාගත යුතුයි) ඒ පසේ බුදුන් වහන්සේගේ තෘෂ්ණා දැල ප්‍රහීනය, දෘෂ්ටි දැල සංසිඳුනේය, තෘෂ්ණා දැල ප්‍රහීනවූ බැවින් දෘෂ්ටි දැල සංසිඳුන බැවින් ඒ පසේ බුදුන් වහන්සේ (ii) රූපයෙහි නොගැටෙයි. ශබ්දයෙහි නොගැටෙයි, ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි නොගැටෙයි. දැකි ඇසූ මුත වශයෙන් ගත් දැනගත යුතු ධර්මයන්හි නොගැටෙයි, නොගනියි. නොබඳියි. නික්මුනේ, වෙන්වුනේ, සීමා නොකළ සිතින් වාසය කරයි.

3. "ජලය හා නොගැටෙන පියුම මෙන්" යන්නෙහි පියුමයයි නෙළුම් මලට කියයි. තොයයයි ජලයට කියයි. යම්සේ නෙළුම් මල දිය හා නොගැටෙද, එමෙන්ම ඇලීම් දෙක එනම් තෘෂ්ණා ඇලීම්ද දෘෂ්ටි ඇලීම්ද නොඇළුනේය. (මමත්වය යනු ඇලීමයයි වෙනස්කොට (මහා නිද්දෙසයේ (2-6) 1 (ii) (iii) යොදාගත යුතුයි.) ඒ පසේ බුදුන් වහන්සේගේ තෘෂ්ණාලෙපය ප්‍රහීනය දෘෂ්ටිලෙපය සන්සිඳුනේය තෘෂ්ණාලෙපය ප්‍රහීනවූ බැවින් දෘෂ්ටිලෙපය සන්සිඳුන බැවින් ඒ පසේබුදුන් වහන්සේ රූපයෙහි නොඇලෙයි (මෙහි 2 (ii) යෙදිය යුතුයි) දැකි, ඇසූ මුත වශයෙන් ගත්, දැනගත යුතු ධර්මයන්හි නොඇලෙයි නොඇළුනේ, නොඑරුනේ, නික්මුනේ, වෙන්වූයේ මිදුනේ, සීමානොකළ සිතින් වාසයකරයි, යනුයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශකළහ.

## 18-39

1. "දළ බලයකොට ඇති සිංහතෙම (තිරිසනුන්) මැඩ හැසිරේද" යනු යම්සේ මෘග රාජවූ සිංහයා දළ බලයකොට ඇත්තේ දළ ආයුධකොට ඇත්තේ සියලු තිරිසන් ගත ප්‍රාණීන් මැඩපවත්වා යටපත්කොට වාසය කෙරේද, ඉරියව් පවත්වාද, පාලනය කෙරේද යැපේද, පසේබුදුන් වහන්සේද, ප්‍රඥාව බලයකොට ඇත්තේ ප්‍රඥාව ආයුධකොට ඇත්තේ බලයකොට ඇත්තේ සියලු ප්‍රාණය ඇති පුද්ගලයන් ප්‍රඥාවෙන් මැඩපවත්වා යටපත් කොට හැසිරෙයි, ඉරියව් පවත්වයි, පාලනය කරයි, යැපෙයි.

2. "වනයෙහි දුර සෙනසුන් සේවනයකරයි" යනු යම්සේ මෘග රාජවූ සිංහයා මහ වනයෙහි වනය මැද හැසිරේද, වාසය කෙරේද, ඉරියව් පවත්වාද, පවතීද, පාලනය කෙරේද, යැපේද, පසේබුදුන් වහන්සේද වනයෙහි දුරවූ අල්ප ශබ්ද ඇති අල්ප ඝෝෂා ඇති, මිනිසුන්ගෙන් තොර මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය විවේකයට සුදුසු සෙනසුන් සේවනය කරයි.

3. හෙතෙම තනිව යයි, තනිව සිටියි, තනිව හිඳියි, තනිව සයනය කරයි, තනිව ගමට පිඬු පිණිස හැසිරෙයි. තනිව ආපසු එයි, තනිව රහසිගතව වැඩහිඳියි, තනිව සක්මනට බැස ගනියි තනිව හැසිරෙයි. වාසය කරයි. ඉරියව් පවත්වයි. පවතියි. පාලනය කරයි. යැපෙයි යනුයි. එහෙයින් පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළසේක.

## 18-40

1. "මෛත්‍රීයද, කරුණාවද, මුදිතාවද, උපෙක්ෂාවද සුදුසු කාලයෙහි වඩන්නේ" යනු ඒ පසේබුදුන් වහන්සේ මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසයකරයි. එසේ දෙවන දිශාවද, එසේ තුන්වන දිශාවද, එසේ සතරවන දිශාවද මෙසේ උඩද යටද සරසද යන සියලු ලෝකය පතුරුවා වාසය කරයි, උපෙක්ෂා සහගත සිතින් විපුලවූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරයෙන් අව්‍යාපාදයෙන්, පතුරුවා වාසය කරයි.

1. "සියලු ලොකයා විසින් විරුද්ධ නොවනු ලබන්නේ" යනු මෛත්‍රීය වඩනලද බැවින් (ii) යම් ඒ පෙරදිග වැසි සත්වයෝ වෙද්ද ඔව්හු විරුද්ධ නොවූවාහු වෙති. යම් ඒ බටහිර දිග වැසි සත්වයෝ වෙද්ද, යම් ඒ උතුරුදිග වැසි සත්වයෝ වෙද්ද, යම් ඒ දකුණුදිග වැසි සත්වයෝ වෙද්ද, යම් පූර්ව අනුදිග සත්වයෝවෙද්ද, යම් බටහිර අනුදිග සත්වයෝ වෙද්ද යම් උතුරු අනුදිග සත්වයෝ වෙද්ද, යම් දකුණු අනුදිග සත්වයෝ වෙද්ද, යම් යටදිශාවෙහි සත්වයෝ වෙද්ද, යම් මතු දිශාවෙහි සත්වයෝ වෙද්ද, යම් දශදිසාවෙහි සත්වයෝ වෙද්ද, ඔව්හු අවිරුද්ධවූවාහු වෙති. කරුණාව වඩනලද බැවින්, මුදිතාව වඩනලද බැවින්, උපෙක්ෂාව වඩනලද බැවින් පෙරදිග සත්වයෝ (මෙහි (ii)

යෙදිය යුතුයි) යම් ඒ දශ දිශාවෙහි සත්වයෝ වෙද්ද, ඔව්හු අවිරුද්ධ වූවාහු වෙති.

3. "සියලු ලෝකයා විසින් විරුද්ධ නොවනු ලබන්නේ" යනු සියලු ලෝකයා විසින් විරුද්ධ නොවනු ලබන්නේ, වෛර නොවනු ලබන්නේ, නොගැටෙනු ලබන්නේ යනුයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

## 18-41

1. "රාගයද, ද්වෙෂයද, මොහයද දුරුකොට" යනු රාගය නම් යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ලෝභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. ද්වෙෂ යනු යම් චිත්තයාගේ වෛරයක් චණ්ඩ ගතියක් කඳුළුහෙලීමක් නොසතුටු බවක් ඇද්ද එයයි. මෝහය යනු දුකෙහි නොදැනීම, දුක් හේතුව නොදැනීම, නිරෝධයේ නොදැනීම, නිරෝධගාමිනී ප්‍රතිපදාවේ නොදැනීම, අවිද්‍යාව, ඉදිරුව, මොහය, අකුශල මූලය යනුයි. ඒ පසේබුදුන් වහන්සේ රාගයද, ද්වෙෂයද, මෝහයද දුරුකොට, බැහැරකොට, සන්සිඳුවා, සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි.

2. "සංයෝජනයන් (බැමි) කඩාදමා" යනු කාම රාග සංයෝජනය ප්‍රතිඝ සංයෝජනය, මෝහ, දෘෂ්ටි, විචිකිච්ඡා භවරාග, මාන උද්ධච්ච අවිද්‍යා සංයෝජනය යනුයි. කඩාදමා යනු දශසංයෝජනයන් කඩාදමා. පලාදමා, බැහැරකොට සංසිඳුවා සම්පූර්ණ අභාවයට පමුණුවා යනුයි.

3. "ජීවිත කෙළවරද සන්ත්‍රාසයට නොපැමිණේ" යනු ජීවිතාවසානයෙහිද තැතිනොගන්නේ, නොසැලෙන්නේ, භය නොවන්නේ, පලා නොයන්නේ ප්‍රහීනකළ භය හා භයට හේතු ඇත්තේ, පහකළ ලොමුඩැහැගැනුම් ඇත්තේ වාසය කරයි. එහෙයින් ඒ පසේබුදුන් වහන්සේ ප්‍රකාශ කළහ."

## 18-42

1. "ආත්මාර්ථ කාරණයෙන් භජනය කරත් සේවනය කරත්" යනු ආත්මාර්ථ කාරණයෙන් පරාර්ථ කාරණයෙන් උභයාර්ථ කාරණයෙන් මෙලොව අර්ථය පිළිබඳ කාරණයෙන් පරලොව

අර්ථය පිළිබඳ කාරණයෙන් පරමාර්ථය පිළිබඳ කාරණයෙන් සේවනය කරත්, භජනය කරත් යනුයි.

2. "කරුණක් නැති මිත්‍රයෝ අද දුර්ලභයහ. යනු මිත්‍රයෝ දෙදෙනෙකි. ගිහි මිත්‍රයාය පැවිදි මිත්‍රයාය යනුයි. හේතුවක් නැති, කාරණයක් නැති, මේ මිත්‍රයෝ දෙදෙන දුර්ලභයහ. දුකසේ ලැබිය යුත්තාහ.

3. "අපිරිසිදු මිනිස්සු" යනු ආත්මාර්ථ" සංඥාවෙන් යුක්තවූවෝ යනුයි. ආත්මාර්ථ සංඥාව නම් තමන්ගේ ප්‍රයෝජනය පිණිස, භජනයකරත්, සේවනය කරත්, හැසිරෙත්, පයිරුපාසනය කරත්, ප්‍රශ්න විචාරත් යනුයි. 'අපිරිසිදු මිනිස්සු' යනු අපිරිසිදු කාය කර්මයෙන් යුත් මිනිස්සු, අපිරිසිදු වාග් කර්මයෙන් යුත් මිනිස්සු, අපිරිසිදු මනඃකර්මයෙන් යුත් මිනිස්සු යනුයි. අපිරිසිදු අදත්තාදානයෙන්, අපිරිසිදු කාමමිත්‍ථ්‍යාචාරයෙන් අපිරිසිදු මුසාවාදයෙන්, අපිරිසිදු කේළාම් කීමෙන්, අපිරිසිදු නපුරු වචනකීමෙන්, අපිරිසිදු හිස්වචන කීමෙන්, අපිරිසිදු දැඩි ලොභයෙන්, අපිරිසිදු අනුන් විනාශකරණ සිතිවිල්ලෙන්, යුක්තවූ යනුයි. නැවතද අපිරිසිදු මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත බැවින් අපිරිසිදු මිනිස්සු නමි. අපිරිසිදු චෙතනාවෙන් යුක්තවූවෝ අපිරිසිදු මිනිස්සු නමි. අපිරිසිදු ප්‍රාර්ථනාවෙන් යුක්තවූවෝ අපිරිසිදු මිනිස්සු නමි. අපිරිසිදු නොයෙක් ආකාර ලාමකවූ පහත්වූ, ස්වල්පවූ යනුයි. එහෙයින් ඒ පසේ බුදුන්වහන්සේ 'ආත්මාර්ථ කාරණයෙන් භජනය කරත්, සේවනය කරත්යයි' ප්‍රකාශ කළහ.

චූලනිද්දේසය නිමි.

# 12. පටිසම්භිදා මග්ග පාළි

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

## 1. ඤාණකථා.

සොතද්වාරානුසාරයෙන් (කණින් අසා) දැනගන්නාලද ධර්ම සමූහයෙහිවූ ප්‍රඥාව සුතමය ඤාණ නමි.

සුතමය ඤාණයෙහි වදාළාවූ ධර්ම සමූහය අසා සතර සංවර සීලයෙහි පවත්නා ප්‍රඥාව සීලමය ඤාණ නමි.

සීලමය ඤාණයෙන් සංවරයෙහි පිහිටා එක් අරමුණක සිත මනාකොට පිහිටුවීමෙහි ප්‍රඥාව සමාධි භාවනාමය ඤාණනමි.

අවිද්‍යාදීප්‍රත්‍ය සංස්කාරාදි ප්‍රත්‍යුත්පන්න ධර්මයන් පිරිසිඳ දැන ගැනීමෙහි ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණ නමි.

අතීතානාගත, දැන් පවත්නා පඤ්චස්කන්ධයන් අතුරෙන් එකි එකී ස්කන්ධයක්හුගේ ලක්ෂණ හකුළුවා පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව සම්මසන ඤාණ නමි.

දැන් පවත්නා පඤ්චස්කන්ධයන්ගේ වෙනස්වන ස්වභාවය නැවත නැවත බැලීමෙහි ප්‍රඥාව උදයබ්බයානුපස්සනාඤාණ නමි.

ඒ ඒ ආරම්මණයන්හි පවත්නා ධර්මසමූහය මෙනෙහි කොට ඉපදීම හා නැතිවීම නැවත නැවත බැලීමෙහිවූ ප්‍රඥාව විපස්සනා ඤාණ නමි.

භය වශයෙන් දක්නා අරමුණෙහි පවත්නා ප්‍රඥාව ආදීනව ඤාණ නමි.

වෘත්තයෙන් මිදෙනු කැමති බව ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීම, ත්‍රිලක්ෂණයෙහි මනාව පිහිටීම යන මෙහි පවත්නා ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි,

බාහිරවූ සංඛාර නිමිත්තෙන් නැගිටීමෙහි හා පෙරළීමෙහි වූ ප්‍රඥාව ගොත්‍රභූ ඤාණ නමි.

දෙයාකාරයකින් සංස්කාරයන් කෙරෙන් නැගිටීමෙහි හා පෙරළීමෙහි පවත්නා ප්‍රඥාව මග්ගඤාණ නමි.

ප්‍රයොගයයි කියන ලද වුට්ඨානයාගේ සංසිඳීම් වශයෙන් පවත්නාවූ ප්‍රඥාව ඵලඤාණ නමි.

ඒ ඒ මාර්ගයෙන් සිඳිනලද ක්ලෙශ සමූහය නැවත බැලීමෙහි වූ ප්‍රඥාව විමුක්තිඤාණ නමි.

ඒ ඒ මාර්ගඵල ක්ෂණයන්හි අවබොධ කරන ලද්දාවූ චතුස්සත්‍ය ධර්මයන් මෙනෙහි කිරීමෙහිවූ ප්‍රඥාව පච්ච වෙක්ඛණ නමි.

ආධ්‍යාත්මිකවූ චක්ඛායතනාදිය පිරිසිඳ දැනීමෙහිවූ ප්‍රඥාව වත්ථුනානත්තඤාණ නමි. පිටත්හිවූ රූපායතනාදිය පිරිසිඳ දැනීමෙහිවූ ප්‍රඥාව ගොචරනානත්තඤාණ නමි.

ත්‍රිවිධචර්යා අටවැදෑරුම් චර්යාවන්ගේ විශෙෂ දැනගන්නාවූ සතර ධර්මයන් පිරිසිඳ දැන ගැනීමෙහි ප්‍රඥාව භූමිනානත්තඤාණ නමි. නවවිධ ධර්මයන් පිරිසිඳ දැනීමෙහිවූ ප්‍රඥාව ධම්ම නානත්තඤාණ නමි.

විශෙෂ ඤාණයෙන් දැනගන්නාවූ ප්‍රඥාව ඤාතට්ඨ ඤාණ නමි.

පිරිසිඳ දැනගත්තාවූ ප්‍රඥාව තීරණට්ඨ ඤාණ නමි.

නිත්‍යසංඥා සුඛසංඥාදිය ප්‍රහාණය කිරීමෙහි ප්‍රඥාව පරිච්චාගට්ඨ ඤාණ නමි.

ඒ ඒ ආකාරයෙන් වැඩියයුතුවූ ප්‍රඥාව එකරසට්ඨ ඤාණ නමි.

පටිවෙධ පටිලාභ වශයෙන් ප්‍රත්‍යක්ෂ කරන්නාවූ ප්‍රඥාව ඵුසනට්ඨඤාණ නමි.

නොයෙක් අර්ථයන්හි හා නොයෙක් ඵලයන්හි පවත්නා ප්‍රඥාව අත්ථපටිසම්භිදාඤාණ නමි.

පෙළ ධර්මයෙහි නානත්වය හා නානා හෙතූන් දක්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදාඤාණ නමි. වචන වචනාර්ථයන්ගේ නානත්වය දක්නාවූ ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා ඤාණ නමි.

පටිභාන නානත්වය දන්නාවූ ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඤාණ නමි.

විදර්ශනා විහාරයන්ගේ නොයෙක් ස්වභාවයන් දන්නාවූ ප්‍රඥාව විහාරට්ඨඤාණ නමි.

නොයෙක් සමාපත්ති විශෙෂයන් දන්නාවූ ප්‍රඥාව සමාපත්තට්ටඤාණ නමි.

විපස්සනා විහාර නානත්වයන් හා සමාපත්තීන්ගේ විශෙෂ දන්නාවූ ප්‍රඥාව විහාර සමාපත්තට්ඨඤාණ නමි.

වික්ෂෙපයෙන් තොරවූ පිරිසිදු සමාධියට අනතුරුව ආශ්‍රව ධර්මයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරික සමාධි ඤාණ නමි.

විදර්ශනා ඥානය අධිපතිකොට ඇත්තාවූද ශාන්තවූ විදර්ශනා විහාරයට පැමිණියාවූද ප්‍රණීතයයි මෙනෙහි කිරීම ඇත්තාවූද ප්‍රඥාව අරණවිහාර ඤාණ නමි.

දෙවැදෑරුම්වූ සමථබල විපස්සනා බලයන්ගෙන් සම්පූර්ණවීම හෙතුකොට ගෙනද කායසංඛාර වචීසංඛාර චිත්ත සංඛාර යන ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීම හෙතුකොට ගෙනද සොළොස්වැදෑරුම් ඤාණයන්ගෙන් යුක්තවීම හෙතුකොට ගෙනද, නවවැදෑරුම් සමාධීන්ගෙන් යුක්තවීම හෙතුකොට ගෙනද වසී බවට පැමිණියහුගේ බවයයි කියනලද ප්‍රඥාව නිරොධ සමාපත්ති ඤාණ නමි.

මනාව ප්‍රකාරයෙන් දන්නහුගේ ක්ලේශයන්ගේද ස්කන්ධයන්ගේද පැවැත්ම අවසාන කිරීමෙහිවූ ප්‍රඥාව පරිනිබ්බාණ ඤාණ නමි.

සියලු ත්‍රෛභූමික ධර්මයන් මනාකොට සිඳීමෙහිද නිරුද්ධ කිරීමෙහිද නැවත නොඉපදීමෙහිද ප්‍රඥාව සමසීසට්ඨ ඤාණ නමි.

බොහෝවූද නොයෙක් ස්වභාව ඇත්තාවූද එක ස්වභාවය ඇත්තාවූද ගිනියයි කියනලද දුශ්ශීල්‍යාදීය කෙළවර කිරීමෙහිවූ ප්‍රඥාව සල්ලෙඛඤාණ නමි.

නොමැලි බව කාය ජීවිත නිරපෙක්ෂතාවය සම්ප්‍රයුක්ත ධර්මයන් එසවීම යන මෙහි පවත්නාවූ ප්‍රඥාව විරියාරම්භ ඤාණ නමි. නොයෙක් ධර්මයන් ප්‍රකාශ කරන්නාවූ ප්‍රඥාව අත්ථසන්දස්සන ඤාණ නමි.

සියලු ධර්මයන් එකත්වයෙන් ගෙන සංග්‍රහ කිරීම නානා ස්වභාව ඇති ධර්මයන් නානා ස්වභාවයෙන් දැනගැනීම පිළිබඳවූ ප්‍රඥාව දස්සන විසුද්ධි ඤාණ නමි.

රූපස්කන්ධාදීන්ගේ අනිත්‍යාදි ආකාරයෙන් වැටහීම නම්වූ ප්‍රඥාව ඛන්ති ඤාණ නමි.

රූපස්කන්ධාදීන්ගේ අනිත්‍යාදි ආකාරයෙන් ස්පර්ශවීම දැනගන්නාවූ ප්‍රඥාව පරියොගාහන ඤාණ නමි.

ස්කන්ධාදිය අතුරෙන් එක්තරා ධර්ම කොටසක පවත්නා ප්‍රඥාව පදෙසවිහාර ඤාණ නමි.

නෛෂ්ක්‍රම්‍යාදියට අධිපති භාවයෙන් පවත්නාවූ ප්‍රඥාව සඤ්ඤාවිවට්ට ඤාණ නමි. නොයෙක් ස්වභාවයන් පහ කිරීමෙහි ප්‍රඥාව චෙතොවිවට්ට ඤාණ නමි.

නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ වශයෙන් සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්තවිවට්ට ඤාණ නමි.

සූන්‍ය භාවයෙහි පැවති ප්‍රඥාව ඤාණවිවට්ට ඤාණ නමි.

දුරු කිරීමෙහි පවත්නා ප්‍රඥාව විමොක්ඛවිවට්ට ඤාණ නමි.

වෙනස් නොවන්නාවූ ස්වභාවයෙහි පවත්නා ප්‍රඥාව සච්චවිවට්ට ඤාණ නමි.

රූප කයද පාදක ධ්‍යාන සිතද එකක් වශයෙන් මෙනෙහි කිරීමෙන් සුඛ සංඥාවද ලහු සංඥාවද අධිෂ්ඨාන කිරීමෙන්

සම්පූර්ණ කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව ඉද්ධිවිධ ඥාණ නමි.

විතර්ක වෙගයෙන් නානා ස්වභාව සහ එක ස්වභාව ඇති ශබ්ද නිමිති දැනගැන්මෙහි ප්‍රඥාව සොතධාතු විසුද්ධි ඥාණ නමි.

සොමනස්ස දොමනස්ස උපෙක්ඛා සහගත ත්‍රිවිධ චිත්තයන්ගේ වෙගයෙන් චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ ප්‍රසාද වශයෙන් නානා ස්වභාව හා එක ස්වභාව ඇති චිත්තයන් දැනගැනීමෙහි ප්‍රඥාව චෙතොපරියාය ඥාණ නමි.

අවිද්‍යා ආදී ප්‍රත්‍යයන් හෙතුකොට ගෙන පවත්නාවූ සංස්කාරාදී ප්‍රත්‍යයන්ගෙන් උපදනා ධර්මයන් නොයෙක් ස්වභාව හා එක ස්වභාව ඇති කර්මවෙග වශයෙන් දැනගැන්මෙහි ප්‍රඥාව පුබ්බෙනිවාසානුස්සති ඥාණ නමි.

කසිණ ලොකයෙන් නොයෙක් ස්වභාව හා එක ස්වභාව ඇති රූප නිමිති දැක්මෙහි ප්‍රඥාව දිබ්බචක්ඛු ඥාණ නමි.

සුසැට ආකාරයකින් අනඤ්ඤාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ වසී බැව් ඇතියහුගේ ස්වභාවයවූ ප්‍රඥාව ආසවක්ඛයඥාණ නමි.

පිරිසිඳ දතයුතු ස්වභාවයෙහි පවත්නා ප්‍රඥාව දුක්ඛ ඥාණ නමි.

ප්‍රහාණය කටයුතු ස්වභාවයෙහිවූ ප්‍රඥාව සමුදය ඥාණ නමි.

ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයෙහි පවත්නා ප්‍රඥාව නිරොධ ඥාණ නමි.

වැඩියයුතු ස්වභාවයෙහි පවත්නා ප්‍රඥාව මග්ග ඥාණ නමි.

දුක්ඛ සත්‍යයෙහිවූ ඥාණය සමුදය සත්‍යයෙහිවූ ඥාණය නිරොධ සත්‍යයෙහිවූ ඥාණය දුක්ඛ නිරොධගාමිනි ප්‍රතිපදා සත්‍යයෙහිවූ ඥාණය අර්ථප්‍රභෙද දන්නා ඥාණය පාළියෙහි ප්‍රභෙද දන්නා ඥාණය වචන ප්‍රභෙද දන්නා ඥාණය ප්‍රඥා

ප්‍රභෙද දන්නා ඤාණය ඉන්ද්‍රියයන්ගේ මූකල නුමූකල බැව් දන්නා ඤාණය, සත්වයන්ගේ ආසය අනුසය දන්නා ඤාණය යමක පාටිහාරිය ඤාණය මහා කරුණා සමාපත්ති ඤාණය සබ්බඤ්ඤුත ඤාණය අනාවරණ ඤාණය යන මොහු සැත්තෑ තුනක් ඥානයෝ වෙති.

මේ තෙසැත්තෑ ඤාණයන් අතුරෙන් සත් සැටක් ඤාණයෝ ශ්‍රාවකයන්ට සාධාරණ වෙත්. ඤාණසයක් ශ්‍රාවකයන්ට සාධාරණ නොවෙත්.

**මාතෘකාව නිමි.**

2. කෙසේනම් සොතද්වාරානුසාරයෙන් දැනගන්නාලද ධර්ම සමූහයෙහිවූ ප්‍රඥාව සුතමය ඤාණය වන්නේද? මේ ධර්මයෝ විශෙෂයෙන් දතයුත්තාහයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ පහකළ යුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නමි. මේ මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැන ගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළ යුතුයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ පරිහානි පක්ෂයෙහි සිටියාහුයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නම් එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නමි. මේ ධර්මයෝ ස්ථිති පක්ෂයෙහි සිටියාහුයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ විශෙෂ පක්ෂයෙහි සිටියාහුයයි දෙසිත ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ ලොභස්කන්ධාදිය ප්‍රදාලනය කිරීම් (පැළීම) පක්ෂයෙහි සිටියාහුයයි දෙසිත ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි.

3. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඥාණ නම් සියලු සංස්කාර ධර්මයෝ දුක්යහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ධර්ම සමූහය සුතමය ඥාණ නම් වේ. සියලු සංස්කාර ධර්මයෝ අනාත්මය හයි දෙසිත ධර්මසමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම් වෙයි.

4. මේ දුඃක්ඛාර්ය සත්‍යයයි වදහළ ධර්ම සමූහය සොතාව ධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නමි. මේ දුඃඛ සමුදයාර්ය සත්‍යයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දන්නා ප්‍රඥාව සුතමය ඥාණ නමි. මේ දුඃඛ නිරොධාය සත්‍යයයි වදාළ ධර්ම සමූහය සොතාව ධාන නමි. එය දැනගත්තාවූ ප්‍රඥාව සුතමය ඥාණ නමි. මේ දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයයිවදාළ ධර්ම සමූහය සොතාවධාන නමි. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නමි.

**විස්සජ්ජන උද්දෙස වාරයයි.**

5. කෙසේ නම් මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් දත යුක්තාහුයයි වදාළ ධර්ම සමූහය සොතවධාන නම් වේද, එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම් වේද, එක් ධර්මයක් විශෙෂ ඥානයෙන් දතයුතුයි. කවරේද, සියලු සත්වයෝ ආහාරය ප්‍රත්‍යකොට පවත්නාහුය, යනුයි.

ධර්ම දෙකක් විශෙෂ ඥානයෙන් දතයුත්තාහුය. කවරහුද? දෙවදෑරුම් ධාතුහුය. ධර්ම තුනක් විශෙෂ ඥානයෙන් දතයුතුය, කවරහුද? තෙවදෑරුම් ධාතුහුය. ධර්ම සතරක් විශෙෂ ඥානයෙන් දතයුත්තාහ. කවරහුද? චතුස්සත්‍යයෝය. ධර්ම පසක් විශෙෂ ඥානයෙන් දතයුත්තාහුය. කවරහුද? පස්වැදෑරුම් විමුක්තායතනයෝය. ධර්ම සයක් විශෙෂ ඥානයෙන් දතයුත්තාහුය. කවරහුද සයානුත්තරිය ධර්මයෝයි. ධර්ම සතක් විශෙෂ ඥානයෙන් දත යුත්තාහුය. කවරහුද? සතක්වූ නිද්දස වස්තුහුය. ධර්ම අටක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? අට වැදෑරුම් අභිභායතනයෝයි ධර්ම නවයක් විශෙෂ

ඥානයෙන් දත යුත්තාහ. කවරහුද? නවානුපූර්ව විහාරයෝයි. ධර්ම දසයක් විශෙෂ ඥානයෙන් දතයුතුය. දස නිර්ජර වස්තූහුය.

**6.** මහණෙනි, සියල්ල විශෙෂඥානයෙන් දතයුතුය. මහණෙනි, කෙසේනම් සියල්ල විශෙෂඥානයෙන් දතයුත්තේ ද? මහණෙනි, චක්ෂුස (ඇස) දතයුතුය. රූපයෝ දතයුත්තාහුය චක්ඛුවිඤ්ඤාණය දතයුතුය. චක්ඛුසම්ඵස්සය දතයුතුය. චක්ඛු සම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද දත යුතුය. ශ්‍රොතය (කණ) දතයුතුය, ශබ්දයෝ දතයුත්තාහ. සොතවිඤ්ඤාණය දතයුතුය. සම්ඵස්සය දතයුතුය. සොතසම්ඵස්සය නිසා යම් සුඛවේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද දතයුතුය. නාසයද දතයුතුය. ගන්ධයෝද දතයුත්තාහ. ඝානවිඤ්ඤාණයද දත යුතුය. ඝානසම්ඵස්සයද දතයුතුය. ඝානසම්ඵස්සය නිසා යම් සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ වේදනාවක් උපදීද, එය දතයුතුය. ජිව්හාවද (දිව) දතයුතුය. රසයෝද දතයුත්තාහ. ජිව්හා විඤ්ඤාණයද දතයුතුය. ජිව්හා සම්ඵස්සයද දතයුතුය. ජිව්හාසම්ඵස්සය නිසා යම් සුඛවූ හෝ අදුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ වේදනාවක් උපදීද එයද දතයුතුය. කයද දත යුතුය. ප්‍රශ්ටව්‍යයෝද දතයුත්තාහ. කායවිඤ්ඤාණයද දතයුතුය. කාය සම්ඵස්සයද දතයුතුය. කායසම්ඵස්සය නිසා යම් සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ එයද දතයුතුය. සිතද දතයුතුය. ධර්මාරම්මණයෝද දතයුත්තාහ. මනොවිඤ්ඤාණයද දතයුතුය. මනොසම්ඵස්සයද දත යුතුය. මනොසම්ඵස්සය නිසා සුඛවූ හෝ දුක්වූ හෝ අදුක්ඛම සුඛවූ හෝ යම් වේදනාවක් උපදීද එයද දතයුතුය.

**7.** රූපස්කන්ධය දතයුතුය. වේදනාස්කන්ධය දත යුතුය. සංඥාස්කන්ධය දතයුතුය. සංස්කාරස්කන්ධය දත යුතුය. විඤ්ඤාණස්කන්ධය දතයුතුය.

**8.** චක්ෂුප්‍රසාදය දතයුතුය. ශ්‍රොත ප්‍රසාදය දතයුතුය. ඝ්‍රාන ප්‍රසාදය දතයුතුය ජිව්හා ප්‍රසාදය දතයුතුය. කාය ප්‍රසාදය දතයුතුය. සිතද දතයුතුය.

9. රූපයෝ දතයුත්තාහ. ශබ්දයෝ දතයුත්තාහ. ගන්ධයෝ දතයුත්තාහ. රසයෝ දතයුත්තාහ. ප්‍රශ්ටව්‍යයෝ දතයුත්තාහ. ධර්මාරම්මණයෝ දතයුත්තාහ.

10. චක්ඛු විඤ්ඤාණය දතයුතුය. සොත විඤ්ඤාණය දත යුතුය ඝානවිඤ්ඤාණය දතයුතුය. ජිව්හා විඤ්ඤාණය දත යුතුය. කාය විඤ්ඤාණය දතයුතුය. මනොවිඤ්ඤාණය දත යුතුය.

11. චක්ඛුසම්ඵස්සය දතයුතුය. සොතසම්ඵස්සය දත යුතුය. ඝානසම්ඵස්සය දතයුතුය. ජිව්හාසම්ඵස්සය දත යුතුය. කායසම්ඵස්සය දතයුතුය. මනොසම්ඵස්සය දත යුතුය.

12. චක්ඛුසම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය. සොතසම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය, ඝාණ සම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය. ජිව්හාසම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය. කාය සම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය. මනොසම්ඵස්සය නිසා උපදින වේදනාව දතයුතුය.

13. රූපසංඥාව දතයුතුය, ශබ්දසංඥාව දතයුතුය, ගන්ධ සංඥාව දතයුතුය. රස සංඥාව දතයුතුය, ප්‍රෂ්ටව්‍ය සංඥාව දතයුතුය, ධර්ම සංඥාව දතයුතුය. රූපසංචෙතනාව දතයුතුය. සද්දසංචෙතනාව දතයුතුය, ගන්ධසංචෙනාව දතයුතුය. රස සංචෙතනාව දතයුතුය. පොට්ඨබ්බසංචෙතනාව දත යුතුය. ධම්මසංචෙතනාව දතයුතුය.

රූප තණ්හාව දතයුතුය. සද්ද තණ්හාව දතයුතුය, ගන්ධ තණ්හාව දතයුතුය, රසතණ්හාව දතයුතුය, පොට්ඨබ්බ තණ්හාව දතයුතුය. ධම්මතණ්හාව දතයුතුය. රූපවිතර්කය දතයුතුය, ශබ්ද විතර්කය දතයුතුය. ගන්ධ විතර්කය දතයුතුය, රසවිතර්කය දතයුතුය, ප්‍රෂ්ටව්‍ය විතර්කය දතයුතුය, ධර්ම විතර්කය දතයුතුය. රූප විචාරය දතයුතුය, ශබ්ද විචාරය දතයුතුය. ගන්ධවිචාරය දතයුතුය, රසවිචාරය දතයුතුය, පොට්ඨබ්බවිචාරය දතයුතුය. ධර්මවිචාරය දතයුතුය.

**14.** පඨවි ධාතුව දතයුතුය. ආපොධාතුව දතයුතුය. තෙජො ධාතුව දතයුතුය. වායො ධාතුව දතයුතුය, ආකාස ධාතුව දතයුතුය, විඤ්ඤාණ ධාතුව දතයුතුය, පඨවි කසිණය දතයුතුය, ආපොකසිණය දතයුතුය, තෙජො කසිණය දත යුතුය. වායොකසිණය දතයුතුය, නීලකසිණය දත යුතුය පීත කසිණය දත යුතුය, ලොහිත කසිණය දතයුතුය, ඔදාත කසිණය දත යුතුය, ආකාස කසිණය දත යුතුය. විඤ්ඤාණ කසිණය දත යුතුය.

**15.** කෙසයෝ දතයුත්තාහ. රෝමයෝ දතයුත්තාහ. නිය දතයුත්තාහ. දත් දතයුත්තාහ. සම දතයුතුය මස් දතයුතුය. නහර දතයුතුය. ඇට දතයුතුය. ඇටමිදුලු දතයුතුය. වකුගඩුව දතයුතුය. හෘදය මාංශය දතයුතුය. අක්මාව දතයුතුය. දළබුසිව්ය දතයුතුය. බඩදිව දතයුතුය. පපුමස දතයුතුය. අතුනු දතයුතුය අතුනුබහන් දතයුතුය. නොපැසුණු ආහාර දතයුතුය. පැසුණු ආහාර දතයුතුය. පිත දතයුතුය. සෙම දතයුතුය. සැරව දතයුතුය. ලෙය දතයුතුය ඩහදිය දතයුතුය. මෙදතෙල් දතයුතුය. කඳුලු දතයුතුය. වුරුණුතෙල් දතයුතුය. කෙළ දතයුතුය, සොටු දතයුතුය සඳමිදුලු දතයුතුය. මුත්‍ර දතයුතුය හිස්මොල දතයුතුය.

**16.** "චක්ඛායතනය දතයුතුය. රූපායතනය දතයුතුය. සොතායතනය දතයුතුය. සද්ධායතනය දතයුතුය. ඝානායතනය දතයුතුය. ගන්ධායතනය දතයුතුය. ජිව්හායතනය දතයුතුය. රසායතනය දතයුතුය. නාසායතනය දතයුතුය. පොට්ඨබ්බායතනය දතයුතුය. මනායතනය දතයුතුය. ධම්මායතනය දතයුතුය.

**17.** "චක්ඛුධාතුව දතයුතුය. රූප ධාතුව දතයුතුය, චක්ඛු විඤ්ඤාණ ධාතුව දතයුතුය, සොත ධාතුව දතයුතුය. සද්ද ධාතුව දතයුතුය. සොතවිඤ්ඤාණ ධාතුව දතයුතුය. ඝාන ධාතුව දතයුතුය. ගන්ධ ධාතුව දතයුතුය. ඝාන විඤ්ඤාණ ධාතුව දතයුතුය. ජිව්හා ධාතුව දතයුතුය රස ධාතුව දතයුතුය. ජිව්හා විඤ්ඤාණ ධාතුව දතයුතුය. කාය ධාතුව දතයුතුය. පොට්ඨබ්බ ධාතුව දතයුතුය. කායවිඤ්ඤාණ ධාතුව දතයුතුය. මනො ධාතුව

දතයුතුය. ධම්ම ධාතුව දතයුතුය. මනොවිඤ්ඤාණ ධාතුව දතයුතුය.

18. "චක්ඛුන්ද්‍රිය දතයුතුය. සොතින්ද්‍රිය දතයුතුය. ඝානින්ද්‍රිය දතයුතුය. ජිව්හාන්ද්‍රිය දතයුතුය. කායින්ද්‍රිය දතයුතුය. මනින්ද්‍රිය දතයුතුය. ජිව්හාන්ද්‍රිය දතයුතුය. ඉත්ථින්ද්‍රිය දතයුතුය. පුරිසින්ද්‍රිය දතයුතුය සුඛින්ද්‍රිය දතයුතුය දුක්ඛින්ද්‍රිය දතයුතුය. සොමනස්සින්ද්‍රිය දතයුතුය. දොමනස්සින්ද්‍රිය දතයුතුය. උපෙක්ඛින්ද්‍රිය දතයුතුය. සද්ධින්ද්‍රිය දතයුතුය. විරියින්ද්‍රිය දතයුතුය සතින්ද්‍රිය දතයුතුය. සමාධින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රිය දතයුතුය. අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය දතයුතුය. අඤ්ඤින්ද්‍රිය දතයුතුය. අඤ්ඤාතාවින්ද්‍රිය දතයුතුය.

19. කාම ධාතුව දතයුතුය. රූප ධාතුව දතයුතුය. අරූප ධාතුව දතයුතුය. කාම භවය දතයුතුය රූප භවය දතයුතුය. අරූප භවය දතයුතුය. සඤ්ඤා භවය දතයුතුය. අසඤ්ඤා භවය දතයුතුය. නෙවසඤ්ඤා නාසඤ්ඤා භවය දතයුතුය. එකවොකාරභවය දතයුතුය. චතුවොකාර භවය දතයුතුය. පඤ්චවොකාරභවය දතයුතුය.

20. පඨමජ්ක්ධානය දතයුතුය. දුතියජක්ධානය දතයුතුය. තතියජ්ක්ධානය දතයුතුය. චතුත්ථජ්ක්ධානය දතයුතුය.

21. මෙත්තා චෙතො විමුක්තිය දතයුත්තීය. කරුණා චෙතො විමුක්තිය දතයුත්තීය. මුදිතා චෙතො විමුක්තිය දතයුත්තීය. උපෙක්ඛා චෙතො විමුක්තිය දතයුත්තීය. ආකාසානඤ්චායතන සමාපත්තිය දතයුත්තීය. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය දතයුත්තීය. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දත යුත්තීය. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය දතයුත්තීය.

22. අවිද්‍යාව දතයුත්තීය. සංස්කාරයෝ දතයුත්තාහ. විඤ්ඤාණය දතයුතුය. නාමරූපය දතයුතුය. සළායතනය දතයුතුය. ඵස්සය දතයුතුය. වෙදනාව දතයුත්තීය. තණ්හාව දතයුත්තීය. උපාදානය දතයුතුය. භවය දතයුතුය. ජාතිය දතයුතුය. ජරා මරණය දතයුතුය.

23. දුක්ඛය දතයුතුය. දුක්ඛ හෙතුව දතයුතුය. දුක්ඛ නිරොධය දතයුතුය. දුක්ඛ නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය.

24. රූපය දතයුතුය. රූපයන්ගේ හෙතුව දතයුතුය. රූපයන්ගේ නිරොධය දතයුතුය. රූප නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය. වෙදනාව දතයුතුය. වෙදනාවගේ හෙතුව දතයුතුය. වෙදනා නිරොධය දතයුතුය. වෙදනා නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය. සඤ්ඤාව දතයුතුය. සඤ්ඤාවගේ හෙතුව දතයුතුය. සඤ්ඤා නිරොධය දතයුතුය. සඤ්ඤා නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය. සංඛාරයෝ දතයුත්තාහ. සංඛාරයන්ගේ හෙතුව දතයුතුය. සංඛාර නිරොධය දතයුතුය. සංඛාර නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය. විඤ්ඤාණය දතයුතුය. විඤ්ඤාණයාගේ හෙතුව දතයුතුය. විඤ්ඤාණ නිරොධය දතයුතුය. විඤ්ඤාණ නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය.

25. ඇස දතයුතුය. ඇසට (ii) හෙතුව දතයුතුය (iii) ඇසේ (iv) නිරොධය දතයුතුය. (v) ඇසේ (iv) නිරොධයට පැමිණෙන මාර්ගය දතයුතුය. (vii) සොතය දතයුතුය සොතයට ((ii) යෙදිය යුතුයි.) සොත ((iv) යෙදිය යුතුයි.) සොත (vi) යෙදිය යුතුයි.) නාසය දතයුතුයි. නාසයට ((ii) යෙදිය යුතුයි.) නාසයේ ((iv) යෙදිය යුතුයි.) නාසයේ (vi) යෙදිය යුතුයි.) දිව දතයුතුයි. දිවට ((ii) යෙදිය යුතුයි.) දිවෙහි (iv) යෙදිය යුතුයි.) දිවෙහි ((vi) යෙදිය යුතුයි.) කය දතයුතුයි කයට ((ii) යෙදිය යුතුයි.) කයෙහි ((iv) යෙදිය යුතුයි.) කයෙහි ((vi) යෙදිය යුතුයි.) සිත දත යුතුයි. සිතට ((ii) යෙදිය යුතුයි.) සිතෙහි (iv) යෙදිය යුතුයි.) සිතෙහි ((vi) යෙදිය යුතුයි.)

26. ජරා මරණය දතයුතුයි. ජරා මරණයන්ට හෙතුව දතයුතුය. ජරා මරණ නිරොධය දතයුතුය. ජරා මරණ නිරොධයට පැමිණීමේ මග දතයුතුය. දුක්ඛයාගේ පිරිසිඳ දතයුතු අර්ථය දතයුතුය. දුක්ඛසමුදය තෘෂ්ණාවගේ පහකළ යුතු අර්ථය දතයුතුය. දුක්ඛ නිරොධ නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂ කළයුතු

අර්ථය දතයුතුය. දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාවවූ මාර්ගයාගේ වැඩිය යුතු අර්ථය දතයුතුය.

27. රූපයාගේ (i) පිරිසිඳ දතයුතු අර්ථය දතයුතුය (ii) රූපයට (iii) හේතුවවූ තෘෂ්ණාවගේ පහකළ යුතුය අර්ථය දතයුතුය. (iv) රූපනිරොධයවූ (v) නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂ කළ යුතු අර්ථය දතයුතුය. (vi) රූප නිරොධයවූ (vii) නිර්වාණයට පැමිණෙන මාර්ගය වැඩිය යුතු අර්ථය දතයුතුය. (viii) වේදනාවගේ (i) යොදන්න) වේදනාවට (iii) යොදන්න.) වේදනා නිරොධයවූ (v) යොදන්න.) වේදනා නිරොධයවූ (vii) යොදන්න) සඤ්ඤාවගේ (i) යොදන්න) සඤ්ඤාවට (iii) යොදන්න) සඤ්ඤා නිරොධයවූ (v) යොදන්න) සඤ්ඤානිරොධවූ (vii) යොදන්න) සංඛාරයන්ගේ (i) යොදන්න) සංඛාරයට (iii) යොදන්න) සංඛාර නිරොධයවූ (v) යොදන්න) සංඛාර නිරොධයවූ (vii) යොදන්න) විඤ්ඤාණයාගේ (i) යොදන්න) විඤ්ඤාණයට (iii) යොදන්න) විඤ්ඤාණ නිරොධයවූ (v) යොදන්න) විඤ්ඤාණ නිරොධයවූ (vii) යොදන්න) ඇසේ (i) යොදන්න) ඇසට (iii) යොදන්න) ඇසේ නිරොධයවූ (v) යොදන්න) ඇස් නිරොධයවූ (vii) යොදන්න) කණේ (i) යොදන්න) කණට (iii) යොදන්න) කණ නිරොධයවූ (v) යොදන්න කණ නිරොධවූ (vii) යොදන්න) නාසයේ (i) යොදන්න නාසයට (iii) යොදන්න) නාසය නිරොධවූ (v) යොදන්න) නාසය නිරොධයවූ (vii) යොදන්න) දිවේ (i) යොදන්න දිවට (iii) යොදන්න) දිවේ නිරොධයවූ (v) යොදන්න) දිවේ නිරොධවූ (vii) යොදන්න) කයේ (i) යොදන්න කයට (ii) යොදන්න) කයේ නිරොධයවූ (v) යොදන්න) කයේ නිරොධයවූ (vii) යොදන්න.) සිතේ (i) යොදන්න) සිතට (iii) යොදන්න) සිතේ නිරොධයවූ (v) යොදන්න) සිතේ නිරොධයවූ (vii) ජරාමරණයාගේ (i) යොදන්න) ජරාමරණයට (iii) යොදන්න) ජරාමරණ නිරොධයට (v) යෙදිය යුතුයි) ජරාමරණ නිරොධගාමිනී පටිපදාවගේ වැඩිය යුතු අර්ථ යෙදිය යුතුය.

28. දුක්ඛයාගේ (i) පිරිසිඳ දැනීම් වශයෙන් ප්‍රතිවෙධකළ යුතු අර්ථය දතයුතුය. (ii) දුක්ඛසමුදයයාගේ (iii) පහකිරීම්

වශයෙන් ප්‍රතිවෙධ කළ යුතු අර්ථය දතයුතුය. (iv) දුක්ඛ නිරොධයාගේ (v) ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් ප්‍රතිවෙධ කළයුතු අර්ථය දත යුතුය. (vi) දුක්ඛ නිරොධ (vii) ගාමිනී ප්‍රතිපදාවගේ වැඩීම් වශයෙන් ප්‍රතිවෙධ කළයුතු අර්ථය දතයුතුය.

රූපයාගේ (ii) යොදන්න) රූප සමුදයයාගේ (iii) යොදන්න) රූප නිරොධයාගේ (v) යොදන්න) රූපනිරොධ (vii) යොදන්න) වේදනාවගේ (i) යොදන්න) වේදනා සමුදය යාගේ (iii) යොදන්න) වේදනා නිරොධයාගේ (v) යොදන්න) වේදනා නිරොධ (vii) යොදන්න) සඤ්ඤාවගේ (i) යොදන්න) සඤ්ඤා සමුදයයාගේ (iii) යොදන්න) නිරොධයාගේ (v) යොදන්න) සඤ්ඤා නිරොධ (vii) යොදන්න.)

සංඛාරයන්ගේ (i) යොදන්න) සංඛාරසමුදයාගේ (iii) යොදන්න) සංඛාර නිරොධයන්ගේ (v) යොදන්න) සංඛාර නිරොධ (vii) යොදන්න) විඤ්ඤාණයාගේ (i) යොදන්න) විඤ්ඤාණ සමුදයාගේ (iii) යොදන්න) විඤ්ඤාණ නිරොධයාගේ (v) යොදන්න) විඤ්ඤාණ නිරොධ (vii) යොදන්න) ඇසේ (i) යොදන්න) ඇස සමුදයාගේ (iii) යොදන්න) ඇසේ නිරොධයාගේ (v) යොදන්න) ඇසේ නිරොධය (vii) යොදන්න) කණේ (i) යොදන්න) කණේ සමුදයාගේ (iii) යොදන්න) කණේ නිරොධයාගේ (v) යොදන්න) කණේ නිරොධ (vii) යොදන්න) නාසයේ (i) යොදන්න) නාස සමුදයාගේ (iii) යොදන්න) නාසනිරොධයාගේ (v) යොදන්න) නාසනිරොධ (vii) යොදන්න) දිවේ (i) යොදන්න) දිවේ සමුදයාගේ (iii) යොදන්න දිවේ නිරොධයාගේ (v) යොදන්න) දිවේ නිරොධ (vii) යොදන්න)

කයේ (i) යොදන්න) කය සමුදයාගේ (iii) යොදන්න) කය නිරොධයාගේ (v) යොදන්න) කය නිරොධ (vii) යොදන්න) සිතේ (i) යොදන්න) සිත සමුදයාගේ (iii) යොදන්න) සිත නිරොධයාගේ (v) යොදන්න) සිත නිරොධ (vii) යොදන්න)

ජරාමරණයාගේ (i) යොදන්න) ජරාමරණ සමුදයාගේ (iii) යොදන්න) ජරාමරණ නිරොධයාගේ (v) යොදන්න) ජරා මරණ නිරොධ (vii) යොදන්න)

**29.** දුක්ඛය විශෙෂ ඥානයෙන් දත යුතුය. දුක්ඛසමුදය විශෙෂ ඥානයෙන් දතයුතුය. දුක්ඛ නිරොධය විශෙෂ ඥානයෙන් දතයුතුය. දුක්ඛසමුදය යන දෙදෙනාගේ නිරොධය විශෙෂ ප්‍රඥාවෙන් දතයුතුය. දුක්ඛයාගේ ඡන්දරාග නිරොධය විශෙෂ ඥානයෙන් දතයුතුය. දුක්ඛයාගේ ආස්වාදය විශෙෂයෙන් දතයුතුය දුක්ඛයාගේ ආදීනවය දතයුතුය. දුක්ඛයාගේ නිශ්ශරණය දතයුතුය. රූපය දතයුතුය. රූප (i) සමුදය දතයුතුය. (ii) රූප (iii) නිරොධය දතයුතුය. (iv) රූපය (v) සමුදය යන දෙදෙනාගේ නිරොධය දතයුතුය. (vi) රූපයාගේ (vii) ඡන්දරාග නිරොධය දතයුතුය. (viii) රූපයාගේ (ix) ආශ්වාදයද දතයුතුය. (x) රූපයාගේ (ix) ආදීනවය දතයුතුය. (xii) රූපයාගේ (xiii) නිස්සරණය දතයුතුය. වේදනාව දත යුතුය. වේදනා ((i) යොදන්න.) වේදනා ((iii) යොදන්න.) වේදනා ((v) යොදන්න.) වේදනාවගේ ((vii) යොදන්න.) වේදනාවගේ (ix) යොදන්න.) වේදනාවගේ (xi) යොදන්න.) වේදනාවගේ (xiii) යොදන්න) සඤ්ඤාව දතයුතුය. සඤ්ඤා ((i) යොදන්න.) සඤ්ඤා ((iii) යොදන්න.) සඤ්ඤා ((v) යොදන්න.) සඤ්ඤාවගේ ((vii) යොදන්න) සඤ්ඤාවගේ ((ix) යොදන්න.) සඤ්ඤාවගේ ((xi) යොදන්න.) සඤ්ඤාවගේ ((xiii) යොදන්න.) සංඛාරයෝ දතයුතුය. සංඛාර ((i) යොදන්න.) සංඛාර ((iii) යොදන්න.) සංඛාර ((v) යොදන්න.) සංඛාරයන්ගේ ((vii) යොදන්න.) සංඛාරයන්ගේ ((ix) යොදන්න.) සංඛාරයන්ගේ ((xi) යොදන්න.) සංඛාරයන්ගේ ((xiii) යොදන්න. විඤ්ඤාණය දතයුතුය. විඤ්ඤාණ ((i) යොදන්න.) විඤ්ඤාණ ((iii) යොදන්න.) විඤ්ඤාණ ((v) යොදන්න.) විඤ්ඤාණයාගේ ((vii) යොදන්න.) විඤ්ඤාණයාගේ ((ix) යොදන්න.) විඤ්ඤාණයාගේ (xi) යොදන්න.) විඤ්ඤාණයාගේ ((xiii) යොදන්න.) ඇස දත යුතුය. ඇස් ((i) යොදන්න.) ඇස් ((iii) යොදන්න.) ඇස් ((v) යොදන්න.) ඇසේ ((vii) යොදන්න.) ඇසේ ((ix) යොදන්න.) ඇසේ ((xi) යොදන්න.) ඇසේ ((xiii) යොදන්න. කණ දතයුතුය. කණේ ((i) යොදන්න) කණේ ((iii) යොදන්න) කණේ ((v) යොදන්න.) කණේ ((vii) යොදන්න.)

පටුන



කණේ ((ix) යොදන්න.) කණේ ((xi) යොදන්න.) කණේ ((xiii) යොදන්න.) නාසය දතයුතුයි. නාස් ((i) යොදන්න.) නාස් ((iii) යොදන්න.) නාස් ((v) යොදන්න.) නාසයේ ((vii) යොදන්න.) නාසයේ ((ix) යොදන්න.) නාසයේ ((xi) යොදන්න.) නාසයේ ((xi) යොදන්න.) නාසයේ (xiii) යොදන්න.) දිව දතයුතුයි. දිව් ((i) යොදන්න.) දිවේ ((iii) යොදන්න.) දිවේ ((v) යොදන්න.) දිවේ ((vii) යොදන්න.) දිවේ ((ix) යොදන්න.) දිවේ ((xi) යොදන්න.) දිවේ ((xiii) යොදන්න.) කය දතයුතුය. කය ((i) යොදන්න.) කය ((iii) යොදන්න.) කය ((v) යොදන්න) කයේ (vii) යොදන්න.) කයේ ((xi) යොදන්න.) කයේ ((xiii) යොදන්න.) සිත දතයුතුය. සිත් ((i) යොදන්න.) සිත් ((iii) යොදන්න.) සිත් ((v) යොදන්න.) සිතේ (vii) යොදන්න.) සිතේ ((ix) යොදන්න. සිතේ ((xi) යොදන්න.) සිතේ ((xiii) යොදන්න. ජරා මරණය දතයුතුය. ජරාමරණ ((i) යොදන්න.) ජරාමරණ ((iii) යොදන්න.) ජරාමරණ ((v) යොදන්න.) ජරාමරණයාගේ ((vii) යොදන්න.) ජරාමරණයාගේ ((ix) ජරාමරණයාගේ (xi) යොදන්න.) ජරාමරණයාගේ (xiii) යොදන්න.)

**30.** දුක්ඛය දතයුතුය. දුක්ඛ සමුදය දතයුතුය. දුක්ඛ නිරොධය දතයුතුය. දුක්ඛනිරොධ ගාමිනී පටිපදාව දත යුතුය. දුක්ඛයාගේ ආශ්වාදය දතයුතුය. දුක්ඛයාගේ ආදීනවය දතයුතුය. දුක්ඛයාගේ නිශ්ශරණය දතයුතුය. රූපය දතයුතුය. රූප ((i) සමුදය දතයුතුය. (ii) රූප (iii) නිරොධය දතයුතුය. (iv) රූප (v) නිරොධගාමිනී පටිපදාව දත යුතුය. (vi) රූපයාගේ (vii) ආශ්වාදය දතයුතුය. (viii) රූපයාගේ (ix) ආදීනවය දතයුතුය. (x) රූපයාගේ (xi) නිශ්ශරණය දතයුතුය. වේදනාව දතයුතුය. වේදනා (i) යොදන්න.) වේදනා (iii) යොදන්න.) වේදනා (v) යොදන්න.) වේදනාවේ (vii) යොදන්න.) වේදනාවේ (ix) යොදන්න.) වේදනාවේ (xi) යොදන්න.) සඤ්ඤාව දත යුතුය. සඤ්ඤා ((i) යොදන්න.) සඤ්ඤා (iii) යොදන්න.) සඤ්ඤා ((v) යොදන්න.) සඤ්ඤාවගේ ((vii) යොදන්න.) සඤ්ඤාවගේ ((ix) යොදන්න.) සඤ්ඤාවගේ ((xi) යොදන්න.) සංඛාරයෝ දතයුතුය. සංඛාර ((i) යොදන්න.) සංඛාර ((iii) යොදන්න.)

සංඛාර ((v) යොදන්න.) සංඛාරයන්ගේ ((vii) යොදන්න.) සංඛාරයන්ගේ ((ix) යොදන්න.) සංඛාරයන්ගේ ((xi) යොදන්න.) විඤ්ඤාණ දතයුතුය. විඤ්ඤාණ ((i) යොදන්න.) විඤ්ඤාණ ((iii) යොදන්න.) විඤ්ඤාණ ((v) යොදන්න.) විඤ්ඤාණයාගේ ((vii) යොදන්න.) විඤ්ඤාණයාගේ (ix) යොදන්න) විඤ්ඤාණයාගේ (xi) යොදන්න) ඇස දතයුතුය. ඇස් (i) යොදන්න) ඇස් (iii) යොදන්න ඇස් (v) යොදන්න) ඇසේ (vii) යොදන්න. ඇසේ (ix) යොදන්න) ඇසේ (xi) යොදන්න) කණ දත යුතුය. කණේ (i) යොදන්න) කණේ (iii) යොදන්න) කණේ (v) යොදන්න) කණේ (vii) යොදන්න) කණේ (ix) යොදන්න) කණේ (xi) යොදන්න) නාසය දතයුතුය. නාස් (i) යොදන්න) නාස් (iii) යොදන්න) නාස් (v) යොදන්න) නාසයේ (vii) යොදන්න) නාසයේ (ix) යොදන්න) නාසයේ (ix) යොදන්න) දිව දතයුතුය. දිවේ (i) යොදන්න) දිවේ (iii යොදන්න) දිව් (v යොදන්න) දිවේ (vii) යොදන්න) දිවේ (ix යොදන්න) දිවේ (xi) යොදන්න) කය දතයුතුය. කාය (i යොදන්න) කාය (iii) යොදන්න) කාය (v යොදන්න) කයේ (vii) යොදන්න) කයේ (ix යොදන්න) කයේ (xi යොදන්න) සිතදතයුතුය. සිත් (i යොදන්න) සිත් (iii) යොදන්න) සිත් (v යොදන්න) සිතේ (vii) යොදන්න) සිතේ (ix) යොදන්න) සිතේ (xi යොදන්න) ජරාමරණය දතයුතුය. ජරාමරණ (i යොදන්න) ජරාමරණ (iii යොදන්න) ජරාමරණ (v යොදන්න) ජරාමරණයාගේ (vii යොදන්න) ජරාමරණයාගේ (ix යොදන්න) ජරාමරණ (xi යොදන්න.)

31. අනිච්චානුපස්සනාව දතයුතුය. දුක්ඛානුපස්සනාව දතයුතුය. අනත්තානුපස්සනාව දතයුතුය. නිබ්බිදානුපස්සනාව දතයුතුය. විරාගානුපස්සනාව දතයුතුය. නිරොධානුපස්සනාව දතයුතුය. පටිනිස්සග්ගානුපස්සනාව දතයුතුය.

රූපයෙහි (i) අනිච්චානුපස්සනාව දතයුතුය (ii) රූපයෙහි (iii) දුක්ඛානුපස්සනාව දතයුතුය. (iv) රූපයෙහි (v) අනත්තානුපස්සනාව දතයුතුය (vi) රූපයෙහි (vii)

නිබ්බිදානුපස්සනාව දතයුතුය. (viii) රූපයෙහි (ix) විරාගානුපස්සනාව දතයුතුය. (x) රූපයෙහි (xi) නිරොධානුපස්සනාව දතයුතුය (xii) රූපයෙහි (xiii) පටිනිස්සග්ගානුපස්සනාව දතයුතුය.

වේදනාවෙහි (31 (i) යොදන්න) වේදනාවෙහි (31 (iii) වේදනාවෙහි (31 v) වේදනාවෙහි (31 vii) වේදනාවෙහි (31 ix) වේදනාවෙහි (31 (xi) වේදනාවෙහි (31 (xiii) සඤ්ඤාවෙහි (31 i) යොදන්න) සඤ්ඤාවෙහි (31 iii) සඤ්ඤාවෙහි (31 v) සඤ්ඤාවෙහි (31 vii) සඤ්ඤාවෙහි (31 ix) සඤ්ඤාවෙහි (31 xi) සඤ්ඤාවෙහි (31 xiii) සංඛාරයන්හි (31 i) යොදන්න.) සංඛාරයන්හි (31 iii) සංස්කාරයන්හි (31 v) සංඛාරයන්හි (31 vii) සංඛාරයන්හි (31 ix) සංඛාරයන්හි (31 xi) සංස්කාරයන්හි (31 xiii) විඤ්ඤාණයෙහි (31 i) යොදන්න.) විඤ්ඤාණයෙහි (31 iii) විඤ්ඤාණයෙහි (31 v) විඤ්ඤාණයෙහි (31 vii) විඤ්ඤාණයෙහි (31 ix) විඤ්ඤාණයෙහි (31 xi) විඤ්ඤාණයෙහි (31 xiii) ඇසෙහි (31 i) යොදන්න.) ඇසෙහි 31 (iii) ඇසෙහි (31 v) ඇසෙහි (31 vii) ඇසෙහි (31 ix) ඇසෙහි (31 xi) ඇසෙහි (31 xiii) කණෙහි (31 i යොදන්න) කණෙහි (31 iii) කණෙහි (31 v) කණෙහි (31 vii) කණෙහි (31 ix) කණෙහි (31 xi) කණෙහි (31 xiii) නාසයෙහි (31 i) යොදන්න) නාසයෙහි (31 iii) නාසයෙහි (31 v) නාසයෙහි (31 vii) නාසයෙහි (31 ix) නාසයෙහි (31 xi) නාසයෙහි (31 xiii) දිවෙහි (31 i) යොදන්න) දිවෙහි (31 iii) දිවෙහි (31 v) දිවෙහි (31 vii) දිවෙහි (31 ix) දිවෙහි (31 xi) දිවෙහි (31 xiii) කයෙහි (31 i යොදන්න) කයෙහි (31 iii) කයෙහි (31 v) කයෙහි (31 vii) කයෙහි (31 ix) කයෙහි (31 xi) කයෙහි (31 xiii) සිතෙහි (31 i යොදන්න.) සිතෙහි (31 iii) සිතෙහි (31 v) සිතෙහි (31 vii) සිතෙහි (31 ix) සිතෙහි (31 xi) සිතෙහි (31 xiii) ජරා මරණයෙහි (31 (i) යොදන්න. ජරා මරණයෙහි 31 (iii) ජරාමරණයෙහි (31 (i) ජරා මරණයෙහි 31 (vii) ජරා මරණයෙහි 31 (ix) ජරාමරණයෙහි 31 (xi) ජරා මරණයෙහි 31 (xiii) (මේ ඡේදයෙහි ඒ ඒ වාක්‍ය අගට "දතයුතුය" යන්න යොදාගත යුතුයි.)

**32.** උත්පාදය දතයුතුය. ස්කන්ධයන්ගේ පැවැත්ම දතයුතුය. සංඛාර නිමිත්ත - කර්මය - ප්‍රතිසන්ධිය - ගතිය - ඉපදීම - විපාකයාගේ පැවැත්ම - ජාතිය - ජරාව - ව්‍යාධිය - මරණය - සොකය - හැඬීම - උපායාසය - අනුපාදය - ස්කන්ධයන්ගේ නොපැවැත්ම - නිමිත්තක් සටහනක් නැති බව - ප්‍රතිසන්ධි දෙන කර්මයක් නැති බව - ප්‍රතිසන්ධියක් නැති බව - ගතියක් නැති බව - ඉපදීමක් නැති බව - විපාකයන්ගේ පැවැත්මක් නැති බව - ජාතියක් නැති බව - ජරාවක් නැති බව - ව්‍යාධියක් නැති බව - මරණයක් නැති බව - සොක රහිත බව - ඇඬීමක් නැති බව - උපායාසයක් නැති බව දතයුතුය.

(33 ඡේදයේ සිට ඒ ඒ වාක්‍ය අගට 'දතයුතුය' යන්න යෙදිය යුතුයි.)

**35.** ඉපදීම දතයුතුය. නොඉපදීම - ස්කන්ධයන්ගේ පැවැත්ම - නොපැවැත්ම - සංඛාර නිමිත්ත - සංස්කාර නිමිති රහිත බව - මතු ප්‍රතිසන්ධි දෙන කර්මය - කර්මයක් නැති බව - ප්‍රතිසන්ධිය - ප්‍රතිසන්ධි රහිත බව - ගතිය - ගති රහිත බව - ඉපදීම - නොඉපදීම විපාකයන්ගේ පැවැත්ම - විපාකයන්ගේ නොපැවැත්ම - ජාතිය - අජාතිය - දිරීම - නොදිරීම - ව්‍යාධිය - ව්‍යාධි රහිත බව - මරණය - මරණයක් නැති බව - සොකය - සොක රහිත බව - හැඬීම - හැඬීම් රහිත බව - උපායාසය - උපායාස රහිතබව දතයුතුය.

**34.** ඉපදීම දුකයයි දතයුතුය. පැවැත්ම නිමිත්ත දුකයයි - ප්‍රතිසන්ධිය දුකයයි - ගතිය දුකයයි - ස්කන්ධයන්ගේ පහළවීම් දුකයයි - විපාකයන්ගේ පැවැත්ම දුකයයි - ජාතිය දුකයයි, - ජරාව දුකයයි, - ව්‍යාධිය දුකයයි, - මරණය දුකයයි, - සොකය දුකයයි - හැඬීම දුකයයි, - උපායාසය දුකයයි දතයුතුය

**35.** නොඉපදීම සැපයයි දතයුතුය. නොපැවැත්ම සැපයයි දතයුතුය අනිමිත්ත සැපයයි, - කර්මයක් නැති බව සැපයයි - ප්‍රතිසන්ධි නොගැන්ම සැපයයි, - ගති රහිත බව සැපයයි, -

ස්කන්ධයන්ගේ පහළ නොවීම සැපයයි, - විපාකයන්ගේ නොපැවැත්ම සැපයයි, - ජාතියක් නැති බව සැපයයි, - ජරාවක් නැති බව සැපයයි - ව්‍යාධියක් නැති බව සැපයයි, - මරණයක් නැති බව සැපයයි - සොකයක් නැතිබව සැපයයි - හැඬීමක් නැතිබව සැපයයි - උපායාසයක් නැතිබව සැපයයි - දතයුතුය.

**36.** ඉපදීම දුකය, නොඉපදීම සැපයයි දතයුතුය. පැවැත්ම දුකයයි නොපැවැත්ම සැපයයි, - සංඛාර නිමිත්ත දුකයයි, සංඛාර නිමිති රහිත බව සැපයයි දතයුතුය. කර්ම රැස්කිරීම දුකයයි, දතයුතුය. කර්ම රැස්නොකිරීම සැපයයි දතයුතුය. ප්‍රතිසන්ධි ගැනීම දුකයයි ප්‍රතිසන්ධි නොගැනීම සැපයයි - ගතිය දුකය ගති රහිත බව සැපයයි දත යුතුය. ස්කන්ධයන්ගේ පහළවීම දුකය. ස්කන්ධයන්ගේ පහළ නොවීම සැපයයි - විපාකයන්ගේ පැවැත්ම දුකය විපාකයන්ගේ නොපැවැත්ම සැපයයි - ජාතිය දුකය ජාති රහිත බව සැපයයි - දිරීම දුකය, නොදිරීම සැපයයි - ව්‍යාධිය දුකය ව්‍යාධි රහිත බව සැපයයි - මරණය දුකය මරණයක් නැති බව සැපයයි සොකය දුකය සොක රහිත බව සැපයයි - හැඬීම දුකය හැඬීම් රහිත බව සැපයයි - උපායාසය දුකය උපායාස රහිත බව සැපයයි - දතයුතුය.

**37.** ඉපදීම භයයි දතයුතුය. පැවැත්ම භයයයි - නිමිත්ත භයයයි, - කර්ම රැස්කිරීම භයයයි, - ගතිය භයයයි, - ස්කන්ධයන්ගේ පහළවීම් භයයි - විපාකයන්ගේ පැවැත්ම දුකයයි - ජාතිය දුකයයි, - ජරාව දුකයයි, - ව්‍යාධිය දුකයයි, - මරණය දුකයයි, - හැඬීම දුකයයි, - උපායාසය දුකයයි - දතයුතුය.

**38.** නොඉපදීම අභයයයි දතයුතුය. නොපැවැත්ම අභයයයි - සංඛාර නිමිතිරහිත බව අභයයයි - කර්ම රැස්නොකිරීම අභයයයි - ප්‍රතිසන්ධි නොගැනීම අභයයයි - ගති රහිත බව අභයයයි - ස්කන්ධයන්ගේ නොපහළවීම අභයයයි - විපාකයන්ගේ නොපැවැත්ම අභයයයි අජාතිය අභයයයයි - නොදිරීම අභයයයි - ව්‍යාධි රහිත බව අභයයයි - මරණයක් නැතිබව අභයයයි - සොක රහිත බව අභයයි - හැඬීම රහිත බව අභයයයි - නො හැඬීම අභයයයි දතයුතුය.

**39.** ඉපදීම භයය, නොඉපදීම අභයයයි - දතයුතුය. පැවැත්ම භයය නොපැවැත්ම අභයයි - සංඛාර නිමිත්ත භයය අනිමිත්ත අභයයයි - කර්ම රැස්කිරීම භයය කර්ම රැස්නොකිරීම අභයයයි - ප්‍රතිසන්ධිගැනීම භයය ප්‍රතිසන්ධි නොගැනීම අභයයයි, - ගතිය භයය ගතිරහිත බව අභයයයි - ස්කන්ධයන්ගේ පහළවීම භයය ස්කන්ධයන්ගේ නොපහළවීම අභයයයි, - විපාකයන්ගේ පැවැත්ම භයය විපාකයන්ගේ නොපහළවීම අභයයයි, - ජාතිය භයය ජාති රහිත බව අභයයයි - ජරාව භයය ජරා රහිත බව අභයයයි - ව්‍යාධි භයයය ව්‍යාධි රහිත බව අභයයයි - දතයුතුය, - මරණය භයය මරණයක් නැතිබව අභයයයි - දතයුතුය. සොකය භයය සොකයක් නැතිබව අභයයයි දතයුතුය. හැඬීම භයය හැඬීම් රහිත බව අභයයයි දතයුතුය. උපයාසය භයය උපායාස රහිත බව අභයයයි දතයුතුය.

**40.** ඉපදීම සාමිස ක්ලේශයන්ගෙන් ආමර්ශනය කිරීම් සහිතයි. පැවැත්ම සාමිසයයි නිමිත්ත සාමිසයයි කර්ම රැස්කිරීම සාමිසයයි. ප්‍රතිසන්ධි ගැනීම සාමිසයයි. ගතිය සාමිසයයි ස්කන්ධයන්ගේ පහළවීම සාමිසයයි. විපාකයන්ගේ පහළවීම සාමිසයයි, ජාතිය සාමිසයයි ජරාව සාමිසයයි ව්‍යාධිය සාමිසයයි මරණය සාමිසයයි. සොකය සාමිසයයි ඇඬීම සාමිසයයි උපායාසය සාමිසයයි දතයුතුය.

**41.** නොඉපදීම නිරාමිසයයි දතයුතුයි. නොපැවැත්ම නිරාමිසයයි - නිමිති රහිතබව නිරාමිසයයි - කර්මරැස් නොකිරීම නිරාමිසයයි - ප්‍රතිසන්ධි නොගැනීම නිරාමිසයයි - ගති රහිත බව නිරාමිසයයි - ස්කන්ධයන්ගේ නොපහළවීම නිරාමිසයයි - විපාකයන්ගේ නොපහළවීම නිරාමිසයයි - ජාතියක් නැතිබව නිරාමිසයයි - ජරාවක් නැති බව නිරාමිසයයි - ව්‍යාධියක් නැතිබව නිරාමිසයයි - මරණයක් නැතිබව නිරාමිසයයි - ශොක නැතිබව නිරාමිසයයි - හැඬීම නිරාමිසයයි උපායාස රහිත බව නිරාමිසයයි දතයුතුයි.

**42.** ඉපදීම සාමිසය නොඉපදීම නිරාමිසයයි - පැවැත්ම සාමිසය නොපැවැත්ම නිරාමිසයයි - සංඛාර නිමිත්ත සාමිසය

සංඛාර නිමිති රහිත බව නිරාමිසයයි - කර්ම රැස්කිරීම සාමිසය කර්ම රැස් නොකිරීම නිරාමිසයයි - ප්‍රතිසන්ධි ගැනීම සාමිසය ප්‍රතිසන්ධි නොගැනීම නිරාමිසයයි - ගතිය සාමිසය ගති රහිත බව නිරාමිසයයි - ස්කන්ධයන්ගේ පහළවීම සාමිසය ස්කන්ධයන්ගේ නොපහළවීම නිරාමිසයයි - විපාකයන්ගේ පහළවීම සාමිසය විපාකයන්ගේ නොපහළවීම නිරාමිසයයි - ජාතිය සාමිසය ජාති රහිත බව නිරාමිස යයි - ජරාව සාමිසය ජරා රහිත බව නිරාමිසයයි - ව්‍යාධිය සාමිසය ව්‍යාධි රහිත බව නිරාමිසයයි - මරණය සාමිසය මරණ රහිත බව නිරාමිසයයි - ශොකය සාමිසය ශොක රහිත බව නිරාමිසයයි - හැඬීම සාමිසය හැඬීම් රහිත බව නිරාමිසයයි - උපායාසය සාමිසය උපායාස රහිත බව නිරාමිසයයි දතයුතුයි.

43. ඉපදීම සංඛාරයයි දතයුතුය. පැවැත්ම, සංඛාරයයි - නිමිත්ත සංඛාරයයි - කර්ම රැස්කිරීම සංඛාරයයි - ප්‍රතිසන්ධි ගැනීම සංඛාරයයි - ගතිය සංඛාරයයි - ස්කන්ධයන්ගේ පහළවීම සංඛාරයයි - විපාකයන්ගේ පැවැත්ම සංඛාරයයි - ජාතිය සංඛාරයයි - ජරාව සංඛාරයයි - ව්‍යාධිය සංඛාරයයි - මරණය සංඛාරයයි - ශොකය සංඛාරයයි - හැඬීම සංඛාරයයි - උපායාසය සංඛාරයයි දතයුතුය.

44. නොඉපදීම නිවනයයි දතයුතුය. නොපැවැත්ම නිවනයයි - අනිමිත්ත නිවනයයි - කර්ම නැති බව නිවනයයි - ප්‍රතිසන්ධි නොගැන්ම නිවනයයි - ගති රහිත බව නිවනයයි - ස්කන්ධයන්ගේ පහළ නොවීම නිවනයයි - විපාකයන්ගේ පහළ නොවීම නිවනයයි - ජාතියක් නැති බව නිවනයයි - ජරාවක් නැති බව නිවනයයි - ව්‍යාධියක් නැති බව නිවන යයි - මරණයක් නැතිබව නිවනයයි - සොත රහිත බව නිවනයයි - හැඬීම් රහිත බව නිවනයයි - උපායාස රහිත බව නිවනයයි දතයුතුයි.

45. ඉපදීම සංඛාරය නොඉපදී නිවනයයි දතයුතුය පැවැත්ම සංඛාරය නොපැවැත්ම නිවනයයි. නිමිත්ත සංඛාරය අනිමිත්ත නිවනයයි - කර්ම රැස්කිරීම සංඛාරය කර්ම රැස් නොකිරීම

නිවනයයි - ප්‍රතිසන්ධි ගැනීම සංඛාරය ප්‍රතිසන්ධි නොගැන්ම නිවනයයි - ගතිය සංඛාරය ගති රහිත බව නිවනයයි - ස්කන්ධයන්ගේ පහළවීම සංඛාරය ස්කන්ධයන්ගේ නොපහළවීම නිවනයයි - විපාකයන්ගේ පහළවීම සංඛාරය විපාකයන්ගේ නොපහළවීම නිවනයයි - ඉපදීම සංඛාරය ඉපදීමක් නැතිබව නිවනයයි - දිරීම සංඛාරය දිරීමක් නැති බව නිවනයයි - ව්‍යාධිය සංඛාරය ව්‍යාධි රහිත බව නිවනයයි - මරණය සංඛාරය මරණයක් නැතිබව නිවනයයි - ශොකය සංඛාරය ශොක රහිත බව නිවනයයි - හැඬීම සංඛාරය හැඬීමක් නැතිබව නිවනයයි - උපායාසය සංඛාරය උපායාස රහිත බව නිවනයයි දතයුතුයි.

**පළමුවැනි බණ වර නිමි.**

---

## දෙවෙනි බණ වර

(1-16 ඡේදවල ඒ ඒ වාක්‍ය අගට "අර්ථය දත යුතුයි" යනු එකතුකළ යුතුයි)

1. හාත්පසින් අල්වා ගතයුතු අර්ථය විශෙෂඥානයෙන් දතයුතුයි. පිරිවරා ගැනීම් - සම්පූර්ණ කිරීම් - එකග වීම් නොවිසිරයාම් - එසවීම් - නොකැළඹීම් - නොසෙල්වීම් - එක් අරමුණෙක පිහිටීම් වශයෙන් චිත්තයාගේ සිටීම් - අරමුණු කිරීම් - ගොචරය යන - පහකිරීම් - දුරුකිරීම් - නැගීම් - වෙන්වීම් - සන්සිඳීම් - ප්‍රණීත, මිදීම් - ආශ්‍රව රහිත බව - යන එතරවීම යන - නිමිති රහිත බව යන - පැතීම් රහිත බව යන - සූන්‍යය යන - එකම ස්වභාවයක් ඇත්තේය යන - සමථ විදර්ශනා ඔවුනොවුන් නොඉක්මවීම් - සමථ විදර්ශනා එකිනෙක සම්බන්ධව පැවතීම් - මාර්ගයාගේ සංස්කාරයන් කෙරෙන් එතෙර කිරීම් - නිවනට පමුණුවන හෙතුව යන - දැකීම් - අධිපති - සමථයාගේ වික්ෂෙප නොවීම් - විදර්ශනාවගේ නැවත නැවත අනිත්‍යාදි වශයෙන් බැලීම් - සමථ විදර්ශනා දෙදෙනාගේ එකම කෘත්‍යයක් ඇති - එක්ව පවත්නා සමථ

විදර්ශනා ඔවුනොවුන් නොඉක්මවීම් - ශික්ෂාව දැඩිව ගැනීම් - ආරම්මණයාගේ භාවනාව පිහිටි තැන යන - හැකුළුණු චිත්තයාගේ එසවීම් අර්ථය දතයුතුය.

2. විසිර යන චිත්තයාගේ සන්හිඳුවීම් - හැකිළීම් විසිරයාම් දෙකින් පිරිසිදුවූ චිත්තයන්ගේ මැදහත්ව බැලීම්, - භාවනා විශෙෂයකට පැමිණීම්, - මාර්ගයට පැමිණීම් වශයෙන් අධිකව ප්‍රතිවෙධ කිරීම්, - චතුස්සත්‍යයාගේ අවබොධ කිරීම්, - ඵල සමාපත්ති වශයෙන් නාමරූප නිරොධයෙහි පිහිටුවීම්, - සද්ධින්ද්‍රියයාගේ ස්ථිරත්වයට පැමිණීම්, - විරියින්ද්‍රයයාගේ සිත ඔසවා සිටීම්, - සතින්ද්‍රියයාගේ අරමුණට එළඹපිහිටීම් - සමාධින්ද්‍රයයාගේ නොවිසිරයාම්, - පඤ්ඤින්ද්‍රියයාගේ දැකීම්, - සද්ධා බලයාගේ අශ්‍රධාවෙන් කම්පා නොකළහැකි, - විරිය බලයාගේ කුසීතකමින් නොසෙල්විය හැකි, - සතිබලයාගේ ප්‍රමාදයෙන් නොසෙල් වියහැකි, - සමාධිබලයාගේ වික්ෂෙප භාවයෙන් නොසෙල්විය හැකි, - ප්‍රඥා බලයාගේ අවිද්‍යාවෙන් නොසෙල්විය හැකි අර්ථය දතයුතුය.

3. සතිසම්බොධ්‍යංගයාගේ අරමුණට එළඹ සිටීම් අර්ථය දතයුතුය. ධම්මවිචය සම්බොධ්‍යංගයාගේ විමසීම්, - විරිය සම්බොධ්‍යංගයාගේ සිත එසවීම්, - පීතිසම්බොධ්‍යංගයාගේ පැතිරීම්, - පස්සද්ධිසම්බොධ්‍යංගයාගේ සංසිඳීම්, - සමාධි සම්බොධ්‍යාංගයාගේ වික්ෂෙප නොවීම්, දතයුතුය. උපෙක්ඛා සම්බොධ්‍යංගයාගේ සමව බැලීම් අර්ථය දතයුතුය.

4. සම්මාදිට්ඨියගේ දැකීම් අර්ථය දතයුතුය. සම්මාසංකප්පයාගේ සිත අරමුණට නැංවීම්, - සම්මාවාචාවගේ වාක්සංවරය වැළඳගැනීම් සම්මාකම්මන්තයාගේ කාය සංවරය පිහිටීම්, - සම්මා ආජීවයාගේ පිරිසිදුකිරීම්, - සම්මාවායාමයාගේ එසවීම්, - සම්මාසතියගේ එළඹසිටීම්, - සම්මාසමාධියගේ අවික්ෂෙපාර්ථය දතයුතුය.

5. ඉන්ද්‍රියයන්ගේ අධිපති අර්ථය දතයුතුය. බලයන්ගේ නොසැලීම්, - බොධ්‍යංගයන්ගේ පැමිණවීම්, - මාර්ගයාගේ හෙත්වර්ථය, - සතිපට්ඨානයන්ගේ එළඹ සිටීම්, -

සම්‍යක්ප්‍රධානයන්ගේ වීර්යකිරීම්, - ඍද්ධිපාදයන්ගේ සමෘද්ධ කිරීම්, - සත්‍යයන්ගේ වෙනස් නොවීම් - මාර්ගයන්ගේ සංසිඳීම හෙතුවීම් - ඵලයන්ගේ ප්‍රත්‍යකිරීම් අර්ථය දතයුතුය.

**6.** විතර්කයාගේ අරමුණට නැංවීම් අර්ථය දතයුතුය විචාරයාගේ පරීක්ෂාකිරීම්, - ප්‍රීතියගේ පැතිරීම්, - සුඛයාගේ තෙමීම්, - චිත්තයාගේ එකගවීම් ආවර්ජන, - දැනීම්, - ප්‍රකාරයෙන් දැනීම්, - හැඳිනීම්, - සමාන කෘත්‍යයක් ඇති විශෙෂඥානයෙන් දතයුතුය, පිරිසිඳ දන්නා ඥානයෙන් පිරිසිඳ දතයුතු පහකළ යුත්තගේ පහකිරීම්, - වැඩියයුතු ධර්මයාගේ සමානකෘත්‍ය ඇති - ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයාගේ ස්පර්ශකිරීම්, -

**7.** ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය දතයුතුය. ධාතුන්ගේ ධාත්වර්ථය, - ආයතනයන්ගේ ආයතන - සංඛත ධර්මයන්ගේ සංඛත - අසංඛත ධර්මයාගේ අසංඛතාර්ථය දතයුතුය.

**8.** අරමුණු දැනගැනීම් ස්වභාවය දැනගතයුතුය චිත්තයාගේ අතරක් නැති ස්වභාවය දතයුතුය. චිත්තයාගේ සංඛාර නිමිත්ත කෙරෙන් නැඟිටීම්, අර්ථය දතයුතුය. චිත්තයාගේ නිවනට පෙරළීම්, - චිත්තයාගේ හෙතු - චිත්තයාගේ ප්‍රත්‍ය, - චිත්තයාගේ වස්තු යන - චිත්තයාගේ භූමි - චිත්තයාගේ ආරම්මණ, - චිත්තයාගේ හැසිරෙන ස්ථානය යන, - චිත්තයාගේ හැසිරීම්, - චිත්තයාගේ එළඹීම්, - චිත්තයාගේ හැඟීම්, - චිත්තයාගේ පැමිණවීම්, - චිත්තයාගේ නිශ්ශරණාර්ථය දතයුතුය.

**9.** එක් අරමුණක් ආවර්ජනය කිරීම්, - එක් අරමුණක් දැනීම්, එක් අරමුණක් ප්‍රකාරයෙන් දැනීම්, - එක් අරමුණක් හැඳිනීම්, - එක් අරමුණක පිහිටීම්, - එක් අරමුණෙක බැඳීම්, - එක් අරමුණෙක බැසගැනීම් - එක් අරමුණෙක පැහැදීම්, - එක් අරමුණෙක්හි මනාව පිහිටිය යුතු තැන යන, - එක් අරමුණෙක්හි මිදීම යන - එක් අරමුණෙක් මෙය ශාන්තයයි දැකීම්, - එක් අරමුණෙක්හි යානාවක්මෙන් කරනලද බව යන, එක් අරමුණෙක්හි වස්තුවක් මෙන් කරන ලද බව යන, - එක් අරමුණෙක්හි එළඹ සිටිනලද බව යන - එක් අරමුණෙක්හි

හාත්පස පුරුදු කරනලද බව යන - එක් අරමුණෙක්හි මනාකොට වීර්ය වඩනලද බව යන, - එක් අරමුණෙක්හි වැළඳ ගැනීම්, - එක් අරමුණෙක්හි පිරිවරාගැනීම්, - එක් අරමුණෙක්හි සම්පූර්ණකිරීම් - එක් අරමුණෙක්හි රැස්වීම් - එක් අරමුණෙක්හි පිහිටීම් - එක් අරමුණෙක්හි සෙවනය කිරීම් - එක් අරමුණෙක්හි වැඩීම් - එක් අරමුණෙක්හි බහුලකිරීම් - එක් අරමුණෙක්හි මනාව පැන නැඟීම් - එක් අරමුණෙක්හි මිදීම් - එක් අරමුණෙක්හි අවබොධ කිරීම් - එක් අරමුණෙක්හි අනුබොධ කිරීම් - එක් අරමුණෙක්හි ප්‍රතිවෙධ කිරීම් - එක් අරමුණෙක්හි බොධන - එක් අරමුණෙක්හි අනුබොධන - එක් අරමුණෙක්හි පටිබොධන - එක් අරමුණෙක්හි සම්බොධනය - එක් අරමුණෙක්හි බොධිපක්ෂයෙහිවීම් - එක් අරමුණෙක්හි බොධියට අනුකූල පක්ෂයෙහිවීම් - එක් අරමුණෙක්හි ප්‍රතිබොධි පක්ෂයෙහිවීම් - එක් අරමුණෙක්හි සම්බොධි පක්ෂයෙහිවීම් - එක් අරමුණෙක්හි බැබලීම් - එක් අරමුණෙක්හි අනුකූලව බැබලීම් - එක් අරමුණෙක්හි අතිශයින් බැබලීම් - එක් අරමුණෙක්හි මනාව බැබලීම් අර්ථය දතයුතුය.

**10.** ප්‍රකාශ කිරීම් අර්ථය දතයුතුය. බැබලීම් - කෙලෙසුන්ගේ තැවීම් - කෙලෙස්මලයන්ගේ පිරිසිදුබැව් - සම්ප්‍රයුක්ත මල රහිතබැව් - අරමුණු කරන්නාවූ මලයන්ගෙන් තොරවීම් - කෙලෙස් සමනය කිරීම් - ප්‍රහාණවිවෙක - නොඇලීම් - නිරුද්ධ කිරීම් - දුක්ඛ නිරොධයෙහි හැසිරීම් දතයුතුය. අත්හැරීම අත්හැරීමෙහි හැසිරීම් - මිදීම් - මිදීමෙහි හැසිරීම් - ඡන්දයවූ - ඡන්දයාගේ මූල යන-ඡන්දයාගේ පාද - ඡන්දයාගේ අධිපති - ඡන්දයාගේ සමෘද්ධ වීම් - ඡන්දයාගේ බැසගැනීම් - ඡන්දයාගේ එසවීම් - ඡන්දයාගේ එළඹ සිටීම් - ඡන්දයාගේ නොවිසිරයාම් - ඡන්දයාගේ දැකීම් අර්ථය දතයුතුය.

**11.** වීර්ය යන අර්ථය දතයුතුය. වීර්යයාගේ මූල - වීර්යයාගේ පාද - වීර්යයාගේ ප්‍රහිණ - වීර්යයාගේ සමෘද්ධවීම් - වීර්යයාගේ බැසගැනීම් - වීර්යයාගේ එසවීම් - වීර්යයාගේ එළඹ සිටීම් - වීර්යයාගේ නොවිසිරයාම් - වීර්යයාගේ දැකීම් -

12. චිත්ත යන අර්ථය දතයුතුය. චිත්තයාගේ මූල චිත්තයාගේ පාද - චිත්තයාගේ අධිපති - චිත්තයාගේ සමෘද්ධවීම් - චිත්තයාගේ බැසගැනීම් - චිත්තයාගේ එසවීම් - චිත්තයාගේ එළඹ සිටීම් - චිත්තයාගේ නොවිසිරයාම් - චිත්තයාගේ දැකීම් අර්ථය දතයුතුය.

13. විමංසය යන විමංසයාගේ මූල, - විමංසයාගේ පාද, - විමංසයාගේ අධිපති, - විමංසයාගේ සමෘද්ධවීම්, - විමංසයාගේ බැසගැනීම්, - විමංසයාගේ එසවීම්, - විමංසයාගේ එළඹසිටීම්, - විමංසයාගේ විසිර නොයාම්, - විමංසයාගේ දැකීම් අර්ථය දතයුතුය.

14. දුක්ඛ යන අර්ථය දතයුතුය. දුක්ඛයාගේ පෙළීම්, - දුක්ඛයාගේ ප්‍රත්‍යයන් විසින් එක්ව කරනලද, - දුක්ඛයාගේ හාත්පස තැවීම්, - දුක්ඛයාගේ වෙනස්වීම්, - සමුදය යන, - සමුදයාගේ රැස්කිරීම්, - සමුදයාගේ නිදාන, - සමුදයාගේ බැඳීම්, - සමුදයාගේ පලිබොධාර්ථය දත යුතුය.

15. නිරොධය යන අර්ථය දතයුතුය. නිරොධයාගේ නිස්සරණ - නිරොධයාගේ විවේක - නිරොධයාගේ ප්‍රත්‍යයන් විසින් සකස් නොකිරීම්, - නිරොධයාගේ අමෘතාර්ථය දතයුතුය.

16. මාර්ගය යන අර්ථය දතයුතුය, මාර්ගයාගේ නෛර්යාන මාර්ගයාගේ හෙතු - මාර්ගයාගේ දර්ශන, - මාර්ගයාගේ අධිපති, - වෙනස් නොවීම්, - අනාත්මසත්‍ය, - ප්‍රතිවෙධ, - විශෙෂයෙන් දැනීම්, - හාත්පස දැනීම්, - ධර්මය යන, - ධාතු යන - දතයුතු - ප්‍රත්‍යක්ෂ කළයුතු, - ස්පර්ශ කල යුතු, - අවබොධ කළ යුතු අර්ථය දතයුතුය.

(17 ඡෙදයේ සිට ඒ ඒ වාක්‍ය අගට "දතයුතුය" යන්න එකතුකළ යුතුයි.)

17. ධ්‍යානය දතයුතුය. ව්‍යාපාද රහිතබව, - ආලෝක සංඥාව - අවික්ෂෙපය, ධර්මයන් පිරිහීම්, - ඤාණය, - සතුටුබව, - ප්‍රථමධ්‍යානය, - ද්විතීයධ්‍යානය, - තෘතියධ්‍යානය, - චතුර්ථධ්‍යානය - ආකාශානඤ්චායතන සමාපත්තිය, -

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය, - ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය, - නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය, - අනිච්චානුපස්සනාව දුක්ඛානු පස්සනාව, - අත්තනානුපස්සනාව - නිබ්බිදානුපස්සනාව විරාගානුපස්සනාව, - නිරොධානුපස්සනාව, - පටිනිස්සග්ගානුපස්සනාව, - ඛයානුපස්සනාව, - වයානුපස්සනාව, - විපරිණාමානුපස්සනාව, - අනිමිත්තානුපස්සනාව, අප්පණිහිතානුපස්සනාව, - සුඤ්ඤතානුපස්සනාව - අධිපඤ්ඤාධම්මවිපස්සනාව - යථාභූත ඤාණදස්සනය - ආදීනවානුපස්සනාව - පටිසංඛානු පස්සනා - විවට්ටානුපස්සනාව - සොතාපත්ති මාර්ගය - සොතාපත්තිඵල සමාපත්තිය - සකෘදාගාමී මාර්ගය - සකෘදාගාමිඵල සමාපත්තිය - අනාගාමි මාර්ගය - අනාගාමීඵල සමාපත්තිය - අර්හත්මාර්ගය දතයුතුය - අර්හත් ඵල සමාපත්තිය දතයුතුය.

18. බැසගැනීම් අර්ථයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. එසවීම් අර්ථයෙන් විරියින්ද්‍රිය එළඹ සිටීම් අර්ථයෙන් සතින්ද්‍රිය - නොවිසිරයාම් අර්ථයෙන් සමෘධින්ද්‍රිය - දැකීම් අර්ථයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය.

අශ්‍රද්ධාවෙන් කම්පා නොවන අර්ථයෙන් ශ්‍රද්ධාබලය - කුසීතකමින් කම්පානොවන අර්ථයෙන් වීර්ය බලය - ප්‍රමාදයෙන් කම්පානොවන අර්ථයෙන් සතිබලය - වික්ෂිප්තභාවයෙන් කම්පානොවන අර්ථයෙන් සමාධිබලය - අවිද්‍යාවෙන් කම්පා නොවන අර්ථයෙන් ප්‍රඥාබලය - එළඹ සිටීම් අර්ථයෙන් සතිසම්බොජ්ධංගය සෙවීම් අර්ථයෙන් ධම්මවිචය සම්බොජ්ක්ධංගය එසවීම් අර්ථයෙන් විරිය සම්බොජ්ක්ධංගය - පැතිරීම් අර්ථයෙන් පීතිසංබොජ්ධංගය - සංසිඳුවීම් අර්ථයෙන් පස්සද්ධිසම්බොජ්ධංගය - නොවිසිරයාම් අර්ථයෙන් සමාධිසම්බොජ්ධංගය - මැදහත්ව බැලීම් අර්ථයෙන් උපෙක්ඛා සම්බොජ්ධංගය දැකීම් අර්ථයෙන් සම්‍යක්දෘෂ්ටිය දතයුතුය. නැංවීම් අර්ථයෙන් සම්‍යක් සංකල්පය දතයුත්තේය. වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය - පිහිටුවීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය - පිරිසිදු කිරීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය - එසවීම්

අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය - එළඹසිටි අර්ථයෙන් සම්‍යක් ස්මෘතිය - නොවිසිරීම් අර්ථයෙන් සම්‍යක් සමාධිය දතයුත්තේය.

**19.** අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ. කම්පා නොවන අර්ථයෙන් බලයෝ, හික්මීම් අර්ථයෙන් බොජ්ඣංගයෝ - හේතු අර්ථයෙන් මාර්ගයෝ - එළඹ සිටීම් අර්ථයෙන් සතිපට්ඨානයෝ - උත්සාහකිරීම් අර්ථයෙන් සම්මප්පධානයෝ සිද්ධවීම අර්ථයෙන් ඍද්ධිපාදයෝ - වෙනස් නොවන අර්ථයෙන් සත්‍යයෝ නොවිසිරයාම් අර්ථයෙන් සමථය දතයුත්තේය. නැවත නැවත දැකීම් අර්ථයෙන් විදර්ශනාව දතයුත්තේය. සමාන කෘත්‍ය ඇති අර්ථයෙන් සමථ විදර්ශනා - ඔවුනොවුන් නොයික්මවන අර්ථයෙන් සුගන්ධය සංවර අර්ථයෙන් සීල විසුද්ධිය - නොවිසිරයාම් අර්ථයෙන් චිත්ත විසුද්ධිය - දැකීම් අර්ථයෙන් දෘෂ්ටි විශුද්ධිය - විදීම් අර්ථයෙන් විමොක්ෂය - ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව - අත්හැරීම් අර්ථයෙන් විමුක්තිය - සහමුලින් සිඳීම් අර්ථයෙන් ක්ෂයයෙහි ඥානය - සංසිඳීම් අර්ථයෙන් අනුප්පාදයෙහි විඥානය - ඡන්දය මූලාර්ථයෙන් දතයුතුය. මනසිකාරයෙන් හාත්පස නැඟිටුවීම් අර්ථය දතයුතුය. ඵස්සය එක්කිරීම් අර්ථයෙන් දතයුතුය. වේදනාව රැස්වීම් අර්ථයෙන් දතයුතුය. සමාධිය ප්‍රමුඛ අර්ථයෙන් - සතිය අධිපති අර්ථයෙන් - ප්‍රඥාව ඊට වැඩිවූවක් නැති අර්ථයෙන් - විමුක්තිය සාරාර්ථයෙන් - අවසානාර්ථයෙන් - අමෘතයට අයත් නිවන අවසානාර්ථයෙන් - යම් යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැනගන්නා ලද්දාහුද,

**20.** ඒ ඒ ධර්මයෝ දැනගන්නා ලද්දාහුවෙත්. ඒ දතයුතු ධර්මයන් දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් මේ ධර්මයෝ සෝතද්වාරානුසාරයෙන් දතයුතු ධර්මයෝ යයිද එය දැනගන්නා ප්‍රඥාව සුතමයෙඤාණයයිද කියනු ලැබේ.

(දෙවෙනි බණවර නිමි.)

## තුන්වෙනි බණවර

1. කෙසේ නම් මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහුයයි දෙශනා කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම සමූහය සොතාවධාන නම්වේද, එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම්වේද? එක් ධර්මයක් පිරිසිඳ දතයුතුය. එනම් උපාදානයන්ට අරමුණුවූ ආශ්‍රව සහිත ඵස්සයයි. ධර්ම දෙකක් පිරිසිඳ දතයුතුය. නාමයත් රූපයත්ය. ධර්ම තුනක් පිරිසිඳ දතයුතුය. ත්‍රිවිධ වෙදනාවෝයි. ධර්ම සතරක් පිරිසිඳ දතයුතුය. සතර ආහාරයෝයි. ධර්ම පසක් පිරිසිඳ දතයුතුය. උපාදානස්කන්ධ පසය. ධර්ම සයක් පිරිසිඳ දතයුත්තාහ. ආධ්‍යාත්මික ආයතන සයය. ධර්ම සතක් පිරිසිඳ දතයුත්තාහ. විඥාන ස්ථිතිසතය, ධර්ම අටක් පිරිසිඳ දතයුත්තාහ. අෂ්ටලොක ධර්මයෝය. ධර්ම නවයක් පිරිසිඳ දතයුත්තාහ. නව සත්වාවාසයෝය. ධර්ම දශයක් පිරිසිඳ දතයුත්තාහ. දස ආයතනයෝයි.

2. (මේ ඡෙදයේ ඒ ඒ වාක්‍ය අගට "පිරිසිඳ දතයුතුය" කියා එකතු කළයුතුයි.) මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතුය. මහණෙනි, කිනම් සියල්ලක් පිරිසිඳ දතයුත්තේද? මහණෙනි, චක්ෂුස (ඇස) පිරිසිඳ දතයුතුය. රූපයෝ පිරිසිඳ දතයුත්තාහ. චක්ඛුවිඤ්ඤාණය, - චක්ඛුසම්ඵස්සය, - චක්ඛු සම්ඵස්සය නිසා (i) යම් සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ යම් වෙදනාවක් උපදියිද, එයද පිරිසිඳ දතයුතුය (ii) සොතය (කණ) පිරිසිඳ දතයුතුය. ශබ්දයෝ - සොත විඤ්ඤාණය, - සොතසම්ඵස්සය, - සොතසම්ඵස්සය නිසා (මෙහි (i) යෙදියයුතුයි.) ඝානය (නාසය) පිරිසිඳ දතයුතුය. ගන්ධයෝ ඝානවිඤ්ඤාණය, - ඝානසම්ඵස්සය, - ඝානසම්ඵස්සය නිසා (මෙහි (i) යෙදිය යුතුයි.) ජිව්හාව (දිව) පිරිසිඳ දතයුතුය. රසයෝ ජිව්හාවිඤ්ඤාණය, - ජිව්හාසම්ඵස්සය, - ජිව්හාසම්ඵස්සය නිසා (මෙහි (i) යෙදිය යුතුයි.) කය පිරිසිඳ දතයුතුය. ස්පර්ශයෝ - කායවිඤ්ඤාණය, - කායසම්ඵස්සය, - කායසම්ඵස්සය නිසා (මෙහි (i) යෙදිය යුතුයි.) සිත පිරිසිඳ දතයුතුය. ධර්මාරම්මණයෝ - මනොවිඤ්ඤාණය, - මනොසම්ඵස්සය, - මනොසම්ඵස්සය නිසා (මෙහි (i) යෙදිය යුතුයි.) රූපය පිරිසිඳ දතයුතුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වෙදනාවෝ, - සංඥාවෝ - සංඛාරයෝ, - විඥ්ඥාණය - ඇස - කණ, - නාසය, - දිව, - කය, - සිත, - (මෙහි 1 වෙනි බණවරයෙහි 26 ඡෙදය යෙදිය යුතුයි.) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් පිරිසිඳ දතයුතුය.

3. යම් යම් ධර්ම කෙනෙකුන් ලැබීම පිණිස උත්සාහ කරන්නහු විසින් ඒ ඒ ධර්මයෝ ලබන ලද්දාහු වෙත්ද මෙසේ ඒ ධර්මයෝ පිරිසිඳ දැනගන්නා ලද්දාහුද තීරණය කරණ ලද්දාහුද වෙත්.

ධ්‍යානය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ධ්‍යානය ලබන ලද්දේවෙයිද (i) මෙසේ ඒ ධර්මය තෙම පිරිසිඳ දැනගන්නා ලද්දේද තීරණය කරන ලද්දේද වෙයි. (ii) අව්‍යාපාදය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් අව්‍යාපාදය ලබන ලද්දේ වෙයිද (මෙහි (i) යොදන්න) ආලොක සංඥාව ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ආලොක සංඥාව ලබන ලද්දී වෙයිද ( (i) යොදන්න.) සමාධිය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් සමාධිය ලබන ලද්දේද ( (i) යොදන්න.) ධර්මයන් බෙදා දැනගැනීම ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ධර්මයන් බෙදා දැනගැනීම ලබන ලද්දේවෙයිද ( (i) යොදන්න.) ඥාණය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ඥාණය ලබන ලද්දේද ( (i) යොදන්න) ප්‍රමොද්‍යය ලැබීම සඳහා වීර්ය කරන්නහු විසින් ප්‍රමොදය ලබන ලද්දේද ( (i) යොදන්න) ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ප්‍රථමධ්‍යානය ලබන ලද්දේ වෙයිද ((i) යොදන්න) ද්විතීයධ්‍යානය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ද්විතීයධ්‍යානය ලබනලද්දේ වෙයිද ( (i) යොදන්න) තෘතීයධ්‍යානය ලැබීම පිණිස වීර්ය කරන්නාහු විසින් තෘතීයධ්‍යානය ලබන ලද්දේ වෙයිද ( (i) යොදන්න) චතුර්ථධ්‍යානය ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් චතුර්ථධ්‍යානය ලබන ලද්දේද ( (i) යොදන්න) පිරිසිඳ දැනගන්නා ලද්දේද තීරණය කරන ලද්දේද වෙයි. ආකාසානඤ්චායතන සමාපත්තිය ලබන පිණිස වීර්ය කරන්නාහු විසින් ආකාසානඤ්චායතන සමාපත්තිය ලබන

(ලද්දීද (i) යොදන්න) විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබන ලද්දීද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබන ලද්දී වෙයිද ( (i) යොදන්න) නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබන ලද්දී වෙයිද ( (i) යොදන්න)

**4.** අනිත්‍යානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් අනිත්‍යානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) දුක්ඛානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් දුක්ඛානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) අනත්තානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් අනත්තානුපස්සනාව ලබන ලද්දි වෙයිද (3 (i) යොදන්න) නිබ්බිදානුපස්සනාව ලබනු පීනස වීර්ය කරන්නහු විසින් නිබ්බිදානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) විරාගානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් විරාගානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) නිරොධානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නාහු විසින් නිරොධානුපස්සනාව ලබන ලදී වෙයිද (3 (i) යොදන්න) පටිනිස්සග්ගානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් පටිනිස්සග්ගානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න)

**5.** ඛයානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් ඛයානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) වයානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් වයානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) විපරිණාමානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් විපරිණාමානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) අනිමිත්තානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් අනිමිත්තානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) අප්පහිතානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින්

අප්පණිහිතානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) සුඤ්ඤතානුපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් සුඤ්ඤතානුපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) අධිපඤ්ඤධම්ම විපස්සනාව ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් අධිපඤ්ඤාධම්මවිපස්සනාව ලබන ලද්දී වෙයිද (3 (i) යොදන්න) යථාභූතඥාන දර්ශනය ලබනු පිණිස වීර්ය කරන්නහු විසින් යථාභූතඥාන දර්ශනය ලබන ලද්දේ වෙයිද (3 (i) යොදන්න) ආදීනවානුපස්සනාව ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් ආදීනවානුපස්සනාව ලබනලද්දේ වෙයිද, (3 (i) යොදන්න) පටිසංඛානුපස්සනාව ලබනු පිණිස වීර්යකරන්නහු විසින් පටිසංඛානුපස්සනාව ලබනලද්දී වෙයිද (3 (i) යොදන්න) විවට්ටානුපස්සනාව ලැබීම පිණිස වීර්ය කරන්නහු විසින් විවට්ටානුපස්සනාව ලබනලද්දී වෙයිද (3 (i) යොදන්න)

7. සෝවාන් මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සෝවාන් මාර්ගය ලබනලද්දේ වෙයිද (3 (i) යොදන්න) සකෘදාගාමී මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සකෘදාගාමී මාර්ගය ලබනලද්දේ වෙයිද (3 (i) යොදන්න. අනාගාමී මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනාගාමී මාර්ගය ලබනලද්දේ වෙයිද (3 (i) යොදන්න) අර්හත් මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අර්හත් මාර්ගය ලබනලද්දේ වෙයිද (3 (i) යොදන්න) යම් යම් ධර්ම කෙනෙකුන් ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් යම් යම් ධර්ම කෙනෙක් ලබනලද්දාහු වෙද්ද එහෙයින් මේ ධර්මයන් පිරිසිඳ දතයුත්තාහයි වදාළ ධර්මය සොතාවධාන නම්. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නමැයි කියනු ලැබේ.

8. කෙසේ නම් මේ ධර්මයෝ පහකළ යුත්තාහයි වදාළ ධර්මය සොතාවධාන නම් වේද, එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වේද? එක් ධර්මයක් පහකළ යුතුය. එනම් අස්මිමානයයි. ධර්ම දෙකක් පහකළ යුතුය. අවිද්‍යාවත් භව තෘෂ්ණාවත්ය. ධර්ම තුනක් පහකළ යුතුය. ත්‍රිවිධ තණ්හාවෝය. ධර්ම සතරක් පහකළ යුත්තාහ. සතර ඕඝයෝය. ධර්ම පහක්

පහකළ යුත්තාහ. පඤ්චනීවරණයෝය. ධර්ම සයක් පහකළ යුත්තාහ. සවැදෑරුම් තෘෂ්ණාකායයෝය. ධර්ම සතක් පහකළ යුතුය. සත්තානුසයයෝය. ධර්ම අටක් පහකළ යුත්තාහ. මිච්ඡත්තධර්ම අටය ධර්ම නවයක් පහකල යුත්තාහ. නවයක් තෘෂ්ණා මූලකයෝය. ධර්ම දහයක් පහකළ යුත්තාහ. දසමිච්ඡත්ත ධර්මයෝය.

**9.** ප්‍රහාණ දෙකකි. තදංග ප්‍රහාණයත් පටිපස්සද්ධි ප්‍රහාණයත්ය. ආශ්‍රව ධර්මයන් ක්ෂයකරන්නාවූ ලොකොත්තර මාර්ගය වඩන්නහුට සමුච්ඡෙද ප්‍රහාණයද ඵල ක්ෂණයෙහි පටිපස්සද්ධි ප්‍රහාණයද වෙයි. ප්‍රහාණ තුනකි. යම් ඒ රූප ධ්‍යානයක් ඇද්ද, එය කාමයන් කෙරෙන් නික්මීමයි යම් ඒ අරූපධ්‍යානයක් ඇද්ද එය රූපයන් කෙරෙන් නික්මීමයි. හටගන්නාවූ ප්‍රත්‍යයන් විසින් සකස්කරන ලද්දාවූ ප්‍රත්‍යයන් නිසා උපන්නාවූ යමක් ඇත්තේද ඔහුගේ නිරොධය එයින් නික්මීමයි ධ්‍යාන ලැබුවහු විසින් කාමයෝ ප්‍රහීණ කරන ලද්දාහුද, දුරුකරන ලද්දාහුද වෙත්. අරූපධ්‍යාන ලැබුවහු විසින් රූපයෝ පහකරන ලද්දාහුද දුරුකරන ලද්දාහුදවෙත්. නිරොධය ලැබුවහු විසින් සංස්කාරයෝ පහකරනලද්දාහුද පුරුදුකරණ ලද්දාහුද වෙත්.

**10.** ප්‍රහාණ සතරකි. දුක්ඛ සත්‍යය පරිඥා ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරමින් පහකරයි. සමුදය සත්‍යය ප්‍රහාණ ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරමින් ප්‍රහාණය කරයි. නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරමින් පහකරයි. මාර්ග සත්‍යය භාවනා ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කරමින් පහකරයි.

**11.** ප්‍රහාණ පසකි. තදංග ප්‍රහාණයද සමුච්ඡේද ප්‍රහාණයද පටිපස්සද්ධි ප්‍රහාණයද නිස්සරණ ප්‍රහාණයද විෂ්කම්භන ප්‍රහාණයද වෙත්. ප්‍රථ ධ්‍යානය වඩන්නහුට නීවරණයන්ගේ විෂ්කම්භන ප්‍රහාණය වෙයි. කලකිරීම් පක්ෂයෙහිවූ සමෘධිය වඩන්නහුට මිථ්‍යාදෘෂ්ටීන්ගේ තදංග ප්‍රහාණය වෙයි. ආශ්‍රවයන් ක්ෂය කරන්නාවූ ලොකොත්තර මාර්ගය වඩන්නහුට සමුච්ඡේද ප්‍රහාණය වෙයි. ඵල ක්ෂණයෙහි පටිපස්සද්ධි ප්‍රහාණය වෙයි.

සංස්කාර ධර්මයන්ගේ නිරොධයවූ නිර්වාණය නිස්සරණ ප්‍රහාණය වෙයි.

12. මහණෙනි සියල්ල පහකළ යුතුය. මහණෙනි, කිනම් සියල්ල පහකළ යුත්තේද? මහණෙනි, චක්ෂුස පහ කළ යුතුය. රූපයෝ පහකළ යුත්තාහ. චක්ඛුවිඤ්ඤාණය පහකළ යුතුය. චක්ඛු සම්ඵස්සය පහකළ යුතුය චක්ඛු සම්ඵස්සය නිසා (i) යම් සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් විඳීමක් උපදීද එයද පහකළ යුතුය.

(ii) සොතය පහකළ යුතුය. ශබ්දයෝ පහකළ යුත්තාහ. සොත විඤ්ඤාණය පහකළ යුතුය. සොත සම්ඵස්සය පහකළ යුතුය. සොත සම්ඵස්සය නිසා (12 (i) යොදන්න.) ඝානය පහකළ යුතුය. ගන්ධයෝ පහකළ යුත්තාහ. ඝාන විඤ්ඤාණය පහකළ යුතුය. ඝාන සම්ඵස්සය පහකළ යුතුය. ඝාන සම්ඵස්සය නිසා (12 (i) යොදන්න.) ජිව්හාව පහකළ යුතුය. රසයෝ පහකළ යුත්තාහ. ජිව්හා විඤ්ඤාණය පහකළ යුතුය. ජිව්හා සම්ඵස්සය පහකළ යුතුය. ජිව්හා සම්ඵස්සය නිසා (12 (i) යොදන්න.) කය පහකළ යුතුය. ස්පර්ශයෝ පහකළ යුත්තාහ. කාය විඤ්ඤාණය පහකළ යුතුය. කාය සම්ඵස්සය පහකළ යුතුය. කාය සම්ඵස්සය නිසා (12 (i) යොදන්න.) සිත පහකළ යුතුය. ධර්මාරම්මණයෝ පහකළ යුත්තාහ. මනො විඤ්ඤාණය පහකළ යුතුය. මනො සම්ඵස්සය පහකළ යුතුය. මනො සම්ඵස්සය නිසා (12 (i) යොදන්න.)

13. රූපය දක්නේ පහකරයි. වේදනාව දක්නේ පහකරයි. සංඥාව දක්නේ පහකරයි. සංස්කාරයන් දක්නේ පහකරයි. චක්ෂුස (මෙහි පළමුවන බණවරෙහි 25, 26 ඡෙද "දතයුතුයි" යනු "දක්නේ පහකරයි" කියා යෙදිය යුතුයි.) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් දක්නේ පහ කරයි.

14. යම් යම් ධර්ම කෙනෙක් පහකරන ලද්දාහු වෙත්ද, ඒ ඒ ධර්මයෝ දුරු කරන ලද්දාහු වෙත්. එය දැනීම අර්ථයෙන් ඥාණ නම් වෙයි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්වෙයි. එහෙයින් මේ ධර්මයෝ පහකළ යුත්තාහයි දෙසූ ධර්මය

සොතාවධාන නම්ද එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඥාණ නමැයිද කියනු ලැබේ.

## සතරවෙනි බණවර

1. කෙසේනම් මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නම්වේද? එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාන නම්වේද? එක් ධර්මයක් වැඩිය යුතුයි. එනම්, සුඛ වේදනාව සමග යෙදුනාවූ කාය ගතා සති ධ්‍යානයයි. ධර්ම දෙකක් වැඩිය යුත්තාහ. සමථයත් විදර්ශනාවත්ය. ධර්ම තුනක් වැඩිය යුත්තාහ. ත්‍රිවිධ සමාධියයි. ධර්ම සතරක් වැඩිය යුත්තාහ. සතර සතිපට්ඨානයෝයි. ධර්ම පසක් වැඩිය යුත්තාහ. අංග පසක් ඇති සමාධියයි, ධර්ම සයක් වැඩිය යුත්තාහ, සය වැදෑරුම් අනුස්සතිට්ඨානයෝයි. ධර්ම සතක් වැඩිය යුත්තාහ. සප්තබොධ්‍යාංගයෝයි, ධර්ම අටක් වැඩිය යුත්තාහ. ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ධර්ම නවයක් වැඩිය යුත්තාහ. පිරිසිදු බවට ප්‍රධාන අංගවූ නව වැදෑරුම් පාරිශුද්ධියයි. ධර්ම දශයක් වැඩිය යුත්තාහ. දශ කසිනායතනයෝයි. භාවනා දෙකකි.

2. ලෞකික භාවනාවත් ලෝකොත්තර භාවනාවත්ය. භාවනා තුනකි. රූපාවචර කුශල ධර්මයන්ගේ වැඩීමද, අරූපාවචර කුශල ධර්මයන්ගේ වැඩීමද, ලෝකොත්තර කුශල ධර්මයන්ගේ වැඩීමද වෙයි. රූපාවචර කුශල ධර්මයන්ගේ වැඩීම හීනවූ වැඩීමක්ද ඇත. මධ්‍යමවූ වැඩීමක්ද ඇත. ප්‍රණීතවූ වැඩීමක් ද ඇත. අරූපාවචර කුශල ධර්මයන්ගේ වැඩීම හීනවූ වැඩීමක්ද ඇත. මධ්‍යමවූ වැඩීමක්ද ඇත. ප්‍රණීතවූ වැඩීමක්ද ඇත. ලෝකොත්තර කුශල ධර්මයන්ගේ වැඩීම ප්‍රණීතය.

3. භාවනා සතරකි. දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනීම් ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කරමින් වඩයි. සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම් ප්‍රතිවෙධයෙන් ප්‍රතිවේධ කරමින් වඩයි. නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම් ප්‍රතිවේධයෙන් ප්‍රතිවෙධ කරමින් වඩයි. මාර්ග සත්‍යය වැඩීම් (භාවනා) ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කරමින් වඩයි. මේ සතර භාවනාවෝයි. තවද භාවනා සතරකි. එසනා භාවනා,

පටිලාභ භාවනා, එකරස භාවනා, ආසෙවන භාවනා යන මොහුයි.

**4.** එසනා භාවනා නම් කවරීද? සමාධියට සමවදින්නාවූ සියල්ලන්ගේ ඒ සමාධියෙහි පහලවූ ධර්මයෝ සමාන කෘත්‍ය ඇත්තාහුය යන මෙය එසනා භාවනා නමි.

පටිලාභ භාවනා නම් කවරේද? සමාධියට සමවදින්නාවූ සියල්ලන්ගේ ඒ සමාධියෙහිවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත් යන මෙය පටිලාභ භාවනා නමි.

**5.** එකරස භාවනා නම් කවරීද? නිශ්චයට බැසීම් අර්ථයෙන් සද්ධින්ද්‍රිය වඩන්නහුට සද්ධින්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහුය. මෙසේ ඉන්ද්‍රියයන්ගේ එකරස වශයෙන් භාවනා නමි. එසවීම් අර්ථයෙන් විරියින්ද්‍රිය වඩන්නහුට විරියින්ද්‍රියයාගේ වශයෙන් සමාන කෘත්‍ය ඇත්තාහුය. මෙසේ ඉන්ද්‍රියයන්ගේ එක රස වශයෙන් භාවනාය එළඹ සිටීම් අර්ථයෙන් සතින්ද්‍රිය වඩන්නහුට සතින්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහුය. මෙසේ ඉන්ද්‍රියයන්ගේ එක රස වශයෙන් භාවනායි. නොවිසිර යෑම් අර්ථයෙන් සමාධින්ද්‍රිය වඩන්නහුට සමාධින්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහුය. මෙසේ ඉන්ද්‍රියයන්ගේ එක රස වශයෙන් භාවනායි. අසද්ධාව කරණකොට කම්පා නොකළ හැකි ස්වභාවයෙන් ශ්‍රද්ධා බලය වඩන්නහුට ශ්‍රද්ධා බලයාගේ වශයෙන් සතර බලයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බලයන්ගේ එක රස වශයෙන් භාවනායි.

**6.** කුසීත භාවය කරණකොට කම්පා නොකළ හැකි ස්වභාවයෙන් වීර්ය බලය වඩන්නහුට වීර්ය බලයාගේ වශයෙන් සතර බලයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බලයන්ගේ එකරස වශයෙන් භාවනායි ප්‍රමාදය කරණකොට කම්පා නොකළ හැකි ස්වභාවයෙන් සති බලය වඩන්නහුට සති බලයාගේ වශයෙන් සතර බලයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බලයන්ගේ එක රස වශයෙන් භාවනායි වික්ෂෙප

භාවය කරණකොට කම්පා නොකළ හැකි ස්වභාවයෙන් සමාධි බලය වඩන්නහුට සමාධි බලයාගේ වශයෙන් සතර බලයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත් මෙසේ බලයන්ගේ එක රස වශයෙන් භාවනායි.

**7.** අවිද්‍යාව කරණකොට කම්පා නොකළ හැකි ස්වභාවයෙන් ප්‍රඥා බලය වඩන්නහුට ප්‍රඥා බලයාගේ වශයෙන් සතර බලයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්, මෙසේ බලයන්ගේ එක රස වශයෙන් භාවනායි.

**8.** එළඹ සිටීම් අර්ථයෙන් සති සම්බොජ්ක්ධංග වඩන්නහුට සති සම්බොජ්ක්ධංගයාගේ වශයෙන් බොජ්ක්ධංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බොජ්ක්ධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. පරීක්ෂා කිරීම් අර්ථයෙන් ධම්ම විචය සම්බොජ්ක්ධංගය වඩන්නහුට ධම්ම විචය සම්බොජ්ක්ධංගයාගේ වශයෙන් බොජ්ක්ධංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බොජ්ක්ධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. එසවීම අර්ථයෙන් විරිය සම්බොජ්ක්ධංගය වඩන්නහුට විරිය සම්බොජ්ක්ධංගයාගේ වශයෙන් බොජ්ක්ධංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත් මෙසේ බොජ්ක්ධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. පැතිරීම් අර්ථයෙන් පීති සම්බොජ්ක්ධංගය වඩන්නහුට පීති සම්බොජ්ක්ධංගයාගේ වශයෙන් බොජ්ක්ධංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බොජ්කධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. සංසිඳීම් අර්ථයෙන් පස්සද්ධි සම්බොජ්ක්ධංගය වඩන්නහුට පස්සද්ධි සම්බොජ්කධංගයාගේ වශයෙන් බොජ්කධංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්.

**9.** මෙසේ බොජ්කධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. නොවිසිර යාම අර්ථයෙන් සමාධි සම්බොජ්කධංගය වඩන්නහුට සමාධි සම්බොජ්කධංගයාගේ වශයෙන් බොජ්කධංග සය සමාන කෘත්‍යය ඇත්තාහු වෙත්. මෙසේ බොජ්කධංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. මැදහත්ව බැලීම අර්ථයෙන් උපෙක්ඛා සම්බොජ්කධංගය වඩන්නහුට

උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වශයෙන් බොජ්ඣංග සය සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ බොජ්ඣංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි.

10. දැකීම අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය වඩන්නහුට සම්‍යක් දෘෂ්ටියගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. අරමුණට නැගවීම් අර්ථයෙන් සම්‍යක් සංකල්පය වඩන්නහුට සම්‍යක් සංකල්පයාගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්.

11. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනාවෙයි. වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය වඩන්නහුට සම්‍යක් වචනයාගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි.

12. මනාව පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය වඩන්නහුට සම්‍යක් කර්මාන්තයාගේ වශයෙන් මාර්ගාංග හත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනාවෙයි. පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය වඩන්නහුට සම්‍යක් ආජීවයාගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘතය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනාවෙයි.

13. එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය වඩන්නහුට සම්‍යක් ව්‍යායාමයාගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. එළඹ සිටීම් අර්ථයෙන් සම්මා සතිය වඩන්නහුට සම්මා සතියගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගාංගයන්ගේ එක රස වශයෙන් භාවනා වෙයි. නොවිසිර යාම් අර්ථයෙන් සම්මා සමාධිය වඩන්නහුට සම්මා සමාධියගේ වශයෙන් මාර්ගාංග සත සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. මෙසේ මාර්ගයන්ගේ එකරස වශයෙන් භාවනා වෙයි. මේ වනාහි එකරස භාවනායි.

14. ආසෙවන භාවනා නම් කවරීද? මේ ශාසනයෙහි මහණතෙම පෙරවරු කාලයෙහි (සමාධිය) දැඩිකොට සෙවනය කරයි. දවල් කාලයෙහිද දැඩිව සේවනය කරයි. (මේ ඡේදයේ ඒ ඒ වචන අගට "දැඩිව සේවන කරයි" යොදාගත යුතුයි) (iii) සවස් කාලයෙහිද - පෙරබත් කාලයෙහිද - පසුබත් කාලයෙහිද - පෙරයමෙහිද - මැදුම් යමෙහිද, - පැසුළු යමෙහිද - රාත්‍රියෙහිද - දවල් කාලයෙහිද, - රෑ දවල් දෙක්හිද - අවපසෙහිද, - පෙර පසෙහිද, - වස්සාන ඍතුවෙහිද, - හේමන්ත ඍතුවෙහිද, - ගිම්හාන ඍතුවෙහිද, - ප්‍රථම වයසෙහිද, - මධ්‍යම වයසෙහිද, - පශ්චිම වයසෙහිද - දැඩිව සේවනය කරයි. මේ වනාහි ආසේවන භාවනාවයි. මේ සතර භාවනාවෝයි.

15. තවද භාවනා සතරකි. ඒ භාවනාවෙහි උපන් ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍ය ඇති අර්ථයෙන් භාවනා ඒ සමාන කෘත්‍ය ඇතිබවට පැමිණීමේ හේතුවවූ වීර්ය දැරීම් අර්ථයෙන් භාවනා දැඩිව සේවනය කිරීම් අර්ථයෙන් භාවනා යන මොහුය. කෙසේ නම් භාවනාවෙහි උපන් ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා වෙයිද? කාමච්ඡන්දය පහ කරන්නහුට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්. මෙසේ භාවනාවෙහි උපන් ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා වෙයි. ව්‍යාපාදය පහ කරන්නහුට අව්‍යාපාදයාගේ වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්. මෙසේ ඒ භාවනා වෙයි උපන් ධර්මයන් ඔවුනොවුන් නො ඉක්මවීම් වශයෙන් භාවනා නම් වෙයි.

---

## පස්වෙනි බණවර

1. ථීනමිද්ධය දුරුකරන්නාහට ආලෝක සංඥාවගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත් මෙසේ (i) ඒ ධ්‍යානයෙහි උපන් ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා නම්වෙයි. (ii) උද්ධච්චය දුරුකරන්න හට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අවික්ෂෙප වශයෙන් හටගත් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. (මෙහි (i) යෙදිය යුතුයි) අවිද්‍යාව දුරුකරන්නහුට ඤාණයාගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) (iii) නොඇල්ම දුරුකරන්නහුට ප්‍රමොද්‍යයාගේ වශයෙන් හටගත් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.) නීවරණ දුරුකරන්නාහට ප්‍රථම ධ්‍යානයාගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.)

විතර්ක විචාරයන් දුරුකරන්නාහට දුතියජ්කධාන වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.) ප්‍රීතිය දුරුකරන්නාහට තතියජ්කධාන වශයෙන් පහළ වූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ((i) යොදන්න.) සුඛ දුක්ඛ වේදනාවන් දුරුකරන්නහුට චතුත්ථජ්ක්ධාන වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.) රූප සඤ්ඤාවද සටිඝසඤ්ඤාවද නානත්ත සඤ්ඤාවද දුරුකරන්නාහට ආකාසානඤ්චායතන සමාපත්ති වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.) ආකාසානඤ්චායතන සඤ්ඤාව දුරුකරන්නහුට විඤ්ඤානඤ්චායතන සමාපත්තියගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.) විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාව දුරුකරන්නහුට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න.) ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව දුරුකරන්නහුට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියගේ වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න.)

2. නිත්‍ය සංඥාව දුරුකරන්නහුට අනිත්‍යානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි (i) එහි උපන් ධර්මයන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා නම් වෙයි. (ii) සුඛ සංඥාව දුරුකරන්නහුට දුක්ඛානු පස්සනා

වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. (මේ ඡේදයේ (i) යොදන්න) ආත්ම සංඥාව දුරුකරන්නහුට අනාත්මානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) ඇලීම දුරුකරන්නහුට නිබ්බිදානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) රාගය දුරුකරන්නහුට විරාගානුපස්සනා වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න සමුදය දුරුකරන්නහුට නිරොධානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) දැඩිව අල්වා ගැනීම දුරුකරන්නහුට පටිනිස්සග්ගානු පස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) ඝනසඤ්ඤාව දුරුකරනහුට ඛයානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) කර්ම රැස්කිරීම් දුරුකරන්නාහට වයානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) ස්ථිරය යන සංඥාව දුරුකරන්නහුට විපරිණාමානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) නිත්‍ය නිමිත්ත දුරුකරන්නහුට අනිමිත්තානුපස්සනා වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) තෘෂ්ණා ප්‍රාර්ථනය දුරුකරන්නහුට අප්පනිතානුපස්සනා වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) ආත්මයක් ඇතැයි ගැන්ම දුරුකරන්නහුට සුඤ්ඤතානු පස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) නිත්‍යසාරයක් ඇතැයි ගැන්ම දුරුකරන්නහුට අධිපඤ්ඤා ධම්මවිපස්සනා වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) සම්මොහ වශයෙන් ගැන්ම දුරුකරන්නහුට යථාභූතඥාන දර්ශන වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) ඇලියයුතුයයි ගැන්ම දුරු කරන්නාහට ආදිනවානුපස්සනා වශයෙන් පහළවූ

ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) අනුපාය ගැන්ම දුරුකරන්නහුට පටිසංඛානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) කාමයොගයන්ගේ පැවැත්ම විවට්ටනානුපස්සනා වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) මිථ්‍යාදෘෂ්ටිය හා එක්වූ ක්ලේශයන් දුරු කරන්නහුට සොතාපත්තිමග්ග වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) ඖදාරික ක්ලේශයන් දුරුකරන්නහුට සකදාගාමිමග්ග වශයෙන් පහළවූ ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි. ( (i) යොදන්න) තුනීවූ ක්ලේශයන් දුරුකරන්නහුට අනාගාමි මාර්ග වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) සියලු ක්ලේශයන් දුරුකරන්නහුට අර්හත්මාර්ග වශයෙන් උපන් ධර්මයෝ ඔවුනොවුන් නොඉක්මවත්නුයි ( (i) යොදන්න) මෙසේ එහි උපන් ධර්මයන් ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා නම් වේ.

3. කෙසේ නම් ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍ය ඇති අර්ථයෙන් භාවනා නම් වේද? කාමච්ඡන්දය දුරුකරන්නහුට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්නුයි. (i) ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍යාර්ථයෙන් භාවනා නම වෙයි. (ii) ව්‍යාපාදය දුරුකරන්නහුට අව්‍යාපාදයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්නුයි. (මේ ඡෙදයේ (i) යොදන්න) (මෙහි 1 ඡෙදයේ (iii) දක්වා යෙදිය යුතුයි.) සියලු ක්ලේශයන් දුරු කරන්නාහුවත් අර්හත් මාර්ගයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්නුයි. ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍යර්ථයෙන් භාවනානම් වෙයි. මෙසේ ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍යාර්ථයෙන් භාවනා නම්වේ.

4. කෙසේ නම් ඊට අනුකූලවූ වීර්ය දැරීම් අර්ථයෙන් භාවනා නම් වේද? කාමච්ඡන්දය දුරුකරන්නහුට නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් වීර්ය දරානුයි (i) ඊට අනුකූලවූ

වීර්ය දැරීම් අර්ථයෙන් භාවනා නම් වෙයි. (ii) ව්‍යාපාදය දුරු කරන්නහුට අව්‍යාපාදයාගේ වශයෙන් වීර්ය දරානුයි. (මේ ඡේදයේ (i) යොදන්න) (මෙහි 1 ඡේදයේ (iii) දක්වා යෙදිය යුතුයි) සියලු කෙලෙසුන් දුරුකරන්නහුට අර්හත් මාර්ගයාගේ වශයෙන් වීර්ය දරානුයි ඊට අනුකූලවූ වීර්ය දැරීම් අර්ථයෙන් භාවනා නම් වේ.

**5.** කෙසේ නම් දැඩිව සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නම් වේද? කාමච්ඡන්දය දුරුකරන්නේ නෛෂ්ක්‍රම්‍යය දැඩිව සෙවනය කෙරේනුයි (i) දැඩිව සෙවනය කිරීම් අර්ථයෙන් භාවනානම් වෙයි. (ii) ව්‍යාපාදය දුරුකරන්නේ අව්‍යාපාදයා දැඩිව සේවනය කෙරේනුයි (මේ ඡේදයේ (i) යොදන්න) සියලු කෙලෙසුන් දුරුකරන්නේ අර්හත් මාර්ගය දැඩිව සෙවනය කෙරේනුයි. දැඩිව සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නම් වෙයි. මෙසේ දැඩිව සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නම් වෙයි.

**6.** මේ සතර වැදෑරුම් භාවනාවන් රූපය දැකියයුතු ආකාරයෙන් දකිමින් වඩයි. වේදනාව දැකිය යුතු ආකාරයෙන් වඩයි. සංඥාව දැකිය යුතු ආකාරයෙන් දකිමින් වඩයි. සංස්කාරයන් දැකියයුතු ආකාරයෙන් දකිමින් වඩයි. විඤ්ඤාණය දැකියයුතු ආකාරයෙන් දකිමින් වඩයි. චක්ෂුස (මෙහි පළමුවන බණවරෙහි 25-26 ඡේද 'දතයුතුය' යනු 'දැකිය යුතු' ආකාරයෙන් දකිමින් වඩයි කියා වෙනස්කොට යොදාගත යුතුයි) ජරාමරණය අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් දකිමින් වඩයි.

**7.** යම් යම් ධර්ම කෙනෙක් වඩන ලද්දාහු වෙත්ද, ඒ ඒ ධර්මයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත් එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි වදාළ ධර්ම සොතාවධාන නමැයිද එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නමැයිද කියනු ලැබේ.

---

## හයවෙනි බණවර

1. කෙසේ නම් මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහයි වදාළ ධර්මය සොතාවධාන නම්වේද? එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඤාණ නම්වේද? එක් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. එනම් නොපිරිහෙන චෙතොවිමුක්තියයි කියනලද අර්හත් ඵලයයි. ධර්ම දෙකක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. විද්‍යාවත් විමුක්තියත්ය. ධර්මතුනක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ත්‍රිවිද්‍යාවෝයි. ධර්ම සතරක් ප්‍රත්‍යක්ෂ කළයුතුය. ඵල සතරය. ධර්මපසක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ස්කන්ධ පසය. ධර්ම සයක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. අභිඥාසයය ධර්ම සතක් ප්‍රත්‍යක්ෂ කළයුතුය. ක්ෂීණාශ්‍රවයන්ගේ බලසතය. ධර්ම අටක් ප්‍රත්‍යක්ෂ කළයුතුය. විමොක්ෂ අටය ධර්ම නවයක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. පිළිවෙළින් නිරුද්ධ කළ යුතුය ධර්ම නවයය. ධර්ම දශයක් ප්‍රත්‍යක්ෂ කළයුතුය. අශෛක්ෂ ධර්ම දසයවෙත්. මහණෙනි, සියල්ල ප්‍රත්‍යක්ෂ කළ යුතුය.

2. මහණෙනි, කිනම් සියල්ලක් ප්‍රත්‍යක්ෂ කළ යුත්තේද? මහණෙනි චක්ෂුස ප්‍රත්‍යක්ෂ කළ යුතුය. රූපයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. චක්ඛුවිඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. චක්ඛු සම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. චක්ඛු සම්ඵස්සය නිසා (i) සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ යම් වෙදනාවක් උපදීද එයද ප්‍රත්‍යක්ෂ කළ යුතුය. (ii) සොතය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ශබ්දයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. සොතවිඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. සොතසම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. සොතසම්ඵස්සය නිසා (මේ ඡේදයේ (i) යෙදිය යුතුයි.) ඝානය ප්‍රත්‍යක්ෂ කළයුතුය. ගන්ධයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. ඝාන විඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ඝානසම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ඝාන සම්ඵස්සය නිසා ( (i) යොදන්න) දිව ප්‍රත්‍යක්ෂ කළ යුතුය. රසයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. ජිව්හාවිඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ජිව්හාසම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ජිව්හා සම්ඵස්සය නිසා ( (i) යොදන්න.) කය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ස්පර්ශයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. කායවිඤ්ඤාණය

ප්‍රත්‍යක්ෂ කළ යුතුය. කායසම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. කායසම්ඵස්සය නිසා ( (i) යොදන්න) සිත ප්‍රත්‍යක්ෂ කළ යුතුය. ධර්මා රම්මණයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ. මනොවිඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. මනොසම්ඵස්සය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. මනොසම්ඵස්සය නිසා සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ යම් වෙදනාවක් උපදීද එයද ප්‍රත්‍යක්ෂ කළ යුතුය.

3. රූපය දතයුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂකරයි. වෙදනාව දතයුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි. සංඥාව දතයුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි. සංස්කාරයන් දතයුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි. විඤ්ඤාණය දතයුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි. චක්ෂුස (මෙහි පළමුවන බණ වරෙහි 23, 26 ‘දත යුතුය’ යනු ‘දත යුතු ආකාරයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි කියා වෙනස් කොට යෙදිය යුතුයි.) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් දකිමින් ප්‍රත්‍යක්ෂ කරයි.

4. යම් යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙත්ද, ඒ ඒ ධර්මයෝ දක්නා ලද්දාහුවෙත්. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහයි වදාළ ධර්මය සොතාවධාන නම්. එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම්.

5. කෙසේ නම් මේ ධර්මයෝ පිරිහීම් පක්ෂයෙහි වූහ, මේ ධර්මයෝ ස්ථිති පක්ෂයෙහි වූහ, මේ ධර්මයෝ විශෙෂ පක්ෂයෙහි වූහ, මේ අවබොධ කිරීම් පක්ෂයෙහි වූහයි වදාළ ධර්මයෝ සොතාවධාන නම් වේද, එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම්වේද, ප්‍රථම ධ්‍යානය ලැබූ පුද්ගලයන්හට කාමයන් අරමුණු කොට ඇති සංඥාවෙන් යුත් මනසිකාරයෝ පවතිත්ද, මෙය පිරිහීම් පක්ෂයෙහිවූ ධර්මය වෙයි. ඒ ධ්‍යානයට අනුව පවත්නා ඇල්මයයි කියනලද සතිය පිහිටියේ වෙයිද, මෙය ස්ථිති පක්ෂයෙහිවූ ධර්මය වෙයි. අවිතර්ක සහගතවූ සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය විශෙෂ පක්ෂයෙහිවූ ධර්මය වෙයි.

මාර්ගය හා යෙදුණාවූ නිර්විදා ඥාන සහ ගතවූ සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය කළකිරීම් පක්ෂයෙහිවූ ධර්මය වෙයි. ද්විතීයධ්‍යානලාභී පුද්ගලයාහට විතර්ක සහගත සංඥාවෙන් යුත් මනසිකාරයෝ පවතිත්ද මෙය හානභාගිය (පිරිහීම් පක්ෂයෙහිවූ) ධර්මය වෙයි. ඒ ධ්‍යානයට අනුව පවත්නා එහි ඇල්මයයි කියනලද සතිය පිහිටයි එය ඨිතිභාගිය (ස්ථිති පක්ෂයෙහි) වූ ධර්මය වෙයි. උපෙක්ඛා සුඛ සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද, මෙය විසෙසභාගිය ධර්මය වෙයි. මාර්ග ඥානයෙන් යුත් නිර්විදා ඥාන සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද, මෙය නිබ්බෙධභාගිය (කලකිරීම් පක්ෂයෙහිවූ) ධර්මය වෙයි. තෘතීය ධ්‍යානලාභී පුද්ගලයා හට පීති සුඛ සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද, මෙය හානභාගිය ධර්මය වෙයි. ඒ ධ්‍යානයට අනුව පවත්නාවූ ධ්‍යාන නිකන්තිය (ඇල්ම) යයි කියනලද සතිය පිහිටයිද මෙය ඨිතිභාගිය ධර්මය වෙයි. අදුක්ඛමසුඛ සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය විශෙෂ භාගිය ධර්මය වෙයි. මාර්ගය හා යෙදුනාවූ නිර්විදා ඥාන සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය නිබ්බෙධ භාගිය ධර්මය වේ. චතුර්ථධ්‍යාන ලාභී පුද්ගලයාහට උපෙක්ඛා සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය හානභාගිය ධර්මය වෙයි. ඊට අනුව පවත්නා ධ්‍යාන නිකන්තියයි කියනලද සතිය පිහිටයිද මෙය ඨිතිභාගිය ධර්මය වෙයි. ආකාසානඤ්චායතන සහගත සඤ්ඤා මනසිකාරයෝ පවතිත්. මෙය විශෙෂ භාගිය ධර්මය වෙයි. මාර්ගය හා යෙදුණාවූ නිර්විදා ඥාන සහගතවූ මනසිකාරයෝ පවතිත්ද මෙය නිබ්බිදා භාගිය ධර්මය වෙයි.

**6.** ආකාසානඤ්චායතන ධ්‍යානලාභී පුද්ගලයාහට රූප සහගත සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද මෙය හානභාගිය ධර්මයවෙයි. ඊට අනුව පවත්නා නිකන්ති සතිය පිහිටියේ වෙයිද, මෙය ඨිතිභාගිය ධර්මයවෙයි. විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද, මෙය විශෙෂභාගිය ධර්මය වෙයි. මාර්ගය හා යෙදුණාවූ නිර්විදාඥාන සහගතවූ සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද මෙය නිබ්බෙධ භාගිය ධර්මයවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විඤ්ඤාණඤ්චායතන ලාභී පුද්ගලයාහට ආකාසානඤ්චායතන සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද මෙය හානභාගිය ධර්මයවෙයි. ඊට අනුව පවත්නාවූ ධ්‍යානනිකන්ති සතිය පිහිටියේ වෙයිද මෙය ඨිතිභාගිය ධර්මයවෙයි. ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤා මනසිකාරයෝ පවතිත්ද, මෙය විශෙෂ භාගිය ධර්මයවෙයි. මාර්ගය හා යෙදුනාවූ නිර්විදාඥාන සහගතවූ සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද, මෙය නිබ්බෙධ භාගිය ධර්මයවෙයි. ආකිඤ්චඤ්ඤායතන ලාභී පුද්ගලයාහට විඤ්ඤාණඤ්චායතන සහගත සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද මෙය හානභාගිය ධර්මයවෙයි. ඊට අනුව පවත්නාවූ ධ්‍යානනිකන්ති සතිය පිහිටියේ වෙයිද, මෙය ඨිතිභාගිය ධර්මය වෙයි. නෙවසඤ්ඤා නාසඤ්ඤා සහගත සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද, මෙය විශෙෂ භාගිය ධර්මයවෙයි. මාර්ගය හා යෙදුණාවූ නිර්විදා ඥාන සහගතවූ සඤ්ඤාමනසිකාරයෝ පවතිත්ද මෙය නිබ්බෙධ භාගිය ධර්මය වෙයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම් වෙයි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම් වෙයි. එහෙයින් මේ ධර්මයෝ හානභාගියහ. මේ ධර්මයෝ ඨිතිභාගියහ. මේ ධර්මයෝ විශෙෂ භාගියහ. මේ ධර්මයෝ නිබ්බෙධ භාගියහයි වදාළ ධර්මයෝ සොතාවධාන නමැයි එය දැනගත්තාවූ ප්‍රඥාව සුතමය ඤාණ නමැයිද කියනු ලැබේ.

7. කෙසේ නම් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු සංස්කාරයෝ දුක්ඛයහ. සියලු සංස්කාරයෝ අනාත්මයහයි වදාළ ධර්මය සොතාවධාන නම් වේද, එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නම් වේද, රූපය (i) ක්ෂය වීම් අර්ථයෙන් අනිත්‍ය නම්. භය සහිත අර්ථය දුක්ඛ නම්. ආත්ම සාරයක් නැති අර්ථයෙන් අනාත්ම නමැයි වදාළ ධර්මය සොතාවධාන නම්. එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඤාණ නම්. (ii) වේදනාව (මෙහි මේ ඡෙදයේ (i) යොදන්න) සංඥාව ( (i) යොදන්න) සංස්කාරයන් ( (i) යොදන්න) විඤ්ඤාණය ( (i) යොදන්න) ඇස් ( (i) යොදන්න) කණ ( (i) යොදන්න) නාසය ( (i) යොදන්න) දිව ( (i) යොදන්න) කය ( (i) යොදන්න) සිත ( (i) යොදන්න

ජරාමරණ ක්ෂයවීම් අර්ථයෙන් අනිත්‍ය නම්. භයසහිත අර්ථයෙන් දුක්ඛ නම්. ආත්ම සාරයක් නැති අර්ථයෙන් අනාත්ම නැමති වදාළ ධර්මය සොතාවධාන නම්. එයද දැනගන්නා ප්‍රඥාව සුතමය ඥාණ නම්. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු සංස්කාරයෝ දුක්ඛයහ. සියලු සංස්කාරයෝ අනාත්මයහයි වදාළ ධර්මය සොතාවධාන නම්. එය දැනගන්නා ප්‍රඥාව සුතමය ඥාණ නමැයි කියනු ලැබේ.

**8.** කෙසේ නම්, මෙය දුඃක්ඛාර්යසත්‍ය නම්. මෙය දුඃඛ සමුදයාර්ය සත්‍ය නම්. මෙය දුඃඛ නිරොධාර්ය සත්‍ය නම්. මෙය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍ය නමැයි වදාළ ධර්මය සොතාවධාන නම් වේද? එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥාණ නම් වේද?

ඒ ආර්ය සත්‍ය සතර අතුරෙන් දුඃඛාර්ය සත්‍ය නම් කවරේද? ඉපදීමද දුකය, ජරාවද දුකය, මරණයද, දුකය, සොකය හැඬීම කායික දුක මානසික දුක සොකයෙන් ඇතිවන දැඩි වෙහෙස යන මොහුද දුක්යහ. අප්‍රියයන් සමග එක්වීමද දුකය. ප්‍රියයන්ගෙන් වෙන්වීමද දුකය. යමක් කැමති නම් එය නොලැබීමද දුකය. සැකෙවින් උපාදානස්කන්ධ පසම දුක්යහ.

**9.** ඔවුන් අතුරෙන් එහි ඉපදීම නම් කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායවල යම් ඉපදීමක් වේද, හටගැන්මක්වේද, පිළිසිඳගැනීමක් වේද, බැසගැනීමක් වේද, වීමක් වේද, ආයතනයන්ගේ ලැබීමක් ස්කන්ධයන්ගේ පහළවීමක් වේද, මේ ඉපදීමයයි කියනු ලැබේ. එහි ජරාව නම් කවරීද, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායවල යම් දිරීමක් දිරීම් ස්වභාවයක් කැඩුනු බවක් පැසුණු බවක් ඇඟ රැලිවැටීමක් ආයුෂයාගේ පිරිහීමක් ඉන්ද්‍රියයන්ගේ මේරීමක් වේද, මේ ජරාවයයි කියනු ලැබේ. එහි මරණය නම් කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායවලින් චුතවීමක් චුතවන ස්වභාවයක් බිඳීමක් වේද, අතුරුදහන්වීමක් වේද, මච්චුයයි කියනලද මරණයක් කාලක්‍රියාවක් වේද. සත්වයන්ගේ බිඳීමක්,

මෘතශරීරය බහා තැබීමක්, ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමක්වේද මෙය මරණයයි කියනු ලැබේ.

**10.** එහි ශොකය කවරේද? ඤාතීන්ගේ විපත්තියකින් හෝ මඩනාලද්දහුටද වස්තු විනාසයකින් හෝ මඩනා ලද්දහුටද, ශීලය විනාශයෙන් හෝ මඩනාලද්දහුටද, රෝග විනාශයෙන් හෝ මඩනාලද්දහුටද, දිට්ඨි විනාශයෙන් හෝ මඩනාලද්දහුටද එක්තරා එක්තරා විනාශයකින් යුක්ත වූවහුටද, එක්තරා එක්තරා දුකකින් මඩනාලද්දහුට ශොකයක් ශොකාකාරයක් ශොක ස්වභාවයක් ඇතුළත ශොකයක් ඇතුළත හාත්පස ශොක කිරීමක් ඇතුළත දැවීමක් දොම්නසක් සොක නැමැති හුලක්වේද, මේ ශොකයයි කියනු ලැබේ. එහි වැලපීම කවරේද? නෑයන්ගේ විනාශයෙන් හෝ මඩනාලද්දහුටද වස්තු විනාශයෙන් හෝ මඩනා ලද්දහුටද, රොග විපත්තියකින් හෝ මඩනාලද්දහුටද, ශීල විපත්තියකින් හෝ මඩනාලද්දහුටද, දෘෂ්ටි විපත්තියකින් හෝ මඩනාලද්දහුටද එක්තරා එක්තරා විපත්තියකින් යුත්වූවහුටද, එක්තරා එක්තරා දුක් ස්වභාවයකින් මඩනා ලද්දහුට ඇඬීමක් වැලපීමක් ඇඬීම් ස්වභාවයක් වැළපීම් ස්වභාවයක් ඇඬීම් බවක් වැළපීම් බවක්, කීමක් වේද, හිස් කීමක් වේද, නැවත නැවත කීමක් වේද, විලාප කීමක් දෙඩවීමක් දෙඩවීම් ආකාරයක් දෙඩවීම් ස්වභාවයක් වේද, මේ පරිදෙවයයි කියනු ලැබේ.

**11.** එහි දුක නම් කවරේද? යම් කායික නොසැප බවක් කයෙහිවූ දුකක් කාය සම්ඵස්සයෙන් හටගත් නොසැපවූ දුක්වූ විඳීමක් කාය සම්ඵස්සයෙන් හටගත් නොසැපවූ දුක්ඛ වේදනාවක්වේද, මේ දුකයයි කියනු ලැබේ.

**12.** එහි දොම්නස නම් කවරේද? මානසිකවූ යම් නොසැප බවක් මානසික දුකක් මනොසම්ඵස්සයෙන් හටගත් නොසැපවූ දුක් විඳීමක් මනොසම්ඵස්සයෙන් හටගත් නොසැපවූ යම් දුක්ඛ වේදනාවක් වේද, මේ දොම්නසයයි කියනු ලැබේ.

**13.** එහි දැඩි වෙහෙස නම් කවරේද? නෑයන්ගේ විනාශයකින් මඩනාලද්දහුට හෝ වස්තු විනාශයෙන් මඩනා

ලද්දහුට හෝ රෝග විනාශයෙන් මඩනාලද්දහුට හෝ ශීල විනාශයෙන් මඩනාලද්දහුට හෝ දෘෂ්ටි විනාශයෙන් මඩනා ලද්දහුට හෝ එක්තරා එක්තරා විපත්තියකින් මඩනා ලද්දහුට හෝ එක්තරා එක්තරා දුක් ස්වභාවයකින් මඩනා ලද්දහුට වෙහෙසක් ක්ලාන්ත බවක් වෙහෙස ආකාරයක් ක්ලාන්ත ආකාරයක් වෙහෙස බවක් ක්ලාන්ත බවක් වේද මේ උපායාසයයි කියනු ලැබේ.

**14.** එහි අප්‍රියයන් හා එක්වීම් දුක නම් කවරේද? මේ ලොකයෙහි යමෙකුහට අයහපත්වූ නොකැමැතිවූ සිත සතුටු නොවන්නාවූ රූපයෝද, ශබ්දයෝද, ගන්ධයෝද, රසයෝද, ස්පර්ශයෝද, වෙත් යම් යම් දේ ඔහුට අයහපත කැමති වන්නාහුද, අහිත බව කැමති වන්නාහුද අපහසු බව කැමතිවන්නාහුද, සතර යෝගයන්ගෙන් මිදීමට නුසුදුසු වන්නාහුද, ඔවුන් සමග එක්වීමක් සමාගමයක් මිශ්‍රවීමක් වේද, මේ අප්‍රියයන් හා එක්වීමේ දුකයයි කියනු ලැබේ.

**15.** එහි ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක නම් කවරේද? මේ ලෝකයෙහි යම් කෙනෙකුට යහපත්වූ කැමතිවන්නාවූ මනවඩන්නාවූ රූපයෝද, ශබ්දයෝද, ගන්ධයෝද, රසයෝද, ස්පර්ශයෝ තවත් යම් යම් දේ ඔහුට යහපත කැමතිවන්නාහුද හිතබව කැමතිවන්නාවූද, පහසුව කැමතිවන්නාවූද, යම් මවු හෝ පියා හෝ සහෝදරයෙක් හෝ සහෝදරියක් හෝ මිත්‍රයෙක් හෝ අසල්වැසියෝ හෝ සහලේ නෑයෝ හෝ වෙත්ද, ඔවුන්ගෙන් වෙන්වීමක් නොඑක්වීමක්, මිශ්‍රනොවීමක් වේද මෙය ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුකයයි කියනු ලැබේ.

**16.** යමක් කැමතිද එය නොලැබීම එහි දුකය යනු කවරේද? ඉපදීම ස්වභාවකොට ඇති සත්වයන්ට ඒකාන්තයෙන් 'අපි ඉපදීම ස්වභාවකොට ඇත්තේ නොවෙමු නම් යහපත, අපට ඒකාන්තයෙන් ඉපදීම නොවන්නේ නම් යෙහෙකැයි' කැමැත්තක් ඇතිවන්නේය. මෙය කැමති පරිදි ලැබිය හැක්කක් නොවේ. මෙයද කැමති යමක් නොලැබීමේ දුකයි. ජරාව ස්වභාවකොට ඇති සත්වයන්ට ව්‍යාධිය ස්වභාවකොට ඇති

සත්වයන්ට මරණය ස්වභාවකොට ඇති සත්වයන්ට ශොකය හැඬීම ශරීර කායික දුක, මානසික දුක, තද වෙහෙස ස්වභාවකොට ඇති සත්වයන්ට 'අතිශොකය හැඬීම, දුක, දොම්නස තද වෙහෙස ස්වභාවකොට ඇත්තෝ නොවෙමුනම් යහපත අපට ඒකාන්තයෙන් ශොකය හැඬීම දුක, දොම්නස තද වෙහෙස නොවන්නේ නම් යෙහෙකැයි' මෙසේ කැමැත්තක් ඇතිවන්නේය. මෙය කැමති පරිදි ලබාගත හැක්කක් නොවේ. මෙයද කැමති දෙයක් නොලැබීමේ දුකයි.

17. එහි සැකෙවින් දැක්වූ උපාදානස්කන්ධ පස කවරේද? ඒ මෙසේයි. රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය සංඥා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොහුය. මොහු සැකෙවින් දුක්වූ උපාදාන ස්කන්ධ පසයයි කියනු ලැබෙත්. මේ දුක්ඛාර්ය සත්‍යයයි කියනු ලැබේ.

18. එහි දුක්ඛසමුදය ආර්යසත්‍යය නම් කවරේද? නැවත ඉපදීම ඇතිකරන්නාවූ නන්දියයි කියනලද රාගයෙන් යුත් ඒ ඒ තැන ඇලෙන්නාවූ යම් මේ තෘෂ්ණාවක්වේද ඒ මෙසේයි කාම තණ්හාවද, භව තණ්හාවද, විභව තණ්හාවද වෙත්. මහණෙනි, මේ තෘෂ්ණාව කිනම් තැනෙක්හි උපදිනුයේ උපදීද කිනම් තැනෙක්හි වැදගනුයේ වැදගනීද? ලෝකයෙහි යම් ප්‍රිය ස්වභාවයක් හෝ මිහිරි ස්වභාවයක් ඇත්තේ වේද, මෙහි ඒ තෘෂ්ණාව උපදිනුයේ උපදියි. වැදගනුයේ වැදගනියි.

19. ලෝකයෙහි ප්‍රිය ස්වභාවය මිහිරි ස්වභාවය ඇත්තේ කුමක්ද? ලෝකයෙහි ඇස (i) ප්‍රිය ස්වභාවය ඇත්තකි. මිහිරි ස්වභාවය ඇත්තකි. එහි ඒ තෘෂ්ණාව උපදිනුයේ උපදියි, වැදගනුයේ වැදගනියි. (ii) ලෝකයෙහි කන (මෙහි 19 (i) යොදන්න) ලෝකයෙහි නාසය ( (i) යොදන්න) ලෝකයෙහි දිව ( (i) යොදන්න) ලෝකයෙහි කය ( (i) යොදන්න) ලෝකයෙහි සිත ( (i) යොදන්න) ලෝකයෙහි ශබ්දයෝ ( (i) යොදන්න) ලෝකයෙහි ගන්ධයෝ ( (i) යොදන්න) ලෝකයෙහි රසයෝ ( (i) යොදන්න) ලෝකයෙහි ධර්මයෝ ( (i) යොදන්න) ලෝකයෙහි

චක්ඛුවිඤ්ඤාණය ( (i) යොදන්න) සොතවිඤ්ඤාණය ( (i) යොදන්න) ඝාණවිඤ්ඤාණය ( (i) යොදන්න) ජිව්හා විඤ්ඤාණය ( (i) යොදන්න) කාය විඤ්ඤාණය ( (i) යොදන්න) සොතවිඤ්ඤාණය ( (i) යොදන්න) ලෝකයෙහි මනො විඤ්ඤාණය ( (i) යොදන්න) ලෝකයෙහි චක්ඛුසම්ඵස්සය ( (i) යොදන්න.) ලොකයෙහි සොතසම්ඵස්සය ( (i) යොදන්න) ලොකයෙහි ඝාණසම්ඵස්සය ( (i) යොදන්න) ලෝකයෙහි ජිව්හාසම්ඵස්සය ( (i) යොදන්න.) ලොකයෙහි කාය සම්ඵස්සය ( (i) යොදන්න.) ලොකයෙහි මනො සම්ඵස්සය ( (i) යොදන්න.) ලෝකයෙහි චක්ඛුසම්ඵස්ස වේදනාව ( (i) යොදන්න.) ලෝකයෙහි සොත සම්ඵස්සජ වේදනාව ( (i) යොදන්න.) ලෝකයෙහි ඝාණ සම්ඵස්සජ වේදනාව ( (i) යොදන්න.) ලෝකයෙහි ජිව්හා සම්ඵස්සජ වේදනාව ( (i) යොදන්න.) ලෝකයෙහි කාය සම්ඵස්සජ වේදනාව ( (i) යොදන්න.) ලෝකයෙහි මනො සම්ඵස්සජ වේදනාව ( (i) යොදන්න.) ලොකයෙහි රූප සංඥාව ) (i) යොදන්න.) ලොකයෙහි ශබ්ද සංඥාව ( (i) යොදන්න.) ලොකයෙහි ගන්ධ සංඥාව ( (i) යොදන්න.) ලොකයෙහි රස සංඥාව ( (i) යොදන්න) ලොකයෙහි ස්පර්ශ සංඥාව ( (i) යොදන්න.) ලොකයෙහි ධර්ම සංඥාව ( (i) යොදන්න.) ලොකයෙහි රූප සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි ශබ්ද සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි ගන්ධ සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි රස සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි ස්පර්ශ සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි ධර්ම සංචෙතනාව ( (i) යොදන්න.) ලොකයෙහි රූප තෘෂ්ණාව ( (i) යොදන්න.) ලොකයෙහි ශබ්ද තෘෂ්ණාව ( (i) යොදන්න.) ලොකයෙහි ගන්ධ තෘෂ්ණාව ( (i) යොදන්න.) ලෝකයෙහි රස තෘෂ්ණාව ( (i) යොදන්න.) ලෝකයෙහි ස්පර්ශ තෘෂ්ණාව ( (i) යොදන්න.) ලෝකයෙහි ධර්ම තෘෂ්ණාව ( (i) යොදන්න.) ලෝකයෙහි රූප විතර්කය ( (i) යොදන්න.) ලෝකයෙහි ශබ්ද විතර්කය ( (i) යොදන්න.) ලොකයෙහි ගන්ධ විතර්කය ( (i) යොදන්න.) ලෝකයෙහි රස

විතර්කය ( (i) යොදන්න.) ලොකයෙහි ස්පර්ශ විතර්කය ( (i) යොදන්න.) ලෝකයෙහි ධර්ම විතර්කය ( (i) යොදන්න.)

ලෝකයෙහි රූප විචාරය ( (i) යොදන්න.) ලෝකයෙහි ශබ්දවිචාරය ( (i) යොදන්න.) ලෝකයෙහි ගන්ධ විචාරය ( (i) යොදන්න.) ලෝකයෙහි රස විචාරය ( (i) යොදන්න.) ලොකයෙහි ස්පර්ශ විචාරය ( (i) යොදන්න.) ලෝකයෙහි ධර්ම විචාරය ( (i) යොදන්න.)

මේ දුක්ඛ සමුදයාර්ය සත්‍යයයි කියනු ලැබේ.

**20.** එහි දුක්ඛ නිරොධාර්ය සත්‍යය නම් කවරේද? ඒ තෘෂ්ණාවගේම යම් සම්පූර්යෙන් වෙන්වීමක් ඇද්ද නිරුද්ධ කිරීමක් ඇද්ද අත්හැරීමක් ඇද්ද දුරුකිරීක් ඇද්ද, මිදීමක් ඇද්ද, ආලය හැරීමක් ඇද්ද, ඒ මේ තෘෂ්ණා තොමෝ කවර තැනෙක්හි ප්‍රහීනවනුයේ ප්‍රහීනවේද, කවර තැනෙක්හි නැතිවන්නේ නැතිවේද ලොකයෙහි යම් ප්‍රිය ස්වභාවයක් මිහිරි ස්වභාවයක් ඇත්තේවේද, මෙහි ඒ තෘෂ්ණාව පහවනුයේ පහවෙයි නිරුද්ධවනුයේ නිරුද්ධ වෙයි.

**21.** ලොකයෙහි ප්‍රිය ස්වභාවය ඇති දෙය මිහිරි ස්වභාවය ඇති දෙය නම් කුමක්ද? ලොකයෙහි ඇස (i) ප්‍රියය, මිහිරිය, එහි මේ තෘෂ්ණාව පහවනුයේ පහවෙයි නිරුද්ධ වනුයේ නිරුද්ධ වෙයි. (මෙහි ඒ ඒ වචන මුලට 'ලොකයෙහි' යන්නද අගට 21 (i) යොදන්න) ඇස-, කණ-, නාසය-, දිව-, කය-, සිත-, රූප-ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශය - ධර්ම - චක්ඛු විඤ්ඤාණය , සෝතවිඤ්ඤාණය-, ඝාණවිඤ්ඤාණය - ජිව්හා විඤ්ඤාණය , කායවිඤ්ඤාණය-, මනොවිඤ්ඤාණය -, චක්ඛු සම්ඵස්සය -, සොත සම්ඵස්සය -, ඝාණසම්ඵස්සය - ජිව්හා සම්ඵස්සය - කායසම්ඵස්සය - මනොසම්ඵස්සය - චක්ඛු සම්ඵස්සජ වේදනාව සොත සම්ඵස්සජ වේදනාව - ඝාණ සම්ඵස්සජ වේදනාව - ජිව්හා සම්ඵස්සජ වේදනාව - කාය සම්ඵස්සජ වේදනාව - මනොසම්ඵස්සජ වේදනාව - රූප සංඥාව - ශබ්ද සංඥාව - ගන්ධ සංඥාව - රස සංඥාව - ස්පර්ශ සංඥාව - ධර්ම සංඥාව - රූප සංචෙතනාව - ශබ්ද සංචෙතනාව - ගන්ධ සංචෙතනාව

- රස සංචෙතනාව - ස්පර්ශ සංචෙතනාව - ධර්ම සංචෙතනාව - රූප තෘෂ්ණාව - ශබ්ද තෘෂ්ණාව - ගන්ධ තෘෂ්ණාව - රස තෘෂ්ණාව - ස්පර්ශ තෘෂ්ණාව - ධර්ම තෘෂ්ණාව - රූප විතර්කය - ශබ්ද විතර්කය - ගන්ධ විතර්කය - රස විතර්කය - ස්පර්ශ විතර්කය - ධර්ම විතර්කය - රූප විචාරය - ශබ්ද විචාරය - ගන්ධ විචාරය - රස විචාරය - ස්පර්ශ විචාරය - ධර්ම විචාරය මේ දුක්ඛ නිරොධ ආර්ය සත්‍යයයි.

**22.** එහි දුක්ඛ නිරොධගාමිනි ප්‍රතිපදා ආර්ය සත්‍යය කවරේද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමය. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුය.

**23.** එහි සම්‍යක් දෘෂ්ටිය නම් කවරේද? දුක දන්නා නුවණ, දුකට හෙතුව දන්නා නුවණ, දුක් නැතිකිරීම දන්නා නුවණ, දුකට හෙතුව දන්නා නුවණ, දුක් නැතිකිරීම දන්නා නුවණ, දුක් නැතිකිරීමේ මාර්ගය දන්නා නුවණ යන මේ සම්මාදිට්ඨියයි කියනු ලැබේ.

**24.** එහි සම්‍යක් සංකල්පය නම් කවරේද? නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාව, අව්‍යාපාද සංකල්පනාව අවිහිංසා සංකල්පනාව, යන මේ සම්‍යක් සංකල්පයයි කියනු ලැබේ.

**25.** එහි සම්‍යක් වචනය කවරේද? බොරු කීමෙන් වෙන්වීම, කේලාම් කීමෙන් වෙන්වීම, ඵරුෂ වචනයෙන් වෙන්වීම, ප්‍රලාප කීමෙන් වෙන්වීම, මේ සම්‍යක් වචනයයි කියනු ලැබේ.

**26.** එහි සම්‍යක් කර්මාන්තය කවරේද? සතුන් මැරීමෙන් වෙන්වීම, නුදුන් දේ ගැනීමෙන් වෙන්වීම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීම, යන මේ සම්‍යක් කර්මාන්තයයි කියනු ලැබේ.

**27.** එහි සම්‍යක් ජීවිකාව කවරේද? මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම වැරදි ජීවිකාවෙන් වෙන්ව යහපත් ජීවිකාවෙන් ජීවිකාව කෙරෙයිද, මේ සම්‍යක් ආජීවයයි කියනු ලැබේ.

**28.** එහි සම්‍යක් ව්‍යායාමය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුශල ධර්මයන් නොඉපදීම පිණිස (i) කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන්ගනීද, සිත යොදයිද, උත්සාහ කෙරේද, (ii) උපන් ලාමක අකුශල ධර්මයන් නැති කිරීම පිණිස (28 (i) යොදන්න) නූපන් කුශල ධර්මයන් ඉපදවීම පිණිස (28 (i) යොදන්න) උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුලා බව පිණිස වැඩිවීම පිණිස මහත් බව පිණිස, භාවනාවගේ පිරීම පිණිස (28 (i) යොදන්න) මේ සම්‍යක් ව්‍යායාමයයි කියනු ලැබේ.

**29.** එහි සම්මාසතිය කවරේද? මේ ශාසනයෙහි මහණ තෙම (i) කෙලෙස් තවන වීර්ය ඇත්තේ යහපත් නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලොභය හා ද්වෙෂය දුරුකොට (ii) ශරීරයෙහි ශරීරය නැවත නැවත බලමින් වාසය කරයි. වෙදනාවන්හි වෙදනාවන් නැවත නැවත බලමින් (29 (i) යොදන්න) සිතෙහි සිත නැවත නැවත බලමින් (29 (i) යොදන්න) ධර්මයන්හි ධර්මය නැවත නැවත බලමින්, වීර්ය ඇතිව, නුවණ ඇතිව සිහිය ඇතිව ස්කන්ධලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරයි. මෙය සම්මා සතියයි කියනු ලැබේ.

**30.** එහි සම්මාසමාධිය කවරේද? මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් පහළවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් තමා තුළ පැහැදීම් ඇති සිතේ එකග්‍ර බව ඇති විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතියෙන් හා සැපයෙන් යුත් දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේ වෙන්වීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සිහි ඇත්තේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපයක් විඳියි. ආර්යයෝ යමක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැපවිහරණ ඇත්තේයයි කියත්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය නැති කිරීමෙන්ද දුක නැති කිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙක දුරුකිරීමෙන් දුක්නැති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සැප නැති උපෙක්ෂාවෙන් යුත් සිහියෙන් පිරිසිදු සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ. මේ දුක්ඛනිරොධ ගාමිනී ප්‍රතිපදා ආර්ය සත්‍යයයි කියනු ලැබේ.

31. එය දැනගැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් මේ දුක්ඛාර්ය සත්‍යය, මේ දුක්ඛ සමුදයාර්ය සත්‍යය, මේ දුක්ඛ නිරොධාර්ය සත්‍යය, මේ දුක්ඛ නිරොධගාමිනී පටිපදාර්ය සත්‍යයයි වදාළ ධර්මය සොතාවධාන නමැයිද, එය දන්නා ප්‍රඥාව සුතමය ඤාණ නමැයිද කියනු ලැබේ.

32. අසා හික්මීමෙහි ප්‍රඥාව කෙසේ සීලමය ඤාණය වේද? සිල් පසකි. පරියන්ත පාරිසුද්ධි අපරියන්ත පාරිසුද්ධි පරිපුණ්ණ පාරිසුද්ධි සීලය අපරාමට්ඨ පාරිසුද්ධි සීලය පටිපස්සද්ධි පාරිසුද්ධි සීලය යන මොහුයි. නුවණ ශීලය දෘෂ්ටියකින් අල්වා නොගත් පිරිසිදුවීමේ නුවණ ශීලය සියලු කෙලෙස් සංසිඳුන පිරිසිදුවීමේ ශීලය යන පසයි.

33. එහි සීමාවක් එයින් පරියන්ත පාරිශුද්ධි සීලය නම් කවරේද? සීමාවක් ඇති ශික්ෂාපදයන්ගේ සංඛ්‍යා සීමාවක් ඇති උපසම්පදා නොවූවන්ගේ ශීලය යයි මෙය පරියන්ත පාරිශුද්ධි ශීලයයි.

34. අපරියන්ත පාරිසුද්ධි සීලය කවරේද? සීමාවක් නැති ශික්ෂාපද ඇති උපසම්පදා වූවන්ගේ ඤාණ සීලයයි මෙය අපරියන්ත පාරිශුද්ධි ශීලයයි. පරිපුණ්ණ පාරිසුද්ධි සීලය කවරේද? කුශල ධර්මයෙහි යෙදුනාවූ ශෛක්ෂ බව කෙළවර කොට ඇති ධර්මය සම්පූර්ණ කරන්නාවූ ශරීරයෙහිත් ජීවිතයෙහිත් අපෙක්ෂා රහිතව පරිත්‍යාග කරණ ලද ජීවිතය ඇති කල්‍යාණ පෘථග්ජනයන්ගේ ශීලයයි. මෙය පරිපුණ්ණ පාරිසුද්ධ ශීලයයි.

35. අපරාමට්ඨ පාරිශුද්ධි ශීලය කවරේද? ශෛක්ෂයන් සත්දෙනාගේ සීලයයි. මෙය අපරාමට්ඨ පාරිසුද්ධි ශීලයයි. පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලය කවරේද? ක්ෂීණාශ්‍රව

බුද්ධශ්‍රාවකයන්ගේද පසේ බුදුවරයන්ගේද තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරයන්ගේද ශීලයයි. මේ පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලයයි.

**36.** කෙළවරක් ඇති ශීලයක් ඇත්තේය. කෙළවරක් නැති ශීලයක් ඇත්තේය. කෙළවරක් ඇති ශීලය කවරේද? ලාභය කෙළවරකොට ඇති ශීලයක් ඇත්තේය. කීර්තිය කෙළවරකොට ඇති ශීලයක් ඇත්තේය නෑයන් කෙළවර කොට ඇති ශීලයක් ඇත්තේය. ශරීර අවයව කෙළවරකොට ඇති ශීලයක් ඇත්තේය. ජීවිතය කෙළවරකොට ඇති ශීලයක් ඇත්තේය. ලාභය කෙළවරකොට ඇති ශීලය කවරේද? මේ ලෝකයෙහි ඇතැමෙක් ලාභය හේතුකොට ගෙන, ලාභය ප්‍රත්‍යයකොටගෙන, ලාභය කරණකොටගෙන සමාදන්වූ ශික්ෂාපදය ඉක්මවයිද, මේ ශීලය ලාභය කෙළවරකොට ඇති ශීලයයි. යසස් කෙළවරකොට ඇති ශීලය කවරේද? මේ ලෝකයෙහි ඇතැමෙක් යසස් හේතුකොටගෙන යසස් ප්‍රත්‍යය කොට ගෙන යසස් කාරණ කොටගෙන, සමාදන්වූ ශික්ෂාපද ඉක්මවයිද, ඒ මේ ශීලය යස පරියන්ත ශීලයයි. ඥාතීන් කෙළවර කොට ඇති ශීලය කවරේද? මේ ලොකයෙහි ඇතැමෙක් ඥාතීන් හේතුකොටගෙන ඥාතීන් ප්‍රත්‍යය කොට ඥාතීන් කරණකොටගෙන සමාදන්වූ සීලය ඉක්මවයිද? මේ සීලය නෑයන් කෙළවරකොට ඇති ශරීර සීලයයි අවයව කෙළවර කොට ඇති සීලය කවරේද? මේ ලෝකයෙහි ඇතැමෙක් අවයව හේතුකොටගෙන අවයව ප්‍රත්‍යය කොටගෙන, අවයව කාරණකොටගෙන සමාදන්වූ ශික්ෂාපද ඉක්මවයිද, ඒ මේ සීලය අවයව කෙළවරකොට ඇති සීලයයි. ජීවිතය අවසන් කොට ඇති සීලය කවරේද? මේ ලෝකයෙහි ඇතැමෙක් ජීවිතය හේතුකොටගෙන ජීවිතය ප්‍රත්‍යයකොටගෙන ජීවිතය කරණකොටගෙන සමාදන්වූ ශික්ෂාපද ඉක්මවයිද, ඒ මේ සීලය ජීවිතය කෙළවරකොට ඇති සීලයයි.

**37.** මෙබඳු සීලයෝ මුල හෝ මැද හෝ කඩවූවාහු, සිදුරුවූවාහු, කබර ගැසුනාහු, කිලුටුවූවාහු, නිදහස් නොවාහු නුවණැත්තන් විසින් ප්‍රශංසා නොකරන ලද්දාහු, තෘෂ්ණා දෘෂ්ටි

දෙකින් අල්වා ගත්තාහුය. සමාධිය පිණිස නොවූවාහු, නොවිපිලිසර බව පිණිස පවත්නාහු ප්‍රමොදයට හෙතුවූවාහු ප්‍රීතියට හෙතුවූවාහු සැපට හෙතුවූවාහු සමාධියට හෙතුවූවාහු යථාභූත ඥාන දර්ශනයට හෙතුවූවාහු එකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරුද්ධවීම පිණිස සංසිඳීම පිණිස විශිෂ්ටඥානයෙන් දැනීම පිණිස අවබොධය පිණිස නිවන පිණිස නොපවතිත්, මේ ශීලය කෙළවරක් ඇති සීලයයි.

38. කෙළවරක් නැති ශීලය කවරේද? ලාභය කෙළවර කොට නැති ශීලයක් ඇත්තේය. යසස් කෙළවරකොට නැති ශීලයක් ඇත්තේය. ඥාතීන් කෙළවරකොට නැති ශීලයක් ඇත්තේය. අවයව කෙළවර කොට නැති ශීලයක් ඇත්තේය. ජීවිතය කෙළවරකොට නැති ශීලයක් ඇත්තේය. ලාභය කෙළවරකොට නැති ශීලය කවරේද? මේ ලොකයෙහි ඇතැමෙක් ලාභය හෙතුකොටගෙන, ලාභය ප්‍රත්‍යය කොට ගෙන, ලාභය කාරණ කොටගෙන සමාදන්වූ ශික්ෂා පදය ඉක්මවීමට සිතකුදු නොඋපදවයි. හෙතෙම කුමක් හෙයින් ඉක්මවන්නේද, ඒ මේ ශීලය ලාභය කෙළවරකොට ඇති ශීලය නොවේ.

39. යසස් කෙළවරකොට ඇති ශීලය කවරේද? මේ ලොකයෙහි ඇතැමෙක් කීර්තිය හෙතුකොටගෙන කීර්තිය ප්‍රත්‍යකොටගෙන කීර්තිය කාරණකොටගෙන සමාදන්වන ශික්ෂාපද ඉක්මවීම පිණිස සිතකුදු නොඋපදවයි. හෙතෙම කුමක් හෙයින් ඉක්ම වන්නේද? ඒ මේ ශීලය කීර්තිය අවසන්කොට නැති සීලයවේ. ඥාතීන් කෙළවර කොට නැති සීලය කවරේද? මේ ශාසනයෙහි ඇතැමෙක් ඥාතීන් හෙතුකොටගෙන ඥාතීන් ප්‍රත්‍යය කොටගෙන ඥාතීන් කාරණකොටගෙන සමාදන්වූ ශික්ෂා පදය ඉක්මීම පිණිස සිතකුදු නොඋපදවයි. කුමක් හෙයින් හෙතෙම ඉක්මවයිද, ඒ මේ ශීලය ඥාතීන් අවසන්කොට නැති සීලයයි. අවයව අවසන්කොට නැති සීලය කවරේද? මේ ශාසනයෙහි ඇතැමෙක් අවයව හෙතුකොටගෙන අවයව කරණ කොටගෙන සමාදන්වූ ශික්ෂාපද ඉක්මවීම පිණිස සිතකුදු නොඋපදවයි. හෙතෙම කුමක් හෙයින් ඉක්මවයිද, ඒ මේ ශීලය අවයව කෙළවරකොට ඇති සීලයයි.

**40.** ජීවිතය කෙළවරකොට ඇති සීලය කවරේද? මේ ශාසනයෙහි ඇතැමෙක් ජීවය හෙතුකොටගෙන ජීවිතය ප්‍රත්‍යය කොටගෙන ජීවිතය කරුණුකොටගෙන සමාදන්වූ ශික්ෂාපද ඉක්මවීම පිණිස සිතකුදු නොඉපදවයි. හෙතෙම කුමකින් ඉක්මවයිද, ඒ මේ සීලය ජීවිතය කෙළවර නැති සීලයයි. මෙබඳු ශීලයෝ කඩ නොවූවාහු සිදුරු නොවූවාහු කබර නොගැසුනාහු කිලුටු ඇති නොවූවාහු නිදහස් වූවාහු ඥාණවන්තයන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහු තෘෂ්ණා දෘෂ්ටිමාන විසින් අල්වා නොගත්තාහු සමාධිය පිණිස පවත්නාහු නොවිපිළිසර බවට කරුණු වූවාහු ප්‍රමොදයට කරුණුවූවාහු ප්‍රීතියට කරුණු වූවාහු සංසිඳීමට කරුණුවූවාහු සැපයට කරුණු වූවාහු යථාභූතඥාන දර්ශනයට කරුණු වූවාහු එකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස සංසිඳීම පිණිස විශිෂ්ටඥානය පිණිස අවබොධය පිණිස නිවණ පිණිස පවතිත්. මේ ඒ ශීලය කෙළවරක් නැති ශීලයයි.

**41.** සීලය නම් කවරේද? සීලයෝ කෙතෙක්ද? සීලයාගේ හෙතු කවරේද? කෙතෙක් ධර්මයන්ගේ එක්වීම සීලයද? සීලය කවරේදැයි යනු චෙතනා ශීලය චෛතසික ශීලය, සංවර සීලය අව්‍යති ක්‍රම සීලය යන මොහුයි. සීලයෝ කෙතෙක්ද? සීල තුනකි. කුශල සීලය, අකුශල සීලය, අව්‍යාකත සීලය යන මොහුයි. සීලයාගේ හෙතුකවරේද? කුසල්සිත හෙතුකොට ඇත්තේ කුසල සීලයයි. අකුසල සිත හෙතුකොට ඇත්තේ අකුසල සීලයයි. අව්‍යාකෘත සිත හෙතුකොට ඇත්තේ අව්‍යාකෘත සීලයයි. කෙතෙක් ධර්මයන්ගේ රැස්වීම සීලයද? සංවරයන්ගේ එක්වීම සීලයයි. අව්‍යතික්‍රමයන්ගේ එක්වීම සීලයයි. ඒ ස්වභාවයෙන් උපන් චෙතනාවගේ එක්වීම සීලයයි. ප්‍රාණඝාතය සංවර කිරීම් අර්ථයෙන් සීල නම් නොඉක්මවීම් අර්ථයෙන් සීල නමි. සොරකම් කිරීම සංවර කිරීම් අර්ථයෙන් සීල නමි. නොඉක්මවීම් අර්ථයෙන් සීල නමි. කාමයෙහි වරදවා හැසිරීම් සංවර කිරීම් අර්ථයෙන් සීල නම් වෙයි. නොඉක්මවන අර්ථයෙන් සීල නමි. බොරුකීම සංවර කිරීම් අර්ථයෙන් සීල නමි. නොඉක්මවීම් අර්ථයෙන් සීල නමි. කේලාම් කීම සංවර කිරීම් අර්ථයෙන් සීල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නම්. නොඉක්මවීම් අර්ථයෙන් සීල නම්. ඵරුෂ වචනය සංවර කිරීම් අර්ථයෙන් සීල නම්. නොඉක්මවීම් අර්ථයෙන් සීල නම්. හිස් වචන සංවර කිරීම් අර්ථනේ සීල නම්. නොඉක්මවීම් අර්ථයෙන් සීල නම්. දැඩි ලොභය සංවර කිරීම් අර්ථයෙන් සීල නම්. නොඉක්මවීම් අර්ථයෙන් සීල නම්. ව්‍යාපාදය සංවරවීමේ අර්තයෙන් සීල නම්. නොඉක්මවීමේ අර්ථයෙන් සීල නම්. මිත්ථ්‍යාදෘෂ්ටිය සංවර කිරීම අර්ථයෙන් සීල නම්. නොඉක්මවීමේ අර්ථයෙන් සීල නම්. ආලොක සඤ්ඤාවෙන් ථිනමිද්ධයද සමාධියෙන් උද්ධච්චයද, ධර්මයන් පිරිසිඳ දැනීමෙන් විචිකිච්ඡාවද නුවණින් අවිද්‍යාවද ප්‍රමොද්‍යයෙන් නොඇලීමද ප්‍රථමධ්‍යානයෙන් නීවරණද දෙවෙනිධ්‍යානයෙන් විතර්ක හා විචාරද තුන්වෙනි ධ්‍යානයෙන් ප්‍රීතියද, සතරවෙනි ධ්‍යානයෙන් සැපදුක් දෙකද ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූපසංඥාවද ප්‍රතිඝ සංඥාවද නානත්ත සංඥාවද, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සංඥාවද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤානඤ්චායතන සංඥාවද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියයන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවද, අනිච්චානුපස්සනාවෙන් නිච්චසඤ්ඤාවද, දුක්ඛානුපස්සනාවෙන් සුඛසඤ්ඤාවද, අනත්තානු පස්සනාවෙන් ආත්ම සංඥාවද නිබ්බිදානුපස්සනාවෙන් නන්දියද, විරාගානුපස්සනාවෙන් රාගයද, නිරොධානුපස්සනාවෙන් සමුදයද, පටිනිස්සග්ගානුපස්සනාවෙන් දැඩිකොට ගැන්මද, ඛයානුපස්සනාවෙන් ඝන සංඥාවද, වයානුපස්සනාවෙන් කර්ම රැස්කිරීමද විපරිණාමානුපස්සනාවෙන් ස්ථිරය යන සංඥාවද, අනිමිත්තානුපස්සනාවෙන් නිමිත්තද, අප්පහිතානුපස්සනාවෙන් තෘෂ්ණා ප්‍රණිධියද, සුඤ්ඤතානුපස්සනාවෙන් මමයයි ගැනීමද, අධිපඤ්ඤා ධම්ම විපස්සනාවෙන් රාගවශයෙන් ආදීනවානුපස්සනාවෙන් ආලය වශයෙන් ගැනීමද, පටිසංඛානුපස්සනාවෙන් අනිත්‍යාදි වශයෙන් නොදැනීමද, විවට්ටානුපස්සනාවෙන් සංඤ්ඤාවශයෙන් මෙනෙහි කිරීමද සොවාන් මාර්ගයෙන් දෘෂ්ටිය ඇති ක්ලේශයන්ද, සකෘදාගාමී මාර්ගයෙන් ඖදාරික ක්ලෙශයන්ද අනාගාමි මාර්ගයෙන් තුනීවූ

කෙලෙස්ද, රහත් මගින් සියලු කෙලෙස්ද, සංවර කිරීම් අර්ථයෙන් සීල නම් වේ. නොඉක්වීම් අර්ථයෙන් සීල නම් වේ.

42. සීල පසකි. ප්‍රාණඝාතයාගේ පහ කිරීම සීලයකි. වෙන්වීම සීලයකි, චෙතනාව සීලයකි. සංවරය සීලයකි. නොයික්මීම සීලයකි, මෙවැනි සීලයෝ චිත්තයාගේ නොපසුතැවීම පිණිස නොපවතිත්. ප්‍රමොදය පිණිස පවතිත්, ප්‍රීතිය පිණිස පවතිත්, සංසිඳීම පිණිස පවතිත්, සතුට පිණිස පවතිත්, නැවත නැවත සෙවනය පිණිස පවතිත්. වැඩීම පිණිස පවතිත්, බොහෝ කොට කිරීම පිණිස පවතිත්, අලංකාරය පිණිස පවතිත්, ක්ෂය වීම පිණිස පවතිත්, පිරිවර පිණිස පවතිත්, සම්පූර්ණවීම පිණිස පවතිත්. එකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස, අවබොධය පිණිස නිවන් පිණිස, පවතිත්. මෙබඳු සීලයන්ගේ සංවරයෙන් පිරිසිදුවීම අධිසීලයයි.

43. සංවර පාරිසුද්ධියෙහි පිහිටි සිත නොවිසිරයයි නොවිසිරයාමෙන් පිරිසිදුවීම අධිචිත්තයයි සංවර පාරිසුද්ධිය මනාව දකියි. අවික්ඛෙපපාරිසුද්ධිය මනාව දකියි. දස්සන පාරිසුද්ධිය අධිප්‍රඥායි. ඒ සංවර සීලයෙහි යම් සංවර ස්වභාවයක් වේද, මෙය අධිසීල ශික්ෂා නමි. ඒ සංවරයෙහි යම් නොවිසිරයාම් ස්වභාවයක් වේද, මෙය අධිචිත්ත ශික්ෂා නමි. ඒ සංවර සීලයෙහි යම් දැකීම් ස්වභාවයක් වේද, මෙය අධිප්‍රඥා ශික්ෂා නමි. මේ ත්‍රිවිධ ශික්ෂාවන් මෙනෙහි කරමින් හික්මෙයි දැනගනිමින් හික්යෙයි. දකිමින් හික්මෙයි. ප්‍රත්‍යවෙක්ෂ කරමින් හික්මෙයි සිත පිහිටුවමින් හික්මෙයි, ශ්‍රද්ධාවෙන් බැස ගනිමින් හික්මෙයි වීර්යයෙන් ඔසවමින් හික්මෙයි. සිහිය එළවමින් හික්මෙයි. සිත එකඟ කරමින් හික්මෙයි. නුවණින් දැනගනිමින් හික්මෙයි. දතයුත්ත දනිමින් හික්මෙයි. පහ කටයුත්ත පහකරමින් හික්මෙයි. වැඩිය යුත්ත වඩමින් හික්මෙයි. ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි. පඤ්චසීලයන් හික්මෙයි. හොරකම් කිරීමද, කාම මිථ්‍යාචාරයද, මුසාවාදයද, කේලාම් කීමද, එරුෂ වචන කීමද, ප්‍රලාප කීමද, දැඩි ලොභයද, ව්‍යාපාදයද, මිථ්‍යාදෘෂ්ටියද, නික්මීමෙන් කාමච්ඡන්දයද, මෛත්‍රියෙන්

ක්‍රොධයද, ආලොක සංඥාවෙන් ථිනමිද්ධයද, සමාධියෙන් උද්ධච්චයද, ධර්මයෙන් පිරිසිඳ දැනීමෙන් විචිකිච්ඡාවද, නුවණින් නොදැනීමද සතුටින් නොඇල්මද, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ද, ද්විතීයධ්‍යානයෙන් විතර්ක විචාරයන්ද, තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියද, චතුර්ථධ්‍යානයෙන් සැපදුක් දෙකද, ආකාශානඤ්චායතන සමාපත්තියෙන් රූප සංඥා පටිඝසංඥා නානත්ත සංඥාවද, විඤ්ඤානඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සංඥාවද, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤානඤ්චායතන සංඥාවද නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංවඥාවද, අනිත්‍ය සංඥාවෙන් නිත්‍යය සංඥාවද, දුක්ඛානුපස්සනාවෙන් සුඛ සංඥාවද, අනත්තානුපස්සනාවෙන් ආත්මසංඥාවද නිබ්බිදානුපස්සනාවෙන් නන්දියද, විරාගානුපස්සනානේ රාගයද, නිරොධානුපස්සනාවෙන් සමුදයද, පටිනිස්සග්ගානුපස්සනාවෙන් දැඩි කොට අල්වා ගැන්මද, ඛයානුපස්සනාවෙන් ඝන සංඥාවද, වයානුපස්සනාවෙන් කර්ම රැස්කිරීමද, විපරිණාමානුපස්සනාවෙන් ස්ථිරය යන සංඥාවද, අනිමිත්තානුපස්සනාවෙන් නිමිත්තද, අප්පහිතානුපස්සනාවෙන් තෘෂ්ණා ප්‍රණිධියද, සුඤ්ඤතානුපස්සනාවෙන් මමයයි ගැනීමද, අධිපඤ්ඤා ධම්ම විපස්සනාවෙන් රාග වශයෙන් ගැනීමද, යථාභූතඥාන දර්ශනයෙන් සම්මොහ වශයෙන් ගැනීමද ආදීනවානුපස්සනාවෙන් ආලය වශයෙන් ගැනීමද, පටිසංඛානුපස්සනාවෙන් අනිත්‍යාදි වශයෙන් නොදැක්මද, විවට්ටානුපස්සනාවෙන් සංයොගයන්ගෙන් ගැනීමද, ශ්‍රොතාපත්ති මාර්ගයෙන් දෘෂ්ටිය හා එක්ව පවත්නා ක්ලේශයන්ද, සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරික ක්ලේශයන්ද, අනාගාමි මාර්ගයෙන් තුනීවූ ක්ලෙශයන්ද, අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශයන්ද, පහකිරීම සීල නම්. වෙන්වීම සීල නම්, චෙතනාව සීල නම්, සංවරය සීල නම්, නොඉක්මවීම සීල නම්.

43. මෙබඳු සීලයෝ චිත්තයාගේ නොවිපිළිසර බව පිණිස පවතිත්, ප්‍රමොද්‍යය පිණිස පවතිත්, ප්‍රීතිය පිණිස පවතිත්, සංසිඳීම්

පිණිස පවතිත්, සොම්නස් බව පිණිස පවතිත්, සෙවනය පිණිස පවතිත්, වැඩීම පිණිස පවතිත්, බොහෝ කොට කිරීම පිණිස පවතිත්, අලංකාරය පිණිස පවතිත්, අවයව පිණිස පවතිත්, පිරිවර පිණිස පවතිත්, සම්පූර්ණවීම පිණිස පවතිත්, ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම් නිරොධය පිණිස, සංසිඳීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස පවතිත්. මෙවැනි සීලයන්ගේ සංවරයෙන් පිරිසිදුවීම අධිසීල නම්. සංවරයෙන් පිරිසිදුවීමෙහි පිහිටි සිත නොවිසිර යයි. නොවිසරයාමෙන් පිරිසිදුවීම අධිචිත්ත නම්. සංවරයෙන් පිරිසිදුවීම මනාව දක්නේය. සමාධියෙන් පිරිසිදුවීම මනාව දක්නේය. මනාව දැක්මෙන් පිරිසිදු වීම අධිපඤ්ඤා නම්. ඒ සංවර සීලයෙහි යම් සංවර ස්වභාවයක් වේද, මෙය අධිශීල ශික්ෂාවයි. ඒ සංවර සීලයෙහි යම් නොවිසිරයාම් ස්වභාවයක් වේද, මෙය අධිචිත්ත ශික්ෂාවයි. ඒ සංවර සීලයෙහි යම් දැකීම් ස්වභාවයක් වේද, මෙය අධිප්‍රඥා ශික්ෂාවයි.

**44.** මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජනා කිරීම වශයෙන් හික්මෙයි. දකිමින් හික්මෙයි. ප්‍රත්‍යවෙක්ෂා කරමින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධාවෙන් බැසගනිමින් හික්මෙයි, වීර්යයෙන් ඔසවමින් හික්මෙයි, සිහිය එළවමින් හික්මෙයි. සිත එකඟකිරීමෙන් හික්මෙයි. ප්‍රඥාවෙන් දනිමින් හික්මෙයි. විශිෂ්ට ඥානයෙන් දතයුත්ත දනිමින් හික්මෙයි. පිරිසිඳ දතයුත්ත පිරිසිඳ දනිමින් හික්මෙයි. දුරුකටයුත්ත දුරුකරමින් හික්මෙයි. වැඩියුත්ත වඩමින් හික්මෙයි. ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි. එය දැනීම් අර්ථයෙන් ඤාණය නම් වෙයි, ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම් වෙයි. එහෙයින් අසා සංවර වීමෙහි ප්‍රඥාව සීලමය ඤාණයයි කියනු ලැබේ.

**45.** කෙසේ නම් සංවර වී සිත එකඟ කිරීමේ ප්‍රඥාව සමාධි භාවනාමය ඤාණ නම් වේද, එක්සමාධියකි. සිතේ එකඟකමය, සමාධි දෙකකි. ලෞකිකසමාධිය ලෝකෝත්තර සමාධිය යනුයි. සමාධි තුනකි. විතර්ක සහිත විචාර සහිත සමාධිය, විතර්ක නැති විචාරය පමණක් ඇති සමාධිය, විතර්කයද නැති විචාරයද නැති සමාධියයි යනුයි, සමාධි සතරකි. හානභාගිය සමාධිය,

ඨිතිභාගිය සමාධිය විසෙසභාගිය සමාධිය නිබ්බෙධ භාගිය සමාධිය යනුයි. සමාධි පසකි. ප්‍රීතිය පැතිරගිය සමාධිය, සැපය පැතිරගිය සමාධිය, උපෙක්ෂාව පැතිරගිය සමාධිය, ආලෝකය පැතිරගිය සමාධිය, ප්‍රත්‍යවෙක්ෂාවට හෙතුවූ සමාධියයි. මෙසේ සමාධි පසකි. සමාධි සයකි. බුද්ධානුස්සති වශයෙන් සිතේ එකඟකම නම්වූ නොවිසිරයන සමාධිය, ධම්මානුස්සති වශයෙන් සිතේ එකඟකම නම්වූ නොවිසිරෙන සමාධිය සංඝානුස්සති වශයෙන් සිතේ එකඟකම නම්වූ නොවිසිරයන සමාධිය, සීලානුස්සති වශයෙන් සිතේ එකඟකම නම්වූ නොවිසිර යන සමාධිය, චාගානුපස්සනා වශයෙන් සිතේ එකඟකම නම්වූ නොවිසිර යන සමාධිය, දෙවතානුස්සති වශයෙන් සිතේ එකඟකම නම් නොවිසිර යන සමාධිය යන මේ සයයි. සමාධි සතකි. සමාධියෙහි දක්ෂබව, සමාධියට සමවැදීමේ දක්ෂබව, සමාධිය පැවැත්මෙහි දක්ෂබව, සමාධියෙන් නැගිටීමෙහි දක්ෂබව, සමාධියගේ යහපත් බවෙහි දක්ෂබව, සමාධියගේ ආරම්මණයන්හි දක්ෂබව, සමාධිය එළවීමෙහි දක්ෂබව, යන මොහුය. සමාධි අටකි. පඨවි කසින වශයෙන් (i) සිතේ එකඟකම අවික්ෂෙප සමාධිය, (ii) අපො කසිණ වශයෙන් (මේ ඡෙදයේ (i) යොදනු) තෙජොකසිණ වශයෙන්ද (i) යොදනු) වායොකසිණ වශයෙන් (i) යොදනු) නීලකසිණ වශයෙන් (i) යොදනු) පීතකසිණ වශයෙන් (i) යොදනු) ලොහිතකසිණ වශයෙන් (i) යොදනු) ඔදාතකසිණ වශයෙන් (i) යොදන්න) සිතේ එකඟකම නම්වූ අවික්ෂෙප සමාධිය යන මොහුයි.

**46.** සමාධි නවයකි. රූපාවචරවූ හීන සමාධියක් ඇත්තේය. මධ්‍යම සමාධියක් ඇත්තේය. ප්‍රණීතවූ සමාධියක් ඇත්තේය. අරූපාවචරවූ හීන සමාධියක් ඇත්තේය. මධ්‍යම සමාධියක් ඇත්තේය ප්‍රණීත සමාධියක් ඇත්තේය. සුඤ්ඤත සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධිය යන මොහුය. සමාධි දසයකි. උද්ධුමාතකසඤ්ඤා වශයෙන් සිතේ එකඟබවවූ නොවිසිර යන්නාවූ, විනීලකසඤ්ඤා වශයෙන්, විපුබ්බකසඤ්ඤා වශයෙන්, විච්ඡිද්දක සඤ්ඤා වශයෙන්, වික්ඛායිතකසඤ්ඤා

වශයෙන්, වික්ඛිත්තකසඤ්ඤා වශයෙන්, හතවික්ඛිත්තකසඤ්ඤා වශයෙන්, ලොහිතකසඤ්ඤා වශයෙන්, පුලවක සඤ්ඤා වශයෙන්, අට්ඨික සඤ්ඤා වශයෙන් සිතේ එකඟබව නම් වූ අවික්ෂේප සමාධිය යන මොහුයි. මේ පස්පනස් සමාධියයි.

47. තවද සමාධියගේ සමාධි අර්ථයෝ පස්විස්සකි. වැළඳ ගැනීම් අර්ථයෙන් සමාධි වේ. පරිවාරාර්ථයෙන් සමාධි නමි. සම්පූර්ණවීම් අර්ථයෙන් සමාධි නමි. එක් අරමුණක් ඇති අර්ථයෙන් සමාධි නමි. නොවිසිරයාම් අර්ථයෙන් සමාධි නමි. නොදිවීම් අර්ථයෙන් සමාධි නමි. නොකැළඹීම් අර්ථයෙන් සමාධි නමි. කම්පා නොවීම් අර්ථයෙන් සමාධි නමි. විශේෂයෙන් මිදීම් අර්ථයෙන් සමාධි නමි. එක් අරමුණෙක්හි සිටීම් වශයෙන් සිතේ පිහිටි බව වන හෙයින් සමාධි නමි. සමව සොයානුයි සමාධි නමි. විසමව නොසොයානුයි සමාධිනමි, සමව සොයනලද බැවින් සමාධි නමි. විසමව නොසොයනලද බැවින් සමාධි නමි. සමව ගන්නා හෙයින් සමාධි නමි. විසමව නොගන්නා හෙයින් සමාධි නමි. සමව ගන්නා ලද හෙයින් සමාධි නමි. විසමව නොගන්නා ලද හෙයින් සමාධි නමි. සමව පිළිපදිනුයි සමාධි නමි. විසමව නොපිළිපදිනුයි සමාධි නම්වේ. සමව පිළිපන් බැවින් සමාධි නම්වේ. විසමව නොපිළිපන් හෙයින් සමාධි නමි. සමව සිතනහෙයින් සමාධි නම්වේ. විසමව නොසිතන හෙයින් සමාධි නම් වේ. සමව සිතන ලද බැවින් සමාධි නම් වේ. විසමව නොසිතන ලද බැවින් සමාධි නම් වේ. සමවූ හිත සුව ඇති බැවින් සමාධි නම් වේ. මෙසේ සමාධියගේ සමාධි අර්ථයෝ පස්විස්සකි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් සංවරවී සමාධි වැඩීමේ ප්‍රඥාව සමාධි භාවනාමය ඤාණයයි කියනු ලැබේ.

48. කෙසේ නම් ප්‍රත්‍ය ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණය වේද? අවිද්‍යාව සංස්කාරයන්ගේ ඉපදීමට හෙතුවද, පැවැත්මට හේතුවද, නිමිත්ත නම් හේතුවද, ව්‍යාපාර හේතුවද, සම්බන්ධ කිරීමේ හේතුවද, බැඳීමේ හේතුවද, මූල හේතුවද උපස්ථම්භක හේතුවද වෙයි

මේ නව ආකාරයෙන් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාර ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝ’යි. මේ ධර්ම දෙක ප්‍රත්‍ය ප්‍රත්‍යසමුත්පන්න ධර්මයෝ යයි පිරිසිඳ දැනගන්නාවූ ප්‍රඥාව ධර්මස්ථිති ඥානයයි. අතීත කාලයෙහිද, අනාගත කාලයෙහිද, අවිද්‍යාව සංස්කාරයන්ගේ (ii) ඉපදීමට හේතුවද, පැවැත්මට හේතුවද, නිමිත්ත නම් හේතුවද ව්‍යාපාර හේතුවද සම්බන්ධ හේතුවද, බැඳීම් හේතුවද මූල හේතුවද, උපස්තම්භ හේතුවද වෙයි. මේ නව ආකාරයෙන් අවිද්‍යාව ප්‍රත්‍ය වේ.

**49.** සංස්කාරයෝ ප්‍රත්‍යයෙන් උපන්නෝ’ය, (ii) මේ ධර්මදෙක ප්‍රත්‍යය සමුත්පන්නයයි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නයන් පිරිසිඳ දැනගන්නා ප්‍රඥාව ධම්මට්ඨිතිඤාණයයි. (iii) සංස්කාරයෝ විඤ්ඤාණයෝ (48 (ii) යොදාගත යුතුයි) මේ නව ආකාරයෙන් සංස්කාර ප්‍රත්‍යය වේ. (මෙහි (ii) යොදාගත යුතුයි.) විඤ්ඤාණය නාමරූපයාගේ (48 (ii) යොදන්න) මේ නව ආකාරයෙන් විඤ්ඤාණය ප්‍රත්‍යයවේ. (මෙහි (ii) නාමරූපය සළායතනයාගේ (48 (ii) මේ නව ආකාරයෙන් නාමරූපය ප්‍රත්‍යවේ. (මෙහි (ii) සළායතනය ස්පර්ශයාගේ (48 (ii) මේ නව ආකාරයෙන් සළායතනය ප්‍රත්‍යයවේ. (මෙහි (ii) ස්පර්ශය වේදනාවගේ (48 (ii) මේ නව ආකාරයෙන් ස්පර්ශය ප්‍රත්‍යයවේ. (මෙහි (ii) වෙදනාව තණ්හාවගේ (48 (ii) මේ නව ආකාරයෙන් වෙදනාව ප්‍රත්‍යය වේ. (මෙහි (ii) ) තණ්හාව උපාදානයාගේ (48 (ii) මේ නව ආකාරයෙන් තණ්හාව ප්‍රත්‍යයවේ. (මෙහි (ii) උපාදානය භවයාගේ (48 (ii) ) මේ නව ආකාරයෙන් උපාදානය ප්‍රත්‍යයවේ. මෙහි (ii) භවය ජාතියගේ (48 (ii) මේ නව ආකාරයෙන් භවය ප්‍රත්‍යයවේ. මෙහි (ii) ජාතිය ජරාමරණ දෙකට ඉපදීම් හේතුවද, පැවැත්මට හේතුවද, නිමිත්ත නම් හේතුවද, ව්‍යාපාර හේතුවද, සම්බන්ධ හේතුවද, බැඳීම් හේතුවද, උපස්තම්භක හේතුවද, ප්‍රත්‍යය හේතුවද, වෙයි. මේ නව ආකාරයෙන් ජාතිය ප්‍රත්‍යයවේ. ජරාමරණ ප්‍රත්‍යයෙන් උපන්නෝ’ය. මේ ධර්ම දෙක ප්‍රත්‍යයෙන් උපන්නෝ’යයි ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නයන් පිරිසිඳ දැනගන්නා ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි. අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද ජාතිය ජරා මරණ දෙක ඉපදීමේ හේතුවද පැවැත්මේ හේතුවද නිමිත්ත

නම් හේතුවද යන මේ නව ආකාරයෙන් ජාතිය ප්‍රත්‍ය නමි. ජරාමරණය ප්‍රත්‍යයොත්පන්න නමි. අවිද්‍යාව හෙතුවයි. සංස්කාරයෝ හෙතුවෙන් උපන් ධර්මයෝයි මේ ධර්ම දෙකම හෙතුවෙන් උපන් ධර්මයෝයයි ප්‍රත්‍යයන් පිරිසිඳ දැනගන්නාවූ ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි. මේ ධර්ම දෙක ප්‍රත්‍යයෙන් හටගත්තෝයයි පිරිසිඳ දැනගන්නා ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි. අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද අවිද්‍යාව හෙතුවය.

**50.** සංස්කාරයෝ හෙතුවෙන් උපන් ධර්මයෝය (ii) මේ ධර්ම දෙක හෙතුව හා හේතුවෙන් උපන් ධර්මයෝයි ප්‍රත්‍යයෙන් පිරිසිඳ දැනගන්නා නුවණ ධර්ම ස්ථිති ඥාන යයි (iii) සංස්කාරයෝ හෙතුවය විඤ්ඤාණය හෙතුවෙන් උපන්නේයයි මෙහි (ii) යොදන්න) විඤ්ඤාණය හෙතුවය නාමරූපය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) සළායතනය හෙතුවය. ඵස්සය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) ඵස්සය හෙතුවය වෙදනාව හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) වෙදනාව හෙතුවය. තණ්හාව හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) තණ්හාව හෙතුවය. උපාදානය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) උපාදානය හෙතුවය. භවය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) භවය හෙතුවය ජාතිය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) ජාතිය හෙතුවය. ජරාමරණය හෙතුවෙන් උපන්නේයයි (මෙහි (ii) මේ ධර්ම දෙක හෙතුව හා හේතුවෙන් උපන් ධර්මයෝයයි ප්‍රත්‍යය පිරිසිඳ දැනගන්නා නුවණ ධම්මට්ඨිති ඤාණයයි අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද ජාතිය හෙතුවය ජරාමරණ හෙතුවෙන් උපන්නේය. ධර්ම දෙකම හෙතුවෙන් උපන් ධර්මයෝයයි ප්‍රත්‍යයන් පිරිසිඳදැනගන්නා ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි.

**51.** අවිද්‍යාව නිසා හටගන්නාවූ සංස්කාරයෝ පටිච්ච සමුප්පන්නයෝය (ii) මේ ධර්ම දෙක පටිච්ච සමුප්පන්නයෝයයි ප්‍රත්‍යය පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි (iii) අතීත කාලයෙහිද, අනාගත කාලයෙහිද සංස්කාරයෝ අවිද්‍යාව නිසා හටගන්නාහුය (මෙහි (ii) යොදන්න) සංස්කාරයන් නිසා විඤ්ඤාණය පටිච්ච

සමුප්පන්නයි (මෙහි (ii) යොදන්න) විඤ්ඤාණ නිසා නාමරූපය පටිච්චසමුප්පන්නයි ( (ii) යොදන්න) නාමරූප නිසා සළායතනය පටිච්චසමුප්පන්නයි ( (ii) යොදන්න) සළායතනය නිසා ස්පර්ශය පටිච්චසමුප්පන්න වේ. (ii) යොදන්න) ස්පර්ශය නිසා වෙදනාව පටිච්චසමුප්පන්නවෙයි ( (ii) යොදන්න) වේදනාව නිසා තෘෂ්ණාව පටිච්චසමුප්පන්නවේ. ( (ii) යොදන්න) තෘෂ්ණාව නිසා උපාදානය පිරිසිඳ පටිච්චසමුප්පන්නවේ. (ii) යොදන්න) උපාදාන නිසා භවය පටිච්ච සමුප්පන්නවේ. (ii) යොදන්න) භවය නිසා ජාතිය පටිච්චසමුප්පන්න වෙයි. භවය නිසා ජරාමරණ පටිච්චසමුප්පන්න වෙයි ( (ii) යොදන්න) අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද ජාතිය නිසා ජරාමරණ පටිච්ච සමුප්පන්න වෙයි. ( (ii) යොදන්න) අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාරයෝ) ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝය ( (ii) යොදන්න) අතීත කාලයෙහිද අනාගතකාලයෙහිද අවිද්‍යාව ප්‍රත්‍යය සංස්කාරයෝ ප්‍රත්‍යයෙන් උපන්නාහ. ( (ii) යොදන්න) සංස්කාර ප්‍රත්‍යයන් විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් උපන්නාහ. ( (ii) යොදන්න) විඤ්ඤාණය ප්‍රත්‍යය නාමරූපය ප්‍රත්‍යයෙන් උපන්නේය, නාමරූපය ප්‍රත්‍යය සලායතනය ප්‍රත්‍යයෙන් උපන්නේය, සලායතන ප්‍රත්‍යය ස්පර්ශය ප්‍රත්‍යයෙන් උපන්නේය, ස්පර්ශය ප්‍රත්‍යය වෙදනාව ප්‍රත්‍යයෙන් උපන්නේය, වෙදනාව ප්‍රත්‍යය තණ්හාව ප්‍රත්‍යයෙන් උපන්නේය, තෘෂ්ණාව ප්‍රත්‍යය උපාදානය ප්‍රත්‍යයෙන් උපන්නේය, උපාදානය ප්‍රත්‍යය භවය ප්‍රත්‍යයෙන් උපන්නේය, භවය ප්‍රත්‍යය ජාතිය ප්‍රත්‍යයෙන් උපන්නේය. ජාතිය ප්‍රත්‍යය ජරා මරණ දෙක ප්‍රත්‍යයෙන් උපන්නේය. මේ ධර්ම දෙකම ප්‍රත්‍යයෙන් උපන්නාහයි ප්‍රත්‍යයෙන් පිරිසිඳ දන්නා ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද ජාතිය ප්‍රත්‍යය ජරාමරණ ප්‍රත්‍යයෙන් උපන්නේය. මේ ධර්ම දෙක ප්‍රත්‍යයෙන් උපන්නාහයි ප්‍රත්‍යයන් පිරිසිඳ දැනගන්නා ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි.

**52.** පූර්වකර්ම භවයෙහි මොහය අවිද්‍යාවයි පූර්ව චෙතනා සංස්කාරයෝයි. නිකන්තිය තෘෂ්ණාවයි දැඩිකොට අල්වා ගැනීම උපාදානයයි චෙතනාව භවයයි පූර්ව කර්ම භවයෙහි මේ

ධර්මපස මේ භවයෙහි ප්‍රති සන්ධියට ප්‍රත්‍යයෝයි. මෙහි ප්‍රතිසන්ධියවූ විඤ්ඤාණයයි. මවුගැබට පිවිසීම නාමරූපයයි. ප්‍රසාදය ආයතනයි ස්පර්ශ කිරීම ස්පර්ශයයි. විඳීම් වෙදනායි. උප්පත්ති භවයෙහි මේ ධර්මපස පෙර කරණලද කර්මයාගේ ප්‍රත්‍යයෙන් පවත්නාහුය. මෙහි ආයතනයන් මූකල පුද්ගලයා විසින් කර්ම රැස් කිරීමෙහි මොහය අවිද්‍යාවයි. පූර්ව චෙතනා සංස්කාරයෝයි. නිකන්තිය තෘෂ්ණාවයි. දැඩිව අල්වා ගැනීම උපාදානයයි. චෙතනාව භවයයි. මේ කර්ම භවයෙහි මේ ධර්මපස මතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයෝයි. මතු භවයෙහි ප්‍රතිසන්ධිය විඤ්ඤාණයයි. මවුකුසට බැස ගැනීම නාම රූපයයි. ප්‍රසාදය ආයතනයයි. ස්පර්ශ කිරීම ඵස්සයයි. විඳීම වෙදනායි මේ ධර්මපස මතු උපදින භවයෙහි මෙහි කරණ ලද කර්මයාගේ ප්‍රත්‍යයෙන් වෙත් මෙසේ මේ සංක්ෂෙප සතරක් ඇත්තාවූද කාලතුනක් ඇත්තාවූද විසි ප්‍රකාරයක් ඇත්තාවූද, සන්ධිතුනක් ඇත්තාවූද, පටිච්චසමුප්පාදය දනියි දකියි දැනගන්නා ලද්දක්කොට ප්‍රතිවෙධකරයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම් වෙයි. ප්‍රකාරයෙන් දන්නා අර්ථයෙන් ප්‍රඥා නම්වෙයි. එහෙයින් ප්‍රත්‍යයන් පිරිසිඳ දැනගන්නා ඥානය පච්චයට්ඨිති ඤාණයයි කියනු ලැබේ.

53. කෙසේ අතීත අනාගත වර්තමාන ධර්මයන් ලුහුඬු කොට පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව සම්මර්ශන ඥාන නම් වේද? ආධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖළාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සන්තිකවූ හෝ අතීතානාගත වර්තමාන යම්කිසි රූපයක්වේද, ඒ සියලු රූපය (ii) අනිත්‍යය වශයෙන් මෙනෙහි කරයි. මෙය එක් සම්මර්ශනයකි. දුක් වශයෙන් මෙනෙහිකරයි. මෙය එක් සම්මර්ශනයකි. අනාත්ම වශයෙන් මෙනෙහිකරයි. මෙය එක් සම්මර්ශනයකි. (iii) යම්කිසි වෙදනාවක් වේද ඒ සියලු වේදනා (මෙහි (ii) යොදන්න) යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥා (මෙහි (ii) යොදන්න) යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාරයෝ (මෙහි (ii) යම්කිසි අතීත අනාගත වර්තමානවූ ආධ්‍යාත්මිකවූද බාහිරවූද ඖළාරිකවූද සුඛුමවූද හීනවූද ප්‍රණීතවූද දුරවූද සන්තිකවූද යම්කිසි

විඤ්ඤාණයක් වේද ඒ සියලු විඤ්ඤාණය (මෙහි (ii) යොදන්න) අතීතානාගත වර්තමාන ඇස (මෙහි (ii) යොදන්න) අතීතානාගත ප්‍රත්‍යුත්පන්න ජරාමරණය මේ සම්මර්ශනයකි. (54 ඡේදයේ ඒ ඒ වචන ඉදිරියේ 'අතීත අනාගත වර්තමානවූ' යන වචන යෙදිය යුතුයි.)

54. අතීත අනාගත වර්තමානවූ රූපය (ii) ක්ෂයවන අර්ථයෙන් අනිත්‍යය බියට හෙතුවන අර්ථයෙන් දුකය, ආත්මසාරයක් නැති බැවින් අනාත්මයයි සංක්ෂෙපකොට මෙනෙහි කරන ප්‍රඥාව සම්මර්ශන ඥානයයි (iii) - වෙදනාව, (මෙහි (ii) - සංඥාව (මෙහි ii) - සංස්කාරයන් (මෙහි ii) - විඤ්ඤාණය (මෙහි ii) - ඇස (මෙහි ii) - කණ (මෙහි ii) - නාසය (මෙහි ii) - දිව (මෙහි ii) - කය (මෙහි ii) - සිත (මෙහි ii) - ජරාමරණය (මෙහි ii)

අතීතානාගත වර්තමාන රූපය (ii) අනිත්‍යය ප්‍රත්‍යයෙන් කරන ලද්දේය. ප්‍රත්‍යය නිසා උපන්නේය, ක්ෂය වන ස්වභාවය ඇත්තේය, විනාශවන ස්වභාවය ඇත්තේය, නොඇලියයුතු ස්වභාවය ඇත්තේය, නිරුද්ධ වන ස්වභාවය ඇත්තේයයි සංක්ෂේපකොට මෙනෙහි කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි (iii) (මෙහි වචන මුලට 'අතීතානාගත වර්තමාන' යන වචන යෙදිය යුතුයි.) වෙදනාව (මෙහි ii) - සංඥාව (මෙහි ii) - සංස්කාරයන් (මෙහි ii) - විඤ්ඤාණය (මෙහි ii) - ඇස (මෙහි ii) - කණ (මෙහි ii) - නාසය (මෙහි ii) - දිව (මෙහි ii) - කය (මෙහි ii) - සිත (මෙහි ii) - ජරාමරණය (මෙහි ii) යොදන්න)

55. ජාතිය නිසා ජරාමරණවෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ (ii) නැතැයි සංක්ෂෙපකොට මෙනෙහි කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයි (iii) අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද ජාතිය නිසා ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ (මෙහි ii) යොදන්න) භවය නිසා ජාතියවෙයි. භවය නැති කල්හි ජාතිය (මෙහි ii) - උපාදානය නිසා භවයවෙයි. උපාදානය නැති කල්හි භවය (මෙහි ii) - තෘෂ්ණාව නිසා උපාදානයවෙයි. තෘෂ්ණාව නැති කල්හි උපාදානය (මෙහි ii) - වෙදනාව නිසා තෘෂ්ණාවවෙයි වෙදනාව නැති කල්හි තෘෂ්ණාව (මෙහි ii) -

ස්පර්ශය නිසා වෙදනාවවෙයි. ස්පර්ශය නැති කල්හි වෙදනාව (මෙහි ii) - සළායතනය නිසා ස්පර්ශයවෙයි. සළායතනය නැති කල්හි (මෙහි ii) - නාමරූපය නිසා සළායතනය වෙයි. නාම රූපය නැති කල්හි සලායතනය (මෙහි ii) - විඤ්ඤාණය නිසා නාම රූපවෙයි විඤ්ඤාණය නැතිකල්හි නාමරූප (මෙහි ii) - සංස්කාරය නිසා විඤ්ඤාණයවෙයි. සංස්කාරය නැති කල්හි විඤ්ඤාණය මෙහි (ii) - අවිද්‍යාව නිසා සංස්කාරයෝවෙත්. අවිද්‍යාව නැති කල්හි, සංස්කාරයෝ (මෙහි (ii) යොදන්න) අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද අවිද්‍යාව නිසා සංස්කාරයෝ වෙත්. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැතැයි සංක්ෂෙප කොට මෙනෙහි කිරීමේ ප්‍රඥාව සම්මර්ශනඥානයයි එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම අර්ථයෙන් ප්‍රඥානමි. එහෙයින් අතීතානාගත වර්තමාන ධර්මයන් සංක්ෂෙපකොට මෙනෙහි කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි කියනු ලැබේ.

**56.** කෙසේනම් වර්තමාන ධර්මයන්ගේ විපරිණාමය දන්නා ප්‍රඥාව උදයබ්බයානුපස්සනා ඤාණය වේද? උපන් රූපය වර්තමාන නමි. එම රූපයාගේ (ii) ඉපදීම් ලක්ෂණය උදය නමි. බිඳීම් ලක්ෂණය වය නමි. නැවත නැවත බැලීම ඤාණ නමි. (iii) උපන් වෙදනාව වර්තමාන නමි. ඒ වෙදනාවගේ (මෙහි (ii) යොදන්න.) උපන් සංඥාව වර්තමාන නමි. ඒ සංඥාවගේ (මෙහි (ii) ) උපන් සංස්කාරයෝ වර්තමාන නමි. ඒ සංස්කාරයන්ගේ (මෙහි (ii) ) උපන් විඤ්ඤාණය වර්තමාන නමි. ඒ විඤ්ඤාණයාගේ (මෙහි (ii) ) උපන් ඇස වර්තමාන නමි. ඒ ඇසේ (මෙහි (ii) ) උපන් කණ වර්තමාන නමි. ඒ කණේ (මෙහි (ii) ) උපන් නාසය වර්තමාන නමි. ඒ නාසයේ (මෙහි (ii) ) උපන් දිව වර්තමාන නමි. ඒ දිවේ (මෙහි (ii) ) උපන් කය වර්තමාන නමි. ඒ කයේ (මෙහි (ii) ) උපන් සිත වර්තමාන නමි. ඒ සිතේ (මෙහි (ii) ) උපන් භවය වර්තමාන නමි. ඒ භවයේ (මෙහි (ii) )

**57.** ස්කන්ධ පඤ්චකයාගේ (ii) ඉපදීම ලක්ෂණය දක්නේ කෙතෙක් ලක්ෂණ දකීද, බිඳීම දක්නේ කෙතෙක් ලක්ෂණ

දකීද? උදය හා වය දක්නේ කෙතෙක් ලක්ෂණ දකීද, ස්කන්ධ පඤ්චකයාගේ (ii) ඉපදීම දක්නේ ලක්ෂණ විසිපහක් දකියි. බිඳීම දක්නේ ලක්ෂණ විසිපහක් දකී. ඉපදීම හා බිඳීම දක්නේ ලක්ෂණ පණසක් දකී (iii) රූපස්කන්ධයාගේ (මෙහි (ii) යොදන්න.) වේදනාස්කන්ධයාගේ (මෙහි (ii) ) සංඥා ස්කන්ධයාගේ (මෙහි (ii) ) සංස්කාර ස්කන්ධයාගේ (මෙහි (ii) ) විඥාන ස්කන්ධයාගේ (මෙහි (ii) )

**58.** රූපස්කන්ධයාගේ (ii) ඉපදීම දක්නේ ලක්ෂණ පහක් දකී. බිඳීම දක්නේ ලක්ෂණ පහක් දකී. ඉපදීම හා බිඳීම දක්නේ ලක්ෂණ දසයක් දකී. (ii) වෙදනාස්කන්ධයාගේ (මෙහි (ii) ) සඤ්ඤා ස්කන්ධයාගේ (මෙහි (ii) ) සංස්කාර ස්කන්ධයාගේ (මෙහි (ii) ) විඥානස්කන්ධයාගේ (මෙහි (ii) )

**59.** රූප ස්කන්ධයාගේ ඉපදීම දක්නේ කවරනම් ලක්ෂණ පසක් දක්නේද? අවිද්‍යාව පහළවීම හෙතුකොටගෙන රූපයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ පහළවීම දකියි. තෘෂ්ණාව පහළවීම් හේතුකොටගෙන රූපයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයයාගේ පහළවීම් අර්ථයෙන් රූප ස්කන්ධයාගේ පහළවීම දකී. කර්මයාගේ පහළවීම් හෙතුකොටගෙන රූපයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයයාගේ පහළවීම් අර්ථයෙන් රූප ස්කන්ධයාගේ පහළවීම දකී. ආහාරයාගේ පහළවීම හෙතුකොටගෙන රූපයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයයාගේ පහළවීම් අර්ථයෙන් රූප ස්කන්ධයාගේ පහළවීම දකී. ඉපදීම් ලක්ෂණය දක්නේ ද රූපස්කන්ධයාගේ පහළවීමදකී. රූපස්කන්ධයාගේ ඉපදීම දක්නේ මේ ලක්ෂණ පස දකී.

**60.** බිඳීම දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාව නැතිවීමෙන් රූපයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යය නැතිවීම් අර්ථයෙන් රූපස්කන්ධයාගේ බිඳීම දකී. තෘෂ්ණාව නැතිවීමෙන් රූපයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යය නිරුද්ධවීම් අර්ථයෙන් රූපස්කන්ධයාගේ බිඳීම දකී. කර්මය නිරුද්ධ වීමෙන් රූපයාගේ නිරුද්ධිය වේයයි ප්‍රත්‍ය නිරුද්ධවීම් අර්ථයෙන් රූපස්කන්ධයාගේ බිඳීම දකී. ආහාරයාගේ නැතිවීමෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රූපයාගේ නිරුද්ධිය වේයයි ප්‍රත්‍යයයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් රූපස්කන්ධයාගේ බිඳීම දකී. විපරිණාම ලක්ෂණය දක්නේද රූපස්කන්ධයාගේ බිඳීම බලයි. රූපස්කන්ධයාගේ බිඳීම දක්නේ මේ ලක්ෂණ පස දකී. ඉපදීම හා බිඳීම දක්නේ මේ ලක්ෂණ දසය දකී.

**61.** වෙදනාස්කන්ධයාගේ පහළවීම් දක්නේ කිනම් ලක්ෂණ පසක් දකීද? අවිද්‍යාවගේ පහළවීම හෙතුකොට ගෙන වේදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් වේදනා ස්කන්ධයාගේ ඉපදීම දකී. තෘෂ්ණාවගේ පහළවීමෙන් වේදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළ වීම් අර්ථයෙන් වේදනාස්කන්ධයාගේ ඉපදීම් දකී. කර්මයාගේ පහළවීම හෙතුකොටගෙන වේදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයයාගේ පහළවීම් අර්ථයෙන් වෙදනා ස්කන්ධයාගේ ඉපදීම දකී. ස්පර්ශයාගේ පහළවීම හෙතුකොටගෙන වෙදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් වේදනා ස්කන්ධයාගේ ඉපදීම දකී. ඉපදීම් ලක්ෂණය දක්නේද වෙදනා ස්කන්ධයාගේ පහළවීම දකී. වෙදනා ස්කන්ධයාගේ පහළවීම දක්නේ මේ ලක්ෂණ පස දකී.

**62.** බිඳීම දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාවගේ නැතිවීමෙන් වේදනාව නැතිවේයයි ප්‍රත්‍යය නැතිවීම් අර්ථයෙන් වෙදනා ස්කන්ධයාගේ බිඳීම දකී. තෘෂ්ණාවගේ නැතිවීමෙන් වේදනාව නැතිවේයයි ප්‍රත්‍යය නැතිවීම් අර්ථයෙන් වේදනාස්කන්ධයාගේ බිඳීම දකී. කර්මයාගේ නැතිවීමෙන් වේදනාව නැතිවේයයි ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් වේදනාස්ඛන්ධයාගේ බිඳීම දකී. ස්පර්ශයාගේ නැතිවීමෙන් වේදනාව නැතිවේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් වේදනා ස්කන්ධයාගේ බිඳීම් දකී. විපරිණාම ලක්ෂණය දක්නේද වේදනාස්කන්ධයාගේ බිඳීම දකී. වේදනා ස්කන්ධයාගේ බිඳීම දක්නේ මේ ලක්ෂණ පස දකී. ඉපදීම හා බිඳීම දක්නේ මේ ලක්ෂණ දසය දකී.

**63.** සඤ්ඤාස්කන්ධයාගේ ඉපදීම දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාව පහළවීම හේතුකොටගෙන සංඥා

ස්කන්ධයාගේ පහළවීමවේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංඥාස්කන්ධයාගේ පහළවීම දකී. තෘෂ්ණාවගේ පහළ වීමෙන් සඤ්ඤා ස්කන්ධයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංඥාස්කන්ධයාගේ ඉපදීම දකී. කර්මයාගේ පහළවීමෙන් සංඥාස්කන්ධයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංඥා ස්කන්ධයාගේ ඉපදීම දකී. ස්පර්ශයාගේ පහළවීම හේතුකොටගෙන සංඥාස්කන්ධයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම අර්ථයෙන් සංඥා ස්කන්ධයාගේ ඉපදීම දකී. ඉපදීම් ලක්ෂණය දක්නේද සඤ්ඤාස්කන්ධයාගේ ඉපදීම දකී. සඤ්ඤාස්කන්ධයාගේ ඉපදීම දක්නේ මේ ලක්ෂණ පස දකී.

බිඳීම දක්නේ කිනම් ලක්ෂණ පසක් දකීද? අවිද්‍යාවගේ නිරුද්ධවීමෙන් සඤ්ඤාස්කන්ධයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් සඤ්ඤාස්කන්ධයාගේ බිඳීම දකී. තෘෂ්ණාවගේ නැතිවීමෙන් සඤ්ඤාස්කන්ධයාගේ නැතිවීම වේයයි, ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් සඤ්ඤා ස්කන්ධයාගේ නිරුද්ධවීම අර්ථයෙන් සඤ්ඤාස්කන්ධයාගේ නැතිවීම දකී. කර්මයාගේ නැතිවීමෙන් සඤ්ඤාවගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීමෙන් සඤ්ඤාවගේ බිඳීම දකියි. ස්පර්ශයාගේ නැතිවීමෙන් සඤ්ඤාව නැතිවේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් වේදනාස්කන්ධයාගේ බිඳීම දකී. විපරිණාම ලක්ෂණය දක්නේද සඤ්ඤා ස්කන්ධයාගේ බිඳීම දකියි. සඤ්ඤාස්කන්ධයාගේ නැතිවීම දක්නේ මේ ලක්ෂණ පස දකී. ඉපදීම බිඳීම දක්නේ මේ ලක්ෂණ දශය දකී.

**64.** සංස්කාර ස්කන්ධයාගේ ඉපදීම දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාව පහලවීම හේතුකොටගෙන සංස්කාර ස්කන්ධයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළ වීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ පහළවීම දකී. තෘෂ්ණාවගේ පහළවීමෙන් සංස්කාරයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ පහළවීම දකී. කර්මයාගේ පහළවීමෙන් සංස්කාර ස්කන්ධයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ

ඉපදීම දකී. ස්පර්ශයාගේ පහළවීම හේතුකොටගෙන සංස්කාරයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ ඉපදීම දකි. ඉපදීම් ලක්ෂණය දක්නේ සංස්කාරයාගේ ඉපදීම දකී. සංස්කාර ස්කන්ධයාගේ ඉපදීම දක්නේ මේ ලක්ෂණ පසදකී. බිඳීම දක්නේ කිනම් ලක්ෂණ පසක් දකීද?

**65.** අවිද්‍යාවගේ නිරුද්ධ වීමෙන් සංස්කාර ස්කන්ධයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ බිඳීම දකී. තෘෂ්ණාවගේ නැතිවීමෙන් සංස්කාර ස්කන්ධයාගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් සංස්කාර ස්කන්ධයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් සංස්කාරයාගේ නැතිවීම දකී. කර්මයාගේ නැතිවීමෙන් සඤ්ඤාවගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීමෙන් සංස්කාරයාගේ බිඳීම දකි. ස්පර්ශයාගේ නැතිවීමෙන් සංස්කාරය නැතිවේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් වේදනා ස්කන්ධයාගේ බිඳීම දකී. විපරිනාම ලක්ෂණය දක්නේද සංස්කාර ස්කන්ධයාගේ නැතිවීම දකී. සංස්කාර ස්කන්ධයාගේ බිඳීම දක්නේ මේ ලක්ෂණ පස දකී. ඉපදීම බිඳීම දක්නේ මේ ලක්ෂණ දශය දකී.

**66.** විඥානස්කන්ධයාගේ ඉපදීම දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාව පහළවීම හෙතුකොටගෙන විඤ්ඤාණයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විඥාන ස්කන්ධයාගේ ඉපදීම දකී. තෘෂ්ණාවගේ පහළවීම හෙතුකොට ගෙන විඤ්ඤාණයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විඥානස්කන්ධයාගේ පහළවීම් දකී. කර්මයාගේ පහළවීමෙන් විඤ්ඤාණයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විඥානස්කන්ධයාගේ ඉපදීම දකී. නාමරූපයන්ගේ පහළවීමෙන් විඤ්ඤාණයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විඥාන ස්කන්ධයාගේ පහළවීම දකී. ඉපදීම් ලක්ෂණය දන්නේද විඥානස්කන්ධයාගේ ඉපදීම දකී. විඥාන ස්කන්ධයාගේ ඉපදීම දක්නේ මේ ලක්ෂණ පස දකී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බිඳීම දක්නේ, කිනම් ලක්ෂණ පසක් දකීද? අවිද්‍යාවගේ නිරුද්ධවීමෙන් විඤ්ඤාණයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීම් අර්ථයෙන් විඥාන ස්කන්ධයාගේ බිඳීම දකී. තෘෂ්ණාවගේ නැතිවීමෙන් විඤ්ඤාණයාගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් විඥානස්කන්ධයාගේ නැතිවීම දකී. කර්මයාගේ නැතිවීමෙන් විඤ්ඤාණයාගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීමෙන් විඥාන ස්කන්ධයාගේ බිඳීම දකියි. නාමය හා රූපයාගේ නැතිවීමෙන් විඤ්ඤාණයාගේ නැතිවීම වේයයි ප්‍රත්‍යයාගේ නැතිවීමෙන් විඥානස්කන්ධයාගේ බිඳීම දකී. විපරිණාම ලක්ෂණය දක්නේද විඥානස්කන්ධයාගේ බිඳීම දකියි. විඥානස්කන්ධයාගේ නැතිවීම දක්නේ මේ ලක්ෂණ පස දකී. ඉපදීම හා බිඳීම දක්නේ මේ ලක්ෂණ දසය දකී. ස්කන්ධ පඤ්චකයාගේ ඉපදීම දක්නේ මේ විසිපස් ලක්ෂණයෙන් දකී. බිඳීම දක්නේ මේ විසිපස් ලක්ෂණයෙන් දකී. ඉපදීම හා බිඳීම දක්නේ මේ පනසක් ලක්ෂණ දකී. මේ එයදැකීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එසේ හෙයින් ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ගේ විපරිණාමය දැක්මෙහි ප්‍රඥාව උදයබ්බයානුපස්සනාඤාණ නමැයි කියනු ලැබේ. රූපස්කන්ධය ආහාර නිසා හටගත්තේය. වෙදනා සංඥා සංස්කාර යන ස්කන්ධ තුන ස්පර්ශය නිසා උපදනාහ. විඥානස්කන්ධය නාමරූපය නිසා උපදනේය.

**67.** කෙසේ නම් ආරම්මණය උදය වය වශයෙන් දැක බිඳීම දැක්මෙහි ප්‍රඥාව විදර්ශනා ඥානය වේද? රූපය අරමුණු කොට ඇති (ii) සිත ඉපද බිඳෙයි. ඒ අරමුණ මෙනෙහි කොට ඒ චිත්තයාගේ බිඳීම නැවත නැවත බලයි. (iii) කෙසේ නැවත නැවත බලයිද? අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය වශයෙන් නොවේ. දුක්ඛ වශයෙන් බලයි. සැප වශයෙන් නොවෙයි අනාත්ම වශයෙන් බලයි, ආත්ම වශයෙන් නොවෙයි. කලකිරෙයි. සතුටු නොවෙයි වෙන් වෙයි, නොඇලෙයි, නැති කරයි, නොඋපදවයි, දුරුකරයි නොගනියි. අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍ය සංඥාව දුරු කරයි, දුක් වශයෙන් බලන්නේ, සැප සංඥාව දුරු කරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම

සංඥාව දුරු කරයි. කලකිරෙන්නේ තෘෂ්ණාව සතුට දුරු කරයි. නොඇලෙන්නේ රාගය දුරලයි. නැති කරන්නේ පහළවීම දුරු කරයි. අත් හරින්නේ ගැනීම දුරුකරයි. (iv) වේදනාව අරමුණුකොට ඇති (මෙහි (ii) යොදන්න) සංඥාව අරමුණු කොට ඇති (මෙහි (ii) සංස්කාරයන් අරමුණුකොට ඇති (මෙහි (ii) විඤ්ඤාණය අරමුණුකොට ඇති (මෙහි (ii) ඇස අරමුණුකොට ඇති (මෙහි (ii) ජරාමරණයන් අරමුණු කොට ඇති (මෙහි (ii) යොදන්න.)

"පළමු අරමුණෙන් අනෙක් අරමුණකට මාරුවීමද උදය ලක්ෂණය දක්නා ඥානය අත්හැර වය ලක්ෂණය දක්නා ඉපදවීමද එක් එක් ධර්මයක භංගය දැක ඒ භංගය අරමුණු කොට ඇති චිත්තයාගේද භංගය දැකීම පිණිස අනතුරුවම මෙනෙහි කළ හැකි බවද යන තුන ආරම්මණ පටිසංඛා භංගානුපස්සනා නමි.

"ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නාලද අරමුණට අනුව අතීත අනාගත ධර්මයන්ගේ භංගයද සමාන කොට මෙනෙහි කිරීමද ඒ භංග සංඛ්‍යාත නිරොධයට නැඹුරුව පැවැත්මද යන මේ තුන වය ලක්ඛණ විපස්සනා නමි.

"රූපාදි ආරම්මණ දැක ඒ ආරම්මණයාගේ භංගයද එය අරමුණුකොට ඇති චිත්තයාගේ භංගයද නැවත නැවත බලයි. එසේ භංගය දක්නාහට නාම රූප ධර්මයන්ගේ භංගයම දැක්මෙන් ශූන්‍යතාව වැටහෙයි. මේ තුන අධිපඤ්ඤා විපස්සනා නමි.

"අනිච්චානුපස්සනාදි ත්‍රිවිධ අනුපස්සනාවන්හි දක්ෂවූද නිබ්බිදානුපස්සනාදි සතර අනුපස්සනාවන්හි දක්ෂවූද මහණ තෙම ක්ෂය වශයෙන් ව්‍යය වශයෙන් ශූන්‍යතා වශයෙන් යන ත්‍රිවිධ උපට්ඨානයෙහි දක්ෂතාවයෙන් නොයෙක් දෘෂ්ටීන් කරණකොටගෙන කම්පා නොවෙයි."

එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් පළමු අරමුණ දැක භංගය දැක්මෙහි ප්‍රඥාව විදර්ශනා ඥානයයි කියනු ලැබේ.

**68.** කෙසේ නම් භය වශයෙන් වැටහීමේ පවත්නා නුවණ ආදීනව ඥාණය වන්නේද? ඉපදීම (ii) භයකැයි භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥාන නම් (iii) පැවැත්ම (මෙහි (ii) යොදන්න) සංස්කාරනිමිත්ත (මෙහි (ii) යොදන්න) කර්ම රැස්කිරීම (මෙහි ii) - ප්‍රතිසන්ධිය (මෙහි ii) - ගතිය (මෙහි ii) - ස්කන්ධයන්ගේ පහළවීමද (මෙහි ii) - විපාකයන්ගේ පහළවීම (මෙහි ii) - ජාතිය (ඉපදීම) මෙහි ii) ජරාව (මෙහි ii) - ව්‍යාධිය (මෙහි ii) - මරණය (මෙහි ii) - ශෝකය (මෙහි ii) - හැඬීම - (මෙහි ii) දැඩි වෙහෙස - (මෙහි ii)

**69.** නොඉපදීම (ii) අභය යයි සංසිඳීමට ස්ථානවූ නිවණෙහි ඥානය (මෙහි (ii) ) නොපැවැත්ම (මෙහි (ii) ) යෙදිය යුතුයි.

(මෙහි පහත දක්වන වචන අගට (69 (ii) යොදන්න) නොපැවැත්ම-, සංස්කාර නිමිත්ත නොවීම-, කර්ම රැස් නොකිරීම-, ප්‍රතිසන්ධි නොවීම-, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළනොවීම-, විපාකයන්ගේ පහළ නොවීම-, ජාතිය (ඉපදීම) හටනොගැනීම-, ජරාවට නොයෑම-, ව්‍යාධියක් නොවීම-, අමරණීය බව-, සොකය නොමැති බව-, හැඬීමක් නැතිබව-, දැඩි වෙහෙස (උපායාස) රහිත බව-,

**70.** ඉපදීම භයය නොඉපදීම (ii) අභයයයි සංසිඳීම ස්ථානවූ නිවණෙහි ඥානය වෙයි (iii) (පහතදක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න) පැවැත්ම භයය, නොපැවැත්ම-, සංස්කාර නිමිත්ත භයය, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස්කිරීම භයය කර්ම රැස්නොකිරීම-, ප්‍රතිසන්ධිය භයය, අප්‍රතිසන්ධිය-, ගතිය භයය, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම භයය, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළවීම භයය, විපාකයන්ගේ පහළනොවීම-, ජාතිය (උත්පත්තිය) භයය, අජාතිය-, ජරාව භයය, අජරාව-, ව්‍යාධිය භයය, අව්‍යාධිය-, මරණය භයය, අමරණය-, සොකය භයය, අසොකය-, පරිදෙවය (හැඬීම) භයය, නොහැඬීම-, උපායාසය (දැඩි වෙහෙස) භයය, අනුපායාසය,

**71.** ඉපදීම (ii) දුකය යයි භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥාන නමි. (iii) (පහත දක්වන වචන අගට මෙහි (ii) යොදන්න.)

පැවැත්ම-, සංස්කාර නිමිත්ත-, කර්ම රැස්කිරීම-, ප්‍රතිසන්ධිය-, ගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම-, විපාකයන්ගේ පහළවීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශෝකය-, හැඬීම, දැඩි වෙහෙස (උපායාසය)-,

72. නොඉපදීම (ii) සැපයයි ශාන්ති පදය වූ නිවණෙහි නුවණයි. (iii) පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.)

නොපැවැත්ම-, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස්නොකිරීම, අප්‍රතිසන්ධිය-, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළනොවීම-, අජාතිය-, අව්‍යාධිය- අමරණය-, අශෝකය-, අපරිදෙවය (නොහැඬීම)-, අනුපායාසය-,

73. ඉපදීම දුකය නොඉපදීම (ii) සැපයයි ශාන්තිපදයවූ නිවණෙහි නුවණ (iii) පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න) පැවැත්ම දුකය, නොපැවැත්ම-, සංස්කාර නිමිත්ත දුකය අසංස්කාර නිමිත්ත-, කර්ම රැස්කිරීම දුකය, කර්ම රැස් නොකිරීම-, ප්‍රතිසන්ධිය දුකය, අප්‍රතිසන්ධිය-, ගතිය දුකය, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම දුකය, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළවීම දුකය. විපාකයන්ගේ පහළනොවීම-, ජාතිය දුකය, අජාතිය-, ජරාවදුකය, අජරාව-, ව්‍යාධියදුකය, අව්‍යාධිය-, මරණය, දුකය, අමරණය-, ශෝකය දුකය, අශෝකය-, පරිදෙවය (හැඬීම) දුකය, අපරිදෙවය-, උපායාසය (දැඩි වෙහෙස) දුකය, අනුපායාසය-,

74. ඉපදීම (ii) තෘෂ්ණා සහිතයයි භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥානනම්. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) පැවැත්ම-, සංස්කාර නිමිත්ත-, කර්ම රැස්කිරීම-, ප්‍රතිසන්ධිය-, ගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම-, විපාකයන්ගේ පහළවීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශෝකය-, හැඬීම, දැඩි වෙහෙස (උපායාසය)-,

75. නොඉපදීම (ii) ශාන්ති පදයවූ නිවණෙහි නුවණයි. (iii) පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) නොපැවැත්ම-, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස් නොකිරීම-, අප්‍රතිසන්ධිය-, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළ නොවීම-,

විපාකයන්ගේ පහළ නොවීම-, අජාතිය-, අව්‍යාධිය-, අමරණය-, අශොකය-, අපරිදෙවය-, (නොහැඬීම)-, අනුපායාසය-,

76. ඉපදීම තෘෂ්ණා සහිතය නොඉපදීම (ii) තෘෂ්ණා රහිතයයි ශාන්ති පදයවූ නිවණෙහි නුවණයි. (iii) (මෙහි පහත දක්වන වාක්‍ය අගට ( (ii) යොදන්න.) පැවැත්ම තෘෂ්ණා සහිතය, නොපැවැත්ම-, සංස්කාර නිමිත්ත තෘෂ්ණා සහිතය, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස් කිරීම තෘෂ්ණා සහිතය, කර්ම රැස් නොකිරීම-, ප්‍රතිසන්ධිය තෘෂ්ණා සහිතය, අප්‍රතිසන්ධිය-, ගතිය තෘෂ්ණා සහිතය, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම තෘෂ්ණා සහිතය, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළවීම තෘෂ්ණා සහිතය, විපාකයන්ගේ පහළ නොවීම-, ජාතිය තෘෂ්ණා සහිතය, අජාතිය-, ජරාව තෘෂ්ණා සහිතය, අජරාව-, ව්‍යාධිය තෘෂ්ණා සහිතය, අව්‍යාධිය-, මරණය තෘෂ්ණා සහිතය, අමරණය-, ශෝකය තෘෂ්ණා සහිතය, අශොකය-, පරිදෙවය (හැඬීම) තෘෂ්ණා සහිතය, අපරිදෙවය-, උපායාසය (දැඩි වෙහෙස) තෘෂ්ණා සහිතය, අනුපායාසය-,

77. ඉපදීම (ii) සංස්කාරයයි භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥාන නම්. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) පැවැත්ම-, සංස්කාර නිමිත්ත-, කර්ම රැස්කිරීම-ප්‍රතිසන්ධිය-, ගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම-, විපාකයන්ගේ පහළවීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශෝකය-, හැඬීම-, දැඩි වෙහෙස, (උපායාසය)-.

78. නොඉපදීම (ii) නිවණයයි. ශාන්ති පදයවූ නිවණෙහි නුවණයි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) නොපැවැත්ම-, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස් නොකිරීම-, අප්‍රතිසන්ධිය-, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළ නොවීම-, අජාතිය-, අව්‍යාධිය-, අමරණය-, අශොකය-, අපරිදෙවය (නොහැඬීම)-, අනුපායාසය-,

79. ඉපදීම සංස්කාරය, නොඉපදීම (ii) නිවණයයි ශාන්ති පදයවූ නිවණෙහි නුවණයි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) පැවැත්ම සංස්කාරය නොපැවැත්ම-, සංස්කාර නිමිත්ත සංස්කාරය, අසංස්කාර නිමිත්ත-, කර්ම රැස්

කිරීම සංස්කාරය, කර්ම රැස් නොකිරීම-, ප්‍රතිසන්ධිය සංස්කාරය, අප්‍රතිසන්ධිය-, ගතිය සංස්කාරය, නොගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම සංස්කාරය, ස්කන්ධයන්ගේ පහළ නොවීම-, විපාකයන්ගේ පහළවීම සංස්කාරය, විපාකයන්ගේ පහළ නොවීම-, ජාතිය සංස්කාරය, අජාතිය-, ජරාව සංස්කාරය, අජරාව-, ව්‍යාධිය සංස්කාරය, අව්‍යාධිය-, මරණය සංස්කාරය, අමරණය-, ශොකය සංස්කාරය, අශොකය-, පරිදෙවය (හැඬීම) සංස්කාරය, අපරිදෙවය-, උපායාසය (දැඩි වෙහෙස) සංස්කාරය, අනුපායාසය-,

**80.** ඉපදීමද පැවැත්මද නිමිත්තද කර්ම රැස් කිරීමද ප්‍රතිසන්ධියද දුකයයි දක්නේය. මෙය ආදීනව දක්නා ඥානය වේ. නොඉපදීමද නොපැවැත්මද අනිමිත්තද කර්ම රැස් නොකිරීමද ප්‍රතිසන්ධි නොගැනීමද සැපයයි දක්නේය. මෙය ශාන්ති පදයවූ නිවණෙහි නුවණයි. මේ ආදීනව ඤාණය ස්ථාන පසෙක්හි උපදී. ස්ථාන පසක ශාන්ති පදයෙහි ඥානය උපදියි. "මෙසේ යොගාවචරතෙම දශ ඥානයන්ගේ දක්ෂතාවයෙන් නොයෙක් දෘෂ්ටීන්හි කම්පා නොවේ.

**81.** එය දැනීම අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥානයයි කියනු ලැබේ. කෙසේනම් මිදෙනු කැමති භාවයෙන් පරීක්ෂා කොට මැදහත් වීමෙහි ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඤාණය වේද? ඉපදීමෙන් (ii) මිදෙනු කැමැත්තෙන් පරීක්ෂා කොට මැදහත්වීමෙහි ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඥාන නමි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) පැවැත්මෙන්-, නිමිත්තෙන්-, කර්ම රැස් කිරීමෙන්-, ප්‍රතිසන්ධියෙන්-, ගතියෙන්-, ස්කන්ධයන්ගේ පහළ වීමෙන්-, විපාකයන්ගේ පහළවීමෙන්-, ජාතියෙන්-, ජරාවෙන්-, ව්‍යාධියෙන්-, මරණයෙන්-, ශොකයෙන්-, හැඬීමෙන්-, දැඩි වෙහෙසින් (උපායාසයෙන්)-.

**82.** ඉපදීම (ii) දුකයයි මිදෙනු කැමැත්තෙන් පරීක්ෂා කොට මැදහත්වීමෙහි ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඤාණ නමි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.)

පැවැත්ම-, නිමිත්ත-, කර්ම රැස් කිරීම-, ප්‍රතිසන්ධිය-, ගතිය-, ස්කන්ධයන්ගේ පහළවීම-, විපාකයන්ගේ පහළ වීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශොකය-, හැඬීම-, දැඩි වෙහෙස (උපායාසය)-,

83. ඉපදීම (ii) භයයයි මිදෙනු කැමති ස්වභාවයෙන් ලක්ෂණ පරීක්ෂාකොට මැදහත්වීමෙහි ප්‍රඥාව සංඛාරුපෙක්ඛාඤාණ නමි. (iii) පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න) පැවැත්ම- නිමිත්ත- කර්ම රැස්කිරීම- ප්‍රතිසන්ධිය- ගතිය- ස්කන්ධයන්ගේ පහළවීම- විපාකයන්ගේ පහළවීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශොකය-, හැඬීම-, දැඩිවෙහෙස (උපායාසය)-

84. ඉපදීම (ii) තෘෂ්ණා සහිතයයි මිදෙනු කැමැති ස්වභාවයෙන් පරීක්ෂා කොට මැදහත් වීමේ ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. (iii) (මෙහි 83 ඡේදයේ සඳහන් වාක්‍ය අගට 84 (ii) යොදාගත යුතුයි.)

85. ඉපදීම (ii) සංස්කාරයයි මිදෙනු කැමති ස්වභාවයෙන් පරීක්ෂාකොට මැදහත්විමේ ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. (iii) (මෙහි 83 වෙනි ඡේදයේ සඳහන් වාක්‍ය අගට 85 (ii) යොදන්න.)

86. ඉපදීම (ii) සංස්කාරයෝයි ඒ සංස්කාරයන් මැදහත්ව බලානුයි සංඛාරුපෙක්ඛා නමි. යම් සංස්කාර කෙනෙක් වෙත්ද යම් උපෙක්ෂාවක් වෙයිද, ඒ දෙකම සංස්කාර නම් වෙත්. ඒ සංස්කාරයන් මැදහත්ව බලානුයි සංඛාරුපෙක්ඛා නමි. (iii) (මෙහි 83 වෙනි ඡේදයේ සඳහන් වාක්‍ය අගට 86 (ii) යොදන්න.)

87. කෙතෙක් ආකාරයකින් සංස්කාරොපෙක්ෂා ඥානයෙන් අන්සිතකට යොමුකරයිද? අට ආකාරයකින් සංස්කාරොපෙක්ෂා ඥානයෙන් අන් සිතකට යොමු කිරීම වෙයි. පෘථග්ජනයාහට කෙතෙක් ආකාරයකින් සංස්කාරොපෙක්ෂා ඥානයෙන් අන්සිතකට යොමු කිරීමවෙයිද? ශෛක්ෂයාහට කෙතෙක් ආකාරයකින් සංස්කාරොපෙක්ෂා ඥානයෙන් අන්සිතකට යොමුකිරීම වෙයිද? රහතන් වහන්සේට කෙතෙක් ආකාරයකින්

සංඛාරුපෙක්ඛා ඥානයෙන් අන්සිතකට යොමු කිරීමවේද? පෘථග්ජනයාහට දෙයාකාරයකින් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමුවීමවෙයි. ශෛක්ෂයාහට තුන් ආකාරයකින් සංඛාරුපෙක්ඛාඤාණයෙන් අන්සිතකට යොමු කිරීමවෙයි. රහතන් වහන්සේට තුන් ආකාරයකින් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමු කිරීම වෙයි.

පෘථග්ජනයාහට කිනම් දෙයාකාරයකින් සංඛාරුපෙක්ඛාඤාණයෙන් අන්සිතකට යොමුකිරීම වෙයිද? පෘථග්ජන තෙම සංඛාරුපෙක්ඛා ඤාණයට ඇලෙන්නේ හෝ වෙයි. එය විදර්ශනා කරන්නේ හෝ වෙයි. පෘථග්ජනයාහට මේ දෙයාකාරයෙන් අන්සිතකට යොමු කිරීමවෙයි. ශෛක්ෂයාහට කිනම් තුන් ආකාරයකින් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන් සිතකට යොමු කිරීම වේද? ශෛක්ෂතෙම සංඛාරුපෙක්ඛා ඤාණයට ඇලෙන්නේ හෝ වෙයි. එය විදර්ශනා කරන්නේ හෝ වෙයි. අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කොට ඵල සමාපත්තියට පැමිණෙන්නේ හෝ වෙයි. ශෛක්ෂයා හට මේ තුන් ආකාරයෙන් සංඛාරුපෙක්ඛා ඤාණය අන් සිතකට යොමු කිරීම වෙයි.

88. රහතන් වහන්සේට කිනම් තුන් ආකාරයකින් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමු කිරීම වේද? රහත් පුද්ගලතෙම සංඛාරුපෙක්ඛාඤාණය විදර්ශනා කරන්නේ හෝ වෙයි. අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කොට ඵලසමාපත්තියට පැමිණෙන්නේ හෝ වෙයි. එය මැදහත්ව බලා සුඤ්ඤතානුපස්සනා විහාරයෙන් හෝ අනිමිත්තානු පස්සනා විහාරයෙන් හෝ අප්පණිහිතානුපස්සනා විහාරයෙන් හෝ වාසය කරයි. රහත් පුද්ගලයාට මේ තුන් ආකාරයෙන් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමුවීම වෙයි.

89. කෙසේ නම් පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමුවීම සමානවේද? සංඛාරුපෙක්ඛා ඤාණයට ඇලෙන්නාවූ පෘථග්ජනයාගේ සිත කිලුටු වෙයි. භාවනාවට බාධාවෙයි, ප්‍රතිවෙධයට අන්තරායවෙයි, මතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයවෙයි. සංඛාරුපෙක්ඛා ඤාණයට

ඇලෙන්නාවූ ශෛක්ෂයාගේද සිත කිලිටි වෙයි. භාවනාවට බාධාවෙයි. ඉහළ මාර්ගඵල ප්‍රතිවෙධයට අන්තරායවෙයි, මතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යවෙයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයයෙන් අන්සිතකට යොමු කිරීම ඇලීම් ස්වභාවයෙන් සමාන බවට පැමිණෙයි.

**90.** කෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද රහත්හුගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමු කිරීම සමානවේද? පෘථග්ජනතෙම සංඛාරුපෙක්ඛා ඤාණය අනිත්‍ය වශයෙන්ද දුක්වශයෙන්ද අනාත්ම වශයෙන්ද විදර්ශනා කරයි. ශෛක්ෂ තෙමේද සංඛාරුපෙක්ඛාඤාණය අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද විදර්ශනා කරයි. අර්හත් පුද්ගල තෙමේද සංඛාරුපෙක්ඛා ඤාණය අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද මෙනෙහි කරයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන් සිතකට යොමුකිරීම නැවත නැවත බැලීම් ස්වභාවයෙන් සමාන බවට පැමිණෙයි.

**91.** කෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන් සිතකට යොමු කිරීම අසමාන වේද? පෘථග්ජනයාගේ සංඛාරුපෙක්ඛාව කුසල් වෙයි. ශෛක්ෂයාගේද සංඛාරුපෙක්ඛාව කුසල් වෙයි. අර්හත් පුද්ගලයාගේ සංඛාරුපෙක්ඛාව අව්‍යාකෘතවෙයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන් සිතකට යොමු කිරීම කුශල අව්‍යාකෘත ස්වභාවයෙන් අසමාන වෙයි. පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණය අසමානවේද? පෘථග්ජනයාගේ සංඛාරුපෙක්ඛාව කිසිකලෙක ප්‍රකටවෙයි. කිසිකලෙක ප්‍රකට නොවෙයි. ශෛක්ෂයාගේද සංඛාරුපෙක්ඛාව කිසිකලෙක ප්‍රකටවෙයි කිසිකලෙක ප්‍රකට නොවෙයි. අර්හත් පුද්ගලයාගේ සංඛාරුපෙක්ඛාව නිරතුරු ප්‍රකට වූයේම වෙයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමුවීම ප්‍රකටවීම් ස්වභාවයෙන් අසමාන වෙයි.

**92.** කෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඥාණයෙන් අන් සිතකට යොමුවීම අසමාන වේද? පෘථග්ජනතෙම විදර්ශනා අවසාන නොකළ හෙයින් සංඛාරුපෙක්ඛාව විදර්ශනා කරයි. ශෛක්ෂ තෙමේද විදර්ශනා කටයුතු අවසාන නොකළ හෙයින් සංඛාරුපෙක්ඛාව විදර්ශනා කරයි. අර්හත් පුද්ගලතෙම විදර්ශනා කටයුතු අවසාන කළ හෙයින් සංඛාරුපෙක්ඛාව විදර්ශනා කරයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේ අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඥාණයෙන් අන්සිතකට යොමුකිරීම අසමාන බවට පැමිණේ.

**93.** කෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඥාණයෙන් අන්සිතකට යොමු කිරීම අසමාන වේද? පෘථග්ජනතෙම සංඛාරුපෙක්ඛාව සංයෝජන තුනක් පහකිරීමෙන් සෝවාන් මාර්ගය ලැබීම පිණිස විදර්ශනා කරයි. ශෛක්ෂතෙම සංඛාරුපෙක්ඛාව සංයෝජන තුනක් පහකළ හෙයින් ඉහළ මාර්ග ඵල ලැබීම පිණිස විදර්ශනා කරයි. අර්හත් පුද්ගලතෙම සංඛාරුපෙක්ඛාව සියලු කෙලෙස් පහකළ හෙයින් ඉහාත්මයෙහි සැප විහරණය පිණිස විදර්ශනා කරයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඥාණයෙන් අන්සිතකට යොමුකිරීම කෙලෙස් පහකරණ ආකාරයෙන් අසමාන බවට පැමිණෙයි.

**94.** කෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඥාණයෙන් අන්සිතකට යොමු කිරීම අසමාන වෙයිද? පෘථග්ජන තෙම සංඛාරුපෙක්ඛාවට ඇලෙන්නේ හෝ වෙයි. එය විදර්ශනා කරන්නේ හෝ වෙයි. මෙනෙහි කරන්නේ හෝ වෙයි. ශෛක්ෂ තෙමේද සංඛාරුපෙක්ඛාවට ඇලෙන්නේ හෝ වෙයි. එය විදර්ශනා කරන්නේ හෝ වෙයි. මෙනෙහිකොට ඵල සමාපත්තියට සමවදින්නේ හෝ වෙයි, අර්හත් පුද්ගල තෙමේ සංඛාරුපෙක්ඛාව විදර්ශනා කරන්නේ වෙයි. මෙනෙහි කොට ඵල සමාපත්තියට සමවදින්නේ හෝ වෙයි. එය මැදහත්ව බලා සුඤ්ඤත විහාරයෙන් හෝ අනිමිත්ත විහාරයෙන් හෝ

අප්පණිහිත විහාරයෙන් හෝ වාසය කරන්නේ හෝ වෙයි. මෙසේ පෘථග්ජනයාගේද ශෛක්ෂයාගේද අර්හත් පුද්ගලයාගේද සංඛාරුපෙක්ඛා ඤාණයෙන් අන්සිතකට යොමු කිරීම විහාර සමාපත්තීන්ගේ ස්වභාවයෙන් අසමාන බවට පැමිණෙයි.

**95.** කෙතෙක් සංඛාරුපෙක්ඛාවෝ සමථ වශයෙන් උපදිත්ද, කෙතෙක් සංඛාරුපෙක්ඛාවෝ විපස්සනා වශයෙන් උපදිත්ද? සංඛාරුපෙක්ඛා අටක් සමථ වශයෙන් උපදිත්. සංඛාරුපෙක්ඛා දසයක් විපස්සනා වශයෙන් උපදිත්. කවර සංඛාරුපෙක්ඛා අටක් සමථ වශයෙන් උපදිත්ද? ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස නීවරණයන් මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින්නාවූ ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. ද්විතීයධ්‍යානය ලබනු පිණිස විතර්ක විචාරයන් මෙනෙහිකොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. තෘතීයධ්‍යානය ලබනු පිණිස ප්‍රීතිය මෙනෙහිකොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. චතුර්ථධ්‍යානය ලබනු පිණිස සුඛදුක්ඛයන් මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. ආකාසානඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස රූපසඤ්ඤාවද පටිඝ සඤ්ඤාවද නානත්තසඤ්ඤාවද මෙනෙහිකොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස ආකාසානඤ්චායතන සඤ්ඤාව මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාව මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නමි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව මෙනෙහිකොට මැදහත්ව සිටින ප්‍රඥාව පටිසංඛා ඤාණ නමි. මේ සංඛාරුපෙක්ඛා අට සමථ වශයෙන් උපදිත්.

**96.** කවර සංඛාරුපෙක්ඛා දසයක් විපස්සනා වශයෙන් උපදිත්ද? ශ්‍රොතාපත්ති මාර්ගයට පැමිණීම පිණිස (ii) ඉපදීමද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැවැත්ම නිමිත්තද කර්ම රැස්කිරීමද ප්‍රතිසන්ධියද ගතියද ස්කන්ධයන්ගේ පහළවීමද විපාකයන්ගේ පහළවීමද ජාතියද ජරාවද ව්‍යාධියද මරණයද සොකයද පරිදෙවයද උපායාසයද මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඥාණ නම්, (iii) සෝවාන් ඵලයට සමවැදීම පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි.) සකෘදාගාමී මාර්ගය ලබනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි.) සකෘදාගාමි ඵලයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි) අනාගාමි මාර්ගය ලබනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි) අනාගාමි ඵලයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි.) අර්හත් මාර්ගයට ලබනු පිණිස (මෙහි (ii) යොදන්න) අර්හත් ඵලයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි) සුඤ්ඤත විහාරයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදාගත යුතුයි.) අනිමිත්ත විහාරයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදන්න)

**97.** මේ සංඛාරුපෙක්ඛා දසය විපස්සනා වශයෙන් උපදිත්. කෙතෙක් සංඛාරුපෙක්ඛා කුසල් වෙත්ද කෙනෙක් අකුසල් වෙද්ද කෙතෙක් අබ්‍යාකත වෙද්ද? පසලොසක් සංඛාරුපෙක්ඛා කුසල් වෙත්. තුනක් සංඛාරුපෙක්ඛා අබ්‍යාකත වෙත්. අකුසල සංඛාරුපෙක්ඛාවක් නැත.

"යම් සංඛාරුපෙක්ඛා කෙනෙකුන් කරණකොටගෙන සිත උත්පාදාදිය කෙරෙන් වෙනස් වෙයිද සිතට අරමුණුවූ මෙනෙහි කිරීමෙන් මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාවයයි කියනලද ඒ සංඛාරුපෙක්ඛා අටක් වෙත්. පෘථග්ජනයාට දෙකක් අරමුණු වෙත්. ශෛක්ෂයාට තුනක් අරමුණුවෙත්. වීතරාගී පුද්ගලයාට තුනක් අරමුණු වෙත්.

"සමාධියට ප්‍රත්‍ය වන්නාවූ සංඛාරුපෙක්ඛා අටක් වෙත්. මාර්ගඵල ඥානයන්ට භූමිවන සංඛාරුපෙක්ඛා දසයක් වෙත්. ත්‍රිවිධ විමොක්ෂයන්ට සංඛාරුපෙක්ඛා අටලොසක් ප්‍රත්‍ය වෙත්.

"මේ අටලොස් ආකාර ප්‍රඥාව යමෙකු විසින් පුරුදු කරනලද්දීද, සංඛාරුපෙක්ඛා ඥාණයන්හි දක්ෂවූ ඒ පුද්ගල තෙම නොයෙක් දෘෂ්ටීන් කරණකොට කම්පා නොවෙයි.

මෙය දැනීම් අර්ථයෙන් ඥාණනමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් මිදෙනු කැමැත්තෙන් මෙනෙහිකොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඥාණයයි කියනු ලැබේ.

**98.** කෙසේනම් බාහිරවූ සංස්කාර නිමිත්තෙන් නැගී නිවන් අරමුණට හැරෙන්නාවූ ප්‍රඥාව ගොත්‍රභූ ඥාණ නම් වේද? ඉපදීම (ii) මැඩ පවත්වන හෙයින් ගොත්‍රභූ නමි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න) පැවැත්ම-, නිමිත්ත-, කර්ම රැස් කිරීම-, ප්‍රතිසන්ධිය-, ගතිය ස්කන්ධයන්ගේ පහළවීම-, විපාකයන්ගේ පහළවීම-, ජාතිය-, ජරාව-, ව්‍යාධිය-, මරණය-, ශොකය-, හැඬීම-, දැඩි වෙහෙස (උපායාසය)-, බාහිරවූ සංඛාර නිමිත්ත මැඩ පවත්වන හෙයින් ගොත්‍රභූ නමි.

**99.** නොඉපදවීමට (ii) බැසගන්නා හෙයින් ගොත්‍රභූ නමි. (iii) පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න) නොපැවැත්මට-, අනිමිත්තට-, කර්ම රැස් නොකිරීමට-, අප්‍රතිසන්ධියට-, නොගතියට-, ස්කන්ධයන්ගේ පහළ නොවීමට-, විපාකයන්ගේ පහළ නොවීමට-, අජාතියට-, අජරාවට-, අව්‍යාධියට-, අමරණයට-, අශොකයට-, නොහැඬීමට-, අනුපායාසයට-, නිරොධයවූ නිවනට බැසගන්නා හෙයින් ගොත්‍රභූ නමි.

**100.** ඉපදීම මැඩ පවත්වා නොඉපදීමට (ii) බැසගන්නා හෙයින් ගොත්‍රභූ නමි. (iii) (පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න.) පැවැත්ම මැඩපවත්වා නොපැවැත්මට-, නිමිත්ත මැඩපවත්වා අනිමිත්තට, බාහිර සංඛාර නිමිත්ත මැඩපවත්වා නිරොධයවූ නිවනට බැස ගන්නා හෙයින් ගොත්‍රභූ නිමි.

**101.** ඉපදීමෙන් (ii) නැගිටින හෙයින් ගොත්‍රභූ නමි. (පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න.) පැවැත්මෙන්-, කර්ම රැස් කිරීමෙන්-, ප්‍රතිසන්ධියෙන්-, ගතියෙන්-, ස්කන්ධයන්ගේ පහළවීමෙන්-, විපාකයන්ගේ පහළ වීමෙන්-, ජාතියෙන්-, ජරාවෙන්-, ව්‍යාධියෙන්-, මරණයෙන්-,

සොකයෙන්-, හැඬීමෙන්-, උපායාසයෙන්-, බාහිර සංඛාර නිමිත්තෙන් නැගිටිනුයි ගොත්‍රභූ නමි.

102. නොඉපදීමට (ii) බැසගන්නා හෙයින් ගොත්‍රභූ නමි. (iii) (පහත දක්වන වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) නොපැවැත්මට-, අසංස්කාර නිමිත්තට-, කර්ම රැස් කිරීමට-, අප්‍රතිසන්ධියට-, නොගතියට-, ස්කන්ධයන්ගේ පහළ නොවීමට-, විපාකයන්ගේ පහළ නොවීමට-, අජාතියට-, අජරාවට-, අව්‍යාධියට-, අමරණයට-, අශෝකයට-, නොහැඬීමට-, අනුපායාසයට-, නිරොධයවූ නිවණට.

103. ඉපදීමෙන් නැගිට නොඉපදීමට (ii) බැසගන්නා හෙයින් ගොත්‍රභූ නමි. (පහත දක්වන වාක්‍ය අගට (iii) මෙහි (ii) යොදන්න) පැවැත්මෙන් නැගිට නොපැවැත්මට නිමිත්තෙන් නැගිට අනිමිත්තට කර්ම රැස්කිරීමෙන් නැගිට කර්ම රැස්නොකිරීමට-, ප්‍රතිසන්ධියෙන් නැගිට ප්‍රතිසන්ධි නොගැනීමට- ගතියෙන් නැගිට ගතිරහිත බවට- ස්කන්ධයන්ගේ පහළවීමෙන් නැගිට ස්කන්ධයන්ගේ පහළ නොවීමට- විපාකයන්ගේ පහළවීමෙන් නැගිට විපාකයන්ගේ පහළ නොවීමට- ජාතියෙන් නැගිට ජාති රහිත බවට- ජරාවෙන් නැගිට ජරා රහිත බවට- ව්‍යාධියෙන් නැගිට ව්‍යාධි රහිත බවට- මරණයෙන් නැගිට මරණ රහිත බවට- ශොකයෙන් නැගිට සොක රහිත බවට- හැඬීමෙන් නැගිට හැඬීම රහිත බවට උපායාසයෙන් නැගිට උපායාස රහිත බවට- බාහිර සංඛාර නිමිත්තෙන් නැගිට නිරොධයවූ නිවනට බැස ගනීනුයි ගොත්‍රභූ නමි.

104. ඉපදීමෙන් (ii) පෙරලෙයිනුයි ගොත්‍රභූ නමි (ii) (පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න) පැවත්මෙන්-, නිමිත්තෙන්-, කර්ම රැස්කිරීමෙන්-, ප්‍රතිසන්ධියෙන්-, ගතියෙන්-, ස්කන්ධයන්ගේ පහළවීමෙන්-, විපාකයන්ගේ පහළවීමෙන්-, ජාතියෙන්-, ජරාවෙන්-, ව්‍යාධියෙන්-, මරණයෙන්-, ශොකයෙන්-, හැඬීමෙන්-, උපායාසයෙන් බාහිර සංඛාර නිමිත්තෙන් පෙරලෙයිනුයි ගොත්‍රභූ නමි.

**105.** නොඉපදීමට (ii) බැසගනීනුයි ගොත්‍රභූ නම්. (පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න.) නොපැවැත්මට-, අසංස්කාර නිමිත්තට-, කර්ම රැස්නොකිරීමට-, අප්‍රතිසන්ධියට-, නොගතියට-, ස්කන්ධයන්ගේ පහළනොවීමට-, විපාකයන්ගේ පහළ නොවීමට- අජාතියට-, අජරාවට-, අව්‍යාධියට-, අමරණයට-, අශොකයට-, නොහැඬීමට-, අනුපායාසයට- නිරොධවූ නිවනට-,

**106.** ඉපදීමෙන් පෙරලී නොඉපදීමට (ii) බැසගනීනුයි ගොත්‍රභූ නම්. (iii) (පහත දක්වන වාක්‍ය අගට මෙහි (ii) යොදන්න.)

පැවැත්මෙන් පෙරලී නොපැවැත්මට-, සංස්කාර නිමිත්තෙන් පෙරලී අසංස්කාර නිමිත්තට- කර්ම රැස්කිරීමෙන් පෙරලී කර්ම රැස්නොකිරීමට-, ප්‍රතිසන්ධියෙන් පෙරලී අප්‍රතිසන්ධියට-, ගතියෙන් පෙරලී නොගතියට-, ස්කන්ධයන්ගේ පහළවීමෙන් පෙරලී ස්කන්ධයන්ගේ පහළ නොවීමට-, විපාකයන්ගේ පහළවීමෙන් පෙරලී විපාකයන්ගේ පහළ නොවීමට-, ජාතියෙන් පෙරලී අජාතියට-, ජරාවෙන් පෙරලී අජරාවට-, ව්‍යාධියෙන් පෙරලී අව්‍යාධියට-, මරණයෙන් පෙරලී අමරණයට- ශොකයෙන් පෙරලී අශොකයට-, හැඬීමෙන් පෙරලී නොහැඬීමට-, උපායාසයෙන් පෙරලී අනුපායාසයට- බාහිර සංඛාර නිමිත්තෙන් පෙරලී නිරොධය වූ නිවනට-

**107.** කෙතෙක් ගොත්‍රභූ ධර්මයෝ සමථ වශයෙන් උපදිත්ද, කෙතෙක් ගොත්‍රභූ ධර්මයෝ විදර්ශනා වශයෙන් උපදිත්ද? ගොත්‍රභූ ධර්ම අටක් සමථ වශයෙන් උපදිත්. ගොත්‍රභූ ධර්ම දසයක් විදර්ශනා වශයෙන් උපදිත් කවර ගොතභූ ධර්ම අටක් සමථ වශයෙන් උපදිත්ද? ප්‍රථම ධ්‍යානය ලබනු පිණිස නීවරණ ධර්මයන් මැඩපවත්වානුයි ගොත්‍රභූනම්. ද්විතීය ධ්‍යානය ලැබීම පිණිස විතර්ක විචාරයන් මැඩපවත්වානුයි ගොත්‍රභූ නම්. තෘතීය ධ්‍යානය ලබනු පිණිස ප්‍රීතිය මැඩපවත්වානුයි ගොත්‍රභූඥාන නම්. චතුර්ථධ්‍යානය ලබනු පිණිස සුඛ දුක්ඛයන් මැඩපවත්වානුයි ගොත්‍රභූඥාන නම්. ආකාසානඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස රූප සඤ්ඤාව පටිඝසඤ්ඤාව

නානත්තසඤ්ඤාව මැඩපවත්වානුයි ගොත්‍රභූනම්. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස ආකාසානඤ්චායතන සඤ්ඤාව මැඩපවත්වානුයි ගොත්‍රභූ නම්. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස විඤ්ඤානඤ්චායතන සඤ්ඤාව මැඩපවත්වානුයි ගොත්‍රභූඥාන නම්. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ලබනු පිණිස ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව මැඩපවත්වානුයි ගොත්‍රභූ නම්. මේ ගොත්‍රභූ ධර්ම අට සමථයෙන් උපදිත්.

108. කවර දස ගොත්‍රභූ ධර්මයක් විදර්ශනාවෙන් උපදිත්ද? සොතාපත්ති මාර්ගය ලබනු පිණිස (ii) ඉපදීම පැවැත්ම නිමිත්ත කර්ම රැස්කිරීම ප්‍රතිසන්ධි ගැනීම ගතිය ස්කන්ධයන්ගේ පහළවීම විපාකයන්ගේ පහළවීම ජාතිය ජරාව, ව්‍යාධිය, මරණය, සොකය, පරිදෙවය, උපායාසය බාහිර සංඛාර නිමිත්ත මැඩපවත්වන හෙයින් ගොත්‍රභූ නම්. (iii) සොතාපත්ති ඵලයට සමවැදීම පිණිස (මෙහි (ii) යොදන්න) මැඩපවත්වන හෙයින් ගොත්‍රභූ නම්. සකෘදාගාමි මාර්ගය ලබනු පිණිස (මෙහි (ii) යොදන්න) සකෘදාගාමි ඵලයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදන්න) අනාගාමි මාර්ගය ලබනු පිණිස (මෙහි (ii) යොදන්න.) අනාගාමි ඵලයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදන්න) අර්හත් මාර්ගය ලබනු පිණිස (මෙහි (ii) යොදන්න) අර්හත් ඵලයට සමවදිනු පිණිස සුඤ්ඤත සමවදිනු පිණිස අනිමිත්ත විහාරයට සමවදිනු පිණිස (මෙහි (ii) යොදන්න) මැඩපවත්වානුයි ගොත්‍රභූ නිමි. මේ ගොත්‍රභූ ධර්ම දශය විදර්ශනා වශයෙන් උපදිත්. කෙතෙක් ගොත්‍රභූ ධර්මයෝ කුසල් වෙත්ද, කෙතෙක් අකුසල් වෙත්ද, කෙතෙක් අව්‍යාකෘත වෙත්ද, ගොත්‍රභූ ධර්ම පසළොසක් කුසල් වෙත්. ගොත්‍රභූ ධර්ම තුනක් අව්‍යාකෘත වෙත්. අකුසල ගොත්‍රභූ ධර්මයෝ නැත්තාහ.

109. "ක්ලේශාවිස සහිතවූද ක්ලේශාවිස රහිතවූද නිකන්ති තෘෂ්ණා සහිතවූද නිකන්ති තෘෂ්ණා රහිතවූද නිකන්තිය හා නොබැඳුණාවූද නිකන්තිය හා බැඳුණාවූද බාහිර සංඛාර නිමිත්තෙන් නැගී සිටියාවූද බාහිර සංඛාර නිමිත්තෙන් නොනැගියාවූද ගොත්‍රභූ ධර්ම වෙයි.

"සමාධියට ප්‍රත්‍යවූ නොගුහු ධර්ම අටක් වෙත්. ඥාණයට ගොචරවූ ගොත්‍රභූ ධර්ම දසයක් වෙත්. මෙසේ ත්‍රිවිධ විමොක්ෂයට ප්‍රත්‍යවූ ගොත්‍රභූ ධර්මයෝ අටලොසක් වෙත්.

"මේ අටලොස් ආකාර ප්‍රඥාව යමෙකු විසින් පුරුදු කරන ලද්දීද, සංඛාර ධර්මයන්ගෙන් නැගිටීමෙහිත් නිවනට පෙරලීමෙහිත් දක්ෂවූ ඒ පුද්ගලතෙම නොයෙක් දෘෂ්ටීන්ගෙන් කම්පා නොවෙත්.

එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් බාහිර සංඛාරයන් කෙරෙන් නැගිටීමෙහිත් නිවනට පෙරලීමෙහිත් පවත්නා ප්‍රඥාව ගොත්‍රභූඥාණයයි කියනු ලැබේ.

110. කෙසේ නම් දෙයාකාරයකින් නැගිටින්නාවූත් සහ වෙන්වන්නාවූත් ප්‍රඥාව මාර්ගඥාන නම්වේද? ශ්‍රොතා පත්ති මාර්ග ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (ii) ඒ මිථ්‍යාදෘෂ්ටිය ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද නැගිටියි. බාහිර සියලු සංඛාර නිමිති කෙරෙන්ද නැගිටියි. එහෙයින් දෙයාකාරයකින් නැගිටින්නාවූත් වෙන්වන්නාවූත් ප්‍රඥාව මාර්ග ඥානයයි කියනු ලැබේ. (iii) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යා කල්පනාවෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න) වැළඳ ගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යාවචනයෙන් නැගිටියි (මෙහි (ii) යොදන්න) මනාකොට පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න) පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය මිථ්‍යාජීවයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න) එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය මිථ්‍යා ව්‍යායාමයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න) එළඹ සිටීම් අර්ථයෙන් සම්මාසතිය මිච්ඡාසතියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) නොවිසිරයාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය මිථ්‍යාසමාධියෙන් නැගිටියි (මෙහි (ii) යොදන්න.)

111. සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (මෙහි 110 (ii)

යොදන්න) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යාකල්පනාවෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යා වචනයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) මනාකොට පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය මිථ්‍යාජීවයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) එළඹ සිටීම් අර්ථයෙන් සම්මාසතිය මිච්ඡා සතියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) නොවිසිර යාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය ඕළාරික කාමරාග සංයොජනයෙන්ද පටිඝ සංයොජනයෙන්ද ඕළාරික කාමරාගානුසයෙන් පටිඝානුසයෙන්ද නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න.) අනාගාමි මාර්ගක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යා කල්පනාවෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යා වචනයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) නොවිසිර යාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය තුනීවූ කාමරාග සංයොජනය කෙරෙන්ද පටිඝසංයොජනය කෙරෙන්ද කාමරාගානුසය කෙරෙන්ද පටිඝානුසය කෙරෙන්ද නැගිටියි. මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න.) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යාකල්පනාවෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න.) වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යාවචනයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න.)

මනාකොට පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය මිථ්‍යා ජීවයෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) එළඹ සිටීම් අර්ථයෙන් සම්මාසතිය මිච්ඡා සතියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) අර්හත් මාර්ග

ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යා කල්පනාවෙන් නැගිටියි. (මෙහි 110 (ii) යොදන්න) වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යා වචනයෙන් නැගිටියි. (මෙහි 110 (iii) යොදන්න.) නොවිසිර යාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා සංයොජනයන් කෙරෙන්ද මානානුසය භවරාගානුසය අවිජ්ජානුසයන් කෙරෙන්ද නැගිටියි. බාහිර සියලු සංස්කාර නිමිති කෙරෙන් ද නැගිටියි. එහෙයින් දෙයාකාරයකින් නැගිටීමෙහිත් වෙන්වීමෙහිත් ප්‍රඥාව මාර්ගඥානයයි කියනු ලැබේ.

"පහළවූ ලොකොත්තර ධ්‍යානයෙන් නූපන් ක්ලේශ ධර්මයන් දවයි. එහෙයින් ධ්‍යානයයි කියනු ලැබේ. ආර්ය මාර්ගය හා යෙදුණාවූ විතර්කාදී ධ්‍යානයන්හිද ආර්ය මාර්ග සංඛ්‍යාත විමොක්ෂයෙහිද දක්ෂවීම හෙතුකොටගෙන නොයෙක් දෘෂ්ටීන් කරණකොටගෙන කම්පා වෙයි. අර්පණා උපචාර ක්ෂණික සමාධි අතුරෙන් එක්තරා සමාධියකින් සමාහිතව ඉදින් යම්සේ විදර්ශනා වඩන්නේද, එසේම විදර්ශනා වඩන තැනැත්තේ සමාධිය උපදවන්නේද එකල්හි විදර්ශනාවද සමථයද යන දෙකම වෙත්. සමානව යුගනන්ධව පවතිත්. "සංස්කාරයෝ දුඃඛයහ. නිර්වාණය සැපයයි දක්නාවූ දෙයාකාරයෙන් නැගී සිටියාවූ ප්‍රඥාව අමෘතපදය ස්පර්ශකරයි. "නානත්ව එකත්ව දෙක්හි දක්ෂවූ යොගී පුද්ගලතෙම ආර්ය මාර්ගයන්ගේ පැවැත්ම දැනගනියි. දර්ශනඥාන භාවනාඥාන දෙක්හි දක්ෂභාවය හෙතු කොටගෙන නොයෙක් දෘෂ්ටීන් කරණකොට කම්පා නොවෙයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් දෙයාකාරයකින් නැගිටීමෙහිත් වෙන්වීමෙහිත් ප්‍රඥාව මාර්ග ඥානයයි කියනු ලැබේ.

**112.** කෙසේ නම් උත්සාහය සංසිඳීමෙහි ප්‍රඥාව ඵල ඥාණය වන්නේද? සෝවාන් මාර්ග ක්‍ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (ii) ඒ අනුව පවත්නා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ක්ලේශයන්ගෙනුත් ස්කන්ධයන්ගෙනුත් නැගිටියි. බාහිර සියලු සංස්කාර නිමිති කෙරෙන්ද නැගිටියි. ඒ උත්සාහය සංසිඳුණු හෙයින් (ii) සම්‍යක් දෘෂ්ටිය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. අරමුණට නැංවීම් අර්ථයෙන් සම්‍යක් සංකල්පය මිථ්‍යා සංකල්පයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සංකල්පය උපදවයි. එය සෝවාන් මාර්ගයාගේ ඵලයයි. වැළඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යා වචනයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් වචනය උපදවයි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. මනාව පිහිටීම අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) නිමිති කෙරෙන්ද නැගිටියි. ඒ උත්සාහය සංසිඳීමෙන් සම්‍යක් කර්මාන්තය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය මිථ්‍යාජීවයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් ආජීවය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය මිථ්‍යා ව්‍යායාමයෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් ව්‍යායාමය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. එළඹ සිටීම් අර්ථයෙන් සම්‍යක් සමාධිය මිථ්‍යාසමාධියෙන් නැගිටියි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සතිය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි. නොවිසිරයාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය මිථ්‍යා සමාධියෙන් (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සමාධිය උපදියි. එය සෝවාන් මාර්ගයාගේ ඵලය වෙයි.

113. සකෘදාගාමි මාර්ග ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (ii) මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න) අරමුණට නැංවීම් ස්වභාවයෙන් සම්‍යක් සංකල්පනාව මිථ්‍යාකල්පනාවෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න.) වැළඳ ගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මිථ්‍යාවචනයෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්නා මනාකොට පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තයෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න) පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය මිථ්‍යාජීවයෙන් නැගිටියි. (මෙහි

112 (ii) යොදන්න) එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න. එළඹ සිටීම් අර්ථයෙන් සම්මාසතිය මිච්ඡා සතියෙන් නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න) නොවිසිරයාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය ඔළාරික කාමරාග සංයෝජනයෙන්ද පටිඝ සංයෝජනයෙන්ද ඔළාරික කාමානුසයයෙන්ද පටිඝානුසයයෙන්ද නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න) සම්‍යක් සමාධිය උපදියි. එය සකෘදාගාමි මාර්ගයාගේ ඵලය වෙයි.

අනාගාමි මාර්ග ක්ෂණයෙහි දැනීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි (ii) යොදන්න) නොවිසිරයාම අර්ථයෙන් සම්‍යක් සමාධිය තුනීවූ කාමරාග සංයෝජනයෙන්ද පටිඝ සංයොජනයෙන්ද තුනීවූ කාමරාගානුසයයෙන්ද පටිඝානුසයයෙන්ද නැගිටියි. (මෙහි 112 (ii) යොදන්න) සම්‍යක් සමාධිය උපදියි. එය අනාගාමි මාර්ගයාගේ ඵලය වෙයි. අර්හත් මාර්ග ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි (ii) යොදන්න.) නොවිසිරයාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා සංයොජනයන් කෙරෙන්ද මානානුසය භවරාගානුසය අවිජ්ජානුසයයන් කෙරෙන්ද නැගිටියි. බාහිර සියලු සංස්කාර නිමිති කෙරෙන්ද නැගිටියි. ඒ උත්සාහය සංසිඳීමෙන් සම්‍යක් සමාධිය උපදියි. එය අර්හත් මාර්ගයාගේ ඵලය වෙයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් උත්සාහය සංසිඳීමෙහි ප්‍රඥාව ඵල ඥාණයයි කියනු ලැබේ.

114. කෙසේනම් සිඳිනලද කෙලෙස් දැක්මෙහි ප්‍රඥාව විමුක්ති ඥාණ නම්වේද? සොතාපත්ති මාර්ගයෙන් සක්කාය දිට්ඨියද විචිකිච්ඡාවද සීලබ්බත පරාමාසයද දිට්ඨානුසයද විචිකිච්ඡානුසයද, යන තම චිත්තයාගේ දැඩිව පවත්නා මේ ක්ලේශයෝ සිඳින ලද්දාහු වෙත්. හාත්පස එක්ව පැනනඟින්නාවූ ධර්මයන් සහිත මේ පස් වැදෑරුම් උපක්ලේශ ධර්මයන්ගෙන් සිත මිදුණේ වෙයි. (ii) මනාකොට මිදුණේ වෙයි. ඒ මිදීම දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් පහකළ කෙලෙසුන් දැක්මෙහි ප්‍රඥාව

විමුත්ති ඤාණයයි කියනු ලැබේ. (iii) සකෘදාගාමි මාර්ගයෙන් ඖළාරික කාම රාග සංයෝජනයද පටිඝ සංයෝජනයද ඖළාරික කාමරාගානුසයද පටිඝානුසයද යන තම චිත්තයාගේ උපක්ලේශයෝ මනාව සිඳින ලද්දාහු වෙත්. හාත්පස එක්ව පැන නගින්නාවූ ධර්මයන් සමග මේ සතර උපක්ලේශයන්ගේ සිත මිදුණේ වෙයි. (මෙහි (ii) යොදන්න.)

අනාගාමි මාර්ගයෙන් තුනීවූ කාම රාග සංයෝජනයද පටිඝසංයෝජනයද තුනීවූ කාම රාගානුසයද පටිඝානුසයද යන තමාගේ චිත්තයාගේ උපක්ලේශයෝ මනාව සිඳින ලද්දාහු වෙත්. හාත්පස එක්ව පැන නගින්නාවූ ධර්මයන් සමග මේ සතර උපක්ලේශයන් කෙරෙන් සිත මිදුණේ වෙයි. (මෙහි (ii) යොදන්න.)

අර්හත් මාර්ගයෙන් රූප රාගයද අරූප රාගයද මානයද උද්ධච්චයද අවිද්‍යාවද මානානුසයද භවරාගානුසයද අවිජ්ජානුසයද තමාගේ චිත්තයාගේ උපක්ලේශයෝ සිඳින ලද්දාහු වෙත්. හාත්පස එක්ව උපදින ධර්මයන් සමග මේ අටවැදෑරුම් උපක්ලේශයන් කෙරෙන් සිත මිදුණේවෙයි. (මෙහි (ii) යොදන්න.) එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥානම්. එහෙයින් පහකළ කෙලෙස් දැක්මෙහි ප්‍රඥාව විමුත්ති ඤාණයයි කියනු ලැබේ.

115. කෙසේනම් ඒ මාර්ග ඵල ක්ෂණයන්හි ලැබීම් වශයෙන්ද අවබොධ කිරීම් වශයෙන්ද එක්ව පහළවූ ධර්මයන් දැක්මෙහි ප්‍රඥාව පච්චවෙක්ඛණ ඤාණ නම්වේද? සෝවාන් මාර්ගක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (ii) ඒ මාර්ග ක්ෂණයෙහි එක්ව පහළවූයේ වෙයි. (iii) අරමුණට නැංවීම් අර්ථයෙන් සම්‍යක් සංකල්පය ( (ii) යොදන්න.) වැළඳ ගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය ( (ii) යොදන්න.) මනාව පිහිටුවීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය ( (ii) යොදන්න) පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය ( (ii) යොදන්න.) එසවීම් ස්වභාවයෙන් සම්‍යක් ව්‍යායාමය ( (ii) යොදන්න.) එළඹ සිටීම් අර්ථයෙන් සම්මා සතිය ( (ii) යොදන්න.) නොවිසිර යාම් අර්ථයෙන් සම්‍යක් සමාධිය ( (ii) යොදන්න.) එළඹ සිටීම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අර්ථයෙන් සතිසම්බොජ්ක්ධංගය එකල්හි පහළවූයේ වෙයි. විමසීම් අර්ථයෙන් ධම්මවිචය සම්බොජ්ක්ධංගය එකල්හි පහළ වූයේවෙයි. එසවීම් අර්ථයෙන් විරිය සම්බොජ්ක්ධංගය එකල්හි පහළවූයේ වෙයි. පැතිරීම් අර්ථයෙන් පීති සම්බොජ්ක්ධංගය එකල්හි එක්ව පහළවූයේ වෙයි. (iv) සංසිඳීම් අර්ථයෙන් පස්සද්ධි සම්බොජ්ක්ධංගය එකල්හි පහළවූයේ වෙයි. නොවිසිරීම් අර්ථයෙන් සමාධි සම්බොජ්ක්ධංගය එකල්හි එක්ව පහළවූයේ වෙයි. මැදහත්ව බැලීම් අර්ථයෙන් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය එකල්හි එක්ව පහළවූයේ වෙයි. අශ්‍රද්ධාවෙන් කම්පා නොවන ස්වභාවයෙන් ශ්‍රද්ධා බලය එකල්හි පහළවූයේ වෙයි. කුසීත භාවයෙන් කම්පා නොවන ස්වභාවයෙන් එකල්හි විරිය බලය එක්ව පහළවූයේ වෙයි. ප්‍රමාදයෙන් කම්පා නොවන ස්වභාවයෙන් එකල්හි සතිබලය එක්ව පහළවූයේ වෙයි. උද්ධච්චයෙන් කම්පා නොවන ස්වභාවයෙන් සමාධි බලය එකල්හි එක්ව පහළවූයේ වෙයි. අවිද්‍යාවෙන් කම්පා නොවන ස්වභාවයෙන් ප්‍රඥා බලය එකල්හි එක්ව පහළ වූයේ වෙයි. නොසෙල්වෙන ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය, එකල්හි එක්ව පහළවූයේ වෙයි. එසවීම් ස්වභාවයෙන් විරියින්ද්‍රිය එකල්හි එක්ව පහළවූයේ වෙයි. එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය එකල්හි එක්ව පහළවූයේ වෙයි. නොවිසිරයාම ස්වභාවයෙන් සමාධින්ද්‍රිය එකල්හි එක්ව පහළවූයේ වෙයි. දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය එකල්හි එක්ව පහළවූයේ වෙයි. (iv)

**116.** අධිපති භාවයෙන් ඉන්ද්‍රියයෝ එකල්හි එක්ව පහළ වූවාහු වෙත්. කම්පා නොවීම් අර්ථයෙන් බලයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. පැමිණවීම් අර්ථයෙන් සම්බොජ්ක්ධංගයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. හේතු අර්ථයෙන් මාර්ගය එකල්හි එක්ව පහළවූයේ වෙයි. එළඹ සිටීම අර්ථයෙන් සතිපට්ඨානයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. වීර්ය කිරීම් අර්ථයෙන් සම්‍යක් ප්‍රධානයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. සමෘද්ධවීම් අර්ථයෙන් ඍද්ධිපාදයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. වෙනස් නොවීම් අර්ථයෙන් සත්‍යයෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. නොවිසිරයාම් අර්ථයෙන් සමථය එකල්හි

එක්ව පහළවූයේ වෙයි. නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාව එකල්හි එක්ව පහළවූයේ වෙයි. සමාන කෘත්‍යාර්ථයෙන් සමථ විපස්සනාවෝ එකල්හි එක්ව පහළවූවාහු වෙත්. ඔවුනොවුන් නොඉක්මවන අර්ථයෙන් යුගනන්ධ සමථ විපස්සනා දෙක එකල්හි එක්ව පහළවූවාහු වෙත්. දැකීම් අර්ථයෙන් දිට්ඨි විසුද්ධිය එකල්හි එක්ව පහළ වූවා වෙයි. විශෙෂයෙන් විදීම් අර්ථයෙන් විමොක්ෂය එකල්හි එක්ව පහළවූයේ වෙයි. ප්‍රතිවෙධ කිරීම් අර්ථයෙන් විද්‍යාව එකල්හි එක්ව පහළවූවා වෙයි. දුරුකිරීම් අර්ථයෙන් විමුක්තිය එකල්හි එක්ව පහළවූවා වෙයි. මනාව සිඳීම් අර්ථයෙන් ක්ලේශයන් ක්ෂය කිරීමෙහි ඤාණය එකල්හි එක්ව පහළවූයේ වෙයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. මනසිකාරය අරමුණට යොමුකිරීම් අර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. ඵස්සය එක්කිරීම අර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. වේදනාව රැස්වීම් අර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. සතිය අධිපති අර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. ප්‍රඥාව ප්‍රධානාර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. මාර්ග විමුක්තිය සාරාර්ථයෙන් එකල්හි එක්ව පහළවූයේ වෙයි. අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් එකල්හි ප්‍රතිවෙධ කිරීම් වශයෙන් පහළවූයේ වෙයි. මේ ධර්මයෝ මාර්ගක්ෂණයෙහි පහළවූහයි එයින් නැගිට ප්‍රත්‍යවෙක්ෂා කරයි.

117. සොතාපත්ති ඵල ක්ෂණයෙහි (i) දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 115 (ii) (iii) යොදන්න) සංසිඳීම් අර්ථයෙන් අනුත්පාදයෙහි ඤාණය එකල්හි පහළවූයේ වෙයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් එකල්හි පහළවූයේ වෙයි. (ii) මනසිකාරය යොමුකිරීම් අර්ථයෙන් එකල්හි පහළ වූයේ වෙයි. ඵස්සය එක්කිරීම් අර්ථයෙන් එකල්හි පහළ වූයේ වෙයි. වෙදනා රැස්කිරීම් අර්ථයෙන් එකල්හි පහළ වූයේ වෙයි. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් එකල්හි පහළවූයේ වෙයි. සතිය අධිපති අර්ථයෙන් එකල්හි පහළවූයේ වෙයි. ප්‍රඥාව ප්‍රධානාර්ථයෙන් එකල්හි පහළවූයේ වෙයි. ඵල විමුක්තිය සාරාර්ථයෙන් එකල්හි

පහළවූයේ වෙයි. (iii) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් එකල්හි පහළ වූයේ මේ ධර්මයෝ එකල්හි පහළ වූහයි එයින් නැගිට ප්‍රත්‍යවෙක්ෂා කරයි.

**118.** සකෘදාගාමි මාර්ග ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 115 (ii) (iii) සහ 116 යොදන්න) සකෘදාගාමි ඵල ක්ෂණයෙහි (මෙහි 117 (i) සිට අගට යොදන්න) අනාගාමි මාර්ග ඥාණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 115 (ii) (iii) සහ 116 යොදන්න) අනාගාමි ඵල ක්ෂණයෙහි (මෙහි 117 (i) සිට අගට යොදන්න) අර්හත් මාර්ග ක්ෂණයෙහි සම්‍යක් දෘෂ්ටිය (මෙහි 115 (ii) (iii) සහ 116 යොදන්න) මනාව සිඳීම් අර්ථයෙන් කෙලෙසුන් ක්ෂය කිරීමේ ඥාණය එකල්හි පහළ වූයේ වෙයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් එකල්හි පහළ වූයේ වෙයි. (මෙහි 117 (ii) යොදන්න) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් ප්‍රතිවෙධ කිරීම් වශයෙන් පහළවූයේ වෙයි. මේ ධර්මයෝ එකල්හි පහළවූහයි. එයින් නැගිට ප්‍රත්‍යවෙක්ෂා කරයි. අර්හත් ඵල ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 115 (ii) (iii) යොදන්න) සංසිඳීම අර්ථයෙන් අනුත්පාදයෙහි ඥාණය එකල්හි පහළවූයේ වෙයි. ඡන්දය මූලාර්ථයෙන් එකල්හි පහළවූයේ වෙයි. (මෙහි 117 යොදන්න) අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් එකල්හි ප්‍රතිවෙධ කිරීම වශයෙන් පහළවූයේ වෙයි. මේ ධර්මයෝ එකල්හි පහළවූහයි එයින් නැගිට ප්‍රත්‍යවෙක්ෂා කරයි.

එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් මාර්ග ඵල ක්ෂණයෙහි ලැබීම් වශයෙන් ප්‍රතිවෙධ කිරීම් වශයෙන්ද පහළවූ ධර්මයන් දැක්මෙහි ප්‍රඥාව ප්‍රත්‍යවෙක්ෂාඥානයයි කියනු ලැබේ.

**119.** කෙසේ නම් අධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව වස්තුනානත්ව ඥාන නම් වන්නේද? කෙසේ නම් අධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කරන්නේද? අධ්‍යාත්ම ඇස මෙනෙහි කරයි. අධ්‍යාත්ම කණ මෙනෙහි කරයි. අධ්‍යාත්ම නාසය මෙනෙහි කරයි. අධ්‍යාත්ම දිව මෙනෙහි කරයි. අධ්‍යාත්ම කය මෙනෙහි කරයි. අධ්‍යාත්ම සිත මෙනෙහි කරයි.

**120.** අධ්‍යාත්ම ඇස කෙසේ මෙනෙහි කරයිද? ඇස අවිද්‍යාවෙන් හටගත්තේයයි මෙනෙහි කරයි. ඇස තණ්හාවෙන් හටගත්තේයයි මෙනෙහි කරයි. ඇස කර්මයෙන් හටගත්තේයයි මෙනෙහි කරයි. ඇස ආහාරයෙන් හටගත්තේයයි මෙනෙහි කරයි. ඇස සතර මහාභූතයන් නිසා පවත්නකැයි මෙනෙහි කරයි. ඇස ප්‍රත්‍යුත්පන්නයයි මෙනෙහි කරයි. ඇස හෙතුවෙන් පහළ වූයේයයි මෙනෙහි කරයි ඇස නොපැවැත පහළ වෙයි. ඇතිව විනාශවන්නේයයි මෙනෙහි කරයි. ඇස කෙළවර සහිතයයි මෙනෙහි කරයි. ඇස අස්ථිරය සදාකාලික නොවේ. වෙනස්වන ස්වභාවය, ඇත්තේයයි මෙනෙහි කරයි. ඇස අනිත්‍යය ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපදින ලදී. ක්ෂය වන ස්වභාවය ඇත්තේය. විනාශ වන ස්වභාවය ඇත්තේය වෙන්වන ස්වභාවය ඇත්තේය. නිරුද්ධවන ස්වභාවය ඇත්තේයයි මෙනෙහි කරයි. ඇස අනිත්‍ය වශයෙන් මෙනෙහි කරයි. නිත්‍යවශයෙන් නොමෙනෙහි කරයි. දුක්වශයෙන් මෙනෙහි කරයි. සැපවශයෙන් නොමෙනෙහි කරයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරයි. ආත්ම වශයෙන් නොමෙනෙහි කරයි. කලකිරෙයි. සතුටු නොවෙයි, වෙන් වෙයි. නො ඇලෙයි. නිරුද්ධ කරයි. නොඋපදවයි, අත්හරියි. අල්වා නොගනියි, අනිත්‍ය වශයෙන් මෙනෙහි කරමින් නිත්‍ය සංඥාව දුරු කරයි. දුක් වශයෙන් මෙනෙහි කරමින් සුඛ සංඥාව දුරු කරයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරමින් ආත්ම සංඥාව දුරු කරයි. කලකිරෙමින් ප්‍රීති සහගත ඇල්ම දුරු කරයි. නොඇලෙමින් රාගය දුරුකරයි. නිරුද්ධ කරමින් (ඉපදීම) ඇතිවීම දුරු කරයි. අත්හරිමින් අල්වා ගැනීම දුරු කරයි. මෙසේ අධ්‍යාත්ම ඇස මෙනෙහි කරයි.

**121.** කෙසේ අධ්‍යාත්ම (ශ්‍රොතය) කණ මෙනෙහි කරයිද? (මෙහි 120 ඡෙදයේ "ඇස" වෙනුවට "කණ" යොදාගත යුතුයි)

**122.** කෙසේ අධ්‍යාත්ම (ඝ්‍රානය) නාසය මෙනෙහි කරයිද? (මෙහි 120 ඡෙදයේ "ඇස" වෙනුවට "නාසය" යොදාගත යුතුයි)

**122.** කෙසේ අධ්‍යාත්ම (ජිව්හාව) දිව මෙනෙහි කරයිද? (මෙහි 120 ඡෙදයේ "ඇස" වෙනුවට "දිව" යොදාගත යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**123.** අධ්‍යාත්ම කය කෙසේ මෙනෙහි කරන්නේද? (මෙහි 120 ඡේදයේ "ඇස" වෙනුවට "කය" යොදාගත යුතුයි.)

**124.** අධ්‍යාත්ම සිත කෙසේ මෙනෙහි කරයිද? (මෙහි 120 ඡේදයේ "ඇස" වෙනුවට "සිත" යොදාගත යුතුයි.) මෙසේ අධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කරයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් අධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව චත්ථුනානත්ත ඤාණයයි කියනු ලැබේ.

**125.** කෙසේ නම් බාහ්‍ය ධර්මයන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව ගොචර නානත්ත ඤාණය නම් වේද? බාහ්‍ය ධර්මයන් කෙසේ මෙනෙහි කරන්නේද? බාහ්‍යරූපයන් මෙනෙහි කරයි. බාහ්‍ය ශබ්දයන් මෙනෙහි කරයි. බාහ්‍ය ගන්ධයන් මෙනෙහි කරයි. බාහ්‍ය රසයන් මෙනෙහි කරයි. බාහ්‍ය ස්පර්ශයන් මෙනෙහි කරයි. කෙසේ බාහ්‍ය රූපයන් මෙනෙහි කරන්නේද?

**126.** රූපයෝ අවිද්‍යාවෙන් හටගත්තාහුයයි මෙනෙහි කරයි. රූපයෝ තෘෂ්ණාවෙන් හටගත්තාහුයයි මෙනෙහි කරයි. රූපයෝ කර්මයෙන් හටගත්තාහුයයි මෙනෙහි කරයි. රූපයෝ ආහාරයෙන් හටගත්තාහුයයි මෙනෙහි කරයි. රූපයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහුයයි මෙනෙහි කරයි. රූපයෝ ප්‍රත්‍යුත්පන්නයෝයයි මෙනෙහි කරයි. රූපයෝ ප්‍රත්‍යයන්ගෙන් පහළ වූවාහුයයි මෙනෙහි කරයි. රූපයෝ නැතිව ඇති වන්නාහු ඇතිව නැති වන්නාහුයයි මෙනෙහි කරයි. රූපයන් කෙළවර ඇතියවුන්යයි මෙනෙහිකරයි. රූපයෝ අස්ථිරයහ අසදාකාලිකය වෙනස්වන ස්වභාව ඇත්තාහුයයි මෙනෙහි කරයි. රූපයෝ අනිත්‍යයහ. ප්‍රත්‍යයෙන් සකස්කරන ලදහ. ප්‍රත්‍යයන් නිසා උපන්නාහ ක්ෂයවන ස්වභාවය ඇත්තාහ විනාශවන ස්වභාවය ඇත්තාහ. වෙන්වන ස්වභාවය ඇත්තාහ. නිරුද්ධවන ස්වභාවය ඇත්තාහුයයි මෙනෙහිකරයි. රූපයන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරයි. නිත්‍ය වශයෙන් මෙනෙහි නොකරයි. දුක් වශයෙන් මෙනෙහි කරයි. සැප වශයෙන් මෙනෙහි නොකරයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරයි. ආත්ම වශයෙන් මෙනෙහි නොකරයි. කලකිරෙයි. සතුටු නොවෙයි. වෙන්වෙයි,

නොඇලෙයි. නිරුද්ධ කරයි. නොඋපදවයි, අත්හරියි, අල්වා නොගනියි. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ නිත්‍යසංඥාව දුරුකරයි. දුක්වශයෙන් මෙනෙහි කරන්නේ සුඛසංඥාව දුරුකරයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ ආත්ම සංඥාව දුරුකරයි කළකිරෙන්නේ තෘෂ්ණාසහගත ප්‍රීතිය දුරුකරයි. නොඇලෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධ කරන්නේ ඉපදීම දුරුකරයි. අත්හරින්නේ අල්වාගැනීම දුරුකරයි. මෙසේ බාහ්‍ය රූපයන් මෙනෙහි කරයි.

**127.** කෙසේ බාහ්‍ය ශබ්දයන් මෙනෙහි කරයිද? (මෙහි 126 ඡෙදයේ "රූපයෝ" වෙනුවට "ශබ්දයෝ" යොදාගත යුතුයි.)

**128.** කෙසේ බාහ්‍ය රසයන් මෙනෙහි කරයිද? (මෙහි 126 ඡෙදයේ "රූපයෝ" වෙනුවට "රසයෝ" යොදාගත යුතුයි.)

**129.** කෙසේ බාහ්‍ය ස්පර්ශයන් මෙනෙහි කරයිද? (මෙහි 126 ඡෙදයේ "රූපයෝ" වෙනුවට "ස්පර්ශයන්" යොදාගත යුතුයි.)

**130.** කෙසේ බාහ්‍ය ධර්මයන් මෙනෙහි කරයිද? (මෙහි 126 ඡෙදයේ "රූපයෝ" වෙනුවට "ධර්මයෝ" යොදාගත යුතුයි) එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් බාහ්‍ය ධර්මයන් මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව ගොචරනානත්ත ඥාණ නමැයි කියනු ලැබේ.

**131.** කෙසේ නම් අරමුණෙහි හැසිරීම මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව චරියානානත්තඥාණය නම් වේද? විඤ්ඤාණචරියා අඤ්ඤාණ චරියා ඥාණ චරියායයි අරමුණෙහි හැසිරීම් තුනකි. විඤ්ඤාණ චරියාව (විඤ්ඤාණයෙන් අරමුණෙහි හැසිරීම) කවරීද? දැකීම පිණිස ආවර්ජනය කරන්නාවූ අව්‍යාකෘතවූ ආවර්ජන ක්‍රියා සිත (පඤ්චද්වාරාවර්ජනය) රූපයන්හි විඤ්ඤාණ චරියා නමි. දැකීම් ස්වභාවය ඇති චක්ඛු විඤ්ඤාණ සිත රූපයන්හි විඤ්ඤාණ චරියා නමි. (චක්ඛු විඤ්ඤාණයෙන්) දක්නාලද හෙයින් අරමුණට නගින්නාවූ විපාක මනොධාතුව (සමපටිච්ඡන සිත) රූපයන්හි විඤ්ඤාණචරියා නමි. අරමුණට නඟිනලද හෙයින් විපාක මනොවිඤ්ඤාණ ධාතුව (සන්තීරණ සිත) රූපයන්හි විඤ්ඤාණචරියා නමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇසීම පිණිස ආවර්ජනය කරන්නාවූ අව්‍යාකෘතවූ ආවර්ජන ක්‍රියා සිත ශබ්දයන්හි විඤ්ඤාණචරියා නම්. අසන්නාවූ සොතවිඤ්ඤාණය ශබ්දයන්හි විඤ්ඤාණ චරියා නම්. (සොතවිඤ්ඤාණයෙන්) අසනලද හෙයින් අරමුණට නගින්නාවූ විපාකමනොධාතුව ශබ්දයන්හි විඤ්ඤාණචරියා නම්. අරමුණට නගිනලද හෙයින් විපාක මනොවිඤ්ඤාණ ධාතුව විඤ්ඤාණචරියා නම්. ආඝ්‍රානය පිණිස ආවර්ජනය කරන්නාවූ ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත ගන්ධයන්හි විඤ්ඤාණචරියා නම්. ආඝ්‍රානය කිරීම් ස්වභාවය ඇති ඝාන විඤ්ඤාණය ගන්ධයන්හි විඤ්ඤාණචරියා නම්. (ඝාන විඤ්ඤාණයෙන්) ආඝ්‍රානය කරනලද හෙයින් අරමුණට නගින්නාවූ විපාක මනොධාතුව ගන්ධයන්හි විඤ්ඤාණචරියා නම්. අරමුණට නගිනලද හෙයින් විපාක මනොවිඤ්ඤාණ ධාතුව ගන්ධයන්හි විඤ්ඤාණචරියා නම්.

රස දැනීම පිණිස ආවර්ජනය කරන්නාවූ අව්‍යාකෘතවූ ආවර්ජන ක්‍රියා සිත රසයන්හි විඤ්ඤාණචරියා නම්. රස දැනගන්නාවූ ජිව්හාවිඤ්ඤාණය රසයන්හි විඤ්ඤාණ චරියා නම්. (ජිව්හාවිඤ්ඤාණයන්) රස දැනගන්නා ලද හෙයින් අරමුණට නගින්නා විපාක මනොධාතුව රසයන්හි විඤ්ඤාණ චරියා නම්. අරමුණට නගිනලද හෙයින් විපාක මනොවිඤ්ඤාණධාතුව රසයන්හි විඤ්ඤාණ චරියා නම්. ස්පර්ශ කිරීම පිණිස (ආවර්ජනය කරන්නාවූ) අව්‍යාකෘත ආවර්ජන ක්‍රියා සිත ප්‍රශ්ටව්‍යයන්හි විඤ්ඤාණචරියා නම්. ස්පර්ශ කරන්නාවූ කාය විඤ්ඤාණය ස්පර්ශයන්හි විඤ්ඤාණ චරියා නම්. කාය විඤ්ඤාණයෙන් ස්පර්ශ කරන ලද හෙයින් අරමුණට නගින්නාවූ විපාක මනොධාතුව ස්පර්ශයන්හි විඤ්ඤාණචරියා නම්. අරමුණට නගින ලද හෙයින් විපාක මනොවිඤ්ඤාණ ධාතුව ප්‍රශ්ටව්‍යයන්හි විඤ්ඤාණචරියා නම්.

දැනීම පිණිස අව්‍යාකෘතවූ ආවර්ජන ක්‍රියාව (මනොද්වාරා වර්ජනය ධම්මාරම්මණයන්හි විඤ්ඤාණචරියා නම්. දැනගන්නාවූ මනොවිඤ්ඤාණය ධර්මාරම්මණයන්හි විඤ්ඤාණචරියා නම්. දැනගන්නාලද හෙයින් අරමුණට

නගින්නාවූ විපාකමනොධාතුව ධම්මාරම්මණයන්හි විඤ්ඤාණචරියා නම්. අරමුණට නගිනලද හෙයින් විපාක මනොවිඤ්ඤාණ ධාතුව ධම්මාරම්මණයන්හි විඤ්ඤාණචරියා නම්.

132. විඤ්ඤාණචරියා යන තන්හි කිනම් අර්ථයකින් විඤ්ඤාණචරියා නම් වේද? රාග විරහිතව හැසිරේනුයි. විඤ්ඤාණචරියා නම්. දොස විරහිතව හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. මොහ විරහිතව හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. (ii) මානවිරහිතව හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. දිට්ඨි විරහිතව හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. උද්ධච්ච විරහිතව හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. විචිකිච්ඡා විරහිතව හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. අනුසය විරහිතව හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. රාගය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. දොසය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. මොහය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. මානය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම් (iii) දිට්ඨිය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. උද්ධච්චය සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම් විචිකිච්ඡාව සමග නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. අනුසය හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. කුශල කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. අකුසල කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. සාවද්‍ය කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණචරියා නම්. නිරවද්‍ය කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. කළු (අයහපත්) කර්මයන් හා නොයෙදී හැසිරේනුයි. විඤ්ඤාණචරියා නම්. සුදු (යහපත්) කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. සැප ඵලවන කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. දුක් ඵලවන කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. සැප විපාක දෙන කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. දුක් විපාක දෙන කර්මයන් හා නොයෙදී හැසිරේනුයි විඤ්ඤාණ චරියා

නම්. විඤ්ඤාණයෙන් දැනගන්නා ලද ආරම්මණයෙහි හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. විඤ්ඤාණයාගේ මෙබඳුවූ හැසිරීම් ඇති හෙයින් විඤ්ඤාණ චරියා නම්. මේ කියන ලද සිත් රාගාදී ක්ලේශයන්ගෙන් කිලුටුවීමක් නැති හෙයින් ප්‍රකෘතියෙන් පිරිසිදුය. එසේ අරමුණු දැනීම් මාත්‍රයම ඇති හෙයින් විඤ්ඤාණ චරියායයි කියනු ලැබේ. මේ විඤ්ඤාණ චරියාවයි.

133. අඤ්ඤාණ චරියාව නම් කවරේද? මනාපවූ රූපාරම්මණයන්හි (ii) රාග ජවන ඉපදීම පිණිස පවත්නාවූ ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. රාග ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. අමනාප රූපයයන්හි දොස ජවන් ඉපදීම පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. දොස ජවනයෝ අඤ්ඤාණ චරියා නම් (iii) රාග ද්වේෂ දෙකට අනුරූපසේ නොබලන අරමුණෙහි මොහ ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. මොහ ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. උසස් කොට සිතන්නාවූ මාන සහගත ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. මාන ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. වරදවා ගන්නා දෘෂ්ටි සහගත ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. දෘෂ්ටි ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. වික්ෂෙපවූ උද්ධච්ච සහගත ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. උද්ධච්ච ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. නිශ්චයක් නැති විචිකිච්ඡා සහගත ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. විචිකිච්ඡා ජවනයෝ අඤ්ඤාණ චරියා නම්. බලවත් අනුසය සහගත ජවන් පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නම්. අනුසය සහගත ජවනයෝ අඤ්ඤාණ චරියා නම්.

134. මනාපවූ ශබ්දයන්හි (මෙහි 133 (ii) (iii) යොදන්න) මනාපවූ ගන්ධයන්හි (මෙහි 133 (ii) (iii) යොදන්න) මනාපවූ රසයන්හි (මෙහි 133 (ii) (iii) යොදන්න) මනාපවූ ස්පර්ශයන්හි

(මෙහි 133 (ii) (iii) යොදන්න) මනාපවූ ධර්මාරම්මණයන්හි මෙහි 133 (ii) (iii) යොදන්න)

135. අඤ්ඤාණ චරියා යන තැන කිනම් අර්ථයකින් අඤ්ඤාණ චරියා නම් වේද? රාග සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දොස සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. මොහ සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. මාන සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දිට්ඨි සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. උද්ධච්ච සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. විචිකිච්ඡා සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. අනුසය සහිතව හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. රාගය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දොසය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. මොහය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. මානය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දිට්ඨිය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. උද්ධච්චය හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. විචිකිච්ඡාව හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. අනුසය ධර්මයන් හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. කුශල කර්ම හා නොයෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. අකුශල කර්මයන් හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. සාවද්‍ය කර්මයන්හි හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණචරියා නමි. නිරවද්‍ය කර්මයන් හා නොයෙදී හැසිරේනුයි අඤ්ඤාණචරියා නමි. තෘෂ්ණා කර්මයන්හි හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. ශුක්ල කර්මයන් හා නොයෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. සැප උපදවන්නාවූ කර්මයන් හා නොයෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දුක් උපදවන්නාවූ කර්මයන් හා යෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. සැප විපාක ඇත්තාවූ කර්මයන් හා නොයෙදී හැසිරේනුයි අඤ්ඤාණ චරියා නමි. දුක් විපාක ඇත්තාවූ කර්මයන්හි යෙදී හැසිරේනුයි අඤ්ඤාණචරියා නමි. නුවණින් නොදන්නා ලද අරමුණෙහි හැසිරේනුයි අඤ්ඤාන චරියා නමි. නොදැනීමගේ මෙබඳු හැසිරීම් ඇත්තේනුයි අඤ්ඤාණ චරියා නමි. මේ අඤ්ඤාණ චරියායයි කියනු ලැබේ.

136. ඤාණචරියාව කවරේද? අනිත්‍ය වශයෙන් දැකීම සඳහා පවත්නාවූ ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නමි. i අනිත්‍ය වශයෙන් දැකීම ඤාණචරියා නමි. දුක් වශයෙන් දැකීම පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නමි. දුක් වශයෙන් දැකීම ඤාණචරියා නමි. අනාත්ම වශයෙන් දැකීම පිණිස ii පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නමි. iii අනාත්ම වශයෙන් දැකීම ඤාණ චරියා නමි. කලකිරීම් වශයෙන් දැකීම පිණිස (මෙහි ii යෙදිය යුතුයි.) නොඇලීම් වශයෙන් දැකීම් පිණිස (ii යොදන්න) නිරුද්ධ කිරීම් වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) අත්හැරීම් වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) ක්ෂයවීම් වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) විනාශවීම් වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) වෙනස්වීම් වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) නිමිති රහිත වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) පැතීම් රහිත වශයෙන් දැකීම පිණිස ( (ii) යොදන්න) සූන්‍ය වශයෙන් දැකීම පිණිස (මෙහි ii) යෙදිය යුතුයි.) අධිප්‍රඥා ධර්මය දැකීම පිණිස යථාභූත ඥානදර්ශනය පිණිස ආදීනව දැකීම පිණිස මැදහත්ව බැලීම පිණිස පවත්නා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත සිත විඤ්ඤාණ චරියා නමි. මැදහත්ව දැකීම ඤාණචරියා නමි. විවට්ටානුපස්සනාව (ගොත්‍රභූ සිත) ඤාණචරියා නමි. සොතාපත්ති මාර්ගය ඤාණචරියා නමි. සොතාපත්ති ඵලයට පැමිණීම ඤාණචරියානමි. සකෘදාගාමි මාර්ගය ඤාණචරියා නමි. සකෘදාගාමි ඵලයට පැමිණීම ඤාණචරියා නමි. අනාගාමි මාර්ගය ඤාණචරියා නමි. අනාගාමි ඵලයට පැමිණීම ඤාණචරියා නමි. අර්හත් මාර්ගය ඤාණචරියා නමි. අර්හත්ඵලයට පැමිණීම ඤාණචරියා නමි.

137. ඤාණචරියා යන තැන කවර අර්ථයකින් ඤාණ චරියා නම් වේද? රාග රහිතව හැසිරේනුයි ඤාණචරියා නමි. දොස රහිතව හැසිරේනුයි ඤාණචරියානමි. මොහ රහිතව හැසිරේනුයි ඤාණචරියා නමි. (මෙහි "විඤ්ඤාණචරියා" ඤාණචරියායි වෙනස්කොට (132 ii) යෙදිය යුතුයි.) අනුසය රහිතව හැසිරේනුයි

ඤාණචරියා නම්. රාගය හා නොයෙදී හැසිරේනුයි ඤාණචරියා නම් දොසය හා නොයෙදී හැසිරේනුයි ඤාණචරියා නම්. (iii) මොහය හා නොයෙදී (ii) හැසිරේනුයි ඤාණචරියා නම් මානය හා නොයෙදී (මෙහි (ii) යෙදිය යුතුයි.) දෘෂ්ටිය හා නොයෙදී (ii) උද්ධච්චය හා නොයෙදී (ii) විචිකිච්ඡාව හා නොයෙදී (ii) අනුසය හා නොයෙදී (ii) කුශලකර්මයන් හා යෙදී (ii) අකුසලකර්මයන් හා නොයෙදී (ii) සාවද්‍ය කර්මයන් හා නොයෙදී (ii) නිරවද්‍ය කර්මයන් හා යෙදී (ii) සැප උපදවන්නාවූ කර්මයන් හා යෙදී (ii) දුක් උපදවන්නාවූ කර්මයන් හා නොයෙදී (ii) සැප විපාක ඇත්තාවූ කර්මයන් හා යෙදී (ii) දුක් විපාක ඇත්තාවූ කර්මයන් හා නොයෙදී හැසිරේනුයි ඤාණචරියා නම් වේ. නුවණින් දැනගන්නාලද අරමුණෙහි හැසිරේනුයි ඤාණචරියා නම්. ඤාණයාගේ මෙබඳු හැසිරීම් ඇති හෙයින් ඤාණචරියා නම්. මේ ඤාණචරියා නම්.

138. විඤ්ඤාණචරියාව අනිකකි. අඤ්ඤාණචරියාව අනිකකිය. ඤාණචරියාව අනිකකියි එය දැනීම් අර්ථයෙන් ඤාණනම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් චරියා පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව චරියා නානත්ත ඤාණයයි කියනු ලැබේ.

139. කෙසේනම් සතර ධර්මයන් පිරිසිඳ දන්නා ඤාණය භූමිනානත්ත ඤාණය නම් වේද? කාමාවචර භූමිය රූපාවචර භූමිය අරූපාවචර භූමිය අපරියාපන්න ලොකොත්තර භූමියයි භූමි සතරකි. කාමාවචර භූමිය කවරීද? යටින් අවීචි නිරය කෙළවරකොට උඩින් වසවර්ති දෙව්ලොව ඇතුළත් කොට මේ අතරතුර වන මෙහි හැසිරෙන්නාවූ මෙහි ඇතුළත්වූ යම් ස්කන්ධ ධාතු ආයතන රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ කෙනෙක් වෙත්ද, මෙය කාමාවචර භූමි නම්.

140. රූපාවචර භූමිය කවරේද? යටින් බ්‍රහ්මලොකය කෙළවරකොට උඩින් අකනිට්ඨ දෙවියන් ඇතුළත්කොට මේ අතරතුර වන මෙහි හැසිරෙන්නාවූ මෙහි ඇතුළත්වූ ධ්‍යානයට සමවැදුණු පුද්ගලයාගේ හෝ බඹලොව උපන්නහුගේ හෝ දිට්ඨධම්ම සුඛවිහාරී රහත්හුගේ හෝ යම් චිත්ත චෛතසික

ධර්ම කෙනෙක් වෙද්ද මේ රූපාවචර භූමි නමි. අරූපාවචර භූමිය කවරීද? යටින් ආකාසානඤ්චායතන දෙවියන් කෙළවරකොට උඩින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ඇතුළත්කොට මේ අතරතුර වන මෙහි හැසිරෙන මෙහි ඇතුළත් ධ්‍යානයට සමවැදුනහුගේ හෝ එහි උපන්නහුගේ හෝ දිට්ඨධම්ම සුඛවිහාරි රහත්හුගේ හෝ යම් චිත්ත චෛතසික ධර්ම කෙනෙක් වෙත්ද, මේ අරූපාවචර භූමි නමි.

141. අපරියාපන්න (ලොකොත්තර) භූමිය කවරීද? ත්‍රිවිධ භූමීන්ට ඇතුළත් නොවී යම් මාර්ගයෝද ඵලයෝද අසංඛත ධාතුවක්ද ඇත්තාහුද මේ අපරියාපන්න භූමි නමි. මේ සතර භූමීහුය. තවද භූමි සතරකි සතර සතිපට්ඨානයෝද සතර සම්‍යක් ප්‍රධානයෝද සතර ඍද්ධිපාදයෝද සතර ධ්‍යානයෝද සතර අප්‍රමාන්‍යයෝද සතර අරූප සමාපත්තීහුද සතර ප්‍රතිසම්භිදාවෝද සතර ප්‍රතිපදාද සතර අරමුණුද සතර ආර්යවංශයෝද සතර සංග්‍රහ වස්තූහුද සතර සම්පත්ති චක්‍රයෝද සතර ධර්මපදයෝද වෙත්. මේ සතර භූමීහුය. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥානමි. එහෙයින් සතර ධර්මයන් පිරිසිඳ දැක්මෙහි ප්‍රඥාව භූමිනානත්තඥාණ නමි.

142. කෙසේනම් ධර්ම නවයක් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධම්ම නානත්ත ඥාණය නම්වේද? කාමාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අකුසල් වශයෙන් පිරිසිඳ දනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. රූපාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. අරූපාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. අපරියාපන්ත (ලෝකොත්තර) ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි.

143. කාමාවචර ධර්මයන් කුසල් වශයෙන් කෙසේ පිරිසිඳ දනියිද, අකුසල් වශයෙන් කෙසේ පිරිසිඳ දනියිද, අබ්‍යාකත වශයෙන් කෙසේ පිරිසිඳ දනියිද? දස කුශල කර්මපථයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. දස අකුශල කර්මපථයන් අකුසල් වශයෙන් පිරිසිඳ දනියි. රූපද විපාකද ක්‍රියාද අබ්‍යාකත වශයෙන්

පිරිසිඳ දනියි, මෙසේ කාමාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි, අකුසල් වශයෙන් පිරිසිඳ දනියි, අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි.

**144.** රූපාවචර ධර්මයන් කෙසේ කුසල් වශයෙන් පිරිසිඳ දනියිද, අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියිද, මෙහි සිටි ධ්‍යානලාභී පුද්ගලයාගේ සතර ධ්‍යානයන් කුසල වශයෙන් පිරිසිඳ දනියි. බඹලොව උපන්නහුගේ සතර ධ්‍යානයන් අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. මෙසේ රූපාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දැනගනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දැනගනියි. කෙසේනම් අරූපාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියිද, අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියිද? මෙහි සිටි අරූප ධ්‍යානලාභී පුද්ගලයාගේ අරූපාවචර සමාපත්ති සතර කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අරූප ලෝකයෙහි උපන්නහුගේ සතර අරූපාවචර සමාපත්ති අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දැනගනියි. මෙසේ අරූපාවචර ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දැනගනියි, අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දැනගනියි.

**145.** කෙසේනම් අපරියාපන්න (ලෝකොත්තර) ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියිද, අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියිද? සතර ආර්ය මාර්ගයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. සතර ආර්ය ඵලයන්ද නිර්වාණයද අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. මෙසේ අපරියාපන්න ධර්මයන් කුසල් වශයෙන් පිරිසිඳ දනියි. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දනියි. මෙසේ ධර්මයන් පිරිසිඳ දනියි. ප්‍රමොද්‍යයට (බලවත් නොවූ ප්‍රීතියට) හේතුවූ ධර්ම නවයකි. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (ii) දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීතිය උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු නාම කය ඇත්තේ මානසික සුවය ලබයි. සැපයෙන් යුක්ත වූවහුගේ සිත සමාධියට පැමිණෙයි. සිත සමාධියට පැමිණි කල්හි තත්වාකාරය දනියි දකියි. තත්වාකාරයෙන් දන්නා දක්නා තැනැත්තේ කලකිරෙයි. කලකිරෙන්නේ (මාර්ගයට පැමිණීම් වශයෙන්) නොඇලෙයි. නොඇලෙන්නේ ඵලයට පැමිණීම් වශයෙන්) මිදෙයි. (iii)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**146.** දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (මෙහි 145 (ii) යොදන්න.) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නා හට (මෙහි 145 (ii) යොදන්න.) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (මෙහි 145 (ii) යොදන්න.) රූපය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න) වේදනාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) සංඥාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නා හට (145 (ii) යොදන්න.) සංඛාරයන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) ඇස අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) කණ අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) නාසය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) දිව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) කය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) සිත අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) ජරාමරණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.)

**147.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) රූපය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නා හට (145 (ii) යොදන්න.) වේදනාව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න. සංඥාව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) සංඛාරයන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) විඤ්ඤාණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) ඇස අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) කණ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) නාසය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) දිව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) කය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii) යොදන්න.) සිත අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (145 (ii)

යොදන්න.) ජරා මරණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට දුර්වල ප්‍රීතිය උපදියි. ප්‍රීතිය ඇතිවූවහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුක්තවූවහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය ලබයි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි. සිත සමාධියට පැමිණිකල්හි තත්වාකාරය දනියි, දකියි. තත්වාකාරය දන්නා දක්නා තැනැත්තේ කලකිරෙයි. කලකිරෙන්නේ මාර්ග වශයෙන් නොඇලෙයි. නොඇලෙන්නේ ඵලයාගේ වශයෙන් මිදෙයි. මේ නවය දුර්වල ප්‍රීතිය මුල්කොට ඇති ධර්මයෝයි.

**148.** යොනිසො මනසිකාරය (නුවණින් මෙනෙහි කිරීම) මුල්කොට ඇති ධර්මයෝ නවයක් වෙති. අනිත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාහට දුර්වල ප්‍රීතිය උපදී. දුර්වල ප්‍රීතිය ඇතිවූවහුට බලවත් ප්‍රීතිය උපදී. බලවත් ප්‍රීතියෙන් යුක්තවූවහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය ලබයි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි සමාධියට පැමිණි සිතින් මේ දුකයයි ඇති සැටියෙන් දනියි. මේ දුක් ඇතිවීමේ හේතුවයයි ඇතිසැටියෙන් දකියි. මේ දුක නැතිකිරීම යයි ඇතිසැටියෙන් දනියි. මේ දුක් නැති කිරීමට පැමිණෙන පිළිවෙත යයි ඇතිසැටියෙන් දකියි.

**149.** දුක් වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාහට (ii) දුර්වල ප්‍රීතිය උපදී, දුර්වල ප්‍රීතිය උපන්නහුට බලවත් ප්‍රීතිය උපදී, බලවත් ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය ලබයි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි. සමාධියට පැමිණි සිතින් මේ දුකයයි, ඇතිසැටියෙන් දනියි. මේ දුකට හෙතුවයයි, ඇතිසැටියෙන් දනියි, මේ දුක නැතිකිරීම යයි ඇතිසැටියෙන් දනියි. මේ දුක නැතිකිරීමට පැමිණෙන පිළිවෙත යයි ඇති සැටියෙන් දනියි.

**150.** අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරන්නා හට (මෙහි 149 (ii) යොදන්න.) රූපය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) වෙදනාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සංඥාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.)

සංඛාරයන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ඇස අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කණ අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) නාසය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) දිව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සිත අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ජරාමරණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.)

151. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න. රූපය දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) වෙදනාව දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සංඥාව දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සංඛාරයන් දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) විඤ්ඤාණය දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ඇස දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කණ දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) නාසය දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) දිව දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කය දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සිත දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ජරාමරණය දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.)

152. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) රූපය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) වේදනාව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සංඥාව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සංඛාරයන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.)

විඤ්ඤාණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ඇස අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කණ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) නාසය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) දිව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) කය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) සිත අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) ජරාමරණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට (149 (ii) යොදන්න.) මේ නවය නුවණින් මෙනෙහි කිරීම මුල්කොට ඇති ධර්ම නවය වෙති.

153. නානත්ව (වෙනස් බැව්) නවයකි. ධාතු නානත්වය නිසා ඵස්ස නානත්වය උපදියි. ඵස්ස නානත්වය නිසා වෙදනා නානත්වය උපදියි. වෙදනා නානත්වය නිසා සංඥා නානත්වය උපදියි. සංඥා නානත්වය නිසා සංකල්ප (කල්පනා කිරීම්) නානත්වය උපදියි. සංකල්ප නානත්වය නිසා ඡන්ද නානත්වය උපදියි. ඡන්ද නානත්වය නිසා තෘෂ්ණා නානත්වය උපදියි. තෘෂ්ණා නානත්වය නිසා පරියෙසන (සෙවීම්) නානත්වය උපදියි. පරියෙසන නානත්වය නිසා ලාභ (ලැබීම්) නානත්වය උපදියි. මේ නානත්ව නවයයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැකීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් නව ධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධම්මනානත්ත ඤාණයයි කියනු ලැබේ.

154. කෙසේනම් විශෙෂ ඥානයෙන් දන්නාවූ ප්‍රඥාව ඤාතට්ඨ ඤාණය නම්වේද පිරිසිඳ දැනගන්නා ප්‍රඥාව තීරණට්ඨ ඤාණය නම්වේද, ප්‍රහාණය කරණ ප්‍රඥාව පරිච්චාගට්ඨ ඤාණ නම්වේද භාවනා ප්‍රඥාව එකරසට්ඨ ඤාණය නම්වේද ප්‍රත්‍යක්ෂ කරන්නාවූ ප්‍රඥාව ඵුසනට්ඨ ඤාණය නම්වේද? යම් යම් ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් දන්නා ලද්දාහුද, ඒ ඒ ධර්මයෝ දැනගන්නා ලද්දාහු නම්වෙත්. යම් යම් ධර්ම කෙනෙක් පිරිසිඳ දැනගන්නා ලද්දාහුද ඒ ඒ ධර්මයෝ තීරණය කරන ලද්දාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් පහකරන ලද්දාහුද ඒ ඒ ධර්මයෝ

දුරු කරන ලද්දාහු වෙත්. යම් යම් ධර්ම කෙනෙක් වඩන ලද්දාහු වෙත්ද ඒ ඒ ධර්මයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. යම් යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙත්ද, ඒ ඒ ධර්මයෝ ඤාණයෙන් ස්පර්ශ කරන ලද්දාහු වෙත්. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් විශෙෂයෙන් දැනගන්නා ප්‍රඥාව ඤාතට්ඨ ඤාණයයිද පිරිසිඳ දන්නා ප්‍රඥාව තීරණට්ඨ ඤාණයයිද ප්‍රහාණ ප්‍රඥාව පරිච්චාගට්ඨ ඤාණ යයිද භාවනා ප්‍රඥාව එකරසට්ඨ ඤාණයයිද ප්‍රත්‍යක්ෂ කරන්නාවූ ප්‍රඥාව ඵුසනට්ඨ ඤාණයයිද කියනු ලැබේ.

**155.** කෙසේනම් අර්ථනානත්වයෙහි (අර්ථයන් වෙනස් බවෙහි) පවත්නා අර්ථ පටිසම්භිදා ඤාණ නම්වේද ධර්ම නානත්වයෙහි (ධර්මයන්ගේ වෙනස් බවෙහි) පවත්නා ප්‍රඥාව ධම්ම පටිසම්භිදා ඤාණය නම්වේද? නිරුත්ති නානත්වයෙහි (වචනයන්ගේ වෙනස් බවෙහි) පවත්නා ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා ඤාණ නම්වේද, පටිභාන නානත්වයෙහි (ඤාණයන්ගේ වෙනස් බවෙහි) පවත්නා ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඤාණ නම්වේද, සද්ධින්ද්‍රිය ධර්ම නම්. විරියින්ද්‍රිය ධර්ම නම් සතින්ද්‍රිය ධර්ම නම්. සමාධින්ද්‍රිය ධර්ම නම්. පඤ්ඤින්ද්‍රිය ධර්ම නම්. සද්ධින්ද්‍රිය ධර්මය අනිකකි. විරියින්ද්‍රිය ධර්මය අනිකකි. සතින්ද්‍රිය ධර්මය අනිකකි. සමාධින්ද්‍රිය ධර්මය අනිකකි. පඤ්ඤින්ද්‍රිය ධර්මය අනිකකි. යම් ඤාණයකින් වෙන් වෙන්වූ ධර්මයෝ දැනගන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම මේ වෙන් වෙන්වූ ධර්මයෝ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි ධම්ම පටිසම්භිදා නම්. එහෙයින් ධර්මයන්ගේ වෙනස දන්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණයයි කියනු ලැබේ.

නිශ්චයට බැසගැනීම් ස්වභාවය අර්ථ නම්. එසවීම් ස්වභාවය අර්ථ නම්. එළඹ සිටීම් ස්වභාවය අර්ථ නම්. නොවිසිරයාම් ස්වභාවය අර්ථ නම්. දැකීම් ස්වභාවය අර්ථ නම්. නිශ්චය කිරීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. එසවීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. එළඹ සිටීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. නොවිසිරයාම් ස්වභාවයවූ අර්ථය අනිකකි. දැකීම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්වභාවයවූ අර්ථය අනිකකි. යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ අර්ථය දැනගන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම මේ වෙන් වෙන්වූ අර්ථයෝ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි. එහෙයින් වෙන් වෙන් වූ අර්ථයන් දැනගැන්මෙහි ප්‍රඥාව අත්ථ පටිසම්භිදා ඤාණයයි කියනු ලැබේ.

ධර්ම පස දැක්වීම පිණිස ව්‍යවහාර වචන වෙත්. අර්ථ පස දැක්වීම පිණිස ව්‍යවහාර වචන වෙත්. ධර්මයන් දක්වන වචන අනෙක් වචනයෝයි. අර්ථයන් දක්වන වචන අනෙක් වචනයෝයි. යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ වචන දැගනන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම ඒ වෙන් වෙන්වූ වචන ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි. එහෙයින් වෙන් වෙන්වූ වචන දැනගන්නා ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා ඤාණයයි කියනු ලැබේ. ධර්ම පසෙහි ඤාණ පසකි. අර්ථ පසෙහි ඤාණ පසකි. වචන දසයෙහි ඤාණ දසයකි. යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ ඤාණයන් දැනගන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම මේ වෙන් වෙන්වූ ඤාණයන් ප්‍රකටකොට දැනගන්නා ලද්දාහුනුයි. එහෙයින් වෙන් වෙන්වූ ඤාණයන් දැනගන්නා ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඤාණයයි කියනු ලැබේ.

**156.** සද්ධා බලය ධම්ම නම්. විරිය බලය ධම්ම නම්. සති බලය ධම්ම නම්. සමාධි බලය ධම්ම නම්. පඤ්ඤා බලය ධම්ම නම්. සද්ධා බල ධර්මය අනිකකි. විරිය බල ධර්මය අනිකකි. සතිබල ධර්මය අනිකකි. පඤ්ඤාබල ධර්මය අනිකකි.

**157.** යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ ධර්මයෝ දන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම ඒ වෙන් වෙන්වූ ධර්මයෝ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි එහෙයින් වෙන් වෙන්වූ ධර්මයන් දැනගන්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණයයි කියනු ලැබේ.

**158.** අශ්‍රද්ධාවෙන් කම්පා නොවන ස්වභාවය අර්ථ නම්. කුසීත බවෙන් කම්පා නොවන ස්වභාවය අර්ථ නම්. ප්‍රමාදයෙන් කම්පා නොවන ස්වභාවය අර්ථ නම්. උද්ධච්චයෙන් කම්පා නොවන ස්වභාවය අර්ථ නම්. අවිද්‍යාවෙන් කම්පා නොවන ස්වභාවය අර්ථ නම්. අශ්‍රද්ධාවෙන් කම්පා නොවන ස්වභාවයවූ

අර්ථය අනිකකි. කුසීත බවෙන් කම්පා නොවන ස්වභාවයවූ අර්ථය අනිකකි. ප්‍රමාදයෙන් කම්පා නොවන ස්වභාවයවූ අර්ථය අනිකකි. උද්ධච්චයෙන් කම්පා නොවන ස්වභාවයවූ අර්ථය අනිකකි. අවිද්‍යාවෙන් කම්පා නොවන ස්වභාවයවූ අර්ථය අනිකකි.

**159.** යම් ඥාණයකින් මේ වෙන් වෙන් අර්ථයෝ දැනගන්නා ලද්දාහුද එම ඥාණයෙන්ම ඒ වෙන් වෙන් අර්ථයෝ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි අත්ථ පටිසම්භිදා ඥාණයයි කියනු ලැබේ.

**160.** ධර්ම පස දැක්වීම පිණිස වචන වෙත්. අර්ථ පස දක්වනු පිණිස වචන වෙත්. ධර්මයන් දක්වන වචන අන්‍යයෝය. අර්ථයන් දක්වන වචන අන්‍යයෝය. (ii) යම් ඥාණයකින් මේ වෙන්වෙන්වූ වචන දැනගන්නා ලද්දාහුද ඒ ඥාණයෙන්ම මේ වෙන් වෙන්වූ වචන ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි. එහෙයින් වෙන් වෙන්වූ වචන දැනීමෙහි ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදායි කියනු ලැබේ.

**161.** ධර්ම පසෙහි ඥාණ පසකි. අර්ථ පසෙහි ඥාණ පසකි. වචන දසයෙහි ඥාණ දසයකි. ධර්මයන්හි ඥාණ අන්‍යයෝය. අර්ථයන්හි ඥාණ අන්‍යයෝය. වචනයන්හි ඥාණ අන්‍යයෝය. (ii) යම් ඥාණයකින් මේ වෙන් වෙන්වූ ඥාණ දැනගන්නා ලද්දාහුද එම ඥාණයෙන්ම මේ වෙන් වෙන්වූ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි. එහෙයින් වෙන් වෙන්වූ ඥාණයන්හි ඥාණය පටිභාන පටිසම්භිදා ඥාණයයි කියනු ලැබේ.

**162.** සතිසම්බොජ්ඣංගය ධම්ම නම්. ධම්ම විචය සම්බොජ්ඣංගය ධම්ම නම්. විරිය සම්බොජ්ඣංගය ධම්ම නම්. පීතිසම්බොජ්ඣංගය ධම්ම නම්. පස්සද්ධි සම්බොජ්ඣංගය ධම්ම නම්. සමාධි සම්බොජ්ඣංගය ධම්ම නම්. උපෙක්ඛා සම්බොජ්ඣංගය ධම්ම නම්. සතිසම්බොජ්ඣංග ධර්මය අනිකකි. ධම්මවිචය සම්බොජ්ඣංග ධර්මය අනිකකි. විරිය සම්බොජ්ඣංග ධර්මය අනිකකි. පීති සම්බොජ්ඣංගය ධර්ම අනිකකි. පස්සද්ධි

සම්බොජ්ක්ධංගය ධර්මය අනිකකි. සමාධි සම්බොජ්ක්ධංගය අනිකකි. (මෙහි 157 ඡේදය යොදන්න.)

**163.** එළඹ සිටීම් ස්වභාවය අර්ථ නමි. විමසීම් ස්වභාව අර්ථ නමි. එසවීම් ස්වභාවය අර්ථ නමි. පැතිරීම් ස්වභාවය අර්ථ නමි. සංසිඳීම් ස්වභාවය අර්ථ නමි. නොවිසිරයාම් ස්වභාවය අර්ථ නමි. මැදහත්ව බැලීම් ස්වභාවය අර්ථ නමි. එළඹසිටීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. විමසීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. එසවීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. පැතිරීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. සංසිඳීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. නොවිසිරීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. මැදහත්ව බැලීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. (මෙහි 159 ඡේදය යොදන්න.)

**164.** ධර්ම සත දක්වනු පිණිස වචන වෙත්. අර්ථ සත දක්වනු පිණිස වචන වෙත්. ධර්ම සත දක්වන වචන අන්‍යයෝ්ය. අර්ථ සත දක්වන වචන අන්‍යයෝ්ය. (මෙහි 160 (ii) යොදන්න.)

**165.** ධර්ම සතෙහි ඥාණ සතකි. අර්ථ සතෙහි ඥාණ සතකි. තුදුස් වචනයන්හි ඥාණ තුදුසකි. ධර්මයන්හි ඥාණ අන්‍යයෝ්ය. අර්ථයන්හි ඥාණ අන්‍යයෝ්ය. වචනයන්හි ඥාණ අන්‍යයෝ්ය. (මෙහි 161 (ii) යොදන්න.)

**166.** සම්‍යක්දෘෂ්ටිය ධර්ම නමි. සම්‍යක් සංකල්පය ධර්ම නමි. සම්‍යක් වචනය ධර්ම නමි. සම්‍යක් කර්මාන්තය ධර්ම නමි. සම්‍යක් ආජීවය ධර්ම නමි. සම්‍යක් ව්‍යායාමය ධර්ම නමි. සම්‍යක් ස්මෘතිය ධර්ම නමි. සම්‍යක් සමාධිය ධර්ම නමි. සම්‍යක් දෘෂ්ටි ධර්මය අනිකකි. සම්‍යක් සංකල්ප ධර්මය අනිකකි. සම්‍යක් වචන ධර්මය අනිකකි. සම්‍යක් කර්මාන්ත ධර්මය අනිකකි. සම්‍යක් ව්‍යායාම ධර්මය අනිකකි. සම්‍යක් ආජීව ධර්මය අනිකකි. සම්‍යක් ව්‍යායාම ධර්මය අනිකකි. සම්‍යක් ස්මෘති ධර්මය අනිකකි. සම්‍යක් සමාධි ධර්මය අනිකකි. (මෙහි 157 ඡේදය යොදන්න.)

**167.** දැකීම් ස්වභාවය අර්ථ නමි. අරමුණට නැංවීම් ස්වභාවය අර්ථ නමි. වැළඳගැනීම් ස්වභාවය අර්ථනමි.

මනාකොට පිහිටුවීම් ස්වභාවය අර්ථනමි. පිරිසිඳුවීම් ස්වභාවය අර්ථනමි. එසවීම් ස්වභාවය අර්ථ නමි. එළඹ සිටීම් ස්වභාවය අර්ථ නමි. නොවිසිරයාම් ස්වභාවය අර්ථ නමි. දැකීම් ස්වභාවය වූ අර්ථය අනිකකි. අරමුණට නැංවීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. වැළඳගැනීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. මනා කොට පිහිටුවීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. පිරිසිඳුවීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. එසවීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. එළඹ සිටීම් ස්වභාවයවූ අර්ථය අනිකකි. නොවිසිරයාම් ස්වභාවයවූ අර්ථය අනිකකි. (මෙහි 159 ඡෙදය යොදන්න.)

**168.** ධර්ම අට දක්වනු පිණිස වචන වෙත්. අර්ථ අට දක්වනු පිණිස වචන වෙත්. ධර්මයන් දක්වන වචන අන්‍යයෝය. අර්ථයන් දක්වන වචන අන්‍යයෝය. (මෙහි 160 (ii) යොදන්න.)

**169.** ධර්ම අටෙහි ඥාණ අටකි. අර්ථ අටෙහි ඥාණ අටකි. වචන සොළසෙහි ඥාණ සොළසකි. ධර්මයන්හි ඥාණයෝ අන්‍යයෝය. අර්ථයන්හි ඥාණයෝ අන්‍යයෝය. වචනයන්හි ඥාණ අන්‍යයෝය. (මෙහි 161 (ii) යොදන්න) එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් වෙන්වූයේ අර්ථයෙන් දැනීමෙහි ප්‍රඥාව අර්ථ පටිසම්භිදා ඥාණයයිද වෙන් වෙන්වූ ධර්මයන් දැනීමෙහි ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඥාණයයිද වෙන් වෙන්වූ වචන දැනීමෙහි ප්‍රඥාව නිරුත්තිපටිසම්භිදා ඥාණයයිද වෙන් වෙන්වූ ඥාණයන් දැනීමෙහි ප්‍රඥාව පටිභාන පටිසම්භිදාඥාණ යයිද කියනු ලැබේ.

**170.** කෙසේ නම් වෙන් වෙන්වූ විසුම්හි ප්‍රඥාව විහාරට්ඨ ඥාණය නම් වේද? වෙන් වෙන්වූ සමවැදුම්හි ප්‍රඥාව සමාපත්තට්ඨඥාණය නම් වේද, වෙන් වෙන්වූ විසුම් සමවැදුම්හි ප්‍රඥාව විහාර සමාපත්තට්ඨ ඥාණය නම් වේද? සංස්කාර නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්තයයි කියනලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇතිහෙයින් (සංස්කාර නිමිත්ත නුවණින්) ස්පර්ශකොට අනිත්‍යය බලයි. මෙය අනිමිත්ත විහාර නමි. තෘෂ්ණා ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්පණිහිත යයි

කියනලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇති හෙයින් (සංස්කාර ධර්මය නුවණින්) ස්පර්ශකොට අනිත්‍යය බලයි. මෙය අප්පණිහිත විහාර නමි. ආත්මවසයෙන් ගැනීම භය වශයෙන් දක්නේ සුඤ්ඤතයයි කියනලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් (සංස්කාර ධර්මය නුවණින්) ස්පර්ශකොට බලයි. මෙය සුඤ්ඤත විහාර නමි.

**171.** සංස්කාර නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත සංඛ්‍යාත නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් පැවැත්මෙහි මැදහත්ව අනිමිත්තවූ නිර්වාණය ආවර්ජනා කොට (ඵලයට) සමවදියි. මෙය අනිමිත්ත සමාපත්ති නමි. තෘෂ්ණා ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්පණිහිත සංඛ්‍යාත නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් පැවැත්මෙහි මැදහත් බව අප්පණිහිතවූ නිරොධයවූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියි. මෙය අප්පණිහිත සමාපත්ති නමි. ආත්ම වශයෙන් ගැනීම භය වශයෙන් දක්නේ සුඤ්ඤතයයි කියනලද නිර්වාණයෙහි නැමුණුහෙයින් පැවැත්මෙහි මැදහත්ව සුඤ්ඤතවූ නිරොධයවූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියි. මෙය සුඤ්ඤත සමාපත්ති නමි.

**172.** සංස්කාර නිමිත්ත භව වශයෙන් දක්නේ අනිමිත්තෙහි නැමුණු සිත් ඇති බැවින් (සංස්කාරයන් නුවණින් ස්පර්ශකොට අනිත්‍යය බලයිද පැවැත්මෙහි මැදහත්ව අනිමිත්තවූ නිරොධයවූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියිද මෙය අනිමිත්තවිහාර සමාපත්ති නමි. ප්‍රණිධිය භව වශයෙන් දක්නේ අප්පණිහිත නිර්වාණයෙහි නැමුණු සිත් ඇති හෙයින් (නුවණින් සංස්කාරයන්) ස්පර්ශ කොට බලයිද පැවැත්මෙහි මැදහත්ව අප්පණිහිතවූ නිරොධයවූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියිද මෙය අප්පණිහිත විහාර සමාපත්ති නමි. ආත්ම වශයෙන් ගැන්ම භයවශයෙන් දක්නේ සුඤ්ඤත නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් (නුවණින් සංස්කාරයන්) ස්පර්ශකොට අනිත්‍යය බලයිද, පැවැත්මෙහි මැදහත්ව සුඤ්ඤතවූ නිරොධයවූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියිද මෙය සුඤ්ඤත විහාර සමාපත්ති නමි.

173. රූප නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත නිර්වාණයෙහි නැමුණු බැවින් (නුවණින් රූප සංස්කාරය) ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍යය බලයි. මෙය අනිමිත්ත විහාර නමි. රූප ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්පණි හිත නිර්වාණයෙහි නැමුණු බැවින් (රූප සංස්කාරයන් නුවණින්) ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍ය බලයි. මෙය අප්පණිහිත විහාර නමි. රූපය ආත්ම වශයෙන් ගැනීම භය වශයෙන් දක්නේ සුඤ්ඤත නිර්වාණයෙහි නැමුණු බැවින් (රූප සංස්කාරයන් නුවණින්) ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍යය බලයි. මෙය සුඤ්ඤත විහාරනමි. රූප නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත නිර්වාණයෙහි නැමුණු බැවින් පැවැත්මෙහි මැදහත්ව නිරොධයවූ අනිමිත්ත නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියි. මෙය අනිමිත්ත සමාපත්ති නමි. රූප ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්පණිහිත නිර්වාණයෙහි නැමුණු බැවින් පැවැත්මෙහි මැදහත්ව නිරොධයවූ අප්පණිහිත නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියි. මෙය අප්පණිහිත සමාපත්ති නමි. රූපය ආත්ම වශයෙන් ගැනීම භය වශයෙන් දක්නේ සුඤ්ඤත නිර්වාණයෙහි නැමුණු බැවින් පැවැත්මෙහි මැදහත්ව නිරොධය වූ සුඤ්ඤත නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියි. මෙය සුඤ්ඤත සමාපත්ති නමි.

රූප නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත නිර්වාණයෙහි නැමුණු බැවින් සංස්කාරය ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍යය බලයිද, පැවැත්මෙහි මැදහත්ව නිරොධයවූ අනිමිත්ත නිර්වාණය ආවර්ජනාකොට සමවදියිද මෙය අනිමිත්ත විහාර සමාපත්ති නමි. රූප ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්පණිහිත නිර්වාණයෙහි නැමුණු බැවින් ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍යය බලයිද, පැවැත්මෙහි මැදහත්ව නිරොධයවූ අප්පණිහිත නිර්වාණය ආවර්ජනාකොට සමවදියිද මෙය අප්පණිහිත විහාර සමාපත්ති නමි. රූපය ආත්ම වශයෙන් ගැනීම භය වශයෙන් දත්තේ සුඤ්ඤත නිර්වාණයෙහි නැමුණු බැවින් ස්පර්ශකොට ස්පර්ශකොට අනිත්‍යය බලයිද, පැවැත්මෙහි මැදහත්ව නිරොධය වූ සුඤ්ඤත නිර්වාණය

ආවර්ජනාකොට සමවදියි. මෙය සුඤ්ඤත විහාර සමාපත්ති නමි.

**174.** වෙදනා නිමිත්ත (මෙහි 173 ඡෙදයේ 'රූප' වෙනුවට 'වේදනාව' ආදී මෙහි දක්වන වචන යොදා ඒ ඡෙදය ඒ වචන අගට යෙදිය යුතුයි.) 'සඤ්ඤා නිමිත්ත' - 'සංඛාර නිමිත්ත'- 'විඤ්ඤාණ නිමිත්ත'- 'ඇසනිමිත්ත' - 'කණ නිමිත්ත' - 'නාසය නිමිත්ත'- 'දිව නිමිත්ත'- 'කය නිමිත්ත' - 'සිත නිමිත්ත'- ජරාමරණ නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත නිර්වාණයෙහි නැමුණු බැවින් ස්පර්ශකොට ස්පර්ශකොට බලයි. (මෙහි 173 ඡෙදයේ 'රූප' වෙනුවට 'ජරාමරණය' නිමිත්ත යොදනු.) අනිමිත්ත විහාරය අනිකකි. අප්පණිහිත විහාරය අනිකකි. සුඤ්ඤත විහාර අනිකකි. අප්පණිහිත විහාර සමාපත්තිය අනිකකි. අනිමිත්ත සමාපත්තිය අනිකකි. අප්පණිහිත සමාපත්තිය අනිකකි. සුඤ්ඤත සමාපත්තිය අනිකකි. අනිමිත්ත විහාර සමාපත්තිය අනිකකි. සුඤ්ඤත විහාර සමාපත්තිය අනිකකි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් වෙන් වෙන්වූ විසුම්හි ප්‍රඥාව විහාරට්ඨ ඥාණයයි ද වෙන් වෙන්වූ සමවැදුම්හි ප්‍රඥාව සමාපත්තට්ඨ ඥාණයයිද වෙන් වෙන්වූ විසුම් හා සමවැදුම්හි ප්‍රඥාව විහාර සමාපත්තට්ඨ ඥාණයයිද කියනු ලැබේ.

**175.** කෙසේ නම් සමාධියගේ පිරිසිදු බව හෙතුකොට ගෙන ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරික සමාධියෙහි (අනතුරුවම ඵලය උපදවන මාර්ග සමාධියෙහි ඥාණය නම් වේද? කාමයන් කෙරෙන් නික්මීම් වශයෙන් සිතේ එකග බව නොවිසිරයාම සමාධි නමි. ඒ සමාධිහුගේ වශයෙන් මාර්ග ඥානය උපදියි. ඒ ඥාණයෙන් ආශ්‍රවයෝ ක්ෂය වෙත්. මෙසේ සමථය පළමු උපදියි. ඥාණය පසුව උපදියි. ඒ ඥාණයෙන් ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි. එහෙයින් සමාධියෙන් පිරිසිදුබව හෙතුකොට ගෙන ආශ්‍රවයෝ ක්ෂය කිරීමෙහි ප්‍රඥාව අනන්තරික සමාධියෙහි (අනතුරුවම ඵලය උපදවන මාර්ග සමාධියෙහි ඥාණයයි කියනු ලැබේ.

**176.** ආශ්‍රව යන මෙහි ඒ ආශ්‍රවයෝ නම් කවරහුද? කාමාසවයද, භවාසවයද, දිට්ඨි ආසවයද, අවිජ්ජාසවයද වෙත්. ඒ ආශ්‍රවයෝ කොතැන්හි ක්ෂය වෙත්ද? සොතාපත්ති මාර්ගයෙන් නිරවශෙෂ (ඉතිරි නොවූ) දිට්ඨි ආශ්‍රවය ක්ෂයවෙයි. අපායෙහි හෙළන කාමාසවය ක්ෂය වෙයි. අපායෙහි හෙළන භවාසවය ක්ෂය වෙයි. අපායෙහි හෙළන අවිජ්ජාසවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්. සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරික කාමාශ්‍රවය ක්ෂය වෙයි. ඒ හා සමග පවත්නා භවාසවය ක්ෂය වෙයි. ඒ හා සමග පවත්නා අවිජ්ජාසවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්. අනාගාමි මාර්ගයෙන් ඉතිරිවූ කාමාශ්‍රවය ක්ෂයවෙයි. ඒ හා සමග පවත්නා භවාසවය ක්ෂයවෙයි. ඒ හා සමග පවත්නා අවිජ්ජාසවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂයවෙත් අර්හත් මාර්ගයෙන් ඉතිරි නොකොට භවාසවය ක්ෂය වෙයි. ඉතිරි නොකොට අවිජ්ජාසවය ක්ෂයවෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

**177.** ව්‍යාපාදයෙන් වෙන්වීම් වශයෙන් ආලොක සංඥාවගේ වශයෙන් සමාධි වශයෙන් ධර්මයන් පිරිසිඳීම් වශයෙන් ඥාණයාගේ වශයෙන් ප්‍රමොද්‍යයාගේ වශයෙන් පඨමජ්ක්ධාන වශයෙන් දුතියජ්ක්ධාන වශයෙන් තතියජ්ක්ධාන වශයෙන් චතුත්ථජ්ක්ධාන වශයෙන් ආකානඤ්චායතන සමාපත්ති වශයෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්ති වශයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති වශයෙන් පඨවිකසිණ වශයෙන් ආපොකසිණ වශයෙන් තෙජොකසිණ වශයෙන් වායොකසිණ වශයෙන් නීලකසිණ වශයෙන් පීතකසිණ වශයෙන් ලොහිත කසිණ වශයෙන් ඔදාතකසිණ වශයෙන් ආකාසකසිණ වශයෙන් විඤ්ඤාණකසිණ වශයෙන් බුද්ධානුස්සති වශයෙන් ධම්මානුස්සති වශයෙන් සංඝානුස්සති වශයෙන් සීලානුස්සති වශයෙන් චාගානුස්සති වශයෙන් දෙවතානුස්සති වශයෙන් ආනාපාන වශයෙන් මරණ සති වශයෙන් කායගතාසති වශයෙන් උපසමානුස්සති වශයෙන් උද්ධුමාතක සඤ්ඤා වශයෙන් විනීලක සඤ්ඤා වශයෙන්

විපුබ්බක සඤ්ඤා වශයෙන් විච්ඡිද්දක වශයෙන් වික්ඛායිතක සඤ්ඤා වශයෙන් වික්ඛිත්තක සඤ්ඤා වශයෙන් හතවික්ඛිත්තක සඤ්ඤා වශයෙන් ලොහිතක සඤ්ඤා වශයෙන් පුළවක සඤ්ඤා වශයෙන් අට්ඨික සඤ්ඤා වශයෙන් දීර්ඝ ආශ්වාසයාගේ දීර්ඝ ප්‍රශ්වාසයාගේ වශයෙන් හ්‍රස්ව ආශ්වාසයාගේ වශයෙන් හ්‍රශ්ව ප්‍රශ්වාසයාගේ වශයෙන් සියලු ආශ්වාස කය දැන ගනිමින් කරන ආශ්වාසයාගේ වශයෙන් සියලු ප්‍රශ්වාසකය දැනගනිමින් කරන ප්‍රශ්වාසයාගේ වශයෙන් කාය සංඛාරය සංසිඳවමින් කරන ආශ්වාසයාගේ වශයෙන් කාය සංඛාරය සංසිඳවමින් කරන ප්‍රශ්වාසයාගේ වශයෙන් ප්‍රීතිය දැනගනිමින් පවත්නා අශ්වාසයාගේ වශයෙන් ප්‍රීතිය දැනගනිමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් සුඛය දැනගනිමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්ත සංඛාරයන් දැනගනිමින් පවත්නා ආශ්වාසයාගේ වශයෙන් චිත්ත සංඛාරය දැනගනිමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තසංඛාරය සංසිඳවමින් පවත්නා ආශ්වාසයාගේ වශයෙන් චිත්තසංඛාරය සංසිඳවමින් පවත්නා ආශ්වාසයාගේ වශයෙන් චිත්තසංඛාරය සංසිඳවමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් සිත ප්‍රකට කරන්නාවූ ආශ්වාසයාගේ වශයෙන් සිත ප්‍රකට කරන්නාවූ ප්‍රශ්වාසයාගේ වශයෙන් සිත සතුටු කරමින් පවත්නා ආශ්වාසයාගේ වශයෙන් සිත සතුටු කරමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් සිත සමාධියට පමුණුවමින් පවත්නා ආශ්වාසයාගේ වශයෙන් සිත සමාධියට පමුණුවමින් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් සිත නීවරණය කෙරෙන් මුදවමින් අනිත්‍ය වශයෙන් බලමින් කලකිරීම් වශයෙන් භංග වශයෙන් බලමින් (ii) අත්හැරීම් වශයෙන් (වුට්ඨානගාමිනී විදර්ශනා වශයෙන්) පවත්නා ආශ්වාසයාගේ වශයෙන් අත්හැරීම් වශයෙන් පවත්නා ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නම්. ඒ සමාධියගේ වශයෙන් මාර්ගඥානය උපදියි. ඒ ඤාණයෙන් ආශ්‍රවයෝ ක්ෂයවෙත්. මෙසේ පළමු සමථයවේ. පසුව ඤාණය වෙයි. ඒ ඤාණයෝ ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිණිස වෙයි. එහෙයින් සමාධියගේ පිරිසිදුබව හෙතුකොට ගෙන ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව

ආනන්තරිය සමාධියෙහි ඤාණයයි කියනු ලැබේ. (මෙහි 176 ඡේදය යොදාගත යුතුයි.) එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් සමාධියගේ පිරිසිදු බව නිසා ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරිය සමාධියෙහි ඤාණයයි කියනු ලැබේ.

178. කෙසේ නම් දැකීම් (විදර්ශනා ඥානය) අධිපති කොට ඇත්තාවූද ශාන්තවූ විදර්ශනා විහාරයට පැමිණීමවූද ප්‍රණීතවූ ඵල සමාපත්තියට නැමී පවත්නාවූද ප්‍රඥාව අරණ විහාර ඤාණය නම් වේද? දැකීම් අධිපතිකොට ඇති යන මෙහි අනිච්චානුපස්සනාව දැකීම අධිපතිකොට ඇත්තේ වෙයි. දුක්ඛානුපස්සනාව දැකීම් අධිපතිකොට ඇත්තේ වෙයි. අනත්තානුපස්සනාව දැකීම් අධිපතිකොට ඇත්තේ වෙයි. රූපයෙහි (ii) අනිච්චානුපස්සනාව දැකීම් අධිපති කොට ඇත්තේ වෙයි. රූපයෙහි දුක්ඛානුපස්සනාව දැකීම් අධිපතිකොට ඇත්තේ වෙයි. රූපයෙහි අනත්තානුපස්සනාව දැකීම් අධිපතිකොට ඇත්තේ වෙයි. (iii) වේදනාවෙහි (මෙහි (ii) යොදන්න) සඤ්ඤාවෙහි (ii) යොදන්න) සංඛාරයන්හි (ii) යොදන්න) විඤ්ඤාණයෙහි (ii) යොදන්න) ඇසෙහි (ii) යොදන්න) කණෙහි (ii) යොදන්න) නාසයෙහි (ii) යොදන්න) දිවෙහි (ii) යොදන්න) කයෙහි (ii) යොදන්න) සිතෙහි (ii) යොදන්න) ජරාමරණයෙහි (ii) යොදන්න)

179. ශාන්තවූ විහාරයට පැමිණීම යනු සුඤ්ඤත විහාරය ශාන්ත විහාරයට පැමිණීම නමි. අනිමිත්ත විහාරයට ශාන්ත විහාරයට පැමිණීම නමි. අප්පණිහිත විහාරය ශාන්ත විහාරයට පැමිණීම නමි. ප්‍රණීතවූ ඵල සමාපත්තියෙහි නැමී පැවැත්ම (පණීතාධිමුත්තතා) යනු සුඤ්ඤත ඵල සමාපත්තියෙහි නැමී පැවැත්ම පණීතාධිමුත්තතා නමි. අනිමිත්ත ඵල සමාපත්තියෙහි නැමී පැවැත්ම පණීතාධිමුත්තතා නමි. අප්පණිහිත ඵල සමාපත්තියෙහි නැමී පැවැත්ම පණීතාධිමුත්තතා නමි.

180. අරණ විහාර යනු ප්‍රථමධ්‍යානය අරණ විහාර නමි. ද්විතීය ධ්‍යානය අරණ විහාර නමි. තෘතියධ්‍යානය අරණ විහාර නමි. චතුර්ථධ්‍යානය අරණ විහාර නමි. ආකාසානඤ්චායතන

සමාපත්තිය අරණ විහාර නම්. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය අරණ විහාර නම්. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය අරණ විහාර නම්. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය අරණ විහාර නම්.

181. අරණ විහාර යන මෙහි කවර අර්ථයකින් අරණ විහාර නම් වේද? (ii) ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් පහ කෙරේනුයි අරණ විහාර නම්. ද්විතීය ධ්‍යානයෙන් විතර්ක විචාරයන් පහකෙරේනුයි අරණ විහාර නම්. තෘතිය ධ්‍යානයෙන් ප්‍රීතිය පහ කරේනුයි අරණ විහාරය නම්. චතුර්ථධ්‍යානයෙන් සුඛ දුක්ඛයන් පහකෙරේනුයි අරණ විහාර චතුර්ථධ්‍යානයෙන් සුඛ දුක්ඛයන් පහකෙරේනුයි අරණ විහාර නම්. (iii) ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූපසඤ්ඤාව පටිඝ සඤ්ඤාව නානත්තසඤ්ඤාව පහ කෙරේනුයි අරණ විහාර නම්. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සඤ්ඤාව පහ කෙර්නුයි අරණ විහාර නම්. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාව පහ කෙරේනුයි අරණ විහාර නම්. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව පහ කෙරේනුයි අරණ විහාර නම්. මෙය අරණ විහාරයයි. එය දැකීම අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් දැකීම් අධිපතිකොට ඇති ශාන්තවූ විහාරයට පැමිණීමවූ ප්‍රණීතවූ ඵලයට නැමී පවත්නා ප්‍රඥාව අරණ විහාරයෙහි ඤාණයයි කියනු ලැබේ.

182. කෙසේ නම් දෙවැදෑරුම් බලයන් යුක්තවූ හෙයින් ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීමෙන් සොළොස් ඤාණ චරියාවෙන් හා නවවිධ සමාධි චරියාවෙන් වසී බවට (පුරුදු කළ බවට) පැමිණි ප්‍රඥාව නිරොධ සමාපත්ති ඤාණ නම් වේද? දෙවැදෑරුම් බලයන්ගෙන් යන මෙහි සමථ විදර්ශනා බලයයි බල දෙකකි. සමථබලය කවරේද? නෛෂ්ක්‍රම්‍ය වශයෙන් චිත්තයාගේ එකග බවවූ සමාධිය සමථබල නම්. අව්‍යාපාද වශයෙන් චිත්තයාගේ එකග බවවූ සමාධිය සමථබල නම්.

ආලොකසඤ්ඤා වශයෙන් චිත්තයාගේ එකඟ බවවූ සමාධිය සමථ බල නමි. අවික්ෂෙප වශයෙන් චිත්තයාගේ එකඟ බවවූ සමාධිය සමථබල නමි. (මෙහි 177 ඡෙදයේ ඤාණයාගේ වශයෙන් යන තැන සිට (ii) සලකුණ දක්වා යොදන්න) අත්හැරීම බලමින් ආශ්වාස කිරීම් වශයෙන් චත්තයාගේ එකඟ බවවූ සමාධිය සමථ බල නමි. අත්හැරීම බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බවවූ සමාධිය සමථ බල නමි.

183. සමථ බලය යන මෙහි කිනම් අර්ථයකින් සමථ බල නම් වේද? ප්‍රථමධ්‍යානය කරණකොට නීවරණයන්ම කම්පා නොවන හෙයින් සමථ බල නමි. ද්විතීයධ්‍යානය කරණකොට විතර්ක විචාරයන්හි කම්පා නොවන හෙයින් බල නමි. තෘතියධ්‍යානය කරණකොට ප්‍රීතියෙහි කම්පා නොවන හෙයින් සමථ බල නමි. චතුර්ථධ්‍යානයෙන් සුඛ දුක්ඛයන්හි කම්පා නොවන හෙයින් සමථ බල නමි. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූපසඤ්ඤාවෙහිද පටිඝසඤ්ඤාවෙහිද නානත්ත සඤ්ඤාවෙහිද කම්පා නොවන හෙයින් සමථ බල නමි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සඤ්ඤාවෙහි කම්පා නොවන හෙයින් සමථ බල නමි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාවෙහි කම්පා නොවන හෙයින් සමථ බල නමි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාවෙහි කම්පා නොවන හෙයින් සමථ බල නමි.

184. උද්ධච්චයද උද්ධච්චය හා යෙදුණාවූ ක්ලේශයන්ද උද්ධච්චය හා යෙදුණාවූ සතර නාමස්කන්ධයන් කරණකොට කම්පා නොවෙයි. නොසෙල්වෙයි. නොවැනෙයි. එහෙයින් සමත බල නමි. මේ සමථ බලයයි. විපස්සනා බලය කවරේද? (ii) අනිච්චානුපස්සනාව විපස්සනා බල නමි. දුක්ඛානුපස්සනාව විපස්සනා බල නමි. අනත්තානුපස්සනාව විපස්සනා බල නමි. නිබ්බිදානුපස්සනාව විපස්සනා බල නමි. විරාගානුපස්සනාව විපස්සනා බල නමි. නිරොධානුපස්සනාව විපස්සනා බල නමි.

පටිනිස්සග්ගානුපස්සනාව විපස්සනා බල නම්. (iii) රූපයෙහි අනිච්චානුපස්සනාව විපස්සනානු බල නම්. (මෙහි (ii) යොදන්න) වෙදනාවෙහි (ii යොදන්න) සඤ්ඤාවෙහි (ii) යොදන්න) සංඛාරයන්හි (ii යොදන්න) විඤ්ඤාණයෙහි (ii) යොදන්න) ඇසෙහි (ii) යොදන්න) කණ (ii) යොදන්න) නාසය (ii යොදන්න) දිව (ii යොදන්න) කය (ii යොදන්න) සිත (ii යොදන්න) ජරාමරණයෙහි (ii යොදන්න)

185. විපස්සනා බල යන මෙහි කිනම් අර්ථයකින් විපස්සනා බල නම්වේද? (ii) අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥාවෙහි කම්පානොවන හෙයින් විපස්සනා බල නම්. දුක්ඛානුපස්සනාවෙන් සුඛ සංඥාවෙහි කම්පා නොවන හෙයින් විපස්සනා බල නම්. අනත්තානුපස්සනාවෙන් ආත්ම සංඥාවෙහි කම්පා නොවන හෙයින් විපස්සනා බල නම්. නිබ්බිදානුපස්සනාවෙන් ප්‍රීතිසහගත ඇල්මෙහි කම්පා නොවන හෙයින් විපස්සනා බල නම්. විරාගානුපස්සනාවෙන් රාගයෙහි කම්පා නොවන හෙයින් විපස්සනා බල නම්. නිරොධානු පස්සනාවෙන් සමුදයයෙහි කම්පානොවන හෙයින් විපස්සනා බල නම්. පටිනිස්සග්ගානුපස්සනාවෙන් අල්වාගැනීමෙහි කම්පා නොවන හෙයින් විපස්සනා බල නම් (iii) අවිද්‍යාවෙද අවිද්‍යාසහගත ක්ලේශයන්ද අවිද්‍යා සහගත ස්කන්ධයන්ද කරණකොට කම්පා නොවෙයි. නොසැලෙයි. නොවැනෙයි. එහෙයින් විපස්සනා බල නම්. මෙය විපස්සනා බල නම්. ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීමෙන් යන මෙහි කවර ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීමෙන්ද ද්විතීය ධ්‍යානයට සමවැදුණහුගේ විතර්ක විචාර යන වාක් සංස්කාරයෝ සංසිඳුණාහුවෙති. චතුර්ථධ්‍යානයට සමවැදුණුගේ ආශ්වාස ප්‍රශ්වාස සංඛ්‍යාත කාය සංස්කාරයෝ සංසිඳුණාහුවෙති. සංඥාවගේද වෙදනාවගේද නිරොධයට සමවැදුණහුගේ සඤ්ඤා වෙදනා චිත්ත සංස්කාරයෝ සංසිඳුණාහු වෙති. මේ ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීමකි.

186. සොළොස් ඥාණ චරියාවන්ගෙන් යන මෙහි කවර සොළොස් ඥාණ චරියාවන්ගෙන්ද? අනිච්චානුපස්සනාව

ඤාණචරියා නම්. දුක්ඛානුපස්සනාව ඤාණචරියා නම්. අනත්තානුපස්සනාව ඤාණචරියානම්. නිබ්බිදානුපස්සනාව ඤාණචරියා නම්. විරාගානුපස්සනාව ඤාණචරියා නම්. නිරොධානුපස්සනාව ඤාණචරියා නම්. පටිනිස්සග්ගානුපස්සනාව ඤාණචරියා නම්. විවට්ටානුපස්සනාව ඤාණචරියා නම්. සොතාපත්ති මාර්ගය ඤාණචරියා නම්. සොතාපත්ති ඵලසමාපත්තිය ඤාණචරියා නම්. සකෘදාගාමි මාර්ගය ඤාණචරියා නම්. සකෘදාගාමි ඵලසමාපත්තිය ඤාණචරියා නම්. අනාගාමි මාර්ගය ඤාණචරියා නම්. අනාගාමි ඵල සමාපත්තිය ඤාණචරියා නම්. අර්හත් මාර්ගය ඤාණචරියා නම්. අර්හත්ඵල සමාපත්තිය ඤාණචරියා නම්. මේ සොළොස් ඤාණචරියාවන්ගේ ලැබීම වෙයි.

187. නවවිධ සමාධිචරියාවන්ගෙන් යන මෙහි කවර නවවිධ සමාධි චරියාවන්ගෙන්ද යත්? ප්‍රථම ධ්‍යානය සමාධි චරියා නම්. ද්විතීය ධ්‍යානය සමාධිචරියා නම්. තෘතිය ධ්‍යානය සමාධිචරියා නම්. චතුර්ථ ධ්‍යානය සමාධිචරියා නම්. ආකාසානඤ්චායතන සමාපත්තිය සමාධිචරියා නම්. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය සමාධිචරියා නම්. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය සමාධිචරියා නම්. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය සමාධිචරියා නම්. ප්‍රථම ධ්‍යානයට පැමිණීම පිණිස (ii) විතර්කයද විචාරයද ප්‍රීතියද සුඛයද එකාග්‍රතාවද ද්විතිය ධ්‍යානයට පැමිණීම පිණිස (මෙහි ii) තෘතීය ධ්‍යානයට පැමිණීම පිණිස (මෙහි ii) චතුර්ථ ධ්‍යානයට පැමිණීම පිණිස (මෙහි ii) ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණීම පිණිස (මෙහි ii) විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණීම පිණිස (මෙහි ii) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණීම පිණිස (මෙහි ii) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පැමිණීම පිණිස විතර්කයද විචාරයද ප්‍රීතියද සුඛයද එකාග්‍රතාවද යන උපචාර ධ්‍යානය සමාධිචරියා නම්. මේ නව වැදෑරුම් සමාධිචරියා වන්ගෙන් වසී යන මෙහි වසීහු පසකි. ආවජ්ජන වසී, සමාපජ්ජන වසී අධිට්ඨාන වසී, වුට්ඨාන වසී, පච්චවෙක්ඛණ වසී, යන මොහුය.

188. ප්‍රථම ධ්‍යානයට යම් තැනක කැමතිද යම් කලෙක කැමතිද යම්තාක් කැමතිද ඒවූ පරිදි ආවර්ජනා කරයි. ආවර්ජනයෙහි කල්ගතවීමක් නැත්තේනුයි ආවජ්ජන වසී නම්. ප්‍රථම ධ්‍යානයට යම් තැනක කැමතිද යම් විටක කැමතිද යම්තාක් කැමතිද ඒවූ පරිදි සමවදියි. සමවැදීමෙහි කල්පසුවීමක් නැති හෙයින් සමාපජ්ජන වසී නම්. ප්‍රථම ධ්‍යානය යම්තැන යම් විටෙක යම්තාක් කැමතිද ඒවූ පරිදි අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨානයෙහි කල්පසුවීමක් නැති හෙයින් අධිට්ඨාන වසී නම්. ප්‍රථම ධ්‍යානයෙන් යම් තැනක යම් විටෙක යම්තාක් කැමතිද ඒවූ පරිදි නැගිටියි. නැගිටීමෙහි කල්පසුවීමක් නැති හෙයින් අධිට්ඨාන වසී නම්. ප්‍රථම ධ්‍යානය (ii) යම් තැනෙක යම් විටෙක යම්තාක් කැමතිද ඒවූ පරිදි ආවර්ජනා කරයි. ආවර්ජනය කිරීමෙහි කල්පසුවීමක් නැති හෙයින් ආවර්ජන වසී නම්.

189. ද්‍රුතිය ධ්‍යානය (188 ඡේදයේ (ii) යොදනු) තෘතීය ධ්‍යානය (188 (ii) චතුර්ථ ධ්‍යානය (188 (ii) ආකාසානඤ්චායතන සමාපත්තිය (188 (ii) විඤ්ඤානඤ්චායතන සමාපත්තිය (188 (ii) ආකිඤ්චායතන සමාපත්තිය (188 (ii) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය (188 ඡේදයේ (ii) යොදනු) ප්‍රථම ධ්‍යානය වෙනුවට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය කියා යොදා ගතයුතුයි.)

මේ වසී පස වෙති. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් දෙවදෑරුම් බලයෙන් යුක්තවූ හෙයින් ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීමෙන් සොළොස් ඤාණචරියාවන්ගෙන් හා නවවිධ සමාධි චාරියාවන්ගෙන් වසී බවට පැමිණියාවූ ප්‍රඥාව නිරොධ සමාපත්ති ඤාණයයි කියනු ලැබේ. කෙසේ නම් වනාහි දන්නා නුවණින් යුක්තවූවහුගේ ක්ලේශයන්ගේ හා ස්කන්ධයන්ගේ පැවැත්ම කෙළවර කිරීමෙහි ප්‍රඥාව පරිනිබ්බාණ ඤාණ නම් වේද?

190. මේ ශාසනයෙහි මනා නුවණින් යුක්තවූ තැනැත්තේ ධ්‍යානයෙන් කාමච්ඡන්දයාගේ පැවැත්ම කෙළවර කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැවැත්ම කෙළවර කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආලෝක සංඥාවෙන් ථිනමිද්ධයාගේ පැවැත්ම කෙළවර කරයි. සමාධියෙන් උද්ධච්චයාගේ පැවැත්ම කෙළවර කරයි. ධර්මයන් පිරිසිඳ දැනීමෙන් විචිකිච්ඡාවගේ පැවැත්ම කෙළවර කරයි. ඥාණයෙන් අවිද්‍යාවගේ පැවැත්ම කෙළවර කරයි, සතුටෙන් නොඇල්ම කෙළවර කරයි. ප්‍රථමධ්‍යානයෙන් (ii) නීවරණයන්ගේ පැවැත්ම කෙළවර කරයි. (iii) ද්විතීයධ්‍යානයෙන් (මෙහි (ii) තෘතීය ධ්‍යානයෙන් (මෙහි (ii) චතුර්ථධ්‍යානයෙන් (මෙහි (ii) සෝවාන් මාර්ගයෙන් (මෙහි (ii) සකෘදාගාමි මාර්ගයෙන් (මෙහි (ii) අනාගාමි මාර්ගයෙන් (මෙහි (ii) ) අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශයන්ගේ පැවැත්ම කෙළවර කරයි. නොහොත් අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පාන්නාවූ මනා නුවණ ඇත්තහුගේ මේ චක්ෂුවගේ (iv) පැවැත්මද කෙළවර කරයි. අනික් චක්ෂුවගේ පැවැත්මද නොවෙයි. මේ ශ්‍රොතයාගේ පැවැත්මද කෙළවර කරයි. අනික් ශ්‍රොතයාගේ පැවැත්මද නොවෙයි. ඝ්‍රානයාගේ පැවැත්මද කෙළවර කරයි. අනික් ඝ්‍රානයකගේ පැවැත්මද නොවෙයි ජිව්හාවගේ පැවැත්මද කෙළවර කරයි. අනික් ජිව්හාවගේ පැවැත්මද නොවෙයි. කායයාගේ පැවැත්මද කෙළවර කරයි. අනික් කායයාගේ පැවැත්මද නොවෙයි. සිතේ පැවැත්මද කෙළවර කරයි. අනික් සිතකගේ පැවැත්මද නොවෙයි. මෙය මනාකොට දන්නහුගේ පැවැත්ම කෙළවර කිරීමෙහි ප්‍රඥාව පරිනිබ්බාණ ඥාණ නම්. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් මනාව දන්නහුගේ පැවැත්ම කෙළවර කිරීමෙහි ප්‍රඥාව පරිනිබ්බාණ ඥාණයයි කියනු ලැබේ.

**191.** කෙසේනම් සියලු ධර්මයන් මනාකොට සිඳීමෙහිද නිරුද්ධ කිරීමෙහිද නැවත නොඉපදීමෙහිද ප්‍රඥාව සමසීසට්ඨ ඥාණය නම්වේද, සියලු ධර්මයෝ නම් පඤ්චස්කන්ධයෝය. දොළොස් ආයතනයෝය, අටලොස් ධාතුහුය, කුශල ධර්මයෝය. අකුශල ධර්මයෝය, අබ්‍යාකත ධර්මයෝය, කාමාවචර ධර්මයෝය, රූපාවචර ධර්මයෝය. අරූපාවචර ධර්මයෝය, ලෝකොත්තර ධර්මයෝය යන මොහුය.

**192.** මනාකොට සිඳියි යන මෙහි නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයෙන් මනාකොට සිඳියි. ව්‍යාපාදයෙන් අව්‍යාපාදය මනාකොට සිඳියි, ආලොක සංඥාවෙන් ථිනමිද්ධය මනාකොට සිඳියි, සමාධියෙන් උද්ධච්චය මනාකොට සිඳියි, ධර්මයන් පිරිසිඳ දැනීමෙන් විචිකිච්ඡාව මනාකොට සිඳියි, ඥාණයෙන් අවිද්‍යාව මනාකොට සිඳියි. ප්‍රීතියෙන් නොඇල්ම මනාකොට සිඳියි, ප්‍රථම ධ්‍යානයෙන් (ii) නීවරණයන් මනාව සිඳියි ද්විතීයධ්‍යානයෙන් (මෙහි (ii) ) තෘතීයධ්‍යානයෙන් (මෙහි (ii) ) චතුර්ථධ්‍යානයෙන් (මෙහි (ii) ) සෝවාන් මාර්ගයෙන් (මෙහි (ii) ) සකෘදාගාමි මාර්ගයෙන් (මෙහි (ii) ) අනාගාමි මාර්ගයෙන් (මෙහි (ii) ) අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශයන් මනාව සිඳියි, නිරුද්ධ කරයි, යනු නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිරුද්ධ කරයි. ආලොක සඤ්ඤාවෙන් ථිනමිද්ධය නිරුද්ධ කරයි. සමාධියෙන් උද්ධච්චය නිරුද්ධ කරයි. ධර්මයන් පිරිසිඳ දැනිමෙන් විචිකිච්ඡාව නිරුද්ධ කරයි. ඥාණයෙන් අවිද්‍යාව නිරුද්ධ කරයි. ප්‍රීතියෙන් නොඇල්ම නිරුද්ධ කරයි. ප්‍රථම ධ්‍යානයෙන් (iii) නීවරණයන් නිරුද්ධ කරයි (ii) ද්විතීය ධ්‍යානයෙන් (මෙහි (iii) තෘතීය ධ්‍යානයෙන් (මෙහි (iii) ) චතුර්ථධ්‍යානයෙන් (මෙහි (iii) ) සෝවාන් මාර්ගයෙන් (මෙහි (iii) ) සකෘදාගාමි මාර්ගයෙන් (මෙහි (iii ) අනාගාමි මාර්ගයෙන් (මෙහි (iii) ) අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන් නිරුද්ධ කරයි.

**193.** නොඉපදීමෙහි යනු නෛෂ්ක්‍රම්‍යය ලැබුවහුට කාමච්ඡන්දය නූපදියි. අව්‍යාපාදය ලැබුවහුට ව්‍යාපාදය නූපදියි, ආලොක සංඥාව ලැබුවහුට ථිනමිද්ධය නූපදියි, සමාධිය ලැබුවහුට උද්ධච්චය නූපදියි. ධර්මයන් පිරිසිඳ දැනීම ලැබුවහුට විචිකිච්ඡාව නූපදියි. ඥාණය ලැබූවහුට අවිද්‍යාව නූපදියි. ප්‍රීතිය ලැබූවහුට නොඇල්ම නූපදියි. ප්‍රථම ධ්‍යානය ලැබූවහුට සස නීවරණයෝ නූපදියි. (iii) ද්විතීයධ්‍යානය ලැබූවහුට (මෙහි ii) ) තෘතීයධ්‍යානය ලැබූවහුට (මෙහි (ii) ) චතුර්ථධ්‍යානය ලැබූවහුට (මෙහි (ii) ) සෝවාන් මාර්ගය ලැබූවහුට (මෙහි (ii) ) සකෘදාගාමි

මාර්ගය ලැබූවහුට (මෙහි (ii) ) අනාගාමි මාර්ගය ලැබූවහුට (මෙහි (ii) ) අර්හත් මාර්ගය ලැබූවහුට සියලු ක්ලේශයෝ නූපදිත්.

**194.** සමසීසට්ඨ යන මෙහි සම යනු කාමච්ඡන්දය පහ කළ හෙයින් නෛෂ්ක්‍රම්‍යය සම නමි. ව්‍යාපාදය පහකළ හෙයින් අව්‍යාපාදය සම නමි. ථිනමිද්ධය පහකළ හෙයින් ආලොක සඤ්ඤාව සම නමි. උද්ධච්චය පහකළ හෙයින් සමාධිය සම නමි. විචිකිච්ඡාව පහකළ හෙයින් ධර්මයන් පිරිසිඳ දැනීම සම නමි. අවිද්‍යාව පහකළ හෙයින් ඥාණය සම නමි. නොඇල්ම පහකළ හෙයින් ප්‍රීතිය සම නමි. (ii) නීවරණයන් පහකළ හෙයින් (iii) ප්‍රථමධ්‍යානය සම නමි. (මෙහි (ii) ) ද්විතීයධ්‍යානය සම නමි (මෙහි (ii) ) තෘතීය ධ්‍යානය සම නමි. (මෙහි (ii) ) චතුර්ථධ්‍යානය සම නමි. (මෙහි (ii) ) සෝවාන් මාර්ගය සම නමි. (මෙහි (ii) සකෘදාගාමි මාර්ගය සම නමි. (මෙහි (ii) ) අනාගාමි මාර්ගය සම නමි. සියලු කෙලෙසුන් පහකළ හෙයින් අර්හත් මාර්ගය සම නමි. සීස යන මෙහි ශීර්ෂ තෙළසකි. තෘෂ්ණාව පළිබොධයට (නිවන් මග ඇවිරීමට) ශීර්ෂය වෙයි. මානය උසස්කොට සිතීම් වශයෙන් සසර බැඳීමට ශීර්ෂය වෙයි. දෘෂ්ටිය වරදවා ගැනීමට ශීර්ෂය වෙයි. උද්ධච්චය සිතේ විසිර යාමට ශීර්ෂය වෙයි. අවිද්‍යාව ක්ලේශයන්ට ශීර්ෂය වෙයි. ශ්‍රද්ධාව අධිමොක්ෂයට (ස්ථිරව සිතීමට) ශීර්ෂය වෙයි. වීර්යය සිත එසවීමට ශීර්ෂය වෙයි. සතිය අරමුණට එළඹ සිටීමට ශීර්ෂය වෙයි. සමාධිය සිත නොවිසිර යාමට ශීර්ෂය වෙයි. ප්‍රඥාව තත්වාකාර දැකීමට ශීර්ෂය වෙයි. ජිවිතෙන්ද්‍රිය උපාදානස්කන්ධයන්ගේ පැවැත්මට ශීර්ෂය වෙයි. විමොක්ෂය (නිර්වාණය) ආරම්මණ ශීර්ෂය වෙයි. නිරොධය (අනුපාදිශෙෂ නිර්වාණය) සියලු සංස්කාර ධර්මයන්ගේ ශීර්ෂය (කෙළවර) වෙයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් සියලු ධර්මයන් මනාකොට සිඳීමෙහිද නිරුද්ධ කිරීමෙහිද නොඉපදීමෙහිද ප්‍රඥාව සමසීසට්ඨ ඥාණයයි කියනු ලැබේ.

**195.** කෙසේ නම් ලොකොත්තර ධර්මයන් හා මිශ්‍ර නොවූ හෙයින් පුථු නම්වූ ක්ලේශයන්ගේද නොයෙක් ස්වභාව ඇති

ධර්මයන්ගේ හා එකම ස්වභාව ඇති ධර්මයන්ගේද (තැවීම් අර්ථයෙන්) තෙජ (ගිනි) නම්වූ දුශ්ශීල භාවාදීන්ගේද ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සල්ලෙඛ ඥාණ නම්වේද? පුථු යන මෙහි රාගය පුථු ධර්මයකි. දොසය පුථු ධර්මයකි. මොහය පුථු ධර්මයකි. ක්‍රොධය පුථු ධර්මයකි. බද්ධ වෛරය පුථු ධර්මයකි. ගුණමකු බව පුථු ධර්මයකි. අනුන් හා ගුණයෙන් සම කොට සිතීම පුථු ධර්මයකි. ඊර්ෂ්‍යාව පුථු ධර්මයකි. මසුරු බව පුථු ධර්මයකි. ඇති වරද සැඟවීම පුථු ධර්මයකි. නැති ගුණ ඇඟවීම පුථු ධර්මයකි. සිත ඉදිමුණු ස්වභාවය පුථු ධර්මයකි. එකට එක කිරීම පුථු ධර්මයකි. මානය පුථු ධර්මයකි. අධිකමානය පුථු දර්මයකි. මත්වීම පුථු ධර්මයකි. ප්‍රමාදය පුථු ධර්මයකි. සියලු ක්ලේශයෝ සියලු දුශ්චරිතයෝ සියලු කර්මයෝ සියලු භවගාමී කර්මයෝ පුථු ධර්මයෝ වෙති.

**196.** නානා ස්වභාව එක ස්වභාව ඇති (නානත්ත එකත්ත) ධර්ම යනු කාමච්ඡන්දය නානත්ත නමි. නෛෂ්ක්‍රම්‍යය එකත්ත නමි. ව්‍යාපාදය නානත්ත නමි. අව්‍යාපාදය එකත්ත නමි. ථිනමිද්ධය නානත්ත නමි. ආලොක සඤ්ඤාව එකත්ත නමි. උද්ධච්චය නානත්ත නමි. සමාධිය එකත්ත නමි. විචිකිච්ඡාව නානත්ත නමි. ධර්මයන් පිරිසිඳ දැනීම එකත්ත නමි. අවිද්‍යාව නානත්ත නමි. ඥාණය එකත්ත නමි. නොඇල්ම නානත්ත නමි. ප්‍රීතිය එකත්ත නමි. (ii) නීවරණයෝ නානත්ත නමි (iii) ප්‍රථමධ්‍යානය එකත්ත නමි. ද්විතීය ධ්‍යානය එකත්ත නමි. (මෙහි (ii) ) තෘතීය ධ්‍යානය එකත්ත නමි (මෙහි (ii) ) චතුර්ථධ්‍යානය එකත්ත නමි. (මෙහි (ii) ) සෝවාන් මාර්ගය එකත්ත නමි. (මෙහි (ii) ) සකෘදාගාමි මාර්ගය එකත්ත නමි.) (මෙහි (ii) ) අනාගාමි මාර්ගය එකත්ත නමි. (මෙහි (ii) ) සියලු ක්ලේශයෝ නානත්ත නමි. අර්හත් මාර්ගය එකත්ත නමි. තෙජො (ගින්න) යනු ගිනි පසකි. චරණ ගින්නද ගුණ ගින්නද ප්‍රඥා ගින්නද පුණ්‍ය ගින්නද ධර්ම ගින්නද වෙති. චරණ (සීල) ගින්නෙන් තවනලද හෙයින් දුශ්ශීල බව නමැති ගින්න කෙළවර වෙයි. ගුණ (සමාධි) ගින්නෙන් තවනලද හෙයින් අගුණ (වික්ෂෙප) ගින්න කෙළවර කරයි. ප්‍රඥාව (විදර්ශනා

ප්‍රඥා) ගින්නෙන් තවනලද හෙයින් දුෂ්ප්‍රඥා ගින්න කෙළවර කරයි. පුණ්‍ය (මාර්ග කුසල) ගින්නෙන් තවනලද හෙයින් අකුසල ගිනි කෙළවර කරයි. ධර්ම (බුද්ධවචන) ගින්නෙන් තවනලද හෙයින් අධර්ම (අන්‍ය තීර්ථකයන්ගේ ඉගැන්වීම) ගින්න කෙළවර කරයි. සල්ලෙඛ යන මෙහි කාමච්ඡන්දය අසල්ලෙඛ (කෙලෙස් කපා නොහරින) ධර්මයකි. නෛෂ්ක්‍රම්‍යය සල්ලෙඛ (කෙලෙස් කපා හරින) ධර්මයකි. ව්‍යාපාදය අසල්ලෙඛ ධර්මයකි. අව්‍යාපාදය අසල්ලෙඛ ධර්මයකි. ථීනමිද්ධය අසල්ලෙඛ ධර්මයකි. ආලෝක සඤ්ඤාව සල්ලෙඛ ධර්මයකි. උද්ධච්චය අසල්ලෙඛ ධර්මයකි. සමාධිය සල්ලෙඛ ධර්මයකි. විචිකිච්ඡාව අසල්ලෙඛ ධර්මයකි. ධර්මයන් පිරිසිඳ දැනීම සල්ලෙඛ ධර්මයකි. අවිද්‍යාව අසල්ලෙඛ ධර්මයකි. ඥාණය සල්ලෙඛ ධර්මයකි. නොඇල්ම අසල්ලෙඛ ධර්මයකි. ප්‍රීතිය සල්ලෙඛ ධර්මයකි. (iii) නීවරණයෝ අසල්ලෙඛ ධර්මයෝය (iv) ප්‍රථමධ්‍යානය සල්ලෙඛ ධර්මයකි. (මෙහි (iii) ද්විතීය ධ්‍යානය සල්ලෙඛ ධර්මයකි. (මෙහි (iii) ) තෘතීය ධ්‍යානය සල්ලෙඛ ධර්මයකි. (මෙහි (iii) ) චතුර්ථධ්‍යානය සල්ලෙඛ ධර්මයකි (මෙහි (iii) ) සෝවාන් මාර්ගය සල්ලෙඛ ධර්මයකි. (මෙහි (iii) ) සකෘදාගාමි මාර්ගය සල්ලෙඛ ධර්මයකි. (මෙහි (iii) ) අනාගාමි මාර්ගය සල්ලෙඛ ධර්මයකි. සියලු ක්ලේශයෝ අසල්ලෙඛ ධර්මයෝය. අර්හත් මාර්ගය සල්ලෙඛ ධර්මයකි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැකීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් වෙන්වූද නොයෙක් ස්වභාව හා එකම ස්වභාව ඇත්තාවූ ධර්මයන්හිද තෙජසින් කෙළවර කිරීමෙහිද ප්‍රඥා සල්ලෙඛ ඥාණයයි කියනු ලැබේ.

**197.** කෙසේනම් නොහැකුළුණු බව කාය ජීවිත දෙක්හි දුරුකරන ලද අපේක්ෂා ඇති බව සිත එසවීම යන මෙහි පවත්නා ප්‍රඥාව විරියාරම්භ ඥාණය නම්වේද? නූපන් අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිසවූ (ii) නොහැකුළුණු බවෙහිද කාය ජීවිත දෙක්හි දුරුකළ අපෙක්ෂා ඇති බවෙහිද සිත එසවීමෙහිද පවත්නා වීර්ය විරියාරම්භ ඥාණ නමි. (ii) උපන් අකුසල ධර්මයන්ගේ පහකිරීම පිණිස (මෙහි (ii) යොදන්න.)

නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස (මෙහි (ii) යොදන්න.) උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම විනාශ නොවීම බොහෝ බව මහත් බව වැඩීම සම්පූර්ණවීම පිණිස (මෙහි (ii) යොදන්න.) නූපන් කාමච්ඡන්දයාගේ නොඉපදීම පිණිස (මෙහි (ii) යොදන්න.) උපන් කාමච්ඡන්දයාගේ පහකිරීම පිණිස ( (ii) යොදන්න) නූපන් නෛෂ්ක්‍රම්‍යයාගේ ඉපදීම පිණිස ( (ii) යොදන්න.) උපන් නෛෂ්ක්‍රම්‍යයාගේ පැවැත්ම විනාශ නොවීම බොහෝ බව මහත් බව වැඩීම සම්පූර්ණවීම පිණිස ( (ii) යොදන්න.) නූපන් සියලු ක්ලේශයන්ගේ නොඉපදීම පිණිස ( (ii) යොදන්න.) උපන් සියලු ක්ලේශයන්ගේ පහකිරීම පිණිස ( (ii) යොදන්න) නූපන් අර්හත් මාර්ගයාගේ ඉපදීම පිණිස ( (ii) යොදන්න.) උපන් අර්හත් මාර්ගයාගේ පැවැත්ම විනාශ නොවීම බොහෝ බව වැඩීම සම්පූර්ණවීම පිණිස ( (ii) යොදන්න.)

එය දැනීම අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් නොහැකුළුණු බවෙහිද කාය ජීවිත දෙක්හි දුරුකළ අපෙක්ෂා ඇති බවෙහි සිත එසවීමෙහිද ප්‍රඥාව විරියාරම්භ ඤාණයයි කියනු ලැබේ.

198. කෙසේනම් නොයෙක් ධර්මයන් ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව අත්ථ සංදස්සන ඤාණ නම්වේද? නොයෙක් ධර්ම යනු පඤ්චස්කන්ධයෝ ද දොළොස් ආයතනයෝද අටළොස් ධාතුහුද කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද අව්‍යාකෘත ධර්මයෝද කාමාවචර ධර්මයෝද රූපාවචර ධර්මයෝද අරූපාවචර ධර්මයෝද ලෝකොත්තර ධර්මයෝද වෙත්. (iii) ප්‍රකාශ කිරීම යනු රූපය (ii) අනිත්‍ය වශයෙන් ප්‍රකාශ කරයි. දුක් වශයෙන් ප්‍රකාශ කරයි. අනාත්ම වශයෙන් ප්‍රකාශ කරයි. (iii) වේදනාව (මෙහි (ii) යොදන්න.) සඤ්ඤාව (මෙහි (ii) යොදන්න.) සංඛාරයන් (මෙහි (ii) යොදන්න.) විඤ්ඤාණය (මෙහි (ii) යොදන්න.) ඇස (මෙහි (ii) යොදන්න.) කණ (මෙහි (ii) යොදන්න.) නාසය (මෙහි (ii) යොදන්න.) දිව (මෙහි (ii) යොදන්න.) කය (මෙහි (ii) යොදන්න.) සිත (මෙහි (ii) යොදන්න.) ජරාමරණය (මෙහි (ii) යොදන්න. අත්ථ සංදස්සන (අර්ථ දැක්වීම) යනු කාමච්ඡන්දය පහකරවමින්

නෛෂ්ක්‍රම්‍යයාගේ අර්ථය දක්වයි. ව්‍යාපාදය පහ කරවමින් අව්‍යාපාදයාගේ අර්ථය දක්වයි. ථිනමිද්ධය පහ කරවමින් ආලෝක සඤ්ඤාවගේ අර්ථය දක්වයි. උද්ධච්චය පහ කරවමින් සමාධිහුගේ අර්ථය දක්වයි.) විචිකිච්ඡාව පහ කරවමින් ධර්මයන් පිරිසිඳ දැනීමෙහි අර්ථය දක්වයි. අවිද්‍යාව පහ කරවමින් ඤාණයාගේ අර්ථය දක්වයි. නොඇල්ම පහ කරවමින් ප්‍රීතිහුගේ අර්ථය දක්වයි. (ii) නීවරණයන් පහ කරවමින් ප්‍රථම ධ්‍යානයාගේ (iii) අර්ථය දක්වයි (මෙහි (ii) ) ද්විතීය ධ්‍යානයාගේ (මෙහි (iii) ) (මෙහි (ii) ) තෘතීය ධ්‍යානයාගේ (මෙහි (iii) ) (මෙහි (ii) ) චතුර්ථ ධ්‍යානයාගේ (මෙහි (iii) ) (මෙහි (ii) ) සෝවාන් මාර්ගයාගේ (මෙහි (iii) ) (මෙහි (ii) ) සකෘදාගාමි මාර්ගයාගේ (මෙහි (iii) ) (මෙහි (ii) අනාගාමි මාර්ගයාගේ (මෙහි (iii) ) සියලු ක්ලේශයන් පහකරවමින් අර්හත් මාර්ගයාගේ අර්ථය දක්වයි. එය දැනීම අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් නොයෙක් ධර්මයන් ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව අත්ථ සංදස්සන ඤාණයයි කියනු ලැබේ.

**199.** කෙසේනම් සියලු ධර්මයන් එකක් වශයෙන් සංග්‍රහ කරනලද බව නානත්වය (වෙනස් බව) එකත්වය (සමාන බව) ප්‍රතිවෙධ කරන ප්‍රඥාව දස්සන විසුද්ධි ඤාණය නම්වේද? (මෙහි 198 (ii) යෙදිය යුතුයි.)

එකක් වශයෙන් සංග්‍රහ කරනලද බව යනු සියලු ධර්මයෝ දොළොස් ආකාරයකින් එකක් කොට සංග්‍රහ කරනලදහ. විද්‍යාමානාර්ථයෙන් අනාත්මාර්ථයෙන් සත්‍යාර්ථයෙන් ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙන්ද විශේෂයෙන් දතයුතු අර්ථයෙන් අනිත්‍යාදි වශයෙන් පිරිසිඳ දතයුතු අර්ථයෙන් දැරීම් අර්ථයෙන් ස්වභාවාර්ථයෙන් දතයුතු අර්ථයෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු අර්ථයෙන් නුවණින් ස්පර්ශ කළයුතු අර්ථයෙන් අවබොධ කළයුතු අර්ථයෙන් යන මේ දොළොස් ආකාරයෙන් සියලු ධර්මයෝ එකක් වශයෙන් සංග්‍රහ කරන ලදහ. නානත්ව එකත්ව යනු කාමච්ඡන්දය නානත්ත වෙයි. නෛෂ්ක්‍රම්‍යය එකත්ත වෙයි. සියලු ක්ලේශයෝ නානත්ත වෙති. අර්හත් මාර්ගය එකත්ත වෙයි.

**200.** ප්‍රතිවෙධ යනු දුක්ඛ සත්‍යය අනිත්‍යාදී වශයෙන් පිරිසිඳ ප්‍රතිවෙධ කිරීමෙන් ප්‍රතිවෙධ කරයි. සමුදය සත්‍යය ප්‍රහාණ ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම් ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. මාර්ග සත්‍යය භාවනා ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. දස්සන විසුද්ධි යනු ශ්‍රොතාපත්ති මාර්ග ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු වෙයි. ශ්‍රොතාපත්ති ඵල ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු විය. සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි දර්ශනය පිරිසිදු වෙයි. සකෘදාගාමි ඵල ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු විය. අනාගාමි මාර්ග ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු වෙයි. අනාගාමි ඵල ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු විය. අර්හත් මාර්ග ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු වෙයි. අර්හත් ඵල ක්ෂණයෙහි දර්ශනය පිරිසිදු විය. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් සියලු ධර්මයන් එකට සංග්‍රහ කරනලද බව නානත්ව එකත්වයන් ප්‍රතිවෙධ කිරීමෙහි ප්‍රඥාව දස්සන විසුද්ධි ඥාණයයි කියනු ලැබේ.

**201.** කෙසේනම් ප්‍රකට කොට දන්නා ප්‍රඥාව ඛන්ති ඥාණය නම්වේද? රූපය (ii) අනිත්‍ය වශයෙන් ප්‍රකටකොට දැනගන්නා ලදී. දුක් වශයෙන් ප්‍රකට කොට දැනගන්නා ලදී. අනාත්ම වශයෙන් ප්‍රකට කොට දැනගන්නා ලදී. යමක් යමක් ප්‍රකට කොට දැනගන්නා ලද්දේද එය දනිනුයි ප්‍රකට කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව ඛන්ති ඥාණ නම්. (iii) වෙදනාව (මෙහි (ii) යොදන්න.) සඤ්ඤාව ( (ii) යොදන්න.) සංඛාරයෝ ( (ii) යොදන්න.) විඤ්ඤාණය ( (ii) යොදන්න.) ඇස (ii) යොදන්න) කණ ( (ii) යොදන්න) නාසය ( (ii) යොදන්න.) දිව ( (ii) යොදන්න.) කය ( (ii) යොදන්න.) සිත ( (ii) යොදන්න.) ජරාමරණය ( (ii) යොදන්න.) එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් ප්‍රකට කොට දැනීම් වශයෙන් පවත්නා ප්‍රඥාව ඛන්ති ඥාණයයි කියනු ලැබේ.

**202.** කෙසේනම් ස්පර්ශ කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව පරියොගහණ (බැස ගැන්මෙහි) ඥාණ නම්වේද? රූපය (ii) අනිත්‍ය වශයෙන් (නුවණින්) ස්පර්ශ කරයි. දුක් වශයෙන් ස්පර්ශ

කරයි. අනාත්ම වශයෙන් ස්පර්ශ කරයි. යමක් යමක් ස්පර්ශ කරයිද, එහි නුවණින් බැසගන්නා හෙයින් ස්පර්ශ කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව පරියොගහණ ඤාණ නම්. (ii) වෙදනාව ( (ii) යොදන්න.) සඤ්ඤාව ( (ii) යොදන්න.) සංඛාරයන් ( (ii) යොදන්න.) විඤ්ඤාණය ( (ii) යොදන්න.) ඇස ( (ii) යොදන්න.) කණ ( (ii) යොදන්න.) නාසය ( (ii) යොදන්න.) දිව ( (ii) යොදන්න.) කය ( (ii) යොදන්න.) සිත ( (ii) යොදන්න.) ජරාමරණය ( (ii) යොදන්න.) එය දැනීම අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් ස්පර්ශ කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව පරියොගහණ ඤාණයයි කියනු ලැබේ.

**203.** කෙසේ නම් ස්කන්ධයන්ගේ එක් කොටසක් පිඬු කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව පදෙස විහාර ඤාණය නම් වේද? මිථ්‍යාදෘෂ්ටිය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. මිථ්‍යාදෘෂ්ටිය සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් දෘෂ්ටිය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් දෘෂ්ටිය සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් දෘෂ්ටිය සංසිඳීම හෙතුකොටගෙනද වේදනාව උපදියි. මිථ්‍යා සංකල්පය හෙතුකොටගෙනද වේදනාව උපදියි. මිථ්‍යාසංකල්පය සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් සංකල්පය හෙතුකොටගෙනද වේදනාව උපදියි. සම්‍යක් සංකල්පය සංසිඳීම හෙතු කොටගෙනද වෙදනාව උපදියි. මිථ්‍යාවිමුක්තිය හෙතුකොට ගෙනද වෙදනාව උපදියි, සම්‍යක් විමුක්තිය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. ඡන්දය හෙතුකොට ගෙනද වෙදනාව උපදියි. ඡන්දය සංසිඳීම හෙතුකොට ගෙනද වේදනාව උපදියි. මිථ්‍යාවචනය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. මිථ්‍යාවචනය සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් වචනය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් වචනය සංසිඳීම හෙතුකොට ගෙනද වෙදනාව උපදියි. මිථ්‍යා කර්මාන්තය (ii) හෙතු කොටගෙන වේදනාව උපදියි. මිථ්‍යා කර්මාන්තය (iii) සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සම්‍යක් කර්මාන්තය (මෙහි (ii) යොදන්න) සම්‍යක් කර්මාන්තය

(මෙහි (iii) මිථ්‍යා ආජීවය (මෙහි (ii) මිථ්‍යා ආජීවය (මෙහි (iii) සම්‍යක් ආජීවය (මෙහි (ii) සම්‍යක් ආජීවය (මෙහි (iii) මිථ්‍යා ව්‍යායාමය (මෙහි (ii) මිථ්‍යා ව්‍යායාමය (මෙහි (iii) සම්‍යක් ව්‍යායාමය (මෙහි (ii) සම්‍යක් ව්‍යායාමය (මෙහි (iii) මිච්ඡා සතිය (මෙහි (ii) මිච්ඡා සතිය (මෙහි (iii) සම්මා සතිය (මෙහි (ii) සම්මාසතිය (මෙහි (iii) මිච්ඡා සමාධිය (මෙහි (ii) මිච්ඡා සමාධිය (මෙහි (ii) සම්මා සමාධිය මෙහි (ii) සම්මා සමාධිය (මෙහි (iii) විතර්කය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. විතර්කය සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සඤ්ඤාව හෙතුකොටගෙනද වෙදනාව උපදියි. සඤ්ඤාව සංසිඳීම හෙතුකොටගෙනද වෙදනාව උපදියි. ඡන්දයද නොසංසිඳුණේවෙයි. විතර්කයද නොසංසිඳුණේ වෙයි. සඤ්ඤාවද නොසංසිඳුණේ වෙයි. එය හෙතුකොට ගෙනද වෙදනාව උපදියි. ඡන්දයද සංසිඳුණේ වෙයි. විතර්කයද සංසිඳුණේ වෙයි. සංඥාවද සංසිඳුණේ වෙයි. එය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. ඡන්දය සංසිඳුණේ වෙයි. විතර්කයද සංසිඳුණේ වෙයි. සංඥාවද නොසංසිඳුණේ වෙයි. එයහෙතුකොටගෙනද වෙදනාව උපදියි. ඡන්දයද සංසිඳුණේ වෙයි. විතර්කයද සංසිඳුණේ වෙයි. සංඥාවද නොසංසිඳුණේ වෙයි. එය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. ඡන්දයද සංසිඳුණේ වෙයි. විතර්කයද සංසිඳුණේ වෙයි. සංඥාවද සංසිඳුණේ වෙයි. එය හෙතුකොටගෙනද වෙදනාව උපදියි. නොපැමිණි ධර්මයට පැමිණීම පිණිස වීර්ය ඇත්තේය ඒ ස්ථානයට පිළිවෙළින් පැමිණි කල්හි ඒ හෙතුකොටගෙනද වෙදනාව උපදියි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් ස්කන්ධාදි ධර්මයන්ගෙන් කොටසක් පිඬුකර දැනීමෙහි ප්‍රඥාව පදෙස විහාර ඤාණයයි කියනු ලැබේ.

**204.** කෙසේ නම් අධිපති භාවයෙන් පවත්නා ප්‍රඥාව සඤ්ඤා විවට්ට ඤාණ නම් වේද? නෛෂ්ක්‍රම්‍යය අධිපති කොට ඇති ප්‍රඥාව කාමච්ඡන්දයට හෙතුවූ සංඥාව කෙරෙන් පෙරළානුයි.

(ii) අධිපති භාවයෙන් පවත්නා ප්‍රඥාව සඞ්ඛ්‍යා විවට්ට ඤාණ නම්.

(iii) අව්‍යාපාදය අධිපතිකොට ඇති ප්‍රඥාව ව්‍යාපාදයට හෙතු වූ සංඥාවෙන් පෙරළානුයි. ( (ii) යොදන්න) ආලොක සඞ්ඛ්‍යාව අධිපතිකොට ඇති ප්‍රඥාව ථිනමිද්ධයට හේතුවූ සඞ්ඛ්‍යාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) සමාධිය අධිපති කොට ඇති ප්‍රඥාව උද්ධච්චයට හෙතුවූ ප්‍රඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න)

ධර්මයන් පිරිසිඳ දැනීම අධිපතිකොට ඇති ප්‍රඥාව විචිකිච්ඡාවට හෙතුවූ සඞ්ඛ්‍යාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) ඤාණය අධිපතිකොට ඇති ප්‍රඥාව අවිද්‍යාවට හෙතුවූ සඞ්ඛ්‍යාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) ප්‍රීතිය අධිපතිකොට ඇති ප්‍රඥාව නොඇල්මට හෙතුවූ සංඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) ප්‍රථමධ්‍යානය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හේතුවූ සංඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) ද්විතීයධ්‍යානය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හෙතුවූ සංඥාවෙන් පෙරලානුයි. තෘතීයධ්‍යානය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හේතුවූ සංඥාවෙන් පෙරළානුයි (ii) යොදන්න) චතුර්ථධ්‍යානය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හෙතුවූ සංඥාවෙන් පෙරළානුයි (ii) යොදන්න) සෝවාන් මාර්ගය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හේතුවූ සංඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) සකෘදාගාමි මාර්ගය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හේතුවූ සංඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) අනාගාමි මාර්ගය අධිපතිකොට ඇති ප්‍රඥාව නීවරණයන්ට හේතුවූ සංඥාවෙන් පෙරළානුයි ( (ii) යොදන්න) අර්හත් මාර්ගය අධිපතිකොට ඇති ප්‍රඥාව සියලු ක්ලේශයන්ට හෙතුවූ සංඥාවෙන් පෙරළානුයි (ii) යොදන්න)

එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් අධිපති භාවයෙන් පවත්නා ප්‍රඥාව සඞ්ඛ්‍යාවිවට්ට ඤාණයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**205.** කෙසේනම් (ශාන්ත ස්වභාවයක් නැති හෙයින් එකම ස්වභාවයක් නැති) නානත්ත ධර්මයන්හි ප්‍රඥාව චෙතොවිවට්ට ඤාණ නම්වේද? කාමච්ඡන්දය අශාන්ත හෙයින් නානත්ත නමි. නෛෂ්ක්‍රම්‍යය ශාන්ත හෙයින් එකත්ත (එකම ස්වභාවයක් ඇත්තේ) නම් වෙයි. නෛෂ්ක්‍රම්‍යය එකත්වය පවත්වන්නාහට කාමච්ඡන්දයෙන් සිත වෙන්වේනුයි. නානත්වයෙහි ප්‍රඥාව චෙතො විවට්ට ඤාණ නමි. ව්‍යාපාදය නානත්ත නමි. අව්‍යාපාදය එකත්ත නමි. අව්‍යාපාදයෙහි එකත්වය පවත්වන්නාහට ව්‍යාපාදය කෙරෙන් සිත වෙන්වේනුයි නානත්වයෙහි ප්‍රඥාව චෙතො විවට්ට ඤාණ නමි. ථීනමිද්ධය නානත්ත නමි. ආලොක සඤ්ඤාව එකත්ත නමි. ආලොක සඤ්ඤා එකත්වය පවත්වන්නාහට ථීනමිද්ධය කෙරෙන් සිත වෙන්වේනුයි නානත්වයෙහි ප්‍රඥාව විවට්ට ඤාණ නමි. කාමච්ඡන්දය නානත්ත නමි. නෛෂ්ක්‍රම්‍යය එකත්ත නමි. සියලු ක්ලේශයෝ නානත්ත නමි. අර්හත් මාර්ගය එකත්ත නමි. අර්හත් මාර්ග එකත්වය පවත්වන්නා හට සියලු කෙලෙසුන් කෙරෙන් සිත වෙන්වේනුයි නානත්වයෙහි ප්‍රඥාව චෙතොවිවට්ට ඤාණ නමි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් නානත්වයෙහි ප්‍රඥාව චෙතො විවට්ට ඤාණයයි කියනු ලැබේ.

**206.** කෙසේනම් සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත විවට්ට ඤාණ නම්වේද? කාමච්ඡන්දය දුරු කරන්නේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත පිහිටුවානුයි සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත විවට්ට ඤාණ නමි. ව්‍යාපාදය දුරු කරන්නේ අව්‍යාපාද වශයෙන් සිත පිහිටුවානුයි සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත විවට්ට ඤාණ නමි. ථීනමිද්ධය දුරු කරන්නේ ආලොක සඤ්ඤා වශයෙන් සිත පිහිටුවානුයි (ii) සිත පිහිටුවීමෙහි ප්‍රඥාව ප්‍රඥාව චිත්ත විවට්ට ඤාණ නමි. නීවරණයන් දුරු කරන්නේ ප්‍රථම ධ්‍යානයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) ) නීවරණයන් දුරුකරන්නේ ද්විතීය ධ්‍යානයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) නීවරණයන් දුරු කරන්නේ තෘතීය ධ්‍යානයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) නීවරණයන් දුරුකරන්නේ

චතුර්ථ ධ්‍යානයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) නීවරණයන් දුරු කරන්නේ සෝවාන් මාර්ගයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) ) නීවරණයන් දුරු කරන්නේ සකෘදාගාමි මාර්ගයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) ) නීවරණයන් දුරු කරන්නේ අනාගාමි මාර්ගයාගේ වශයෙන් සිත පිහිටුවානුයි (මෙහි (ii) ) සියලු කෙලෙසුන් දුරු කරන්නේ අර්හත් මාර්ග වශයෙන් සිත පිහිටුවානුයි සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත විවට්ට ඥාණ නමි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්තයෙන් ප්‍රඥා නමි. එහෙයින් සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත විවට්ට ඥාණයයි කියනු ලැබේ.

**207.** කෙසේනම් සූන්‍ය භාවයෙහි පවත්නා ප්‍රඥාව විවට්ට ඥාණ නම්වේද? ඇස (ii) තමාගෙන්ද තමා සතු බවෙන්ද, නිත්‍ය බවෙන්ද ස්ථිර බවෙන්ද, සදාකාලික බවෙන්ද, වෙනස් නොවන බවෙන්ද හිස්යයි තත්වාකාරයෙන් දන්නාහුගේ දක්නහුගේ (iii) ඇස (iv) මම යයි වදරවා ගැනීමෙන් ඥාණය වෙන්වේනුයි සූන්‍යත්වය දක්නා ප්‍රඥාව ඥාණ විවට්ට ඥාණනමි. කණ (මෙහි (ii) ) කණ (මෙහි (iv) ) නාසය (මෙහි (ii) ) නාසය (මෙහි (iv) ) දිව (මෙහි (ii) ) දිව (මෙහි (iv) ) කය (මෙහි (ii) ) කය (මෙහි (iv) ) සිත (මෙහි (ii) ) සිත (මෙහි (iv) ) එය දැනීම අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් සුන්‍යත්වය දක්නා ප්‍රඥාව ඥාණ විවට්ට ඥාණ නමි.

**208.** කෙසේනම් අත්හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නම්වේද? (ii) නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය අත්හරිනුයි අත් හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නමි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය අත්හරිනුයි අත් හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නමි (iii) ආලොක සඤ්ඥාවෙන් ථිනමිද්ධය අත්හරිනුයි අත් හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නමි. සමාධියෙන් උද්ධච්චය අත්හරිනුයි අත්හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නමි. (මෙහි (ii) යොදන්න.) අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශයන් අත්හරිනුයි අත්හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඥාණ නමි. එය දැනීම් අර්ථයෙන්

ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් අත්හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඤාණයයි කියනු ලැබේ.

**209.** කෙසේනම් සත්‍යාර්ථයන් දක්නාවූ ප්‍රඥාව සච්ච විවට්ට ඤාණ නම්වේද? දුක්ඛ සත්‍යයාගේ පිළිත ස්වභාවය සකස්කළයුතු ස්වභාවය තැවීම් ස්වභාවය වෙනස්වීම් ස්වභාවය පිරිසිඳ දැනගන්නේ වෙන්වේනුයි. සථ්‍යාර්ථය දක්නා ප්‍රඥාව සච්ච විවට්ට ඤාණ නමි. සමුදය සත්‍යයාගේ රැස්කිරීම් ස්වභාවය හෙතුවීම් ස්වභාවය බැඳීම් ස්වභාවය බාධා ස්වභාවය පහ කරන්නේ වෙන්වේනුයි සත්‍යාර්ථය දක්නා ප්‍රඥාව සච්ච විවට්ට ඤාණනමි. නිරොධ සත්‍යයාගේ මිදීම් ස්වභාවය විවේක ස්වභාවය සකස් නොකිරීම් ස්වභාවය අමෘත ස්වභාවය දක්නේ වෙන්වේනුයි සත්‍යාර්ථයන් දක්නේ වෙන්වේනුයි සත්‍යාර්ථයන් දක්නා ප්‍රඥාව සච්ච විවට්ට ඤාණනමි. මාර්ග සත්‍යායාගේ එතර කිරීම් ස්වභාවය හෙතුවීම් ස්වභාවය දැකීම් ස්වභාවය අධිපති ස්වභාවය වඩන්නේ වෙන්වේනුයි සත්‍යාර්ථය දැක්මෙහි ප්‍රඥාව සච්ච විවට්ට ඤාණ නමි. සඤ්ඤා විවට්ට චෙතො විවට්ට චිත්ත විවට්ට ඤාණ විවට්ට විමොක්ඛ විවට්ට සච්ච විවට්ට යයි විවට්ට සයකි. දැනගනිමින් වෙන්වේනුයි සඤ්ඤා විවට්ට නමි. පවත්වමින් වෙන්වේනුයි චෙතො විවට්ට නමි. සිත පිහිටුවමින් වෙන්වෙනුයි චිත්ත විවට්ට නමි. ශූන්‍ය වශයෙන් දක්නා ඤාණයෙන් ප්‍රකට කරමින් වෙන්වේනුයි ඤාණ විවට්ට නමි. අත්හරිමින් වෙන්වේනුයි විමොක්ඛ විවට්ට නමි. සත්‍යාර්ථයන් ප්‍රත්‍යක්ෂ කරමින් වෙන්වේනුයි සච්ච විවට්ට නමි. යම් තැනෙක සඤ්ඤා විවට්ටය වෙයිද, එහි චෙතො විවට්ටය වෙයි. යම්තැනෙක්හි සඤ්ඤා විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය වෙයි. යම්තැනෙක්හි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය වෙයිද, එහි චිත්ත විවට්ටය වෙයි. යම්තැනෙක්හි චිත්ත විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය වෙයි. යම්තැනෙක්හි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය චිත්ත විවට්ටය වෙයිද, එහි ඤාණ විවට්ටය වෙයි. යම්තැනෙක්හි ඤාණ විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය චිත්ත විවට්ටය වෙයි. යම් තැනෙක්හි

සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය චිත්ත විවට්ටය ඤාණ විවට්ටය වෙයිද, එහි විමොක්ඛ විවට්ටය වෙයි. යම් තැනෙක්හි විමොක්ඛ විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය චිත්ත විවට්ටය ඤාණ විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය චිත්ත විවට්ටය ඤාණ විවට්ටය විමොක්ඛ විවට්ටය වෙයිද, එහිසච්ච විවට්ටය වෙයි. යම් තැනෙක්හි සච්ච විවට්ටය වෙයිද, එහි සඤ්ඤා විවට්ටය චෙතො විවට්ටය ඤාණ විවට්ටය විමොක්ඛ විවට්ටය වෙයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් සත්‍යාර්ථයන් දැක්මෙහි ප්‍රඥාව සච්ච විවට්ට ඤාණ නම්.

**210.** කෙසේනම් කයද සිතද සමාන කොට මෙනෙහි කිරීමෙන් සුඛ සඤ්ඤාවත් ලහු සඤ්ඤාවත් අධිෂ්ඨාන කිරීම් වශයෙන් සමෘද්ධ කිරීමෙහි පවත්නා ප්‍රඥාව ඍද්ධිවිධ ඥාන නම්වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය (ii) අධිපති කොට ඇති සමාධියෙන්ද, සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය (iii) වඩයිද වීර්යය (මෙහි (ii) යොදන්න.) සිත (මෙහි (ii) විමංසාව (මෙහි ii) හෙතෙම මේ සතර ඍද්ධි පාදයන්හි සිත පුරුදු කරයි. දමනය කරයි. මෘදු කරයි, කර්මන්‍ය කරයි. හෙතෙම මේ සතර ඍද්ධි පාදයන්හි සිත පුරුදු කොට දමනය කොට මෘදු කොට කර්මන්‍ය කොට කයද සිතෙහි ඇතුළත් කරයි. සිතද කයෙහි ඇතුළත් කරයි. කය සිත හා සමාන කරයි. සිත කය හා සමාන කරයි. කය සිත හා සමාන වේවායි අධිෂ්ඨාන කරයි. සිත කය හා සමාන වේවායි අධිෂ්ඨාන කරයි. කය සිත හා සමාන කොට සිත කය හා සමාන කොට කය සිත හා සමාන වේවායි අධිෂ්ඨාන කොට සිත කය හා සමාන වේවායි අධිෂ්ඨාන කොට සුඛසඤ්ඤාවද ලහු සඤ්ඤාවද කයෙහි ඇතුළත්කොට වාසය කරයි. හෙතෙම එසේ වඩනලද පිරිසිදුවූ පවිත්‍රවූ සිතින් ඍද්ධිවිධ ඥානයට සිත එළවයි. නමයි. හෙතෙම නොයෙක් ආකාර ඍද්ධි ප්‍රභෙද අනුභව කරයි. එක්කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝදෙනෙක්ව එක්කෙනෙක් වෙයි. ප්‍රකට බව සැඟවුණු

බවට පැමිණෙයි. බිත්තියෙන් පිටතට ප්‍රාකාරයෙන් පිටතට පර්වතයෙන් පිටතට අහසෙහි මෙන් නොගැටී ගමන් කරයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම මතුකරයි. පොළොවෙහි මෙන් ජලයෙහි නොගිලී ගමන් කරයි. පක්ෂියකු මෙන් අහසෙහි පළක් බැඳ ගමන් කරයි. මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති චන්ද්‍ර සූර්යයන් අතින් පිරිමදියි. බඹලොව දක්වා කයින් වශයෙහි පවත්වයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් කයද සිතද එකක් කොට මෙනෙහි කිරීමෙන් සුඛ සඤ්ඤාවද ලහු සඤ්ඤාවද අධිෂ්ඨාන කිරීම් වශයෙන් සමෘද්ධ කිරීමෙහි ප්‍රඥාව ඉද්ධිවිධ ඥාණයයි කියනු ලැබේ.

**211.** කෙසේනම් විතර්ක වේගයෙන් නොයෙක් ස්වභාව ඇත්තාවූ එක ස්වභාව ඇත්තාවූද ශබ්ද නිමිති කෙරෙහි බැසගන්නාවූ ප්‍රඥාව සොත ධාතු විසුද්ධි ඥාණ නම්වේද මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන්ද (ii) සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද, වීර්ය අධිපතිකොට ඇති සමාධියෙන්ද (මෙහි (ii) සිත අධිපති කොට ඇති සමාධියෙන්ද (මෙහි (ii) විමංසාව අධිපතිකොට ඇති සමාධියෙන්ද සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර ඍද්ධි පාදයන්හි සිත පුරුදු කරයි. දමනය කරයි. මෘදු කරයි. කර්මන්‍ය කරයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත වඩා දමනය කොට මෘදු කොට කර්මන්‍ය කොට දුර ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. ළඟ ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි.

මහත් ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. සියුම් ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහිකරයි. ඉතාසියුම් ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. පූර්ව දිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. පශ්චිම දිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. උතුරු දිශාවෙහි ශබ්දයන්ගේ ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. දකුණු දිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්තද මෙනෙහි කරයි. පූර්ව අනුදිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි.

පශ්චිම අනුදිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. දකුණු අනුදිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. යට දිශාවෙහි ශබ්දයන්ගේද ශබ්ද නිමිත්ත මෙනෙහිකරයි. උඩදිශාවෙහිද ශබ්දයන්ගේ ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. හෙතෙම එසේ පුරුදු කරන ලද පිරිසිදුවූ භාත්පස පිරිසිදුවූ සිතින් සොත ධාතු විසුද්ධිඥාණය පිණිස සිත එළවයි. නමයි හෙතෙම මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිව්‍ය ශ්‍රොත ධාතුවෙන් දිව්‍යවූද, මනුෂ්‍යවූද, දුරවූද, සමීපවූද, දෙවදෑරුම් ශබ්දයන් අසයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් විතර්ක වශයෙන් නොයෙක් ස්වභාව ඇත්තාවූද එක් ස්වභාවයක් ඇත්තාවූද ශබ්ද නිමිතිවලට බැස ගැන්මෙහි ප්‍රඥාව සොතධාතු විසුද්ධි ඥාණයයි කියනු ලැබේ.

**212.** කෙසේ නම් (සොමනස්ස සහගත දොමනස්ස සහගත උපෙක්ඛා සහගත යන) ත්‍රිවිධ චිත්තයන් පිළිබඳ වෙගයන්ගේ වශයෙන් ඉන්ද්‍රියයන්ගේ පැහැදීමට අනුව නොයෙක් ස්වභාව ඇත්තාවූද සමාන ස්වභාව ඇත්තාවූද චිත්තයන්ගේ පැවැත්ම බැස ගැනීමෙහි ප්‍රඥාව චෙතො පරිය ඥාණ නම් වේද?

මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන්ද (ii) සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. වීර්ය අධිපතිකොට ඇති සමාධියෙන්ද මෙහි (ii) යොදන්න.) සිත අධිපතිකොට ඇති සමාධියෙන්ද (මෙහි (ii) යොදන්න) විමංසය අධිපතිකොට ඇති සමාධියෙන්ද සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. හෙතෙම ඒ ඍද්ධිපාදයන්හි සිත පුරුදු කරයි. දමනය කරයි, මෘදුකරයි, කර්මන්‍යය කරයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුරුදුකොට දමනයකොට මෘදුකොට කර්මාන්‍ය කොට මේ රූපය සොමනස්සින්ද්‍රියයෙන් හටගත්තේය. මේ රූපය දොමනස්සින්ද්‍රියයෙන් හටගත්තේය. මේ රූපය උපෙක්ඛින්ද්‍රියයෙන් හටගත්තේයයි මෙසේ දැන ගනියි. හෙතෙම එසේ පුරුදු කරන ලද පිරිසිදු කරන ලද භාත්පස පිරිසිදු කරන ලද සිතින් චෙතොපරිය ඥාණය පිණිස සිත

ඵලවයි, නමයි. හෙතෙම අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාග සහිත සිත හෝ රාග රහිත සිතයයි දනියි. දොස සහිත සිත හෝ දොස රහිත සිත හෝ මොහ සහිත සිත හෝ මොහ රහිත සිත හෝ හැකුළුණු සිත හෝ විහිදුණු සිත හෝ මහද්ගත සිත හෝ අමහද්ගත සිත හෝ සඋත්තර සිත හෝ අනුත්තර සිත හෝ සමාහිත සිත හෝ අසමාහිත සිත හෝ විමුත්ත සිත හෝ අවිමුත්ත සිත හෝ අවිමුත්ත සිතයයි දැනගනියි. එය දැනීම් අර්ථයෙන් ඤාණය නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් ත්‍රිවිධ වේගයෙන් ඉදුරන්ගේ පැහැදීම් වශයෙන් නොයෙක් ස්වභාවයන් ඇත්තාවූ එක ස්වභාවය ඇත්තාවූ චිත්තයන්ට බැස ගැන්මෙහි ප්‍රඥාව චෙතොපරිය ඤාණයයි කියනු ලැබේ.

**213.** කෙසේ නම් නොයෙක් ස්වභාව හා එක ස්වභාව ඇති කර්මයන්ගේ වෙගයෙන් ප්‍රත්‍යයන්ට අනුව පවත්නා ධර්මයන්ට බැස ගැන්මෙහි ප්‍රඥාව පුබ්බෙ නිවාසානුස්සති ඤාණය නම් වේද?

මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකෙට ඇති (මෙහි 210 ඡේදයේ (ii) යොදන්න.) වීර්ය අධිපතිකොට ඇති (210 යේ ii) සිත අධිපතිකොට ඇති (210 යේ (ii) විමංසාව අධිපතිකොට ඇති (210 යේ ii) මෘදුකොට කර්මන්‍යකොට මෙසේ දැනගනියි. කෙසේද? මේ හේතුව ඇති කල්හි මේ ඵලය වෙයි. මේ හේතුව ඉපදීම හේතුකොට ගෙන මේ ඵලය උපදියි. එනම් අවිද්‍යාව නිසා සංස්කාරයෝ උපදිත් සංස්කාරය නිසා විඤ්ඤාණය උපදියි. විඤ්ඤාණය නිසා නාම රූපය උපදියි. නාම රූපය නිසා සළායතනය උපදියි. සළායතනය නිසා ඵස්සය උපදියි. ඵස්සය නිසා වෙදනාව උපදියි වෙදනාව නිසා තණ්හාව උපදියි. තණ්හාව නිසා උපාදානය උපදියි. උපාදානය නිසා භවය උපදියි, භවය නිසා ජාතිය පහළවෙයි. ජාතිය නිසා ජරා මරණ පහළවෙයි. සොක පරිදේව දුක්ඛ දොමනස්ස උපායාසයෝ පහළවෙත්. මෙසේ සැපයෙන් අමිශ්‍ර වූ හුදු දුක්ඛස්කන්ධයාගේ පහළවීම වෙයි යනුවෙනි. හෙතෙම

එසේ පුරුදු කරනලද පිරිසිදු කරන ලද භාත්පස පිරිසිදු කරන ලද සිතෙන් පුබ්බෙනිවාසානුසස්ති ඤාණය පිණිස සිත එළවයි. නමයි හෙතෙම නොයෙක් පෙර විසීම් සිහි කරයි. ඒ කවරේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද ජාති දසයක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද දහස් ජාතියක්ද ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසවල් තැන වූයෙමි. මෙනම් ඇත්තෙක් මෙනම් ගොත්‍ර ඇත්තෙක් මෙනම් වර්ණ ඇත්තෙක් මෙනම් ආහාර ඇත්තෙක් මෙනම් සැප දුක් විඳින්නෙක් මෙනම් ආයුෂ ඇත්තෙක් වීමි. හෙතෙම එයින් චුතව අසවල් තැන උපන්නේය. එහිදී මෙනම් ඇතිවිය මෙනම් ගොත්‍ර ඇත්තේ මෙනම් ආහාර ඇත්තේ මෙසේ සැප දුක් විඳින්නේ මෙනම් ආයුෂ ඇත්තේ විය හෙතෙම එයින් චුතව මෙහි උපන්නේ යයි මෙසේ ආකාර සහිතව උදෙසීම් සහිතව නොයෙක් ප්‍රභෙද ඇති පෙර විසීම් සිහි කරයි. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්, ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් නොයෙක් ස්වභාව ඇත්තාවූද, එක ස්වභාව ඇත්තාවූද කය වෙගයෙන් ප්‍රත්‍යයන් නිසා පවත්නා ධර්මයන්ට බැස ගැන්මෙහි ප්‍රඥාව පුබ්බෙනිවාසානුස්සති ඤාණයයි කියනු ලැබේ.

**214.** කෙසේ නම් කසිණාලොකයාගේ වශයෙන් නොයෙක් ස්වභාවයන් ඇත්තාවූද, එක ස්වභාවය ඇත්තාවූද රූප සටහන් දැක්මෙහි ප්‍රඥාව දිබ්බ චක්ඛුඤාණ නම් වේද?

මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇත්තාවූ සමාධියෙන්ද, (ii) සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. වීර්ය අධිපතිකොට ඇති සමාධියෙන්ද, (මෙහි (ii) යොදන්න) චිත්තය අධිපතිකොට ඇති සමාධියෙන්ද, (මෙහි (ii) යොදන්න) විමංසාව අධිපතිකොට ඇති සමාධියෙන්ද, සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුරුදු කරයි. හික්මවයි මෘදු කරයි. කර්මන්‍ය කරයි හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත

පුරුදුකොට හික්මවා මෘදු කොට කර්මන්‍ය කොට ආලොක සඤ්ඤාව මෙනෙහි කරයි. දවල් යන සඤ්ඤාව උපදවයි. දවල් යම්සේද රාත්‍රියද එසේම වෙයි. රාත්‍රිය යම්සේද දවල්ද එසේම වෙයි. මෙසේ විවෘතවූ නොවැසුණාවූ ආලොක සහිතවූ සිත වඩයි හෙතෙම එසේ පුරුදු කරනලද පිරිසිදුවූ භාත්පස පිරිසිදුවූ සිතින් සත්වයන්ගේ චුති උත්පත්ති දැනගැනීම පිණිස සිත එළවයි නමයි හෙතෙම මිනිස් බව ඉක්ම ගියාවූ දිව්‍ය චක්ෂුසින් චුත වන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූ යහපත්වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද සත්වයන් දකියි. කර්මානුකූලව උපදින්නාවූ සත්වයන් දැනගනියි. කෙසේද? පින්වත්නි, මේ සත්වයන් එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, වාක්දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, ආර්‍යයන්ට ගර්හා කළාහුය, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහුය, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්වූවාහුය, ඔව්හු කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ විනාශව වැටෙන්නාවූ නපුරු ගති ඇත්තාවූ නිරයෙහි උපන්නාහුය, පින්වත්නි, මේ සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූවාහුය, වාක් සුචරිතයෙන් යුක්තවූවාහුය මනො සුචරිතයෙන් යුක්තවූවාහුය, ආර්යයන්ට නින්දා නොකළාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය, සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන්වූවාහුය, ඔව්හු කායයාගේ බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපන්නාහු යයි මෙසේ මිනිසත් බව ඉක්මවූ පිරිසිදුවූ දිව්‍ය චක්ෂුසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද කර්මානුකූලව යන්නාවූ සත්වයන් දනියි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් කසිණා ලොකයෙන් නොයෙක් ස්වභාවයන් ඇත්තාවූද එක ස්වභාවය ඇත්තාවූද රූප සටහන් දැක්මෙහි ප්‍රඥාව දිබ්බචක්ඛු ඥාණයයි කියනු ලැබේ.

**215.** කෙසේ නම් සූසැට ආකාරයකින් ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ පුරුදු කිරීමෙහි ප්‍රඥාව ආසවක්ඛය ඥාණ නම් වේද?

කවර නම් ඉන්ද්‍රිය තුනක්හුගේද අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියගේද අඤ්ඤින්ද්‍රියගේද

අඤ්ඤතාවින්ද්‍රියගේද වෙයි. අන්‍යඥඥාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය කෙතෙක් ස්ථානයන්ට පැමිණෙයිද අඤ්ඤින්ද්‍රිය කෙතෙක් ස්ථානයන්ට පැමිණෙයිද, අඤ්ඤාතාවින්ද්‍රිය කෙතෙක් ස්ථානයන්ට පැමිණෙයිද? අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය එක් ස්ථානයකට පැමිණෙයි. සොතාපත්ති මාර්ගයයි අඤ්ඤින්ද්‍රිය ස්ථාන සයකට පැමිණෙයි. සොතාපත්තිඵලයද සකෘදාගාමි මාර්ගයද, සකෘදාගාමි ඵලයද, අනාගාමි මාර්ගයද, අනාගාමි ඵලයද අර්හත් මාර්ගයද වෙත්. අඤ්ඤාතාවින්ද්‍රිය එක් ස්ථානයකට පැමිණෙයි අර්හත් ඵලයයි.

**216.** සොතාපත්ති මාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට සද්ධින්ද්‍රිය (ii) නිසැක ඇදහීම් වශයෙන් පිරිවරවෙයි. විරින්ද්‍රිය සිත එසවීම් වශයෙන් පිරිවර වෙයි. සතින්ද්‍රිය එළඹ සිටීම් වශයෙන් පිරිවර වෙයි. සමාධින්ද්‍රිය නොවිසිරයාම් වශයෙන් පිරිවර වෙයි. පඤ්ඤින්ද්‍රිය දැකීම් වශයෙන් පිරිවර වෙයි. මනින්ද්‍රිය දැනීම් වශයෙන් පිරිවරවෙයි සොමනස්සින්ද්‍රිය පිනවීම් වශයෙන් පිරිවර වෙයි. ජීවිතින්ද්‍රිය වර්තමාන සන්තතියට අධිපතිවීම් වශයෙන් පිරවර වෙයි.

**217.** සොතාපත්ති මාර්ගක්ෂණයෙහි (ii) හටගත් චිත්තජ රූප හැර සියලු ධර්මයෝ කුසලයෝ වෙත්. සියලු ධර්මයෝම ආශ්‍රව රහිත වෙත්. සියලු ධර්මයෝම වෘත්තයෙන් එතර කරන්නාහු වෙත්. සියලු ධර්මයෝම නිවනට පමුණුවන්නාහු වෙත්. සියලු ධර්මයෝම ලොකොත්තර වෙත්. සියලු ධර්මයෝම නිවන් අරමුණුකොට ඇත්තාහු වෙත්. සොතාපත්ති මාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට මේ ඉන්ද්‍රියයෝ අට දෙන එක්ව පහළවන පිරිවර වෙත්. ඔවුනොවුන්ට පිරිවර වෙත්. නිශ්‍රය වශයෙන් පිරිවර වෙත්. සම්ප්‍රයුක්ත වශයෙන් පිරිවර වෙත්. සහගත වශයෙන් පිරිවර වෙත්. එක්ව උපදිත්. මිශ්‍රවෙත් එකට යෙදෙත්. ඒ ඉන්ද්‍රිය ධර්මයෝම ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියගේ කොටස්ද වෙත්. පිරිවරද වෙත්.

සොතාපත්ති ඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට සද්ධින්ද්‍රිය (ii) (මෙහි 216 (ii) යොදන්න)

**218.** සොතාපත්ති ඵලක්ෂණයෙහි හටගත් චිත්තජ රූප හැර සියලු ධර්මයෝ අව්‍යාකෘත වෙත්, සියලු ධර්මයෝම ආශ්‍රව රහිත වෙත්, සියලු ධර්මයෝම ලොකොත්තර වෙත්, සියලු ධර්මයෝම නිවන් අරමුණුකොට ඇත්තාහු වෙත්. සොතාපත්ති ඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට මේ ඉන්ද්‍රියයෝ අට දෙන සහජාත පරිවාරවෙත්. අඤ්ඤමඤ්ඤ පරිවාර වෙත්. නිස්සය පරිවාර වෙත්, සම්පයුත්ත පරිවාර වෙත්. සහගත වෙත්, සහජාත වෙත්, සංසට්ඨ වෙත්, සම්පයුත්ත වෙත්. ඒ ඉන්ද්‍රියයෝම ඒ අඤ්ඤින්ද්‍රියයාගේ කොටස්ද පිරිවරද වෙත්.

**219.** සකෘදාකාමි මාර්ගක්ෂණයෙහි (මෙහි 216, 217, 218 ඡෙදයෙහි "සොතාපත්ති" වෙනුවට "සකෘදාගාමි" යෙදිය යුතුයි.) අනාගාමි මාර්ගක්ෂණයෙහි (මෙහි 216, 217, 218 ඡෙදයෙහි "සොතාපත්ති" වෙනුවට "අනාගාමි" යෙදිය යුතුයි.) අර්හත් ඵලක්ෂණයෙහි සද්ධින්ද්‍රිය (මෙහි 216 (ii) යොදන්න) අර්හත්මාර්ග ක්ෂණයෙහි උපන් චිත්තජරූප හැර සියලු ධර්මයෝ කුසලයෝ වෙත්. සියලු ධර්මයෝම ආශ්‍රව රහිත වෙත්. සියලු ධර්මයෝම වාතයෙන් එතර කරන්නාහු වෙත්. සියලු ධර්මයෝම නිවනට පමුණුවන්නාහු වෙත්. සියලු ධර්මයෝම ලොකොත්තර වෙත්. සියලු ධර්මයෝම නිවන් අරමුණුකොට ඇත්තාහු වෙත්. අර්හත්මාර්ග ක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියාට මේ ඉන්ද්‍රියයෝ අටදෙන සහජාත පරිවාර වෙත්. අඤ්ඤමඤ්ඤ පරිවාරවෙත්. නිස්සය පරිවාරවෙත්. සම්පයුත්ත පරිවාර වෙත්, සහගත වෙත් සහජාත වෙත්, සංසට්ඨවෙත්, සම්පයුත්ත වෙත්, ඒ ඉන්ද්‍රියයෝම ඒ අඤ්ඤින්ද්‍රියාගේ කොටස්ද පිරිවරද වෙත්.

අර්හත් ඵල ක්ෂණයෙහි අඤ්ඤාතාවිපස්සනාව සද්ධින්ද්‍රිය (මෙහි 216 (ii) යොදන්න) අර්හත්ඵල ක්ෂණයෙහි හටගත් චිත්තජ රූප හැර සියලු ධර්මයෝ අව්‍යාකෘතවෙත්. සියලු ධර්මයෝම ආශ්‍රව රහිත වෙත්. සියලු ධර්මයෝම ලොකොත්තර වෙත්. සියලු ධර්මයෝම නිවන් අරමුණු කොට ඇත්තාහු වෙත්. අර්හත්ඵල ක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ ඉන්ද්‍රියයෝ අටදෙන සහජාතපරිවාර වෙත්. අඤ්ඤමඤ්ඤ පරිවාරවෙත්, නිස්සයපරිවාරවෙත්. සම්පයුත්ත පරිවාරවෙත්. සහගත වෙත්,

සහජාත වෙත්, සංසට්ඨවෙත්. සම්‍යුක්ත වෙත් ඒ ඉන්ද්‍රියෝම ඒ අඤ්ඤාතාවින්ද්‍රියගේ කොටස්ද පිරිවරද වෙත්, මෙසේ අටවරක් අට සූසැටක් වෙත්. ආසවයන මෙහි ආශ්‍රවයෝ නම් කවරහුද? කාමාශ්‍රවයද භවාශ්‍රවය, දෘෂ්ටි ආශ්‍රවය, අවිද්‍යා ආශ්‍රවයද වෙත්. ඒ ආශ්‍රවයෝ කොතැන්හි ක්ෂය වෙත්ද?

**220.** සොතාපත්ති මාර්ගයෙන් ඉතිරි නොවූ දෘෂ්ටි ආශ්‍රවය ක්ෂයවෙයි. අපායෙහි හෙළන කාමාශ්‍රවය ක්ෂයවෙයි. අපායෙහි හෙළන භවාශ්‍රවය ක්ෂයවෙයි. අපායෙහි හෙළන ද්විද්‍යාශ්‍රවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරික කාමාශ්‍රවය ක්ෂය වෙයි. ඒ හා එක්ව පවත්නා භවාශ්‍රවය ක්ෂය වෙයි. ඒ හා එක්ව පවත්නා අවිද්‍යාශ්‍රවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

අනාගාමි මාර්ගයෙන් ඉතිරිනොවූ කාමාශ්‍රවය ක්ෂය වෙයි. ඒහා එක්ව පවත්නා භවාශ්‍රවය ක්ෂය වෙයි. ඒ හා එක්ව පවත්නා අවිද්‍යාශ්‍රවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්. අර්හත්මාර්ගයෙන් ඉතිරි නොවූ භවාශ්‍රය ක්ෂය වෙයි. ඉතිරිනොවූ අවිද්‍යාශ්‍රවය ක්ෂය වෙයි. මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

එය දැනීම් අර්ථයෙන් ඤාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් සූසැට ආකාරයකින් ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ පුරුදු කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව ආශ්‍රව ක්ෂය ඥානයයි කියනු ලැබේ.

**221.** කෙසේ නම් පිරිසිඳ දැකීමෙහි ප්‍රඥාව දුක්ඛයෙහි ඤාණය පහ කිරීමෙහි ප්‍රඥාව සමුදයයෙහි ඤාණයවේද, වැඩීමෙහි ප්‍රඥාව මාර්ගයෙහි ඤාණය ප්‍රත්‍යක්ෂ කිරීමෙහි නිරොධයෙහි ඤාණය නම වේද? දුක්ඛ සත්‍යයාගේ පීළනාර්ථය සංඛතාර්ථය සන්තාපාර්ථය විපරිණාමාර්ථය පිරිසිඳ දතයුතු අර්ථය වෙයි. සමුදය සත්‍යයාගේ ආයුහනාර්ථය නිදානාර්ථය සංයොගාර්ථය පලිබොධාර්ථය ප්‍රහාණය කළයුතු අර්ථය වෙයි. නිරොධ සත්‍යයාගේ නිශ්ශරණාර්ථය විවෙකාර්ථය අසංස්කෘතාර්ථය අමෘතාර්ථය ප්‍රත්‍යක්ෂ කළ යුතු අර්ථය වෙයි.

මාර්ග සත්‍යයාගේ නෛර්යානාර්ථය හෙත්වර්ථය දර්ශනාර්ථය ආධිපත්‍යාර්ථය වැඩිය යුතු අර්ථය වෙයි. එය දැනීම අර්ථයෙන් ඤාණ නම් වෙයි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් පිරිසිඳ දතයුතු අර්ථයෙහි ප්‍රඥාව දුක්ඛයෙහි ඤාණ නමි. ප්‍රහාණාර්ථයෙහි ප්‍රඥාව සමුදයෙහි ඤාණ නමි. ප්‍රත්‍යක්ෂ කටයුතු අර්ථයෙහි ප්‍රඥාව නිරොධයෙහි ඤාණ නමි. වැඩීමෙහි ප්‍රඥාව මාර්ගයෙහි ප්‍රඥානමි.

**222.** කෙසේ නම් දුක්ඛයෙහි ඤාණය දුක්ඛ සමුදයයෙහි ඤාණය දුක්ඛනිරොධයෙහි ඤාණය දුක්ඛනිරොධගාමිනි ප්‍රතිපදාවෙහි ඤාණය වේද? මාර්ගයෙන් යුක්තවූවහුගේ යම් ඤාණයක් වේ නම් එය දුක්ඛයෙහි ඤාණයද වෙයි. දුක්ඛ සමුදයෙහි ඤාණයද වෙයි දුක්ඛනිරොධයෙහි ඤාණයද වෙයි. දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදායෙහි ඤාණයද වෙයි. එහි දුක්ඛයෙහි ඤාණය නම් කවරේද? දුක්ඛ සත්‍යය අරමුණුකොට (ii) යම් ප්‍රඥාවක් දැනීමක් අනිත්‍යාදි ලක්ෂණ සෙවීමක් මනාකොට සෙවීමක් චතුස්සත්‍ය ධර්මය සෙවීමක් සැලකීමක් මනාකොට සැළකීමක් නැවත නැවත සැලකීමක් පණ්ඩිත බවක් දක්ෂ බවක් නිපුණ බවක් අනිත්‍යාදිය ප්‍රකට කිරීමක් අනිත්‍යාදිය සිතීමක් එළඹ පරික්ෂා කිරීමක් පැතුරුණු නුවණක් කෙලෙස් පහකරන නුවණක් යහපත් ධර්මයන් කරා පමුණුවන නුවණක් විවිධාකාරයෙන් දැකීමක් මනා කොට දැනීමක් නිසිමගට හරවන හෙයින් කෙවිටකට බඳු නුවණක් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයක් ප්‍රඥාබලයක් ප්‍රඥා ආයුධයක් ප්‍රඥා ප්‍රාසාදයක් ප්‍රඥා ආලොකයක් ප්‍රඥා රශ්මියක් ප්‍රඥා බැබලීමක් ප්‍රඥා රත්නයක් නුමුළාවක් ධර්මයන් සෙවීමක් සම්‍යක් දෘෂ්ටියක් ඇත්තේද, මෙය දුඃඛසත්‍යයෙහි ඤාණයයි කියනු ලැබේ.

(iii) දුක්ඛ සමුදය සත්‍යය අරමුණුකොට (මෙහි (ii) යොදන්න) දුක්ඛ නිරොධ සත්‍යය අරමුණුකොට (මෙහි (ii) යොදන්න) දුක්ඛ නිරොධාගමිනී ප්‍රතිපදාර්ය සත්‍යය අරමුණුකොට (මෙහි (ii) යොදන්න) නුමුළාවක් ධර්මයන්, සෙවීමක් සම්‍යක් දෘෂ්ටියක් පවත්නේද, මෙය දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයයි කියනු ලැබේ. එය දැනීම්

අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැකීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් දුක්ඛයෙහි ඥාණය දුක්ඛසමුදයෙහි ඥාණය දුක්ඛ නිරොධයෙහි ඥාණය දුක්ඛ නිරොධගාමිනි ප්‍රතිපදායෙහි ඥාණයයි කියනු ලැබේ.

223. කෙසේ අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණය ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණය නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණය ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාවෙහි ඥාණය වේද? අර්ථයන්හි ඥාණය අර්ථ ප්‍රතිසම්භිදා නම්. ධර්මයන්හි ඥාණය ධර්ම ප්‍රතිසම්භිදා නම්. නිරුක්තීන්හි ඥාණය නිරුක්ති ප්‍රතිසම්භිදා නම්. ඥාණයන්හි ඥාණය ප්‍රතිභාන ප්‍රතිසම්භිදා නම්. අර්ථ නානත්වයෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ධර්ම නානත්වයෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. නිරුක්ති නානත්වයෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ප්‍රඥා නානත්වයෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. අර්ථයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. නිරුක්ති පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණනම්. ප්‍රඥා පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. අර්ථයන් සැලකීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ධර්මයන් සැලකීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. නිරුක්ති සැලකීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණනම්. ප්‍රඥා සැලකීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. අර්ථයන් මනාකොට සැලකීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ධර්මයන් මනාකොට සැලකීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. නිරුක්තීන් මනාකොට සැලකීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ප්‍රඥා මනාකොට සැලකීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. අර්ථ ප්‍රභෙදයන්හි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ධර්ම ප්‍රභෙදයන්හි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. නිරුක්ති ප්‍රභෙදයන්හි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඥාණ නම්. ප්‍රඥා ප්‍රභෙදයන්හි ප්‍රඥාව

ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. අර්ථ ප්‍රකට කිරීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ධර්මයන් ප්‍රකට කිරීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. නිරුක්ති ප්‍රකට කිරීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ප්‍රඥා ප්‍රකට කිරීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. අර්ථ දැක්වීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ධර්මයන් දැක්වීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිම්භිදාවෙහි ඤාණ නම්. නිරුක්ති දැක්වීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ප්‍රඥා දැක්වීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. අර්ථයන් විවිධාකාරයෙන් දැක්වීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ධර්මයන් විවිධාකාරයෙන් දැක්වීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. නිරුක්ති විවිධාකාරයෙන් දැක්වීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ප්‍රඥා විවිධාකාරයෙන් දැක්වීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ප්‍රඥා නම්. අර්ථ ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ධර්ම ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. නිරුක්ති ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. ප්‍රඥා ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඤාණ නම්. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් අර්ථ ප්‍රතිසම්භිදාවෙහි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ඤාණය නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි ඤාණය ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ඤාණයයි කියනු ලැබේ.

**224.** කෙසේ නම් තථාගතයන් වහන්සේ සත්වයන් තුළ ඉන්ද්‍රියන්ගේ උතුම්බව හීන බව දැනගන්නා ඤාණය වේද? තථාගතයන් වහන්සේ ස්වල්ප රාගාදිරජස් ඇත්තාවූද මහත් රාගාදි රජස් ඇත්තාවූද තියුණු ඉන්ද්‍රිය ඇත්තාවූද මෘදු ඉන්ද්‍රිය ඇත්තාවූද යහපත් ආකාර ඇත්තාවූද අයහපත් ආකාර ඇත්තාවූද පහසුවෙන් අවබොධ කළහැක්කාවූද, පහසුවෙන් අවබොධ නොකළහැක්කාවූද, ඇතැම් පරලොව සහ වරදෙහි භය දක්නාවූද, ඇතැම් පරලොව සහ වරදෙහි භය නොදක්නාවූද, සත්වයන් දක්නාහ.

ස්වල්ප රාගාදී රජස් ඇති මහත් රාගාදී රජස් ඇති සත්වයන් යන මෙහි සැදැහැවත් පුද්ගලතෙම ස්වල්ප රාගාදි රජස් ඇත්තේ වෙයි. නොසැදැහවත් පුද්ගලතෙමේ මත් රාගාදි රජස් ඇත්තේ වෙයි. පටන්ගත් වීර්ය ඇති පුද්ගලතෙම ස්වල්ප කෙලෙස් ඇත්තේ වෙයි. කුසීත පුද්ගල තෙම මහත් කෙලෙස් ඇත්තේ වෙයි. එළඹ සිටි සිහි ඇති පුද්ගලතෙම ස්වල්ප කෙලෙස් ඇත්තේ වෙයි. මුළාවූ සිහිය ඇති පුද්ගලතෙම මහත් කෙලෙස් ඇත්තේ වෙයි. සමාධියෙන් යුත් පුද්ගලතෙම ස්වල්ප කෙලෙස් ඇත්තේ වෙයි. සමාධිය නැති පුද්ගලතෙම මහත් කෙලෙස් ඇත්තේවෙයි. ප්‍රඥාවත් පුද්ගලතෙම ස්වල්ප කෙලෙස් ඇත්තේ වෙයි. දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම මහත් කෙලෙස් ඇත්තේ වෙයි.

**225.** තියුණු ඉන්ද්‍රිය ඇති මෘදු ඉන්ද්‍රිය ඇති යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලයා තියුණු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. අශ්‍රද්ධාවත් පුද්ගලයා මෘදු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. පටන්ගත් වීර්ය ඇති පුද්ගලයා තියුණු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. කුසීත පුද්ගලයා මෘදු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. එළඹ සිටි සිහි ඇති පුද්ගලයා තියුණු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි මුළාවූ සිහි ඇති පුද්ගලයා මෘදු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි සමාධිය ඇති පුද්ගලයා තියුණු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. සමාධිය නැති පුද්ගලයා මෘදු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. ප්‍රඥාවත් පුද්ගලයා තියුණු ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. දුෂ්ප්‍රාඥ පුද්ගලයා මෘදුඉන්ද්‍රිය ඇත්තේ වෙයි. යහපත් ආකාර ඇති යහපත් ආකාර නැති යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලයා යහපත් ආකාර ඇත්තේ වෙයි. අශ්‍රද්ධාවත් පුද්ගලයා අයහපත් ආකාර ඇත්තේ වෙයි. පටන් ගත් වීර්ය ඇති පුද්ගලයා යහපත් ආකාර ඇත්තේ වෙයි. කුසීත පුද්ගලයා අයහපත් ආකාර ඇත්තේ වෙයි. එළඹ සිටි සිහි ඇති පුද්ගලයා යහපත් ආකාර ඇත්තේවෙයි. මුළාවූ සිහි ඇති පුද්ගලයා අයහපත් ආකාර ඇත්තේ වෙයි. සමාධියෙන් යුත් පුද්ගලයා යහපත් ආකාර ඇත්තේ වෙයි සමාධිය නැති පුද්ගලයා අයහපත් ආකාර ඇත්තේ වෙයි. ප්‍රඥාවත් පුද්ගලයා යහපත් ආකාර ඇත්තේ වෙයි. ප්‍රඥාව නැති පුද්ගලයා අයහපත් ආකාර ඇත්තේ වෙයි.

**226.** පහසුවෙන් අවබොධ කටහැකි පහසුවෙන් අවබොධ නොනටහැකි යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලයා පහසුවෙන්

අවබෝධ කටහැකි වෙයි. අශ්‍රද්ධාවත් පුද්ගලයා පහසුවෙන් අවබෝධ කළ නොහැකිවෙයි. පටන්ගත් වීර්ය ඇති පුද්ගලයා පහසුවෙන් අවබෝධ කටහැකි වෙයි. කුසීත පුද්ගලයා පහසුවෙන් අවබෝධ නොකළ හැකිවෙයි.

එළඹ සිටි සිහිය ඇති පුද්ගලයා පහසුවෙන් අවබෝධ කළ හැකි වෙයි. මුළාවූ සිහිය ඇති පුද්ගලයා පහසුවෙන් අවබෝධ නොකළ හැකි වෙයි. සමාධියෙන් යුත් පුද්ගලයා පහසුවෙන් අවබෝධ කළහැකි වෙයි. සමාධිය නැති පුද්ගලයා පහසුවෙන් අවබෝධ නොකළහැකි වෙයි. ප්‍රඥාවත් පුද්ගලයා පහසුවෙන් අවබෝධ කළ හැකි වෙයි. දුෂ්ප්‍රාඥ පුද්ගලයා පහසුවෙන් අවබෝධ නොකළහැකි වෙයි.

**227.** ඇතැම් පරලොව හා වරදෙහි භය දක්නා පුද්ගලයන් ඇතැම් පරලොව හා වරදෙහි භය නොදක්නා පුද්ගලයන් යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලයා පරලොව හා වරදෙහි භය දක්නේ වෙයි. අශ්‍රද්ධාවත් පුද්ගලයා පරලොව හා වරදෙහි භය නොදක්නේ වෙයි. පටන්ගත් වීර්ය ඇති පුද්ගලයා පරලොව හා වරදෙහි භය දක්නේ වෙයි. කුසීත පුද්ගලයා පරලොව හා වරදෙහි භය නොදක්නේ වෙයි. එළඹ සිටි සිහිය ඇති පුද්ගලයා පරලොව හා වරදෙහි භය දක්නේ වෙයි. සිහිමුළාවූ පුද්ගලයා පරලොව හා වරදෙහි භය නොදක්නේ වෙයි. සමාධියෙන් යුත් පුද්ගලයා පරලොව හා වරදෙහි භය දක්නේ වෙයි. සමාධිය නැති පුද්ගලයා පරලොව හා වරදෙහි භය නොදක්නේ වෙයි. ප්‍රඥාවත් පුද්ගලයා පරලොව හා වරදෙහි භය දක්නේ වෙයි. දුෂ්ප්‍රාඥ පුද්ගලයා පරලොව හා වරදෙහි භය නොදක්නේ වෙයි.

**228.** ලොක යන මෙහි ලොක නම් ස්කන්ධ ලොකයද ධාතු ලොකයද ආයතන ලොකයද විපත්ති භව ලොකයද (අපාය ලොකය) විපත්ති සම්භව ලොකයද (අපායෙහි උපදවන කර්මය) සම්පත්ති ලොකයද (සුගති ලොකය) සම්පත්ති සම්භව ලොකයද (සුගති ලොකයෙහි උපදවන කර්මය) එක් ලොකයකි. සියලු සත්වයෝ ආහාරය නිසා පවත්නාහ. ලොක දෙකකි. නාමයද රූපයද වෙයි. ලොක තුනකි ත්‍රිවිධ වේදනාවෝයි ලොක සතරකි. සතර ආහාරයෝයි. ලොක පසකි. උපාදානස්කන්ධ

පහයි. ලොක සයකි. ආධ්‍යාත්මිකායතන සයයි. ලොක සතකි. විඥානස්ථිති සතය. ලොක අටකි. අෂ්ටලොක ධර්මයෝයි. ලොක නවයකි. සත්වාවාස නවයයි ලොක දසයකි. ආයතන දසයයි. ලොක දොළොසකි. දොළොස් ආයතනයෝයි, ලොක දහඅටෙකි දහඅටක්වූ ධාතූහුය.

වරද යන මෙහි වරද නම් සියලු ක්ලේශයෝ වරද වෙති. සියලු දුශ්චරිතයෝ වරද වෙති. සියලු කර්මයෝ වරද වෙති. සියලු භවගාමි කර්මයෝ වරද වෙති. මෙසේ මේ ලෝකයෙහිද මේ වරදෙහිද අමෝරාගත් කඩුවක් ඇති වධකයෙකු කෙරෙහි මෙන් තියුණු භය සඤ්ඤාව එළඹ සිටියේ වෙයි. මේ පණස් ආකාරයෙන් මේ පඤ්ච ඉන්ද්‍රියයන් දන්නේද දක්නේද අවබෝධ කරන්නේද ප්‍රතිවේධ කරන්නේද වෙයි. මෙය තථාගතයන් වහන්සේගේ සත්වයන්ගේ ඉන්ද්‍රියයන් උසස් බව හීන බව දැනගන්නා ඤාණ නම් වේ.

**229.** කුමක් නම් තථාගතයන් වහන්සේගේ සත්වයන්ගේ ආසය අනුසය දන්නා ඤාණය වේද? තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි සත්වයන්ගේ ආසය (පුරුද්ද) දන්නාහ. අනුසයද සිත්හි ලැගගෙන පවත්නා (බලවත් කෙලෙස්) දන්නාහ. චරිතයද දන්නාහ. බලවත් කැමැත්තද දන්නාහ. සුදුසු නුසුදුසු සත්වයන්ද දන්නාහ. සත්වයන්ගේ ආසය නම් කුමක්ද? ලොකය (ආත්මය) නිත්‍යයයි හෝ ලෝකය නිත්‍ය නොවේයයි කියා හෝ ලෝකය කෙළවර සහිතයයි හෝ ලොකය කෙළවර රහිතයයි හෝ ජීවයත් එයමය, ශරීරයත් එයමයයි හෝ සත්වතෙම (ආත්මය) මරණින් පසු ඇතැයි කියා හෝ සත්වයා මරණින් පසු නැතැයි කියා හෝ සත්වයා මරණින් පසු ඇත්තේද වෙයි, නැත්තේද වෙයි. කියා හෝ සත්වයා මරණින් පසු නැත්තේද නැත්තේ නොවන්නේද වෙයි, කියා හෝ මෙසේ සත්වයෝ භව දෘෂ්ටිය ඇසුරුකළාහු හෝ වෙත්) විභව දෘෂ්ටිය ඇසුරුකළාහු හෝ වෙත්. මේ දෙයාන්තයට නොබැස මේ හේතුව නිසා මේ ඵලය ඇතිවේය යන පටිච්ච සමුප්පාද ධර්මයට අනුකූලවූ නුවණ හෝ ලද්දේ හෝ වෙයි. යථාභූත ඥානය හෝ ලද්දේ වෙයි. කම්සැප විඳින්නහුම මේ පුද්ගලයා කාමය ගරු කරන්නෙක

කාමාසය ඇත්තෙක, කාමයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. කම්සැප විඳින්නහුම මේ පුද්ගලතෙම කාමයෙන් වෙන්වීම ගරු කරන්නෙක. කාමයෙන් වෙන්වීමේ ආසය ඇත්තෙකි. කාමයෙන් වෙන්වීමේ බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ.

**230.** කාමයෙන් වෙන්ව වසන්නහුම මේ පුද්ගලතෙමේ නෛෂ්ක්‍රම්‍ය ගරු කරන්නෙකි. නෛෂ්ක්‍රම්‍ය ආසය ඇත්තෙකි. නෛෂ්ක්‍රම්‍යයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. නෛෂ්ක්‍රම්‍ය සේවනය කරන්නහුම මේ පුද්ගලතෙම කාමය ගරු කරන්නෙකි. කාම ආසය ඇත්තෙකි. කාමයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ.

**231.** ව්‍යාපාදය (ක්‍රොධය) සේවනය කරන්නහුම මේ පුද්ගලතෙම ව්‍යාපාදය ගරු කරන්නෙකි. ව්‍යාපාද ආසය ඇත්තෙකි. ව්‍යාපාදයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකියි දන්නාහ. ව්‍යාපාදය සේවනය කරන්නහුම මේ පුද්ගලයා අව්‍යාපාදය ගරු කරන්නෙක. අව්‍යාපාද අදහස් ඇත්තෙක. අව්‍යාපාදයෙහි අධික කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. අව්‍යාපාදය සේවනය කරන්නහුම මේ පුද්ගලතෙම අව්‍යාපාදය ගරු කරන්නෙක. අව්‍යාපාදය ආසය ඇත්තෙක, අව්‍යාපාදයෙහි කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. අව්‍යාපාදය සේවනය කරන්නහුම මේ පුද්ගලතෙම ව්‍යාපාදය ගරු කරන්නෙක ව්‍යාපාද ආසය ඇත්තෙක. ව්‍යාපාදයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ.

**232.** ථිනමිද්ධය සෙවනය කරන්නහුට මේ පුද්ගලතෙම ථිනමිද්ධය ගරුකරන්නෙක. ථිනමිද්ධ ආසය ඇත්තෙකි. ථිනමිද්ධයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. ථිනමිද්ධය සෙවනය කරන්නහුම මේ පුද්ගලතෙම ආලෝක සඤ්ඤාව ගරුකරන්නෙක. ආලොක සඤ්ඤා ආසය ඇත්තෙක. ආලොක සඤ්ඤාවෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ.

**233.** ආලොක සඤ්ඤාව සෙවනය කරන්නාහු මේ පුද්ගල තෙම ආලොක සඤ්ඤාව ගරුකරන්නෙක. ආලොක සඤ්ඤා

ආසය ඇත්තෙක, ආලොක සඤ්ඤාවෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. ආලොක සඤ්ඤාව සෙවනය කරන්නහුම මේ පුද්ගලතෙම ථිනමිද්ධය ගරු කරන්නෙක, ථිනමිද්ධ ආසය ඇත්තෙක ථිනමිද්ධයෙහි බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ. මෙය සත්වයන්ගේ ආසය නමි.

**234.** සත්වයන්ගේ අනුසය නම් කවරේද? කාමරාගානුසය පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, භවරාගානුසය, අවිජ්ජානුසයයයි අනුසය සතකි.

**235.** ලොකයෙහි යම් ප්‍රිය රූපයක් මිහිරි රූපයක් වෙයිද මෙහි සත්වයන්ගේ කාමරාගානුසය (ඉපදීමට සුදුසු කරුණු ලැබ) උපදියි. ලොකයෙහි යම් අප්‍රිය රූපයක් අමිහිරි රූපයක් වෙයිද මෙහි සත්වයන්ගේ පටිඝානුසය උපදියි. මේ දෙවැදෑරුම් ධර්මයන්හිම අවිද්‍යාව අනුව යන්නේ වෙයි. ඒ හා එක්ව පවත්නාවූ මානයද දිට්ඨියද, විචිකිච්ඡාවද දතයුත්තාහ. මේ සත්වයන්ගේ අනුසය නම් වෙයි.

**236.** සත්වයන්ගේ චරිතය නම් කුමක්ද? ස්වල්ප විපාක ඇත්තාවූ හෝ මහා විපාක ඇත්තාවූ හෝ පුඤ්ඤාභි සංඛාර අපුඤ්ඤාභිසංඛාර අනෙඤ්ජාභිසංඛාර යන කුශලාකුශල කර්මයෝ වෙත්ද, මෙය සත්වයන්ගේ චරිත නමි. සත්වයන්ගේ අධිමුක්ති (අදහස) නම් කවරේද? හීන අදහස් ඇති සත්වයෝද ඇත්තාහ. උතුම් අදහස් ඇති සත්වයෝද ඇත්තාහ. හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් සෙවනය කරත්, භජනය කරත්, පයිරුපාසනය කරත්, උතුම් අදහස් ඇති සත්වයෝ උතුම් අදහස් ඇති සත්වයන් සෙවනය කරත්, භජනය කරත්, පයිරුපාසනය කරත්, අතීත කාලයෙහිදු හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් සේවනය කළාහුය, භජනය කළාහුය, පයිරුපාසනය කළාහුය, උතුම් අදහස් ඇති සත්වයෝ උතුම් අදහස් ඇති සත්වයන් සේවනය කළාහුය, භජනය කළාහුය, පයිරුපාසනය කළාහුය. අනාගත කාලයෙහිදු හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් සෙවනය කරන්නාහුය, භජනය කරන්නාහුය. පයිරුපාසනය කරන්නාහුය. උසස් අදහස් ඇති සත්වයෝ උසස් අදහස් ඇති සත්වයන්

සෙවනය කරන්නාහුය, භජනය කරන්නාහුය පයිරුපාසනය කරන්නාහුය. මෙය සත්වයන්ගේ අදහස නම්.

237. නුසුදුසු සත්වයෝ නම් කවරහුද? යම් ඒ සත්ව කෙනෙක් කර්මාවරණයෙන් යුක්තවූවාහුද ක්ලෙසාවරණයෙන් යුක්තවූවාහුද විපාක ආවරණයෙන් යුක්තවූවාහුද ශ්‍රද්ධානැත්තාහුද කැමැත්ත නැත්තාහුද නුවණ නැත්තාහුද කුශල ධර්මයන් අතුරෙන් අනතුරුව ඵලයගෙන දෙනහෙයින් යහපත් ස්වභාවය ඇත්තාවූ මාර්ග කුශලයට පැමිණීමට නුසුදුස්සාහුද, මේ සත්වයෝ නුසුදුස්සෝ වෙත්. කවර සත්වයෝ සුදුස්සෝ වෙත්ද? යම් ඒ සත්ව කෙනෙක් කර්මාවරණයෙන් යුක්ත නොවූවාහුද, ක්ලේශාවරණයෙන් යුක්ත නොවූවාහුද, විපාකාවරණයෙන් යුක්ත නොවූවාහුද, ශ්‍රද්ධා ඇත්තාහුද කැමැත්ත ඇත්තාහුද නුවණ ඇත්තාහුද කුශල ධර්මයන් අතුරෙන් (අනතුරුව ඵලදෙන හෙයින්) යහපත් ස්වභාවය ඇත්තාවූ මාර්ග කුශලයට පැමිණීමට සුදුසුවූවාහුද මේ සත්වයෝ සුදුස්සෝ වෙත්. මේ තථාගතයන් වහන්සේගේ ආසයානුසය ඤාණයයි.

238. කුමක් නම් තථාගතයන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්ය ඥානය වේද? මේ ලොකයෙහි තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන්ට අසාධාරණවූ යමක ප්‍රාතිහාර්ය දක්වයි. උඩුකයින් ගිනිකඳ පවතියි. යටිකයින් දිය දහර පවතියි. යටිකයින් ගිනිකඳ පවතියි. උඩුකයින් දිය දහර පවතියි. පෙර කයින් ගිනිකඳ පවතියි. පසුකයින් දිය දහර පවතියි. පසු කයින් ගිනිකඳ පවතියි. පෙර කයින් ගිනිකඳ පවතියි. දකුණු ඇසින් ගිනිකඳ පවතියි. වම් ඇසින් දිය දහර පවතියි. වම් ඇසින් දිය දහර පවතියි. දකුණු ඇසින් ගිනිකඳ පවතියි. දකුණු කණින් ගිනිකඳ පවතියි. වම් කණින් දිය දහර පවතියි. වම් කණින් ගිනිකඳ පවතියි දකුණු කණින් දිය දහර පවතියි. දකුණු නාස් පුඩුවෙන් ගිනි කඳ පවතියි. වම්නාස් පුඩුවෙන් දිය දහර පවතියි. වම් නාස් පුඩුවෙන් ගිනිකඳ පවතියි. දකුණු නාස් පුඩුවෙන් දිය දහර පවතියි. දකුණු උරහිසින් ගිනිකඳ පවතියි. වම් උරහිසින් දියදහර පවතියි. වම් උරහිසින් ගිනිකඳ පවතියි. දකුණු උරහිසින් දියකඳ

පවතියි. දකුණු අතින් ගිනිකඳ පවතියි. වම් අතින් දියකඳ පවතියි. වම් අතින් ගිනිකඳ පවතියි. දකුණු අතින් දියදහර පවතියි. දකුණු අංසයෙන් ගිනිකඳ පවතියි. වම් අංසයෙන් දිය දහර පවතියි. වම් අංසයෙන් ගිනිකඳ පවතියි. දකුණු අංසයෙන් දිය දහර පවතියි. දකුණු පාදයෙන් ගිනිකඳ පවතියි. වම් පාදයෙන් දිය දහර පවතියි වම් පාදයෙන් ගිනිකඳ පවතියි. දකුණු පාදයෙන් දිය දහර පවතියි. ඇඟිල්ලකින් ඇඟිල්ලකින් ගිනිකඳ පවතියි. ඇඟිලි අතරින් දිය දහර පවතියි. ඇඟිලි අතරින් ගිනිකඳ පවතියි. ඇඟිල්ලකින් ඇඟිල්ලකින් දිය දහර පවතියි. එක් එක් රෝමයකින් ගිනිකඳ පවතියි. එක් එක් රෝමයකින් දිය කඳ පවතියි. රෝම කූපයකින් රෝම කූපයකින් ගිනිකඳ පවතියි රෝම කූපයකින් රෝම කූපයකින් දිය දහර පවතියි. සකල ශරීරයෙන් නීල පීත ලොහිත ඔදාත මංජෙෂ්ට ප්‍රභාස්වර යන සවණක් රැස් පවතියි. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරනසේක. නිර්මිත බුදුරජතෙම සිටින්නේ හෝ හිඳින්නේ හෝ සයනය කරන්නේ හෝ වෙයි. භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිනසේක. නිර්මිත බුදුරජතෙම සක්මන් කරන්නේ හෝ හිඳින්නේ හෝ සයනය කරන්නේ හෝ වෙයි. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳිනසේක. නිර්මිත බුදුරජතෙම සක්මන් කරන්නේ හෝ සිටින්නේ හෝ සයනය කරන්නේ හෝ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සයනය කරන සේක. නිර්මිත බුදුරජතෙම සක්මන් කරන්නේ හෝ සිටින්නේ හෝ සයනය කරන්නේ හෝ වෙයි. නිර්මිත බුදුරජ තෙම සක්මන් කරයි. භාග්‍යවතුන් වහන්සේ සිටිනසේක් හෝ වැඩහිඳිනසේක් හෝ සයනය කරනසේක් හෝ වෙති. නිර්මිත බුදු රජතෙම සිටින්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරණසේක් හෝ වැඩහිඳිනේ හෝ සයනය කරණසේක් හෝ වෙති. නිර්මිත බුදුරජ තෙම හිඳින්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරණසේක් හෝ සිටිනසේක් හෝ සයනය කරණසේක් හෝ වෙති. නිර්මිත බුදුරජතෙම සයනය කරන්නේ වෙයි. භාග්‍ය වතුන්වහන්සේ සක්මන් කරණ සේක් හෝ සිටිනසේක් හෝ හිඳිනසේක් හෝ වෙත්. මෙය භාග්‍යවතුන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්ය ඥාණ නම් වේ.

තථාගතයන් වහන්සේගේ මහා කරුණා සමාපත්තියෙහි ඤාණය නම් කවරේද? නොයෙක් ආකාරයෙන් ලොව දක්නාවූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොක සන්නිවාසය (රාගාදි ගිනි වලින්) ගිනිගෙන දන්නේයයි දක්නාවූ (ii) භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. (iii) ලෝක සන්නිවාසය නිතර කටයුතුවල යෙදී වාසය කරන්නේයයි භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොක සන්නිවාසය මරණය කරා නොනැවත ගමන් කරන්නේයයි දක්නාවූ භාග්‍යවතුන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොක සන්නිවාසය නොමග පිළිපන්නේයයි දක්නාවූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොකයතෙම ජරාවෙන් මරණයට පමුණුවනු ලැබේ. අස්ථිරයයි දක්නාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොකය අසරණය සහාය වන්නෙකු නැතැයි සත්වයන් කෙරෙහි භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි.

**239.** ලොකයතෙම තමා සතු දෙයක් නැත. සියල්ල අත්හැර යායුතුයයි දක්නා භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලෝවැසිතෙම අඩුපාඩු සහිතය, ඇතිවීමක් නැත, තෘෂ්ණාවගේ දාසයෝයයි දක්නාවූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළවෙයි. ලොක සන්නිවාසය පිහිටක් ඇත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොකසන්නිවාසය සැඟවීමට තැනක් නැත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය අසරණයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය ඉපදීමත් සමගම අසරණවූයේ යයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලෝවැසිතෙම විසිර ගිය සිත් ඇත්තේය. නොසංසිඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලෝක සන්නිවාසය

විඳිනලද රාගාදි බොහෝ හුල්වලින් හුල් සහිතය. මා හැර ඔහුගේ ඒ හුල් උදුරා දමන්නාවූ අනිකෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොකසන්නිවාසය අවිද්‍යාන්ධකාරයෙන් වැසුණේය. ක්ලේශයන් නැමති කූඩුවෙහි දමනලදුව අන්ධවූයේය. ඔහුට මා හැර ආලොකය දන්නාවූ අනිකෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොකසන්නිවාසය අවිද්‍යාවෙන් යුක්තවූයේය, බිත්තරය තුළ උපන් සත්වයෙකු මෙන් අවිද්‍යාව නමැති බිත්තර කටුවෙන් හාත්පස වැසුණේය. නූල් කැරැල්ලක් මෙන් අවුල් වූයේය. රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් පොදියක් මෙන් පැටලුම් සහිත වූයේය. මුදුස්තෘණ බබුස්තෘණ වලින් ගොතන ලද ලණු කැබැල්ලක මෙන් අගක් මුලක් නැත්තේය. දුර්ගතියවූ සැපයෙන් විනාශවූ අපාය සංසාරය නොඉක්මවන්නේ යයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය අවිද්‍යාව නමැති විෂ දොෂයෙන් ආලේපනය කරණ ලද්දේය. කෙලෙස් මඩ සහිතවූයේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලෝවැසිතෙම රාග දොෂ මොහ අවුලෙන් අවුල් වූයේය. මා හැර ඔහුගේ අවුල අවුල් හරින්නාවූ අන්කිසිවෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණා බන්ධනයෙන් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණා දැලෙන් පැටලුණේයයි (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණා සැඩ පහරින් ගසාගෙන යනු ලබන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණා රැහැණින් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසයතෙම තෘෂ්ණානුසයයෙන් ශක්තිමත් බවට පැමිණියේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණා සන්තාපයෙන් තැවේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණාදාහයෙන් දැවේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දෘෂ්ටි බන්ධනයෙන් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක

සන්නිවාසය තෙම දෘෂ්ටි දැලෙන් පැටලුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දෘෂ්ටි සැඩපහරින් ගසායනු ලැබේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දෘෂ්ටි රැහැණින් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.)

**240.** ලොක සන්නිවාසය දෘෂ්ටි අනුසයයෙන් ශක්තිමත් වූයේ යයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දෘෂ්ටි සන්තාපයෙන් තැවේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දෘෂ්ටි දාහයෙන් දැවේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම ජාතියට පිවිසෙන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසය තෙම ජරාවෙන් දුවන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම ව්‍යාධියෙන් මඩනා ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසය තෙම මරණයෙන් විනාශවන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම දුකෙහි පිහිටියේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම තෘෂ්ණාවෙන් එල්වන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම ජරා ප්‍රාකාරයෙන් වටකරන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය මරණය නැමැති මළ පුඩුවෙන් බඳනා ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම රාග බන්ධනයෙන්ද දොස බන්ධනයෙන්ද මොහ බන්ධනයෙන්ද දිට්ඨි බන්ධනයෙන්ද කිලෙස බන්ධනයෙන්ද දුශ්චරිත බන්ධනයෙන්ද යන මහා බන්ධනයෙන් බැඳුණේය, මාහැර ඔහු බන්ධනායන් මුදවන්නාවූ අන් කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.)

**241.** ලොක සන්නිවාසය තෙම මහත් සම්බන්ධයට පැමිණියේය. මාහැර ඔහුට කිසි අවකාශයක් පෙන්වන්නාවූ අන් කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම මහත් වැළැක්මෙන් වළක්වන ලද්දේය. මාහැර ඔහුගේ වැළැක්වූ සිඳින්නාවූ අන්කෙනෙකු

නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම මහත් ප්‍රපාතයෙහි වැටුණේය. මා හැර ඔහු ප්‍රපාතයෙන් ගොඩ ගන්නා අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම මහත් කාන්තාරයට පිළිපන්නේය. මා හැර ඔහු කාන්තාරයෙන් එතර කරන්නාවූ අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම මහත් සංසාරයට පිළිපන්නේය. මා හැර ඔහු සංසාරයෙන් මුදවන්නාවූ අන් කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම මහත් දුක් සහිත මාර්ගයෙහි ඔබ මොබ ගමන් කරයි. මා හැර ඔහු දුර්ග මාර්ගයෙන් මුදාලන අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම සියලු උවදුරුවලින් මඩනා ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම රාග ගින්නෙන් දොස ගින්නෙන් මොහ ගින්නෙන් ජාතියෙන් ජරාවෙන් මරණයෙන් ශොකයන්ගෙන් පරිදෙවයන්ගෙන් දුක්ඛයන්ගෙන් දොමනස්සයන්ගෙන් උපායාසයන්ගෙන් ගිනිගෙන ඇවිලෙන ලද්දේය. මා හැර ඔහු නිවන්නාවූ අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.)

**242.** ලොක සන්නිවාසයතෙම ජාතියෙන් උදුරා ජරාදී උවදුරුවලට පමුණුවන ලද්දේ නිරතුරු පිහිටක් නැත්තේ දඬුවමට පැමිණි සොරෙක් මෙනැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසයතෙම වරදට අසුවී බැඳුණ දංගෙඩියට එළඹ සිටියේය. මා හැර ඔහු බන්ධනයෙන් මුදවන්නාවූ අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසය තෙම අනාථය. පරම දිලිඳු බවට පැමිණියේය. මා හැර ඔහුට පිහිටවන්නාවූ අන් කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොක සන්නිවාසයතෙම දුකින් මිරිකෙන ලද්දේය. බොහෝ කලක් මුළුල්ලෙහි පෙළෙන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසයතෙම තණ්හාවෙන් ගිජු වූයේය, නිතර තෘෂ්ණා පිපාසයෙන් යුක්තවූයේයයි දක්නාවූ (මෙහි 238

(ii) යොදන්න) ලොක සන්නිවාසයතෙම අඳය. ඇස් නැත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම නැසුණු නෙත් ඇත්තේය. මග පෙන්වන්නෙක් නැත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම වැරදි මගට බැස්සේය. හරිමග වැරදුනේය. මා හැර ඔහු ආර්යමාර්ගයට පමුණුවන්නාවූ අන්කෙනෙකු නැත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම මහ වතුරට බැසගත්තේය. මා හැර ඔහු මහ වතුරෙන් ගොඩගන්නාවූ අන්කෙනෙකු නැතැයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.)

**243.** ලොකසන්නිවාසයතෙම දෙවැදෑරුම් දෘෂ්ටියෙන් අල්වාගැනීමට පැමිණියේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම ත්‍රිවිධ දුශ්චරිතයන්ට බැසගත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සතර යොගයන්ගෙන් යුක්තවූයේය. සතර යොගයන්ගෙන් බැඳුනේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සතර උපාදානයන්ගෙන් අල්වාගනු ලැබීයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සතර ග්‍රන්ථයන්ගෙන් ගැටගැසුණේ යයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසය තෙම පඤ්චගතියට නැගගත්තේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම පස්කම් ගුණයෙන් ඇලෙන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම පඤ්චනීවරණයන්ගෙන් වසනලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම විවාදමූල සයින් විවාද කරන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සවැදෑරුම් තෘෂ්ණා කායයන්ගෙන් ඇලෙන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සවැදෑරුම් දෘෂ්ටීන්ගෙන් මඩනාලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොක සන්නිවාසයතෙම අනුසය සතින් ශක්තිමත් බවට පැමිණියේ යයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න)

ලොකසන්නිවාසය තෙම සඞ්ඤොජන සතින් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම සත්වැදෑරුම් මානයෙන් උඩඟුවූයේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලෝකසන්නිවාසයතෙම අෂ්ටලෝක ධර්මයෙන් පෙරළෙන්නේයයි දක්නාවූ - (මෙහි 238 (ii) යොදන්න)

**244.** ලොකසන්නිවාසයතෙම මිච්ඡත්ත ධර්ම අටෙන් මඩනා ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසතෙම පුරුෂදොෂ අටෙන් දූෂ්‍යවන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසය තෙම නව ආඝාතවස්තුවෙන් ක්‍රොධකරන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසයතෙම නව තණ්හා මූලක ධර්මයන්ගෙන් ඇලෙන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසයතෙම දස ක්ලේශ වස්තූන්ගෙන් කිලුටුවන්නේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසයතෙම දස ආඝාතවස්තුවෙන් ක්‍රොධකරන ලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසයතෙම දශ අකුශල කර්මපථයෙන් යුක්ත වූයේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි) ලොකසන්නිවාසය තෙමද සංයෝජනයන්ගෙන් බැඳුණේයයි දක්නාවූ (මෙහි 238 (ii) යෙදිය යුතුයි.) ලොකසන්නිවාසය තෙම දස මිච්ඡත්තධර්මයන්ගෙන් මඩනාලද්දේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූයේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න.) ලොකසන්නිවාසය තෙම දශ වස්තුක අන්තග්‍රාහික මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූයේයයි දක්නාවූ (මෙහි 238 (ii) යොදන්න) ලොකසන්නිවාසයතෙම එකසිය අටක් යයි කියනලද තෘෂ්ණාප්‍රපඤ්ච සියයෙන් ප්‍රමාදයට පැමිණියේයයි දක්නාවූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. ලොකසන්නිවාසය තෙම දෙසැට මිථ්‍යාදෘෂ්ටියෙන් මඩනා ලද්දේයයි දක්නාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**245.** මම වනාහි එතෙරවූයේ වෙමි. ලෝවැසිතෙම එතෙර නුවූයේය. මම වනාහි මිදුණේ වෙමි. ලෝවැසිතෙම නොමිදුණේය. මම වනාහි දමනය වූයේ වෙමි. ලෝවැසි තෙම දමනය නොවූයේය. මම වනාහි සංසිඳුණේ වෙමි. ලෝවැසිතෙම නොසංසිඳුණේය. ම වනාහි නොඇලුණේ වෙමි. ලෝවැසිතෙම ඇලුණේය. මම වනාහි පිරිනිවියේ වෙමි. ලෝවැසිතෙම නොපිරිනිවියේය. එතෙරවූ මම එතර කරවන්ට සමර්ථ වෙමි. මිදුණාවූ මම මුදවන්ට සමර්ථ වෙමි. දැමුණාවූ මම දමනය කරවන්ට සමර්ථ වෙමි. සංසිඳුණාවූ මම සංසිඳවන්ට සමර්ථ වෙමි. නොඇලුණාවූ මම නොඇලවන්ට සමර්ථ වෙමි. පිරිනිවියාවූ මම අනුනුදු පිරිනිවාලීමට සමර්ථ වෙමැයි දක්නාවූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. මෙය තථාගතයන් වහන්සේගේ මහා කරුණාවෙහි ඥාණයයි.

**246.** තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානය නම් කවරේද? සංඛතවූද අසංඛතවූද සියල්ල නිරවශෙෂ කොට දනීනුයි සර්වඥතාඥාන නම්වේ. ඒ සියල්ල දැනීමෙහි ආවරණයක් නැත්තහුයි (ඒ සර්වඥතාඥානය) අනාවරණ ඥාණ නම් වෙයි. අතීතවූ සියල්ල දනීනුයි. සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්හුයි අනාවරණ ඥාන නමි. අනාගත සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. ප්‍රත්‍යුත්පන්න සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. චක්ෂුවද රූපයෝද ඇත්තාහ. (ii) ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. ශ්‍රොතයද ශබ්දයෝද ඇත්තාහ. (මෙහි (ii) යොදන්න) ඝානයද ගන්ධයෝද ඇත්තාහ. (ii යොදන්න) ජිව්හාවද රසයෝද ඇත්තාහ. (ii යොදන්න) කයද ප්‍රශ්ටව්‍යයෝද ඇත්තාහ. (ii යොදන්න) සිතද ධර්මයෝද ඇත්තාහ. (ii යොදන්න) ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණඥාන නමි. iii යම්තාක් දේ අනිත්‍ය ස්වභාවය ඇත්තේද දුක්ඛ ස්වභාවය ඇත්තේද අනාත්ම ස්වභාවය

ඇත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතා ඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. (iv) යම්තාක් රූපස්කන්ධයාගේ අනිත්‍ය ස්වභාවය ඇත්තේද, දුක්ඛ ස්වභාවය යම්තාක් ඇත්තේද, අනාත්ම ස්වභාවය යම්තාක් ඇත්තේද, ඒ සියල්ල දනීනුයි සර්වඥතා ඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඤාණ නමි. (v) වෙදනාස්කන්ධයාගේ යම්තාක් (මෙහි (iii) යොදන්න) සඤ්ඤා ස්කන්ධයාගේ යම්තාක් ( (iii) යොදන්න) සංඛාර ස්කන්ධයාගේ යම්තාක් ( (iii) යොදන්න) විඤ්ඤානස්කන්ධයාගේ යම්තාක් ( (iii) යොදන්න) චක්ෂුසගේ යම්තාක් ( (iii) යොදන්න) ජරාමරණයාගේ යම්තාක් අනිත්‍ය ස්වභාවය ඇත්තේද දුක්ඛ ස්වභාවය ඇත්තේද අනාත්ම ස්වභාවය ඇත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. යම්තාක් ප්‍රකට කොට දක්නා නුවණින් ප්‍රකට කොට දතයුත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. යම්තාක් පිරිසිඳ දන්නා නුවණින් පිරිසිඳ දතයුතු වන්නේද, ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. යම්තාක් ප්‍රහාණය කළයුතු ධර්මයාගේ ප්‍රහාණය කටයුතු ස්වභාවයක් ඇත්තේද (මෙහි (ii) යොදන්න) යම්තාක් වැඩිය යුතු ධර්මයාගේ වැඩිය යුතු ස්වභාවයක් ඇත්තේද (vi) යොදන්න) යම්තාක් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයාගේ ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයක් ඇත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. යම්තාක් ස්කන්ධ (රාශි) අර්ථයක් ඇත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥා නමි. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණ ඥාන නමි. යම්තාක් ධාතූන්ගේ ධාතු ස්වභාවයක් ඇත්තේද (මෙහි (iv) යොදන්න) යම්තාක් ආයතනයන්ගේ ආයතන ස්වභාවයක් ඇත්තේද ( (iv) යොදන්න) යම්තාක් සංඛත ධර්මයන්ගේ සංඛත ස්වභාවයක් ඇත්තේද ( (iv) යොදන්න) යම්තාක් අසංඛත ධර්මයාගේ අසංඛත ස්වභාවයක් ඇත්තේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණ

ඥාන නම්. ඇතිතාක් සියලු කුශල ධර්මයන් (iv) යොදන්න) දනීනුයි සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාණනම්. ඇතිතාක් සියලු අකුශල ධර්මයන් (මෙහි (iv) යොදන්න) ඇතිතාක් සියලු අව්‍යාකෘත ධර්මයන් (මෙහි (iv) යොදන්න) ඇතිතාක් සියලු කාමාවචර ධර්මයන් (මෙහි (iv) යොදන්න) ඇතිතාක් සියලු අරූපාවචර ධර්මයන් (මෙහි (iv) යොදන්න) ඇතිතාක් සියලු ලොකොත්තර ධර්මයන් දනීනුයි. සර්වඥතා ඥාන නම්. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණ ඥාන නම්. දුක්ඛ සත්‍යයාගේ දුක්ඛ ස්වභාව යම් පමණවේද, ඒ සියල්ල දන්නා හෙයින් සර්වඥතා ඥාන නම්. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණ ඥාන නම්. සමුදය සත්‍යයාගේ සමුදය ස්වභාව යම් පමණ වේද (මෙහි (iv) යොදන්න) නිරොධ සත්‍යයාගේ නිරොධය ස්වභාව යම් පමණ වේද, (මෙහි (iv) යොදන්න) මාර්ග සත්‍යයාගේ මාර්ග ස්වභාව යම් පමණ වේද ඒ සියල්ල දන්නා හෙයින් සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැත්නුයි අනාවරණඥාන නම්. අර්ථ ප්‍රතිසම්භිදා ඥානයෙන් දතයුතු අර්ථ ප්‍රතිසම්භිදාර්ථ යම්තාක් වේද ඒසියල්ල දන්නා හෙයින් සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණඥාන නම්. ධර්ම ප්‍රතිසම්භිදා ඥානයෙන් දතයුතු ධර්ම ප්‍රතිසම්භිදාර්ථ යම් පමණ වේද (මෙහි (v) යොදන්න) නිරුක්ති ප්‍රතිසම්භිදා ඥානයෙන්ද දතයුතුවූ නිරුක්ති ප්‍රතිසම්භිදාර්ථ යම් පමණ වේද (මෙහි (v) යොදන්න) ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ඥානයෙන් දතයුතුවූ ප්‍රතිභාන ප්‍රතිසම්භිදාර්ථ යම් පමණ වේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැත්නුයි. අනාවරණඥාන නම්. යම්තාක් ඉන්ද්‍රියයන්ගේ වැඩුණු නොවැඩුණු බව දන්නා ඥානය වේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැත්නුයි අනාවරණඥාන නම්. සත්වයන්ගේ ආසය අනුසය දන්නා ඤාණය යම්තාක්වේද (මෙහි (v) යොදන්න) යමක ප්‍රාතිහාර්යයෙහි ඥානය යම්තාක් වේද (මෙහි (v) යොදන්න) මහා කරුණා සමාපත්ති ඤාණය යම්තාක් වේද ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නම්. එහි

ආවරණයක් නැත්නුයි අනාවරණඥාන නම්. දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලොකයා විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව විසින් ඇසින් දක්නාලද කණින් අසනලද ඝාන ජිව්හා කාය යන ඉන්ද්‍රියන් තුනෙන් දැනගන්නා ලද සිතින් දැනගන්නා ලද පැමිණෙන ලද සොයන ලද සිතින් හැසිරෙන ලද යම් පමණ දෙයක් වේද, ඒ සියල්ල දනීනුයි සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැති හෙයින් අනාවරණඥාන නම්.

**247.** "උන්වහන්සේ විසින් මේ වර්තමාන කාලයෙහි නුවණැසින් නොදක්නාලද කිසිවක් නැත. එසේම අතීත කාලයෙහි නොදක්නා ලද කිසිවක්ද නැත. අනාගත කාලයෙහිදු නොදතයුතු (නොදන්නා) කිසිවක් නැත, කාලත්‍රය පිළිබඳවූ දතයුතු යමක් ඇත්නම් ඒ සියල්ල දැන වදාළේය. එහෙයින් තථාගතයන් වහන්සේ සමන්ත චක්ඛු (හාත්පස සියල්ල දක්නා නුවණැස ඇත්තේ) නම් වනසේක.

**248.** සමන්ත චක්ඛු යන මෙහි කිනම් අර්ථයකින් සමන්ත චක්ඛු නම් වෙයිද? බුද්ධඥාන තුදුසකි. දුකෙහි පවත්නා ඥානය බුද්ධඥාන නම්. දුක්ඛසමුදයයෙහි පවත්නා ඥානය බුද්ධඥාන නම්. දුක්ඛ නිරොධයෙහි පවත්නා ඥානය බුද්ධ ඥාන නම්. දුක්ඛනිරොධ ගාමිනී ප්‍රතිපදායෙහි පවත්නා ඤාණය බුද්ධඥාන නම්. අර්ථ ප්‍රතිසම්භිදායෙහි ඤාණය බුද්ධඥාන නම්. ධර්ම ප්‍රතිසම්භිදායෙහි ඤාණය බුද්ධ ඥාන නම්. නිරුක්ති ප්‍රතිසම්භිදායෙහි ඤාණය බුද්ධඥාන නම්. ප්‍රතිභාන ප්‍රතිසම්භිදායෙහි ඥානය බුද්ධ ඥාන නම්. ඉන්ද්‍රිය පරොපරියත්තයෙහි ඤාණය බුද්ධ ඥානනම්. සත්වයන්ගේ ආසයානුසයෙහි ඤාණය බුද්ධ ඥානනම්. යමක ප්‍රාතිහාර්යයෙහි ඤාණය බුද්ධ ඥානනම්. මහාකරුණා සමාපත්තියෙහි ඤාණය බුද්ධ ඥානනම්.

**249.** සර්වඥතාඥානය බුද්ධඥාන නම්. අනාවරණ ඥානය බුද්ධ ඥාන නම්. මොව්හු තුදුස් බුද්ධ ඥානයෝ නම් වෙත්. මේ තුදුස් බුද්ධ ඥානයන් අතුරෙන් ඥාන අටක් ශ්‍රාවකයන්ට

සාධාරණ වෙත්. ඥාන සයක් ශ්‍රාවකයන්ට සාධාරණ නොවෙත්. දුක්ඛ සත්‍යයාගේ යම්තාක් දුක්ඛාර්ථ ඇත්තේද ඒ සියල්ල දැනගන්නාලදී. නොදන්නාලද දුක්ඛාර්ථයක් නැත්නුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. දුක්ඛසත්‍යයාගේ යම්තාක් දුක්ඛාර්ථ වෙයිද, (ii) ඒ සියල්ල දැනගන්නාලදී. සියල්ල දක්නාලදී. සියල්ල ප්‍රකට කරණ ලදී. සියල්ල ප්‍රත්‍යක්ෂ කරණ ලදී. සියල්ල ප්‍රඥාවෙන් ස්පර්ශ කරණ ලදී. ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණ ලද දුක්ඛාර්ථයක් නැත්නුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි. අනාවරණ ඥාන නමි (iii) සමුදය සත්‍යයාගේ යම්තාක් සමුදයාර්ථය වෙයිද නිරොධ සත්‍යයාගේ යම්තාක් නිරොධාර්ථ වෙයිද මාර්ග සත්‍යයාගේ යම්තාක් මාර්ගාර්ථ වෙයිද (මෙහි (ii) යොදන්න) අර්ථ ප්‍රතිසම්භිදාවෙහි යම්තාක් අර්ථ ප්‍රතිසම්භිදා වෙහිද (මෙහි (ii) ධර්ම ප්‍රතිසම්භිදාවෙහි යම්තාක් ධර්ම ප්‍රතිසම්භිධාර්ථ වෙයිද (මෙහි (ii) නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි යම්තාක් නිරුක්ති ප්‍රතිසම්භිදාර්ථවෙයිද, (මෙහි (ii) ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි යම්තාක් ප්‍රතිභාන ප්‍රතිසම්භිධාර්ථ වෙයිද ඒ සියල්ල දැනගන්නාලදී. සියල්ල දක්නා ලදී. සියල්ල ප්‍රකට කරණලදී. සියල්ල ප්‍රත්‍යක්ෂකරණලදී. ප්‍රඥාවෙන් ස්පර්ශකරණලදී. ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණලද ප්‍රතිභාන ප්‍රතිසම්භිදාර්ථයක් නැත්නුයි. සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. ඉන්ද්‍රිය පරොපරියත්තයෙහි යම්තාක් ඥානය වෙයිද සත්වයන්ගේ ආසයානුසයයෙහි යම්තාක් ඥානය වෙයිද යමක ප්‍රාතිහාර්යයෙහි යම්තාක් ඥානය වෙයිද, මහා කරුණා සමාපත්තියෙහි යම්තාක් ඥානය වෙයිද, ඒ සියල්ල දැනගන්නාලදී. සියල්ල දක්නාලදී. සියල්ල ප්‍රකට කරණලදී. සියල්ල ප්‍රත්‍යක්ෂකරණ ලදී. ප්‍රඥාවෙන් සියල්ල ස්පර්ශකරණලදී. ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණ ලද මහා කරුණා සමාපත්තියෙහි ඥානයක් නැත්නුයි සර්වඥතාඥාන නමි. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නමි. දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බඹුන් සහිතවූ ලෝකයා විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන්

සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව විසින් දක්නාලද, අසනලද ඝ්‍රාණාදී ඉන්ද්‍රිය තුනින් දැනගන්නාලද සිතින් දැනගන්නාලද පැමිණෙනලද සොයනලද සිතින් හැසිරෙනලද යම්තාක් දෙයක් ඇත්තේද ඒ සියල්ල දැනගන්නාලදී. සියල්ල දක්නා ලදී. සියල්ල ප්‍රකට කරණලදී. සියල්ල ප්‍රත්‍යක්ෂ කරණ ලදී. සියල්ල ඥානයෙන් ස්පර්ශ කරණලදී. ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණලද්දක් නැත්නුයි සර්වඥතාඥාන නම්. එහි ආවරණයක් නැත්නුයි අනාවරණ ඥාන නම්.

"උන්වහන්සේ විසින් මේ ත්‍රිවිධ ලෝකයෙහි වර්තමානය පිළිබඳවූ නොදක්නාලද කිසිවක් නැත එසේම අතීතය පිළිබඳ නොදන්නාලද කිසිවක් නැත. අනාගතය පිළිබඳ නොදන්නා කිසිවක් නැත. දතයුතු ධර්ම යම්තාක් ඇත්තේද ඒ සියල්ල දැන වදාළසේක. එහෙයින් තථාගතයන් වහන්සේ සර් මන්තචක්ඛු නම් වනසේක."

(ඥානකථාව නිමි.)

## 2. දිට්ඨි කථාව.

1. දිට්ඨි යනු කුමක්ද? දෘෂ්ටි හෙතු කෙතෙක්ද? දෘෂ්ටීන්ගේ පැනනැගීම් කෙතෙක්ද? දෘෂ්ටීහු කෙතෙක්ද? දෘෂ්ටියෙන් වරදවා ගන්නා ප්‍රභෙද කෙතෙක්ද? දෘෂ්ටි හේතූන් සිඳ දැමීම් නම් කුමක්ද? යනු මොහු ප්‍රශ්නයෝයි.

2. දිට්ඨි යනු කුමක්ද යන ප්‍රශ්නයෙහි වරදවා දැඩි කොට අල්වාගැනීම සත්‍යයට විරුද්ධව ගැනීම දිට්ඨි නම්. දෘෂ්ටි හෙතු කෙතෙක්ද යන ප්‍රශ්නයෙහි දෘෂ්ටි හේතු අටකි. දෘෂ්ටි පැනනැගීම් කෙතෙක්ද යන ප්‍රශ්නයෙහි දෘෂ්ටි පැන නැගීම් අටළොසකි. දෘෂ්ටීහු කෙතෙක්ද යන ප්‍රශ්නයෙහි දෘෂ්ටීහු සොළසකි. දෘෂ්ටියෙන් වරදවා ගන්නා ප්‍රභෙද කෙතෙක්ද යන ප්‍රශ්නයෙහි දෘෂ්ටියෙන් වරදවා ගැනීම් ප්‍රභෙද තුන් සියයකි. දෘෂ්ටි හෙතූන් සහමුලින් සිඳදැමීම නම් කවරේද යන ප්‍රශ්නයෙහි සොතාපත්ති මාර්ගය දෘෂ්ටිහේතූන් සහමුලින් සිඳීම වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. වරදවා දැඩිකොට ගැනීම් සත්‍යයට විරුද්ධ ගැනීම් කෙසේ නම් දිට්ඨි වන්නේද? රූපස්කන්ධය (ii) මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, සත්‍යයට විරුද්ධව වරදවා ගැනීම දිට්ඨි නම්, (iii) වේදනාස්කන්ධය මෙය මගේය, (මෙහි (ii) යෙදිය යුතුයි) සඤ්ඤාස්කන්ධය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) සංස්කාරස්කන්ධය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) විඤ්ඤාණස්කන්ධය මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මය යයි සත්‍යයට විරුද්ධව දැඩිකොට අල්වාගැනීම දිට්ඨි නම් චක්ෂුප්‍රසාදය මෙය මගේය. (මෙහි (ii) යෙදිය යුතුයි) ශ්‍රොතප්‍රසාදය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) ඝ්‍රානප්‍රසාදය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) ජිව්හා ප්‍රසාදය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) කාය ප්‍රසාදය මෙය මගේය (මෙහි (ii) යෙදිය යුතුයි) සිත මෙය මගේය. මෙය මම වෙමි, මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට අල්වා ගැනීම දිට්ඨි නම්. රූපාරම්මණයන් මෙය මගේය (මෙහි (ii) ) ශබ්දාරම්මණයන් මෙය මගේය (මෙහි (ii) ) ගන්ධාරම්මණයන් මෙය මගේය (මෙහි (ii) ) රසාරම්මණයන් මෙය මගේය ප්‍රශ්ටව්‍යාරම්මණයන් මෙය මගේය. (මෙහි (ii) ) ධර්මාරම්මණයන් මෙය මගේය, (මෙහි (ii) ) (මෙහි 4 ඡෙදයේ සිට 18 ඡෙදය තෙක් මේ සලකුණ ඇති තැන්වල (ii) ඡෙදය යොදා ගත) යුතුයි.

4. චක්ඛුවිඤ්ඤාණය මෙය මගේය - සොතවිඤ්ඤාණය මෙය මගේය- ඝාන විඤ්ඤාණය මෙය මගේය- ජිව්හා විඤ්ඤාණය මෙය මගේය- කාය විඤ්ඤාණය මෙය මගේය- මනොවිඤ්ඤාණය මෙය මගේය- මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව වරදවා දැඩිකොට අල්වා ගැනීම දිට්ඨි නම්.

5. චක්ඛුසම්ඵස්සය මෙය මගේය- සොතසම්ඵස්සය මෙය මගේය- ඝාන සම්ඵස්සය මෙය මගේය, ජිව්හා සම්ඵස්සය මෙය මගේය- කාය සම්ඵස්ස මෙය මගේය- මනොසම්ඵස්සය මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවාගැනීම දිට්ඨි නම්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6. චක්ඛුසම්ඵස්සජ වෙදනාව මෙය මගේය- සොත සම්ඵස්සජ වෙදනාව මෙය මගේය- ඝානසම්ඵස්සජ වෙදනාව මෙය මගේය- ජිව්හාසම්ඵස්සජ වෙදනාව මෙය මගේය - කායසම්ඵස්සජ වෙදනාව මෙය මගේය- මනොසම්ඵස්සජ වෙදනාව මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නමි.

7. රූප සඤ්ඤාව මෙය මගේය- සද්ද සඤ්ඤාව මෙය මගේය- ගන්ධ සඤ්ඤාව මෙය මගේය- රස සඤ්ඤාව මෙය මගේය- පොට්ඨබ්බ සඤ්ඤාව මෙය මගේය, ධම්ම සඤ්ඤාව මෙය මගේය. මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නමි.

8. රූප සඤ්චෙතනාව මෙය මගේය- සද්ද සඤ්චෙතනාව මෙය මගේය- ගන්ධ සඤ්චෙතනාව මෙය මගේය- රස සංචෙතනාව මෙය මගේය- පොට්ඨබ්බ සඤ්චෙතනාව මෙය මගේය- ධම්ම සඤ්චෙතනාව මෙය මාගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නමි.

9. රූප තණ්හාව මෙය මගේය - සද්ද තණ්හාව මෙය මගේය- ගන්ධ තණ්හාව මෙය මගේය- රස තණ්හාව මෙය මගේය- පොට්ඨබ්බ තණ්හාව මෙය මගේය- ධම්ම තණ්හාව මෙය මගේය. මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නමි.

10. රූප විතර්කය මෙය මගේය- ශබ්ද විතර්කය මෙය මගේය- ගන්ධ විතර්කය මෙය මගේය- රස විතර්කය මෙය මගේය- ප්‍රෂ්ටව්‍ය විතර්කය මෙය මගේය- ධර්ම විතර්කය මෙය මගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි සත්‍යයට විරුද්ධව දැඩිව වරදවා අල්වා ගැනීම දිට්ඨි නමි.

11. රූප විචාරය මෙය මගේය- ශබ්ද විචාරය මෙය මගේය- ගන්ධ විචාරය මෙය මගේය- රස විචාරය මෙය මගේය- පොට්ඨබ්බ විචාරය මෙය මගේය- ධර්ම විචාරය මෙය මගේය

මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිව වරදවා අල්වා ගැනීම දිට්ඨි නම්.

12. පඨවි ධාතුව මෙය මගේය- ආපො ධාතුව මෙය මගේය- තෙජො ධාතුව මෙය මගේය- වායො ධාතුව මෙය මගේය- ආකාස ධාතුව මෙය මගේය- විඤ්ඤාණ ධාතුව මෙය මගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්.

13. පඨවි කසිණය මෙය මගේය- ආපො කසිණය තෙජො කසිණය මෙය මාගේය- වායො කසිණය මෙය මාගේය- නීල කසිණය මෙය මාගේය- පීත කසිණය මෙය මාගේය- ලෝහිත කසිණය මෙය මාගේය- ඕදාත කසිණය ආකාස කසිණය මෙය මාගේය- විඤ්ඤාණ කසිණය මෙය මගේය. මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිව වරදවා ගැන්ම දිට්ඨි නම්.

14. හිසකෙස් මෙය මගේය- රෝම මෙය මගේය. නියපොතු මෙය මගේය- දත් මෙය මගේය- සම මෙය මගේය- මස් මෙය මගේය- නහර මෙය මගේය- ඇට මෙය මගේය- ඇට මිදුලු මෙය මගේය- වකුගඩු මෙය මගේය- හෘදයමාංශය මෙය මගේය- අක්මාව මෙය මගේය- දළබුව මෙය මගේය- ඇලදිව මෙය මගේය- පපුමස මෙය මගේය- බඩවැල් මෙය මගේය- අතුණුබහන් මෙය මගේය- ආමාසගත ආහාර මෙය මගේය- මළ මෙය මගේය- පිත මෙය මගේය- සෙම මෙය මගේය- සැරව මෙය මගේය- ලේ මෙය මගේය- දහඩිය මෙය මගේය- මේදතෙල් මෙය මගේය- කඳුලු මෙය මගේය- වුරුණු තෙල් මෙය මගේය- කෙළ මෙය මගේය- සොටු මෙය මගේය- සඳමිදුලු මෙය මගේය- මුත්‍ර මෙය මගේය- මොළ මෙය මගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්.

15. චක්ඛායතනය මෙය මගේය- රූපායතනය මෙය මගේය- සොතායතනය මෙය මගේය- සද්දායතනය මෙය මගේය- ඝානායතනය මෙය ගේය- ගන්ධායතනය මෙය මගේය-

ජිව්හායතනය මෙය මගේය- රසායතනය මෙය මගේය - කායායතනය මෙය මගේය- පොට්ඨබ්බායතනය මෙය මගේය- මනායතනය මෙය මගේය- ධම්මායතනය මෙය මගේය- චක්ඛු ධාතුව මෙය මගේය- රූප ධාතුව මෙය මගේය- චක්ඛු විඤ්ඤාණ ධාතුව මෙය මගේය- සොත ධාතුව මෙය මගේය- සද්ද ධාතුව මෙය ගේය- සොත විඤ්ඤාණ ධාතුව මෙය මගේය- ඝාන ධාතුව මෙය මගේය- ගන්ධ ධාතුව මෙය මගේය- ඝානවිඤ්ඤාණ ධාතුව මෙය මගේය- ජිව්හා ධාතුව මෙය මගේය- රස ධාතුව මෙය මගේය- ජිව්හා විඤ්ඤාණ ධාතුව මෙය මගේය- කාය ධාතුව මෙය මගේය- පොට්ඨබ්බ ධාතුව මෙය මගේය- කාය විඤ්ඤාණධාතුව මෙය මගේය- මනොධාතුව මෙය මගේය- ධම්මධාතුව මෙය මගේය- මනොවිඤ්ඤාණධාතුව මෙය මගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිව වරදවාගැනීම දිට්ඨි නම්.

16. චක්ඛුන්ද්‍රිය මෙය මගේය- සොතින්ද්‍රිය මෙය මගේය- ඝානින්ද්‍රිය මෙය මගේය- ජිව්හින්ද්‍රිය මෙය මගේය- කායින්ද්‍රිය මෙය මගේය- මනින්ද්‍රිය - මෙය මගේය- ජීවිතින්ද්‍රිය මෙය මගේය- ඉත්ථින්ද්‍රිය මෙය මගේය- පුරිසින්ද්‍රිය මෙය මගේය- සුඛින්ද්‍රිය මෙය මගේය- දුක්ඛින්ද්‍රිය මෙය මගේය- සොමනස්සින්ද්‍රිය මෙය මගේය- දොමනස්සින්ද්‍රිය මෙය මගේය- උපෙක්ඛින්ද්‍රිය මෙය මගේය- සද්ධින්ද්‍රිය මෙය මගේය- විරියින්ද්‍රිය මෙය මගේය- සතින්ද්‍රිය මෙය මගේය- සමාධින්ද්‍රිය මෙය මගේය- පඤ්ඤින්ද්‍රිය මෙය මගේය මෙය මම වෙමි මෙය මාගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිව වරදවා ගැන්ම දිට්ඨි නම්.

17. කාමධාතුව (කාමලොකය) මෙය මගේය- රූපධාතුව (රූප ලොකය) මෙය මගේය- අරූප ධාතුව (අරූප ලොකය) මෙය මගේය- කාම භවය මෙය මගේය- රූප භවය මෙය මගේය- අරූප භවය මෙය මගේය- සඤ්ඤා භවය මෙය මගේය- අසඤ්ඤාභවය මෙය මගේය- නෙවසඤ්ඤා නාසඤ්ඤා භවය මෙය මගේය- එකවොකාර භවය මෙය මගේය- චතුවොකාර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භවය මෙය මගේය- පඤ්චවොකාර භවය මෙය මගේය- ප්‍රථම ධ්‍යානය මෙය මගේය- ද්විතීයද්ධ්‍යානය මෙය මගේය- තෘතීයද්ධ්‍යානය මෙය මගේය- චතුර්ථ ධ්‍යානය මෙය මගේය- මෛත්‍රීසමාධිය මෙය මගේය- කරුණා සමාධිය මෙය මගේය- මුදිතාසමාධිය මෙය මගේය- උපෙක්ඛා සමාධිය මෙය මගේය- ආකාසානඤ්චායතන සමාපත්තිය මෙය මගේය- විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය මෙය මගේය- ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මෙය මගේය- නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය මෙය මගේය- මෙය මම වෙමි මෙය මගේ ආත්මය වෙමියි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්.

**18.** අවිද්‍යාව මෙය මගේය- සංඛාරයන් මෙය මගේය- විඤ්ඤාණය මෙය මගේය- නාම රූපය මෙය මගේය- සළායතනය මෙය මගේය- ඵස්සය මෙය මගේය- වෙදනාව මෙය මගේය- තණ්හාව මෙය මගේය- උපාදානය මෙය මගේය- භවය මෙය මගේය- ජාතිය මෙය මගේය- ජරාමරණය මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි සත්‍යයට විරුද්ධව දැඩිකොට වරදවාගැන්ම දිට්ඨි නම්.

**19.** දිට්ඨි හෙතු අට නම් කවරහුද? ස්කන්ධයෝද දිට්ඨි හෙතු නම්. අවිද්‍යාවද දිට්ඨි හෙතු නම්. ඵස්සයද දිට්ඨි හෙතු නම්. සඤ්ඤාවද දිට්ඨි හෙතු නම්. විතර්කයද දිට්ඨි හෙතු නම්. අයොනිසොමනසිකාරයද දිට්ඨි හෙතු නම්. පාපමිත්‍රයාද දිට්ඨි හෙතු නම්. පරතොඝොෂය (අන්‍යයන්ගේ කීම) ද දිට්ඨි හෙතු නම්. (ii) පහළවීමට ජනක වශයෙන්ද උපස්තම්භක වශයෙන්ද හෙතුවන හෙයින් (iii) ස්කන්ධයෝ දිට්ඨි හෙතු නම් වෙත්.

**20.** මෙසේ ස්කන්ධයෝද දිට්ඨි හෙතු නම් වෙත්. (මෙහි 19 (ii) යොදන්න) අවිද්‍යාවද දිට්ඨි හෙතු නම්. මෙසේ අවිද්‍යාවද දිට්ඨි හෙතු නම්. (මෙහි 19 (ii) යොදන්න) ඵස්සයද දිට්ඨි හෙතු නම්. මෙසේ ඵස්සයද දිට්ඨි හෙතු නම් (මෙහි 19 (ii) යොදන්න) සඤ්ඤාවද දිට්ඨි හෙතු නම්. මෙසේ සඤ්ඤාවද දිට්ඨි හෙතු නම්. (මෙහි 19 (ii) යොදන්න) විතර්කයද දිට්ඨි හෙතු නම්. මෙසේ විතර්කයද දිට්ඨි හෙතු නම්. (මෙහි 19 (ii) යොදන්න)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අයොනිසොමනස්කාරයද දිට්ඨි හෙතු නම්. මෙසේ අයොනිසොමනසිකාරයද දිට්ඨි හෙතු නම්. (මෙහි 19 (ii) යොදන්න) පාපමිත්‍රයාද දිට්ඨි හෙතු නම්. මෙසේ පාපමිත්‍රයාද දිට්ඨිහෙතු නම්. (මෙහි 19 (ii) යොදන්න) පරතොඝොෂයද දිට්ඨි හෙතු නම්. මෙසේ පරතොඝොෂයද දිට්ඨි හෙතු නම්.

12. අටලොස් දෘෂ්ටි පැනනැගීම් නම් කවරහුද? යම් දෘෂ්ටියක් දෘෂ්ටි කටුවක් දෘෂ්ටි වනයක් දෘෂ්ටි කාන්තාරයක් දෘෂ්ටි හුලක් දෘෂ්ටි සංකලනයක් දෘෂ්ටි සංයොජනයක් දෘෂ්ටි සම්බන්ධයක් දෘෂ්ටි පලිබොධයක් දෘෂ්ටි බන්ධනයක් දෘෂ්ටි ප්‍රපාතයක් දෘෂ්ටි අනුසයක් දෘෂ්ටි සන්තාපයක් දෘෂ්ටි පරිළාහයක් දෘෂ්ටි ග්‍රන්ථයක් දෘෂ්ටියෙන් දැඩිකොට ගැනීමක් දෘෂ්ටියෙන් සත්‍යයට විරුද්ධව ගැනීමක් වේද, මොව්හු අටලොස් දෘෂ්ටි පැන නැඟීම් නම් වෙත්.

22. සොළොස් දෘෂ්ටීහු නම් කවරහුද? අස්සාද දිට්ඨිය අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨිය සක්කාය දිට්ඨිය සක්කාය වත්ථුක සස්සත දිට්ඨිය සක්කාය වත්ථුක උච්ඡෙද දිට්ඨිය අන්තග්ගාහික දිට්ඨිය පුබ්බන්තානුදිට්ඨිය අපරන්තානු දිට්ඨිය සඤ්ඤොජනික දිට්ඨිය අහන්තිමාන විනිබන්ධ දිට්ඨිය මමන්තිමාන විනිබන්ධ දිට්ඨිය අත්තවාද පටිසංයුක්ත දිට්ඨිය ලොකවාද පටිසංයුත්ත දිට්ඨිය භව දිට්ඨිය විභව දිට්ඨිය යන මොහු සොළොස් දෘෂ්ටීහු නම් වෙත්.

23. තුන්සියයක් දෘෂ්ටියෙන් දැඩිකොට අල්වා ගැනීම් නම් කවරහුද? අස්සාද දිට්ඨියෙන් කෙතෙක් ආකාරයකින් දැඩිකොට අල්වා ගැනීම වේද, අත්තානු දිට්ඨියෙන් කෙතෙක් ආකාරයකින් දැඩිව අල්වා ගැනීම වේද, මිච්ඡාදිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිකොට අල්වා ගැනීම් වේද සක්කායදිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිකොට අල්වා ගැනීම වේද, සක්කාය වත්ථුක සස්සත දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, සක්කාය වත්ථුක උච්ඡෙද දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, අන්තග්ගාහික දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, පුබ්බන්තානු දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද,

අපරන්තානු දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, සඤ්ඤොජනික දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, අහන්තිමානවිනිබන්ධ දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීමවේද, මමන්තිමානවිනිබන්ධ දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, අත්තවාදපටිසඤ්ඤුත්තදිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීමවේද, ලොකවාදපටිසඤ්ඤුත්ත දිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, භවදිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද, විභවදිට්ඨියෙන් කෙතෙක් ආකාරයෙන් දැඩිව ගැනීම වේද,

අස්සාද දිට්ඨියෙන් පන්තිස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. අත්තානුදිට්ඨියෙන් විසිආකාරයකින් දැඩිව ගැනීම වෙයි. මිච්ඡාදිට්ඨියෙන් දස ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. සක්කාය දිට්ඨියෙන් විසි ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. සක්කායවත්ථුක සස්සත දිට්ඨියෙන් පසළොස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. සක්කායවත්ථුක උච්ඡෙද දිට්ඨියෙන් පස්ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. අන්තගග්ගාහික දිට්ඨියෙන් පනස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. පුබ්බන්තානු දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. අපරන්තානු දිට්ඨියෙන් සුසාලිස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. සඤ්ඤොජනික දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. අහන්තිමාන විනිබන්ධ දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. මමන්තිමාන දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. අත්තවාද පටිසංයුත්ත දිට්ඨියෙන්, විසි ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. ලොකවාදපටිසංයුත්ත දිට්ඨියෙන් අට ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. භව දිට්ඨියෙන් එක් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි. විභව දිට්ඨියෙන් එක් ආකාරයකින් දැඩිව ගැනීම වෙයි.

**24.** අස්සාද දිට්ඨියෙන් කිනම් පන්තිස් ආකාරයකින් දැඩිව ගැනීම වේද? රූපස්කන්ධය නිසා යම් සුඛයක් සොම්නසක් උපදීද මෙය රූපස්කන්ධයාගේ ආශ්වාදයයි දැඩිකොට ගැනීම වරදවා ගැනීම දිට්ඨිනම්. දෘෂ්ටිය ආශ්වාදය නොවේ. ආශ්වාදය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි, ආශ්වාදය අනිකකි. යම් දෘෂ්ටියක්වේද, යම් ආශ්වාදයක් වේද, මෙය ආශ්වාද දෘෂ්ටියයි, මිථ්‍යාදෘෂ්ටියයි කියනු ලැබේ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තිය වෙයි. ඒ දෘෂ්ටි විපත්තියෙන් යුත් පුද්ගලයා දෘෂ්ටි විනාශයට පැමිණියේ නම් වෙයි.

**25.** දෘෂ්ටි විනාශයට පැමිණි පුද්ගලයා සෙවනය නොකටයුතුය. භජනය නොකටයුතුය. ආශ්‍රය නොකටයුතුය. ඊට හේතු කවරේද, ඔහුගේ දෘෂ්ටිය ලාමකය දෘෂ්ටියෙහි යම් ඇලීමක් වේද, එය දිට්ඨිය නොවේ. දිට්ඨිය ඇලීම නොවේ. දිට්ඨිය අනිකකි. ඇලීම් අනිකකි. යම් දිට්ඨියක් වේද, යම් ඇලීමක්වේද, මෙය දිට්ඨිරාගයයි කියනු ලැබේ. එම දෘෂ්ටියෙන්ද, එම රාගයෙන්ද, යුත් පුද්ගලයා දිට්ඨි රාගයෙන් ඇලුණේ නම්වේ. දිට්ඨි රාගයෙන් ඇලුණු පුද්ගලයා කෙරෙහි දෙනලද දානය මහත්ඵල ඇත්තේ, මහත් ආනිසංස ඇත්තේ නොවෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමකය, අස්සාද දිට්ඨිය, මිච්ඡා දිට්ඨිය නමි. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ පරලොව ගති දෙකක්මය. නිරය හෝ තිරිසන් යොනිය හෝ වෙයි. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ දෘෂ්ටියට අනුව පුරනලද කරනලද යම් කායකර්මයක්වේද දෘෂ්ටියට අනුව පුරනලද කරන ලද යම් වාක් කර්මයක් වෙයිද, දෘෂ්ටියට අනුව පුරනලද කරනලද යම් මනොකර්මයක් වෙයිද, එය දෘෂ්ටියට අනුව කරන ලද්දකි, ගන්නාලද්දකි.

**26.** යම් චෙතනාවක් වේද, යම් ප්‍රාර්ථනාවක් වේද, යම් කැමැත්තක්වේද, යම් සංස්කාර කෙනෙක් වෙත්ද, ඒ සියලු ධර්මයෝ අනිෂ්ට බව පිණිස අප්‍රිය බව පිණිස අමනාප බව පිණිස අහිත පිණිස දුක පිණිස පවත්නාහ. ඊට හේතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමකය, යම් සේ කොහොඹ ඇටයක් හෝ තිත්ත වැටකොලු ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ තෙත්වූ පොළොවෙහි රෝපනය කරනලද්දේ වේද, එය යම් පෘථිවි රසයක් ගන්නේවේද, යම් ආපොරසයක් ගන්නේවේද, ඒ සියල්ල තිත්ත බව පිණිස කටුකබව පිණිස අමිහිරිබව පිණිස පවතියි, ඊට හෙතු කවරේද, ඒ බීජය ලාමකය, එමෙන් මිථ්‍යාදෘෂ්ටික

පුද්ගලයාගේ දෘෂ්ටියට අනුව පුරනලද කරනලද යම් කාය කර්මයක්වේද, දෘෂ්ටියට අනුව පුරනලද කරනලද යම් වාක් කර්මයක්වේද, දෘෂ්ටියට අනුව පුරනලද කරනලද යම් මනෝ කර්මයක්වේද, යම් චෙතනාවක් යම් ප්‍රාර්ථනාවක් යම් කැමැත්තක් යම් සංඛාර කෙනෙක් වෙත්ද, ඒ සියලු ධර්මයෝ අනිෂ්ට බව පිණිස අප්‍රියබව පිණිස අමනාපය පිණිස අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඊට හේතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමක හෙයිනි. අස්සාද දිට්ඨිය, මිථ්‍යාදිට්ඨි නම්. මිච්ඡාදෘෂ්ටිය දෘෂ්ටියට බැසීමනම්. දෘෂ්ටිවනය නම්. දෘෂ්ටිකාන්තාර නම්. දෘෂ්ටිකටුව නම්. දෘෂ්ටි සංකල්පය නම්. දෘෂ්ටිසංයෝජන නම්. දෘෂ්ටිහුල නම්. දෘෂ්ටි සම්බාධ නම්. දෘෂ්ටි පළිබොධනම්. දෘෂ්ටිබන්ධන නම්. දෘෂ්ටිප්‍රපාත නම්. දෘෂ්ටි සන්තාප නම්. දෘෂ්ටි පරිළාහ නම්. දෘෂ්ටි ග්‍රන්ථ නම්. දෘෂ්ටි උපාදාන නම්. දෘෂ්ටියෙන් දැඩිව ගැනීම නම්. දෘෂ්ටියෙන් සත්‍යයට විරුද්ධව ගැනීම නම්. මේ ආකාරයෙන් පැන නගින ලද චිත්තයාගේ සංයෝගය වෙයි.

27. (i) සංයොජන වන්නාවූද දෘෂ්ටි වන්නාවූද ධර්මයෝ ඇත්තාහ. සංයෝජන වන්නාවූද දෘෂ්ටි නොවන්නාවූද ධර්මයෝ ඇත්තාහ. සංයෝජන වන්නාවූද දෘෂ්ටි නොවන්නාවූද ධර්මයෝ කවරහුද? සක්කායදිට්ඨියද සීලබ්බත පරාමාසයද වෙත්. මොව්හු සංයොජනද වෙත්. දිට්ඨිද වෙත්. සංයොජනවන්නාවූ දිට්ඨි නොවන්නාවූ ධර්මයෝ කවරහුද? කාමරාග සංයෝජනය පටිඝ සංයොජනය මාන සංයෝජනය විචිකිච්ඡා සංයොජනය භවරාග සංයොජනය ඉස්සා සංයෝජනය මච්ඡරිය සංයොජනය අනුනය සංයෝජනය අවිජ්ජා සංයොජනය යන මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටි නොවෙත්. (ii) වෙදනාව නිසා (මෙතැන සිට නිසා, යන්න යෙදී තිබෙන සෑම තැන්හිම එහි අගට මෙහි (i) ඡෙදය යොදන්න) සඤ්ඤාව නිසා- සංඛාරයන් නිසා- විඤ්ඤාණය නිසා- ඇස නිසා- කණ නිසා- නාසය නිසා- දිව නිසා- කය නිසා- සිත නිසා- රූපය නිසා- ශබ්දයන් නිසා-ගන්ධයන් නිසා- රසයන් නිසා- ප්‍රශ්ටව්‍යයන් නිසා- ධර්මයන් නිසා- චක්ඛුවිඤ්ඤාණය නිසා- සොතවිඤ්ඤාණය

නිසා- ඝාන විඤ්ඤාණය නිසා- ජිව්හා විඤ්ඤාණය නිසා- කාය විඤ්ඤාණය නිසා- මනොවිඤ්ඤාණය නිසා- චක්ඛුසම්ඵස්සය නිසා- සොතසම්ඵස්සය නිසා- ඝානසම්ඵස්සය නිසා- ජිව්හා සම්ඵස්සය නිසා- කාය සම්ඵස්සය නිසා- මනො සම්ඵස්සය නිසා- චක්ඛු සම්ඵස්සජ වෙදනාව නිසා- සොත සම්ඵස්සජ වෙදනාව නිසා- ඝානසම්ඵස්සජ වෙදනාව නිසා- ජිව්හා සම්ඵස්සජ වෙදනාව නිසා කායසම්ඵස්සජ වෙදනාව නිසා- මනොසම්ඵස්සජ වෙදනාව නිසා යම් සුඛයක් සොම්නසක් උපදීද මෙය මනොසම්ඵස්සජ වෙදනාවගේ ආශ්වාදයයි දැඩිකොට අල්වා ගැනීම වරදවා ගන්නාවූ දිට්ඨි නම්. දිට්ඨිය ආශ්වාදය නොවේ. ආශ්වාදය දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. ආශ්වාදය අනිකකි. යම් දෘෂ්ටියක්වේද යම් ආශ්වාදයක් වේද මෙය අස්සාද දිට්ඨියයි කියනු ලැබේ. අස්සාද දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. දෘෂ්ටි විපත්තිය මිථ්‍යා දෘෂ්ටි නම්. දෘෂ්ටි විපත්තිනේ යුත් පුද්ගලයා දෘෂ්ටි විපන්න පුද්ගලයා නම්. දෘෂ්ටි විපන්න පුද්ගලයා සෙවනය නොකටයුතුය, භජනය නොකටයුතුය, ආශ්‍රය නොකට යුතුය. ඊට හෙතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමක හෙයිනි.

28. යම් දෘෂ්ටියක් වේද, යම් රාගයක් වේද, එම රාගය දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය රාගය නොවේ. දෘෂ්ටිය අනිකකි. රාගය අනිකකි. යම් දෘෂ්ටියකුත් වේද, යම් රාගයකුත්වේද මෙය දෘෂ්ටි රාග නම්. එම දෘෂ්ටියෙන්ද එම රාගයෙන්ද යුත් පුද්ගලයා දෘෂ්ටි රාගයෙන් ඇලුණු පුද්ගලයා නම් වේ. දෘෂ්ටි රාගයෙන් ඇලුණු පුද්ගලයා කෙරෙහි දෙන ලද දානය මහත් ඵල ඇත්තේ මහත් ආනිසංස ඇත්තේ නොවෙයි. ඊට හෙතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමක හෙයිනි. ආශ්වාද දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි නම්. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ ගති දෙකක්ම වෙයි. නිරය හෝ තිරිසන් යොනිය හෝ වෙයි. (ii) මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ දෘෂ්ටියට අනුව පුරන ලද සමාදන්වනලද යම් කාය කර්මයක් වේද, දෘෂ්ටියට අනුව පුරනලද සමාදන්වනලද යම් වාක්කර්මයක්වේද, දෘෂ්ටියට අනුව පුරනලද සමාදන්වනලද යම් මනොකර්මයක් වේද, යම් චෙතනාවක් වේද යම් ප්‍රාර්ථනාවක් වේද, යම් කැමැත්තක් වේද යම් සංඛාර කෙනෙක්

වේද ඒ සියලු ධර්මයෝ අනිෂ්ට බව පිණිස අප්‍රිය බව පිණිස අමනාපය පිණිස අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඊට හෙතු කවරේද? ඔහුගේ දෘෂ්ටිය ලාමක හෙයිනි. (iii) යම්සේ කොහොඹ ඇටයක් හෝ තිත්ත වැටකොලු ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ තෙත්වූ පොළොවෙහි රෝපනය කරණලද්දේ යම් පෘථිවි රසයක් ඇදගනීද, යම් ආපොරසයක් ඇද ගනීද, ඒ සියල්ල තිත්ත බව පිණිස කටුක බව පිණිස අමිහිරි බව පිණිස පවතියි, ඊට හෙතු කවරේද, ඔහුගේ බීජය ලාමක හෙයිනි. එමෙන් (මෙහි (ii) යොදන්න) ආශ්වාද දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි නම්. මිථ්‍යාදෘෂ්ටිය වරදවා ගැනීමට පැමිණීම වෙයි. දෘෂ්ටිවනය වෙයි. (මෙහි 26 ඡෙදයේ දෘෂ්ටිවනය යන තැන සිට, නම් යනුවෙයි කියා යොදා සත්‍යයට විරුද්ධව යන තැනට යොදාගත යුතුයි.) වරදවා දැඩිව ගැනීමවෙයි. සත්‍යයට විරුද්ධ ගැනීම වෙයි මේ අටලොස් ආකාරයෙන් පැන නැගි චිත්තයාගේ සංයොගය වෙයි.

**29.** (i) සංයොජන වන්නාවූත් දෘෂ්ටි වන්නාවූත් ධර්මයෝ ඇත්තාහ. සංයොජන වන්නාවූ දෘෂ්ටි නොවන්නාවූ ධර්මයෝ ඇත්තාහ. සංයොජන වන්නාවූත් දෘෂ්ටි වන්නාවූත් ධර්මයෝ කවරහුද? සක්කාය දිට්ඨියද සීලබ්බත පරාමාසයද වෙත්. මොව්හු සංයොජනද දෘෂ්ටිද වෙත්. සංයොජන වන්නාවූ දෘෂ්ටි නොවන්නාවූ ධර්මයෝ කවරහුද? (ii) කාමරාග සංයොජනය පටිඝසංයොජනය මාන සංයොජනය විචිකිච්ඡා සංයොජනය භවරාග සංයොජනය ඉස්සා සංයොජනය මච්ඡරිය සංයොජනය අනුසය සංයොජනය අවිජ්ජා සංයොජනය යන මොව්හු සංයෝජනයෝ වෙත් (iii) දෘෂ්ටි නොවෙත් ආශ්වාද දෘෂ්ටිනේ මේ පන්තිස් ආකාරයෙන් දැඩිව ගන්නේ වෙයි.

**30.** අත්තානු දිට්ඨියෙන් කිනම් විසි ආකාරයකින් දැඩිව ගන්නේද? මේ ලොකයෙහි ආර්ය පුද්ගලයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපස්කන්ධය (ii) ආත්මය වශයෙන් දකියි. රූපස්කන්ධය

ඇතියකු හෝ ආත්මය වශයෙන් දකියි. ආත්මය කෙරෙහි රූපස්කන්ධය පිහිටියේයයි හෝ දකියි. රූපස්කන්ධය කෙරෙහි ආත්මය පිහිටියේයයි හෝ දකියි.

(iii) වෙදනාස්කන්ධය (මෙහි (ii) යොදන්න) සංඥාස්කන්ධය (මෙහි (ii) යොදන්න) සංස්කාරස්කන්ධය (මෙහි (ii) යොදන්න) විඥානස්කන්ධය ආත්මය වශයෙන් දකියි. විඤ්ඤාණය ඇතියකු හෝ ආත්මය වශයෙන් දකියි. ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇත්තේයයි කියා හෝ දකියි. විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇත්තේයයි කියා හෝ දකියි.

31. කෙසේ රූපය ආත්මය වශයෙන් දකීද? මේ ලොකයෙහි ඇතමෙක් (ii) පඨවි කසිණය ආත්මය වශයෙන් දකියි. පඨවි කසිණය යමක්ද ඒ මම වෙමි. යමක් මම වෙම්ද එය පඨවි කසිණ නමැයි පඨවි කසිණයද ආත්මයද එකක් කොට දකියි. (iii) යම්සේ දැල්වෙන්නාවූ තෙල් පහනේ යම් පහන් සිළුවක් වේද එයට වර්ණය වෙයි යමක් වර්ණය වේද, එය පහන් සිළුව වේයයි පහන් සිළුවද වර්ණයද එකක්කොට දකියිද, එසේම මේ ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න.)

32. දැඩිව වරදවා අල්වා ගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ පළමුවැනි රූපය වස්තු කොට ඇති අත්තානු දිට්ඨියවේ. අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. මිච්ඡා දිට්ඨිය දිට්ඨි විපත්ති නම්. අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. මිථ්‍යාදෘෂ්ටි පුද්ගලයාගේ ගති දෙකක්මය (ii) නිරය හෝ තිරිසන් යෝනිය හෝ වෙයි. මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජන වෙත්. දෘෂ්ටි නොවෙත්.

33. (i) මේ ලෝකයෙහි ඇතමෙක් ආපොකසිණය තෙජොකසිණය වායො කසිණය නීල කසිණය පීත කසිණය ලොහිත කසිණය ඔදාත කසිණය ආත්ම වශයෙන් දකියි. යමක් ඔදාත කසිණය වේද එය මම වෙමි. යමක් මම වෙම්ද එය ඔදාත කසිණ නමැයි. ඔදාත කසිණයද ආත්මයද එකක් කොට දකියි. (ii) යම්සේ දල්වන ලද තෙල් පහනේ යමක් සිළුවද එය

වර්ණය වෙයි. යමක් වර්ණයද එය සිළුව වේයයි සිළුවද වර්ණයද එක්කොට දකියිද එසේම මේ ලොකයෙහි ඇතමෙක් (මෙහි (i) යොදන්න) ඕදාත කසිණයද ආත්මයද එකක්කොට දකියි.

34. දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි වස්තුව අනිකකි. යමක් දෘෂ්ටිය වෙයිද, යමක් වස්තුව වෙයිද, මෙය පළමුවැනි රූපය වස්තුවකොට ඇති අත්තානු දිට්ඨි නම්. අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්ති නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජන වෙත්. දෘෂ්ටි නොවෙත්. මෙසේ රූපය ආත්මය වශයෙන් දකියි කෙසේ රූපය ඇතියකු ආත්මය වශයෙන් දක්නේද, මේ ලොකයෙහි ඇතමෙක් වෙදනාව සංඥාව සංස්කාරයන් විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි. මේ වනාහි මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි මේ රූපයෙන් රූපය සහිත වේයයි රූපය ඇතියකු ආත්මය වශයෙන් දකියි. යම්සේ ඡායාවෙන් යුත් රුකක් වෙයිද, ඊට එක් පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ රුකය මේ ඡායාවය රුක අනිකකි, ඡායාව අනිකකි. ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායා සහිතයයි ඡායාව ඇති රුකක් දක්නේද. එසේම ලොව ඇතමෙක් වෙදනාවද සඤ්ඤාවද සංඛාරයන්ද විඤ්ඤාණයද, ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි. මේ මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි රූපයෙන් රූප සහිතයයි රූපය ඇතියකු ආත්මය වශයෙන් දකියි. දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වෙයිද, මෙය දෙවැනි රූපය වස්තුකොට ඇති අත්තානු දිට්ඨි නම්. අත්තානු දිට්ඨිය, මිච්ඡාදිට්ඨි නම්. මිච්ඡා දිට්ඨිය දිට්ඨි විපත්ති නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයොජන වෙත්. දෘෂ්ටි නොවෙත්. මෙසේ රූපය ඇතියකු ආත්මයකොට දකියි.

35. කෙසේ නම් ආත්මය කෙරෙහි රූපය ඇත්තේයයි දක්නේද? මෙලොකයෙහි ඇතමෙක් (ii) වෙදනාව සඤ්ඤාව

සංඛාරයන් විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි එය වනාහි මගේ ආත්මය වෙයි. මේ ආත්මය කෙරෙහි මේ රූපය පිහිටියේ වේයයි ආත්මය කෙරෙහි රූපය ඇතැයි දකියි (iii) යම්සේ සුවඳ ඇති මලක් වන්නේද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මලය මේ සුවඳය මල අනිකකි, සුවඳ අනිකකි. ඒ සුවඳ මේ මලෙහි වන්නේයයි මලෙහි සුවඳ ඇතැයි දකියිද එමෙන් ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න)

**36.** දැඩිකොට වරදවා ගැන්ම දිට්ඨි නම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වෙයිද යම් වස්තුවක් වෙයිද මෙය තුන්වැනිවූ රූපය වස්තුකොට ඇති අත්තානුදිට්ඨි නම්. අත්තානුදිට්ඨිය මිථ්‍යාදෘෂ්ටි නම්. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටි විපත්ති නම්. (මෙහි 29 ඡෙදයේ (ii) කාම රාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න මේ සංයොජනයෝ දෘෂ්ටිහු නොවෙත්. මෙසේ ආත්මය කෙරෙහි රූපය ඇත්තේයයි දක්නේය.

**37.** කෙසේ රූපය කෙරෙහි ආත්මය ඇත්තේයයි දක්නේද? මේ ලොකයෙහි ඇතමෙක් (ii) වෙදනාව සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිත් වෙයි. මේ වනාහි මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි මේ රූපයෙහි පිහිටියේ වේයයි රූපය ආත්මය ඇතැයි දකියි. (ii) යම්සේ මැණිකක් කරඬුවෙහි දමන ලද්දේ වෙයිද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. 'මේ මැණිකය' මේ කරඬුවය. මැණික අනිකකි. කරඬුව අනිකකි. ඒ මේ මැණික වනාහි මේ කරඬුවෙහි ඇතැයි කරඬුවෙහි මැණික දක්නේද, එමෙන් මේ ලොකයෙහි ඇතැමෙක් (මෙහි (ii) යොදන්න.) දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තු දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දෘෂ්ටියද යමක් වස්තුවද මේ සතර වැනිවූ රූපය වස්තු කොට ඇති අත්තානුදිට්ඨියයි. අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්ති නම්. (මෙහි 29 ඡෙදයේ (ii) කාම රාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයෝජනයෝ

වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ රූපය කෙරෙහි ආත්මය දක්නේය.

38. කෙසේ වෙදනාව ආත්මය වශයෙන් දකීද? මේ ලොකයෙහි ඇතමෙක් චක්ඛුසම්ඵස්සජ වෙදනාව සොත සම්ඵස්සජ වෙදනාව ඝානසම්ඵස්සජ වෙදනාව ජිව්හා සම්ඵස්සජ වෙදනාව කාය සම්ඵස්සජ වෙදනාව (ii) මනො සම්ඵස්සජ වෙදනාව ආත්මය වශයෙන් දකියි. 'යම් මනො සම්ඵස්සජ වෙදනාවක්වේද ඒ මම වෙමි. යමක් මම වෙම්ද එය මනොසම්ඵස්සජ වෙදනාවයයි මනොසම්ඵස්සජ වෙදනාවද ආත්මයද එකක්කොට දකියි. (iii) යම්සේ දැල්වෙන්නාවූ තෙල් පහනක සිළුව යමක්ද එය වර්ණය වෙයි. යමක් වර්ණයද එය සිළුව වේයයි. පහන් සිළුවද වර්ණයද එකක් වශයෙන් දකියි. එමෙන් මේ ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න.) දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දෘෂ්ටිය වෙයිද යමක් වස්තුව වෙයිද මෙය පළමුවැනි වේදනාව වස්තුකොට ඇති අත්තානුදිට්ඨි නම්. අත්තානු දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්ති නම්. (මෙහි 29 ඡෙදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ වෙදනාව ආත්මය වශයෙන් දකියි. කෙසේ වෙදනා ඇතියකු ආත්මය වශයෙන් දකීද? මේ ලොකයෙහි ඇතමෙක් (ii) සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය රූපය ආත්ය වශයෙන් දකීද ඔහුට මෙසේ සිතෙයි. මේ මගේ ආත්මය වෙයි. මගේ මේ ආත්මය වනාහි මේ වෙදනාවෙන් වෙදනාවක්යයි වෙදනාවත් ආත්මය දකියි. (iii) යම්සේ වනාහි ඡායාවෙන් යුත් රුකක් වෙයිද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ රුකය, මේ ඡායාවය, රුක අනිකකි. ඡායාව අනිකකි. ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායාවක්යයි ඡායාවත් රුකත් දකියිද එමෙන්ම ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න.) දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි.

වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් වස්තුවක් වෙයිද මේ දෙවැනි වෙදනාව වස්තු කොට ඇති අත්තානු දිට්ඨි නමි. අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. මිච්ඡා දිට්ඨිය දිට්ඨි විපත්ති නමි. (මෙහි 29 ඡෙදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොහු සංයෝජනයෝ වෙති. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ වෙදනාවෙහි ආත්මය දකියි.

**39.** කෙසේ ආත්මය කෙරෙහි වෙදනාව ඇතැයි දකීද? ලෝකයෙහි ඇතමෙක් (ii) සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය රූපය, ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි. මේ මගේ ආත්මය වෙයි. මේ ආත්මය කෙරෙහි මේ වෙදනාව ඇතැයි ආත්මය කෙරෙහි වෙදනාව පිහිටියේයි දකියි. (iii) යම්සේ සුවඳැති මලක්වේද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මලය, මේ සුවඳය, මල අනිකකි, සුවඳ අනිකකි, මේ සුවඳ වනාහි මලෙහි වේයයි, මලෙහි සුවඳ පිහිටියේයයි දකියිද, එමෙන් ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න)

**40.** දැඩිව වරදවාගැනීම දිට්ඨිනමි. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක්වේද, යම් වස්තුවක්වේද, මෙය තුන් වැනි වේදනාව වස්තුකොට ඇති අත්තානුදිට්ඨිය අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨිනමි. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්තිනමි. (මෙහි 29 වන ඡෙදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.)

මොව්හු සංයෝජනයෝ වෙති. දෘෂ්ටීහු නොවෙත්, මෙසේ ආත්මය කෙරෙහි වෙදනාව පිහිටියේයි දක්නේය.

**41.** කෙසේ වෙදනාව කෙරෙහි ආත්මය ඇතැයි දක්නේද? ලොකයෙහි ඇතමෙක් (ii) සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය රූපය, ආත්මය වශයෙන් දකීද, ඔහුට මෙසේ සිතෙයි. මේ වනාහි මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි මේ වෙදනාවෙහි වේයයි වේදනාව කෙරෙහි ආත්මය පිහිටියේ යයි දකියි. (iii) යම්සේ මැණිකක් කරඬුවෙහි දමනලද්දේ වෙයිද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය, මේ මැණිකය මේ කරඬුවය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මැණික අනිකකි. කරඬුව අනිකකි. ඒ මැණික වනාහි මේ කරඬුවෙහි යයි කරඬුවෙහි මැණික පිහිටියේයයිද කියයිද එමෙන් මේ ලෝකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න.)

**42.** දැඩිව වරදවා දැකීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක්වේද, යම් වස්තුවක්වේද, මේ සතර වැනි වේදනාව වස්තුකොට ඇති අත්තානුදිට්ඨියයි, අත්තානු දිට්ඨිය මිච්ඡාදිට්ඨිනම්. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්තිනම් (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයෝජනයෝවෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ වෙදනාවෙහි ආත්මය පිහිටියේයයි දක්නේය.

**43.** කෙසේ සඤ්ඤාව ආත්මය වශයෙන් දකීද, මේ ලෝකයෙහි ඇතමෙක් චක්ඛුසම්ඵස්සජ සඤ්ඤාව, සොතසම්ඵස්සජ සඤ්ඤාව ඝානසම්ඵස්සජ සඤ්ඤාව, ජිව්හාසම්ඵස්සජ සඤ්ඤාව, කායසම්ඵස්සජ සඤ්ඤාව, මනොසම්ඵස්සජ සඤ්ඤාව ආත්මය වශයෙන් දකියි. (ii) මනොසම්ඵස්සජ සඤ්ඤාව 'යමක්ද එය මම වෙමි. යමක් මම වෙම්ද, එය මනොසම්ඵස්සජ සඤ්ඤාව වේයයි මනොසම්ඵස්සජ සඤ්ඤාවද, ආත්මයද එකක් වශයෙන් දනිමි. (iii) යම්සේ දල්වනලද තෙල් පහනක යම් සිළුවක්වේද එසේම වර්ණය වෙයි. යම් වර්ණයෙක්වේද, එය සිළුව වේයයි සිළුවද, වර්ණයද, එකක් වශයෙන් දකීද එමෙන් මේ ලොකයෙහි මනොසම්ඵස්සජ සඤ්ඤාව ආත්මය වශයෙන් දකියි (මෙහි (ii) යොදන්න)

**44.** දැඩිව වරදවාගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක්වේද, යම් වස්තුවක්වේද, මේ පළමු වැනි සඤ්ඤාව වස්තුකොට ඇති අත්තානුදිට්ඨි නම්. අත්තානු දිට්ඨිය, මිච්ඡා දිට්ඨි නම්. මිච්ඡාදිට්ඨිය, දිට්ඨි විපත්තිනම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා

යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ සඤ්ඤාව ආත්ම වශයෙන් දකියි.

45. කෙසේ සඤ්ඤාව ඇතියකු ආත්ම වශයෙන් දකියිද? ලෝකයෙහි ඇතමෙක් (ii) සංඛාරයන් විඤ්ඤාණය, රූපය, වේදනාව ආත්මය වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිතෙයි. මේ වනාහි මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි මේ සඤ්ඤාවෙන් සඤ්ඤාවත්යයි සඤ්ඤා ඇතියකු ආත්මයකොට දකියි. (iii) යම්සේ ඡායාවෙන් යුත් රුකක් වේද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ රුකය, මේ ඡායාවය, රුක අනිකකි. ඡායාව අනිකකි. ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායාවත් යයි ඡායාව ඇති රුක දක්නේද එමෙන්ම ලොකයෙහි (මෙහි (ii) යොදන්න)

46. දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම් දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි, යම් දෘෂ්ටියක්වේද, යම් වස්තුවක්වේද මේ දෙවැනි සඤ්ඤාව වස්තුවකොට ඇති අත්තානුදිට්ඨියයි අත්තානුදිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්තිනම්. (මෙහි 29 ඡේදයේ (i) කාමරාග සංයෝජකය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙති. දෘෂ්ටීහු නොවෙති. මෙසේ සඤ්ඤා ඇතියකු ආත්මය කොට දකියි.

47. කෙසේ ආත්මය කෙරෙහි සඤ්ඤාව ඇත්තේයයි දකීද? මේ ලෝකයෙහි ඇතමෙක් (ii) සංඛාරයන් විඤ්ඤාණය රූපය, වේදනාව, ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි. ‘මේවනාහි මගේ ආත්මය වෙයි. මේ මගේ ආත්මය කෙරෙහි මේ සඤ්ඤාව ඇතැයි’ ආත්මය කෙරෙහි සඤ්ඤාව ඇතැයි දකියි (iii) (මෙහි (ii) යොදන්න) යම්සේ සුවඳ ඇති මලක් වන්නේද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මලය, මේ සුවඳය, මල අනිකකි, සුවඳ අනිකකි, ඒ මේ සුවඳ වනාහි මේ මලෙහි වේයයි මලෙහි සුවඳ දක්නේය. එමෙන්ම මේ ලෝකයෙහි ඇතැමෙක් (මෙහි (ii) යොදන්න)

48. දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම් දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව

අනිකකි. යම් දෘෂ්ටියක්වේද, මේ වස්තුවක්වේද, මේ තුන්වැනිවූ සඤ්ඤාව වස්තුකොට ඇති අත්තානුදිට්ඨි නම්. අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 ඡේදයේ (ii) කාම රාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.)

මොව්හු සංයෝජනයෝ වෙති. දෘෂ්ටීහු නොවෙති. මෙසේ ආත්මය කෙරෙහි සඤ්ඤාව ඇතැයි දකියි.

**49.** කෙසේ සංඥාව කෙරෙහි ආත්මය ඇතැයි දකියිද? මේ ලොකයෙහි (ii) ඇතමෙක් සංඛාරයන් විඤ්ඤාණයන් රූපය වෙදනාව ආත්මය වශයෙන් දකියිද ඔහුට මෙසේ සිතෙයි. ‘මේ මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය මේ සඤ්ඤාවෙහි ඇතැයි’ දකියි. (iii) යම්සේ මැණිකක් කරඬුවෙහි දමන ලද්දේ වෙයි. ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. ‘මේ මැණිකය’ මේ කරඬුවය මැණික අනිකකි. කරඬුව අනිකකි. ඒ මැණික වනාහි මේ කරඬුවෙහි ඇතැයි කරඬුවෙහි මැණික දක්නේය. එමෙන්ම මේ ලොකයෙහි (මෙහි (ii) යොදන්න.)

**50.** දැඩිකොට වරදවා ගැනීම දිට්ඨිනම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි, යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද මේ සතර වැනි සඤ්ඤාව වස්තුකොට ඇති අත්තානු දිට්ඨි නම්. අත්තානු දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්, මෙසේ සඤ්ඤාව කෙරෙහි ආත්මය ඇතැයි දකියි.

**51.** කෙසේ සංඛාරය ආත්මය වශයෙන් දකියිද? මේ ලොකයෙහි ඇතමෙක් චක්ඛුසම්ඵස්සජ චෙතනාව සොත සම්ඵස්සජ චෙතනාව ඝානසම්ඵස්සජ චෙතනාව ජිව්හාසම්ඵස්සජ චෙතනාව කායසම්ඵස්සජ චෙතනාව මනොසම්ඵස්සජ චෙතනාව (ii) ආත්මය වශයෙන් දකියි. ‘යම් මනොසම්ඵස්සජ වෙදනාවක් වෙයිද, ඒ මම වෙමි’ යමක් මම වෙම්ද එය මනොසම්ඵස්සජ චෙතනාවයයි මනොසම්ඵස්සජ චෙතනාවද ආත්මයද එකක් කොට දකියි. (iii) යම්සේ දැල්වෙන

තෙල් පහනේ යම් සිළුවක් වේද, එය වර්ණය වෙයි. යමක් වර්ණය වෙයිද එය සිළුව යයි සිළුවද වර්ණයද එකක් කොට දකියිද, එමෙන්ම මේ ලොකයෙහි ඇතමෙක් මනොසම්ඵස්සජ චෙතනාව (මෙහි (ii) යොදන්න)

**52.** දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ පළමුවැනි සංස්කාරයන් වස්තු කොට ඇති අත්තානු දිට්ඨියයි අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 ඡෙදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ සංස්කාරයන් ආත්ම වශයෙන් දකියි.

**53.** කෙසේ සංස්කාරයන් ඇතියකු ආත්මය වශයෙන් දකියිද? මේ ලොකයෙහි ඇතමෙක් (ii) විඤ්ඤාණය රූපය වේදනාව සඤ්ඤාව ආත්ම වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිතෙයි. 'මේ මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය මේ සංඛාරයන්ගෙන් සංඛාර සහිතයයි' සංඛාර ඇතියකු ආත්මය වශයෙන් දකියි. (iii) යම්සේ ඡායාවෙන් යුත් රුකක් ඇත්තේද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. 'මේ රුකය මේ ඡායාවය රුක අනිකකි. ඡායාව අනිකකි. ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායාවත්යයි ඡායාව ඇති රුක දකියි. එසේම මේ ලොකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න.)

**54.** දැඩිකොට වරදවා ගැනීම දිට්ඨිනම්. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ දෙවැනි සංඛාරයන් මුල්කොට ඇති අත්තානු දිට්ඨිය වේ. අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 ඡෙදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ සංඛාරයන් ඇතියකු ආත්මය වශයෙන් දකියි.

**55.** කෙසේ ආත්මයෙහි සංඛාරයන් ඇතැයි දකීද? (ii) මේ ලොකයෙහි ඇතමෙක් විඤ්ඤාණය රූපය වේදනාව

සඤ්ඤාව ආත්මය වශයෙන් දකියි. ඔහුට මෙසේ සිතෙයි. 'මේ වනාහි මගේ ආත්මය වෙයි. මේ මගේ ආත්මය කෙරෙහි මේ සංස්කාරයෝ වෙත්යයි' ආත්මය කෙරෙහි සංස්කාරයන් දකියි. (iii) යම්සේ සුවඳැති මලක් වේද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මලය මේ සුවඳය මල අනිකකි. සුවඳ අනිකකි. ඒ මේ සුවඳ වනාහි මේ මලෙහි වේයයි මලෙහි සුවඳ පිහිටියේයයි දකියිද, එමෙන්ම (මෙහි (ii) යොදන්න)

**56.** දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ තුන්වැනිවූ සංස්කාරයන් වස්තුකොට ඇති අත්තානු දිට්ඨියයි අත්තානු දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්, මෙසේ ආත්මය කෙරෙහි සංස්කාරයන් දකියි.

**57.** කෙසේ සංස්කාරයන් කෙරෙහි ආත්මය දකියිද? (ii) මේ ලොකයෙහි ඇතමෙක් විඤ්ඤාණය රූපය වෙදනාව සඤ්ඤාව ආත්මය වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිතෙයි. මේ මගේ ආත්මය වෙයි. ඒ මගේ ආත්මය වනාහි මේ සංස්කාරයන් කෙරෙහි ඇතැයි' සංස්කාරයන් කෙරෙහි ආත්මය දකියි. (iii) යම්සේ මැණිකක් කරඬුවෙහි දමන ලද්දේ වෙයිද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මැණිකය මේ කරඬුවය. මැණික අනිකකි. කරඬුව අනිකකි. ඒ මැණික වනාහි මේ කරඬුවෙහි යයි කරඬුවෙහි මැණික ඇතැයි දකියිද එමෙන්ම (මෙහි (ii) යොදන්න)

**58.** දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ සතර වැනි සංස්කාරයන් වස්තුකොට ඇති අත්තානු දිට්ඨියයි. අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ සංස්කාරයන්හි ආත්මය ඇතැයි දකියි.

**59.** කෙසේ විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියිද? මේ ලොකයෙහි ඇතමෙක් චක්ඛුවිඤ්ඤාණය සොතවිඤ්ඤාණය ඝාන විඤ්ඤාණය ජිව්හා විඤ්ඤාණය කාය විඤ්ඤාණය මනො විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. (ii) යමක් මනො විඤ්ඤාණයක් වේද, ඒ මමය. යමක් මම වෙමිද, ඒ මනො විඤ්ඤාණයයි මනො විඤ්ඤාණයත් ආත්මයත් එකක් වශයෙන් දකියි. (iii) යම්සේ දැල්වෙන තෙල් පහනේ යම් සිළුවක්වේද, එයම වර්ණය වෙයි. යමක් වර්ණය වෙයිද, එය පහන්සිළුව වේයයි පහන් සිළුවද, වර්ණයද එකක් වශයෙන් දක්නේද, එමෙන්ම (මෙහි (ii) යොදන්න)

**60.** දැඩිව වරදවාගැනීම දිට්ඨිනම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දෘෂ්ටියද, යමක් වස්තුවද මේ පළමුවැනිවූ විඤ්ඤාණය වස්තුකොට ඇති අත්තානුදිට්ඨිනම්. අත්තානුදිට්ඨිය මිච්ඡාදිට්ඨිනම්. (මෙහි 29 ඡේදයේ (ii) කාම රාග සංයෝජනය යන තැන සිට අවසානය දක්වා යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්, දෘෂ්ටීහු නොවෙත්. මෙසේ විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි.

**61.** කෙසේ විඤ්ඤාණය ඇතියකු ආත්මය වශයෙන් දකියිද? (ii) මේ ලෝකයෙහි ඇතමෙක් රූපය වේදනාව, සඤ්ඤාව, සංඛාරයන් ආත්මය වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිතෙයි. මේ වනාහි මගේ ආත්මය වෙයි. ඒ මේ මගේ ආත්මය මේ විඤ්ඤාණයෙන් විඤ්ඤාණ සහිතයයි විඤ්ඤාණය ඇතියකු ආත්මය කොට දකියි. (iii) (මෙහි (ii) යෙදිය යුතුයි) යම්සේ ඡායාව ඇති රුකක් ඇත්තේද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ රුකය, මේ ඡායාවය, රුක අනිකකි ඡායාව අනිකකි, ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායා සහිතයයි ඡායාව ඇති රුකයයි දකියිද, එමෙන්ම මේ ලෝකයෙහි ඇතමෙක් (මෙහි (ii) යොදන්න)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**58.** දැඩිකොට වරදවාගැනීම දිට්ඨීනම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක්වේද යම් වස්තුවක්වේද මේ දෙවැනි විඤ්ඤාණය වස්තුකොට ඇති අත්තානුදිට්ඨිනම්. අත්තානු දිට්ඨිය මිච්ඡාදිට්ඨිනම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයෝජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත් මෙසේ විඤ්ඤාණය ඇතියකු ආත්මය වශයෙන් දකියි.

**63.** කෙසේ ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි දක්නේද? (ii) මේ ලෝකයෙහි ඇතමෙක් රූපය, වේදනාව, සඤ්ඤාව සංඛාරයන් ආත්මය වශයෙන් දකියිද, ඔහුට මෙසේ සිතෙයි. 'මේ මගේ ආත්මය වෙයි. මේ මගේ ආත්මය කෙරෙහි මේ විඤ්ඤාණය පිහිටියේයි. ආත්මය කෙරෙහි විඤ්ඤාණය දකියි. (iii) (මෙහි (ii) යොදන්න) යම්සේ සුවඳැති මලක්වේද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මලය, මේ සුවඳය, මල අනිකකි, සුවඳ අනිකකි. ඒ සුවඳ වනාහි මේ මලෙහි පිහිටියේයයි මලෙහි සුවඳයයි දක්නේද, එමෙන්ම (මෙහි (ii) යොදන්න)

**64.** දැඩිකොට වරදවා ගැන්ම දිට්ඨී නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් යම් වස්තුවක් වේද, මේ තුන්වැනිවූ විඤ්ඤාණය වස්තු කොට ඇති අත්තානු දිට්ඨියයි අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨී නම්. (මෙහි 29 ඡේදයේ (ii) කාමරාග සංයොජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත් මෙසේ ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි දකියි.

**65.** කෙසේ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි දක්නේද? (ii) මේ ලොකයෙහි ඇතමෙක් රූපය වේදනාව සඤ්ඤාව සංඛාරයන් ආත්මය වශයෙන් දකියිද ඔහුට මෙසේ සිතෙයි. 'මේ මගේ ආත්මය වෙයි ඒ මගේ ආත්මය වනාහි මේ විඤ්ඤාණයෙහි ඇතැයි විඤ්ඤාණයෙහි ආත්මය දකියි (iii)

යම්සේ කරඬුවෙහි දමනලද මැණිකක් වේද ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ මැණිකය, මේ කරඬුවය. මැණික අනිකකි කරඬුව අනිකකි, ඒ මැණික වනාහි මේ කරඬුවෙහි ඇතැයි කරඬුවෙහි මැණික දකියි එමෙන්ම (මෙහි (ii) යොදන්න.)

**66.** දැඩිකොට වරදවා ගැන්ම දිට්ඨි නමි. දෘෂ්ටිය වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් වස්තුවක් වේද මේ සතර වැනි විඤ්ඤාණය වස්තු කොට අත්තානු දිට්ඨියයි. අත්තානු දිට්ඨිය මිච්ඡා දිට්ඨි නමි. (මෙහි 29 ඡෙදයේ (ii) කාමරාග සංයොජනය යන තැන සිට එහි අවසානය දක්වා යොදන්න) මොව්හු සංයොජන වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි දකියි. අත්තානු දිට්ඨියෙන් මේ විසි ආකාරයෙන් දැඩිකොට වරදවා අල්වා ගන්නේ වෙයි.

**67.** කිනම් දස ආකාරයකින් මිථ්‍යාදෘෂ්ටියෙන් දැඩිකොට වරදවා ගැනීම වේද? දුන්දෙයෙහි පලක් නැත යනු වස්තු නමි. (ii) මෙසේ කියන්නාවූ දැඩිකොට වරදවාගැනීම දිට්ඨිනමි. දෘෂ්ටි වස්තුව නොවේ. වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි වස්තුව අනිකෙකි යම් දෘෂ්ටියක්වේද, යම් වසලක් වේද, මේ පළමුවැනි වූ වරදවා ගැනීම වස්තුකොට ඇත්තාවූ මිච්ඡාදිට්ඨිනමි. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්ති නමි. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. සුලු දානයෙහි විපාක නැත යනු වස්තුනමි. (මෙහි (ii) යොදන්න) මහාදානයෙහි විපාක නැත යනු වස්තුනමි. (මෙහි (ii) යොදන්න) යහපත් ක්‍රියා අයහපත් ක්‍රියාවන්ගේ ඵල විපාක නැත යනු වස්තු නමි. (මෙහි (ii) යොදන්න) මෙලොවක් නැත යනු වස්තුනමි. (මෙහි (ii) යොදන්න) පරලොවක් නැත යනු වස්තුනමි. (මෙහි - (ii) යොදන්න.) මවට කරන ලද හොඳ නොහොඳ කර්මයන්ගේ විපාක නැත යනු වස්තු නමි. (මෙහි - (ii) යොදන්න) පියාට කරනලද හොඳ නොහොඳ කර්මයන්ගේ විපාක නැත යනු වස්තුනමි. (මෙහි - (ii) යොදන්න ඔපපාතික

සත්වයන් නැත යනු වස්තුනමි. (මෙහි (ii) යොදන්න) යම් කෙනෙක් මෙලොවද පරලොවද තුමූම විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරත්ද යහපත්ව ගියාවූ යහපත්ව පිළිපැද්දාවූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙත්ද එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලොකයෙහි නැත යනු වස්තුනමි. (මෙහි - (ii) යොදන්න) මෙසේ කියන්නාවූ දැඩි කොට වරදවාගැනීම දිට්ඨී නමි. දිට්ඨිය වස්තුව නොවේ, වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි, වස්තුව අනිකකි යම් දෘෂ්ටියක්වේද යම් වස්තුවක්වේද, මෙය දසවැනිවූ වරදවා ගැනීම වස්තුකොට ඇත්තාවූ මිච්ඡාදිට්ඨීනමි. මිච්ඡාදිට්ඨිය දිට්ඨි විපත්තිනමි. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ ගති දෙකකි. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මිථ්‍යාදෘෂ්ටියෙන් මේ දශ ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**68.** සක්කාය දිට්ඨියෙන් කිනම් විසි ආකාරයකින් දැඩිකොට ගැනීම වෙයිද? මේ ලෝකයෙහි ආර්යයන් නොදක්නා ආර්ය ධර්මයෙහි අදක්ෂ ආර්ය ධර්මයෙහි නොහික්මුණු සත්පුරුෂයන් නොදක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු අශ්‍රැතවත් පෘථග්ජනතෙම (iii) රූපය ආත්මය වශයෙන් දකියි. රූපය ඇතියෙකු හෝ ආත්මය කෙරෙහි රූපය පිහිටියේයයි හෝ රූපය කෙරෙහි ආත්මය පිහිටියේ යයි හෝ දකියි. වෙදනාව-සඤ්ඤාව-සංඛාරයන්-විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. විඤ්ඤාණය ඇතියකු හෝ ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි හෝ දකියි.

**69.** කෙසේ රූපය ආත්මය වශයෙන් දකියිද? මේ ලෝකයෙහි ඇතමෙක් පඨවි කසිණය (මෙහි 31 (ii) යොදන්න) ඔදාත කසිණය ආත්මය වශයෙන් දකියි. ඔදාත කසිණය යමක්ද, ඒ මම වෙමි. යමක් මම වෙම්ද, එය ඔදාත කසිණය වේයයි ඔදාත කසිණයත් ආත්මයත් එකක් කොට දකියි. යම්සේ දැල්වෙන තෙල් පහනක (මෙහි 31 (iii) යොදන්න) එමෙන්ම මේ ලෝකයෙහි ඇතමෙක් ඔදාත කසිණය ආත්මය වශයෙන්

දකියි. දැඩිකොට වරදවාගැනීම දිට්ඨිනම්. මේ පළමුවැනිවූ රූපය වස්තුකොට ඇති සක්කායදිට්ඨියයි සක්කායදිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටිහු නොවෙත්, මෙසේ රූපය ආත්මය වශයෙන් දකියි. මෙහි (iii) යොදන්න) සක්කාය දිට්ඨියෙන් මේ විසි ආකාරයෙන් දැඩිව වරදවාගැනීම වෙයි.

**70.** සක්කාය වස්තුකොට ශාස්වත දෘෂ්ටියෙන් කිනම් පසළොස් ආකාරයකින් දැඩිව වරදවාගැනීම වෙයිද? මේ ලෝකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රුතවත් පෘථග්ජනතෙම (ii) රූපය ඇතියකු හෝ ආත්මය වශයෙන් දකියි. ආත්මය කෙරෙහිවූ රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකියි. (iii) වේදනාව ඇතියකු හෝ (මෙහි (ii) 'රූපය වෙනුවට, 'වෙදනාව' යොදාගත යුතුයි) සඤ්ඤාව ඇතියකු හෝ (මෙහි (ii) 'රූපය' වෙනුවට 'සඤ්ඤාව' යොදාගත යුතුයි) සංඛාරයන් ඇතියකු හෝ (මෙහි (ii) 'රූපය' වෙනුවට 'සංඛාරය' යොදාගත යුතුයි.) විඤ්ඤාණය ඇතියකු හෝ ආත්මය වශයෙන් දකියි. ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි හෝ දකියි.

**71.** කෙසේ රූපය ඇතියකු ආත්මය වශයෙන් දකියිද? (ii) මේ ලොකයෙහි ඇතමෙක් වෙදනාව සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය ආත්මය වශයෙන් දකීද, ඔහුට මෙසේ සිතෙයි. මේ මාගේ ආත්මය වෙයි. ඒ මේ මාගේ ආත්මය වනාහි මේ රූපයෙන් රූපය ඇතියෙකුයි. රූපය ඇතියකු ආත්මය වශයෙන් දකියි. (iii) යම්සේ ඡායාවෙන් යුත් රුකක් වන්නේද, ඊට පුරුෂයෙක් මෙසේ කියන්නේය. මේ රුකය මේ ඡායාවය රුක අනිකකි. ඡායාව අනිකකි. ඒ මේ රුක වනාහි මේ ඡායාවෙන් ඡායා සහිතයයි ඡායාව ඇති රුක දක්නේද, එමෙන්ම (මෙහි (ii) යොදන්න) මේ පළමුවැනිවූ සක්කාය වස්තුකොට ඇති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශාස්වත දෘෂ්ටියයි ශාස්වත දෘෂ්ටිය මිථ්‍යා දෘෂ්ටි නම්. (මෙහි 29 ඡේදයේ (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ රූපය ඇතියකු ආත්මය වශයෙන් දකියි. (මෙහි (ii) යොදන්න) සක්කාය වස්තුකොට ඇති ශාස්වත දෘෂ්ටියෙන් මේ පසළොස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

72. සක්කාය වස්තුකොට ඇති උච්ඡේද දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද? මේ ලොකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත් පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම (ii) රූපය ආත්මය වශයෙන් දකියි. වේදනාව ආත්මය වශයෙන් දකියි. සඤ්ඤාව ආත්මය වශයෙන් දකියි. සංඛාරයන් ආත්මය වශයෙන් දකියි. විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. (iii) කෙසේ රූපය ආත්මය වශයෙන් දක්නේද? මේ ලොකයෙහි ඇතමෙක් පඨවි කසිණය (මෙහි 31 (ii) 33 (i) යොදන්න) ඔදාත කසිණය ආත්මය වශයෙන් දකියි. යමක් ඔදාත කසිණය වෙයිද 'ඒ මම වෙමි. යමක් මම වෙම්ද, ඒ ඔදාත කසිණය වේයයි' ඔදාත කසිණයත් ආත්මයත් එකක්කොට දකියි. යම්සේ දැල්වෙන තෙල් පහනක (මෙහි 31 (iii) යොදන්න) මේ පළමුවැනි සක්කාය වස්තුකොට ඇති දිට්ඨියයි උච්ඡේද දිට්ඨිය මිච්ඡා දිට්ඨිය නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ රූපය ආත්මය වශයෙන් දකියි. (මෙහි (ii) යොදන්න) සක්කාය වස්තුව වස්තුකොට ඇති උච්ඡේද දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

73. අන්තග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පනස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද? ලොකය ශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කෙතෙක් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද, ලොකය අශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කෙතෙක් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද, ලොකය කෙළවර සහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටිය

කෙතෙක් ආකාරයකින් වරදවා ගැනීමවේද, ලොකය කෙළවර රහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් එයම ජීවයද එයම ශරීරයද වේයයි ගන්නාවූ අන්තග්ගාහිත දෘෂ්ටියෙන් ජීවය අනිකකි. ශරීරය අනිකකැයි ගන්නා අන්තග්ගාහික දෘෂ්ටියෙන් සත්වයා (ආත්මය) මරණින් මතු ඇත්තේය. සත්වයා මරණින් පසු නැත්තේය. සත්වයා මරණින් පසු වන්නේත් වෙයි. සත්වයා මරණින් පසු වන්නේත් නොවෙයි, නොවන්නේත් නොවේ යයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කෙතෙක් ආකාරයෙන් වරදවා ගැනීමවේද? ලොකය ශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම වෙයි. සත්වයා මරණින් පසු වන්නේත් නොවෙයි නොවන්නේත් නොවේයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම වෙයි.

74. ලොකය ශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටිය කිනම් පසළොස් ආකාරයකින් වරදවා ගැනීමවේද? රූපය ලොකය (ආත්මය) ද වෙයි. ශාස්වතද වේයයි (ii) දැඩිව වරදවා ගැනීම දිට්ඨි නමි. ඒ දෘෂ්ටියෙන් ඒ ශාස්වත අන්තය ගන්නාලද හෙයින් අන්තග්ගාහික දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද මේ පළමුවැනිවූ ලොකය ශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියයි (iii) අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡා දිට්ඨි නමි. (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙත් දෘෂ්ටීහු නොවෙත්. වේදනාව ලොකයද වෙයි. ශාස්වතද වේයයි, (මෙහි (ii) යොදන්න.) සඤ්ඤාව ලොකයද වෙයි. ශාස්වතද වේයයි (මෙහි (ii) යොදන්න.) සංඛාරයෝ ලෝකයද වෙත්. ශාස්වතද වෙත්යයි (මෙහි (ii) යොදන්න.) විඤ්ඤාණය ලොකයද වෙයි. ශාස්වතද වේයයි දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නමි. ඒ දෘෂ්ටියෙන් ඒ ශාස්වත අන්තය ගන්නාලද හෙයින් අන්තග්ගාහික දිට්ඨි නමි. (iv) දෘෂ්ටිය වස්තුව නොවේ වස්තුව දෘෂ්ටිය නොවේ. දෘෂ්ටිය අනිකකි වස්තුව අනිකකි යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක්

වේද (v) මේ පස්වැනිවූ ලෝකය ශාස්වතයයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨි නම්. අන්තගග්ගාහික දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. ලෝකය ශාස්වතයයි ගන්නාවූ අන්තගග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වේ.

**75.** ලොකය අශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වේද? රූපය ලොකයද වෙයි. අශාස්වතද වේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අශාස්වත අන්තය ගන්නාලද හෙයින් අන්තගග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න.) මේ පළමුවැනි ලොකය අශාස්වතයයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න.) මේ පළමුවැනි ලොකය අශාස්වතයයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨි නම්. අන්තගග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. මිච්ඡා දිට්ඨිය දිට්ඨි විපත්ති නම් (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. වේදනාව ලොකයද වෙයි. අශාස්වතද වේයයි (මෙහි (ii) යොදන්න.) සඤ්ඤාව ලොකයද වෙයි. අශාස්වතද වේයයි (මෙහි (ii) යොදන්න.) සංඛාරයෝ ලොකයද වෙත් අශාස්වතද වේයයි (මෙහි (ii) යොදන්න) විඤ්ඤාණය ලොකයද වෙයි. අශාස්වතද වේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අශාස්වත අන්තය ගන්නාලද්දේනුයි අන්තගග්ගාහික දිට්ඨි නම්. අන්තගග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයෝජනය නම් වෙත්. දෘෂ්ටීහු නොවෙත්. ලෝකය අශාස්වතයයි ගන්නාවූ අන්තගග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**76.** ලොකය කෙළවර සහිතයයි ගන්නාවූ අන්තගග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද? මේ ලොකයෙහි ඇතමෙක් ස්වල්ප තැනක නීල කසිණය පතුරුවයිද, ඔහුට මෙසේ සිතෙයි. මේ ලෝකය (ආත්මය) කෙළවර සහිතය සීමා සහිතයයි කෙළවරක් ඇත්තේය යන හැඟීම් ඇතිවෙයි. යම් කසිණයක් පතුරුවයිද එය වස්තුවද

ආත්මයද වෙයි. යම් සිතකින් පතුරුවයිද එය ආත්මයද ලොකයද වේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දිට්ඨියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් වස්තුවක් වේද මේ පළමුවැනි ලොකය (ආත්මය) කෙළවර සහිතයයි යන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දෘෂ්ටිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

77. මේ ලොකයෙහි ඇතමෙක් ස්වල්ප තැනක පීත කසිණය පතුරුවයි. ලොහිත කසිණය පතුරුවයි, ඔදාත කසිණය පතුරුවයි. ආලොක කසිණය පතුරුවයි. ඔහුට මෙසේ සිතෙයි, ලොකය කෙළවර සහිතය සීමා සහිතයයි කෙළවර ඇත්තේය යන හැඟීම් ඇත්තේ වෙයි. යම් කසිණයක් පතුරවයිද එය වස්තුවද ආත්මයද වෙයි. යම් සිතකින් පතුරුවයිද එය ආත්මයද ලොකයද වේයයි, දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දිට්ඨියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි' අන්තග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න) ලොකය කෙළවර සහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වේ.

78. ලොකය කෙළවර රහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වේද? මේලොකයෙහි ඇතැමෙක් මහත් තැනක නීල කසිණය පතුරුවයි. ඔහුට මෙසේ සිතෙයි. 'මේ ලොකය කෙළවර රහිතය සීමා රහිතයයි අනන්ත සඤ්ඤාව ඇත්තේ වෙයි. යම් කසිණයක් පතුරුවයිද, එය වස්තුවද ලොකයද වෙයි. යම් සිතකින් පතුරුවයිද එය ආත්මයද ලොකයද වේයයි දැඩි කොට වරදවා ගැනීම වෙයි, ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි' අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි, වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් වස්තුවක් වේද මෙය පළමුවැනිවූ ලොකය කෙළවර රහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික

දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයොජනයෝවෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**79.** මේ ලොකයෙහි ඇතමෙක් මහත්වූ තැනක පීත කසිණය පතුරුවයි. ලොහිත කසිණය පතුරුවයි. ඔදාත කසිණය පතුරුවයි. ආලොක කසිණය පතුරුවයි. ඔහුට මෙසේ සිතෙයි. 'මේ ලොකය කෙළවර රහිතය, සීමා රහිතයයි අනන්ත සඤ්ඤාව ඇත්තේවෙයි. යම් කසිණයක් පතුරුවයිද එය වස්තුවද ලොකයද වෙයි. යම් සිතකින් පතුරුවයිද එය ආත්මයද ලොකයද වේයයි' දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න) ලොකය කෙළවර රහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**80.** එයම ජීවය වෙයි. එයම ශරීරය වේයයි. ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වේද?

ඒ රූපය ජීවයද (ආත්මය) වෙයි. ශරීරයද වෙයි. යමක් ජීවය (ආත්මය) වෙයිද එය ශරීරය වෙයි. යමක් ශරීරයද එය ජීවය වේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දිට්ඨියද යමක් වස්තුවද මෙය පළමුවැනි ජීවය වෙයි. එය ශරීරය වේයයි ගන්නා අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න.) මොව්හු සංයොජනයෝවෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**81.** වෙදනාව ජීවයද වෙයි. ශරීරයද වෙයි. සඤ්ඤාව ජීවයද වෙයි. ශරීරයද වෙයි. සංඛාරයෝ ජීවයද වෙත්. ශරීරයද වෙත්. විඤ්ඤාණය ජීවයද වෙයි. ශරීරයද වේයයි. යමක් ජීවයද එය ශරීරය වෙයි. යමක් ශරීරයද එය ජීවය වේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි. අන්තග්ගාහික දෘෂ්ටි නම්. (මෙහි 74 (iv) යොදන්න.) එය ජීවය

වෙයි, එය ශරීරය වේයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

82. ජීවය අනිකකි, ශරීරය අනිකකියි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් කිනම් පස් ආකාරයක් වරදවා ගැනීම වේද? රූපය ශරීරය වෙයි. ජීවය නොවෙයි ජීවය ශරීරය නොවෙයි. ජීවය අනිකකි. ශරීරය අනිකකියි දැඩි කොට වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි. අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි වස්තුව අනිකකි, යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ පළමුවැනි ජීවය අනිකකි. ශරීරය අනිකකියි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

83. වෙදනාව ශරීරය වෙයි. ජීවය නොවෙයි. සඤ්ඤාව ශරීරය වෙයි, ජීවය නොවෙයි. සංඛාරයෝ ශරීරය වෙයි. ජීවය නොවෙයි. විඤ්ඤාණය ශරීරය වෙයි. ජීවය නොවෙයි. ජීවය අනිකකි ශරීරය අනිකකියි දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න) ජීවය අනිකකි. ශරීරය අනිකකියි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

84. මරණින් පසු සත්වයා වන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද, රූපය මෙහිම මැරෙන ස්වභාව ඇත්තේය. සත්වයා ශරීරය නැතිවීමෙන් පසු වන්නේද සිටින්නේද උපදින්නේද, පහළ වන්නේද, වේයයි ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දෘෂ්ටිය වේද, යමක් වස්තුව වේද, මේ පළමුවැනිවූ සත්වයා මරණින් පසු වන්නේයයි

ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**85.** වෙදනාව මෙහිම මැරෙන ස්වභාවය ඇත්තේය- සඤ්ඤාව මෙහිම මැරෙන ස්වභාව ඇත්තේය- සංස්කාරයෝ මෙහිම මැරෙන ස්වභාවය ඇත්තාහුය. විඤ්ඤාණය මෙහිම මැරෙන ස්වභාවය ඇත්තේය. කය නැතිවීමෙන් සත්වයා වන්නේද, සිටින්නේද, උපදින්නේද, පහළ වන්නේද, වේයයි දැඩිව අල්වා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. (මෙහි 74 (iv) යොදන්න) මරණින් පසු සත්වයා වන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**86.** මරණින් පසු සත්වයා නොවන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් කිනම් පස් ආකාරයකින් දැඩි කොට ගැනීම වේද? රූපය මෙහි මැරීම ස්වභාවකොට ඇත්තේය. සත්වතෙමේද කය නැතිවීමෙන් සිඳින්නේය. විනාශවන්නේය, නොවන්නේයයි දැඩිකොට වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද, යම් වස්තුවක් වේද, මේ පළමු වැනිවූ සත්වයා මරණින් පසු සිඳෙන්නේය, විනාශ වන්නේය. නොවන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම් (මෙහි 29 (ii) යොදන්න මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. වෙදනාව මෙහිම මැරීම ස්වභාවය කොට ඇත්තේය. සඤ්ඤාව මෙහිම මැරීම ස්වභාවයකොට ඇත්තේය. සංඛාරයෝ මෙහි මැරීම ස්වභාවයකොට ඇත්තේය. විඤ්ඤාණය මෙහිම මැරීම ස්වභාවය කොට ඇත්තේය. සත්වයා කය නැතිවීමෙන් පසු සිඳෙන්නේය. විනාශවන්නේය නොවන්නේ යයි වරදවා ගැනීම දිට්ඨි නම්. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි

අන්තග්ගාහික දිට්ඨි නම් (මෙහි 74 (iv) යොදන්න.) සත්වයා මරණින් පසු නොවන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් මේ පස් ආකාරයෙන් දැඩිකොට වරදවා ගැනීම වෙයි.

87. සත්වයා මරණින් පසු වන්නේද වෙයි නොවන්නේද වේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් කිනම් පස් ආකාරයකින් දැඩිකොට ගැනීම වෙයිද? රූපය මෙහිම මැරීම ස්වභාව කොට ඇත්තේය. සත්වයා මරණින් පසු වන්නේද නොවන්නේද වේයයි දැඩිකොට ගැනීම දිට්ඨි නම්. ඒ දිට්ඨියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක් වේද යම් වස්තුවක් වේද මේ පළමුවැනි සත්වයා කය නැති වීමෙන් පසු වන්නේද වෙයි. නොවන්නේද වේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨි නම්. අන්තග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයොජනයෝ වෙත්, දෘෂ්ටීහු නොවෙත්.

88. වෙදනාව මෙහිම මරණය ස්වභාව කොට ඇත්තීය සඤ්ඤාව මෙහිම මරණය ස්වභාව කොට ඇත්තීය. සංඛාරයෝ මෙහිම මරණය ස්වභාව කොට ඇත්තාහ. විඤ්ඤාණය මෙහිම මරණය ස්වභාව කොට ඇත්තේය. කය නැතිවීමෙන් සත්වයා වන්නේද වෙයි. නොවන්නේද වේයයි දැඩිව ගැනීම දිට්ඨි නම්. ඒ දිට්ඨියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තග්ගාහික දිට්ඨි නම්. මරණින් පසු සත්වයා වන්නේද වෙයි. නොවන්නේද වේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් මේ පස් ආකාරයෙන් දැඩිව ගැනීම වෙයි.

89. සත්වයා මරණින් පසු නොවන්නේද වෙයි. නොවන්නේ ද නොවේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් කිනම් පස් ආකාරයකින් වරදවා ගැනීම වේද? රූපය මෙහිම මරණය ස්වභාව කොට ඇත්තේය. සත්වයා මරණින් පසු නොවන්නේද වෙයි නොවන්නේද නොවේයයි දැඩිව වරදවා ගැනීම දිට්ඨි

නමි. ඒ දෘෂ්ටියෙන් ඒ අන්තය ගන්නා ලද්දේනුයි අන්තගග්ගාහික දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දිට්ඨියක්වේද, යම් වස්තුවක්වේද මේ පළමුවැනිවූ සත්වයා මරණින් පසු නොවන්නේද වෙයි. නොවන්නේද නොවේයයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨි නමි. අන්තගග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 ඡේදයේ (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**90.** වේදනාව මරණය ස්වභාවකොට ඇත්තීය, සඤ්ඤාව මරණය ස්වභාවකොට ඇත්තීය. සංස්කාරයෝ මරණය ස්වභාවකොට ඇත්තාහ. විඤ්ඤාණය මරණය ස්වභාවකොට ඇත්තේය. සත්වයා කය බිඳීමෙන් මරණින් පසු නොවන්නේද වෙයි, නොවන්නේද නොවේයයි දැඩිකොට ගැනීම දිට්ඨි නමි. ඒ දිට්ඨියෙන් ඒ අන්තය ගන්නාලද්දේනුයි අන්තගග්ගාහික දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දෘෂ්ටිය අනිකකි. වස්තුව අනිකකි. යම් දෘෂ්ටියක්වේද, යම් වස්තුවක් වේද, මේ පස්වැනිවූ සත්වයා මරණින් පසු නොවන්නේද වෙයි නොවන්නේද නොවේ යයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨි නමි. අන්තගග්ගාහික දිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. සත්වයා මරණින් පසු වන්නේද වෙයි. නොවන්නේද නොවේයයි ගන්නාවූ අන්තගග්ගාහික දිට්ඨියෙන් මේ පස්ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

අන්තගග්ගාහික දිට්ඨියෙන් මේ පනස් ආකාරයෙන් ගැනීම වෙයි.

**91.** පුබ්බන්තානුදිට්ඨියෙන් කිනම් අටලොස් ආකාරයකින් වරදවාගැනීම වෙයිද, ශාස්වතවාද සතරකි කොටසක් ශාස්වතයයි ගන්නාලද සතරකි. කෙළවරක් ඇතිය, නැත යයි ගන්නාවූ අන්තානන්තිකවාද සතරකි. නොඇල්විය හැකි මසකු මෙන් පැනයන ස්වභාවය ඇත්තාවූ අමරාවික්ඛෙපිකවාද සතරකි. හෙතුවක් නැතිව ඇතිවන්නේයයි ගන්නාවූ

අධිච්චසමුප්පන්නවාද දෙකකි. පුබ්බන්තානු දිට්ඨියෙන් මේ අටළොස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

අපරන්තානු දිට්ඨියෙන් කිනම් සුසාලිස් ආකාරයකින් වරදවාගැනීම වේද? සඤ්ඤීවාද සොළසකි. අසඤ්ඤීවාද අටකි. නෙවසඤ්ඤී නාසඤ්ඤීවාද අටකි. උච්ඡෙදවාද සතකි. දිට්ඨි ධම්ම නිබ්බානවාද පසකි. අපරන්තානුදිට්ඨියෙන් මේ සුසාලිස් ආකාරයෙන් වරදවාගැනීම වෙයි.

**92.** සංයෝජන වන්නාවූ දෘෂ්ටියෙන් කිනම් අටළොස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද? යම් වරදවාගැනීමක් මිථ්‍යාදෘෂ්ටියට බැසගැනීමක් දෘෂ්ටි වනයක් දෘෂ්ටි කාන්තාරයක්, දෘෂ්ටි කටුවක්, දෘෂ්ටි සංකල්පයක්, දෘෂ්ටි සංයෝජනයක්, දෘෂ්ටිහුලක්, දෘෂ්ටි සම්බාධයක්, දෘෂ්ටි පලිබොධයක්, දෘෂ්ටි බන්ධනයක්, දෘෂ්ටි ප්‍රපාතයක්, දෘෂ්ටි සන්තාපයක්, දෘෂ්ටි පරිලාහයක් දෘෂ්ටි ග්‍රන්ථයක් දෘෂ්ටි උපාදානයක් දෘෂ්ටියෙන් දැඩිව ගැනීමක්, සත්‍යයට විරුද්ධව ගැනීමක් වේද, සංයොජනික දිට්ඨියෙන් මේ අටළොස් ආකාරයෙන් දැඩිකොට ගැනීමවෙයි.

**93.** මමයයි මානයෙන් බැඳීම සහිත දිට්ඨියෙන් කිනම් අටළොස් ආකාරයකින් දැඩිව ගැනීම වේද? චක්ෂුස මමයයි (ii) දැඩිකොට වරදවා ගැනීම මමයයි මානයෙන් බැඳීම සහිත දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දිට්ඨියද, යමක් වස්තුවද, මේ පළමුවැනිවූ මමයයි ගන්නා මානයෙන් බැඳීම සහිත දිට්ඨි නම්. මාන විනිබන්ධ දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම්. (මෙහි 29 ඡෙදයේ ii යොදන්න.) (iii) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**94.** ශ්‍රොතය මමයයි (මෙහි 92 (ii) යොදන්න) ඝානය මමයයි (මෙහි 93 (ii) ජිව්හාව මමයයි (මෙහි 93 (ii) කය මමයයි (මෙහි 88 (ii) සිත මමයයි (මෙහි 88 (ii) රූපයෝ මමයයි (මෙහි 88 (ii) (ධර්මයෝ මමයයි, චක්ඛු විඤ්ඤාණය මමයයි (මෙහි 88 (ii) මනොවිඤ්ඤාණය මමයයි දැඩිකොට

වරදවා ගැනීම අහන්තිමාන විනිබන්ධ දිට්ඨි නම්. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දිට්ඨියක් වේද යම් වස්තුවක් වේද, මේ අටළොස්වැනිවූ අහන්තිමාන විනිබන්ධ දිට්ඨි නමි. මාන විනිබන්ධ දිට්ඨිය මිච්ඡා දිට්ඨි නමි. (මෙහි 29 ඡෙදයේ (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. අහන්ති මාන විනිබන්ධ දිට්ඨියෙන් මේ අටළොස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**95.** මගේයයි මානයෙන් බැඳි දිට්ඨියෙන් කිනම් අටළොස් ආකාරයකින් වරදවා ගැනීම වෙයිද, චක්ෂුස මගේ යයි (ii) දැඩිකොට වරදවා ගැනීම මමන්ති මාන විනිබන්ධ දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යමක් දිට්ඨියද යමක් වස්තුවද මේ පළමුවැනිවූ මමන්ති මාන විනිබන්ධ දිට්ඨි නමි. මාන විනිබන්ධ දිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 ඡෙදයේ (ii) යොදන්න.) (iii) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. ශ්‍රොත්‍රය මගේයයි (මෙහි (ii) යොදන්න.) ඝානය මගේයයි (මෙහි (ii) ) ජිව්හාව මගේයයි (මෙහි (ii) ) කය මගේයයි (මෙහි (ii) සිත මගේයයි (මෙහි (ii) ) රූපයෝ මගේයයි (මෙහි (ii) යොදන්න) ධර්මයෝ මගේයයි (මෙහි (ii) යොදන්න) චක්ඛු විඤ්ඤාණය මගේයයි (මෙහි (ii) යොදන්න.) මනො විඤ්ඤාණය මගේයයි වරදවා ගැනීම මමන්ති මාන විනිබන්ධ දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දිට්ඨියක් වේද, යම් වස්තුවක් වේද, මේ අටලොස්වැනිවූ මමන්තිමාන විනිබන්ධ දිට්ඨි නමි. මාන විනිබන්ධ දිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 ඡෙදයේ (ii) යොදන්න) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මමන්ති මාන විනිබන්ධ දිට්ඨියෙන් මේ අටළොස් ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**96.** ආත්මවාදය පිළිබඳ කොට ඇති දෘෂ්ටියෙන් කිනම් විසි ආකාරයකින් වරදවා ගැනීම වෙයිද?

මේ ලොකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ සත් පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම රූපය ආත්මයයි දකියි. (ii) රූපය ඇතියකු හෝ ආත්මය වශයෙන් දකියි. ආත්මය කෙරෙහි රූපය ඇතැයි හෝ රූපය කෙරෙහි ආත්මය ඇතැයි හෝ දකියි. වෙදනාව සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය ආත්මය වශයෙන් දකියි. විඤ්ඤාණය ඇතියකු හෝ ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියි. (iii) මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් පඨවිකසිණය (මෙහි 31 ඡෙදයේ ii යොදන්න) ආපොකසිණය වායොකසිණය, නීලකසිණය, පීතකසිණය, ඔදාත කසිණය ආත්මය වශයෙන් දකියි. (iv) යමක් ඔදාත කසිණය වේද ඒ මම වෙමි. යමක් මම වෙම්ද ඒ ඔදාත කසිණයයයි ඔදාත කසිණයද ආත්මයද එකක් කොට දකියි. (v) යම් දැල්වෙන පහනක යම් වැටියක් වේද එයම වර්ණයවේ. යම් වර්ණයක් වේද එයම වැටිය වේයයි පහන් වැටියද වර්ණයද එකක් කොට දකියිද එමෙන්ම මේ ලොකයෙහි ඇතමෙක් ඔදාත කසිණය ආත්මය වශයෙන් දකියි (මෙහි (iv) යොදන්න) මේ පළමු වැනිවූ රූපය වස්තු කොට ඇති ආත්මවාදය පිළිබඳවූ දිට්ඨියයි ආත්මවාදය පිළිබඳවූ දිට්ඨිය මිච්ඡාදිට්ඨි නමි. (මෙහි 29 ii) යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. මෙසේ රූපය ආත්මය වශයෙන් දකියි. (මෙහි ii යොදන්න.) ආත්මවාදය පිළිබඳවූ දිට්ඨියෙන් මේ විසි ආකාරයෙන් වරදවා ගැනීම වෙයි.

**97.** ලොකවාදය පිළිබඳවූ දිට්ඨියෙන් කිනම් අට ආකාරයෙන් වරදවා ගැනීම වෙයිද? ආත්මයද ලොකයද ශාස්වතයයි (ii) දැඩිකොට වරදවා ගැනීම ලොකවාදය පිළිබඳවූ දිට්ඨි නමි. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි. යම් දිට්ඨියක් වේද යම් වස්තුවක් වේද මේ පළමුවැනිවූ ලොකවාදය පිළිබඳවූ දිට්ඨිය

වේ. ලොකවාදය පිළිබඳවූ දිට්ඨිය මිච්ඡා දිට්ඨි නම්. (මෙහි 29 ඡේදයේ ii යොදන්න.) මොව්හු සංයොජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්. (iii)

**98.** ආත්මයද ලොකයද අශාස්වතයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද ශාස්වතද වෙයි. අශාස්වතද වේයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද ශාස්වතද නොවේ. අශාස්වතද නොවේයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද කෙළවර සහිතයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද කෙළවර රහිතයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද කෙළවර සහිතද වේ. කෙළවර රහිතද වේයයි (93 ඡේදයේ ii යොදන්න.) ආත්මයද ලොකයද කෙළවර සහිතද නොවේ. කෙළවර රහිතද නොවේයයි වරදවා ගැනීම ලොකවාදය පිළිබඳවූ දිට්ඨිය වේ. දිට්ඨිය වස්තුව නොවේ. වස්තුව දිට්ඨිය නොවේ. දිට්ඨිය අනිකකි. වස්තුව අනිකකි යම් දිට්ඨියක් වේද යම් වස්තුවක් වේද මේ අටවැනිවූ ලොකවාදය පිළිබඳවූ දිට්ඨි නම්. ලොකවාදය පිළිබඳවූ දිට්ඨිය මිච්ඡාදිට්ඨි නම් (මෙහි 29 ඡේදයේ ii යොදන්න.) මොව්හු සංයෝජනයෝ වෙත්. දෘෂ්ටීහු නොවෙත්.

**99.** ලොකවාදය පිළිබඳවූ දිට්ඨියෙන් මේ අට ආකාරයෙන් වරදවා ගැනීම වෙයි. නිවන් මගට හැකිලෙන්නාක් වැනිව වරදවා ගත්තාවූ දිට්ඨිය භවදිට්ඨි නම්. නිවන්මග ඉක්මවා යාම වශයෙන් ගන්නාවූ දිට්ඨිය විභව දිට්ඨි නම්.

අස්සාද දිට්ඨියෙන් පන්තිස් ආකාරයකින් වරදවා ගැනීම කෙතෙක් භව දෘෂ්ටීහු වෙත්ද කෙතෙක් විභව දෘෂ්ටීහු වෙත්ද? අත්තානුදිට්ඨියෙන් විසි ආකාරයකින් වරදවා ගැනීම කෙතෙක් භව දෘෂ්ටීහු වෙත්ද කෙතෙක් විභව දෘෂ්ටීහු වෙත්ද, ලොකවාදය පිළිබඳ දෘෂ්ටියෙන් අට ආකාරයකින් වරදවා ගැනීම කෙතෙක් භව දෘෂ්ටීහු වෙත්ද කෙතෙක් විභව දෘෂ්ටීහු වෙත්ද? අස්සාද දිට්ඨියෙන් පන්තිස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටීහු වෙත්. විභව දෘෂ්ටීහුද වෙත්, අත්තානුදිට්ඨියෙන් විසි ආකාරයකින් වරදවා ගැනීම පසළොසක් භව දෘෂ්ටීහුය, පසක්

විභව දෘෂ්ටිහුය මිථ්‍යා දෘෂ්ටියෙන් දස ආකාරයෙන් වරදවා ගැනීම සියල්ලම විභව දෘෂ්ටිහුය, සක්කාය දිට්ඨියෙන් විසි ආකාරයකින් වරදවා ගැනීම පසලොසක් භව දෘෂ්ටිහුය. පසක් විභව දෘෂ්ටිහුය. සක්කාය වත්ථුක සස්සත දිට්ඨියෙන් පසළොස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම භව දෘෂ්ටිහුය සක්කාය වත්ථුක උච්ඡෙද දිට්ඨියෙන් වරදවා ගැනීම් සියල්ලම විභව දෘෂ්ටිහුය. ලොකය ශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම භව දෘෂ්ටිහුය. ලොකය අශාස්වතයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම විභව දෘෂ්ටිහුය. ලොකය කෙළවර සහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටිහුද වෙත්. විභව දෘෂ්ටිහුද වෙත්. ලොකය කෙළවර රහිතයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් වරදවා ගැනීම භව දෘෂ්ටිහුද වෙත්. විභව දෘෂ්ටිහුද වෙත්. එය ජීවයද වෙයි. ශරීරයද වේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් වරදවා ගැනීම් සියල්ලම විභව දෘෂ්ටිහුය, ජීවය අනිකකි. ශරීරය අනිකකියි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම භව දෘෂ්ටිහුය. සත්වයා මරණින් පසු වන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දෘෂ්ටියෙන් පස්ආකාරයකින් වරදවා ගැනීම සියල්ලම භව දෘෂ්ටිහුය. මරණින් පසු සත්වයා නොවන්නේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම විභව දෘෂ්ටිහුය, සත්වයා මරණින් පසු වන්නේද වෙයි. නොවන්නේද යයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටිහුද වෙත්. විභව දෘෂ්ටිහුද වෙත්. සත්වයා මරණින් පසු වන්නේද නොවේ. නොවන්නේද නොවේයයි ගන්නාවූ අන්තග්ගාහික දිට්ඨියෙන් පස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටිහුද වෙත්. විභව දෘෂ්ටිහුද වෙත්. පුබ්බන්තානු දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටිහුද වෙත්. විභව දෘෂ්ටිහුද වෙත්. අපරන්තානු දිට්ඨියෙන් සතලිස්

ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටීහුද වෙත්. විභව දෘෂ්ටීහුද වෙත්. සඤ්ඤොජනික දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටීහුද වෙත්. විභව දෘෂ්ටීහුද වෙත්. අහන්තිමාන විනිබන්ධ දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම විභව දෘෂ්ටීහු වෙත්. මමන්තිමාන විනිබන්ධ දිට්ඨියෙන් අටලොස් ආකාරයකින් වරදවා ගැනීම් සියල්ලම භව දෘෂ්ටීහු වෙත්. අත්තවාද පටිසංයුක්ත දිට්ඨියෙන් විසි ආකාරයකින් වරදවා ගැනීම පසලොසක් භව දෘෂ්ටීහු වෙත්. පසක් විභව දෘෂ්ටීහු වෙත්. ලොකවාද පටිසංයුක්ත දිට්ඨියෙන් අට ආකාරයකින් වරදවා ගැනීම භව දෘෂ්ටීහුද වෙත්. විභව දෘෂ්ටීහුද වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම අස්සාද දිට්ඨීහු වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම අත්තානු දිට්ඨීහු වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම මිථ්‍යාදෘෂ්ටීහු වෙති. ඒ සියලු දෘෂ්ටීහුම සක්කාය දිට්ඨීහු වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම අන්තග්ගාහික දිට්ඨීහු වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම සංයෝජනික දිට්ඨීහු වෙත්. ඒ සියලු දෘෂ්ටීහුම ආත්ම වාදය පිළිබඳ දෘෂ්ටීහු වෙත්.

> "තාර්කිකයෝ (තර්ක කරන්නෝ) භව දෘෂ්ටියද විභව දෘෂ්ටියද යන මේ දෙක ඇසුරු කළාහුය. යම් නිර්වාණ ධාතුවෙක්හි දෙවියන් සහිතවූ ලොකයා (දුකය යන) විපරීත හැඟීම් ඇත්තේද දෘෂ්ටි නිරොධයවූ ඒ නිර්වාණයෙහි ඔවුන්ට ඤාණයක් නැත."

**100.** "මහණෙනි, සිත්හි පැන නගිනලද දෘෂ්ටි දෙකකින් ඇතැම් දෙව් මිනිසුන් හැකිලෙත්. ඇතැම් දෙව් මිනිසුන් ඉක්මවා යත්. ඇස් ඇත්තෝ දකිත්. මහණෙනි, කෙසේ ඇතමෙක් හැකිලෙත්ද? මහණෙනි, දෙව් මිනිසුන් භවයට ඇලුණාහු භවයට ආශාකරන්නාහු භවයට සතුටුවන්නාහු වෙත්. ඔවුන්ට භව නිරොධය පිණිස ධර්ම දෙශනාකරන කල්හි සිත ඒ අනුව නොයයි නොපහදියි, නොපිහිටයි. නොකැමතිවෙයි, මහණෙනි, මෙසේ ඇතමෙක් හැකිළෙත්. මහණෙනි, කෙසේ ඇතමෙක් ඉක්මවා යත්ද? ඇතමෙක් භවයෙහි දුකට පැමිණෙමින් ලජ්ජාවට පැමිණෙමින් පිළිකුල් කරමින් පින්වත්නි, යම්හෙයකින් මේ

ආත්මය කය බිඳීමෙන් සිඳෙයි නම් විනාශවන්නේ නම් නොවන්නේ නම් එය නිවීමය, එය ප්‍රණීතය, එය යථාස්වභාවයයි විභවය කැමති වෙත්. මහණෙනි, මෙසේ ඇතමෙක් ඉක්මවායත්. මහණෙනි, කෙසේ ඇස් ඇත්තෝ දකිත්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම හෙතුවෙන් හටගත් දෙය හෙතුවෙන් හටගත් දෙය වශයෙන් දකියි. හෙතුවෙන් හටගත් දෙය හෙතුවෙන් හටගත් දෙය වශයෙන් දැක හේතුවෙන් හටගත් දෙයෙහි විදර්ශනාව පිණිස මාර්ගය පිණිස නිර්වාණය පිණිස පිළිපන්නේ වෙයි. මහණෙනි, මෙසේ ඇස් ඇත්තෝ දකිත්.

"යමෙක් භූතයයි කියනලද දුක්ඛසත්‍යය පිරිසිඳ දැක භූතයාගේ ඉක්මීම වන නිර්වාණය ප්‍රත්‍යක්ෂව දැක මාර්ග භාවනාව වඩා භව තෘෂ්ණාව ක්ෂයකිරීමෙන් යථා ස්වභාවයවූ නිර්වාණයෙහි කැමතිවේද"

"භූතයන් පිරිසිඳ දැනගත්තාවූ කුඩා මහත් භවයන්හි තෘෂ්ණාව පහකළාවූ වෘත්ත දුක්ඛය සිඳදැමූ ඒ අර්හත් පුද්ගලතෙම නැවත භවයට නොපැමිණෙන්නේය"

**101.** විනාශවූ දෘෂ්ටි ඇති පුද්ගලයෝ තිදෙනෙකි. සම්පූර්ණ වූ දෘෂ්ටි ඇති පුද්ගලයෝ තිදෙනෙකි. විනාශවූ දෘෂ්ටි ඇති පුද්ගලයෝ තිදෙන කවරහුද? තීර්ථකයාද, තීර්ථක ශ්‍රාවකයාද එයින් අන්කිසි දෘෂ්ටියක් ගත් මිථ්‍යාදෘෂ්ටිකයාද යන තිදෙනාය. සම්පූර්ණ දෘෂ්ටි ඇති පුද්ගලයෝ තිදෙන කවරහුද? තථාගත තෙමේද, තථාගත ශ්‍රාවකතෙමේද එයින් අන්‍යවූ සම්‍යක් දෘෂ්ටික පුද්ගලයාද යන තිදෙනා වෙති. මේ පුද්ගලයෝ සම්පූර්ණ දෘෂ්ටි ඇති පුද්ගලයෝ තිදෙනා වෙති.

"ක්‍රොධ කරන්නාවූ බද්ධවෛර පවත්වන්නාවූ ලාමක ගුණමකු බව ඇත්තාවූ විනාශවූ දෘෂ්ටි ඇත්තාවූ කළ වරද සඟවන්නාවූ යම් මිනිසෙක් වේද, ඔහු වසලයෙකැයි දැනගන්නේය."

"ක්‍රොධ නොකරන්නාවූ බද්ධවෛර නොපවත්වන්නාවූ (ඥානදර්ශන විශුද්ධියෙන්) පිරිසිදුවූ (මාර්ග ඵලයෙන්)

පිරිසිදු බවට පැමිණියාවූ යහපත් දෘෂ්ටි ඇත්තාවූ නුවණැතියෙක් වේනම් ඔහු ආර්යයෙකැයි දන්නේය”

**102.** විනාශවූ දෘෂ්ටි තුනකි. යහපත් දෘෂ්ටි තුනකි. විනාශ වූ දෘෂ්ටි තුන කවරහුද, මෙය මගේයයි ගන්නාවූ විනාශවූ දෘෂ්ටිය මෙය මම යයි ගන්නාවූ විනාශවූ දෘෂ්ටිය මෙය මගේ ආත්මයයි ගන්නාවූ විනාශවූ දෘෂ්ටිය යන මේ තුන විනාශවූ දෘෂ්ටීහු වෙත්

යහපත් දෘෂ්ටි තුන කවරහුද? මෙය මගේ නොවේයයි දක්නාවූ යහපත් දෘෂ්ටිය මෙය මම නොවේයයි දක්නාවූ යහපත් දෘෂ්ටිය, මෙය මගේ ආත්මය නොවේයයි දක්නාවූ යහපත් දෘෂ්ටිය යන මේ තුන යහපත් දෘෂ්ටීහු වෙත්.

මෙය මගේයයි ගන්නාවූ දෘෂ්ටිය කිනම් දෘෂ්ටියක්ද, කෙතෙක් දෘෂ්ටීහුද, ඒ දෘෂ්ටීහු කිනම් අන්තයක් අනුව ගියාහුද? මෙය මම වෙමියයි ගන්නාවූ දෘෂ්ටිය කිනම් දෘෂ්ටියක්ද, කෙතෙක් දෘෂ්ටීහුද? ඒ දෘෂ්ටිහු නම් අන්තයක් අනුව ගියාහුද, මෙය මගේ ආත්මයයි ගන්නාවූ දෘෂ්ටිය කිනම් දෘෂ්ටියක්ද කෙතෙක් දෘෂ්ටීහුද ඒ දෘෂ්ටීහු කිනම් අන්තයක් අනුව ගියාහුද?

**102.** මෙය මගේයයි ගන්නාවූ දිට්ඨිය පුබ්බන්තානු දිට්ඨි නම්. දිට්ඨි අටලොසකි. ඒ දෘෂ්ටීහු පූර්ව අන්තය අනුව ගියාහුය. මෙය මම වෙමියි ගන්නාවූ දෘෂ්ටිය අපරන්තානු දිට්ඨි නම්. දෘෂ්ටීහු සුසාලිසකි. ඒ දෘෂ්ටීහු අපරාන්තය අනුව ගියාහුය. මෙය මගේ ආත්මය වේයයි ගන්නාවූ දෘෂ්ටිය විසි වැදෑරුම් ආත්ම දෘෂ්ටියද විසිවැදෑරුම් සක්කාය දෘෂ්ටියද වෙයි. සක්කාය දිට්ඨිය දොරටුව කොට ඇති දෙසැට දෘෂ්ටීහු වෙත්. ඒ දෘෂ්ටීහු පූර්වාන්තය අනුව ගියාහු වෙත්.

**103.** මහණෙනි, යම් කෙනෙක් මාර්ග ඥාණයෙන් මා කෙරෙහි (ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධයයි) නිසැක බවට ගියාහුද ඒ සියල්ලෝ සම්පූර්ණවූ දෘෂ්ටි ඇති පුද්ගලයෝ යයි ඒ සම්පූර්ණ දෘෂ්ටි ඇති පුද්ගලයන් අතුරෙන් පස් දෙනෙක් මේ කාම ලෝකයෙහි (පරිනිර්වාණයෙන්) නිෂ්ටාවට පැමිණෙත්. පස්දෙනෙක් මේ කාම ලොකය හැර නිෂ්ටාවට පැමිණෙත්.

කවර පස් දෙනෙකුන්ගේ මේ කාම ලොකයෙහි නිෂ්ටාව වෙයිද? සත්තක්ඛත්තු පරම පුද්ගලයාගේද කොලං කොල පුද්ගලයාගේද එකබීජ පුද්ගලයාගේද සකෘදාගාමි පුද්ගලයාගේද යමෙක් මේ ආත්මයෙහි රහත්වීද ඔහුගේද යන පස්දෙනාගේ මේ කාම ලෝකයෙහි නිෂ්ටාව වෙයි. කවර පස්දෙනෙකුන්ගේ නිෂ්ටාව මේ කාම ලොකය හැර වේද? අන්තරා පරිනිබ්බායි පුද්ගලයාගේද උපහච්ච පරිනිබ්බායී පුද්ගලයාගේද අසංඛාර පරිනිබ්බායී පුද්ගලයාගේද සසංඛාර පරිනිබ්බායී පුද්ගලයාගේද උද්ධං සොත අකනිට්ඨගාමී පුද්ගලයාගේද යන පස්දෙනාගේ නිෂ්ටාව මේ කාම ලෝකය හැර සිදුවෙයි.

**104.** මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි නිසැක බවට පැමිණියාහු නම් ඒ සියලුදෙන දෘෂ්ටියෙන් සම්පූර්ණ වූවෝයි. ඒ සම්පූර්ණ දෘෂ්ටි ඇතියවුන් අතුරෙන් මේ පස්දෙනාගේ නිෂ්ටාව මේ කාම ලොකයෙහි වන්නීය. මේ පස් දෙනාගේ නිෂ්ටාව මේ කාම ලොකය හැර (බඹලොවදී) වන්නීය.

**105.** මහණෙනි, මා කෙරෙහි යම් කෙනෙක් නොසෙල්වෙන සේ පැහැදුණාහුද ඒ සියලුදෙන ආර්ය මාර්ග ශ්‍රොතයට පැමිණියාහු වෙත්. ආර්ය මාර්ග ශ්‍රොතයට පැමිණියාවූ පස් දෙනෙකුගේ නිෂ්ටාව මේ කාම ලොකයෙහිදී වෙයි. පස් දෙනෙකුන්ගේ නිෂ්ටාව මේ කාම ලොකය හැර වෙයි. කවර පස් දෙනෙකුන්ගේ නිෂ්ටාව මේ කාම ලොකයෙහි වෙයිද, සත්තක්ඛත්තු පරම පුද්ගලයාගේද කොලං කොල පුද්ගලයාගේද ඒක බීජී පුද්ගලයාගේද සකෘදාගාමි පුද්ගලයාගේද යමෙක් ඉහාත්මයෙහිම රහත්වීද ඔහුගේද, යන මේ පස්දෙනාගේ නිෂ්ටාව මේ කාම ලොකයෙහි වෙයි. කවර පස්දෙනෙකුගේ නිෂ්ටාව මේ කාම ලොකය හැර වෙයිද? අන්තරාපරිනිබ්බායී පුද්ගලයාගේද උපහච්ච පරිනිබ්බායී පුද්ගලයාගේද අසංඛාර පරිනිබ්බායී පුද්ගලයාගේද සසංඛාර පරිනිබ්බායී පුද්ගලයාගේද උද්ධංසොත අකනිට්ඨගාමී පුද්ගලයාගේද යන මේ පුද්ගලයන් පස්දෙනාගේ නිෂ්ටාව මේ කාම ලොකය හැර බඹලොවදී වෙයි. මහණෙනි, යම්කෙනෙක් මා කෙරෙහි නොසෙල්වෙන

ශ්‍රද්ධාවෙන් පැහැදුණාහුද ඔහු සියල්ලෝ ආර්ය මාර්ග ශ්‍රොතයට බැසගත්තාහු වෙත්. ඒ ශ්‍රොතයට පැමිණියාවුන් අතුරෙන් පස්දෙනාගේ නිෂ්ටාව මේ කාම ලෝකයෙහි වෙයි. මේ පස් දෙනාගේ නිෂ්ටාව මේ කාමලොකය හැර වෙයි.

**(දිට්ඨි කථාව නිමි.)**